325 වන කාණ්ඩය - 05 වන කලාපය
தொகுதி 325 - இல. 05
Volume 325 - No. 05

2026 පෙබරවාරි 18වන බදාදා
2026 பெப்ருவரி 18, புதன்கிழமை
Wednesday, 18th February, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

කථානායකතුමාගේ සහතිකය [තීරුව 799]

කොළඹ වරායේ සිට බහාලුම් 323 ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම [තීරුව 799]

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා** [තීරුව 801]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 805-846]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

නිල සංචිත තත්ත්වය සහ විදේශ ගෙවීම් gateways හරහා විදේශ විනිමය අහිමි වීම [තීරුව 847]

**කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ වර්තමාන තත්ත්වය:**

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගේ ප්‍රකාශය [තීරුව 850]

**වරප්‍රසාද:**

2026.02.06 දින කම්කරු නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් කරන ලද ප්‍රකාශය [තීරුව 864]

**වරප්‍රසාද යෝජනා:**

අකුරණ ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා විසින් කරන ලද තර්ජනය [තීරුව 866]

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**

මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) - [ගරු චාමර සම්පත් දසනායක මහතා] - පළමුවන වර කියවන ලදී [තීරුව 868]

**විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත:**

නියම [තීරු 869-972]

**රේගු ආඥාපනත:**

යෝජනා සම්මතය [තීරුව 973]

**මෝටර් වාහන පනත:**

නියෝග [තීරුව 973]

**කල්තැබීමේ යෝජනාව:**

අල්ලස සහ දූෂණයෙන් තොර රාජ්‍යයක් ස්ථාපිත කිරීම [තීරු 974-988]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 988-1024]

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**

சபாநாயகரது சான்றுரை [ப: 799]

கொழும்பு துறைமுகத்திலிருந்து 323 கொள்கலன்களை கட்டாய பௌதிகப் பரிசோதனைக்கு உட்படுத்தாமல் விடுவித்தமை தொடர்பில் ஆராய்ந்து அறிக்கையிடுவதற்காகவும் அது குறித்த அதன் முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு: உறுப்பினர் பதிலீடு [ப: 799]

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்** [ப: 801]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 805-846]

**தனி அறிவித்தல் மூல வினா:**

மொத்த உத்தியோகபூர்வ கையிருப்பு நிலைமை மற்றும் வெளிநாட்டு கட்டண நுழைவாயில்கள் மூலம் அந்நியச் செலாவணி இழப்பு [ப: 847]

**பெண்கள் பற்றிய தேசிய ஆணைக்குழுவின் தற்போதைய நிலை:**

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 850]

**சிறப்புரிமை:**

2026.02.06ஆம் திகதி மாண்புமிகு தொழில் பிரதி அமைச்சரால் தெரிவிக்கப்பட்ட கூற்று [ப: 864]

**சிறப்புரிமைப் பிரேரணைகள்:**

அக்குறணை பிரதேச சபையின் உப தவிசாளரால் விடுக்கப்பட்ட அச்சுறுத்தல் [ப: 866]

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**

சிறுவர்களுக்கான மஹாவிலச்சிய கல்வி நிலையம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 868]

**விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம்:**

கட்டளைகள் [ப: 869-972]

**சுங்கக் கட்டளைச் சட்டம்:**

தீர்மானம் [ப: 973]

**மோட்டார் வாகனச் சட்டம்:**

ஒழுங்குவிதிகள் [ப: 973]

**ஒத்திவைப்புப் பிரேரணை:**

இலஞ்சம் மற்றும் ஊழலற்ற தேசத்தைத் தாபித்தல் [ப: 974-988]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 988-1024]

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Speaker's Certificate [Col. 799]

Select Committee to Look into and Report to Parliament on the Release of 323 Containers from the Port of Colombo without Undergoing Mandatory Physical Inspection and Submit Its Proposals and Recommendations in That Regard: Substitution of Member [Col. 799]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 801]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 805-846]

QUESTION BY PRIVATE NOTICE:

Gross Official Reserve Situation and Loss of Foreign Exchange through Foreign Payment Gateways [Col. 847]

CURRENT STATUS OF NATIONAL COMMISSION ON WOMEN:

Statement by Minister of Women and Child Affairs [Col. 850]

PRIVILEGE:

Statement Made by Deputy Minister of Labour on 06.02.2026 [Col. 864]

PRIVILEGE MOTIONS:

Threat Made by Vice Chairman of Akurana Pradeshiya Sabha [Col. 866]

PRIVATE MEMBERS' BILLS:

Mahawilachchiya Education Centre for Children (Incorporation) - [The Hon. Chamara Sampath Dasanayake] - Read the First time [Col. 868]

SPECIAL COMMODITY LEVY ACT:

Orders [Col. 869-972]

CUSTOMS ORDINANCE:

Resolution [Col. 973]

MOTOR TRAFFIC ACT:

Regulations [Col. 973]

ADJOURNMENT MOTION:

Establishment of a State Free from Bribery and Corruption [Cols. 974-988]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 988-1024]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 පෙබරවාරි 18වන බදාදා***
*2026 பெப்ருவரி 18, புதன்கிழமை*
*Wednesday, 18th February, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2026 පෙබරවාරි 17 දින මවිසින් "කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ", "නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන)" සහ "පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ)" නමැති පනත් කෙටුම්පත්වල සහතික සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## II

### කොළඹ වරායේ සිට බහාලුම් 323 ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම
### கொழும்பு துறைமுகத்திலிருந்து 323கொள்கலன்களை கட்டாய பௌதிகப் பரிசோதனைக்கு உட்படுத்தாமல் விடுவித்தமை தொடர்பில் ஆராய்ந்து அறிக்கையிடுவதற்காகவும் அது குறித்த அதன் முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு: உறுப்பினர் பதிலீடு
### SELECT COMMITTEE TO LOOK INTO AND REPORT TO PARLIAMENT ON THE RELEASE OF 323 CONTAINERS FROM THE PORT OF COLOMBO WITHOUT UNDERGOING MANDATORY PHYSICAL INSPECTION AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD: SUBSTITUTION OF MEMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කොළඹ වරායේ සිට බහලුම් 323 ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර කරුණාතිලක මහතා ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 106 හි විධිවිධාන ප්‍රකාරව, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## III

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF THE COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2026 පෙබරවාරි 18වන බදාදා, එනම් අද දින අපර භාග 1.30 ට කාරක සභා කාමර අංක 2 හි දී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the -

(i) Annual Report of the Vocational Training Authority of Sri Lanka for the year 2024; and

(ii) Annual Report and Accounts of the Postgraduate Institute of English of the Open University of Sri Lanka for the year 2024.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන්, 2024 වර්ෂය සඳහා 1990 සුවසැරිය පදනමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කොළඹ මහා නගර සභාව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වගන්තිය සමඟ කියවිය යුතු 44, 123, 124, 125, 126, 126ආ, 128, 132, 132අ සහ 231 වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 නොවැම්බර් 17 දිනැති අංක 2463/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(ii) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 126 වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 දෙසැම්බර් 17 දිනැති අංක 2467/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, ඔබතුමා විසින් දැනටමත් පත් කර තිබෙන, කන්ටේනර් 323 සිද්ධිය සම්බන්ධයෙන් වන විශේෂ කාරක සභාවෙන් ඉල්ලා අස්වීම පිළිබඳව කෙටි පැහැදිලි කිරීමක් කරන්න මා අවසර ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, එවකට මෙම විශේෂ කාරක සභාව සඳහා ඔබතුමා විසින් මා පත් කරන අවස්ථාවේදී නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා හැටියට තමයි මම කටයුතු කළේ. නමුත් මේ වන විට මම කටයුතු කරන්නේ වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා හැටියට. ඇත්තවශයෙන්ම පොදුවේ මේ කන්ටේනර් - බහලුම් - නිදහස් කිරීම සහ ඒ සම්බන්ධයෙන් වන කටයුතු සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකා රේගුව විසින්. ශ්‍රී ලංකා රේගුව ක්‍රියාත්මක වෙන්නේ සම්පූර්ණයෙන්ම මුදල් අමාත්‍යාංශය හරහා. බහලු ආනයන සහ අපනයන කටයුතු සඳහා පහසුකම් සපයන ආයතනයක් හැටියට තමයි ශ්‍රී ලංකා වරාය අධිකාරිය කටයුතු කරනු ලබන්නේ.

කෙසේ වුවත්, එම සිද්ධිය සිදුවන අවස්ථාවේ මම වරාය විෂයය භාර අමාත්‍යවරයා හැටියට කටයුතු නොකළා වුණත්, මේ විශේෂ කාරක සභාවට මම සහභාගි වීම සමහර වෙලාවට කෙනෙකුට අර්ථ දක්වන්න පුළුවන්, සබැඳියාවන් අතර ගැටුමක් ඇති වීමක් හැටියට. ඒ වාගේම මෙම විශේෂ කාරක සභාවේ ක්‍රියාවලියෙන් මතු වන සත්‍යය කිසියම් කෙනෙකුට දුර්වර්ණ කිරීම

සඳහා මා එම විශේෂ කාරක සභාවේ සාමාජිකයෙකු හැටියට කටයුතු කිරීම භාවිත කරන්න පුළුවන්. ඒ වාගේම ඒ මතු වන සත්‍යයේ සුජාතභාවය පිළිබඳව කිසියම් කෙනෙක් ප්‍රශ්න කරන්න පුළුවන්. ඒ පිළිබඳව කල්පනා කරලා මම ඒ විශේෂ කාරක සභාවෙන් ඉල්ලා අස්වෙන්න තීරණය කළා. ගරු කථානායකතුමනි, එම ඉල්ලා අස්වීමට අදාළ ලිපිය මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

මට කාලය ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, එම විශේෂ කාරක සභාවේ සාමාජිකයෙක් හැටියට කටයුතු කරන මමත් මෙතුමා කළ පැහැදිලි කිරීම සම්බන්ධව යම් දෙයක් කියන්න ඕනෑ. මේක සාධාරණ වෙන්න ඕනෑ. එතුමා එම විශේෂ කාරක සභාවේ සාමාජිකයෙකු හැටියට පත් කළා. එම කන්ටේනර් පිට වීම සම්බන්ධයෙන් කාරණා සොයා බැලීම සඳහා අපට එම කාරක සභාවට රේගු නිලධාරින්, ඊළඟට වරාය අධිකාරියේ නිලධාරින් විශාල ප්‍රමාණයක් ගෙන්වන්න තිබෙනවා. එසේ ගෙන්වන්න ඕනෑ නිසාම විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට අපි එතුමාට එතැනදී පෙන්වා දුන්නා, එතුමා එතැන වාඩි වෙලා ඉන්න එකෙන් conflict of interest ප්‍රශ්නයක් එනවා කියලා. ඒ මත තමයි එතුමා ඉල්ලා අස් වුණේ. ඒක මම කියන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කාරණය පැහැදිලියි. මහජන පෙත්සම් පිළිගැන්වීම. *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
හොරාගෙ අම්මගෙන් පේන අහනවා වගේ නේ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු කථානායකතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු අමාත්‍යතුමා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එහෙම නම් අපටත් අවස්ථාව ඕනෑ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු කථානායකතුමනි, එම සිද්ධිය වන අවස්ථාවේදී මම කිසිම විධියකින් වරාය විෂයය සම්බන්ධයෙන් කටයුතු කළේ නැහැ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාරණාව පැහැදිලියි. අපි විවාදයකට යා යුතු නැහැ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ඒ අවස්ථාවේ මම කිව්වේ, ඒ පිළිබඳව කල්පනා කරලා තීරණයක් ගන්නම් කියලායි. එය මගේ තීරණය මිසක්, වෙන කිසිම ඉල්ලීමක් මත නොවෙයි මා එම විශේෂ කාරක සභාවෙන් ඉල්ලා අස් වුණේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාරණාව පැහැදිලියි. විවාදයකට යා යුතු නැහැ.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු චමින්ද ලලිත් කුමාර මහතා**
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)
ගරු කථානායකතුමනි, මීරිගම, කිතලවලාන, මාලදෙණිය, අංක 24 යන ලිපිනයෙහි පදිංචි එම්.ඩී.එන්.ඩී.පී. කුමාරි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු කථානායකතුමනි, ජාඇල, මාකේවිට, ගෝනගහ, අංක 8/ඒ යන ලිපිනයෙහි පදිංචි රණසිංහගේ සිරිපාල මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## වතු කම්කරුවන් මුහුණ දෙන අනතුරු: වැළැක්වීමට ගෙන ඇති පියවර
## பெருந்தோட்டத் தொழிலாளர்கள் எதிர்கொள்ளும் ஆபத்துக்கள்: தடுப்பதற்கான நடவடிக்கை
## HAZARDS FACED BY PLANTATION WORKERS: PREVENTIVE MEASURES

1466/2025

**1. ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වැවිලි වතුවල සේවකයින් වන සතුන්ගේ ප්‍රහාරයන්ට ගොදුරුවීම්, සර්පයින් හා බඹරුන්ගේ දෂ්ට කිරීම් සහ රසායනික ද්‍රව්‍ය නිසා සිදු වන අනතුරුවලට ලක් වන බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් පැමිණිලි ලැබෙන්නේද;

(iii) එසේ නම්, පසුගිය වසර පහ තුළ ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත අනතුරුවලින් සේවකයින් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වැවිලි වතු සේවකයින් සේවා ස්ථානවලදී සේවා යෝජකයින්ගෙන් වාචික, ශාරීරික හෝ වෙනත් ආකාරයෙන් හිංසනයට ලක් වන බව දන්නේද;

(ii) එම හිංසන වළක්වා ගැනීම සඳහා නීතිමය පියවර ගෙන තිබේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பெருந்தோட்டங்களில் தொழிலாளர்கள் காட்டு விலங்குகளின் தாக்குதல்கள், பாம்புக் கடி, குளவிக் கொட்டு மற்றும் இரசாயனப் பதார்த்தங்களால் ஏற்படுகின்ற பாதிப்புகளுக்கும் உள்ளாவதை அறிவாரா என்பதையும்;

(ii) அது தொடர்பான முறைப்பாடுகள் கிடைக்கின்றனவா என்பதையும்;

(iii) ஆமெனில், கடந்த ஐந்து வருட காலப்பகுதியினுள் கிடைக்கப்பெற்றுள்ள முறைப்பாடுகளின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iv) மேற்படி ஆபத்துகளில் இருந்து தொழிலாளர்களைப் பாதுகாப்பதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) பெருந்தோட்டத் தொழிலாளர்கள் தமது தொழிலிடங்களில் தொழில் வழங்குநர்களின் வாய்மூல, உடல் ரீதியான அல்லது வேறு வகையிலான துன்புறுத்தல்களுக்கு உள்ளாவதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி துன்புறுத்தல்களைத் தடுப்பதற்காக ஏதேனும் சட்டரீதியான நடவடிக்கைகள் எடுக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iii) இன்றேல், எதிர்காலத்தில் அது தொடர்பில் சட்டரீதியான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) whether he is aware that plantation workers are vulnerable to wild animal attacks, snake and wasp bites and chemical hazards;

(ii) whether complaints have been received regarding such incidents;

(iii) if so, the number of complaints received in the last five years, separately; and

(iv) the measures that have been taken to ensure the safety of the employees from the said hazards?

(b) Will he also inform this House -

(i) whether he is aware that plantation workers are subjected to verbal, physical or other forms of harassments by employers at work;

(ii) whether any legal action has been taken to prevent such harassments; and

(iii) if not, whether legal action will be taken in this regard in the future?

(c) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii)

- ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වන වැවිලි වතුවල සේවකයින් වනසතුන්ගේ ප්‍රහාරයන්ට ගොදුරු වීම්, සර්පයින් හා බඹරුන්ගේ දෂ්ට කිරීම් සහ රසායනික ද්‍රව්‍ය නිසා සිදු වන අනතුරුවලට ලක්වීම් පිළිබඳව පැමිණිලි වාර්තා වේ.

- එසේ වුවත්, ප්‍රාදේශීය වැවිලි සමාගම්වල වතු සේවකයින් සම්බන්ධ තොරතුරු අමාත්‍යාංශය වෙත වාර්තා නොවේ. මේ සම්බන්ධයෙන් පොදුවේ කතිකාවක් පැවතියද, එම අනතුරු සම්බන්ධයෙන් නිශ්චිත වශයෙන් වාර්තා කරන ලද පැමිණිලි/තොරතුරු අප සතුව නොමැත.

(iii) දෛනිකව වැඩකටයුතු කරගෙන යාමේදී වතු සේවකයන් වනසතුන්ගේ ප්‍රහාරයන්ට ගොදුරු වීම් සහ සර්පයින් හා බඹරුන්ගේ දෂ්ට කිරීම් ආදී අනතුරුවලට ඇතැම් විට භාජන වන අවස්ථා පවතී. කෙසේ වුවද මෙම තොරතුරු නිශ්චිත ලෙස වාර්තා වී නොමැත.

- ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලද තොරතුරු අනුව, වර්ෂයකට දළ වශයෙන් බඹරුන්ගෙන් සිදුවන අනතුරු 500ක් පමණ වාර්තා වේ.

- ජනතා වතු සංවර්ධන මණ්ඩලය යටතේ පාලනය වන වතුයායවල -තේ වතුවල- පසුගිය වසර 05 තුළ බඹර ප්‍රහාරවලට ලක්වීම් 19ක්, සර්ප දෂ්ට කිරීම් 6ක්, වල් අලි ප්‍රහාර 5ක් සහ දෙබර ප්‍රහාර 1ක් වාර්තා වී ඇත.

(iv) රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් පහත පරිදි පියවර ගෙන තිබේ:

- ඉවත් කළ හැකි මට්ටමේ පවතින බඹර වද කම්කරුවන් යොදවා ඉවත් කිරීම.

- තේ පඳුරු තුළ බඹර වද ඇති ස්ථාන හඳුනාගෙන එම ස්ථානවලට වැඩ සඳහා සේවකයන් නොයෙදීම.

- හදිසි අවස්ථාවක බඹර ප්‍රහාරවලට ලක්වීමකදී ඔවුන් සුදුසු වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය මඟින් පහත පරිදි පියවර ගෙන තිබේ:

- ක්ෂේත්‍ර මායිම් එළිපෙහෙළි කර අවශ්‍ය ආරක්ෂාව සැපයීමට කටයුතු කිරීම.

- බඹරු වද බඳින ගස්වල අතු ඉවත් කිරීම දිගටම කරගෙන යෑම.

- බඹර කූඩු ඉවත් කිරීම සිදු කිරීම.

- වතු සේවකයන් හට සේවා කාලය තුළ අවශ්‍ය ආරක්ෂක ආවරණ -මුඛ ආවරණ, අත්වැසුම් හා පාවහන් ආදිය- ලබා දී, ඒවා පැළඳීමට උපදෙස් ලබා දීම.

ප්‍රාදේශීය වැවිලි සමාගම්වලින් පහත පරිදි පියවර ගෙන තිබේ:

- මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම් විසින් මධ්‍යම පළාත් තේ වතු ආශ්‍රිත ජන ජීවිතයට තර්ජනයක්ව ඇති බඹර ප්‍රහාර වළක්වා ගැනීම සම්බන්ධයෙන් බිඟු සම්පත සුරැකීමේ සංවිධානය විසින් ප්‍රාදේශීය වැවිලි සමාගම් සමඟ පුහුණු වැඩසටහන් සංවිධානය කර තිබුණි.

- රසායනික ද්‍රව්‍ය ආරක්ෂිතව භාවිත කිරීමට හා අනතුරු වළක්වා ගැනීමට වතු කළමනාකාරිත්වය විසින් නිරන්තරයෙන් වතු සේවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරනු ලබනවා. රසායනික ද්‍රව්‍ය යොදන සේවකයන් සඳහා පෞද්ගලික ආරක්ෂක උපකරණ සහ රසායනික ද්‍රව්‍ය ඉසීමෙන් පසු ස්නානය සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම සිදු කරන බවට වාර්තා වෙනවා.

- ජාතික හා අන්තර්ජාතික පාරිසරික තත්ත්ව සහතික - Rainforest Alliance Certificates - ලබා ගැනීමේදී නිර්ණායක ලෙස රසායනික ද්‍රව්‍ය හැසිරීම සහ භාවිතය පිළිබඳව අනිවාර්යයෙන් සලකා බැලීම සිදු කරනු ලබනවා.

(ආ) (i) තොරතුරු වාර්තා වී නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මම අසන ලද ප්‍රශ්නයේ (ආ) (i) යටතේ සඳහන් වන ආකාරයට, වතුකරයේ සේවය කරන කාන්තාවන් ඇතුළු සේවක පිරිස් වාචික හිංසනවලටත් ලක් වෙනවා. වතුකරයේ වැඩියෙන්ම සේවය කරන්නේ කාන්තාවන්. ඒ කාන්තාවන් විවිධ හිංසනවලට ලක් වෙනවා. විශේෂයෙන්ම වතුවල පාලනාධිකාරිය විසින් වාචිකව පවා මේ අයව පීඩනයට පත් කරන අවස්ථා බොහොමයක් තිබෙනවා. ඒ වාගේ අවස්ථාවල නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට වාතාවරණයක් තිබෙනවා ද කියන එකත් අපි හඳුනා ගන්න ඕනෑ. ඒ කාරණය සම්බන්ධව ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා නම් හොඳයි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමිය නඟන අතුරු ප්‍රශ්නයට අනුව කම්කරුවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වෙනවා නම්, ඔවුන් අඩන්තේට්ටම්වලට ලක් වෙනවා නම් පැමිණිලි කළ යුතු සහ මැදිහත් විය යුතු ආයතනය කම්කරු අමාත්‍යාංශය කියායි මම විශ්වාස කරන්නේ. කෙසේ වුණත්, අපිට වැවිලි ක්ෂේත්‍රය සම්බන්ධයෙන් යම් වගකීමක් පැවරී තිබෙන නිසා එවැනි සිද්ධි විටින් විට අපටත් වාර්තා වෙනවා. එවැනි සිද්ධි වාර්තා වුණාම අපි ඒවා නීතිමය අංශවලට යොමු කිරීම් කරනවා. ඒ වාගේම වතු පාලකයන් සමඟ සාකච්ඡා කරලා, එවැනි අවස්ථාවලදී අපේ පැත්තෙන් ගත හැකි අදාළ ක්‍රියාමාර්ග ගන්නා බවත් මම දැනුම් දෙන්න කැමැතියි.

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපේ ආණ්ඩුව පත් වනකොට වතු පාරවල් ප්‍රාදේශීය සභාවටවත්, වෙනත් කිසිදු ආයතනයකටවත් භාර වෙලා තිබුණේ නැහැ. ඒ වාගේම ඒවා PRDA එකටවත්, RDA එකටවත් භාර වෙලා තිබුණේ නැහැ. එහෙත් මේ අවුරුද්ද තුළ අපි ගොඩක් වතු පාරවල් හදලා තිබෙනවා. ඒ පාරවල් නඩත්තු කිරීම සම්බන්ධයෙන් වතු companies එක්ක, වතු අධිකාරින් සමඟ අමාත්‍යාංශ මට්ටමින් කථා කරලා තිබෙනවාද, ඒවා නඩත්තු කිරීමේ වගකීම කා සතුද කියන එක මම ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු මන්ත්‍රීතුමියනි, වතු සමාගම් ඇතුළත තිබෙන පාරවල් එම වතු සමාගම්වලට තමයි අයිති. ඒ පාරවල් පළාත් පාලන ආයතනවලට හෝ වෙනත් රාජ්‍ය ආයතනයකට අයත් ඒවා නොවෙයි. නමුත්, ඔබතුමිය කිව්වා වාගේ අපේ රටේ වතු පාරවල් නඩත්තු කිරීම ඉතාම දුර්වල මට්ටමක පවතින නිසාත්, ඒ වතු අභ්‍යන්තරයේ මලෛයහම් ප්‍රජාව ලයින් කාමරවල ඉන්න නිසාත් අපට රජය පැත්තෙන් ඔවුන්ට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීමේ වගකීමකුත් පැවරී තිබෙනවා. ඒ වාගේම වතු සම්බන්ධයෙන් ඉතිහාසයේ එළඹිලා තිබෙන ගිවිසුම්වලට අනුව ඒ වතු පාරවල්, ලයින් කාමර නඩත්තු කිරීමේ වගකීම විශේෂයෙන් පැවරෙන්නේ වතු සමාගම් වෙත. විශේෂයෙන් වතුකරයේ ඉන්න ජනතාව ඉතිහාසයේ පීඩාවට පත් වුණා වාගේම දැනටත් පීඩාවට පත් වන නිසා ඔවුන්ට පහසුකම් ලබා දීමේ කටයුතු අපි රජයක් හැටියට සැලකිය යුතු මට්ටමින් සිදු කරනවා.

මේ වනකොටත් අපේ අමාත්‍යාංශයේ යටිතල පහසුකම් අංශයෙන් රුපියල් ලක්ෂ 1,000ක මුදලක් වතු සමාගම් ඇතුළත තිබෙන පාරවල් වාගේම වතු ජනතාව ඉන්න ප්‍රදේශවල පාරවල් පිළිසකර කිරීම සඳහා යොදවා තිබෙනවා. වතු සමාගම් එක්කත් සාකච්ඡා කර ඒ පාරවල් නඩත්තු කරන්න කියන එක පිළිබඳව ඔවුන්ව දැනුවත් කරමින් ඉන්නවා. කෙසේ නමුත්, ඉදිරියේදී අපි රජයක් හැටියට ඒ ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීමට මීට වඩා මැදිහත් වීමක් කරන්න බලාපොරොත්තු වන බව දන්වන්න කැමතියි.

## 2020 සිට රත්නපුර දිස්ත්‍රික්කයේ වතු නිවාස සංවර්ධනය: වෙන් කළ මුදල

## 2020ஆம் ஆண்டு முதல் இரத்தினபுரி மாவட்டத்தில் மேற்கொள்ளப்பட்ட தோட்டப்புற வீடுகளின் அபிவிருத்தி: ஒதுக்கப்பட்ட நிதி

## DEVELOPMENT OF ESTATE HOUSES IN RATNAPURA DISTRICT FROM 2020: ALLOCATIONS

1500/2025

**2. ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති වතු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා එම වතු නිවාස සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වතු නිවාස සංවර්ධනය කිරීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்திலுள்ள தோட்டப்புற வீடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) 2020ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை மேற்படி தோட்டப்புற வீடுகளை அபிவிருத்தி செய்ய ஒதுக்கப்பட்ட நிதி ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) அத்தோட்டப்புற வீடுகளை அபிவிருத்தி செய்வதற்கு எதிர்காலத்தில் மேற்கொள்ளப்படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House the -

(i) number of estate houses in the Ratnapura District;

(ii) amount of funds that have been allocated for the development of those estate houses from 2020 to date, separately for each year; and

(iii) measures to be taken in the future to develop those estate houses?

(b) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| නිවාස වර්ගය (Type of house) | නිවාස ගණන (Total number of houses) |
|---|---|
| තනි නිවාස සංඛ්‍යාව - (Single houses) | 3,717 |
| යුගල නිවාස සංඛ්‍යාව - (Twin cottages) | 2,869 |
| තනි පේළි ලයින් නිවාස සංඛ්‍යාව - (Line rooms - single barrack) | 6,876 |
| ද්විත්ව පේළි නිවාස සංඛ්‍යාව - (Line rooms - double barrack) | 8,605 |
| මහල් (තට්ටු) පේළි නිවාස සංඛ්‍යාව - (Upstair line rooms) | 9 |
| තාවකාලික මඩු - (Temporary sheds) | 2,159 |
| එකතුව - (Total) | 24,235 |

(ii) 01. 2020 වර්ෂයේ සිට වතු නිවාස සංවර්ධනය සඳහා වෙන් කරන ලද මුදල්

| වර්ෂය | වෙන් කරන ලද මුදල (රුපියල් මිලියන) |
|---|---|
| 2020 | 680.79 |
| 2021 | 1,000 |
| 2022 | 300 |
| 2023 | 500 |
| 2024 | 500 |
| 2025 | 767 |

02. රත්නපුර දිස්ත්‍රික්කය සඳහා 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වෙන් කරන ලද ප්‍රතිපාදන ඇමුණුම් i සහ ii වශයෙන් ඉදිරිපත් කර ඇත.

2021 වර්ෂයට අදාළව රුපියල් මිලියන 58.5යි. 2025 වර්ෂයට අදාළව රුපියල් මිලියන 10.2යි.

(iii) මේ වන විට ක්‍රියාත්මක ව්‍යාපෘති සම්බන්ධයෙන් ගත්තොත්, ඇමුණුම iii හා iv හි සඳහන් නිවාස ව්‍යාපෘති අපි කඩිනමින් නිම කරන්නට කටයුතු කරමින් තිබෙනවා.

ඒවා ටිකක් විශාල ඇමුණුම් නිසා මම ඔබතුමාට බලා ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

ඇමුණුම් i, ii, iii හා iv **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු ඇමතිතුමනි, රත්නපුර දිස්ත්‍රික්කය ගත්තොත්, ඔබතුමාගේ සංඛ්‍යාලේඛන අනුව මේ වන විට මඩුවල ජීවත් වෙන ප්‍රමාණය පවුල් දෙදහස් ගණනක්. අපි දන්නවා, රත්නපුර දිස්ත්‍රික්කයේ රක්වාන ආසනයේ, ඒ වාගේම බලංගොඩ, රත්නපුර වාගේ ප්‍රදේශවල විශාල වතු තිබෙන බව. මේ වතුවල ජනතාව ජීවත් වන ලැයිම් කාමර වසර 200කට පමණ පෙර තමයි ඉදි කරලා තිබෙන්නේ. ඒ ලැයිම් ගත්තොත්, අර මඩුවේ ඉන්නවා වාගේමයි, කාමර දෙකක් තුනක් තමයි තිබෙන්නේ. එක ලැයිමේ ජීවත් වෙනවා, පවුල් තුන හතරක්. රත්නපුර දිස්ත්‍රික්කය තුළ ඒ වාගේ දමිළ පවුල් 30,000කට වැඩි ප්‍රමාණයක් ජීවත් වෙනවා. ඉතින් මේ අයට නිවාස පහසුකම් සකස් කරන්න ආණ්ඩුව වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවාද කියලා අපි දැනගන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා පසුගිය මැතිවරණයේදී ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කළා, මේ පවුලකට වතුකරයෙන් පර්චස් 10ක් ලබා දෙනවා කියලා. ඒ පර්චස් 10ක් ලබා දීලා මොන ආකාරයටද මේ නිවාස කඩිනමින් ඉදි කරන්න කටයුතු කරන්නේ? මොකද, වසර ගණනාවක් තිස්සේ මේ අය මේ ගැන බලාපොරොත්තුවෙන් ඉන්නවා. පසුගිය ආණ්ඩු කාලයේ ඉන්දියානු ආධාර යටතේ යම් වැඩසටහනක් කළා. ඒ වාගේම ගරු කථානායකතුමනි, අපි දැක්කා, පසුගිය කාලයේ ඉන්දියානු ආධාර යටතේ නිවාස ඉදි කරන වැඩසටහනක් ගෙනැල්ලා තිබුණා. සූරියකන්ද ප්‍රදේශයේ "අලුත් කැල්ල" කියන කොටසේ නිවාස ඉදි කරන්න සකස් කරලා තිබුණත්, මේ වෙනකම් තවම ඒක පටන් ගත්තේවත් නැහැ. ඒ, නාය යන ප්‍රදේශයක්. ඉතින් කඩිනමින් මේ සඳහා විසඳුම් ලබා දෙන්න වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවාද කියන එක තමයි මම පළමුවන අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ විශේෂයෙන් මලෙයහම් ප්‍රජාව තමන්ට කියලා ඉඩම් කොටසක්, තමන්ට කියලා නිවසක් නැතිව ජීවත් වනවා විතරක් නොවෙයි, ඔවුන් සැලකිය යුතු දුෂ්කරතාවකට පත් වන බව රත්නපුර දිස්ත්‍රික්කයට අදාළ පිළිතුර තුළින්ම පැහැදිලි වනවා. ඒ කියන්නේ, ලැයිමක්වත් නැති, තාවකාලික මඩු කියන වර්ගයේ ජීවත් වන පවුල් ප්‍රමාණය 2,159ක්. මේක රටේම ගත්තාම විශාල ප්‍රමාණයක්. රත්නපුර දිස්ත්‍රික්කයට වඩා නුවරඑළිය, බදුල්ල, මහනුවර, මාතලේ වාගේ ස්ථානවල මේක ටිකක් වැඩියි කියන එකත් මම මතක් කරන්න කැමැතියි. මේ සඳහා දැනට අපේ රජය ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියන එක තමයි ඔබතුමා විමසුවේ.

නව රජය හැටියට අපි තීන්දුවක් ගත්තා, වතුකරයේ ජනතාවට පර්චස් 10ක ඉඩමක අයිතිය ලබා දෙන්න. මොකද, මලෙයහම් ප්‍රජාවට මේ රටේ ඉඩම්වල අයිතියක් ලැබිලා නැහැ. ඒ නිසා අපි පර්චස් 10ක ඉඩමක් ලබා දෙන්න තීන්දු කළා. ඔබතුමා ප්‍රශ්න කළා වාගේම මඩුවල විතරක් නොවෙයි, මීට වඩා දුෂ්කර ස්ථානවලත් ජනතාව ජීවත් වනවා. පසුගිය කාලවල යම් යම් නාය යාම්වලට ගොදුරු වීම නිසා තවම ලැයිමක් නැතිව, මඩුවක් නැතිව, අනාථ කඳවුරු එහෙම නැත්නම්, සුරක්ෂිතතා කඳවුරුවල ජීවත් වන පවුල් විශාල ප්‍රමාණයක් රටේ ඉන්නවා.

මගේ දිස්ත්‍රික්කය ගත්තාම, 2023දී එවකට තිබුණු ආණ්ඩුව කාලයේ නාය යෑමක් හේතුවෙන් පවුල් 50ක් වසා දැමූ තේ ෆැක්ටරියක් තුළ අවුරුදු දෙකහමාරක් තිස්සේ ජීවත් වනවා. දැන් අපි ඔවුන්ට ගෙවල් හදාගෙන යනවා වේගයෙන්. මම හිතනවා, අපට තව මාස දෙකකින් විතර ගෙවල් 50ක් එතැන ලබා දෙන්න පුළුවන් කියලා. ඒ වාගේම සාමසර කන්ද ප්‍රදේශයේ අපට වාර්තා වෙනවා, නුවරඑළිය දිස්ත්‍රික්කයේ තවත් ස්ථාන ගණනාවකම අපට වාර්තා වෙනවා. අපි ඒ සඳහා දැනට අනුගමනය කරනවා, වැඩ පිළිවෙළක්. මා ඉන්දියානු රජයට, නරේන්ද්‍ර මෝදි අගමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා, අපේ රටේ මේ ප්‍රජාව වෙනුවෙන් ලබාදෙන දායකත්වය සම්බන්ධයෙන්. ඉන්දියානු ආධාර ක්‍රමය යටතේ අපි නිවාස 10,000ක ව්‍යාපෘතියක් මේ වන විට කරගෙන යනවා. ඉන්දියානු රජයෙන් නිවාස හදා ගන්න ආධාරයක් ලබා දෙනවා. ඒ සඳහා යටිතල පහසුකම් සකස් කිරීම - වතුර ලබා දීම, පාරවල් සකස් කිරීම, විදුලිය ලබා දීම - අපි රජය හැටියට මුදල් යොදවලා කරනවා; ලංකා රජයෙන් මහජන බදු මුදලින් අපි ඒ කටයුතු කරනවා.

ඊට අමතරව රජයෙන් පර්චස් 10ක ඉඩමක් ලබා දෙනවා. ඒ ක්‍රමය යටතේ අපි ගිය අවුරුද්දේ -2025 වසරේ- ලංකා ඉතිහාසයේ පළමු වතාවට මලෙයහම් ප්‍රජාව වෙනුවෙන් නිවාස 2,026ක් ලබා දීමේ හිමිකම් පත්‍ර ගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් බණ්ඩාරවෙලදී ලබා දුන්නා. ඒ නිවාසවල මූලික කටයුතු මේ වන විට ආරම්භ කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මේ නිවාස හදනකොට අපිට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. කඳුකරවල නිවාස හදන එක තැන්නේ තරම් පහසුවක් වෙන්නේ නැහැ. "දිට්වා" සුළි කුණාටුවෙන් පස්සේ අපි මුහුණ දීපු ප්‍රශ්නය තමයි මුලින් තෝරා ගත්ත, නිර්දේශ කරපු ඉඩම් දෙවැනි වටයේදී සමහර වෙලාවට

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා ]

NBRO එක ගිහිල්ලා බලලා අපිට පැහැදිලි කරනවා, අලුත් තත්ත්වයන් අනුව ඒ තැන්වල නිවාස හැදීම දැන් සුදුසු නැහැ කියලා. ඒ නිසා අපි ඒවා සමාලෝචනය කරලා නිවාස හදන්න පටන් ගන්නවා. කොහොම නමුත්, නිවාස 2,026ක් අලුතෙන් හැදෙනවා. අපි 2026 වසරේදී බලාපොරොත්තු වෙනවා ඉන්දියානු නිවාස යෝජනා ක්‍රමය යටතේ තව නිවාස 2,600කට වැඩි ප්‍රමාණයක් ඉදි කරන්න.

ඒ වාගේම අපි නිවාස ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ වෙනකොට ඇමතිතුමාගේ පාර්ශ්වයෙනුත් ලංකාවේ නිවාස 50,000කට වඩා සැදීමට සැලසුම් වෙනවා, අඩු ආදායම්ලාභීන්ට සහ මේ වාගේ ප්‍රජාවට ලබා දෙන්න. ඒ අතරෙත් වැවිලි ක්ෂේත්‍රයට නිවාස විශාල ප්‍රමාණයක් ලැබෙනවා. ඒ වාගේම "දිට්වා" සුළි කුණාටුවෙන් වැඩිම හානි සිදු වුණේ ලැයිම් කාමරවල හිටපු ජනතාවට. අපි ඉස්සෙල්ලාම තීන්දු කරලා තිබුණේ "දිට්වා" සුළි කුණාටුවෙන් පූර්ණ හානි වෙච්ච නිවාසයකට රුපියල් ලක්ෂ 50ක් ලබා දෙන්නයි. ඒ අනුව අපි වතුකරයේ ජනතාවටත් - තමන්ට ඉඩමක් නැතත්, ලැයිමේ හිටියත් ඔවුන්ටත්- ඒ හිමිකම ලබා දෙන්න ගරු ජනාධිපතිතුමා සාකච්ඡා කරලා තිබෙනවා. ඒ අනුව මේ කියන ක්‍රමවලට අමතරව "දිට්වා" සුළි කුණාටුවෙන් හානියට පත්වෙච්ච ජනතාවටත් අපේ රජයේ ප්‍රතිපාදන, ආධාර යටතේ නිවාස ලබා දීමේ වැඩ පිළිවෙළක් ඉදිරියේදී කඩිනමින් ක්‍රියාත්මක කරන බව ඔබතුමාට මතක් කරන්න කැමැතියි.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපි දන්නවා වතුකරයේ විශාල ඉඩම් ප්‍රමාණයක් තිබෙන බව. රත්නපුර දිස්ත්‍රික්කය ගත්තොත්, ඕපාතවත්ත, හුණුවලවත්ත වාගේ මුඩු බවට පත් වෙච්ච ඉඩම් අක්කර දහස් ගණනින් තිබෙනවා. වතු සමාගම් මඟින් ඒවායේ පාලනය නිසි ලෙස සිදු වන්නේ නැහැ. වත්තේ තේ දලු තිබෙන ප්‍රමාණය කඩා ගන්නවා මිස ඒ ඉඩම් සංවර්ධනයක් වෙන්නේ නැහැ. අපේ පක්ෂයේ -සමඟි ජන බලවේගයේ- ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාත් පසුගිය කාලයේ කිව්වා, ඒ වතු ප්‍රජාවට ඒ ප්‍රදේශයේ මුඩු ඉඩම් ලබා දීලා ඒවායේ තේ, කුරුඳු, ගම්මිරිස් වාගේ වැවිලි භෝග වගා කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා. එතකොට ඔබතුමන්ලා කිව්වේ පර්චස් 10ක් ලබා දෙනවා කියලායි. වසර සිය ගණනාවක සිටම ඒ සමහර ප්‍රදේශවල අක්කර දහස් ගණන් මුඩු ඉඩම් බවට පත් වෙලා තිබෙනවා. එසේ පර්චස් 10ක් ලබා දෙනවා වාගේම ඒ මුඩු ඉඩම්වල වගා කටයුතු කරන්න අවස්ථාව ලබා දුන්නොත් ඒවායෙන් විශාල ආදායමක් ලබා ගන්න අපට පුළුවන්. අද කුරුඳු කිලෝවක් රුපියල් 5,000ක් 6,000ක් වෙනවා; ගම්මිරිස් කිලෝවක් රුපියල් දෙදහස් ගණනක් වෙනවා. ඒවා වගා කළොත් අපනයනය කරලා විශාල ආදායමක් ලබා ගන්න අපට පුළුවන්. ඒ මුඩු ඉඩම් දිහා බලාගෙන ඒ වතු ආශ්‍රිත දමිළ ජනතාවත් ඒ වාගේම සිංහල ජනතාවත් ජීවත් වෙනවා. ඒ අය ඒ ඉඩම් දිහා බලාගෙන ඉන්නවා විතරයි. ඒ අයට වවන්න ඉඩම් නැහැ. ඒ අය ලැයිම් කාමරයට කොටු වෙලා ඉන්නවා. මේ සඳහා ඔබතුමා මොන වාගේ වැඩ පිළිවෙළක්ද සකස් කරන්නේ කියලා, දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට මම මේ අවස්ථාවේදී අහනවා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නඟන ප්‍රශ්නය නිවැරැදියි. අපේ රටේ කඳු යායවල වගා නොකරපු වතු සමාගම්වල ඉඩම් තිබෙන බව ඒ ප්‍රදේශවලට ගියාම අපට පෙනෙනවා. ඒකට බලපාන ප්‍රධාන හේතුව මෙයයි. අපටත් ඕනෑ ඒවා වගා කරවන්නයි. වතු සමාගම් එක්ක ගහපු ගිවිසුම් බරපතළයි. එම නිසා වගා කරන්න ඉඩමක් ගන්න එක විතරක් නොවෙයි තිබෙන ප්‍රශ්නය. මෙතැන ඉන්න සමහර මන්ත්‍රීවරු ඇවිල්ලා අපට කියනවා, "පාසලක් නාය ගියා. පාසලට මේ වත්තෙන් ඉඩමක් දෙන්න" කියලා; "රෝහලක් නාය ගියා. ඒකට ඉඩමක් දෙන්න" කියලා. ඔබතුමන්ලාගේ පාලන කාලයේ ඉඳන් ඔය ප්‍රශ්නය තිබෙනවා. විශේෂයෙන් මාතර දිස්ත්‍රික්කයේ දෙණියාය රෝහල නාය ගිහින් අවුරුදු ගණනක් ගත වෙලාත් ඒ රෝහල සඳහා ඉඩමක් වතු සමාගමෙන් ගන්න බැරිව තිබුණා. අපේ රජය බලයට ආවාට පසුව ඒ සමාගම් එක්ක කථා කරලා, මහන්සියක් වෙලා තමයි දෙණියාය රෝහලට වත්තේ ඉඩමක් ලබා දුන්නේ.

"දිට්වා" සුළි කුණාටුවෙන් පසුවත් රාජ්‍ය අංශයේ කටයුතු සඳහා, ආගමික ස්ථාන සඳහා, ජනතාව සඳහා සැලකිය යුතු ඉඩම් අවශ්‍යතාවක් තිබෙනවා. නමුත්, එවකට එළඹ තිබෙන ගිවිසුම් අනුව රජයේ අවශ්‍යතාවකට වුණත් ඉඩම් කැබැල්ලක් ලබා ගැනීම ලෙහෙසි පහසු නැහැ, ගරු කථානායකතුමනි. එය ඉතාම අපහසු තත්ත්වයක් වෙලා තිබෙනවා. ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, ඒ එළඹී තිබෙන ගිවිසුම් නිසා ඇති වී තිබෙන දුෂ්කරතායි. නමුත්, රජයක් හැටියට අපට ඒක කිය කියා ඉන්න අයිතියක් නැහැ. අපේ ආණ්ඩුව කාලයේ හෝ අපි ඒ සඳහා පිළියමක් යොදන්න ඕනෑ. ඒක එක කාරණයක්. අනෙක් අතට, ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවටම ඇවිත් පැහැදිලිව කිව්වා, ඉදිරියේදී අපේ රටේ ඌන උපයෝජිත ඉඩම් තිබෙන්න බැහැ, එම ඉඩම් වගා කිරීම සඳහා යොදවන්න ඕනෑ, වගා කිරීම සඳහා ආර්ථික හැකියාවක් තිබෙන, අවශ්‍යතාවක් තිබෙන අයට ඒවා දිය යුතුව තිබෙනවා, ඒවා රටට ප්‍රයෝජනවත් විධියට යොදවන්න ඕනෑ කියලා. ඒ අනුව අපි වැවිලි සමාගම්වලටත් දැනුම් දීලා තිබෙනවා, තමන්ගේ ඌන උපයෝජිත ඉඩම් එක්කෝ තමන් විසින්ම වගා කරන්න, එහෙම නැත්නම් අතුරු බදු දෙන්න කියලා. මොකද, ඒ අයට පුළුවන් ගහපු ගිවිසුම්වලට අනුව ඒ ඉඩම් අතුරු බදු දෙන්න. වැවිලිකරයේ කම්කරු ජනතාවට ඉඩමක් දෙන එකට අපේ අකමැත්තක් නැහැ. හැබැයි, ඒ ගිවිසුම අනුව එහෙම ලබා දෙන්න රජයක් හැටියට අපට පුළුවන්කමක් නැහැ. සමාගමට ඕනෑ නම් පුළුවන්, අතුරු බදු දෙන්න. ඒ විධියට ලබා දෙන්න ගියාම වෙන වෙන ප්‍රශ්නත් පැන නඟින බව අපි දකිනවා. ඒ හින්දා අපි ඒ කාරණය වැවිලි සමාගම්වලට දැනුම් දීලා තිබෙනවා.

ඒ වාගේම, රජය සතු වැවිලි සමාගම් කිහිපයක් තිබෙනවා. ඒ කියන්නේ, අප සතුව රාජ්‍ය වැවිලි සංස්ථාව තිබෙනවා, ජනවසම තිබෙනවා, Elkaduwa Plantations තිබෙනවා. ගරු ජනාධිපතිතුමා ගත්තු තීන්දුව අනුව, ඒවායේ තිබෙන ඌන උපයෝජිත ඉඩම් බදු දීම සඳහා මීට මාස 4කට උඩදී පත්තරේ දැන්වීම් පළ කරලා ඉඩම් අක්කර තුන්දහස් ගණනක් බදු දීමට යොදවා තිබෙනවා. ඒවා බදු දීමේ කටයුතු දැන් අවසන් අදියරේ තිබෙනවා. තවත් මාස එකහමාරක් වගේ කාලයක් යනකොට ඔය කියපු රාජ්‍ය වතුවල තවත් අක්කර 5,000ක ප්‍රමාණයක් බදු දීම සඳහා පුවත් පත් දැන්වීම් පළ කරනවා. ඒ කාලයේ වගේ යටින් දෙන්නේ නැහැ. පුවත් පත් දැන්වීම් දාලා, සුදුසුකම් තිබෙන කට්ටියට ඒ ඉඩම් ගන්න අවස්ථාව ලබා දෙනවා. ඒ වාගේ වැඩ පිළිවෙළක් දැනට ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

ඒ වාගේම, අපි අදහසක ඉන්නවා, පෞද්ගලික වැවිලි සමාගම් තමන් සතු ඉඩම් තමන් විසින් සංවර්ධනය කරන්නේ නැත්නම් හෝ ඒවා අතුරු බදු දීලා හරි සංවර්ධනය නොකරන්නේ නම් ඒවා සම්බන්ධයෙන් ඉදිරියේදී රජය විධියට තීන්දුවක් ගන්න. මොකද, රටක් හැටියට අපට කල්පනා කරන්න වෙනවා නේ. ඒ සඳහා අපි සූදානම්. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට අවසාන වශයෙන් කියන්නේ මේකයි. ඔබතුමන්ලා මේ කාර්යයන්ට සහයෝගය

දෙන්න. වැවිලිකරයේ ජනතාව වෙනුවෙන් ප්‍රශ්න අහනවා වාගේම ඒ කම්කරුවන්ගේ වැටුප් වැඩි කරන කොට ගිහින් පැමිණිලි කරන්න එපා; බාධා කරන්න එපා; මෙතැනදී එරෙහි වෙන්න එපා. එහෙම නොකරනවා නම් මේවා කරන එක පහසුයි. අපට ඔබතුමන්ලාගේ සහයෝගය දෙනවා නම් මේවා කරන්න පුළුවන් කියන කාරණයත් මා මතක් කරන්න කැමැතියි.

## යටියන්තොට නාගස්තැන්න වතුයාය: විස්තර
### யட்டியாந்தோட்டை, நாகஸ்தென்ன தோட்டம்: விபரம்
### NAGASTENNA ESTATE, YATIYANTOTA: DETAILS

1542/2025

**3. ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යටියන්තොට, නාගස්තැන්න වතු යාය මේ වන විට අයත් වන්නේ කවුරුන්හටද;

(ii) එම වතු යායේ කළමනාකරණය ප්‍රශස්ථ මට්ටමක තිබේද;

(iii) එම වතු යායේ ඉඩම් පෞද්ගලික පාර්ශ්වයන් විසින් අත්පත් කර ගන්නා බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ආර්ථික, පාරිසරික හා සමාජීය වශයෙන් වටිනා ඉහත වතු යායේ ඉඩම් සංවර්ධනය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யட்டியாந்தோட்டை, நாகஸ்தென்ன தோட்டம் இன்றளவில் யாருக்குச் சொந்தமானது என்பதையும்;

(ii) அந்தத் தோட்டத்தின் முகாமைத்துவம் சிறந்த மட்டத்தில் காணப்படுகின்றதா என்பதையும்;

(iii) அந்தத் தோட்டத்துக்குரிய காணிகள் தனியாரால் கைப்பற்றப்படுவதை அறிவாரா என்பதையும்;

(iv) ஆமெனில், அது தொடர்பாக மேற்கொள்ளப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) மேற்படி தோட்டத்திலுள்ள பொருளாதார, சுற்றாடல் மற்றும் சமுதாய ரீதியில் பெறுமதிமிக்க காணிகளை அபிவிருத்தி செய்வதற்கு மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக் கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) the name of the present owner of the Nagastenna Estate in Yatiyantota;

(ii) whether the management of the said estate is at an optimal level;

(iii) whether he is aware that the lands of the said estate are being encroached by private parties;

(iv) if so, the measures that have been taken in that regard; and

(v) the measures that have been taken to develop the lands of the said estate, which are economically, environmentally and socially valuable?

(b) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) යටියන්තොට, නාගස්තැන්න වතුයාය මේ වන විට අයත් වන්නේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයටය. එහි වපසරිය හෙක්ටෙයාර 482.84කි.

(ii) එම වතුයායේ කළමනාකාරිත්වය ප්‍රශස්ත මට්ටමක නොතිබූ අතර, එයට හේතු වී තිබුණේ මූලා දුෂ්කරතා මත වගාව සඳහා අවශ්‍ය යෙදවුම් - ඒ කියන්නේ, පොහොර සහ රසායනික බෙහෙත් ආදිය - නොයෙදීම සහ නැවත වගා කිරීම සිදු නොකිරීමය. එහෙත් මේ වන විට අවශ්‍ය පොහොර සහ රසායනික ද්‍රව්‍ය ලබා දෙමින් පවතී.

පසුගිය කාලයේ අවුරුදු ගණනක් - අවුරුදු 10කට ආසන්න කාලයක් - ජනවසම සමහර ඉඩම්වලට, රාජ්‍ය වැවිලි සංස්ථාවේ ඉඩම්වලට පොහොර දාලා නැහැ. නැවත සිටුවීම සිදු කරලා තිබුණේ නැහැ.

(iii) මෙම වතුයායේ පදිංචිකරුවන් 164දෙනෙක් සිටිති. ඒ අය අතරින් 99 දෙනෙක් අනවසර පදිංචිකරුවන්.

(iv) මෙම වතුයායට පිටතින් පැමිණ අනවසරයෙන් ඉඩම් භුක්ති විඳින පස්දෙනෙකු ඉවත් කිරීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇත. එහෙත් වතුයායේ වතු කම්කරුවන්ගේ ඇවෑමෙන් වතුයායේ අනවසරයෙන් පදිංචිව සිටින අය ඉවත් කිරීම සමාජීය ප්‍රශ්නයක්ව පවතින බැවින් ඔවුන් ඉවත් කිරීම සඳහා මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොමැත.

(v) මෙම වතුයායේ පවතින වගාව සාරවත්ව පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය යෙදවුම් සහ කළමනාකරණ උපදෙස් ලබා දී ඇත.

එසේම, වගා කළ හැකිව පවතින හෙක්ටෙයාර 138.26ක් ඌන උපයෝජිත ඉඩම්/දේපළ ප්‍රශස්ත උපයෝජනය සඳහා සුදුසු ආයෝජකයින් වෙත

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

ලබා දීමේ වැඩසටහන යටතේ පෞද්ගලික අංශයට බඳු දීමට, ආයෝජකයින් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
ස්තුතියි, ගරු අමාත්‍යතුමනි.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ නාගස්තැන්න කියන්නේ කඳු සහිත ප්‍රදේශයක පිහිටා තිබෙන විශාල තැනිතලා බිමක්. ඒ එක කඳු කලාපයක වර්ධනයෙන් පූර්ණත්වයට පත් වෙච්ච පයිනස් වගාවක් තිබෙනවා. අනෙක් කලාපවල මානා, ඇටමුරු වාගේ ආක්‍රමණික ශාක ව්‍යාප්තියක් තිබෙනවා. මගේ අතුරු ප්‍රශ්නය තමයි, ඒවා ක්‍රමානුකූලව ඉවත් කරලා වන වගාවක් සඳහා යොමු විය නොහැකිද, අමාත්‍යාංශය පැත්තෙන් ඒ සඳහා වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන එක.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු කථානායකතුමනි, අපේ රටේ තිබෙන ඉඩම් මේ රටේ ආර්ථික හා සමාජ අවශ්‍යතා සඳහා ප්‍රශස්ත මට්ටමින් යොදවා ගත යුතුව තිබෙනවා. ඒ නිසා වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය විධියට ඉඩම් වැවිලි සඳහා යොදවා ගන්න තමයි අපි උපරිම උත්සාහ ගන්නේ. මොකද, අපි රජයක් හැටියට ජාතික ඉලක්ක සකස් කරලා තිබෙනවා. තේ ගත්තොත්, 2024දී ලංකාවේ මුළු නිෂ්පාදනය කිලෝ ප්‍රමාණය මිලියන 262යි. අපේ ඉලක්කය තිබෙන්නේ එම මිලියන 262ක ප්‍රමාණය 2030 වෙනකොට මිලියන 400 දක්වා ගෙන ඒම. 2024දී අපේ රටේ තේ අපනයනයෙන් ලැබූ ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 1,400කට ආසන්නයි. ඒක 2030 වන විට ඩොලර් මිලියන 2,500කට -බිලියන 2.5කට- ගෙන එන එක තමයි අපේ ඉලක්කය වන්නේ. ඒ නිසා මේ ඌන උපයෝජිත ඉඩම් ඒ ඒ වගා සඳහා යොදවන එක තමයි අපේ පළමුවැනි අරමුණ වන්නේ. ඒ නිසා අපි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වාගේ ආයතන තුළින් වනය ආරක්ෂා කර ගැනීමට උත්සාහ ගන්නවා. ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඔබතුමා ඇහුවා වාගේ මෙහි විදේශීය ශාක ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම ආක්‍රමණික ශාක තිබෙනවා. ආක්‍රමණික ශාක සම්බන්ධයෙන් අපි රජයක් හැටියට ඒවා රටෙන් ඉවත් කළ යුතුයි කියන ස්ථාවරයේ ඉන්නවා. නමුත්, දැවමය වශයෙන් වන ශාක සම්බන්ධයෙන් වතුවල අනුගමනය කරන ප්‍රතිපත්තිය තුළ, අපේ කර්මාන්තවලට විශේෂයෙන්ම තේ කර්මාන්තයට දැව අවශ්‍යතාවක් තිබෙනවා. ඒ දැව ඉන්ධන හැටියට සපයා ගැනීමේ අවශ්‍යතාව මත මේ සමහර ඒවා වගා කරලා තිබෙනවා. ඒ වාගේම වතු සමාගම් දැව හැටියට අළෙවි කරන්න පුළුවන් ඒවා අළෙවි කරලා යම් ලාභ ලබන ප්‍රමාණයක් තිබෙනවා. නමුත් අපේ පරිසර අමාත්‍යාංශය ප්‍රතිපත්තියක ඉන්නවා, අපේ රටේ වන වැස්ම අපේ රටට උචිත, දේශීය වන වැස්මක් ලෙස වගා කරවන්න ඕනෑ කියලා. පරිසර අමාත්‍යාංශය කේන්ද්‍ර කරගෙන තමයි ඒක කරන්නේ. කොහොම නමුත්, අපි සිටින ස්ථාවරය ඒකයි කියන එක මම ඔබතුමාට පැහැදිලි කරන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
ගරු අමාත්‍යතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ නාගස්තැන්න කියන ප්‍රදේශයට ආසන්නවම පිහිටා තිබෙන සීපෝත් සහ බෙරන්නාව කියන ප්‍රදේශ තමයි "දිට්වා" සුළි කුණාටුවෙන් වැඩිපුරම හානියට පත් වුණේ. ඒ නිසා යටියන්තොට ආසනයේ විතරක් අධි අවදානම් නිවාස 300කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඒ තුන්සිය ගණනකට අධික නිවාසවල සිටින පිරිසෙන් යම් ප්‍රමාණයක් නාගස්තැන්න ප්‍රදේශයේ විධිමත්ව සහ විද්‍යාත්මකව නැවත පදිංචි කිරීම සඳහා මෙන්න මේ ඌන උපයෝජිත ඉඩම්වලින් කොටසක් ලබා දිය හැකිද, ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
මීට පෙර ප්‍රශ්නය අහපු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට මම මුලින් පැහැදිලි කළා වාගේ අපි වැවිලි සමාගම් සතුව තිබෙන ඉඩම් - RPCs- ඒ සඳහා ලබා දෙන්න ඕනෑ. ඒකට යම් දුෂ්කරතාවක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඔබතුමා අහන්නේ අප සතුව තිබෙන වැවිලි සමාගමක ඉඩම් ගැන. අනිවාර්යයෙන්ම ආපදාවට පත් වෙච්ච ජනතාව වෙනුවෙන් අපි ඒවා ලබාදීමට සූදානම්. ඒක තමයි ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට උත්තරය. ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා අදාළ සම්බන්ධීකරණ කමිටුවල තීන්දු අරගෙන, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල තීන්දු අරගෙන, NBRI එකේ අදාළ නිර්දේශ අරගෙන කටයුතු කරන්න කියලා අපි වැවිලි සමාගම් දැනුවත් කරන්නම්. සුදුසු ඉඩම් තිබෙනවා නම් අපි ජනතාව වෙනුවෙන් ඒවා ලබා දෙන්න සූදානම් කියන පණිවුඩය ඔබතුමාට ලබා දෙන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1576/2025- (2), ගරු කිට්නන් සෙල්වරාජ් මහතා.

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -1637/2025- (1), ගරු රුවන් විජේවීර මහතා.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කළුතර දිස්ත්‍රික්කයේ LRC ඉඩම්: විස්තර
### களுத்துறை மாவட்டத்திலுள்ள LRC காணிகள்: விபரம்
### LRC LANDS IN KALUTARA DISTRICT: DETAILS

1664/2025

**6. ගරු සංජීව රණසිංහ මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කළුතර දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉඩම්වලින්, බදු පදනම මත ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය, මහජනතාව වෙත ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය, නිදහස් ඔප්පු ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය සහ බලපත්‍ර මඟින් මහජනතාව වෙත ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බලපත්‍රලාභී ඉඩම් සඳහා නිදහස් ඔප්පු ලබාදීමේ හැකියාවක් තිබෙන්නේද;

(iv) මහජනතාව වෙනුවෙන් ලබාදී ඇති ඉඩම්වලින්, ප්‍රයෝජනයට නොගෙන අත්හැර දමා ඇති ඉඩම් ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ඉඩම් නැවත පවරාගෙන, ඉඩම් නොමැති අය සඳහා ලබා දීමේ හැකියාවක් තිබෙන්නේද;

(vi) පුද්ගලයන් හෝ ආයතන විසින්, අයථා ලෙස අත්පත් කරගෙන ඇති, කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காணிச் சீர்திருத்த ஆணைக்குழுவுக்குச் சொந்தமானதும் களுத்துறை மாவட்டத்தில் காணப்படுகின்றதுமான காணிகளின் அளவு ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவின் அடிப்படையில் வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அத்தகைய காணிகளில், குத்தகை அடிப்படையில் வழங்கப்பட்டுள்ள காணிகளின் அளவு, பொதுமக்களுக்கு வழங்கப்பட்டுள்ள காணிகளின் அளவு, இறையிலி உறுதிகள் வழங்கப்பட்டுள்ள காணிகளின் அளவு மற்றும் காணி அனுமதிப்பத்திரங்கள் மூலமாக பொதுமக்களுக்கு வழங்கப்பட்டுள்ள காணிகளின் அளவு ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவின் அடிப்படையில் வெவ்வேறாக யாது என்பதையும்;

(iii) அனுமதிப்பத்திர காணிகளுக்காக இறையிலி உறுதிகளை வழங்க முடியுமா என்பதையும்;

(iv) பொதுமக்களுக்கு வழங்கப்பட்டுள்ள காணிகளில், பயன்படுத்தாது கைவிடப்பட்டுள்ள காணிகளின் அளவு ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவின் அடிப்படையில் வெவ்வேறாக யாது என்பதையும்;

(v) அவ்வாறான காணிகளை மீண்டும் கையகப்படுத்தி, காணியற்றோருக்கு வழங்க முடியுமா என்பதையும்;

(vi) தனி நபர்கள் அல்லது நிறுவனங்களால் முறைகேடாக கையகப்படுத்தப்பட்டுள்ள காணிச் சீர்திருத்த ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகளின் அளவு ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவின் அடிப்படையில் வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the extent of land belonging to the Land Reform Commission, separately, in each Divisional Secretary's Division in the Kalutara District;

(ii) separately, for each Divisional Secretary's Division, the extent of land provided under leasehold, direct public allocation, freehold and the extent of land provided to public under land permits;

(iii) is there a possibility of providing freehold deeds for the lands under permits;

(iv) separately, for each Divisional Secretary's Division, the extent of abandoned lands, out of the lands previously provided to the public;

[ගරු සංජීව රණසිංහ මහතා]

(v) whether there is a possibility of re-acquiring those lands and providing them to those who do not have lands; and

(vi) separately, for each Divisional Secretary's Division, the extents of lands belonging to the Commission which have been misappropriately acquired by individuals or institutions?

(b) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අනුව ප්‍රකාශිත හා පැවරුණු ඉඩම් ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව නොව දිස්ත්‍රික්ක මට්ටමින් පවරාගෙන ඇත. ඒ අනුව කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රකාශිත සහ පැවරුණු ඉඩම් ප්‍රමාණ පිළිබඳ විස්තර පිළිතුරෙහි දක්වා තිබෙනවා.

ඇත්තටම ගරු මන්ත්‍රීතුමා අහන්නේ කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය කොපමණද කියලා. නමුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වශයෙන් බෙදා දී තිබෙන ඉඩම් ප්‍රමාණ සඳහන් කරලා තිබුණත්, පොදුවේ පවරා ගැනීම් කරලා තිබෙන්නේ දිස්ත්‍රික්ක මට්ටමෙන්. ඒ අනුව මා පිළිතුර ඉදිරිපත් කරනවා.

| | පැවරුණු ඉඩම් ප්‍රමාණය | | |
|---|---|---|---|
| | අක්කර | රූඩ | පර්: |
| ගොඩ | 33,243 | 2 | 28 |
| කුඹුරු | 243 | 0 | 21 |

(ii) කළුතර දිස්ත්‍රික්කයට අදාළව ගත්තොත්, කළුතර, දොඩංගොඩ, මතුගම, බුලත්සිංහල, මදුරාවල, වලල්ලාවිට, පාලින්ද නුවර, අගලවත්ත, හොරණ, ඉංගිරිය, මිල්ලනිය, පානදුර, බණ්ඩාරගම, බේරුවල යන ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ 14හිම ඇති LRC ඉඩම් මහජනතාවට බෙදා දී ඇති ප්‍රමාණය, ඔප්පු ලබා දී ඇති ප්‍රමාණය හා බදු පදනම මත ලබා දී ඇති ප්‍රමාණය වෙන් වශයෙන් පහත වගුවේ දක්වා ඇත.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | මහජනයාට බෙදා දී ඇති ඉඩම් ප්‍රමාණය | | | ඔප්පු ලබා දී ඇති ප්‍රමාණය | | | බදු පදනම මත ලබා දී ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අක්: | රූඩ | පර්: | අක්: | රූඩ | පර්: | අක්: | රූඩ | පර්: |
| 01. | කළුතර | 68 | 3 | 27 | 45 | 1 | 13 | 02 | 0 | 15 |
| 02. | දොඩංගොඩ | 314 | 0 | 29 | 178 | 2 | 33 | 50 | 1 | 23 |
| 03. | මතුගම | 145 | 3 | 28 | 64 | 0 | 30 | 369 | 1 | 28 |
| 04. | බුලත්සිංහල | 570 | 1 | 26 | 324 | 2 | 06 | 42 | 2 | 34 |
| 05. | මදුරාවල | 407 | 3 | 36 | 149 | 1 | 19 | 03 | 2 | 37 |
| 06. | වලල්ලාවිට | 120 | 0 | 05 | 16 | 0 | 01 | 29 | 1 | 37 |
| 07. | පාලින්ද නුවර | 146 | 3 | 30 | 84 | 0 | 02 | - | - | - |
| 08. | අගලවත්ත | 275 | 3 | 17 | 131 | 3 | 14 | 26 | 0 | 01 |
| 09. | හොරණ | 687 | 1 | 22 | 536 | 2 | 16 | 17 | 1 | 15 |
| 10. | ඉංගිරිය | 746 | 2 | 25 | 352 | 3 | 06 | 00 | 0 | 17 |
| 11. | මිල්ලනිය | 254 | 1 | 38 | 169 | 0 | 24 | 13 | 2 | 31 |
| 12. | පානදුර | 68 | 3 | 27 | 45 | 1 | 13 | 00 | 1 | 27 |
| 13. | බණ්ඩාරගම | 98 | 0 | 19 | 64 | 2 | 18 | 01 | 0 | 00 |
| 14. | බේරුවල | 241 | 2 | 26 | 101 | 1 | 25 | 00 | 1 | 38 |

(iii) රජය විසින් අත්පත් කර නොගත්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් සඳහා නිකුත් කර ඇති බලපත්‍රවලට ඔප්පු ලබා දීමේ හැකියාව ඇත.

(iv) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඔප්පු ලබා දී ඇති ඉඩම් සින්නක්කර විකුණුම්කරයක් මඟින් මහජනයා වෙත බැහැර කර ඇත. ඉන් පසු ආයතනය විසින් ඒ සම්බන්ධව සොයා බැලීමක් සිදු නොකරයි.

(v) නීත්‍යානුකූලව පවරා දී ඇති හා පනතේ අරමුණු යටතේ භාවිත කරනු ලබන ඉඩම් නැවත පවරා ගැනීම සඳහා වූ විධිවිධාන නොමැත.

(vi) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් සකස් කළ ඉඩම් ලේඛනයට අනුව හඳුනාගත් ඉඩම් මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් හඳුන්වා දී ඇති අයිලාස් මෘදුකාංගය භාවිතයට ගනිමින් මූලික සිතියම්ගත කිරීමක් සිදු කරමින් පවතී. ඒ අනුව අයථා ලෙස අත්පත් කරගෙන ඇති ඉඩම් හඳුනා ගැනීමෙන් පසු ඒවා ප්‍රාදේශීය ලේකම් කොටයාස මට්ටමෙන් ලබා දිය හැක.

(ආ) අදාළ නොවේ.

**ගරු සංජීව රණසිංහ මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු, කළුතර දිස්ත්‍රික්කයේ ඉඩම් සම්බන්ධව ගැටලු ප්‍රමාණයක් මතු වෙලා තිබෙනවා.

මම හිතන විධියට, යම් ප්‍රමාණයකට ඉඩම් ඔප්පු ලබා දීමට අදාළ කටයුතු සිදු කර තිබුණත්, අවිධිමත්භාවයක් තමයි අපි දකින්නේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මහජන දිනවලදී ප්‍රධාන වශයෙන් අපට එන ගැටලුවක් තමයි LRC ඉඩම්වල පදිංචිකරුවන්ට විවිධ ගැටලුවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා කියන කාරණය. විශේෂයෙන්ම පාසල්වලට අලුතින් දරුවන් ඇතුළත් කිරීමේ කටයුත්තේදී එම දෙමව්පියන්ගෙන් ඔප්පු ඉල්ලා සිටිනවා. ඒ නිසා ඔවුන්ට විශාල අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා. මොකද, මේ LRC ඉඩම්වල දීර්ඝ කාලයක් තිස්සේ පදිංචි වෙලා සිටියත්, එය නිවැරදිව තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය කරන ලේඛනයක් ඔවුන්ට නැතිවීම මත ඔවුන් විවිධ අපහසුතාවලට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ නිසා මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය විධියට මෙම කාරණා පිළිබඳව මම අහන්න කැමැතියි. මේ ඉඩම් ඔප්පු ලබා දීම සිදු කර තිබුණත් එය විධිමත් කර ගැනීම සඳහාත්, අපහසුතාවට පත් වෙලා සිටින එම ජනතාවට සහනයක් ලබා දීම සඳහාත් කඩිනමින් ඔප්පු ලබා දීමට හැකියාවක් පවතිනවාද, ඒ සඳහා කොපමණ කාලයක් ගත වෙයිද?

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු මන්ත්‍රීතුමනි, LRC ඉඩම් පිළිබඳ විවිධ වූ ප්‍රශ්නවලට අපි මේ සභාවේදී පිළිතුරු ලබා දී තිබෙනවා. එහිදී අපිට පෙනී ගියා එම ඉඩම් පවරා දීමේදීත්, බැහැර කිරීමේදීත් ඉතාම අවිධිමත් වූ වැඩ පිළිවෙළක් තමයි ඉතිහාසයේ පැවතිලා තිබුණේ කියන කාරණය. විවිධ හේතු මත, විවිධ දේශපාලන වුවමනා මත, ඒ වාගේම සමහර ආයතනගත නිලධාරීන්ගේ තිබුණු ලැදියාවන් මත ඉඩම් බැහැර කිරීම් කර තිබෙනවා. දැනට අපි කරන ලද පරීක්ෂණවලින් ඒවා හඳුනා ගෙන තිබෙනවා. අපි ඒ සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා. ඒවායේ අවිධිමත්බවක් තිබෙනවා. ඒ අවිධිමත් බව තුළ LRC ඉඩම්වල පදිංචි වී සිටින සාමාන්‍ය ජනතාව මුහුණ දෙන දැවැන්ත ප්‍රශ්න ටිකකුත් අපි හඳුනා ගෙන තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමා, LRC ඉඩම් සඳහාත්, රජයේ අනෙකුත් ඉඩම් සඳහාත් බලපත්‍ර, දීමනා පත්‍ර, ඔප්පු ලබා දීම සඳහා ඉඩම් අමාත්‍යාංශය විධියට අපි දැනටම පුළුල් වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. ඒ නිසා LRC ඉඩම්වල පදිංචි වෙලා සිටින මහජනතාවට - එම නිර්දේශ සලකා බලා - ඉක්මනින්ම ඊට අදාළ නීත්‍යනුකූලභාවය ලබා දීම සඳහා අපි කටයුතු කරමින් ඉන්නවා. ඇත්තටම ගත්තොත්, මේ වසරේ මැයි මාසය වාගේ වෙනකොට හිමිකම් ඔප්පු 65,000ක් වාගේ ලබා දෙන්න අපි කටයුතු සූදානම් කර තිබෙනවා. ඒ වාගේම LRC ඉඩම්වල ජීවත් වන ජනතාවටත් කෙටි කාලයක් ඇතුළත ඒවායේ නීත්‍යනුකූලභාවය ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් අපි ආරම්භ කර තිබෙනවා. ඒ නිසා කෙටි කාලයක් තුළ මෙම ගැටලුවට විසඳුමක් ලබා දීමට අපි කටයුතු කරනවා කියන කාරණය ගරු මන්ත්‍රීතුමාට මම සතුටින් කියන්න කැමැතියි.

**ගරු සංජීව රණසිංහ මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බොහෝ වෙලාවට LRC එකට අයිති ඉඩම් විධිමත් ලෙස ඵලදායි කාර්යයන් සඳහා යොදා නොගන්නා බව අපි දකිනවා. මේ යටතේ හිස් ඉඩම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. වර්තමානයේ අපේ රජය විසින් කර්මාන්ත ඉදිකිරීම, ඒ වාගේම විවිධ වගා ව්‍යාපෘති සඳහා විශාල වශයෙන් සැලසුම් සකස් කරලා තිබෙනවා. එම ඉඩම් මෙම කාර්යයන් සඳහා ඵලදායි ලෙස යොදා ගත යුතුයි කියලා මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බොහෝ වෙලාවට විවිධ ජනතාව විසින් තමන්ට වගා කටයුතු සඳහා ඉඩම් කොටසක් ලබා දෙන්න කියලා ඉල්ලීම් කර තිබෙන ආකාරය අපි දකිනවා. LRC එකට අයිති ඉඩම් වගා කටයුතු සඳහා ලබා ගැනීමට දැඩි ලෙස ඉල්ලීම් පවතිනවා. ඒ වෙනුවෙන් ගත හැකි ක්‍රියාමාර්ග කවරේද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය ඉතාම වැදගත්. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව, අපි රටේ නිෂ්පාදන ක්‍රියාවලිය වේගවත් කරන්න සැලසුම් කරලා තිබෙනවා. ඒ අනුව රට පුරාම සිටින ව්‍යවසායකයන්, තරුණයන් වගා කිරීම සඳහා ඉඩම් ලබා දෙන ලෙස දිගින් දිගටම අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කරමින් තිබෙනවා. ඒ පිළිබඳව අපි වැඩි අවධානයක් යොමු කරලා, මේ වනකොටත් විධිමත් සැලැස්මක් දියත් කරමින් තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර ලෙස කියනවා නම්, වගාව සඳහා යොදා ගත හැකි LRC එකට අයිති ඉඩම්, ඒ වාගේම රජයේ අනෙකුත් ඉඩම් මෙම ව්‍යාපෘති සඳහා ලබා දීමට අපි දැනට හඳුනා ගනිමින් තිබෙනවා. ඉන් සමහර ව්‍යාපෘති සඳහා මේ වන විට අපි ඉඩම් ලබා දීලා තිබෙනවා. වගා කිරීම සඳහා; සංවර්ධනය කිරීම සඳහා අපි ඉඩම් හඳුනාගෙන, නීත්‍යනුකූල ක්‍රමවේද යටතේ ඒවා ලබා දෙන්න සැලසුම් කර තිබෙනවා. මේ වන විටත් ගරු මන්ත්‍රීතුමාගේ සම්බන්ධීකරණය යටතේ තිබෙන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලටත් මේ කාරණය යොමු කර තිබෙනවා. සම්බන්ධීකරණ කමිටු හරහා ලබා දෙන තොරතුරු අනුව අපි ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. එම නිසා තරුණ ව්‍යවසායකයන්ට, ඒ වාගේම වගා කටයුතු කරලා ආර්ථිකයට සම්බන්ධ වෙන්න බලාපොරොත්තු වන හැමෝටම සතුටුදායක පිළිතුරක් ලෙස කියන්න කැමැතියි, අපි ඉඩම් ලබා දෙන්න විධිමත් ක්‍රමවේදයක් යටතේ කටයුතු සූදානම් කර තිබෙන බව.

## වාණිජ කටයුතු සඳහා පුපුරණ ද්‍රව්‍ය ගබඩා කිරීම සහ නිකුත් කිරීම: ක්‍රමවේදය

வணிக நோக்கத்துக்காக வெடி மருந்துகளைக் களஞ்சியப்படுத்தலும் விநியோகித்தலும்: வழிமுறை

STORAGE AND ISSUANCE OF EXPLOSIVES FOR COMMERCIAL PURPOSES: PROCEDURE ADOPTED

1696/2025

**7. ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) වාණිජ කටයුතු සඳහා පුපුරණ ද්‍රව්‍ය යොදා ගැනීම සම්බන්ධව දැනට පවතින නීති සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන අංශ කවරේද;

(ii) පුපුරණ ද්‍රව්‍ය ගබඩා කිරීමේ සහ නිකුත් කිරීමේ ක්‍රමවේදය කවරේද;

[ගරු නිහිඳ තුෂාරි ජයසිංහ මහත්මිය]

(iii) ඒවා ක්‍රියාත්මක කරන නිලධාරින්ගේ තනතුරු කවරේද;

(iv) ඒ සඳහා දිස්ත්‍රික්ක භාර සහකාර නිලධාරින් පත් කර තිබේ නම්, ඔවුන්ගේ කාර්යභාරය කවරේද;

(v) මේ වනවිට වෙඩි බෙහෙත් පාලක තනතුර පුරප්පාඩුවී තිබේද;

(vi) එම පුරප්පාඩුව පිරවීමට කටයුතු කරන්නේද;

(vii) ඉහත තනතුරට දෙවන පෙළ නිලධාරින් සූදානම් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වාණිජමය පදනම මත නිකුත් කර ඇති පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර සහ මේ වනවිට ක්‍රියාකාරී බලපත්‍රලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම බලපත්‍ර නිකුත් කිරීමේදී අනුගමනය කරන ක්‍රමවේදය කවරේද;

(iii) එම බලපත්‍ර නියාමනය කරන්නේද;

(iv) පුපුරණ ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා යොදා ගන්නා පෞද්ගලික මධ්‍යස්ථාන කවරේද;

(v) ඒවායේ ආරක්ෂාව සඳහා ගෙන ඇති පියවර කවරේද;

(vi) බලපත්‍රලාභියෙකුට වරකට නිකුත් කරන පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வணிக நோக்கத்துக்காக வெடி மருந்துகளைப் பயன்படுத்துவது குறித்து தற்போது வலு விலுள்ள சட்டங்களின் எப்பிரிவுகளில் திருத்தம் மேற்கொள்ள எதிர்பார்க்கப்படுகிறது என்ப தையும்;

(ii) வெடி மருந்துகளை களஞ்சியப்படுத்தல் மற்றும் விநியோகிக்கும் வழிமுறை யாது என்பதையும்;

(iii) அந்தத் தொழிற்பாடுகளை மேற்கொள்ளும் அலுவலர்களின் பதவிப் பெயர்கள் யாவை என்பதையும்;

(iv) அப்பணிக்காக மாவட்டத்துக்குப் பொறுப்பான உதவி அலுவலர்கள் நியமிக்கப்பட்டிருப்பின், அவர்களின் பணிப்பொறுப்பு யாது என்பதையும்;

(v) இன்றளவில் வெடி மருந்துக் கட்டுப்பாட்டாளர் பதவி வெற்றிடமாக உள்ளதா என்பதையும்;

(vi) அந்த வெற்றிடத்தை நிரப்ப நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(vii) மேற்படி பதவிக்கு இரண்டாந்தர அலுவலர்கள் பயிற்றப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வணிக அடிப்படையில் விநியோகிக்கப்பட்டுள்ள வெடி மருந்து உரிமங்கள் மற்றும் தற்போதைய செயற்பாட்டு உரிமம் பெறுநர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) இத்தகைய உரிமங்களை விநியோகிப்பதற்காகப் பின்பற்றப்படுகின்ற வழிமுறை யாது என்பதையும்;

(iii) அவ்வுரிமங்கள் ஒழுங்குறுத்தப்படுகின்றனவா என்பதையும்;

(iv) வெடி மருந்துகளை களஞ்சியப்படுத்து வதற்காகப் பயன்படுத்தப்படுகின்ற தனியார் நிலையங்கள் யாவை என்பதையும்;

(v) அவற்றின் பாதுகாப்புக்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(vi) உரிமம்பெறுநர் ஒருவருக்கு தடவை ஒன்றில் விநியோகிக்கப்படுகின்ற வெடி மருந்துகளின் அளவு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) the sectors in which the existing laws pertaining to the use of explosives for commercial purposes are expected to be amended;

(ii) the procedures adopted for the storage and issuance of explosives;

(iii) the designations of the officers who implement these procedures;

(iv) if Assistant Officers in charge of districts have been appointed for this purpose, the role of the said officers;

(v) whether the post of Controller of Explosives remain vacant at present;

(vi) whether action will be taken to fill this vacancy; and

(vii) the reasons for not preparing second-tier officers for the above post?

(b) Will he also inform this House -

(i) separately, the number of licences for explosives that have been issued on a commercial basis and the number of active licensees at present;

(ii) the procedure adopted in issuing those licences;

(iii) whether those licences are regulated;

(iv) the private facilities used for the storage of explosives;

(v) the steps that have been taken for their security; and

(vi) the quantity of explosives issued to a licensee at a time?

(c) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) අමප/25/1780/803/050 හා 2025.10.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

(ii) 1956 අංක 21 දරන පුපුරණ ද්‍රව්‍ය පනත හා එහි සංශෝධන පනත්, එයට අදාළව නිකුත් කර ඇති නියම හා නියෝග ප්‍රකාරව පුපුරණ ද්‍රව්‍ය පාලකවරයා ලෙස ආරක්ෂක ලේකම් විසින් නිකුත් කර ඇති 01/2024 චක්‍රලේඛය අනුව පුපුරණ ද්‍රව්‍ය ගබඩා කිරීම හා නිකුත් කිරීම සිදු කරනු ලබයි. එම විස්තර ඇමුණුම 01හි දැක්වේ.

(iii) අ.පනතේ කාර්යය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් පුපුරණ ද්‍රව්‍ය පාලක වශයෙන් කටයුතු කරනවා.

ආ. පනතේ කාර්යය සඳහා අමාත්‍යාංශයේ සෑම අතිරේක ලේකම්වරයෙකු හා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකුම නියෝජ්‍ය පුපුරණ ද්‍රව්‍ය පාලකවරයෙකු වේ. එමෙන්ම, සෑම සහකාර ලේකම්වරයෙකුම සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලකවරයෙකු වේ.

ඇ. පනතේ කාර්යය සඳහා ධුරයෙන් පත් කරන ලද නියෝජ්‍ය පුපුරණ ද්‍රව්‍ය පාලක ලෙස සහ සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක නිලධාරින් රාජකාරි කරනු ලබනවා.

ඈ. පනතේ කාර්යය සඳහා සැරයන්වරයකුගේ නිලයට වඩා පහළ නොවන නිලයන් දරන සෑම පොලිස් නිලධාරියකුටම පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂකයකු ලෙස කටයුතු කරන්න බලය පවරා තිබෙනවා.

(iv) පත් කර තිබේ.

සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලකවරු දිස්ත්‍රික්කවලට අනුයුක්ත කර ඇති අතර, දැනට පාලකවරු 13දෙනෙකු දිවයිනම ආවරණය කරනු ලබයි. ඔවුන්ගේ රාජකාරි ලැයිස්තුව ඇමුණුම 02හි දැක්වේ.

මෙම නිලධාරින්ගේ රාජකාරි අධීක්ෂණය සඳහා නියෝජ්‍ය පුපුරණ ද්‍රව්‍ය පාලකයෙකු පත් කර ඇත. නියෝජ්‍ය පුපුරණ ද්‍රව්‍ය පාලකගේ රාජකාරි ලැයිස්තුව ඇමුණුම 03හි දැක්වේ.

(v) වෙඩි බෙහෙත් පාලක ලෙස තනතුරු නාමයක් නොමැත.

(vi) අදාළ නොවේ.

(vii) පැන නොනඟී.

(ආ) (i)
- පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර සංඛ්‍යාව - 1,355
- ගිනිකෙළි භාණ්ඩ නිෂ්පාදන බලපත්‍ර සංඛ්‍යාව - 232
- පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදන බලපත්‍ර - 08
- ගිනිපෙට්ටි නිෂ්පාදන අවසර පත්‍ර සංඛ්‍යාව - 12
- පුපුරණ ද්‍රව්‍ය ආනයන බලපත්‍ර ගණන - 58
- අනෙකුත් සපයන්නන්ගේ බලපත්‍ර සංඛ්‍යාව - 514

2025.11.30 දිනට දිස්ත්‍රික් මට්ටමෙන් අදාළ තොරතුරු ඇමුණුම 04හි දැක්වේ.

ඇමුණුම් 01, 02, 03 සහ 04 **සභාගත*** කරමි.

(ii) 1956 අංක 21 දරන පුපුරණ ද්‍රව්‍ය පනත හා එහි සංශෝධන පනත්, එයට අදාළව නිකුත් කර ඇති නියම හා නියෝග ප්‍රකාරව පුපුරණ ද්‍රව්‍ය පාලකවරයා ලෙස ආරක්ෂක ලේකම් විසින් නිකුත් කර ඇති 01/2024 චක්‍රලේඛය අනුව ගබඩා කිරීම හා නිකුත් කිරීම සිදු කරනු ලබනවා. ඒ කාර්යභාරය සහ ඒ කටයුතු ඇමුණුම 01හි සවිස්තරාත්මකව දක්වා තිබෙනවා.

(iii) ඔව්.

(iv) පුපුරණ ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා පොලිස් ආරක්ෂාව යටතේ පවතින ගබඩා සංඛ්‍යාව 33කි. එමෙන්ම, ආසන්න පොලිස් ස්ථානයේ අධීක්ෂණය යටතේ පුපුරණ ද්‍රව්‍ය බලපත්‍රලාභීන් හා අවසරපත්‍රලාභීන් බාරයේ ගබඩා 2,179ක් පවතී.

(v) පොලිස් ආරක්ෂාව යටතේ පවතින පුපුරණ ද්‍රව්‍ය ගබඩා 33 සඳහා පොලිස් සැරයන්/උප පොලිස් පරීක්ෂක නිලයට සමාන හෝ ඉහළ නිලයක් දරන පොලිස් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ දිවා රාත්‍රී දෙකේදීම ආරක්ෂාව සපයනු ලබන අතර, එම ගබඩා පවතින ඉඩම් තුළම අදාළ පොලිස් මුරපොළ ස්ථාපනය කර ඇත.

අනෙකුත් අවසර පත්‍ර හා බලපත්‍රලාභීන්ගේ පුපුරණ ද්‍රව්‍ය ගබඩා කරනු ලබන ස්ථාන ඔවුන් බාරයේ පවතින අතර, ඒවා වැඩබිමෙහි හෝ නිවසෙහි යන ස්ථාන දෙකෙන් වඩා ආරක්ෂිත ස්ථානයක ඉදිකරන ලද ගබඩා තුළ පවතින අතර, එම ගබඩා පිහිටි ප්‍රදේශයේ ආසන්නතම පොලිස් ස්ථානය මඟින් අධීක්ෂණය කරනු ලබයි.

(vi) නිකුත් කරන ලද ප්‍රමාණ හා වාරික ගණන අවසරපත්‍රලාභීන් හා බලපත්‍රලාභීන්ගේ අවශ්‍යතාව, ඔවුන්ගේ පවතින යටිතල පහසුකම් හා මානව සම්පත් මත ඔවුන් විසින් ලබා ගත යුතු අනෙකුත් බලපත්‍ර හා අවසරපත්‍රවල සඳහන් කොන්දේසි ප්‍රකාරව සහකාර පාලකවරු ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් පසු ප්‍රමාණ තීරණය කරනු ලබයි. එම කටයුතු අදාළ දිස්ත්‍රික් ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ සිදු කෙරෙනු ඇත.

(ඇ) අදාළ නොවේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ජාතික ආරක්ෂාව කෙරෙහි බලපාන අනෙකුත් රසායනික ද්‍රව්‍ය නියාමනය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු මන්ත්‍රීතුමියනි, මේ ක්ෂේත්‍රයේ විශේෂිත වූ වැඩ කටයුතු රාශියක් කරලා තිබෙනවා. ජාතික ආරක්ෂාව සඳහා ඉහළ අවදානමක් සහිත රසායනික ද්‍රව්‍ය 15ක් දැනට අපි හඳුනාගෙන තිබෙනවා. ඉන් ද්‍රව්‍ය 7ක් පුපුරණ ද්‍රව්‍ය පාලක මඟින් නියාමනය කරනු ලබනවා. තව 8ක් හඳුනාගන්න තිබෙනවා. එක ද්‍රව්‍යයක් පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය මඟින් නියාමනය කරනවා. ඒ වාගේම කිසිදු ආයතනයක් මඟින් නියාමනය නොකරන රසායනික ද්‍රව්‍ය 7ක් හඳුනාගෙන තිබෙනවා. ඒවා අධීක්ෂණය කිරීමේ ආයතනයක් ලෙස ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය වෙත පැවරීමට දැනට තීරණය කර තිබෙනවා. ඒ අනුව අපේ ජාතික ආරක්ෂාව කෙරෙහි බලපාන අනෙකුත් රසායනික ද්‍රව්‍යවල තිබෙන අවදානම් තත්ත්වය ඉතාම ඕනෑකමින්, අවබෝධයෙන් සැලකිල්ලට අරගෙන අපි කටයුතු කරලා තිබෙනවා.

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. රසායනික ද්‍රව්‍ය නියාමනය කිරීම සම්බන්ධයෙන් වූ නීති යාවත්කාලීන කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු මන්ත්‍රීතුමියනි, මේ සඳහා අපි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. අපි මේ සම්බන්ධව කැබිනට් මණ්ඩලයටත් සන්දේශයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ කියන්නේ, මුලින් අසන ලද ප්‍රශ්නයට ලබා දුන් පිළිතුරේදීත් මම සඳහන් කළේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් ඇති කරන්න පුළුවන් කියලා හඳුනාගෙන තිබෙන සහ ඉදිරියේදී හඳුනා ගන්න නියමිත රසායනික ද්‍රව්‍ය නියාමනය - regulate - කරන්න අපි ප්‍රමාණවත් නීති රෙගුලාසි සෑදීම ගැනයි. ඒ වාගේම වග කිව යුතු පොදු ආයතනයක අවශ්‍යතාවත් ගොඩක් කල් ඉඳලා රටේ අවධානයට ලක් වෙලා තිබෙනවා. ඒ අනුව හඳුනාගෙන තිබෙන රසායනික ද්‍රව්‍ය 15න් 8ක් නියාමනය කිරීම සඳහා අපි දැනටමත් ඒ ආයතනවලට බලය පවරා තිබෙනවා. පසු කාලීනව හඳුනා ගනු ලැබූ රසායනික ද්‍රව්‍ය 7ක් අධීක්ෂණය කිරීමේ කාර්යය, ඒ බලය රසායනික අවි සම්මුති ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය වෙත පැවරීම සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරන්නත් අපි කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව ජාතික ආරක්ෂාව සඳහා බලපෑනු ලබන රසායනික ද්‍රව්‍ය නියාමනය කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කරලා ආරක්ෂක අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් ඒ පනත් කෙටුම්පත සකස් කිරීමේ කටයුතු ආරම්භ කර තිබෙන බව මම ප්‍රකාශ කරන්න කැමැතියි.

## කම්කරු දෙපාර්තමේන්තුව වෙත ලැබුණු පැමිණිලි: විසඳීම
## தொழில் திணைக்களத்துக்குக் கிடைக்கப்பெற்ற முறைப்பாடுகள்: தீர்த்தல்
## COMPLAINTS RECEIVED BY DEPARTMENT OF LABOUR: RESOLUTION

1720/2025

**8.** **ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කම්කරු දෙපාර්තමේන්තුවේ, පැමිණිලි අංශයට පැමිණිල්ලක් විසඳීම සඳහා ගත වන සාමාන්‍ය කාලය කොපමණද;

(ii) මේ වන විට එම අංශයේ පවතින නොවිසඳුණු පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iii) එම පැමිණිලි කඩිනමින් හා ඵලදායීව විසඳීම සඳහා පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ)නොඑසේ නම්, ඒ මන්ද?

தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தொழில் திணைக்களத்தின் முறைப்பாட்டுப் பிரிவில் முறைப்பாடொன்றைத் தீர்க்க எடுக்கும் சாதாரண காலம் எவ்வளவு என்பதையும்;

(ii) இன்றளவில், அந்தப் பிரிவில் இருக்கும் தீர்க்கப்படாத முறைப்பாடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அந்த முறைப்பாடுகளைத் துரிதமாகவும் பயனுடையதாகவும் தீர்ப்பதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iv) ஆமெனில், அந்த நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour:

(a) Will he inform this House -

(i) the average time taken by the Complaints Division of the Department of Labour to resolve a complaint;

(ii) the number of unresolved complaints currently pending in the aforesaid division;

(iii) whether steps are being taken to resolve these complaints, expeditiously and effectively; and

(iv) if so, of the aforesaid steps?

(b) If not, why?

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

ගරු කථානායකතුමනි, කම්කරු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2025 වර්ෂයේදී කම්කරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් වූ පැමිණිලි විසඳීම සඳහා ගත වූ කාලය පහත පරිදි ඉදිරිපත් කළ හැකිය.

- මාසයට අඩු කාලයක් තුළ විසඳූ ප්‍රතිශතය = 8.14
- මාස 1 - 3 අතර කාලයක් තුළ විසඳූ ප්‍රතිශතය = 36.72
- මාස 3 - 6 අතර කාලයක් තුළ විසඳූ ප්‍රතිශතය = 39.24
- මාස 6 - 12 අතර කාලයක් තුළ විසඳූ ප්‍රතිශතය = 15.78
- මාස 12ට වැඩි කාලයක් තුළ විසඳූ ප්‍රතිශතය = 0.12

යම් පැමිණිල්ලක් සම්බන්ධයෙන් නඩු පැවරීමට සිදු වුවහොත් ගත වන කාලය මෙම කාලයට අමතර වශයෙන් ඇතුළත් විය යුතුය. නඩු පැවරීමෙන් අනතුරුව විවිධ හේතු මත නඩු කටයුතු ප්‍රමාද වන අතර, එය මෙම දෙපාර්තමේන්තුවේ පාලනයෙන් තොර හේතු මත සිදු වන ප්‍රමාදයන් වේ. 2025.09.11 දින වනවිට පැවති එවැනි නඩු ප්‍රමාණය 23,429කි.

(ii)
- 2025.01.01 දිනට ඉතිරිව තිබූ පැමිණිලි ගණන 11,071
- 2025 වර්ෂය තුළ ලද පැමිණිලි ගණන 16,762
- 2025 වර්ෂය තුළ විසඳූ පැමිණිලි ගණන 18,708
- 2025.12.31 දිනට නොවිසඳී ඉතිරි වූ පැමිණිලි ගණන 9,125

(iii) ඔව්.

(iv)
➢ කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම හා භෞතික සම්පත් ලබා දීම

කම්කරු දෙපාර්තමේන්තුවේ වසර ගණනාවක් පුරා අවශ්‍ය භෞතික හා මානව සම්පත්වල හිඟයක් පැවතීම කම්කරු පැමිණිලි කඩිනමින් විසඳීම සඳහා බාධාකාරී සාධකයන් ලෙස පවතී. 2025 හා 2026 වසරවල කාර්ය මණ්ඩල පුරප්පාඩු 582ක් පැවති අතර, ඉන් 142ක ප්‍රමාණයක් පිරවීමට හැකි වී ඇති අතර, අවශ්‍ය පරිගණක ආදී භෞතික සම්පත් ලබා දීමට කටයුතු කර ඇත.

පසුගිය සඳුදා දිනත් නවක කම්කරු නිලධාරින් 36දෙනෙකුට අපි පත්වීම් ලබා දුන්නා, ගරු කථානායකතුමනි. 57කට පත්වීම් ලබා දීමට කැඳවා තිබුණත් 36ක් තමයි වැඩ භාර ගත්තේ.

නවක නිලධාරින් පුහුණු කර අනුයුක්ත කිරීම තුළින් හා දැනට සිටින කාර්ය මණ්ඩලය පුහුණු කිරීම තුළින් පැමිණිලි කඩිනමින් විසඳීමට අපේක්ෂා කෙරේ.

2025 වසර තුළ අපි පුහුණු වැඩසටහන් රැසක් දියත් කළා, කම්කරු නිලධාරින් හා අනෙකුත් නිලධාරින් පදනම් කරගෙන. මේ වසරේදීත් අපි පළාත් මට්ටමින් මේ අය පුහුණු කිරීම සඳහා වැඩසටහන් රැසක් සැලසුම් කරලා තිබෙනවා.

➢ දෙපාර්තමේන්තු කටයුතු ඩිජිටල්කරණය කිරීම

මේ තුළින් එක් එක් නිලධාරි මට්ටමින් පැමිණිලි සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව නිශ්චිත ඉලක්ක ලබා දීමටත්, මෙම ඉලක්ක තුළ සිදු නොකෙරුණු පැමිණිලි පිළිබඳව අධීක්ෂණය කිරීමටත් ක්‍රමවේදයක් සකස් කෙරෙනු ඇත.

➢ සුනිසි වැඩ පරිසරයක් - decent work environment - නිර්මාණය කිරීම

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහයෝගයෙන් සිදු කරන සමාජ කතිකාව - social dialogue - වැඩසටහන තුළින් ද සේව්‍ය - සේවක දෙපාර්ශ්වයන් සඳහා ගැටලුවලට අදාළ තීරණ ගැනීමේ දී පුළුල් සමාජ සාධාරණත්ව කෝණයකින් එම ගැටලු දෙස අවධානය යොමු කර තීරණවලට එළඹීමට දැනුවත් කිරීම් හා සහයෝගයන් ලබා දී එමඟින් පැමිණිලි ඇති වීම අවම කිරීමට කටයුතු කරනු ලැබේ.

➢ කම්කරු ක්ෂේත්‍රයට අදාළ නීතිමය රාමුව ශක්තිමත් කිරීම

යල්පැන ගිය කම්කරු නීති වර්තමාන වැඩ ලෝකයට ගැළපෙන ආකාරයට සහ පනත් අතර පවතින සංකීර්ණතා ඉවත් කර සරලකොට සියලු පාර්ශ්වයන්ට ප්‍රතිලාභ සහතික කිරීමට හැකි වන පරිදි සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී. එමඟින් ද පැමිණිලි ඇති වීම අවම කිරීමට අපේක්ෂා කෙරේ.

ගරු කථානායකතුමනි, අපි 17දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර තිබෙනවා, කැබිනට් අනුමැතියෙන් සහ අමාත්‍යාංශ ලේකම්තුමාගේ සභාපතිත්වයෙන්. එම කමිටුව නිරන්තර ඒකරාශී වෙමින් මේ කම්කරු නීති සංශෝධනය පිළිබඳව ඉතාම හොඳින් මැදිහත් වෙමින් තිබෙනවා.

➢ නිරන්තර අධීක්ෂණය

පැමිණිලි ඵලදායීව හා කඩිනමින් විසඳීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ආරවුල් විසඳීමේ ප්‍රගතිය නිරන්තර අධීක්ෂණය කරනු ලබන අතර, කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු විසින් දිස්ත්‍රික් භාර සහකාර කම්කරු කොමසාරිස්වරු සඳහා රැස්වීම්ද, මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් ද, කාර්තුගතව රැස්වීම් ද පවත්වා පැමිණිලි පරීක්ෂණ ප්‍රගතිය සොයා බලනු ලැබේ. එසේම, කම්කරු කොමසාරිස් ජනරාල් ඇතුළු මාණ්ඩලික නිලධාරින් විසින් සිදු කරනු ලබන කලාප ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී පැමිණිලි පරීක්ෂණ ප්‍රගතිය ප්‍රධාන අධීක්ෂණ මාතෘකාවක් වශයෙන් සාකච්ඡාවට භාජන කරනු ලැබේ.

(ආ) පැන නොනඟී.

**ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
ගරු කථානායකතුමනි, ලෝකය වේගයෙන් ඉස්සරහට යනකොට ඒ හා සමගාමීව AI තාක්ෂණය, නව නිපැයුම්, නවීන තාක්ෂණය කියන සියල්ලක්ම update වෙනවා. නූතනත්වයට ගැළපෙන පරිදි සහ වැඩ පරිසරයට අනුකූල වන පරිදි තමයි කම්කරු නීති සකස් විය යුත්තේ. ගරු ඇමතිතුමනි, ඒ හා සමගාමීව කම්කරු නීති update වෙනවාද? ඔබතුමා මුලින් සඳහන් කළා, මේ වනවිට, මෙතෙක් පැවති කම්කරු නීති යාවත්කාලීන කරන්න පත් කළ කමිටුවක් ගැන. ඒ කමිටුවේ වර්තමාන ප්‍රගතිය පිළිබඳව මම දැනගන්න කැමැතියි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු කථානායකතුමනි, මම පැහැදිලි කළා වාගේ අපි කැබිනට් අනුමැතිය සහිතව 17දෙනෙකුගෙන් යුත් අනුකමිටුවක් පත් කර තිබෙනවා. එහි සභාපතිත්වය දරනවා, අපේ අමාත්‍යාංශයේ ලේකම්, එස්.එම්. පියතිස්ස මහත්මා. ඒ වාගේම දේශීය, විදේශීය, ජාත්‍යන්තර නීති පිළිබඳව පුළුල් අවබෝධයක් සහිත නීතිඥ ප්‍රජාව ඇතුළු විවිධ අයගෙන් මේ කමිටුව සමන්විත වෙලා තිබෙනවා. විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් තමයි අපි මේ කමිටුව පත් කර තිබෙන්නේ. ඒ නිසා එම කමිටුව මේ වනවිට ඉතාම හොඳින් ක්‍රියාත්මක වනවා. පසුගිය 16වැනි සඳුදා දින කමිටුව රැස්වීමට නියමිතව තිබුණා. නමුත්, නීතිඥ මහත්වරුන්ගේ පැවති විරෝධතාවක් නිසා එදා දවසේ කමිටුව රැස් වුණේ නැහැ. මේ කමිටුව නිරන්තර රැස් වෙමින්, අදාළ නීති සංශෝධනය සඳහා ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. එහිදී, ඔබතුමිය පැහැදිලි කළා වාගේ අලුත් වැඩ ලෝකය පිළිබඳව, අලුත් කම්කරු නීතිය පිළිබඳව, අලුත් කම්කරු නීති ප්‍රවණතා පිළිබඳව, ජාත්‍යන්තර නීතිය පිළිබඳව කියන මේ සියලු අත්දැකීම් සැලකිල්ලට ගනිමින් තමයි නීති සංශෝධනය සඳහා අවධානය යොමු වෙලා තිබෙන්නේ.

**ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ලංකාවේ ළමා ශ්‍රමයට අදාළ පැමිණිලි ලැබීම කෙබඳුද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි? පසුගිය දිනවල ඔබතුමා ළමා ශ්‍රමය තුරන් කිරීමේ සමුළුවකට සහභාගි වීම සඳහා විදේශ සංචාරයක යෙදුණා. ගරු ඇමතිතුමනි, ළමා ශ්‍රමය තුරන් කිරීමට කම්කරු අමාත්‍යාංශය පැත්තෙන් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද කියා මම දැනගන්න කැමතියි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමිය ප්‍රශ්න කළා වාගේ, පසුගිය 11-13 දින අතරේ මොරොක්කෝවේ මරකේෂ් නගරයේ පැවතුණු 6වැනි ලෝක ළමා ශ්‍රමය තුරන් කිරීමේ ගෝලීය සමුළුවට අපේ රට නියෝජනය කරමින් මම සහභාගි වුණා. ලෝකය පුරා රටවල සිටින ළමුන්ගෙන් මිලියන 138ක් පමණ ළමා ශ්‍රමිකයින් ලෙස මේ වනකොට හඳුනාගෙන තිබෙනවා. ඇත්තටම මීට කලින් පැවතුණු 5වැනි සමුළුවේදී අවධානය යොමු කර තිබෙනවා, 2025 වනවිට සම්පූර්ණයෙන්ම ලෝකයේ ළමා ශ්‍රමය තුරන් කරන්න. නමුත්, තවදුරටත් මිලියන 138ක් ළමා ශ්‍රමිකයින් ඉන්නවා. හැබැයි, අපේ රට ගත්තොත් ඒක ඉතාම අවම අගයක තිබෙන්නේ. පසුගිය වසරේ ජිනීවාහි පැවතුණු ජාත්‍යන්තර කම්කරු සංවිධානය මගින් පැවැත් වූ සමුළුවේදීත් අපේ රට පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර තිබුණා, රට පිළිබඳව ලබා දුන් වාර්තාව පදනම් කරගෙන. නමුත් අපි ඒ අවස්ථාවේදීත් පැහැදිලි කළා, අපේ රට තුළ ළමා ශ්‍රමය අවම කරන්න ඕනෑ කරන සියලු විධිවිධාන ගෙන තිබෙන බව. සාමාන්‍යයෙන් වසරකට ළමා ශ්‍රමයට අදාළ පැමිණිලි අපිට වාර්තා වෙන්නේ 10කටත් වඩා අඩු සංඛ්‍යාවක්. ඒ නිසා අපි උපරිම ලෙස මේ ළමා ශ්‍රමය තුරන් කරන්න උත්සාහ කරමින් සිටිනවා. විශේෂයෙන්ම අවිධිමත් ක්ෂේත්‍රවල මේ සම්බන්ධව කරුණු වාර්තා වෙමින් තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම වැවිලි ක්ෂේත්‍රය වාගේම කෘෂිකාර්මික ක්ෂේත්‍රය ගැනත් අවධානය යොමු කරලා, ළමා ශ්‍රමය තුරන් කරන්න අපි කටයුතු කරමින් සිටිනවා.

ඒ වාගේම ළමා ශ්‍රමය තුරන් කිරීමේ කටයුත්තේදී අපට පෙනෙන්න තිබෙනවා, එක පැත්තකින් එය දුප්පත්කම හා බැඳී තිබෙන බව. ඒ නිසා දුප්පත්කම තුරන් කිරීමෙන් තොරව ළමා ශ්‍රමය තුරන් කරන්න බැහැ. ඒ සඳහා අපේ උපාලි පන්නිලගේ ඇමතිතුමා නියෝජනය කරන අමාත්‍යාංශය සම්බන්ධ වෙලා ප්‍රජා සවිබලගැන්වීමේ විශාල ව්‍යාපෘතියක් දැන් අපේ රට තුළ දියත් කරමින් සිටිනවා. ඒ හරහා අපිට ඒ සම්බන්ධව කටයුතු කරන්න පුළුවන්. ඒ වාගේම එතැනින් එහාට ගිය තවත් කරුණු ගණනාවක් මේ ළමා ශ්‍රමය සඳහා බලපා තිබෙනවා. ඒ කාරණා සියල්ල පිළිබඳව අවධානය යොමු කරලා ඉදිරියේදී අපේ රටින් ළමා ශ්‍රමය සහමුලින්ම තුරන් කරන්න ඕනෑ කරන වැඩ පිළිවෙළක් අපේ අමාත්‍යාංශය තුළින් දියත් කරන්න බලාපොරොත්තු වෙනවා.

## පොතුවිල් ප්‍රා.ලේ. කොට්ඨාසයේ සුනාමියෙන් පසු ප්‍රතිසංස්කරණය කරන ලද ධීවර ගොඩනැඟිලි: විස්තර

சுனாமியின் பின்னர் பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் மீளமைக்கப்பட்ட மீனவக் கட்டடங்கள்: விபரம்

FISHERY BUILDINGS RENOVATED AFTER TSUNAMI IN POTTUVIL DS DIVISION: DETAILS

1739/2025

**9.** **ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සුනාමියෙන් පසුව ප්‍රතිසංස්කරණය කළ ධීවර ගොඩනැඟිලි ඇති බවත්;

(ii) එම ගොඩනැඟිලි අතරින් කුලී සහ බදු පදනම මත ලබා දෙන ලද සහ විකුණන ලද ධීවර ගොඩනැඟිලි ඇති බවත්;

(iii) එම ගොඩනැඟිලි අතරින් මේ දක්වා භාවිත නොකරන ලද ගොඩනැඟිලි ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත (අ)(iii)හි සඳහන් ධීවර ගොඩනැඟිලි රජයේ සහ පොදු අවශ්‍යතාවන් සඳහා ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) සුළු පන්න ධීවර සම්මේලනය මඟින් සුනාමියෙන් පසුව ජලාල්ඩීන් චතුරශ්‍රය සහ කනකර් ග්‍රාම නිලධාරි වසම්වල ඉදි කළ ධීවර බහු කාර්ය ගොඩනැඟිලි භාරව කටයුතු කරන, ආදායම් අය කරන සහ නඩත්තු කටයුතු කරන පාර්ශ්වයන් කවරේද;

(iii) ඉහත ගොඩනැඟිලි පරිශ්‍රයන්හි අයිතිකරුවන් හඳුනා ගතහොත්, ඔවුන්ට පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් විකල්ප ඉඩම් ලබා

දීමෙන්, මෙම ධීවර බහු කාර්ය ගොඩනැගිලි පොතුවිල් ප්‍රාදේශීය සභාවට හෝ මහජන භාවිතයට ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் சுனாமியின் பின்னர் மீளமைக்கப்பட்ட மீனவக் கட்டடங்கள் உள்ளன என்பதையும்;

(ii) அவற்றுள் வாடகைக்கு அல்லது குத்தகைக்கு விடப்பட்ட அல்லது விற்பனை செய்யப்பட்ட மீனவக் கட்டடங்கள் உள்ளன என்பதையும்;

(iii) அவ்வாறான கட்டடங்களில் தற்போது வரை பயன்படுத்தப்படாமல் உள்ள கட்டடங்களும் உள்ளன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேலே (அ)(iii)இல் குறிப்பிடப்பட்டுள்ள மீனவக் கட்டடங்களை அரச மற்றும் பொதுத் தேவைகளுக்குப் பயன்படுத்துவதற்காக வழங்குவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(ii) சுனாமியின் பின்னர், சிறு மீனவ சம்மேளனத்தால் ஜலால்டீன் சதுக்கம் மற்றும் கனகர் கிராம உத்தியோகத்தர் பிரிவுகளில் அமைக்கப்பட்ட மீனவர் பல்தேவைக் கட்டடங்களுக்குப் பொறுப்பாகப் பணியாற்றுகின்ற, வருமானத்தை அறவிடுகின்ற மற்றும் பராமரிப்புப் பணிகளை மேற்கொள்கின்ற தரப்பினர்கள் யாவர் என்பதையும்;

(iii) மேற்படி கட்டட வளவுகளின் உரிமையாளர்கள் அடையாளங்காணப்பட்டால், பொத்துவில் பிரதேச செயலகம்மூலம் அவர்களுக்கு மாற்றுக் காணிகளை வழங்கி, மேற்படி மீனவ பல்தேவைக் கட்டடங்களைப் பொத்துவில் பிரதேச சபைக்கு அல்லது பொது மக்கள் பாவனைக்கு வழங்குவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Is he aware that there are -

(i) fishery buildings that were renovated after tsunami in the Pottuvil Divisional Secretary's Division;

(ii) fishery buildings that were given on rent and lease basis and buildings that have been sold, out of the said buildings; and

(iii) buildings that have not hitherto been used, out of those buildings?

(b) Will he inform this House -

(i) whether steps will be taken to provide the fishery buildings mentioned in (a) (iii) above for Government and public needs;

(ii) the parties in charge of, who do maintenance and revenue collection of the multi-purpose fishery buildings constructed in Jalaldeen Square and Kanaker GN Divisions by the Small-scale Fisheries Federation after tsunami; and

(iii) whether action will be taken to vest these multi-purpose fishery buildings with the Pottuvil Pradeshiya Sabha or to allocate them for public use after providing the owners of the above buildings with alternative lands through the Pottuvil Divisional Secretariat, if those owners are identified?

(c) If not, why?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ சபாநாயகர் அவர்களே, இந்த வினாவுக்கான விடை பின்வருமாறு:

(அ) (i) ஆம், உள்ளன.

- **சங்கக் கட்டிடங்கள்:**

பொத்துவில் கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களப் பிரிவில் சுனாமி பேரழிவுக்குப் பிறகு கட்டப்பட்ட பல கட்டிடங்கள் உள்ளன. இவற்றில் சில கடற்றொழில் மற்றும் கடல் வளங்கள் திணைக்களம்மூலம் வழங்கப்பட்டன. சில கட்டிடங்கள் நேரடியாக மீனவச் சங்கங்களுக்கு வழங்கப்பட்டுள்ளன. அந்தக் கட்டிடங்கள் தற்போது சம்பந்தப்பட்ட மீனவர்களால் பயன்படுத்தப்படுகின்றன. மேலும் சில கட்டிடங்கள் கூட்டுறவுக் கிளைகள்மூலம் வழங்கப்பட்டுள்ளன. சில கட்டிடங்கள் நேரடியாகத் தனிநபர்களுக்கு வழங்கப்பட்டுள்ளன. இவற்றில் சில கட்டிடங்கள் பயன்படுத்தப்படவில்லை. மற்றவை சம்பந்தப்பட்ட நபர்களால் சிறப்பாகப் பயன்படுத்தப்படுகின்றன.

- **கிராமிய கடற்றொழில் அமைப்புகளால் தற்போது பயன்படுத்தப்படும் கட்டிடங்கள்:**

1. களப்புக்கட்டு கிராமிய கடற்றொழில் அமைப்பு - பல்நோக்குக் கட்டிடம் - களப்புக்கட்டு, பொத்துவில் - 15 (NECDEP)
2. ஊரணி கிராமிய கடற்றொழில் அமைப்பு - சுற்றுச்சூழல் சுற்றுலா மையம் - ஊறணி, பொத்துவில் - 25 (CCD)

- **மீனவர் கூட்டுறவுச் சங்கங்களுக்கு வழங்கப்பட்ட கட்டிடங்கள் (தற்போது பயன்பாட்டில் உள்ளன)**

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

1. கிராம சேவையாளர் பிரிவு P20, P21 மற்றும் P27 கூட்டுறவுச் சங்கம் - பல்நோக்குக் கட்டிடம் - இதயபுரம், பொத்துவில் - 21 (NECDEP)
2. கிராம சேவையாளர் பிரிவு P20, P21 மற்றும் P27 கூட்டுறவுச் சங்கம் - சுற்றுச்சூழல் சுற்றுலா மையம் - ஹிதாயாபுரம், பொத்துவில் - 21 (CCD)
3. கோமாரி கூட்டுறவுச் சங்கம் - பல்நோக்குக் கட்டிடம் - கோமாரி - 02 (ICEDA)

மேற்கூறிய கட்டிடங்கள் மீனவர்களால் பராமரிக்கப்படுகின்றன.

- **மீனவர் கூட்டுறவுச் சங்கங்களுக்கு வழங்கப்பட்ட கட்டிடங்கள் (தற்போது பயன்பாட்டில் இல்லை)**

1. ஐக்கிய ஆழ்கடல் கூட்டுறவுச் சங்கம் - பல்நோக்குக் கட்டிடம் - பாசிச்சேனை, பொத்துவில் - 18 (ICEDA)
2. கத்திரியா கூட்டுறவுச் சங்கம் - அலுவலகக் கட்டிடம் - பாசிச்சேனை, பொத்துவில் - 18 (ICEI)
3. கத்திரியா கூட்டுறவுச் சங்கம் - பல்நோக்குக் கட்டிடம் - சின்ன உள்ளை, பொத்துவில் - 18 (NECDEP)
4. அறுகம்குடா மீனவர் கூட்டுறவுச் சங்கம் - பல்நோக்குக் கட்டிடம்

மேற்கூறிய 4 கட்டிடங்கள் தற்போது பயன்பாட்டில் இல்லை.

- **மீனவர் கூட்டுறவுச் சம்மேளனத்துக்கு வழங்கப்பட்ட கட்டிடங்கள்:**

1. கூட்டுறவுச் சங்கம் - குளிர்பதன கட்டிடம் - ஜலால்தீன் சதுக்கம், பொத்துவில் - 04 (GTZ)
2. கூட்டுறவுச் சங்கம் - பனிக்கட்டி உற்பத்தித் தொழிற்சாலை - ஜலால்தீன் சதுக்கம், பொத்துவில் - 04 (ICEI)

குளிர்பதன கட்டிடம் 2016ஆம் ஆண்டு பொத்துவில் பிரதேச செயலாளரால் இலங்கை இராணுவத்திடம் ஒப்படைக்கப்பட்டதாகக் கூறப்படுகிறது. பொத்துவில் கடற்றொழில் மற்றும் கடல் வளங்கள் திணைக்களப் பிரிவு வளாகத்தில் அமைந்துள்ள பனிக்கட்டி தொழிற்சாலை சேதமடைந்து செயற்படவில்லை. எனவே, மீள ஆரம்பிப்பதற்காக தற்போதுள்ள கட்டிடங்களை கடற்றொழில் மற்றும் கடல் வளங்கள் திணைக்களத்துறையிடம் கையகப்படுத்தத் தொடர்புடைய ஆவணங்கள் பொத்துவில் பிரதேச செயலாளரிடம் ஒப்படைக்கப்பட்டுள்ளன.

- **மீன்வள மற்றும் நீர்வளத் துறையுடன் தொடர்பில்லாத கட்டிடங்கள்:**

1. சிறு அளவிலான மீனவர் சம்மேளனம் - பல்நோக்குக் கட்டிடம் - ஊறணி, பொத்துவில் - 25
2. சிறு அளவிலான மீனவர் சம்மேளனம் - பல்நோக்குக் கட்டிடம் - ஜலால்தீன் சதுக்கம், பொத்துவில் - 04

இந்தக் கட்டிடங்கள் சிறு அளவிலான மீனவர் சம்மேளனத்தால் பயன்படுத்தப்பட்டன. மேலும், அவை தற்போது செயல்பாட்டு நிலையில் இல்லை.

(ii)
- ஐக்கிய ஆழ்கடல் கூட்டுறவுச் சங்கம் - பல்நோக்குக் கட்டிடம் - பாசிச்சேனை, பொத்துவில் - 18 (ICEDA)
- கத்திரியா கூட்டுறவுச் சங்கம் - அலுவலகக் கட்டிடம் - பாசிச்சேனை, பொத்துவில் - 18 (ICEI)

இந்தக் கட்டிடங்கள் இரண்டும் மீனவர் கூட்டுறவுச் சங்கங்களுக்கு வழங்கப்பட்டு, அந்தச் சங்கங்களின் பயன்பாட்டுக்காகத் தனிநபர்களிடம் ஒப்படைக்கப்பட்டுள்ளன. ஆனால், இதற்கான வாடகை செலுத்தப்பட்டதாகத் தெரிவிக்கப்படவில்லை.

(iii) ஆம்.

- **மீனவர் கூட்டுறவுச் சம்மேளனங்களுக்கு வழங்கப்பட்ட கட்டிடங்கள்**

1. ஐக்கிய ஆழ்கடல் கூட்டுறவுச் சங்கம் - பல்நோக்குக் கட்டிடம் - பாசிச்சேனை, பொத்துவில் - 18 (ICEDA)
2. கத்திரியா கூட்டுறவுச் சங்கம் - அலுவலகக் கட்டிடம் - பாசிச்சேனை, பொத்துவில் - 18 (ICEDA)
3. கத்திரியா கூட்டுறவுச் சங்கம் - பல்நோக்குக் கட்டிடம் - சின்ன உல்லை, பொத்துவில் - 18 (NECDEP)
4. அறுகம்குடா மீனவர் கூட்டுறவுச் சங்கம் - பல்நோக்குக் கட்டிடம்

- **மீனவர் கூட்டுறவுச் சம்மேளனத்துக்கு வழங்கப்பட்ட கட்டிடங்கள்**

1. கூட்டுறவுச் சங்கம் - ஐஸ் உற்பத்தித் தொழிற்சாலை - ஜலால்தீன் சதுக்கம், பொத்துவில் - 04 (ICEI)

(ஆ) (i) செயல்பாட்டு நிலையில் இல்லாத கட்டிடங்கள் குறித்து பொத்துவில் பிரதேச செயலாளருடன் கலந்துரையாடிய பின்னர், அந்தக் கட்டிடங்களை பொதுப் பயன்பாட்டுக்குக் கிடைக்கச் செய்ய நடவடிக்கை எடுக்கலாம்.

(ii) இந்த விஷயம் கடற்றொழில் மற்றும் கடல் வளங்கள் அமைச்சுக்குப் பொருந்தாது என்பதையும், மேற்கூறிய கட்டிடங்கள் அந்தத் துறையால் வழங்கப்படவில்லை என்பதையும் நான் உங்களுக்குத் தெரிவித்துக் கொள்கின்றேன்.

(iii) இந்தப் பிரச்சினையை பொத்துவில் பிரதேச செயலாளருடன் விவாதிக்கலாம். மேற்கூறிய கட்டிடங்களைப் பொதுப் பயன்பாட்டுக்கு வழங்க முடியுமா என்பது குறித்து ஒரு முடிவை

எடுக்கலாம். மேலும், அந்த நோக்கத்துக்காக மாற்று நிலங்களை வழங்குவது குறித்து விவாதங்கள் நடத்தலாம். இது தொடர்பாக விசேட பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலும், மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலும் விவாதிக்க முடியும். இது சம்பந்தமாகப் பொருத்தமான தீர்வைப் பெற்றுக்கொடுக்க முடியும்.

(இ) ஏற்புடையதன்று.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

நன்றி! கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கடந்த ஆண்டு நவம்பர் மாதம் ஏற்பட்ட அனர்த்த நிலைமை காரணமாக நாட்டின் பல பாகங்களும் மீனவர்களும் விவசாயிகளும் பாதிக்கப்பட்டனர். அந்த வகையில், பொத்துவில் பிரதேச செயலாளர் பிரிவின் ஜலால்தீன் சதுக்கப் பிரிவில் கரைவலை மீன்பிடித் தொழிலை மேற்கொண்டுவந்த எம்.ஐ. தஸ்லீம் என்பவரும் பாதிக்கப்பட்டுள்ளார். அவரது கரைவலைப்பாடு NBSB-A-0150-TLEஆம் இலக்கம் கொண்டது. அவரது fibreglass boat, 35 'பீஸ்' வலைகள், இழுவை வலைகள், கயிறு 'றோல்'கள், **தேடாக்கயிறு,** நூல் வலைகள் அடங்கலாக சுமார் 3,560,000 ரூபாய் பெறுமதியுடைய பொருட்களுக்குச் சேதம் ஏற்பட்டதாக 2025.11.27ஆம் திகதிய - CIB -II 327/277 - பொலிஸ் முறைப்பாடுமூலம் உறுதிப் படுத்தியுள்ளார். இந்தச் சேதமானது, 2025.11.26ஆம் திகதி இரவு 10.00 மணிக்கு இடம்பெற்றுள்ளது. அதன் பின்னர், எல்லா இடமும் தேடியும் தனது படகும் பொருட்களும் கிடைக்கவில்லையென அவர் தெரிவிக்கிறார். இதனால் அவருடன் தொழில் செய்த சுமார் 30 குடும்பங்களும் பாதிக்கப்பட்டுள்ளன. அவர் மீளவும் மீன்பிடித் தொழிலைத் தொடங்குவதற்கு அரசானது நஷ்டஈட்டை விரைவாக வழங்குவதற்கு நடவடிக்கை எடுக்குமா? என கௌரவ அமைச்சரிடம் கேட்கின்றேன். இது குறித்த ஆவணங்களை நான் சபையில் ***சமர்ப்பிக்கின்றேன்**.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

கௌரவ உறுப்பினர் அவர்களே, இது நல்லதொரு கேள்வி. இந்தக் கேள்வி பிரதான கேள்வியோடு தொடர்புடையதாக இல்லாவிட்டாலும்கூட, நான் பதிலளிக்கின்றேன். கடந்த அனர்த்தத்தின்போது பாதிக்கப்பட்ட மீனவர்கள் மற்றும் அவர்களது குடும்பங்கள், வலைகள், வள்ளங்கள் தொடர்பாக அரசாங்கம் என்ற ரீதியில் நாங்கள் நடவடிக்கைகளை எடுத்திருக்கின்றோம். நீங்கள் ஆவணங்களைத் தந்தால் மிகவும் நல்லது. இப்போது இதற்கு நிதி ஒதுக்கீடு செய்யப்படுமா அல்லது எதிர்காலத்தில் நடவடிக்கை எடுக்கப்படுமா என்பதை நான் அறியத் தருகிறேன். இது தொடர்பில் மேலதிக நடவடிக்கை எடுக்க வேண்டுமாயின், அதையும் நாங்கள் எடுப்பதற்குத் தயாராக இருக்கின்றோம். தயவுசெய்து, அந்த ஆவணங்களை என்னிடம் தருமாறு கேட்டுக் கொள்கின்றேன்.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

நன்றி! கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

நாடளாவிய ரீதியில் கடற்கரையையும் அதன் சூழலையும் பாதுகாக்க வேண்டும் என்ற அடிப்படையில், கரைவலை மீனவர்கள் 'வின்ச்' இயந்திரத்தைப் பாவிப்பதற்குத் தடை விதிக்கப்பட்டுள்ளது. இதனை நாம் ஏற்றுக்கொண்டாலும், ஏற்பட்டுள்ள பிரச்சினைகளையும் யோசிக்க வேண்டியுள்ளது. எமது அம்பாறை மாவட்டத்தில் பொத்துவில் ஜலால்தீன் சதுக்கம் எனும் இடத்தில் கரைவலைத் தொழிலில் ஈடுபட்டுவந்த ஸலாம், பஷீர், தஸ்லீம், ரபீக், ஹரீம், ஹஸீம், நியாஸ், சஹாப்தீன், நாவூர் தம்பி ஆகிய 09 பேரும் குடாக்கள்ளி எனும் இடத்தில் கரைவலைத் தொழிலில் ஈடுபட்டுவந்த நஜ்முதீன், புஹாரி, ஷம்ஸுல் ஆரிபீன், அசோக செல்வா ரமேஷ், ஜப்பார், றிஸாட், நஜீம் நிசார் ஆகிய 7 பேருமென மொத்தம் 16 பேரினது தொழில் பாதிக்கப்பட்டு, வருமானம் இல்லாமல் கஷ்டப்படுவதை அவதானிக்க முடிகின்றது. 'வின்ச்' இயந்திரங்களைப் பாவிப்பது தடைசெய்யப்பட்டுள்ளதால், 30-50 பேர் வரை தலா ஒவ்வொருவரும் சுமார் 500 பேரை தொழிலுக்குத் தேடிப் பெறுவது சிரமமாக உள்ளது. இந்த நிலைமையைக் கவனத்திற்கொண்டு அரசானது கடற்கரைக்கும் சூழலுக்கும் எவ்வித சேதமும் - அசாதாரண நிலைமையும் - ஏற்படாதவாறும், தொழிலாளர்களைப் பெறுவதில் ஏற்பட்டுள்ள சிக்கலைத் தவிர்ப்பதற்கும், 'வின்ச்' இயந்திரங்களைப் பாவித்து கரைவலைத் தொழிலை மேற்கொள்வதற்கு, தற்போது எடுக்கப்பட்டுள்ள தீர்மானத்தை எதிர்காலத்தில் மீள்பரிசீலனை செய்து நாட்டிலுள்ள மீனவர்களுக்கு உதவ முடியுமா? எனக் கேட்க விரும்புகிறேன்.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

இதுவும் நல்லதொரு கேள்வி. அண்மையில்கூட, இந்தக் கரைவலை மீன்பிடித் தொழிலாளர்கள் மாண்புமிகு சனாதிபதி அவர்களுடன் பேச்சுவார்த்தை நடத்தினார்கள். அதுமாத்திரமல்ல, அவர்கள் 10 நாட்களுக்கும் மேலாகப் பாரிய சத்தியாக்கிரகப் போராட்டங்களையும் முன்னெடுத்தார்கள். ஆறு மாதங்களுக்கு முன்னர், நாங்கள் இந்தக் கரைவலைத் தொழிலாளர்களுடன் பேச்சுவார்த்தை நடத்தினோம். அதன்போது, இந்த இயந்திரத்தைப் பயன்படுத்துவதால் இயற்கைக்கும் சூழலுக்கும் சிறிய மீனவர்களுக்கும் ஏற்படுகின்ற பாதிப்புகள் தொடர்பாகக் கூடுதலாகக் கலந்துரையாடினோம். அதன்பின்னர், நாங்கள் அவர்களுக்குச் சொல்லியிருந்தோம், “ஆறு மாத கால அவகாசம் தருகிறோம். இதற்கான மாற்று நடவடிக்கையை எடுங்கள்! அதன்பிறகு, நாங்கள் இதனைத் தடை செய்யவேண்டி வரும்” என்று. அதற்கு ஏற்ப, நாங்கள் இதனைத் தடை செய்தோம். இதற்கு எதிராக வழக்கொன்றும் தாக்கல் செய்யப்பட்டு இருக்கிறது. எது எவ்வாறு இருந்தபோதிலும், கரைவலைத் தொழிலில் 'வின்ச்' இயந்திரத்தையும் 'டெக்டரை'ஐயும் பயன்படுத்துவதைத் தொடர்ந்து அனுமதிப்பதா, இல்லையா என்பது தொடர்பில் நாங்கள் கரைவலைத் தொழிலாளர் சங்க உறுப்பினர்கள் ஐந்து பேருடனும் துறைசார்ந்த நிபுணர்களுடனும் இணைந்து நேற்றுமுதல் ஆராய்ந்து வருகின்றோம்.

மேலும், கரைவலைத் தொழிலில் இந்த இயந்திரங்களைப் பயன்படுத்துவதால் ஏற்படும் சாதக, பாதகங்கள் என்ன? 'டெக்டர்'ஐப் பயன்படுத்துவதா, 'வின்ச்' இயந்திரத்தைப்

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

பயன்படுத்துவதா? என்பது தொடர்பில் விரிவாக ஆராய்ந்து வருகின்றோம். அதுமாத்திரமன்றி, இதனுடன் தொடர்புடைய சகல தரப்பினரினது அறிக்கைகளையும் பெற்றுக்கொண்டு, அந்த அறிக்கைகளில் கூறப்படுகின்ற விடயங்களை குறிப்பாக, 'வின்ச்' இயந்திரத்தை மாத்திரம் பயன்படுத்த முடியுமா அல்லது 'டெக்டரை'யும் பயன்படுத்த முடியுமா? 'டெக்டர்'ஐப் பயன்படுத்துவதன்மூலம் கடற்கரைக்கு ஏற்படுகின்ற பாதிப்புகள் என்ன? அதன்மூலம் நண்டுகளுக்கு, ஆமைகளுக்கு, ஆமை முட்டைகளுக்கு ஏற்படுகின்ற பாதிப்புகள் என்ன? என்பன தொடர்பிலும் விரிவாக ஆராய்ந்து, எங்களுடைய சனாதிபதியோடும் கதைத்து, இரண்டு மாதங்களுக்குள் இதற்கு நீடித்து நிலைக்கக்கூடிய நிரந்தரமான தீர்வைப் பெற்றுக்கொடுப்பதற்கு நாங்கள் முடிவு எடுத்திருக்கின்றோம். அது வரைக்கும் நாங்கள் இதைத் தடைசெய்திருக்கின்றோம்.

கரைவலை மீன்பிடித் தொழில் என்பது பாரம்பரியமான, கைகளால் வலைகளை இழுக்கும் தொழில்! அவ்வாறே தொடர்ந்து செய்து வருமானத்தை தேடிக்கொள்ளுமாறு நாங்கள் அந்த மீனவர்களிடம் கேட்டுக் கொள்கின்றோம். பின்னர் இதற்குள் தொழில்நுட்பத்தைச் சேர்ப்பதா, இல்லையா? என்பது தொடர்பில் பரிசீலனை செய்வோம் என்பதுதான் நாங்கள் இப்போதைக்கு எடுத்திருக்கின்ற முடிவாகும். நன்றி!

## ගම්පහ සණස සංවර්ධන බැංකුවේ තැන්පත්කරුවන්ට සිදුවූ අසාධාරණකම්: පොලිස් පැමිණිලි

## கம்பஹா சனச அபிவிருத்தி வங்கியில் அநீதிக்கு உள்ளான வைப்பாளர்கள்: பொலிஸ் முறைப்பாடுகள்

## INJUSTICE TO DEPOSITORS OF SANASA DEVELOPMENT BANK, GAMPAHA: COMPLAINTS TO POLICE

1809/2026

**10.** ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අසාධාරණයට ලක් වූ තැන්පත්කරුවන්ගෙන් ගම්පහ සණස බැංකුව සම්බන්ධයෙන් පොලිසිය වෙත පැමිණිලි ලැබී තිබේද;

(ii) එසේ නම්, එම පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iii) එම පැමිණිලි පොලීසිය වෙත ලැබුණු දිනය එක් එක් පැමිණිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම පැමිණිලි සම්බන්ධයෙන් පොලීසිය විසින් මේ දක්වා සිදු කර ඇති විමර්ශනවල ප්‍රගතිය කවරේද;

(v) සණස බැංකුව මඟින් ණය ලබාගෙන ඇති Gampaha Development Company (Pvt.) Ltd. (GDC) ආයතනය සම්බන්ධයෙන් පොලීසිය වෙත පැමිණිලි ලැබී තිබේද;

(vi) එසේ නම්, එම පැමිණිලි සම්බන්ධයෙන් මේ දක්වා සිදු කර ඇති විමර්ශනවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநீதிக்கு உள்ளான வைப்பாளர்களால் கம்பஹா சனச வங்கி தொடர்பில் பொலிசாருக்கு முறைப் பாடுகள் கிடைத்துள்ளனவா என்பதையும்;

(ii) அவ்வாறெனில், அந்த முறைப்பாடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அந்த முறைப்பாடுகள் பொலிசாருக்குக் கிடைத்த திகதி ஒவ்வொரு முறைப்பாட்டுக்கும் ஏற்ப வெவ்வேறாக யாது என்பதையும்;

(iv) அந்த முறைப்பாடுகள் தொடர்பாக பொலிசார் இதுவரை மேற்கொண்டுள்ள விசாரணைகளின் முன்னேற்றம் யாது என்பதையும்;

(v) சனச வங்கிமூலம் கடன்பெற்றுள்ள Gampaha Development Company (Pvt.) Ltd. (GDC) நிறுவனம் தொடர்பாகப் பொலிசாருக்கு முறைப் பாடுகள் கிடைத்துள்ளனவா என்பதையும்;

(vi) அவ்வாறெனில், அந்த முறைப்பாடுகள் தொடர்பில் இதுவரை மேற்கொள்ளப்பட்டுள்ள விசாரணைகளின் முன்னேற்றம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) whether any complaints have been received by the police from the depositors of Gampaha Sanasa Development Bank who have suffered injustices;

(ii) if so, the number of such complaints;

(iii) separately, the date on which each of the said complaints was received by the police;

(iv) the progress of the investigations conducted by the police so far regarding the said complaints;

(v) whether any complaints have been received by the police regarding the Gampaha Development Company (Pvt.) Ltd. (GDC), which has obtained a loan from the Gampaha Sanasa Development Bank; and

(vi) if so, the progress of the investigations conducted by the police so far regarding the said complaints?

(b) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) 207කි.

ගම්පහ පොලිස් ස්ථානය වෙත පැමිණිලි 203යි.

මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත පැමිණිලි 04යි.

(iii) පහත ඇමුණුමෙහි වගුවල (ii) තීරුව මඟින් දක්වා ඇත.

ඇමුණුම

❖ ගම්පහ පොලිස් ස්ථානය :-

1.

| අනු අංක (i) | පැමිණිලි වාර්තා වූ දිනය (ii) | පැමිණිල්ල (iii) | පැමිණිලි සංඛ්‍යාව (iv) | ප්‍රගතිය (v) |
|---|---|---|---|---|
| 1 | 2019.02.09 | තැන්පත් මුදල් ආපසු නොගෙවීම සම්බන්ධව | 1 | දෙපාර්ශවය ස්ථානයට කැඳවීමෙන් පසුව සමථයට පත්ව ඇත. |
| 2 | 2019.03.01 | | 1 | |
| 3 | 2019.03.07 | | 1 | |
| 4 | 2019.03.11 | | 1 | |
| 5 | 2019.03.19 | | 1 | |
| 6 | 2019.05.03 | | 1 | |
| 7 | 2019.06.10 | | 1 | |
| 8 | 2019.06.26 | තැන්පත් මුදල් ආපසු නොගෙවීම සම්බන්ධව | 1 | මෙම පැමිණිල්ල විමර්ශණයේදි සණස තැම්පත්කරුවන්ගේ සංගමය විසින් අංක CA/WRT/59/20 යටතේ අභියාචනා අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බවත්, එම නඩුවට අදාලව ආයතනයේ සියළුම නිශ්චල චංචල දේපල බැහැර කිරීම තහනම් කරමින් නියෝගයක් ලබා දී ඇති බවත් එම නඩුවේ අවසන් තීන්දුවට අනුව ක්‍රියාකරන බවට වර්ථමාන අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත දන්වා ඇත. |
| 9 | 2019.07.01 | තැන්පත් මුදල් ආපසු නොගෙවීම සම්බන්ධව | 2 | දෙපාර්ශවය පොලිස් ස්ථානයට කැඳවීමෙන් පසුව සමථයට පත්ව ඇත. |
| 10 | 2019.07.03 | | 1 | |
| 11 | 2019.07.17 | | 1 | |
| 12 | 2019.07.18 | | 2 | |
| 13 | 2019.09.03 | තැන්පත් මුදල් ආපසු නොගෙවීම සම්බන්ධව පැමිණිලි පිටපත් ලබා ගැනීම සඳහා | 2 | සිවිල් නඩු පවරාගැනීම සඳහා පැමිණිලි පිටපත් නිකුත් කර ඇත |
| 14 | 2019.09.04 | තැන්පත් මුදල් ආපසු නොගෙවීම සම්බන්ධව | 1 | දෙපාර්ශවය පොලිස් ස්ථානයට කැඳවීමෙන් පසුව සමථයට පත්ව ඇත. |
| 15 | 2019.09.05 | | 1 | |
| 16 | 2019.09.06 | | 3 | |
| 17 | 2019.09.07 | | 1 | |
| 18 | 2019.09.08 | | 1 | |
| 19 | 2019.09.09 | | 1 | |
| 20 | 2019.09.09 | තැන්පත් මුදල් ආපසු නොගෙවීම සම්බන්ධව පැමිණිලි පිටපත් ලබා ගැනීම සඳහා | 1 | සිවිල් නඩු පවරා ගැනීම සඳහා පැමිණිලි පිටපත් නිකුත් කර ඇත |
| 21 | 2019.09.10 | | 7 | |
| 22 | 2019.09.12 | | 1 | |
| 23 | 2019.09.14 | | 1 | |
| 24 | 2019.09.16 | | 1 | |
| 25 | 2019.09.17 | | 1 | |
| 26 | 2019.09.18 | | 2 | |
| 27 | 2019.09.20 | | 1 | |
| 28 | 2019.09.21 | | 1 | |
| 29 | 2019.09.22 | | 1 | |
| 30 | 2019.10.02 | | 1 | |
| 31 | 2019.10.03 | | 1 | |
| 32 | 2019.10.04 | තැන්පත් මුදල් ආපසු නොගෙවීම සම්බන්ධව | 2 | දෙපාර්ශවය පොලිස් ස්ථානයට කැඳවීමෙන් පසුව සමථයට පත්ව ඇත. |
| 33 | 2019.10.06 | | 1 | |
| 34 | 2019.10.07 | | 1 | |
| 35 | 2019.10.08 | | 1 | |
| 36 | 2019.10.15 | | 3 | |
| 37 | 2019.10.18 | | 2 | |
| 38 | 2019.10.20 | | 1 | |
| 39 | 2019.10.21 | | 1 | |
| 40 | 2019.10.22 | | 1 | |
| 41 | 2019.10.23 | | 2 | |
| 42 | 2019.10.25 | | 1 | |
| 43 | 2019.10.26 | | 1 | |
| 44 | 2019.10.27 | | 1 | |
| 45 | 2019.10.28 | | 1 | |
| 46 | 2019.10.29 | | 1 | |
| 47 | 2019.10.31 | | 1 | |
| 48 | 2019.11.01 | | 2 | |
| 49 | 2019.11.04 | | 2 | |
| 50 | 2019.11.05 | | 5 | |
| 51 | 2019.11.06 | | 15 | |
| 52 | 2019.11.07 | | 7 | |
| 53 | 2019.11.08 | | 5 | |
| 54 | 2019.11.09 | තැන්පත් මුදල් ආපසු නොගෙවීම සම්බන්ධව පැමිණිලි පිටපත් ලබා ගැනීම සඳහා | 5 | සිවිල් නඩු පවරා ගැනීම සඳහා පැමිණිලි පිටපත් නිකුත් කර ඇත |
| 55 | 2019.11.11 | | 7 | |
| 56 | 2019.11.12 | | 1 | |
| 57 | 2019.11.13 | | 8 | |
| 58 | 2019.11.14 | | 6 | |
| 59 | 2019.11.15 | | 5 | |
| 60 | 2019.11.18 | | 3 | |
| 61 | 2019.11.19 | | 4 | |
| 62 | 2019.11.20 | | 20 | |
| 63 | 2019.11.21 | | 5 | |
| 64 | 2019.11.22 | | 3 | |
| 65 | 2019.11.23 | | 2 | |
| 66 | 2019.11.25 | | 2 | |
| 67 | 2019.11.26 | | 3 | |
| 68 | 2019.11.27 | | 1 | |
| 69 | 2019.11.28 | | 1 | |
| 70 | 2019.11.29 | | 1 | |
| 71 | 2019.12.02 | | 1 | |
| 72 | 2019.12.07 | | 1 | |
| 73 | 2019.12.23 | | 1 | |
| 74 | 2019.12.29 | | 1 | |
| 75 | 2020.01.07 | | 1 | |
| 76 | 2020.01.09 | | 1 | |
| 77 | 2020.01.13 | | 1 | |
| 78 | 2020.01.17 | | 1 | |
| 79 | 2020.01.18 | | 2 | |
| 80 | 2020.01.23 | | 1 | |
| 81 | 2020.01.24 | | 2 | |
| 82 | 2020.02.03 | | 1 | |
| 83 | 2020.03.05 | තැන්පත් මුදල් ආපසු නොගෙවීම සම්බන්ධව | 1 | මෙම පැමිණිල්ල විමර්ශනයේදි සණස තැම්පත්කරුවන්ගේ සංගමය විසින් අංක CA/WRT/59/20 යටතේ අභියාචනා අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බවත්, එම නඩුවට අදාලව ආයතනයේ සියළුම නිශ්චල චංචල දේපල බැහැර කිරීම තහනම් කරමින් නියෝගයක් ලබා දී ඇති බවත් එම නඩුවේ අවසන් තීන්දුවට අනුව ක්‍රියාකරන බවට වර්ථමාන අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත දන්වා ඇත. |
| 84 | 2020.06.29 | තැන්පත් මුදල් ආපසු නොගෙවීම සම්බන්ධව පැමිණිලි පිටපත් ලබා ගැනීම සඳහා | 1 | සිවිල් නඩු පවරා ගැනීම සඳහා පැමිණිලි පිටපත් නිකුත් කර ඇත. |
| 85 | 2020.07.14 | | 1 | |
| 86 | 2020.07.30 | | 1 | |
| 87 | 2020.07.31 | | 1 | |
| 88 | 2020.09.10 | | 1 | |
| 89 | 2020.09.22 | | 1 | |
| 90 | 2020.09.29 | | 1 | |
| 91 | 2020.11.23 | | 1 | |
| 92 | 2020.11.25 | | 2 | |
| 93 | 2020.12.19 | | 1 | |
| එකතුව | | | 203 | |

මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය :-

2.

| අනු අංක (i) | පැමිණිල්ල වාර්තා වූ දිනය (ii) | පැමිණිල්ල (iii) | ප්‍රගතිය (iv) |
|---|---|---|---|
| 01 | 2019.08.02 | සී/ස සණස ගම්පහ දිස්ත්‍රික් සංගමයේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් තැන්පත්කරුවන්ගේ මුදල් වලින් සිදුකර ඇති මූල්‍ය වංචා | 2023.10.24 දින නීතිපති උපදෙස් සඳහා අංක CR1/305/2023 යටතේ යොමු කර ඇත. නීතිපති උපදෙස් මෙතෙක් ලැබී නොමැත. |
| 02 | 2019.11.23 | සීමාසහිත ගම්පහ සණස නගර බැංකුව සමිතියේ රු.11,757,389.00 ක මුදලක් වංචා කිරීම.<br><br>සීමාසහිත ගම්පහ සණස නගර බැංකුව සමිතියේ තැන්පත් කරුවන් 1233 දෙනෙකු විසින් තැන්පත් කරන ලද රු කෝටි 72 ක මුදල් වංචා කිරීම. | ගම්පහ ම/උ බී 1351/19 හා බී2722/19 දරන නඩු කරයන් එක් විමර්ශනයක් ලෙස පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් උපදෙස් පතා සහ විමර්ශනයේ සංකීර්ණතාවය හේතුවෙන් නීතිපති නියෝජනයක් ලබා දෙන ලෙසට 2020.01.04 දින ඉල්ලීම් කර ඇත. 2019.12.27, 2021.11.24, 2024.04.05 යන දිනයන්හි CR1/240/2019 නීතිපති තුමා වෙත උධෘත ගොනු යොමු කර ඇත. |
| 03 | 2020.02.26 | සීමාසහිත මැදගම්පිටිය සණස සමිතියේ සාමාජිකයින්ගේ තැන්පත් මුදල් වංචා කිරීම. | CR1/270/2023 යටතේ 2023.09.15 වන දින නීතිපති උපදෙස් සඳහා උධෘත යොමු කර ඇත. නීතිපති උපදෙස් අනුව වැඩිදුර විමර්ශන සිදු කරමින් පවතී. |
| 04 | 2020.02.25 | සීමාසහිත හෙනරත්ගොඩ සණස සමිතියේ සිදුකර තිබෙන මහා පරිමාණ වංචා දූෂණ අක්‍රමිකතා හා මුදල් අවභාවිතය පිළිබඳව විමර්ශනය. | නීතිපති වෙත යොමු කිරීම සඳහා අධිකරණය මඟින් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව සිදු කල යුතු විමර්ශන කඩිනමින් අවසන් කර නීතිපති වෙත යොමු කිරීමට නියමිතව ඇත. |

(iv) ඉහත ඇමුණුමෙහි 1 වන වගුවේ (v) තීරුව මඟින් හා 2 වගුවේ (iv) තීරුව මඟින් දක්වා ඇත.

(v) ඔව්.

ගම්පහ පොලිස් ස්ථානය වෙත පැමිණිලි 02යි.

මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත පැමිණිලි 01යි.

(vi)

**ගම්පහ පොලිස් ස්ථානය:**

2020.01.13 - මුදල් ආරාවුලක් සම්බන්ධයෙන් අංක 118 වරපලාන, උඩුතුත්තිරිපිටිය ලිපිනයේ පදිංචි විජේසිංහ ආරච්චිලාගේ නාලක ප්‍රියදර්ශන විජේසිංහ යන අය විසින් (CIB1 42/179) පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන්

[ගරු ආනන්ද විජේපාල මහතා]

දෙපාර්ශ්වය පොලිස් ස්ථානයට කැඳවා පැමිණිල්ල විභාග කර මුදල් ගෙවීමට එකඟ වී සමථ වී ඇත. පැමිණිල්ල සමථයට පත් වූ බැවින් අධිකරණයට කරුණු වාර්තා කර නොමැත.

2010.01.22 - ගොඩනැගිල්ලක ආරාවුලක් සම්බන්ධයෙන් අංක 104 අඹන්විට, ගම්පහ ලිපිනයේ පදිංචි දුනිල් මායාදුන්න ඒකනායක යන අය විසින් (CIB 1 219/315) පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් විභාග කර සිවිල් නඩුවක් පවරා ගැනීමට උපදෙස් ලබා දී පැමිණිල්ල අවසන් කර ඇත.

**මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය:**

සණස වතුරශ්‍රය, උසාවිය පාර, ගම්පහ ලිපිනයේ පවත්වාගෙන යන ලද Gampaha Development Company (Pvt.) Limited ආයතනය විසින් ගම්පහ, මේරි බිසෝ මාවතේ ඉදි කර ඇති වෝඩ් සිටි සාප්පු සංකීර්ණයේ කඩ කාමර මිල දී ගැනීම සඳහා ගැනුම්කරුවන්ගෙන් රුපියල් 1,129,648,528ක -රුපියල් මිලියන 1129.6ක- මුදලක් ලබාගෙන එම කඩ කාමරවල හිමිකම් ලබා දීමට කටයුතු නොකර වංචා කර ඇති බවට 2019.07.25 දිනැතිව වෝඩ් සිටි වෙළඳ සැල් හිමියන්ගේ සංගමයේ ලේකම් රංජිත් පෙරේරා සහ එම සංගමයේ සභාපති අනුර ගමිණි යන අයගේ අත්සනින් යුතුව ඉදිරිපත් කර ඇති ලිඛිත පැමිණිල්ලකට අනුව FCID 43/2019 යටතේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් ගම්පහ මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී 2378/21 යටතේ කරුණු වාර්තා කර විමර්ශනයක් සිදු කරනු ලබයි.

- එකී පැමිණිල්ල අනුව වගඋත්තරකාර සමාගම විසින් ගම්පහ නගරය තුළ "සණස සමඟ පිබිදෙන ගම්පහ" නමින් කඩ කාමර ඉදි කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති බවටත්, කඩ කාමර විකිණීමේ පොරොන්දු ගිවිසුම් මත ගැනුම්කරුවන් වෙත ලබා දී ඇති බවටත්, මෙතෙක් එම කඩ කාමරවලට අදාළව නීත්‍යානුකූල හිමිකම පවරා දීමට කටයුතු කර නොමැති බවටත් කරුණු අනාවරණය වී ඇත.

- ඒ අනුව, අදාළ කඩ කාමර ලබා ගැනීමට මුදල් ගෙවා ඇති පුද්ගලයන්ගේ ප්‍රකාශ සටහන් කර, අදාළ විකිණීමේ පොරොන්දු ගිවිසුම් ඇතුළු ලේඛන භාරයට ගනිමින් පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශන සිදු කරමින් පවතී. එලෙසම Gampaha Development Company (Pvt.) Limited ආයතනයේ සාමාන්‍යාධිකාරි ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය කැඳවා ප්‍රකාශ සටහන් කරගෙන ඇත.

- තවද, මෙම කඩ කාමර සහ නිවාසවල ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැති බවත්, එකී ගොඩනැගිලි සඳහා මෙතෙක් අනුකූලතා සහතිකය සහ සභාධිපත්‍ය කළමනාකරණ සහතිකය ලබාගෙන නොමැති බවත්, ඉදිකිරීම් සඳහා මූලික ප්‍රාග්ධන මුදල් ලබා ගැනීමේ අරමුණින් ඉදි කරමින් පවතින ගොඩනැගිලිවලට අදාළ ඉඩම් කොටස විවිධ මූල්‍ය ආයතන වෙත උකස් කර රුපියල් මිලියන 52ක මුදලක් ලබාගෙන ඇති බවත් අනාවරණය වී ඇත.

- මෙකී ප්‍රශ්නගත දේපළ ගැනුම්කරුවන් වෙත අලෙවි කිරීමේදී ඉදිකිරීම් අවසන් නොකරන ලද කඩ කාමර ද ලබා දී ඇති බවට අනාවරණය වී ඇති අතර, ඉදිකිරීම් නිසි අයුරින් අවසන් නොකිරීම හේතුවෙන් සහ නීත්‍යානුකූල හිමිකම් පවරා නොදීම හේතුවෙන් අගතියට පත් ගැනුම්කරුවන් සමඟින් Gampaha Development Company (Pvt.) Limited සමාගම හෙවත් ජීඩීසී සමාගම විසින් එළඹ ඇති විකිණීමේ පොරොන්දු ගිවිසුම් පරීක්ෂාවට ලක් කරමින් ඉදිරි විමර්ශන කටයුතු සිදු කරමින් පවතී.

(ආ) පැන නොනඟී.

**ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)

ගරු කථානායකතුමනි, මට එක් අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

ගරු ඇමතිතුමා පැවසූ ආකාරයටම විශේෂයෙන්ම ගම්පහ සණස ව්‍යාපාරය සම්බන්ධයෙන් පැමිණිලි 200කට වැඩි ප්‍රමාණයක් ඇවිත් තිබෙනවා. ඒ වාගේම, සණස ව්‍යාපාරයට අනුබද්ධ නොවුණත්, පෞද්ගලික ආයතනයක් විධියට ජීඩීසී ආයතනය සම්බන්ධයෙනුත් පැමිණිලි විශාල ප්‍රමාණයක් ලැබී තිබෙනවා. මූල්‍යමය වශයෙන් ගත්තොත්, මිලියන 1,000කට වැඩි මූල්‍ය වංචාවක් එතැන සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මම එක් කාරණයක් දැනගන්න කැමැතියි. එම ව්‍යාපාරය සම්බන්ධයෙන් කියැවෙන මේ වංචාවට අදාළව එක පැත්තකින් විවිධ අමාත්‍යාංශ පවා ගැට ගැහෙනවා. විශේෂයෙන් වෝඩ් සිටි සාප්පු සංකීර්ණයේ කඩ කාමර සම්බන්ධ කාරණයේදී එක පැත්තකින් UDA එක, සමුපකාර දෙපාර්තමේන්තුව ගැට ගැහෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් නිශ්චිත විමර්ශනයක් කෙරෙන්න ඕනෑ, නිශ්චිත කරුණු කාරණා හෙළි වෙන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් පැමිණිලි යොමු කරලා තිබෙනවා, විශේෂයෙන්ම FCID එකට. මේ විමර්ශන කටයුතු ඉක්මන් කර ගන්න අමාත්‍යාංශය විධියට ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද කියා මා දැනගන්න කැමැතියි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, මේ පැමිණිල්ල විභාග කරන්නේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මඟින්. 2019දීයි මේ පැමිණිල්ල ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඔබතුමාත් දන්නවා, පසුගිය කාලයේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය අක්‍රිය කරලා තිබුණු බව. මෑතකදී තමයි මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය නැවතත් ස්ථාපිත කරලා විධිමත් කරලා තිබෙන්නේ. දැන් කඩිනමින් විමර්ශන සිද්ධ කරමින් යනවා. මේ වන විටත් මූලික කාරණා හඳුනාගෙන තිබෙනවා. මේ පිළිබඳව ගත හැකි කඩිනම් ක්‍රියාමාර්ග ගන්න අවශ්‍ය උපදෙස් අමාත්‍යාංශය හැටියට ලබා දෙන්න අපි කටයුතු කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)

අතුරු ප්‍රශ්න එපමණයි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### නිල සංචිත තත්ත්වය සහ විදේශ ගෙවීම් gateways හරහා විදේශ විනිමය අහිමි වීම
### மொத்த உத்தியோகபூர்வ கையிருப்பு நிலைமை மற்றும் வெளிநாட்டு கட்டண நுழைவாயில்கள் மூலம் அந்நியச் செலாவணி இழப்பு
### GROSS OFFICIAL RESERVE SITUATION AND LOSS OF FOREIGN EXCHANGE THROUGH FOREIGN PAYMENT GATEWAYS

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ දළ නිල විදේශ සංචිතයෙහි - Gross Official Reservesහි - අඛණ්ඩතාව, සංයුතිය සහ භාවිතයට යෝග්‍යතාව සම්බන්ධයෙන්, විදේශීය Credit Cards සහ payment gateways හරහා සිදු වන විදේශ විනිමය රටින් පිටවීම සම්බන්ධයෙන්, එමෙන්ම 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන නියාමන ක්‍රියාමාර්ගවල සමානභාවය සම්බන්ධයෙන් රජයෙන් හදිසි ප්‍රකාශයක් ඉල්ලා සිටිමි. Hon. Speaker, this is in the background of the Central Bank issuing a Circular under the Foreign Exchange Act, No. 12 of 2017.

ගරු කථානායකතුමනි, සංචිත විශ්වසනීයභාවය හිස් සංඛ්‍යා අගයන් මත පමණක් නොව, පැහැදිලිභාවය, ක්‍රියාත්මක කළ හැකි බව සහ නියාමන සමානභාවය මත පදනම් විය යුතුය. That means, it must be based on factual and practical reserves that are demonstrated. එබැවින් පහත කරුණු සම්බන්ධයෙන් සම්පූර්ණ ප්‍රකාශයක් මෙම ගරු සභාවට ඉදිරිපත් කරන ලෙස මම ඉල්ලා සිටිමි.

1. නවතම වාර්තා කරන ලද Gross Official Reserves ප්‍රමාණය කීයද? එයින් බැඳී ඇති වත්කම්, swap ගිවිසුම් සහ ඇප තැබූ මුදල් ඉවත් කළ පසු භාවිතයට යෝග්‍ය සංචිත ප්‍රමාණය කීයද? 2023-2025 වර්ෂ තුළ Gross Official Reserves මත ලැබූ ආදායම වාර්ෂිකව කීයද?

   There seems to be a trend of domestic swaps taking place, Sir. That is the reason why, for the protection of the country, I am asking this.

2. Gross Official Reserves පිළිබඳව වෙන් වූ විස්තරාත්මක විග්‍රහයක් සපයන්න:
   (a) රන් සංචිත (ප්‍රමාණය හා වටිනාකම් ක්‍රමවේදය) - මෙය භෞතික රන්ද, නැතහොත් කඩදාසි/රන් පත්‍රද? Is it real gold or gold paper?
   (b) ප්‍රධාන මුදල් වර්ග අනුව විදේශ මුදල් වත්කම්;
   (c) SDR හිමිකම්;
   (d) IMF සංචිත ස්ථානය;
   (e) විදේශ swaps - ප්‍රධාන මුදල, කාල සීමාව, පරිණත දිනය හා සමස්ත වියදම;
   (f) දේශීය swaps - ප්‍රමාණය, කාල සීමාව, අලුත් කිරීමේ කොන්දේසි හා වියදම.

   Sir, I am asking this question on purchase price and sale price because we see hot money being used to show that there are reserves being created in the country. So, that phenomenon needs to be clarified.

3. වාර්තා කර ඇති මුළු සංචිතයෙන් කොපමණ ප්‍රමාණයක් බැඳී ඇතිද, swap මත පදනම් වූද, හෝ ණය සේවය හා මුදල් ස්ථායීකරණය සඳහා භාවිත කළ නොහැකිද?

4. රජයට ඩොලර් මිලදී ගැනීමේදී හෝ විකිණීමේදී මහ බැංකුව යොදන රුපියල් margin/ ගාස්තු/ විස්තර මොනවාද? පසුගිය වසර තුන තුළ එවැනි ගනුදෙනුවලින් මහ බැංකුව වාර්ෂිකව උපයා ඇති ලාභය කීයද?

   Sir, I am asking about the swap between the buying price and the selling price because the only money that the Central Bank makes is by dealing with the Government.

5. විගණකාධිපති විසින් අඛණ්ඩ සහ ව්‍යවස්ථානුකූල විගණනයකට මහ බැංකුව ලක් කරන්නේද? එසේ නම්, නවතම විගණන වාර්තාව, විගණන පරාසය, නියැදි ප්‍රමාණය, swap සහ රන් සත්‍යාපන විස්තර සභාවට ඉදිරිපත් කරන්නේද?

6. දේශීය ආයතන සම්බන්ධයෙන් නිකුත් කළ නවතම විදේශ මුදල් චක්‍රලේඛය නිකුත් කිරීමට හේතුව කුමක්ද?

7. විදේශ ගෙවීම් gateways හරහා credit card ගෙවීම් සිදු කිරීමෙන් ඇති වන විදේශ විනිමය හා බදු ආදායම් අහිමිවීම මහ බැංකුව ගණනය කර තිබේද?

   There is a loss of about US Dollars 3 billion. So, the Government could use the foreign exchange as well as the revenue that would come from within.

8. දේශීය ආයතන දැඩිව නියාමනය කරන අතර, විදේශ ගෙවීම් gateway භාවිත කර විදේශ විනිමය රටින් පිටතට හරවන අනුකූල නොවන ව්‍යාපාරික ආයතනයන්ට එරෙහිව බැඳී සිටින චක්‍රලේඛයක් නිකුත් නොකළේ ඇයි?

ගරු කථානායකතුමනි, මෙම කරුණු සම්බන්ධයෙන් මම සම්පූර්ණ පැහැදිලි කිරීමක් ඉල්ලා සිටිමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට සවිස්තරාත්මක පිළිතුරක් ලබා දීම සඳහා සති දෙකක කාලයක් මා ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය, ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම අමාත්‍යතුමියගේ නිවේදනයට බාධා කරනවා නොවෙයි. ස්ථාවර නියෝග 92(2)(ආ) යටතේ මම ගරු කථානායකතුමාගේ අවධානයට මේ කරුණ යොමු කරන්න කැමැතියි. මේක බරපතළ ප්‍රශ්නයක්. ගරු කථානායකතුමනි, අය වැයෙන් මුදල් වෙන් කරනකොට විශේෂ වියදම් ඒකක කියලා සියලු කොමිෂන් සභාවලට වෙනම මුදල් වෙන් කිරීමක් සිද්ධ වනවා. ඒවා කිසිම අමාත්‍යාංශයක් යටතේ එන ඒවා නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි. මේක වැදගත් කාරණාවක්.

ස්ථාවර නියෝග 27 (2) යටතේ මම ප්‍රශ්නයක් ඇහුවා, කාන්තා කොමිසම ගැන. කාන්තා කොමිසම ඇත්තවශයෙන්ම ස්වාධීන කොමිසමක්. හැබැයි මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, කාන්තා කොමිසම ගැන ප්‍රශ්නය අහනකොට, ස්වාධීන යැයි කියන කාන්තා කොමිසම කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ ගැසට් කරලා තිබීම සම්බන්ධව. ඒක බරපතළ වරදක්. මම මේ ලේඛනය ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්. රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අධිකරණ සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හා මැතිවරණ කොමිෂන් සභාව යනාදී කොමිෂන් සභාවලට මුදල් වෙන් කරලා තිබෙන්නේ විශේෂ වියදම් ඒකක යටතේයි.

ඒ වරප්‍රසාදම මේ කාන්තා කොමිසමට; වනිතා කටයුතු කොමිසට ලැබෙන්නට ඕනෑ. නමුත් මේ රජය වරදක් කරලා තිබෙනවා. ස්වාධීන යැයි කියන කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ ගැසට් කිරීමම වැරදියි. එතැනින්ම එහි ස්වාධීනත්වය නැති වෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි. ගරු ඇමතිතුමියට මේ ප්‍රශ්නයට උත්තර දෙන්න පුළුවන්. ඒකේ කිසි ගැටලුවක් නැහැ. නමුත් මෙතැන බරපතළ වරදක් සිද්ධ වෙලා තිබෙනවා. අනෙක් සියලු කොමිෂන් සභා ස්වාධීන හැටියට සලකලා, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය යටතට වනිතා කොමිසම ඇතුළත් කිරීම මේ රටේ සියයට 52ක් වූ කාන්තා පරපුරට කරපු නිග්‍රහයක් හැටියටයි අපි දකින්නේ. දැන් එතුමියට මම අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමිය, අමාත්‍යාංශ නිවේදනය ඉදිරිපත් කරන්න.

## කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ වර්තමාන තත්ත්වය: කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගේ ප්‍රකාශය
## பெண்கள் பற்றிய தேசிய ஆணைக்குழுவின் தற்போதைய நிலை: மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரினது கூற்று
## CURRENT STATUS OF NATIONAL COMMISSION ON WOMEN: STATEMENT BY MINISTER OF WOMEN AND CHILD AFFAIRS

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)
මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු විපක්ෂ නායකතුමා 2026.02.03වැනි දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසා තිබෙන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමට පෙර මම මුලින්ම එතුමා ඒ යටතේ මතු කළ කාරණයට අදාළ නීත්‍යනුකූල පසුබිම පොඩි වෙලාවක් තුළ කියන්නම්. කාන්තා කොමිසම කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ ගැසට් කරපු ආයතනයක් නොවෙයි.

2024 අංක 37 දරන කාන්තාවන් සවිබලගැන්වීමේ පනතේ අරමුණු සාක්ෂාත් කිරීම සඳහා පනතේ 6වන වගන්තිය පරිදි තමයි කාන්තාවන් පිළිබඳව ජාතික කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කරන්න වෙන්නේ. මොකද, අපේ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලින් එකක් තමයි, කාන්තා කමිටුව. කාන්තාවන් සවිබලගැන්වීමේ පනතට අනුව "කාන්තා කමිටුව" කියන එක අහෝසි වීමෙන් පසුව තමයි මෙන්න මේ "කාන්තා කොමිසම" කියන එක ස්ථාපිත වෙන්නේ. එතකොට මෙතෙක් කාලයක් පුරාවටම; මේ පනත ක්‍රියාත්මක වනතුරු අපේ අමාත්‍යාංශය යටතේ පැවති කාන්තා කමිටුව 2024 අංක 37 දරන කාන්තාවන් සවිබලගැන්වීමේ පනතට අනුව තමයි කාන්තා කොමිසම බවට ස්ථාපිත වන්නේ; පත් වන්නේ. ඒ කොමිසම පත්වීමෙන් පසු ඒක ස්වාධීන ආයතනයක්. ඒකට අපේ කිසිදු බලපෑමක් නැහැ. මේ ක්‍රියාවලිය ඇතුළේ රජය හැටියට අපි සම්පූර්ණයෙන්ම ඒ කොමිසමේ ස්වාධීනත්වය වෙනුවෙන් පෙනී ඉන්නවා. ඒ වාගේම ඒ කොමිසමේ ස්වාධීනත්වය අපි පිළිගන්නවා. ඒ වාගේම ලංකාවේ සියයට 52ක් වෙච්ච කාන්තාවන් වෙනුවෙන් මේ කාන්තා කොමිසම පිහිටුවීමේ ගෞරවය හා වගකීම අපි භාරගෙන තිබෙනවා කියන එකත් මේ වෙලාවේ මම කියනවා.

ගරු විපක්ෂ නායකතුමා විසින් 2026.02.03වැනි දින ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. 2024 අංක 37 දරන කාන්තාවන් සවිබලගැන්වීමේ පනතෙහි කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ කාර්යභාරය සඳහන් කර තිබෙනවා. එහි කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීම හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීම පිළිබඳව පරීක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම සහ පනතේ IIවන කොටසේ විධිවිධාන ප්‍රකාරව පැමිණිලි භාර ගැනීම කියන කාර්යභාරයේ සිට කාර්යභාරයන් 23ක් නම් කර තිබෙනවා. එම කාර්යභාරයන් ඇතුළත් ප්‍රශ්න අංක 1ට අදාළ පිළිතුර මා **සභාගත*** කරනවා.

---

***පිළිතුර අවසානයේ පළ කර ඇත.**
** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
**Produced at end of Answer.*

එම සභාපතිනිය ධුරයෙන් ඉල්ලා අස් වූ බවට e-mail පණිවුඩයක් මඟින් අමාත්‍යාංශයට දැනුම් දී තිබෙනවා. ඒ වාගේම එතුමිය ඒ බව මා වෙත දැනුම් දීමේ අවශ්‍යතාවක් නැහැ. මොකද, එතුමිය ස්වාධීන කොමිසමක සභාපතිවරියක්. ස්වාධීන කොමිසමක සභාපතිවරයා පත් කිරීම ජනාධිපතිවරයා ඇතුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මඟින් කරන එකක්. ඒ නිසා එතුමියගේ ඉල්ලා අස්වීම මා වෙත ලිඛිතව හෝ මොනම ආකාරයකින්වත් දැනුම් දීමේ අවශ්‍යතාවක් නැහැ කියා මා හිතනවා. එතුමියට මම ඉතාම කෘතවේදී වෙනවා. ඒ වාගේම එතුමිය සභාපති ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය භාර දී තිබෙන්නේ ජනාධිපතිතුමා වෙත. එබැවින් එම ඉල්ලා අස්වීමට හේතුව පිළිබඳව අමාත්‍යාංශය හැටියට අප දැනුවත් නැහැ. මම පෞද්ගලිකව ඒකට නිශ්චිත හේතු සොයා බැලීමක් කරන්නේ නැහැ. මොකද, ජනාධිපතිවරයා වෙත තමයි ඒ දැනුම් දීම කරන්න අවශ්‍ය වන්නේ.

2. ඒ කාරණාව සම්බන්ධයෙන් මට කියන්න තිබෙන්නේ මෙයයි. ඇත්තටම 2026 වර්ෂය සඳහා අපි අය වැය යෝජනා ලබා ගැනීම සිදු කළේ 2025 මැයි මාසයේදී. 2025 මැයි මාසය වෙනකොට අපි අමාත්‍යාංශය ලෙස 2026 සඳහා අය වැය යෝජනා ඉදිරිපත් කරලා තිබුණා. ඒ වෙනකොට කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසම ආරම්භ කිරීම හෝ ඊට අදාළ කටයුතු ආරම්භ වෙලා තිබුණේ නැහැ. 2025 සැප්තැම්බර් මාසයේදී තමයි දැන්වීම් පළ කරලා, අදාළ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සඳහා අයදුම්පත් කැඳවලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හරහා කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසම සඳහා තෝරා පත් කිරීම් සිද්ධ වුණේ. ඒ නිසා 2026 වර්ෂය සඳහා කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට අතිරේක ප්‍රතිපාදන වෙන් කර ගැනීම සඳහා ජාතික අය වැය දෙපාර්තමේන්තුවෙන් කරන ලද ඉල්ලීමකට අනුව රුපියල් මිලියන 50ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමෙන් ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කරනවා.

මේ ස්වාධීන කොමිසමේ, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසමේ අදාළ රාජකාරි සඳහා විධායක අධ්‍යක්ෂවරියක් පත් කරලා තිබෙනවා. 2026 ජනවාරි 7 වැනිදා සිට එතුමියගේ පත්වීම බලාත්මක වෙලා තිබෙනවා. ඒ කියන්නේ, මේ වර්ෂයේ ජනවාරි 7වැනි දා සිට. එතැන් පටන් එතුමිය විසින් තමයි මේ කාර්යාවලිය ආරම්භ කරන්නේ. එතකොට, මේ අදාළ පරිශ්‍රයන් සොයා ගැනීම සහ අනෙකුත් කටයුතු පිළිබඳව එතුමිය කටයුතු කරමින් ඉන්නවා.

3. ඇත්තටම ගත්තොත්, ගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ ඉඳලා මේ දක්වා වූ කාලය තුළ ආයතනය ක්‍රියාත්මක කිරීම සඳහා පරිශ්‍රයක් නැහැ. අපේ අමාත්‍යාංශය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය පවතින්නේත් නාගරික සංවර්ධන අමාත්‍යාංශයට අයත් පරිපාලන ගොඩනැඟිල්ලක් වන සෙත්සිරිපායේ තුන්වැනි මහලේ. මේ වෙනකොට එහි හිස් අවකාශයක්, හිස් පරිශ්‍රයක් තිබෙනවා. අදාළ ප්‍රතිපාදන ලැබිලා, ඒ අනුව ඉදිරියේදී වෙනත් ස්වාධීන ස්ථානයක් සොයා ගන්නා තෙක් විධායක අධ්‍යක්ෂතුමියට කටයුතු කරගෙන යන්න එම පරිශ්‍රය තාවකාලිකව භාවිතා කළ හැකි බව අපි කියලා තිබුණා. ඒ කියන්නේ මේ කොමිසම සඳහාම නොවෙයි, එතුමියගේ නිල රාජකාරි සඳහා අවශ්‍ය නම්. ඒක කිසිසේත්ම එහි ස්වාධීනත්වයට අපි කරන මැදිහත්වීමක් හෝ ඇඟිලි ගැසීමක් නොවෙයි.

ඒ වාගේම අපේ විපක්ෂ නායකතුමාට මේ කාරණය හොඳින් අවබෝධ කර ගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. ගොඩනැඟිල්ලක භෞතිකව කොච්චර දුරින් ඉන්නවාද කියන එක මත නොවෙයි කොමිසමක ස්වාධීනත්වය තීරණය වෙන්නේ. කොමිසමක ස්වාධීනත්වය තීරණය වෙන්නේ, ඒ ගනු ලබන තීන්දු තීරණ හා ඒ කාරණා සම්බන්ධව අපි කොයි තරම් මැදිහත්වීම් කරනවාද කියන කාරණය මතයි. අපි එහෙම කිසිදු මැදිහත්වීමක් කරලා නැහැ. ආයතනයක් භෞතිකව කොච්චර ඈතින් පිහිටුවනවාද කියන එක මත කොමිසමේ ස්වාධීනත්වය තීරණය වෙන්නේ නැහැ කියන එක අපේ විපක්ෂ නායකතුමාට තේරුම් ගන්න හැකියාව තිබෙනවා ඇතැයි මම හිතනවා.

කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව සඳහා සුදුසු පරිශ්‍රයක් ස්ථිරව ලබා ගන්නා තෙක් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය කුලී පදනම මත දැනට පවත්වාගෙන යනු ලබන නාගරික සංවර්ධන අධිකාරියට අයත් පරිශ්‍රය තුළ තාවකාලික ස්ථානයක් වෙන් කර දී තිබුණා. කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරිය 2026 ජනවාරි 7වැනි දා සිට රාජකාරි භාරගෙන කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව කොමිෂන් සභාවට ස්ථිර ලෙස කාර්ය මණ්ඩලය බඳවා ගන්නා තෙක් එම බඳවා ගැනීම්වලට අදාළ ලිපි ලේඛන සකස් කිරීම, අය වැය ඉල්ලුම් කිරීමට අදාළ කටයුතු සිදු කිරීම සඳහා අමාත්‍යාංශයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ සහාය ලබා දෙන්න පුළුවන්. එසේම මෙම කොමිෂන් සභාවට ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සඳහා වන බඳවා ගැනීම් පටිපාටි සකස් කර තිබෙන අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. එකී අනුමැතිය ලද පසු කොමිෂන් සභාව විසින් ස්ථිර කාර්ය මණ්ඩලය පත් කර ගැනීමට කටයුතු කරනු ඇත. ඉහත කරුණු අනුව මෙම කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත ස්වාධීනත්වයට කිසිදු අයුරකින් බලපෑමක් සිදු කර නොමැති බව සඳහන් කරනු ලබනවා.

4. දැනට එවැනි කිසිම කොමිසමක් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශ පරිශ්‍රය තුළ ක්‍රියාත්මක නොවන බව මම සඳහන් කරනවා. කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ ස්වාධීනත්වය ආරක්ෂා කළ යුතු බව අපි පිළිගන්නවා; අමාත්‍යාංශය පිළිගන්නවා; රජය පිළිගන්නවා. අපි දැනට එහෙම කිසිදු කොමිෂන් සභාවක් අපේ අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කර නැහැ. ඔවුන්ට කටයුතු කිරීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීම සඳහා දැනට අපේ කාර්යාල පරිශ්‍රයේ - සෙත්සිරිපාය ගොඩනැගිල්ලේ 3වන මහලේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරිය - කාන්තා කමිටුව දැනට ක්‍රියාත්මක වන ස්ථානය භාවිත කිරීමේ හැකියාව තිබෙන බවත් අපි කියනවා.

5. මෙම කොමිෂන් සභාව අමාත්‍යාංශයේ අංශයක් බවට පත් කිරීමට රජයේ කිසිදු උත්සාහයක් නැහැ. කොමිෂන් සභාව ස්ථාපිත කිරීමට සුදුසු පරිශ්‍රයක් තෝරා ගත් පසු; කොමිසම ස්ථාපිත කිරීමට අදාළ ස්ථානයක් සොයා ගැනීමෙන් පසු එහි කටයුතු ආරම්භ කළ හැකියි.

6. මෙම කොමිෂන් සභාවට ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සඳහා සකස් කර ඇති බඳවා ගැනීම් පටිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත්තා. ඒප අනුව කොමිෂන් සභාව විසින් ස්ථිර කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කරනවා. කොමිෂන් සභාව ස්ථාපිත කිරීමට සුදුසු පරිශ්‍රයක් තෝරා ගැනීමට ඔවුන්ටම අවකාශය දීලා තිබෙනවා. කොමිසමේ සාමාජිකාවන්ට ඒ අදාළ පරිශ්‍රය සොයා බලා තෝරා ගැනීමේ අවසරය තිබෙනවා. ඒ අනුව මෙරට කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින කාන්තාවන් පිළිබඳ ජාතික කාන්තා කොමිෂන් සභාව කිසිදු අයුරකින් අකර්මණ්‍ය කිරීමට අපේ බලාපොරොත්තුවක් නැහැ කියන කාරණයත් සඳහන් කරනවා. මේ ස්වාධීන කොමිසම ආරම්භ කිරීමට වසර ගණනාවක් තිස්සේ - වසර

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය]

30ක් පමණ - ඉල්ලීම් කර තිබුණත්, එම ඉල්ලීම්වලට අනුව කාන්තා කොමිසම ස්ථාපිත කිරීමේ හැකියාව ලැබුණේ අපටයි කියන කාරණයත් මේ අවස්ථාවේ මා සඳහන් කරන්න කැමැතියි.

ස්තුතියි.

***සභාමේසය මත තබන ලද ප්‍රශ්න අංක 1ට අදාළ පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட வினா இல. 1க்கான விடை:*
** Answer to Question No.1 tabled:*

කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ කාර්යභාරය

කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව විසින් 2024 අංක 37 දරන කාන්තාවන් සවිබලගැන්වීමේ පනතේ අරමුණු සාක්ෂාත් කිරීම සඳහා පනතේ 6 වගන්තිය පරිදි පහත දැක්වෙන බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සිදු කළ යුතුය.

(I) කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීම හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීම පිළිබඳ පරීක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම සහ පනතේ IIවන කොටසේ විධිවිධාන ප්‍රකාරව පැමිණිලි භාර ගැනීම.

(II) යම් අධිකරණයක් ඉදිරියේ පැවැත්වෙන කාන්තාවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමකට අදාළ යම් නඩු කටයුතුවලදී එකී අධිකරණයේ අවසරය සහිතව ඊට මැදිහත් වීම.

(III) මේ පනතේ 7වන වගන්තිය ප්‍රකාරව පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන කාර්ය පටිපාටි හා යන්ත්‍රණ ඇතුළත් කාන්තා අභිවෘද්ධිය සහ සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම.

(IV) (මෙහි මින්මතු "මූලික ව්‍යුහය" යනුවෙන් සඳහන් කරනු ලබන) කාන්තාවන් සවිබලගැන්වීම සහතික කිරීම සහ පහසුකම් සැලසීම සඳහා කාන්තා අභිවෘද්ධිය සහ සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ඊට අනුකූලව මූලික ව්‍යුහයක් ක්‍රමානුකූලව සකස් කිරීම.

(V) කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීම හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමකට අදාළව මහජන විමර්ශන පැවැත්වීම.

(VI) කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීමකට හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමකට අදාළව නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයක් විසින් සිය මෙහෙයවීමෙන් නඩු පැවරීම.

(VII) උපරිමාධිකරණයක් විසින් හෝ වෙනත් යම් අධිකරණයක් විසින් සඳහන් කරනු ලැබ ඇති කාන්තා අයිතිවාසිකම්වලට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් එකී අධිකරණය විසින් විධානය කරනු ලැබිය හැකි යම් පියවර ගැනීම.

(VIII) මේ පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ කොමිෂන් සභාව වෙත පවරනු ලැබ ඇති යම් කර්තව්‍යයක් ඉටු කිරීමේ කාර්යය සඳහා යම් තැනැත්තකුගෙන් යම් තොරතුරු හෝ වාර්තා ඉල්ලා සිටීම හෝ කැඳවීම.

(IX) කාන්තා අයිතිවාසිකම්වලට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සමඟ අනුකූල වීම. තහවුරු කිරීමට සහ කාන්තා අයිතිවාසිකම් සඳහා වන පිළිගැනීම වර්ධනය කිරීම සහ කාන්තා අයිතිවාසිකම් නිරීක්ෂණය කිරීමේ අදහසින් පැමිණිලි පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සහ විමර්ශන සිදු කිරීම.

(X) පොදු ප්‍රතිපත්තීන් සහ භාවිතයන් පෝෂණය කිරීමේ අරමුණින් සහ කොමිෂන් සභාව විසින් පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අවශ්‍ය සහාය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රාජ්‍ය ආයතනවල මණ්ඩල සමඟ අන්තර් ක්‍රියාකාරිත්වය සහ සම්බන්ධීකරණය ඇති කිරීම.

(XI) කොමිෂන් සභාවේ ප්‍රාදේශීය සහ පළාත් කාර්යාල විවෘත කිරීම.

(XII) මිලදී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ වෙනත් ආකාරයකින් නිශ්චල හෝ චංචල යම් දේපළක් අත්කර ගැනීම, ලබා ගැනීම සහ දැරීම සහ එකී නිශ්චල හෝ චංචල දේපළ විකිණීම, උකස් කිරීම, බද්දට දීම, ප්‍රදානය කිරීම, පැවරීම, රික්තවරණය කිරීම, හිමිකර දීම, හුවමාරු කිරීම හෝ බැහැර කිරීම.

(XIII) කාන්තා අයිතිවාසිකම් සහ කාන්තා අයිතිවාසිකම්වලට අදාළ ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා ලද සම්මත පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම සඳහා වැඩසටහන් මෙහෙයවීම සහ තොරතුරු ව්‍යාප්ත කිරීම.

(XIV) පැමිණිල්ලක් ලැබීම මත හෝ සිය මෙහෙයවීමෙන්ම, මෙහි මින් මතු සලස්වා ඇති විධිවිධානවලට අනුකූලව වෙනස් කොට සැලකිල්ලට බඳුන් වී ඇති යම් කාන්තාවක් සමථකරණය වෙත යොමු කිරීම.

(XV) රජය සහ අමාත්‍යවරයා වෙත -

(i) කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මත සහ ප්‍රමිති සමඟ දේශීය නීති, ප්‍රතිපත්ති සහ පරිපාලන භාවිතයන් අනුකූල වන බවට සහතික කිරීම සඳහා ගනු ලැබිය යුතු පියවර; සහ

(ii) කාන්තා අයිතිවාසිකම්වලට ගරු කිරීම, ඒවා ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම සහ සපුරාලීම සඳහා ව්‍යවස්ථාදායකය සහ පරිපාලන විධාන සහ අවශ්‍ය කාර්ය පටිපාටි පිළිබඳ නියම කරනු ලැබිය යුතු නියෝග සකස් කිරීම සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කිරීම.

(XVI) වෙනස්කොට සැලකීමට සම ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ කාන්තාවන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන අතර සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් කාන්තා අයිතිවාසිකම් සම්බන්ධයෙන් නීති ප්‍රතිපත්ති සහ භාවිතයන් ඇගැයීම සහ අදාළ ආයතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

(XVII) මේ පනත යටතේ සාදන ලද නියෝග මඟින් හඳුනාගනු ලැබූ විවිධ කාණ්ඩවලට සහ තරාතිරම්වලට අයත් කාන්තාවන් සඳහා සමානාත්මතාවෙන් සහ ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගැනීම.

(XVIII) පුද්ගලික තැනැත්තන් සහ වෙනත් රාජ්‍ය නොවන ආයතන විසින් ප්‍රතිපත්ති සහ භාවිතයන් කාන්තා අයිතිවාසිකම්වලට අදාළ වනතාක් ඒ ප්‍රතිපත්ති සහ භාවිතයන් වෙත ඇති බැඳී සිටීම අධීක්ෂණය කිරීම සහ ඇගැයීම.

(XIX) කාන්තා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම වැඩිදියුණු කිරීමේ සහ කාන්තා අයිතිවාසිකම්වලට අදාළ කරුණු සම්බන්ධයෙන් දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීමේ සහ අධ්‍යාපනය ලබා දීමේ පර්යේෂණ සිදු කිරීම.

(XX) විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීමට යටත්ව දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම

(XXI) අගතියට පත් තැනැත්තකු විසින් මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙහිලා සාධාරණ ලෙස වැයකර තිබිය හැකි වියදම් පියවීමට ප්‍රමාණවත් ලෙස සැලකිය හැකි යම් මුදල් ප්‍රමාණයක් එහි පරම අභිමතය පරිදි එම තැනැත්තා වෙත ප්‍රදානය කිරීම.

(XXII) මේ පනත යටතේ රීති සාදනු ලැබිය යුතු යයි නියමිත කරුණු සම්බන්ධයෙන් රීති සෑදීම; සහ

(XXIII) මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවස්ථාවෝචිත විය හැකි වෙනත් සියලුම ක්‍රියා සිදු කිරීම.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாச)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ඇත්තවශයෙන්ම මම මේකට ප්‍රතිචාර දක්වන්න ගියොත්, මට සිද්ධ වෙනවා අපේ ගරු අමාත්‍යතුමිය ඉදිරිපත් කළ කරුණු කාරණා -බොරු කියලා කියනවා වෙනුවට- නිවැරදිභාවයෙන් තොරයි කියලා කියන්න. ගරු කථානායකතුමනි, එතුමියම කිව්වා, කාන්තාවන් පිළිබඳව ජාතික කොමිෂන් සභාව ගැසට් කර නැහැ කියලා. බලන්න, මගේ අතේ මේ තිබෙන්නේ ඒ ගැසට් එක. මම ගරු කථානායකතුමාට මේකේ පිටපතක් එවන්නම්. මේ තිබෙන්නේ ඒ ගැසට් එක. එය ගැසට් කරලා තිබෙන්නේ. මම කනගාටු වෙනවා, ඇමතිතුමියට මෙහෙම උත්තර දෙන්න සිදුවීම ගැන. මේ තිබෙන්නේ, ගැසට් එක. කොමිෂන් සභාව ගැසට් කරලා තිබෙන්නේ. ඒක, එක කාරණාවක්.

ගරු ඇමතිතුමියනි, ඔබතුමිය කරුණු කාරණා ගණනාවක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම ඔබතුමිය ඉදිරිපත් කළ කරුණු සම්බන්ධව මම ඔබතුමියගෙන් පැහැදිලි කිරීමක් කරගන්න කැමැතියි. ඔබතුමිය කිව්වා, 2025 මැයි තමයි මුදල් වෙන් කිරීමේ කාර්යය සිදු වෙන්නේ, හැබැයි ඒ කාර්යය ආරම්භ වෙනකොට කාන්තා කොමිසම ස්ථාපනය කර තිබුණේ නැහැ, කාන්තා කොමිසම ස්ථාපනය වුණේ සැප්තැම්බර් මාසයේ කියලා. මම ඔබතුමියට පැහැදිලි කරන්න කැමැතියි, සැප්තැම්බර් මාසයේ මේ කාන්තා කොමිසම නිර්මාණය වුණත්, අය වැය ඉදිරිපත් කරන අවස්ථාවේදීම පරිපූරක ඇස්තමේන්තුවක් - Supplementary Estimate එකක් - හරහා මුදල් ටික වෙන් කර ගන්න රජයට හැකියාවක් තිබෙන බව. නමුත් ඔබ ඒක කර තිබුණේ නැහැ.

මම ඔබතුමියගෙන් මේ කාරණය අහන්න කැමැතියි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ කාන්තා සංසදය කාන්තා කොමිසම සඳහා නියෝජිතවරියන් දෙපළක් පත් කරනවා. ඔබතුමියලා ඒ අය පත් කළේ 2025 ජනවාරි මාසයේ. එහෙම පත් කරලා, පෙබරවාරි මාසයේ ජිනීවාවල තිබෙන CEDAW එකේදී මොකක්ද කියන්නේ? ඒ කියන්නේ, කාන්තාවන්ට වෙනස් ලෙස සැලකීම ප්‍රතික්ෂේප කරන ප්‍රඥප්තිය කේන්ද්‍ර කර ගත් ඒ ජාත්‍යන්තර සාකච්ඡාවේදී ඔබතුමියලාම -රජයම- කියනවා, කාන්තා කොමිසම ක්‍රියාත්මක කරන්නට දැන් සියලු වැඩකටයුතු ක්‍රියාත්මක කරලා හමාරයි කියලා. දැන් ඔබතුමියගේ උත්තරයෙන් කියැවුණා, විධායක නිලධාරිවරියක් පත් කර තිබෙනවා කියලා. ඇත්තවශයෙන්ම ඒ පත්කිරීමේ ක්‍රියාවලිය කාන්තා කොමිෂන් සභාවේ අයයි, සභාපතිතුමියයි එකතු වෙලා තමයි කරන්නට ඕනෑ. ඒක දේශපාලන පත්වීමක් නොවෙයි. හිටපු අමාත්‍යාංශ ලේකම්තුමියක් තමයි පත් කරලා තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයකට ලබා දුන් පිළිතුරක් පැහැදිලි කර ගැනීමක් විතරයි කරන්න පුළුවන්. නමුත්, දැන් මෙතැන විවාදයක් තිබෙන්නේ. එහෙම නම් මෙතුමාට පුළුවන්, ඒකට වෙනම විවාදයක් ගන්න. පෙර වරු 11.30ට දිනට නියමිත කටයුතු පටන් ගන්න තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, කෙටි පැහැදිලි කිරීමකට තමයි ස්ථාවර නියෝගය අනුව පුළුවන්කම තිබෙන්නේ. *[බාධා කිරීම්]* ස්ථාවර නියෝගවල ඉතා පැහැදිලිව තිබෙන්නේ - *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මෙතුමා ගරු ඇමතිතුමියගේ කථාවට කලිනුත් ප්‍රකාශයක් කළා. ඊට පස්සේ - *[බාධා කිරීම්]* විපක්ෂ නායකතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග අනුව කටයුතු කරන්න ඉගෙන ගන්න. ඔබතුමා ඒක ඉගෙන ගන්න. ඔබතුමාට ලැබුණු අවස්ථාව වල් බුරු කර ගන්න එපා. එහෙම අයිතියක් නැහැ. ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මෙහෙම හැකියාවක් නැහැ. ඔබතුමා නීතියට අනුව කටයුතු කරන්න. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු කථානායකතුමනි, ඔබතුමා ඉන්නවා නේ. එතුමා කථානායකද?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
එතුමා කථානායකද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලදී අතුරු ප්‍රශ්න අහනකොට ඒවාට දුන් කාල වේලාව ඔක්කෝම මම මෙතැන ඉඳගෙන බලාගෙන හිටියා. තමන්ගේ පාර්ශ්වයේ අය ප්‍රශ්න අහනකොටයි, විපක්ෂ නායකවරයා ප්‍රශ්න අහනකොටයි වෙනස් ලෙස සලකන්න බැහැ. අනෙක් එක, මට මෙතුමාගෙන් -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂ නායකතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය පැහැදිලි කර ගැනීම කෙටියෙන් කරන්න. *[බාධා කිරීම්]* ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා මේ වනකොට විනාඩි 4ක් අරගෙන තිබෙනවා. තව විනාඩියකින් අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇයි මෙහෙම බාධා කරන්නේ? මේ රටේ සියයට 52ක් වන කාන්තාවන් වෙනුවෙන් ප්‍රශ්න අහනකොට, ඇයි සභානායකතුමා බාධා කරන්නේ? පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ගැන මට එතුමාගෙන් ටියුෂන් ඕනෑ නැහැ; මට එතුමාගෙන් උපකාරක පන්ති අවශ්‍ය නැහැ. ගරු කථානායකතුමනි, මම මේ කියන්නේ, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මේ වනකොට විනාඩි 5ක කාලයක් අරගෙන තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාගේ පැහැදිලි කර ගැනීම කර ගන්න. *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
තීන්දු තීරණ ගැනීමේ වැඩ වරදිනකොට අපේ කටවල් වහන්න එන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, - *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කරුණාකරලා මට අවස්ථාව දෙන්න. බාධා කරන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, මම ඔබතුමාට අවස්ථාව ලබා දුන්නා. ඔබතුමා ප්‍රශ්නය අහලා අවසන් කරන්න. ඔබතුමා පැහැදිලි කර ගැනීම සඳහා මේ වනකොට විනාඩි 6ක් අරගෙන තිබෙනවා. විනාඩි 2කින් අහලා අවසන් කරන්න ඕනෑ. ඔබතුමා විනාඩි 6ක් අරගෙන තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මොකක්ද තිබෙන්නේ? විපක්ෂ නායකවරයාට සහ පක්ෂ නායකවරයන්ට මොකක්ද තිබෙන්නේ? එහි මෙසේ තිබෙනවා:

> "..... එසේ වුවද, ප්‍රශ්න අවසානයේ දී පොදු වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අදාළ අමාත්‍යවරයාට විධිමත් ලෙස දැනුම්දීමකින් අනතුරුව පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ නායකවරයා හෝ පිළිගත් දේශපාලන පක්ෂයක නායකවරයකු විසින් අසනු ලැබිය හැකි ය."

දැන් ප්‍රශ්නය අහලා තිබෙන්නේ. ඒකට උත්තරයත් දීලා තිබෙන්නේ. ඊට අමතරව තමයි මේකට අදාළව ඉතාම කෙටියෙන් යම්කිසි පැහැදිලි කර ගැනීමක් කරන්න පුළුවන් කියන එක තිබෙන්නේ. හැබැයි, ඔබතුමා විනාඩි 6ක් අරගෙන තිබෙනවා. විපක්ෂ නායකතුමනි, ඔබතුමාට අමුතු බලයක් නැහැ. ඔබතුමාත් මන්ත්‍රීවරයෙක් විතරයි. මේ ප්‍රශ්නයේදී ඔබතුමා පක්ෂ නායකයෙක් විතරයි. එම නිසා කරුණාකරලා මෙතැන සෝෂා කරන්න එපා. ගරු ඇමතිතුමිය ඉතා වැදගත් විධියට උත්තර දුන්නා. කරුණාකරලා ප්‍රශ්නය අහලා ඉවර කරන්න. මොකක්ද මේ කරන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ප්‍රශ්නය අහලා අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ රටේ සියයට 52ක් වන කාන්තාවන්ගේ උන්නතිය තකා ප්‍රශ්නයක් අහනකොට මේ විධියට බාධා කිරීම ගැන මම අතිශයින්ම කනගාටු වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ප්‍රශ්නය අහලා අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි, මම අවසන් කරන්නම්.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට එක දෙයක් කියන්න කැමැතියි. මේ සභා ගර්භය තුළ වැරදි දේවල් ප්‍රකාශ කරන්නට බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න. ඔබතුමා අතුරු ප්‍රශ්නය සඳහා දැන් විනාඩි 6ක් අරගෙන තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම මෙහෙම කථා කරන්න නොවෙයි හිටියේ, ගරු ඇමතිතුමියනි. ඔබතුමියගේ අමාත්‍යාංශය යටතේ මේ කාන්තා කොමිසම ගැසට් කර හමාරයි. එතුමිය කිව්වා, ගැසට් කර නැහැ කියලා. *[බාධා කිරීම්]* ඒ නිසා මම අහන්න කැමැතියි, ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට විනාඩි 2ක් දෙන්න, මේක ඉවර කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පුදුම බයක් නේ තිබෙන්නේ. අපට ප්‍රශ්න අහන්න අයිතියක් නැද්ද? *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම එහෙනම් අවසානයේ අහනවා, මෙන්න මේ කරුණු කිහිපය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණු කිහිපයක් නොවෙයි, අවසන් කරන්න. දැන් ඔබතුමා විනාඩි 8ක් අරගෙන තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
දැන් මට හොඳටම බාධා කළා නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විනාඩි 8ත් 4ක් ඔබතුමා කථා කළා. අතුරු ප්‍රශ්න සඳහා විනාඩි 2යි දෙන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අවසන් කරන්නම්. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, තව විනාඩි 10ක් තිබෙනවා, 11.30ට විවාදය පටන් ගන්නේ. [බාධා කිරීම්] ඇයි, මෙච්චර බය? [බාධා කිරීම්] අනේ, ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න. අපේ කටවල් වහන්න එන්න එපා. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, අතුරු ප්‍රශ්නයකට විනාඩි 2යි ලබා දෙන්නේ. අනේ, මම දන්නේ නැහැ, මේ කාරණාව ඔබතුමා තේරුම් ගන්නවාද කියලා. ඒ ගැන අපි එකඟතාවට පත්වෙලා තිබෙනවා. ඔබතුමා ප්‍රශ්නය අහන්න. එච්චරයි. ඔබතුමාට මයික් එක දීලා තිබෙන්නේ. ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු අමාත්‍යතුමියගෙන් මම අහනවා, ඔබතුමිය හිතන්නේ නැද්ද, - *[බාධා කිරීම්]* හිටපු අමාත්‍යාංශ ලේකම්වරියක් විධායක නිලධාරිවරිය හැටියට පත් කරනකොට එතැන ස්වාධීනත්වය නැති වෙනවා. ඒ වාගේම දැන් ඇමතිතුමියම කියනවා, රුපියල් මිලියන 50ක් වෙන් කළා ලු. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමිය. *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කිසිම point of Order එකක් නැහැ, ගරු විපක්ෂ නායකතුමනි. [බාධා කිරීම්] නැහැ, නැහැ. අවසන් කරන්නේ නැහැ නේ, ඔබතුමා. [බාධා කිරීම්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට අවසන් කරන්න ඉඩ දෙන්න.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
ගරු විපක්ෂ නායකතුමනි, මේ සඳහා - *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමියනි, ඔබතුමිය පැහැදිලි කරන්න. *[බාධා කිරීම්]*

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
ගරු විපක්ෂ නායකතුමනි, - *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කිසිම point of Order එකක් නැහැ, ගරු විපක්ෂ නායකතුමනි. ඔබතුමා පිළිතුරට ඇහුම්කන් දෙන්න.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
ගරු කථානායකතුමනි, මගේ පිළිතුර ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමියනි, ඔබතුමියගේ පිළිතුර පැහැදිලි කරන්න.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
ගරු කථානායකතුමනි, ඇත්තටම මේ විධායක අධ්‍යක්ෂවරිය තෝරා පත් කිරීම අමාත්‍යවරිය හැටියට මගෙන් කෙරෙන කාර්යභාරයක් නොවෙයි. අපට ඒ සඳහා යවන්න පුළුවන් නාම යෝජනා පමණයි. ජනාධිපති ලේකම් කාර්යාලයෙන්, ජනාධිපතිවරයා හරහා තමයි ඒ තෝරා පත් කිරීම කර පත්වීම් ප්‍රදානය කෙරෙන්නේ, පනත අනුව. මා ළඟ තිබෙනවා, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත. මේ පනතට අනුව ගත්තත්, එතුමා කිව්වේ අපේ කාන්තා කමිටුව තමයි අපේ අමාත්‍යාංශයේ තිබෙන්නේ. කාන්තා කමිටුව අපේ අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කරපු ආයතනයක්; අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන එකක්. මේ පනතේ පළමු පිටුවේම තිබෙනවා, "කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; කාන්තාවන්ගේ අභිවෘද්ධිය සහ සවිබල ගැන්වීම පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිණිස ද; කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද" යනුවෙන්. ජාතික කොමිෂන් සභාවක් කියන එක තමයි පනතේ තිබෙන්නේ. ඒක මම නැවතත් අවධාරණය කරනවා, අපේ විපක්ෂ නායකතුමාට. එය මගේ පත් කිරීමක් නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට දැනගන්න ඕනෑ, - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි, ගරු විපක්ෂ නායකතුමනි. *[බාධා කිරීම්]*

වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට ස්ථාවර නියෝග අනුව, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒක අහනවා. නමුත්, ඊට කලින් ස්ථාවර නියෝග 146ට අනුව මට දෙයක් අහන්න තිබෙනවා. ඔබතුමා නිරන්තරයෙන්ම මේ ස්ථාවර නියෝග 146 අනුව ඔබතුමාගේ අධිකාරියත් එක්ක ඒ කටයුතු කළා. හැබැයි, ඔබතුමා නිහඬව බලාගෙන ඉඳිද්දී සභානායක, කථානායක වෙන්න ගියාම හැම දාම ප්‍රශ්න. *[බාධා කිරීම්]* එතුමා නෝනාත් එක්ක පාර්ලිමේන්තු ඇවිල්ලා තමයි මේ හැම කටයුත්තක්ම කරන්නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භ කරන්න තිබෙන නිසා ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔය කාරණය point of Order එකක් නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක point of Order එකක් නොවෙයි නම් ඔබතුමා මට ටිකක් සවන් දෙන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමා මටත් සවන් දෙන්න ඕනෑ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමා point of Order එකක් ඉල්ලන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට මමයි නියෝග කරන්නේ. ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නය යොමු කරන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ නියෝග මම පිළිපදින්නම්. හැබැයි, විපක්ෂ නායකතුමාට අවස්ථාවක් දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ නැත්නම් මට ඊළඟ කටයුත්තට යන්න සිද්ධ වෙනවා. *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, මොකක්ද, point of Order එක ගරු විපක්ෂ නායකතුමා?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අන්න හරි, good.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද? ඔබතුමා point of Order එක ඉදිරිපත් කරන්නේ මොන ස්ථාවර නියෝගය යටතේද, ගරු විපක්ෂ නායකතුමා?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ ඇමතිතුමිය උත්තරයක් දුන්නාම ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කර ගන්න ස්ථාවර නියෝග 92 යටතේ මට අයිතියක් නැද්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා පැහැදිලි කිරීමක් කළා, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කර ගන්න මට අයිතියක් නැද්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ගරු විපක්ෂ නායකතුමා ඒ පැහැදිලි කිරීම කළා. *[බාධා කිරීම්]* ඒක අදාළ නැහැ. ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අවස්ථාව දුන්නා. පැහැදිලි කර ගැනීමටත් අවස්ථාව දුන්නා. දැන් ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. ඔබතුමා අනෙක් අයට සීනි කිරන්න යන්න එපා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මම වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්නම්. දැන් මේ ස්ථාවර නියෝග 29 (1) සහ 29 (2) යටතේ කියලා දැම්මේ මේ වරප්‍රසාද,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය කියවන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒක තමයි මම මේ කියවන්න හදන්නේ. ඔබතුමා මට හැමදාම නියෝග කරනවා, ඔබතුමාට ලියලා දීලා තිබෙන වරප්‍රසාද ප්‍රශ්නය කියවන්න කියලා. ඒක හරි. ඒක මම පිළිගන්නවා. නමුත්, ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 29 (1) සහ 29 (2) අනුව අපි ඔබතුමාගෙන් ඉල්ලන්න ඕනෑ පාර්ලිමේන්තුව කල් තියන්න කියලා. ඒක තමයි මම මේ ඉල්ලන්නේ. ඒ කියන්නේ, වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය මේ රීති ප්‍රකාරව මම ඇහුවා. ඔබතුමා එයට එකඟ වෙලා මට අවස්ථාව දෙනවා. ඒ නිසා දැන් මගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්නම්.

## වරප්‍රසාද: 2026.02.06 දින කම්කරු නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් කරන ලද ප්‍රකාශය
## சிறப்புரிமை: 2026.02.06ஆம் திகதி மாண்புமிகு தொழில் பிரதி அமைச்சரால் தெரிவிக்கப்பட்ட கூற்று
## PRIVILEGE: STATEMENT MADE BY DEPUTY MINISTER OF LABOUR ON 06.02.2026

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, 2026.02.06 දින ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් කරන ලද ප්‍රකාශයක් හේතුවෙන් සිදු වූ මාගේ වරප්‍රසාද කඩවීම පිළිබඳව ගරු සභාව දැනුවත් කිරීම සඳහාත්, අවශ්‍ය පැහැදිලි කිරීම් සිදු කිරීම සඳහාත් ස්ථාවර නියෝග 29 (1) සහ 29 (2) යටතේ ගරු කථානායකතුමාගේ අවසරය ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමනි, අනිවාර්යයෙන්ම මට ඒ සඳහා අවසරය දෙන්න ඕනෑ, ස්ථාවර නියෝග 29 (1) සහ 29 (2) යටතේ ඔබතුමා මට අවසර දෙනවා නම්. එසේම, 2026.02.06 දින සිදු කළ මාගේ කථාවෙන් පසු ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිවරයා විසින් රීති ප්‍රශ්නයක් මතු කරමින් ස්ථාවර නියෝග 91. (ඌ) වගන්තිය උල්ලංඝනය කරමින් මා වෙත අයුතු ආරෝපණයක් කරන ලද ප්‍රකාශය,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමා කරුණාකර මා වෙත ලබා දී තිබෙන වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය කියවන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒක තමයි මම මේ කියවන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට ලබා දී තිබෙන වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයේ ඔබතුමා ඔය කියන දේවල් නැහැ. ඔබතුමා කියන දේවල් මට ලබා දී තිබෙන මේ වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයේ නැහැ. ඔබතුමා මට ලබා දී තිබෙන වරප්‍රසාද ප්‍රශ්නය කියවන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒක තමයි මම ඔබතුමාට එවා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ඔබතුමා වෙන දෙයක් කියවන්නේ. හරි, එහෙම නම් දැන් කියවන්න. *[බාධා කිරීම්]* ඔබතුමා ඒ වරප්‍රසාද ප්‍රශ්නය කියවන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒක තමයි මම මේ කියවන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හෙඳයි, ඔබතුමා කියවන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
දැන් මේ මම කියවපු වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය නොවෙයිද, ඔබතුමා ළඟ තිබෙන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. ඔබතුමා වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය කියන්න පටන් ගනිද්දී කිව්වේ මට ලබා දී තිබෙන වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයේ සඳහන් දේවල් නොවෙයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
නැහැ, නැහැ, ගරු කථානායකතුමනි. මුලින් කිව්වේ ස්ථාවර නියෝග 29 (1) සහ 29 (2) යටතේ කියන එක.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒකම කියවන්න ඕනෑ නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එහෙම කියන්න ඕනෑ නැහැ. එහෙනම් මම ආපසු ඒ වරප්‍රසාද ප්‍රශ්නයේ ඉතුරු කොටස කියවනවා, ගරු කථානායකතුමනි.

එසේම, 2026.02.06 දින සිදු කළ මාගේ කථාවෙන් පසු ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිවරයා විසින් රීති ප්‍රශ්නයක් මතු කරමින් ස්ථාවර නියෝග 91 (ඌ) වගන්තිය උල්ලංඝනය කරමින් මා වෙත අයුතු ආරෝපණයක් කරන ලද ප්‍රකාශය හේතුවෙන් මාහට අපහාසයක් මෙන්ම නින්දා කිරීමට කටයුතු කළ බව මාගේ වැටහීමයි.

එබැවින්, ඉහත ප්‍රකාශය තුළින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ (බලතල හා වරප්‍රසාද) පනතේ උපලේඛනයේ (ආ) කොටසේ පාර්ලිමේන්තුව විසින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය යටතේ දඬුවම් කළ හැකි වරදක් වන (4)වන වගන්තිය යටතේ මාහට නින්දා කිරීමක් සිදු කිරීම මඟින් ද, (අ) කොටසේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ම පමණක් දඬුවම් කළ හැකි වරදක් වන 8වන වගන්තිය යටතේ අපහාසාත්මක ප්‍රකාශයක් පළ කිරීම මඟින් ද, මාගේ වරප්‍රසාද කඩ වී ඇති බැවින් එය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට යොමු කරන මෙන් වැඩිදුරටත් ඉල්ලා සිටිමි.

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### අකුරණ ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා විසින් කරන ලද තර්ජනය
அக்குறணை பிரதேச சபையின் உப தவிசாளரால் விடுக்கப்பட்ட அச்சுறுத்தல்
THREAT MADE BY VICE CHAIRMAN OF AKURANA PRADESHIYA SABHA

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී රියාස් ෆාරුක් මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2026 පෙබරවාරි 05 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, උදේ 9.30 ඉඳන් 11.30 වෙනකම් මම බලාගෙන හිටියා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමනි. මම වචන කීපයයි කියන්නේ. මම උදේ 9.30 ඉඳන් මුකුත් කියන්නේ නැතුව මෙච්චර වෙලා බලාගෙන හිටියා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වෙන කාට හරි කරන්න කියලා. ඔබතුමා දෙපැත්ත බලාගෙන හරියට කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මට නියෝග කිරීමට ඔබතුමාට නොහැකියි. ඔබතුමා විනයක් ඇතුව හැසිරීමට කටයුතු කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එතුමා ඒක කියන්න ඕනෑ විපක්ෂ නායකතුමාට. එතුමා තමයි සම්පූර්ණයෙන්ම මේ සභාව නාවන්නේ. විනාඩි 10ක් නාස්ති කළේ එතුමා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට පැවරුණු රාජකාරිය විතරක් ඔබතුමා කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමාට බැහැ, විපක්ෂ නායකතුමාව කනෙන් අල්ලලා එළියට දමන්න. ඔබතුමාට නම් පුළුවන් වෙයි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මම දෙපැත්තටම කිව්වේ, එක පැත්තකට නොවෙයි. ඒ නිසා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එපා, සභානායකතුමා. මම පක්ෂයක නම කියලා කා ගැනවත් කිව්වේ නැහැ නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි හරියට timetable එක හදලා තිබෙනවා. ඒ timetable එක ඇතුළේ තමයි අපි ඉන්නේ. මේ සභාවේ වාද විවාද කරන්න තිබෙන වැදගත් කාලය තමයි

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

*[බාධා කිරීමක්]* ඒකට වග කියන්න ඕනෑ ගරු කථානායකතුමා නොවෙයි, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මෙහෙමයි. ගරු සභානායකතුමනි, පක්ෂ නායකයෝ ඔබතුමන්ලා මිසක් අපි නොවෙයි නේ. ඔබතුමන්ලා නේ meeting කරන්නේ; ඔබතුමන්ලා නේ Party Leadersලා. ඔබතුමන්ලා, ඔබතුමන්ලාගේ අය හදා ගන්න, අපිව හදන්න ඉස්සෙල්ලා. අපි නිකම් මන්ත්‍රීතුමන්ලා. ඒක ඔබතුමන්ලා දෙගොල්ලන් එකතු වෙලා කර ගන්න ඕනෑ දෙයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමනි, ඔබතුමා පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න. ඔබතුමා මොනවාද මේ කියවන්නේ? *[බාධා කිරීමක්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
Priority දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, විපක්ෂයේ චාමර සම්පත් මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. එතුමා මට කිව්වා, විපක්ෂ නායකතුමාව හදලා ගන්න කියලා. මම ඉස්සරහට ඒක කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න.

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### சிறுவர்களுக்கான மஹாவிலச்சிய கல்வி நிலையம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### MAHAWILACHCHIYA EDUCATION CENTRE FOR CHILDREN (INCORPORATION) BILL

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

> "මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6) இன்படி கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Education, Higher Education and Vocational Education for report.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 6 දක්වා ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා. The Hon. Bimal Rathnayake to start the Debate. You have 14 minutes.

## විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත: නියමය
## விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம்: கட்டளை
## SPECIAL COMMODITY LEVY ACT: ORDER

[පූ.භා. 11.29]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2(3) වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 නොවැම්බර් 25 දිනැති අංක 2464/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.02.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 සහ 3 දරන යෝජනා - විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක) 2 සහ (අංක) 3 ද, විෂය අංක 4 - රේගු ආඥා පනත යටතේ යෝජනා සම්මතය සහ විෂය අංක 5, 6 - මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක) 1 සහ (අංක) 2 දරන යෝජනා ද මා ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, අද දින විෂය කාරණා ගණනාවක් විවාද කරන්න තිබෙනවා. මුදල් අමාත්‍යාංශයට අදාළ කාරණා පිළිබඳව මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමා සාකච්ඡා කරනවා. ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ තිබෙන කාරණා තමයි මම මේ සභාවේ විවාදයට ලක් කරන්න බලාපොරොත්තු වෙන්නේ.

ගරු කථානායකතුමනි, ඉතා වුවමනාවෙන් නැවත නැවතත් මම ඉල්ලා සිටිනවා, අපි කවුරුත් මන්ත්‍රීවරු වශයෙන් මේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුව නිශ්චිත සුදුසු භාෂාව පාවිච්චි කරමින් කථා කිරීමට කටයුතු කරමු කියලා. ගරු ඇමතිතුමිය ඉතා පැහැදිලි විස්තරාත්මක පිළිතුරක් ලබා දුන්නා. ඒ හැම දෙයක්ම උදේ drama එකේ කොටස් බවට පත් කර ගැනීම සුදුසු දෙයක් විධියට අපි නම් දකින්නේ නැහැ. ගරු කථානායකතුමනි, අපි ඇත්තටම ඒ සම්බන්ධයෙන් කනගාටු වෙනවා.

මේ රටේ ජන වරම ගැන කිසිම හැඟීමක් නැති, විශ්‍රාම වැටුප් පවා ගන්නා අය ගැන කියන්න මම කාලය නාස්ති කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මොකද, අම්මාගේ විශ්‍රාම වැටුපත් ගන්නවා, තාත්තාගේ විශ්‍රාම වැටුපත් ගන්නවා, පුතාගේ විශ්‍රාම වැටුපත් ගන්නවා. මේ රටේ ඉහළම ජන වරමක් අපට ලැබිලා තිබියදීත්, රටේ අලංකාරත්වයට, රටේ ගරුත්වයට බාධා කරන මේ ජාතියේ පුද්ගලයන් ජනතාව විසින් මේ සභාවට එවීම ගැන අපි කනගාටු වෙනවා. ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග තේරෙන්නේ නැති විපක්ෂ නායකවරයෙක් අපි නම් මීට කලින් දැකලා නැහැ. අපි ඒ සම්බන්ධයෙන් කනගාටු වෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order. ප්‍රධාන වැඩ කටයුතුද මේ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට ඒකයි කියන්න තිබෙන්නේ. ස්ථාවර නියෝග තේරුම් ගන්න පුළුවන් විපක්ෂ නායකවරයෙක් ඕනෑ. ඒ නිසා මම චාමර මන්ත්‍රීතුමා කියපු විධියට කටයුතු කරන්නම්. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමනි, අද මේ විවාදයේදී අපි බලාපොරොත්තු වෙනවා, ප්‍රධාන වශයෙන්ම කාරණා කීපයක් ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, ඔබතුමා මේ ඝෝෂාව නතර කරලා දෙන්න. *[බාධා කිරීම්]* ඔබතුමා ඝෝෂාව නතර කරලා දෙන්න. *[බාධා කිරීම්]* මම විපක්ෂ නායකතුමාව හදා ගන්නම්. *[බාධා කිරීම්]* මම එතුමාව හදා ගන්නම්. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වන්න. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අයියෝ! දන්න දේවල් තමයි. *[බාධා කිරීම්]* දන්න දේවල් තමයි. ගරු කථානායකතුමනි, මේගොල්ලන් හැම එක්කෙනාම පස්සේ ගිහිල්ලා මන්ත්‍රීකමත් විකුණා ගත්ත නිසා හිතනවා, අපිත් එහෙම අය කියලා. අපි එහෙම අය නොවෙයි.

ඒ නිසා ඔබතුමා මගේ කාලය නාස්ති කරන්න ඉඩ දෙන්න එපා මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මගේ කාලය නාස්ති කරන්න ඔබතුමා ඉඩ දෙන්න එපා. *[බාධා කිරීම්]* මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඉඩදෙන්න එපා.*[බාධා කිරීම්]* මම ඒ වචනය කියන්නේ කනගාටුවෙන්. *[බාධා කිරීම්]* තමන්ගේ මන්ත්‍රීකම විකුණපු මිනිස්සු, මේ. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, අද වෙලා තිබෙන්නේ මොකක්ද? මම හිතන්නේ ළඟදී ගුටි කෑවා. මම දැක්කා, මොකක් හරි එකක තිබෙනවා, නාගරික මන්ත්‍රීවරයෙකුගෙන් ළඟදී ගුටි කෑවා කියලා. *[බාධා කිරීම්]* ළඟදී සජබයේ නාගරික මන්ත්‍රීවරයෙකුගෙන් මෙයා ගුටි කාලා. *[බාධා කිරීම්]* ගුටි කෑවා නේද? *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා කථා කරන්න. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මගේ වෙලාව දෙන්න.

ගරු කථානායකතුමනි, අපි අද ප්‍රවාහනයට අදාළ ගැසට් දෙකක් ඉදිරිපත් කර තිබෙනවා. *[බාධා කිරීම්]* පළමුවෙනි දේ තමයි අපට කියන්න,- *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, හුඟක් වනවර අය හිතනවා, අපිත් ඒ වාගේ කියලා. අපි එහෙම නැහැ. *[බාධා කිරීම්]* අපි එහෙම නැහැ. හොඳද? *[බාධා කිරීම්]* මම විපක්ෂ නායකතුමාව හදා ගන්නම්. ඊට පස්සේ ඔයගොල්ලන් හදා ගන්න. *[බාධා කිරීම්]* පළමුවෙනි කාරණය මේකයි, ගරු කථානායකතුමනි. මේ ගැසට් නිවේදන දෙකෙන් කාරණා දෙකක් බලාපොරොත්තු වෙනවා. *[බාධා කිරීම්]* මගේ නාස්ති කරපු කාලය එතුමන්ලාගෙන් අඩු කරන්න.

අපි මේ එක ගැසට් එකකින් බලාපොරොත්තු වෙන්නේ මෙන්න මේකයි. "දිට්වා" සුළි කුණාටුව නිසා නොවැම්බර් 25 ඉඳලා දෙසැම්බර් 24 දක්වා කාලය තුළ driving licence අලුත් කරන්න බැරි වෙච්ච මිනිස්සු ප්‍රමාණයක් හිටියා. අන්න ඒ පිරිසට අපි කාලයක් ලබා දුන්නා, ඒවා අලුත් කරගන්න. ඒ ගැසට් එක අපි අද ඉදිරිපත් කර තිබෙනවා. දෙවැනි එක මෙයයි. ලංකාවට එන විදේශිකයන්ට වෙරහැරට ගිහිල්ලා තමයි, ඒගොල්ලන්ගේ driving licences අලුත් කරගන්න facility එක තිබුණේ. අපි බලයට ආවාට පස්සේ වෙරහැරට අමතරව Bandaranaike International Airport එකෙනුත් ඒක කරගන්න අවසර ලබා දුන්නා. ඒකෙන් විදේශිකයන්ට, විශේෂයෙන්ම සංචාරකයන්ට විශේෂ පහසුවක් ඇති වුණා. හැබැයි ඒක කරද්දී මුලින්ම අපි සැලසුම් කර තිබුණේ අඩු මුදල් ප්‍රමාණයක්. ඉන්පසුව අපි ඒ මුදල වැඩි කළා, රුපියල් 45,000 දක්වා. ඒ, විදේශිකයෙකු - ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන තැනැත්තෙකු - වෙනුවෙන් නිකුත් කරන රියැදුරු බලපත්‍රයක් අලුත් කරගැනීම සඳහා. අන්න ඒ ගැසට් දෙක තමයි අපි ක්‍රියාත්මක කර තිබෙන්නේ. ඒ ක්‍රියාත්මක කරපු ගැසට් දෙක අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ නිසි කාලයේදී. ඒක තමයි අද අපි කර තිබෙන්නේ. Ministerial Consultative Committee එකේදීත් අපි මේක අනුමත කර ගත්තා. ඒ පිළිබඳව විශේෂ පැහැදිලි කිරීමක් අවශ්‍ය නැහැ. නමුත් මම හිතුවා, කාරණා කිහිපයක් කියන්න මේක මූලික වශයෙන්ම අවස්ථාවක් කරගන්න.

ගරු කථානායකතුමනි, අපි බලාපොරොත්තු වෙන එක කාරණයක් තමයි, පාර්ලිමේන්තුවේ විනය හදන්න වාගේම රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයේත් විනය හදන එක. ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ අපට බලතල ලැබී තිබෙනවා. Three-wheelers, taxis, school vans, office vans යනාදිය මෙච්චර කාලයක් හරියාකාරව නියාමනය නොකිරීමෙන් ඒ කර්මාන්තයේ නිරත අයටත් ගැටලු විශාල ප්‍රමාණයක් තිබෙනවා. උදාහරණයක් විධියට school vansවලට අදාළව ගත්තොත්, කර්මාන්තයේ යෙදෙන අයටත් ගැටලු තිබෙනවා; දෙමව්පියන්ටත් තිබෙනවා. ත්‍රිරෝද රථ රියැදුරන් ගත්තොත්, ඔවුන් අද පොලිසියෙන් තමයි යම් ආකාරයකට කළමනාකරණය වෙන්නේ. සමහර පළාත් සභාවලින් නියාමනයක් කෙරෙනවා. ඒ, හරියාකාර නියාමනයක් නොවෙයි. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, three-wheelers, taxis, school vans, office vans කියන හතරටම අදාළව රෙගුලාසි සකස් කරන්න. අපි ඒවා සකස් කරලා, බොහෝදුරට අවසන් කරලා, මේ මාස දෙකක වාගේ කාලය යොදාගෙන තිබෙනවා, ඒ කණ්ඩායම් සමඟ නැවත අවසානාත්මක අවස්ථාවේ සාකච්ඡා කරන්න.

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, අපි මෑතකදී තමයි මත්ද්‍රව්‍ය භාවිත කර සේවයේ යෙදෙන රියැදුරන් සහ කොන්දොස්තරවරුන් පිළිබඳ පරීක්ෂා කරන්න බලය ගත්තේ කියන එක. මට හිතෙනවා, ඒ mobile lab එකක් සහිත බස් එක පාර්ලිමේන්තුව පැත්තටත් එවන්න ඕනෑ කියලා, සමහර අයගේ හැසිරීම දැක්කාම. කොහොම වුණත්, අපි දැන් ඒ බස් එකෙන් පරීක්ෂා කරගෙන යනවා රියැදුරන් සහ කොන්දොස්තරවරු මත්ද්‍රව්‍ය භාවිත කරලාද ඉන්නේ කියලා.

මම හිතනවා, මෑත භාගයේ ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරලා කරන රැකියා අතර, මත්ද්‍රව්‍යවලට වැඩියෙන්ම ඇබ්බැහි වුවන් කරන රැකියා අතර එකක් බවට රියැදුරු රැකියාව පත් වෙලා තිබෙනවා කියලා, මේ ජංගම පරීක්ෂණාගාරයේ කරන පරීක්ෂණවලින් එන ප්‍රතිඵල අනුව බැලුවාම. ගරු කථානායකතුමනි, අපි ඒකාබද්ධව වැඩ කරගෙන යනවා, ශ්‍රී ලංකාවේ ශල්‍ය වෛද්‍යවරුන්ගේ විද්‍යාලයත් එක්ක. ඒකේ ඉතාම ඉහළ විශේෂඥ වෛද්‍යවරුන් මේ ළඟදී රූපවාහිනී සාකච්ඡා රාශියකට සම්බන්ධ වුණා. අපිත් අමාත්‍යාංශයක් විධියට උදවු කළා, ඒවා සම්බන්ධ කර හදන්නට. ඉතින් ඔවුන් පැහැදිලිව කියන දේ තමයි මත්ද්‍රව්‍ය පාවිච්චි කරලා, ඇල්කොහොල් පාවිච්චි කරලා drive කරනකොට වෙන අනතුරු ප්‍රමාණය ගත්තාම, ඒ driversලාට තීරණයක් ගන්න බැහැ, හරියට; වේගයෙන් තීරණයක් ගන්නත් බැහැ, හරි තීරණයක් ගන්නත් බැහැ කියන එක. ඒ නිසා අපේ රටේ වැඩිපුර ප්‍රමාණයක් අනතුරුවලට ලක්

[ගරු බිමල් රත්නායක මහතා]

වෙනවා. 2025 අවුරුද්දේ 2,700ක් මැරුණා accidentsවලින්. ඒකෙන් 2,000කට ආසන්න ප්‍රමාණයක් මෝටර්සයිකල්වල ගමන් කරන අය සහ පදිකයන්. ඉතින් මේ මෝටර්සයිකල්වල යන මිනිස්සු මැරෙන්නේ සමහර විට මෝටර්සයිකලයේ යන කෙනාගේ වැරැද්දකින් නොවෙයි, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච, ඒවා පාවිච්චි කරන වෙනත් වාහනයක වැඩ කරන රියැදුරෙක් නිසා. නැත්නම් පදිකයෝ ගත්තොත්, ගොඩක් වේලාවට කිසිම පදිකයෙක් පාරේ වැටිලා මැරෙන්නේ නැහැ. අනිවාර්යයෙන්ම වාහනයක හැප්පිලා තමයි අනතුරට පත් වෙන්නේ. ඒ නිසා අපි මේ රෙගුලාසි සකස් කිරීමේදී එක පැත්තකින් බලාපොරොත්තු වුණා, රියැදුරන්ගේ විනය හදන එක. එය අත්‍යවශ්‍යයි. පාරේ විනය හදන්න තිබෙන අත්‍යවශ්‍යම දේ ඒකයි කියන එක අපට සංඛ්‍යාලේඛනවලින් පැහැදිලි වෙලා තිබෙනවා. ඒ වාගේම මත්ද්‍රව්‍ය පාලනය කිරීමත් අත්‍යවශ්‍යයි කියලා අපි හිතනවා. මොකද, සැහෙන ප්‍රමාණයක් රියැදුරන් මේ තත්ත්වයට ගොදුරු වෙලා තිබෙන නිසා. එහි වන්දිය ගෙවන්නේ මත්ද්‍රව්‍ය හෝ කිසිම දේකට සම්බන්ධ නැති අහිංසක මිනිස්සු.

ඊළඟට ඔබතුමා දන්නවා, කලින් ඉඳලාම seat belt නීති ලංකාවේ තිබුණු බව. අපි ඒක ටිකක් බලවත් කළා. විශේෂයෙන්ම අධිවේගී මාර්ගවල ධාවනය වන වාහනවල පිටුපස අසුන්වල යන අයටත් අපි මේක අනිවාර්ය කළා. ඒකත් ඔබතුමා දකින්න ඇති. ශල්‍ය වෛද්‍යවරුන්ගේ සංගමයත් එක්ක අපි දිගට වැඩ කරගෙන යනවා. ගරු කථානායකතුමනි, මේ seat belts භාවිත කරන්න කියලා මම ම ගිහිල්ලා පත්‍රිකා බෙදුවා, expresswaysවල. අපේ රටේ ශල්‍ය වෛද්‍ය විශේෂඥවරු ගිහිල්ලා පත්‍රිකා බෙදලා මිනිස්සුන්ට කිව්වා, seat belts දාන්න කියලා. ඒ වාගේම ලංකාවේ කලාකරුවෝ, ඔය ඩිලන්ත මාලගමුව වාගේ international level එකේ ridersලා ඒ කටයුතුවලට සම්බන්ධ වුණා. මේක කරන්න ඕනෑ ද? මිනිස්සු මට බැණලා තිබෙනවා, නළවන්නේ ඇයි, මේ seat belts දාන්න, මෙච්චර කියන්නේ ඇයි කියලා. නමුත් ඕනෑම දෙයක් අලුතෙන් කරනකොට, දෙයක් හරියට කරන්න හදනකොට අපි හිතනවා, ජනතාව දැනුවත් කිරීම වැදගත් කියලා. ඉතින්, seat belt නීතිය අලුත් එකක් නොවෙයි, 2011දී පටන් ගත්ත නීතියක්. ඒක හැම රටකම ක්‍රමානුකූලව තමයි වැඩි කරලා තිබෙන්නේ. අපි ඒකත් ක්‍රියාත්මක කරලා තිබෙනවා. මොකද, seat belt එකක් දාලා තිබුණොත්, College of Surgeons of Sri Lanka කියන විධියට accident එකකින් වෙන මාරාන්තික අනතුරුදායක තත්ත්වය සියයට 40කින් අඩු වෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාත් වෛද්‍යවරයෙක් නිසා ඔබතුමා මේ ගැන දන්නවා. ඒ නිසා අපි ඒ ආකාරයෙන් ප්‍රවාහන ක්ෂේත්‍රයේ වෙනස්කම් කරගෙන යනවා.

ඒ වාගේම තමයි අද මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය මුදල් ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා, card payments සම්බන්ධව. ගරු කථානායකතුමනි, දැනටම බස්වල ඒක පටන් අරගෙන තිබෙනවා, card payment systems හරහා බැංකු කාඩ්වලින් ගෙවන්න. ඕනෑම බැංකු කාඩ් එකකින් ගෙවන්න පුළුවන්. මම දැක්කා, ගොඩක් අය කියලා තිබෙනවා, transport card එකක් දෙන්න කියලා. නමුත් transport card එකක් දුන්නාම වෙන්නේ, ඒ transport card අපි මුද්‍රණය කරන්න ඕනෑ, නිෂ්පාදනය කරන්න ඕනෑ. ඒවා කඩවල් ගාණේ බෙදන්න ඕනෑ. ඊට පස්සේ ඒකට වෙනම regime එකක් හදන්න ඕනෑ. ඒ වාගේම හැම කෙනාම ඒක ගන්න ඕනෑ. නමුත් ඊට වඩා open ක්‍රමයක් තිබෙනවා. තමන් අතේ bank cards තිබෙන අයට ඒක ගෙවන්න පුළුවන්. Bank cards පාවිච්චියේදී තිබෙන දේ තමයි ඒ bank cardsවල මව් සමාගම් පිටරට සමාගම් නිසා තර්කයක් තිබෙනවා, ඒකෙන් යම්කිසි මුදලක් පිටරටට යනවා කියලා. ඒක මේ bank cards පටන් ගත්ත දවසේ ඉඳන්ම තිබෙන දෙයක්. ඒවා හදා ගන්න ඕනෑ තරම් කාලය ලංකාවේ තිබිලා තිබෙනවා. ඒ කාලය ගොඩක් ආණ්ඩු පහු කරලා තිබෙනවා, ඒවා නොකර. නමුත් ප්‍රවාහනයට අදාළව ගත්තාම, අපි මේ bank cardsවල මව් සමාගම් එක්ක කථා කළා. බැංකු එක්ක නොවෙයි, ඒවායේ mother companies එක්ක. මම ඒ සමාගම්වල නම් කියන එක ගැළපෙන්නේ නැහැ. අද ප්‍රධාන වශයෙන්ම ලංකාවේ,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you have two more minutes.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මට නැති වෙච්ච කාලය දෙන්න ඕනෑ. විනාඩි දෙක තුනක්. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, බාධා කළේ ඔබතුමන්ලා නේ. *[බාධා කිරීමක්]* බාධා කළේ ඔබතුමන්ලා නේ. ඔය පැත්තේ කාලයෙන් තමයි ගන්න ඕනෑ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
නැහැ, නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා සුදුසු දෙයක් කරන්න.

අපට කියන්න තිබෙන දේ මේකයි. අපි Ministry of Digital Economy සහ මහ බැංකුවත් එක්ක සම්බන්ධ වෙලා ඒ ප්‍රධාන බැංකු කාඩ් සමාගම් සමඟ සාකච්ඡා කළා. බැංකු කාඩ් සමාගම් දෙකක් තමයි ප්‍රධාන වශයෙන් ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වෙන්නේ. අද අපට ඉතාම සතුටින් කියන්න පුළුවන් කාරණයක් තිබෙනවා. ඒ සමාගම් දෙකෙන් එකක් නිශ්චිත වශයෙන්ම, officially දැනුම් දීලා තිබෙනවා, ලංකාවේ සමහර payment systemsවලින් ඒගොල්ලන් ගන්නා commission එක ගන්නේ නැහැ කියලා; අපේ විෂයයට අදාළව ගත්තොත්, ප්‍රවාහනයේදී බස් ටිකට් එකට ගෙවන කාඩ් එකෙන් ගන්නා ඒගොල්ලන්ගේ commission එක ගන්නේ නැහැ කියලා. අනෙක් සමාගමත් දැනට unofficially ඒ තත්ත්වය වාර්තා කර තිබෙනවා කියලා තමයි අප දන්නේ. ඒ නිසා ඉදිරියට ප්‍රවාහනයේදී බස් රථ හිමියන්ට ඒ බැංකු කාඩ් එකෙන් ගෙවීමේදී සියයට එකයි දශම ගණනක හෝ සියයට එකක වාගේ commission එකක් යන්නේ නැහැ. ඒක පැහැදිලිවම අඩු වෙනවා. අපි හිතනවා, ඒ වාසිය කෙටි කාලයක් තුළ ලබා දෙන්න අපට පුළුවන් වෙයි කියලා.

ගරු කථානායකතුමනි, මම ලොකු වෙලාවක් ගන්න කොහෙත්ම බලාපොරොත්තු වෙන්නේ නැහැ. ලංකාවේ driving licences නිකුත් කිරීම සම්බන්ධව backlog එකක් තිබුණා. මේ මාසයේ අග වන කොට අපි ඒ 490,000ක backlog එක අවසන් කරනවා. ඊට පසුව සාමාන්‍ය මට්ටමේ, සාමාන්‍ය සේවා යටතේ යම් කාලයක් ගත වෙයි කියලා අපි හිතනවා. එක් දින සේවා යථා තත්ත්වයට පත් කරන්න අපට පුළුවන්, මාර්තු මැද වාගේ ඉඳලා. පසුගිය කාලයේ - අවුරුදු ගණනක් තිස්සේ - එකතු වෙලා තිබුණු 490,000ක කාඩ් මුද්‍රණය කරලා අවසන් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි ඔබතුමාට මේ කාරණයත් කියන්න ඕනෑ. DMT එක සහමුලින්ම හොර කොම්පැනිවලත්, දූෂිත නිලධාරින්ගේත්, හිටපු ඇමතිවරුන්ගේත් තෝතැන්නක්

වෙලායි තිබුණේ. ඒවාට අදාළව නඩු කියමින්, නීතිපතිගේ උපදෙස් ලබා ගනිමින්, චූටි දෙයක් කරන්න ගියත් අතිවිශාල වෙහෙසක් දරා කටයුතු කරමින් තමයි අප එය මේ තත්ත්වයට හෝ ගෙනැල්ලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, නියමිත කාලය අවසානයි. ඔබතුමාට තවත් විනාඩියක් ලබා දෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳමයි, ගරු කථානායකතුමනි.

ඉහත කී අර්බුදවලට සම්පූර්ණයෙන් වග කියන්න ඕනෑ පසුගිය අවුරුදු 15, 20 තුළ පැවැති ආණ්ඩු. අපි ඒ තත්ත්වය වෙනස් කරලා තමයි දැන් ඒ backlog එක අවසන් කරලා වැඩ කරගෙන යන්නේ.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. ඊයේ දිනයේදී දුම්රිය වැඩ වර්ජනයක් ක්‍රියාත්මක කරන්න උත්සාහයක් තිබුණා. හැබැයි ඒ වැඩ වර්ජනය නතර වුණා. නමුත් අපි ඒ සම්බන්ධව මේ රටට කරුණු කීපයක් කියන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, "දිට්වා" සුළි කුණාටුවත් එක්ක ලංකාවේ දුම්රිය මාර්ගවලට වෙච්ච දේ. සාමාන්‍යයෙන් ලංකාවේ දුම්රිය මාර්ගවල operate වන දුර ගත්තොත්, කිලෝමීටර 1,700කට ආසන්නයි. "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව අපට දුම්රිය ධාවනය කරවන්න පුළුවන් වුණේ දුම්රිය මාර්ග කිලෝමීටර හාරසිය ගණනක පමණයි. අනෙක් සියල්ල විනාශ වුණා. කැලණිවැලි මාර්ගයත්, මුහුදුබඩ දුම්රිය මාර්ගයත් හැරුණාම අනෙක් සියලු දුම්රිය මාර්ගවල දුම්රිය ධාවනය නතර වුණා. දැන් "දිට්වා" සුළි කුණාටුව අවසන් වෙලා මාස 3කට ආසන්න කාලයක් වෙනවා. අපි ඒ දුම්රිය මාර්ග විශාල වේගයකින් විවෘත කළා. ඔබතුමන්ලා දන්නවා, අතිවිශාල විනාශයක් වෙලා තිබියදීත් බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ඔඩිසි දුම්රිය ධාවනය පවා නැවත ආරම්භ කරන්න පුළුවන්කම ලැබුණු බව. ඒවා ආරම්භ කරන්න පුළුවන් වුණේ කොහොමද? ගරු කථානායකතුමනි, ඒවා ආරම්භ කරන්න පුළුවන් වුණේ තනිකරම දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන්ගේ මැදිහත්වීමෙන් හෝ සේවකයන්ගේ මැදිහත්වීමෙන් පමණක් නොවෙයි. ඔවුනුත් මහන්සි වුණා, ජනතාවත් මහන්සි වුණා. නමුත් අප ඉතා වගකීමෙන් දන්නා දෙය තමයි, ත්‍රිවිධ හමුදාව මැදිහත් නොවන්නට ඒ කටයුතු ඉක්මනින් කර ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ කියන එක. අද වන විට දුම්රිය මාර්ග කිලෝමීටර 1,200කට ආසන්න ප්‍රමාණයක් operate වෙනවා. ඒ, මේ මාස දෙකහමාර ඇතුළත. අපි ඒ තැන්වලට ගිහිල්ලා බලලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, කාලය අවසානයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මටම තමයි කියන්න වෙන්නේ, ආණ්ඩු පක්ෂයේ වෙලාවෙන් තවත් විනාඩි දෙකතුනක් දෙන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ත්‍රිවිධ හමුදාවේ සෘජු මැදිහත්වීමෙන් තමයි ඒ දුම්රිය මාර්ග පිළිසකර කිරීමට අවශ්‍ය ගල් ගෙන යන්නේ, මැෂින් ගෙන යන්නේ. ඔවුන් සුවිශාල දෙයක් කළා. ත්‍රිවිධ හමුදාව මැදිහත් වුණේ නැතිනම් කිලෝමීටර 1,200ක් තියා කිලෝමීටර හයහත්සියයක්වත් යථාවත් කරන්න අපට පුළුවන් වෙයි කියා මම විශ්වාස කරන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, පේරාදෙණිය පාලමත් කැඩුණා. අපි දැන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය, CECB එක ආදි ඔක්කොමත් එක්ක එකතු වෙලා පේරාදෙණිය පාලමේ වැඩ කරගෙන යනවා. අපි උත්සාහ කරනවා, මේ අප්‍රේල් මාසයේ 14වැනි දාට කලින් පේරාදෙණියේ ඒ කැඩුණු පාලම හදලා කෝච්චි ධාවනය කරවන්න. එතැන අඩි 20කට වඩා උස විශාල දූපතක් ගොඩ නැඟිලා තිබුණා, බට ගස් ආදි බොහෝ දේවල් කඩාගෙන ඇවිල්ලා. ගරු කථානායකතුමනි, දවස් 9ක් විතර තිස්සේ නාවික හමුදාවේ diversලා තමයි ඒ ගලන ගඟේ යට කිමිදි කිමිදී ඒවා අයින් කරන්න මැදිහත් වුණේ. තවත් අවුරුද්දක් ගියත්, ගඟ හිඳෙන කල් හිටියොත් මිසක් දුම්රිය දෙපාර්තමේන්තුවට ඒක කරන්න බැහැ. ත්‍රිවිධ හමුදාව තමයි ඒ අතිදුෂ්කර කටයුත්තට දායක වුණේ. ගරු කථානායකතුමනි, ඒ වාගේම තමයි ඒ අය බදුල්ල ප්‍රදේශය ඇතුළු හැම තැනකදීම තමන්ගේ දායකත්වය ලබා දුන්නේ. මගේ ඇස් දෙකෙන්ම දැක්කා මන්නාරමේ තත්ත්වය. ත්‍රිවිධ හමුදාව විශාල කාර්ය භාරයක් කළා දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය කරන්න. ඔවුන් නොඑන්න අපට ඒක කරන්න බැහැ. දුම්රිය මාර්ග විතරක් නොවෙයි, ප්‍රධාන මාර්ග ගත්තත් එහෙමයි. නුවරඑළිය, කොත්මලේ, රම්බොඩ වාගේ ප්‍රදේශවලට ත්‍රිවිධ හමුදාවේ කමාන්ඩෝ භටයන් ගිහිල්ලා තමයි සමහර ගම්මාන සොයා ගත්තේ; ඒවාට වතුර ගෙන ගියේ; ඒවායේ පාරවල් හදන්නේ. අද ලංකාවේ RDA එකට අයත් කැඩිච්ච පාරවල් සහ පාලම් සියල්ල වාගේ - සියයට 99ක්ම - යන්න පුළුවන් විධියට හදලා තිබෙනවා. කොහොමද ඒවා හදලා තිබෙන්නේ? ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදාව වාගේම ඉන්දියාවෙන් ආපු හමුදාවත් එකතු වෙලා තමයි ඒ සමහර පාරවල්, සමහර පාලම් හදලා තිබෙන්නේ. ඒක තමයි ඇත්ත. ගරු කථානායකතුමනි, මහියංගනය රෝහල විනාශ වුණාම ඒ රෝහලට ගිහිල්ලා වැඩ කළේ ඉන්දියාවෙන් ආපු වෛද්‍යවරු. හලාවත රෝහල යට වුණා. එතැන වැඩ කළේ ජපානයෙන් ආපු වෛද්‍යවරු. ඔබතුමා දන්නවා අදත් උතුරු-බදුල්ල මාර්ගය ප්‍රතිසංස්කරණය කරන බව. අතිවිශාල landslides සිදු වෙලායි තිබෙන්නේ. ගරු කථානායකතුමනි, දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට නිසි ගෞරවය ඇතිව මම අවංකව කියන්න කැමැතියි, ඒවා දුම්රිය දෙපාර්තමේන්තුවේ ශක්තියෙන් කළොත් අවුරුද්දකින්වත් හදන්න බැරි බව. 'බලන' වාගේ ප්‍රදේශවලට මම පයින් ගිහිල්ලා බැලුවා. අපට හිතාගන්නවත් බැහැ. ඒවායේ කටයුතු කරන්නේ NBRO එක, RDA එක විතරක් නොවෙයි. ත්‍රිවිධ හමුදාවේ ඉංජිනේරුවන්, ත්‍රිවිධ හමුදාවේ මිනින්දෝරුවන්, ත්‍රිවිධ හමුදාවෙන් දීපු නිලධාරීන් ඇවිල්ලා දුම්රිය නිලධාරීන් එක්ක එකතු වෙලා වැඩ කරනවා. අපි NBRO එකත් එක්ක සම්බන්ධ වෙලා වෙනම Operations Room එකක් පවත්වාගෙන යනවා. එහෙම තමයි මේවා කරන්නේ. මා කියන්නේ, දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, NBRO එකේ නිලධාරීන් වාගේම ත්‍රිවිධ හමුදාවත් ඒ ඉදිකිරීම්වල සියයට 50ක, 60ක කොටසක් බවයි. අප දන්නා දෙයක් තමයි ඕනෑම රටක සිදු

[ගරු බිමල් රත්නායක මහතා]

වන ආපදාවකදී ත්‍රිවිධ හමුදාව විශාල භූමිකාවක් කරනවා කියන එක. අපේ රටේත් අප දැක්කා, දුම්රිය මාර්ග හදද්දී, landslides වුණු තැන් යථාවත් කරද්දී ත්‍රිවිධ හමුදාව බෙහෙවින් කැප වුණු ආකාරය.

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා "දිට්වා" ආපදා තත්ත්වය එන්න කලිනුත් දුම්රිය සේවය හොඳට තිබුණේ නැති බව. දුම්රිය එන්ජින් 9ක් අවුරුද්දකට ලෙඩ දෙනකොට රත්මලාන workshop එකෙන් හදලා දෙන්නේ එන්ජින් දෙකයි, තුනයි. මගී ජනතාව දුක් විඳිනවා. ඒ නිසා අපි ඒ කටයුතුවලටත් ත්‍රිවිධ හමුදාවේ උදව් ලබා ගත්තා, ඒක "දිට්වා" නිසා විනාශ වෙච්ච තැනක් නොවුණත්. "දිට්වා" විනාශය හමුවේත් මිනිසුන්ට දෙන්න තිබෙන හොඳම දේ දෙන්න අප මහන්සි වුණේ එහෙමයි.

ගරු කථානායකතුමනි, ත්‍රිවිධ හමුදාව ලෝකය පුරාම විශේෂඥ වෛද්‍යවරුන් ලෙස කටයුතු කරනවා, ඉංජිනේරුවරුන් ලෙස කටයුතු කරනවා. හමුදාවේ Mechanical Section එක, Engineering Section එක තමයි සමහර road development වැඩවල ඉන්නේ, railway tracks හදන වැඩවල ඉන්නේ. දුම්රිය රියැදුරන් පුහුණු කිරීම ආරක්ෂක අංශ කරපු ඉල්ලීමක් නිසා කළා නොවෙයි. අප හිතපු දේ තමයි හදිසි තත්ත්වයකදී ත්‍රිවිධ හමුදාවේ පිරිසක් පුහුණු වෙලා ඉන්න එක හොඳයි කියන එක. ඒක ඕනෑම විෂයයකට අදාළයි. ඒක වෛද්‍ය වෘත්තියට, ඉංජිනේරු වෘත්තියට, දුම්රිය රියැදුරු වෘත්තියට, වෙන ඕනෑම සේවයකට අදාළ වෙන්න පුළුවන්. ඒක අත්‍යවශ්‍යයි. අපි දැක්කා ඒ අවශ්‍යතාව. අපි අත්වින්දා ඒක.

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා අදත් නුවර ඉඳලා කොළඹට කෝච්චියේ එන්න අදත් බැරි බව. විශාල office trains ප්‍රමාණයක් තිබෙනවා. ඒක අතිවිශාල කරදරයක්. අපි මොකක්ද කරන්නේ? නුවරින් බස් දාලා මඟීන් රඹුක්කනට ගෙනෙනවා; එහෙම නැත්නම් කොළඹට ගෙනෙනවා. කෝච්චි හදලා තිබෙන්නේම office trains විධියට මඟීන් උදේට ගෙන එන්න සහ හවසට ගෙන යන්න. එතකොට ඒක අතිශය වැදගත්. ඒ නිසා ඇත්තටම අපිම තමයි ත්‍රිවිධ හමුදාවට කිව්වේ, ඔබතුමන්ලාගේ ඉංජිනේරුවන් අපට දෙනවා, landslides සම්බන්ධයෙන් කටයුතු කරන්න, ඔබතුමන්ලාගේ surveyors දෙනවා, ඒ හැම එකක්ම දෙනවා, හමුදාවේ 20ක් විතර පුහුණු කරලා හමුදාවේ තියා ගන්න කියලා. එහෙම නැතිව ඒ අය දුම්රිය සේවයට අනුයුක්ත කරන්න කියලා නොවෙයි කිව්වේ. එතකොට මොකක්ද කළේ? ඒ රියැදුරු පුහුණුවට විරුද්ධ වුණා. හැබැයි, දුම්රිය සේවයේ හැම තැනටම හමුදාවේ උදව් ගන්නවා. ඒ රියැදුරු පුහුණුවට යොදා ගත්තේ හමුදාවේ 20 දෙනෙකු පමණයි. ගරු කථානායකතුමනි, දවසකට දුම්රිය ගමන් සේවාවන් 280ක් විතර කරනවා. හමුදාවේ නිලධාරින් 20ක් පුහුණු කර ගත්තා කියලා දුම්රිය සේවයට කරන්න පුළුවන් බලපෑම මොකක්ද? දුම්රිය සේවයට කිසිම බලපෑමක් කරන්න බැහැ, 20දෙනෙකුට. එහෙම තත්ත්වයක් තිබියදී තමයි ඊයේ strike එකක් call කළේ. අපි අතිශයින්ම කනගාටු වෙනවා ඒ අය ඒ විධියට කටයුතු කිරීම පිළිබඳව.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් තවත් විනාඩි කිහිපයක් ඉල්ලා ගන්නවා, මේ කාරණා කලබලයක් නැතිව කියා ගන්න ඕනෑ නිසා. අපි ආණ්ඩු පක්ෂයේ වෙලාව සංශෝධනය කර ගන්නම්. ගරු කථානායකතුමනි, ඔබතුමාට මම කියන්නම් මෙතැන තිබෙන තර්කය මොකක්ද කියලා. හමුදාවේ කට්ටිය කිහිපදෙනෙකු පුහුණු කර ගන්න එකයි මේ කරන්නේ. එහෙම නැතිව, හමුදාවේ කට්ටිය දුම්රිය දෙපාර්තමේන්තුවට ගන්නවා නොවෙයි. පුහුණු කර ගන්නේ - පුරුදු කර ගන්නේ - හදිසි තත්ත්වයකදී අවශ්‍ය වුණොත් යොදා ගන්නයි. නමුත් ගරු කථානායකතුමනි, ඔබතුමාට මම කියන්න කැමැතියි, වෘත්තීය සමිති අරගළ කුඩු පට්ටම් කරන්න ත්‍රිවිධ හමුදාව යොදා ගන්න අපට කිසිසේත් වුවමනා නැති බව.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියන්නම් අපේ ආණ්ඩුව පැවැති මේ මාස 14ට වෙච්ච සිදුවීම් ටිකක්. 2025 මාර්තු මාසයේ දවස් කිහිපයක් කුරුණෑගල සිට කොළඹ කොටුව දක්වා ධාවනය වන දුම්රිය ධාවනය නැවැත්තුවා. දුම්රිය රියැදුරු සේවකයෙකු තමන්ගේ බෑග් එක ගෙනැල්ලා දුන්නේ නැහැ කියලා පොල්ගහවෙල පැත්තේ දුම්රිය ධාවනය - 141 කියන එක - දවස් තුනක් විතර නතර කළා. අපි ඒ වෙලාවේ හමුදාව යොදවන්න හිතුවේවත් නැහැ. කිහිප දෙනෙකුට සේවා ස්ථාන මාරුවක් දුන්නා කියලා 2025 මැයි 25වන දා සේවයට වාර්තා නොකර සිටියා, සියලු දුම්රිය ධාවන වාර cancel වන විධියට. ඒ වෙලාවේත් අපට කිසිම හමුදාවක කට්ටියක් ගැන මතක් වුණේවත් නැහැ; අපි එහෙම දෙයක් ගැන හිතුවේ නැහැ. අපි එහෙම හිතන්නේත් නැහැ. ඒ වාගේම දුම්රිය ස්ථානාධිපතිවරුත් ඒ විධියටම කටයුතු කළා. අවශ්‍ය නම් ඒ ගැන මම වෙනම කියන්නම්.

දුම්රිය එන්ජින් රියැදුරන්ගේ පැත්තෙන් ගත්තොත්, ඔවුන් මීට කලින් අවස්ථා කිහිපයකදීම strike කරලා තිබෙනවා. ඔවුන් දුම්රිය ධාවනය නතර කරලා තිබෙනවා. අපි බලයට එන්න කලිනුත් සමහර විට හවස 4.00ටත් දුම්රිය නතර කරලා තිබෙනවා. ඒ කිසිම අවස්ථාවකදී අපි හමුදාවක් ගැන හිතුවේ නැහැ. එහෙම නම් අපට ඒ වෙලාවේදී තමයි ඒ අය ගැන හිතන්න තිබුණේ. සමහර වැඩ වර්ජන අන්තිම අසාධාරණයි. ඔබතුමා දන්නවා, බෑග් එක ගෙන යන්න සේවකයෙක් හිටියේ නැහැ කියලා පොල්ගහවෙලදී දුම්රිය නතර කරලා ගිය බව. සේවාවන් ඔක්කොම ගැන මේ අවස්ථාවේදී කථා කරන්න ඕනෑ නැහැ. සමහරු තමන්ට restroom එකක් නැහැ කියලා වර්ජනය කළා. මම දන්නවා, ඒවා විශාල ප්‍රශ්න කියලා. ඒවා අවුරුදු 10ක්, 20ක් වැනි කාලයක් තිස්සේ ආණ්ඩු විසින් විසඳපු නැති ප්‍රශ්න. හැබැයි, අපි ඒ ප්‍රශ්න විසඳනවා. අපි බලයට ආවාට පසුව තමයි ඒ ප්‍රශ්න විසඳාගෙන යන්නේ.

ගරු කථානායකතුමනි, එක දුම්රියක් මඩකලපුවේදී රාත්‍රී 11.30ට නතර කරලා, ටිකට් පත් 130ක් අරගෙන තිබුණු මිනිස්සු දුම්රියෙන් බැස්සුවා. ඒ, ඔවුන්ට restrooms නැහැ කියලා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Can I - *[Interruption.]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
No. I do not have time to joke with you.

ගරු කථානායකතුමනි, මට කියන්න තිබෙන දේ මෙයයි. අපි ඒ කිසිම අවස්ථාවකදී ත්‍රිවිධ හමුදාවවත්, වෙන කණ්ඩායමක්වත් ඒ සඳහා යොදා ගන්න කල්පනා කළේ නැහැ. මේ වෙලාවේදී අපට කිසිසේත්ම එහෙම කරන්න අවශ්‍යතාවක් නැහැ. හැබැයි, අපි දැන ගත්ත දේ මොකක්ද? ගරු කථානායකතුමනි, ත්‍රිවිධ හමුදාව දුම්රිය සේවයට, මහාමාර්ග ක්ෂේත්‍රයට මෙතරම් උදවු කර තිබියදී අපි කිසිසේත්ම හිතුවේ නැහැ, හමුදාව හරි, කවුරු හරි ඒ සඳහා යොදවන්න. එහෙම හිතුවොත් හමුදාව නොවෙයි, වෙන කෙනෙක් පුහුණු කළත් ඔය ප්‍රශ්නය තමයි ඇති වන්නේ. දුම්රිය රියැදුරන් strike එක කොහොම හරි කර ගැනීම කියන එක පිළිබඳව විතරද හිතන්නේ? අපි කරුණාවෙන් මේ කාරණය කියන්න කැමැතියි. අපි කවදාවත් හිතුවේ නැහැ, මේ විධියට ඔවුන් වර්ජනය කරයි කියලා. මෙවර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් බිල්ලට ගන්න තරම් දුරකට මේ පිරිස කටයුතු කරයි කියලා මම කවදාවත් බලාපොරොත්තු වුණේ නැහැ. එම නිසා අපි ඒ ගැන කනගාටු වනවා.

අපේ ආණ්ඩුව බලයට එනකල් අවුරුදු හතකින් හෝ ඊටත් වැඩි කාලයකින් දුම්රිය සේවයට දුම්රිය රියැදුරන් බඳවාගෙන නැහැ. අපි දැන් දුම්රිය රියැදුරන් 190ක් බඳවාගෙන තිබෙනවා. ඒ අය පුහුණු කරන්නත් දැන් පටන් අරගෙන තිබෙනවා. Station mastersලා අවුරුදු හත, අටකට පසුවයි - අපි බලයට ආවාට පසුව - අරගෙන තිබෙන්නේ. ජනාධිපතිතුමාගේ මහ පෙන්වීමත් එක්ක අපි රාජ්‍ය සේවය තුළ අත්‍යවශ්‍ය දේවල් දියුණු කරනවා. ජනවාරි පඩිය අරගෙන තමයි සමහර අය strike කරන්නේ. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, අපි වෘත්තීය සමිතිවලට සටන් කරන්න උගන්වා තිබෙනවා, ජනතාව වෙනුවෙන්. නමුත්, අපි වෘත්තීය සමිතිවලට කඩාකප්පල්කාරී වැඩ කිරීමට උගන්වන්න කවදාවත් හිතලා නැහැ. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, මේ ඒක විපක්ෂයේ අය විග්‍රහ කර ගන්න විධිය. මේ සිදුවීම ගැන අපි කනගාටු වෙනවා. දුම්රිය රියැදුරු මහත්වරුන්ගේත් දරුවෝ O/L Exam එකට පෙනී සිටිනවා. ඒ දුම්රිය රියැදුරු මහත්වරු අනෙක් අයට සාපේක්ෂව සැලකිය යුතු වැටුපක් ලබන පිරිසක්. O/L Exam කරන දරුවන්ව බිලි ගන්න තරම් දුරකට ඔබතුමන්ලා යන්න ලැහැස්තියි කියන එක දැනගන්න ලැබීම අතිශය කනගාටුදායකයි. නමුත්, ඒ දැනුම ලබා දුන්නාට ස්තුතියි. ත්‍රිවිධ හමුදාවේ අය පුහුණු කිරීම සම්බන්ධ කාරණය අපි දරුවන් ගැන හිතලා වෙනස් කර ගත්තා. නමුත් අපි හිතනවා, විශේෂඥ වෛද්‍යවරු, ඉංජිනේරුවන්, මිනින්දෝරුවන්, accountantsලා, nursesලා කියන හැම ක්ෂේත්‍රයකටම ත්‍රිවිධ හමුදාව සම්බන්ධ කරගෙන ලෝකය පුරාම රටවල් කටයුතු කරනවා නම් අපට ඒකෙන් වෙනස් වෙන්න බැහැ කියන එක. දුම්රිය රියැදුරු මහත්වරු සමහර වෙලාවට එන්නේත් හමුදාවෙන් හදපු පාලම් උඩින් සහ පාරවල්වලින්. එහෙම කටයුතු කරපු හමුදාව තමන්ගේ වෘත්තියට අභියෝගයක් ලෙස හිතන ඒ අයගේ මනස ගැන මට තේරුම් ගන්න බැහැ.

මම මෙවර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන්ගෙන් සමාව ඉල්ලනවා, අපි යටතේ එහෙම නිලධාරින් පිරිසක් ඉන්න එක ගැන. සමහර විට දුම්රිය රියැදුරන් අතරත් හොඳ නිලධාරින් ප්‍රමාණයක් ඇති. ඇත්තටම මම මේ අවස්ථාවේදී ඒ දරුවන්ගෙන් සමාව ඉල්ලනවා. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් බිල්ලට තියලා ත්‍රිවිධ හමුදාවේ 20දෙනෙක් පුහුණු කරන එක නවත්වන්න ලැහැස්ති කට්ටියක් අපේ දෙපාර්තමේන්තුවේ, අපේ අමාත්‍යාංශය යටතේ ඉන්නවා කියන එක දැනගන්න ලැබීමත් අතිශය කනගාටුදායකයි.

ඒක නිසා මම සාමාන්‍ය පෙළ විභාගය ලියන දරුවන්ගෙන් සහ ඒ දරුවන්ගේ දෙමව්පියන්ගෙන් සමාව ඉල්ලනවා, ඊයේ පැය දෙක තුනකට හෝ සිදු වුණු කලබලය පිළිබඳව. නමුත්, අද වනවිට ඒ ප්‍රශ්නය විසඳිලා තිබෙනවා. අද දුම්රිය ධාවන කටයුතු නිසි පරිදි සිදු වෙලා තිබෙනවා. ඒ නිසා දරුවෝ විභාගයට ගිහිල්ලා ඇති.

මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, ගරු කථානායකතුමනි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Hon. Speaker, Standing Order No. 92(2)(a) states, I quote:

> "A member may in any proceedings question whether proper procedures have been or are being followed by making a point of …."

මෙච්චර ඉක්මනින් ධනවාදී පැත්තට හැරීම පිළිබඳව මම සභානායකතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

Next, the Hon. Mujibur Rahuman. You have six minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[අ.භා. 12.02]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභානායකතුමා විවාදය පටන් ගත්තේම විපක්ෂයට පහර ගහලා. විපක්ෂ නායකතුමාටත් හැමදාම පහර ගහනවා, අපටත් පහර ගහනවා. විපක්ෂය පැත්ත බලාගෙන කියනවා, හොරු ඉන්නේ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හොරු බලයට ගෙනෙන්න එතුමා තමයි "මහින්ද චින්තනය" ලිව්වේ. *[බාධා කිරීමක්]* 2005දී බිමල් රත්නායක තරුණ තරුණියන්ට කිව්වා, මහින්ද රාජපක්ෂට ඡන්දය දෙන්න කියලා. පරණ වීඩියෝ අරගෙන බලන්න. එතුමාට ඔච්චර කේන්තියක් තිබෙනවා නම් මහින්ද රාජපක්ෂගේ photo එකක් ගෙනැල්ලා ඉස්සරහින් තබා ගෙන බණින්න. දැන් අපට බණින්න එපා. *[බාධා කිරීමක්]* රාජපක්ෂලා බලයට ගෙනාවේ අපි නොවෙයි. මේ සභාවේ අපි කවුරුවත් රාජපක්ෂලාට ඡන්දය දීලා නැහැ. ආණ්ඩු පක්ෂය පැත්තේ ඉස්සරහ පේළියේ ඉන්න ඔක්කෝම රාජපක්ෂලාට ඡන්දය දීලා තිබෙනවා. *[බාධා කිරීමක්]* රාජපක්ෂලා බලයට ගෙනැල්ලා දැන් මෙතැනට ඇවිල්ලා අපට බණිනවා. අපට බැණලා හරියනවා යැ. *[බාධා කිරීමක්]*

අනික් කාරණය මේකයි. මොනවාද මේ හැමදාම කියන වචන? එතුමා කියනවා, පාර්ලිමේන්තු සම්ප්‍රදායය ආරක්ෂා කරන්න කියලා. 2022දී පාර්ලිමේන්තුව ඉස්සරහ හන්දියට ඇවිල්ලා පාර්ලිමේන්තුව ගිනි තියන්න එන්න කියලා මිනිස්සුන්ට අඬ ගැහුවා. *[බාධා කිරීමක්]* අද කථා කරනවා, පාර්ලිමේන්තු සම්ප්‍රදායය ගැන. *[බාධා කිරීමක්]* පවුලම පාර්ලිමේන්තුවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ලජ්ජයි!

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

අනුර කුමාර දිසානායක කිව්වේ පවුල් දේශපාලනය අවසන් කරනවා කියායි. එහෙමයි අනුර කුමාර කථා කළේ. දැන් මොකක්ද වෙන්නේ? අනුර කුමාර, නෝනායි, මහත්තයායි පාර්ලිමේන්තුවට ගෙනාවා; තාත්තායි, පුතායි පාර්ලිමේන්තුවට ගෙනාවා; ඒ වාගේම, girlfriend සහ boyfriend පාර්ලිමේන්තුවට ගෙනාවා. *[බාධා කිරීමක්]* Boyfriend, boyfriend විතරයි ගෙනාවේ නැත්තේ. *[බාධා කිරීමක්]* Boyfriend, girlfriend ගෙනාවා. *[බාධා කිරීමක්]* Boyfriend, boyfriend ඉන්නවාද කියන එකත් දැන් හොයන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමා හිනා වෙනවා. මම දන්නවා, මෙතුමා ඒ subject එකේ නැහැ කියලා. මම ඒක හොඳට දන්නවා. එතුමා හිනා වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Mujibur Rahuman, shall we move onto the Debate?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

Yes, why not?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

There are only three minutes remaining. You have been given only six minutes.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

Sir, I am telling you, මෙතුමා හැමදාම උදේ ඉඳලා කරන්නේ අපට බණින එක.

ඊළඟට, හවස 5.30ට පාර්ලිමේන්තුවේ කටයුතු අවසන් කළ යුතුව තිබුණත් පැයක කාලයක් දීර්ඝ කරගෙන අපට බණිනවා. මොකක්ද, මේ කරන්නේ? අපට බණින්නද පාර්ලිමේන්තු ආවේ? *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ. අපට බණින්නද මෙතුමා පාර්ලිමේන්තුවට ආවේ? පාර්ලිමේන්තුවට ඇවිල්ලා අවුරුද්දකුත් ගත වෙලා තිබෙනවා. ඒත් හැමදාම අපට බණිනවා. අපි දන්නේ නැහැ, හැම දාම උදේට ගෙදර නෝනාත් එක්ක තරහා වෙලා එනවාද කියලා. මේ සභාවට ඇවිල්ලා අපිව දැක්ක ගමන් අපට බණිනවා. මේක මාර වැඩක් නේ. ඒක අපි අහන්න එපා යැ. නෝනා එක්ක ඔරොප්පු වෙලා එනවා නම් ඒක ගෙදරදී නෝනාත් එක්ක බලා ගන්න ඕනෑ. *[බාධා කිරීමක්]* පාර්ලිමේන්තුවට ඇවිල්ලා මෙතැන වාඩි වෙලා විපක්ෂ නායකතුමා දැක්ක ගමන්, අපිව දැක්ක ගමන් නෝනාව දැක්කා වාගේ අපට බණිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Mujibur Rahuman, you have finished more than half of your allotted time now.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා පාසල් ශිෂ්‍යයෝ ගැන කිව්වා. ඒ නිසා මම මේ කාරණයත් කියන්න ඕනෑ. එතුමාට මෙවර සාමාන්‍ය පෙළ විභාගය ලියන දරුවන් ගැන දුකයි ලු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1987-88 කාලයේ "මව්බිම නැත්නම් මරණය" කියලා මේ රටේ පාසල් යන දරුවන්ට පාසල් යන්න එපා කියලා ඔවුන්ව පාරට ගෙනාපු අය, අද O/L විභාගය ලියන දරුවන් ගැන දුක් වෙනවා. ළමයින්ට ඉස්කෝලේ යන්න දුන්නේ නැහැ. ඉන්දු-ලංකා ගිවිසුම එනකොට කොළඹ ඉස්කෝලවල ළමයි ඔක්කෝම පාරට බැස්සුවා. ඒ ළමයි පාරට අරගෙන කිව්වා, "ඉස්කෝලේ නොවෙයි, ඉස්සෙල්ලාම මව්බිම" කියලා. එහෙම කථා කරපු උදවිය අද strikes ගැන කථා කරනවා. මේ අය විපක්ෂයේ හිටපු කාලයේ හමුදාවට පුහුණුව දෙනකොට ඒ හැම එකකටම විරුද්ධ වුණා; හමුදාකරණය කරන්න එපා කියලා කිව්වා. එහෙම කියලා, හමුදාවේ අයට කෝච්චි එළවන්න පුරුදු කරන්න ඕනෑ කියලා අද කියනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Mujibur Rahuman, you have only two more minutes.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

Okay, Sir.

අද කියනවා, හමුදාවේ අයට කෝච්චි එළවන්න පුරුදු කරන්න ඕනෑ ලු. එදා විපක්ෂයේ ඉන්නකොට කිව්වා, හමුදාකරණය එපා කියලා. මොකක්ද මේ? මෙතුමන්ලා හැදෙන එක ගැන අපට සන්තෝෂයි. මොකද, මෙතුමන්ලා තරම් මේ රටට හානි කරපු දේශපාලන ව්‍යාපාරයක් මේ රටේ තිබුණේ නැහැ. මේගොල්ලන් තමයි හැම දාම මේ රටට හානි කළේ. ඉන්දියාව ගැන බිල්ලෝ මැව්වා. එක එක රටවල් ගැන බිල්ලෝ මැව්වා. ආයෝජකයන් එනකොට බිල්ලෝ මැව්වා. ඉන්දියාවට ගිහින් ඇවිත් දැන් කියනවා, මෝදි හොඳයි ලු. ඔව්, මෝදි හොඳයි. හැබැයි, ගාන්ධි හොඳ නැහැ. එදා ගාන්ධි එනකොට හොඳ නැහැ, දැන් මෝදි හොඳයි. එහෙම නේද? මේ රටේ ජනතාව මේගොල්ලන්ව දෙබිඩි දේශපාලනයෙන් ගලවා ගත්තා. ඇත්තටම අපි සන්තෝෂ වෙන්න ඕනෑ, මේගොල්ලන්ට ආණ්ඩුවක් දීපු එක ගැන. මොකද, දැන් නේ අපට තේරෙන්නේ, එදා හිටපු කට්ටිය නොවෙයි මේ ඉන්නේ කියලා. එහෙම නේද? දැන් හොඳ ලස්සනට බඩවල් ඇවිල්ලා තිබෙනවා; V8වල යනවා; කොණ්ඩෙට හොඳ ඩයි වර්ග ගානවා. පිඹුරෝ වාගේ දැන්. ඉස්සර එහෙම හිටියේ නැහැ නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමා නම් ඒ සයිස් එකෙන්ම ඉන්නවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

එතුමා නම් ඉස්සර ඉඳන් ඔහොම තමයි. එතුමා ඉස්සර අපේ පක්ෂයේ හිටපු කෙනෙක්. වැරදිලා, ඒ පැත්තට ගියේ. කථානායකතුමාටත් අපි කියන්න කැමතියි, මේක නවත්වන්න කියලා. එතුමා නැඟිට්ට ගමන් mike එක on වෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
වම් අත වැඩ කරන්නේ නැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔව්, කථානායකතුමාගේ වම් අත වැඩ කරන්නේ නැහැ. එතුමාගේ දකුණු අත විතරයි වැඩ කරන්නේ. මෙතුමාට කිසිම point of Order එකක් බලන්නේ නැහැ. අපි නැඟිටිනකොට point එක කියන්න ඕනෑ; අංකය කියන්න ඕනෑ; වචනය කියන්න ඕනෑ. හැම එකක්ම කියන්න ඕනෑ. මෙතුමා නැඟිට්ට ගමන් mike එක on වෙනවා. එහෙම වෙන්නේ කොහොමද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායන්, ස්ථාවර නියෝග තිබෙනවා. ඒවා හැම කෙනාටම පොදුයි; ඒවා තිබෙන්නේ අපට විතරක් නොවෙයි. ඒවා අපට විතරක් නොවෙයි, එතුමාටත් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, your time is over now.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒ නිසා අපි කථානායකතුමාට කියනවා, එතුමාව පාලනය කරගන්න කියලා. පාලනය කරගන්න බැරි නම් කථානායකතුමා යන්න, මන්ත්‍රී කෙනෙක් හැටියට. ඔබතුමා වාඩි වෙන්න, ඔය ආසනයේ. *[බාධා කිරීම්]* ඔබතුමා ඊට වැඩිය හොඳට පාලනය කරනවා. ඔබතුමාට ඒ ශක්තිය තිබෙනවා. එතුමා නැඟිට්ට ගමන්, එතුමා මුහුණ බලපු ගමන් කථානායකතුමා වෙනස් වෙනවා. හරියට, එතුමා කථානායකතුමාගේ තාත්තා වාගේ. විපක්ෂයට නිතර නිතර චෝදනා කරලා විපක්ෂයේ කටවල් වහන්න, විපක්ෂ නායකයාව අඩපණ කරන්න හිතන්න එපා කියලා අපි පැහැදිලිව කියනවා. මතක තියාගන්න, ජන වරම කියලා කියන්නේ ගලේ කොටපු එකක් නොවෙයි කියන එක. ජන වරම කියන්නේ ගලේ කොටපු එකක් නොවෙයි. ඒක වෙනස් වෙනවා. ඔයගොල්ලන් වාගේම දඟලපු කට්ටියක් හිටියා, 2019දී බලයට ඇවිල්ලා. අන්තිමට මොකද වුණේ? අවුරුදු දෙකෙන් ඒ අයට යන්න වුණා. ඒක හොඳට මතක තියාගන්න. *[බාධා කිරීම්]* අවුරුදු දෙකෙන් යන්න වුණා. ඔයගොල්ලන්ගේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක වාගේම කෙනෙක් ඔතැන හිටියා, ජොන්ස්ටන් ප්‍රනාන්දු කියලා. එයා කැගැහුවේ පුටු උඩ නැඟලා. *[බාධා කිරීම්]* ඔය වාගෙමයි, දෙවැනි නැහැ. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, you have exhausted your extra time also.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ආණ්ඩු පක්ෂයට ගරු කරනවා. ඔබතුමන්ලාට ජන වරමක් ලැබිලා තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. ඒ ජන වරම අවභාවිත කරලා විපක්ෂය අඩපණ කරන්න එපා කියමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 91(අ) සහ 91( උ) කියන ස්ථාවර නියෝග කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම සභාවේ මූලික කටයුතුවලට ගියාම එදා දවසේ යෝජනාව තමයි සභානායකට ඉදිරිපත් කරන්න තිබුණේ. හැබැයි, එතුමා එයින් බැහැර වෙලා බැණගෙන බැණගෙන ගිය නිසා තමයි අපට මැදිහත් වෙන්න සිද්ධ වුණේ. ඒක නිවැරදි කරන්න කියලා අපි කථානායකතුමාගෙන් ඉල්ලුවා. ඒක සිද්ධ වුණේ නැහැ. ස්ථාවර නියෝග 91 (උ) යටතේ මම මේ ඔබතුමාට කියන්නේ. එතුමා සහ ආණ්ඩු පක්ෂය අපට අවලාද නඟනවා; විවිධ නම්වලින් ආමන්ත්‍රණය කරනවා. හැබැයි මේ කාරණය මම කියන්න කැමතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම මගේ තාත්තාගේ ජානවලින් ඉපදුණු පුද්ගලයෙක්. අපට එහෙම අවලාද කරන කට්ටියට මම අභියෝග කරනවා. පුළුවන් නම් එන්න කියලා, ජාන පරීක්ෂාවෙන් තාත්තා කවුද කියලා සොයාගන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, we will move onto the next speaker. Next, the Hon. (Prof.) L.M. Abeywickrama. You have ten minutes.

[අ.භා. 12.10]

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ, විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ වන නියම සම්බන්ධයෙනුත් අපි කථා කරනවා. විශේෂයෙන්ම කෘෂිකාර්මික නිෂ්පාදන වන අර්තාපල්, බී ලූනු සඳහා -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! Hon. Members, I would have to expunge any unacceptable words from Hansard.

Hon. (Prof.) L.M. Abeywickrama, you may continue. Sorry for the interruption.

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
ගරු කථානායකතුමනි, බී ලූනු සඳහා රුපියල් 50ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක්, ඒ වාගේම අර්තාපල් සඳහා රුපියල් 80ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක් පැනවීම පිළිබඳව සමාජය තුළ කතිකාවක් තිබෙනවා. විශේෂයෙන්ම අර්තාපල් හා බී ලූනු

[ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා]

නිෂ්පාදනය ගත්තොත්, අපේ රටට ඒවා ආනයනය කරන ඉන්දියාව, පාකිස්තානය, චීනය වාගේ රටවල ගොවියාගේ නිෂ්පාදන වියදම සහ ලංකාවේ ගොවියාගේ නිෂ්පාදන වියදම අතර විශාල පරතරයක් තිබෙනවා. මේ පරතරයට හේතු ගොඩක් තිබෙනවා. අපේ ලංකාවේ වැලිමඩ වාගේ ප්‍රදේශවල අර්තාපල් කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 200ක් විතර වෙනවා. නමුත්, ඉන්දියාව ගත්තොත්, එහි නිෂ්පාදන පිරිවැය රුපියල් 40යි. ඒ වාගේම ලංකාවේ බී ලූනුවල නිෂ්පාදන වියදම කිලෝග්‍රෑමයකට රුපියල් 125ක් විතර වෙද්දී, ඉන්දියාවේ නිෂ්පාදන වියදම ඒකෙන් පහෙන් පංගුවක්, ඒ කියන්නේ රුපියල් 25ක් විතර තමයි වෙන්නේ. ඒ නිෂ්පාදන වියදමේ විශාල පරතරයට හේතු ගොඩක් තිබෙනවා. එකක් තමයි දේශගුණය. විශේෂයෙන්ම ඉන්දියාවේ, පාකිස්තානයේ, චීනයේ අඩු ආර්ද්‍රතාවක් සහිත දේශගුණයක් තිබෙන කලාපවල තමයි අර්තාපල් සහ බී ලූනු වගා කරන්නේ. ඒ වාගේම ලංකාවේ දිලීර රෝගවලට භාජනවීම වැඩි නිසා කෘෂි රසායන ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අපේ රටේ ගොවියාට භාවිත කරන්න සිද්ධ වෙනවා. ඒ වාගේම පස පිළිබඳව ගත්තොත්, ඉන්දියාවේ හර්යානා හා පන්ජාබ් වාගේ ප්‍රාන්තවල තිබෙන වැලි ලෝම පසෙහි අල වාගේ භෝග හොඳින් වගා කරන්න පුළුවන්. ඒ නිසා පසෙහි තිබෙන වාසිය ඉන්දියාවේ ගොවියාට හා පාකිස්තානයේ ගොවියාට තිබෙනවා.

අනෙක් පැත්තෙන්, අපේ රටේ නිෂ්පාදකයාට බීජ සඳහා විශාල මුදලක් වැය වෙනවා. අර්තාපල්වල නිෂ්පාදන වියදමින් සියයට 50ක් විතර බීජ අර්තාපල්වලට යනවා. ඒවා නෙදර්ලන්තයෙන්, ඕස්ට්‍රේලියාවෙන් ගෙන්වන්නේ. පසුගිය රජයන් විසින් අපේ රටේ බීජ නිෂ්පාදන කර්මාන්තය වුවමනාවෙන්ම කඩා වට්ටලා තිබෙනවා. ඒවා ඔක්කොම රටින් ගෙන්වන නිසා, අපේ ගොවියාට බීජ අර්තාපල් හා බීජ ලූනු සඳහා විශාල මුදලක් වැය කරන්න සිද්ධ වෙනවා.

ඊළඟට, ඉන්දියාව, පාකිස්තානය වාගේ රටවල නිෂ්පාදන යෙදවුම්වලට ඉතා විශාල සහනාධාර ප්‍රමාණයක් දෙනවා. බලශක්තියට විශාල සහනාධාරයක් දෙනවා. මේ කියපු හේතු නිසා අපේ රටේ ගොවියාට ඉතා විශාල පිරිවැයක් දරන්න සිද්ධ වෙනවා. හැබැයි, ඒ මත යැපෙන ගොවීන් විශාල සංඛ්‍යාවක් අපේ රටේ ඉන්නවා. බී ලූනු වගා කරන, ඒ වාගේම අර්තාපල් වගා කරන ගොවීන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ඒ නිසා අපේ රටේ බී ලූනු වගා කරන ගොවියා, අර්තාපල් වගා කරන ගොවියා අපි ආරක්ෂා කර ගත යුතුයි. එහෙම නැත්නම් මේ විශාල වියදම නිසා අපිට ප්‍රශ්නයක් මතු වෙනවා. අපේ Budget share එකෙන් විශාල ප්‍රමාණයක් අර්තාපල් හා බී ලූනු ගෙන්වීම සඳහා වැය කරමින්, විදේශ රටවල් මත දිගින් දිගටම යැපෙන්න සිද්ධ වුණොත් එය අපේ ආර්ථිකයට බලවත් ප්‍රශ්නයක් වෙනවා.

ඒ නිසා තමයි දේශීය ගොවියා ආරක්ෂා කරන්න බී ලූනු මත රුපියල් 50ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක් හා අර්තාපල් මත රුපියල් 80ක බද්දක් දිගින් දිගටම පවත්වා ගෙන යන්න ඕනෑ කියන යෝජනාව අපි ගෙන එන්නේ. මේ මගින් දිගින් දිගටම මේක කරන්න අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපි දන්නා කාරණය තමයි, 2030 වෙනකොට අපිට මේ para-tariffs phase out කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා මේක අපට දිගටම කරගෙන යන්න අවශ්‍ය නැති වුණත්, අපි ඊට ඉස්සෙල්ලා මේ ගොවියා ආරක්ෂා කර ගත යුතුයි.

විශේෂයෙන්ම ඉන්දියාවේ පන්ජාබ් වාගේ ප්‍රාන්තවල, චීනය වාගේ රටවල විශාල පරිමාණයෙන් වගා කරනවා. ඒගොල්ලන්ගේ ඒකක පිරිවැය අඩුයි. අපේ රටේ ගොවීන් ඉතා කුඩා පරිමාණයෙන් වගා කරන ගොවීන්. ඒ කුඩා පරිමාණයෙන් වගා කරන ගොවීන් තාක්ෂණයෙන් සන්නද්ධ කරලා, ඒ ගොල්ලන්ගේ පිරිවැය අඩු කරලා, agricultural sector එක modernize කරලා, ඒ යටතේ ගොවීන්ගේ නිෂ්පාදන පිරිවැය අඩු කරන්න අපට සිද්ධ වෙනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මේ අවුරුද්දේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ තාක්ෂණය වැඩි දියුණු කරන්න විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. අනෙක් පැත්තෙන් ගත්තොත්, වෙළෙඳ පොළ ශීත ගබඩා ඇති කරලා, ගබඩා කිරීමේ පහසුකම් ඇති කරලා, ගොවියාගේ පිරිවැය අඩු කරන්න අපි මේ අවුරුද්දේ විශාල පරිශ්‍රමයක් දරනවා. කෙටි කාලයක් ඇතුළත; වසර දෙකක් තුනක් ඇතුළත; 2030 වෙන්න ඉස්සෙල්ලා, අපේ ගොවියාට ඉන්දියාවේ පන්ජාබ් ප්‍රාන්තයේ, හර්යානා ප්‍රාන්තයේ, චීනය, පාකිස්තානය වාගේ රටවල ගොවීන් සමඟ කරට කර යන්න පුළුවන්; ඒ තරගකාරිත්වය දෙන්න පුළුවන් විධියේ නිෂ්පාදන පිරිවැයක් ඇති කර ගන්න, නිෂ්පාදන පිරිවැය අඩු කර ගන්න අපට ක්‍රියා කරන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. ඒ විශ්වාසය මත පදනම් වෙලා අපි ක්‍රියා කරනවා. ඇත්ත වශයෙන්ම ඒ පිරිවැය වැඩිවීමට හේතුව තමයි, කාලාන්තරයක් තිස්සේ පසුගිය ආණ්ඩු විසින් කෘෂිකර්මය නොසලකා හැරලා, තාක්ෂණය නොසලකා හැරලා, ඒ ගොවීන් අතහැරලා දාපු එක. ඒ නිසා තමයි අපේ ගොවියා තරගකාරී නොවී තිබෙන්නේ. ඒ නිසා, අපේ රටේ ගොවියා ඉදිරි කාලය ඇතුළත තරගකාරී ගොවියෙක් බවට පත් කිරීම හරහා ඒ ගොවීන්ටත් අඩු පිරිවැයක් යටතේ මේ නිෂ්පාදන කරන්න අවස්ථාව ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. එහෙක් අපි මේ ගොවියෝ අත හැරියොත්, බදු අයින් කරලා මේ මිල ගණන් නිදහසේ පාවෙන්න දුන්නොත් විදේශ වෙළෙඳ පොළවල් අපේ වෙළෙඳ පොළ ආක්‍රමණය කරනවා. ඒ නිසා අපේ ගොවියා ආරක්ෂා කරන්න අපට අවශ්‍යයි. අපේ ප්‍රතිපත්තියම වෙලා තිබෙන්නේ අපේ කෘෂි කර්මාන්තය දියුණු කිරීම. ඒ නිසා අපේ ගොවියා ආරක්ෂා කරගෙන ඒ ගමන යන්න අපට මේ පිරිවැය දිගටම පවත්වාගෙන යන්න අවශ්‍යයි. අනෙක් පැත්තෙන් මේක යම්කිසි අසාධාරණයක් වාගේ පෙනුණත්, ඇත්තවශයෙන්ම පාරිභෝගිකයාගේ පැත්තෙන් ගත්තොත් මෙහි සාධාරණයක් තිබෙනවා.

පසුගිය අවුරුදු කිහිපය තුළ කෘෂි නිෂ්පාදනවල මිල ඉහළ පහළ ගියා. සමහර කාලයට අර්තාපල් කිලෝව රුපියල් 600ට, 700ට ඉහළ යනවා. ආයෙත් අඩු වනවා. බී ලූනුවලත් ඒ ප්‍රශ්නයමයි තිබෙන්නේ. හැබැයි අපි ආණ්ඩුව භාරගෙන මේ කෙටි කාලය තුළ අපට පුළුවන්කම ලැබුණා, වෙළෙඳ පොළ තුළ මෙම කෘෂි නිෂ්පාදනවලට අදාළව ස්ථාවර මිලක් පවත්වාගෙන යන්න. ඒ අනුව නිෂ්පාදන තිබෙන කාලවලත්, නැති කාලවලත් සාමාන්‍යයෙන් අර්තාපල් කිලෝවක් රුපියල් 200ත්, 300ත් අතර මිලක පවත්වාගෙන යන්නත්, බී ලූනු කිලෝවක් රුපියල් 100ත්, 200ත් අතර මිලක පවත්වාගෙන යන්නත් හැකි වුණා. ඒ කියන්නේ සාමාන්‍ය ස්ථාවර මිලක්. ඒ තුළින් නිෂ්පාදකයා දිරිගන්වනවා වාගේම, පාරිභෝගිකයින්ට තම පවුලේ වියදම් සැලසුම් කරගන්නත් පුළුවන් වනවා. නිෂ්පාදකයා ආරක්ෂා කරනවා වාගේම, නිෂ්පාදකයින්ට වෙළෙඳ පොළට එන්න දිරිගැන්වීමක් වෙනවා වාගේම පාරිභෝගිකයාගේ පැත්තෙනුත් තමන්ගේ අය වැය - budgets - සම්බන්ධව තීරණ ගන්න හොඳ නිර්ණායකයක් වෙනවා, මෙවැනි ස්ථාවර මිලක් පවත්වාගෙන යාම.

නමුත් අපි විශ්වාස කරන කාරණය තමයි, බී ලූනු කිලෝවකට රුපියල් 50ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක් සහ අර්තාපල් කිලෝවකට රුපියල් 80ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක් පැනෙව්වත් මේ වනකොටත් මේ බද්ද යටතේ අපේ ගොවීන්ගේ නිෂ්පාදන වියදමට වඩා අඩු මුදලකට ඉන්දියාවෙන්, පාකිස්තානයෙන්, චීනයෙන් අර්තාපල් සහ ලූනු ගෙන්විය හැකියි කියන එක. අපේ ආර්ථිකය තුළ මේ බද්ද විශාල බද්දක් වශයෙන් අපට දැනුණත්, අපේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය ගැන සලකා බලනකොට එය තරගකාරී බද්දක් නොවෙයි, යම්කිසි මට්ටමකට

අපේ ගොවියා ආරක්ෂා කරන මට්ටමේ බද්දක්. මේක බදු ආදායමක් වශයෙන් දැක්කත්, රජයක් වශයෙන් අපි මේ බදු ආදායම නාස්තිකාර ලෙස වියදම් කරන්නේ නැහැ. අපේ ඇමතිවරුන්ට රට සවාරි යෑම වාගේ දේවල්වලට නොවෙයි ඒ මුදල් පාවිච්චි කරන්නේ. කෘෂි කර්මාන්තය සංවර්ධනය කරලා, ගොවීන්ට නවීන තාක්ෂණය ලබා දීලා, ඒ වාගේම ගොවීන්ට අවශ්‍ය අනෙකුත් පහසුකම් වන ශීතාගාර පහසුකම්, ගබඩා පහසුකම් ලබා දීලා ගොවියා සංවර්ධනය කිරීමට තමයි මේ බදු මුදල් පාවිච්චි කරන්නේ. ඒ නිසා අපේ අපේක්ෂාව වන්නේ, කෙටි කාලයක් ඇතුළත ගොවීන්ගේ තාක්ෂණය වැඩිදියුණු කරලා ලංකාවේ බීජ ගොවිපළවල් සංවර්ධනය කිරීමයි. අපි දැනටත් වැලිමඩ, බණ්ඩාරවෙල වාගේ ප්‍රදේශවල ආරම්භ කර තිබෙනවා, First Generation අර්තාපල් බීජ නිෂ්පාදනය කරන්න. ඒ වාගේම දඹුල්ල වාගේ ප්‍රදේශවල බී ලූනු බීජ නිෂ්පාදනය කිරීමත් අපි ආරම්භ කර තිබෙනවා. මේ හරහා අපට පුළුවන් වෙලා තිබෙනවා, බීජවලට යන විශාල වියදම අඩු කිරීම තුළින් එක පැත්තකින් ගොවියාගේ නිෂ්පාදන පිරිවැය අඩු කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තාක්ෂණය වැඩිදියුණු කිරීම හරහා, ඒ වාගේම ගොවි කණ්ඩායම් සමූහගත කිරීම සහ සමුපකාර ක්‍රමයට ඒකාබද්ධ කිරීම හරහා වගා බිම්වල ප්‍රමාණය වැඩි කිරීමටත් අපි බලාපොරොත්තු වනවා. කුඩා පරිමාණයෙන් - පර්චස් ගණන්වල; අක්කර කාලට වඩා අඩු වගාබිම්වල - වගා කරන ගොවීන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ කුඩා ප්‍රමාණයේ භූමිවල වගා කරන ගොවීන්ට නවීන තාක්ෂණය භාවිත කිරීමේ අපහසුතාවක් තිබෙනවා. ඒ නිසා අපට පුළුවන්කමක් තිබෙනවා, ඔවුන් ඒකරාශි කරලා සමුපකාර ක්‍රමයට ඒකාබද්ධ කිරීම හරහා මහා පරිමාණ ගොවීන් වාගේම නවීන තාක්ෂණය පාවිච්චි කරන තත්ත්වයට ඒ අයව ගේන්න. ඒ නවීන තාක්ෂණය හරහා අපෙට පුළුවන්කම ලැබෙනවා, ඒකක පිරිවැය අඩු කරගන්න. අපි මේ වනකොටත් මේ වාගේ විවිධාකාර උත්සාහයන් ගොඩක් දරලා තිබෙනවා. විශේෂයෙන් තාක්ෂණය වැඩිදියුණු කිරීමට අපි තාක්ෂණික ගොවිපළවල් ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම ගොවීන්ට තාක්ෂණය දියුණු කර ගැනීම සඳහා විවිධාකාර ප්‍රතිපාදන ලබා දෙන්න, යන්ත්‍ර සූත්‍ර ලබා දෙන්න අපි විශාල මුදලක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා.

අපි විශ්වාස කරනවා, මේ බදු හරහා ගොවීන්ට දාලා තිබෙන පාලම කැඩුවොත්; ඒක අතහැරියොත් ගොවීන් ඒකේ ගිලෙනවා කියලා. ඒ නිසා අපි plane එකෙන් පනින්න ඉස්සෙල්ලා පැරෂූට් එක හදාගන්න අවශ්‍යයි. අපි මේ පැරෂූට් එක අත හරින්න හොඳ නැහැ. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නියුතු කෙනෙකු විධියට මම යෝජනා කරනවා, 2030 වර්ෂය වනකොට මේ වෙළෙඳ භාණ්ඩ බද්ද අයින් කරන්න ඉස්සෙල්ලා ගොවීන් සන්නද්ධ කරනතුරු මේ ආකාරයෙන්ම ඉදිරි වසර දෙකක් වාගේ කාලයක් තුළ එය දිගටම පවත්වාගෙන යාම සුදුසුයි කියලා. ඒ තුළින් ගොවියා ශක්තිමත් කරන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා. අපි විපක්ෂයට යෝජනා කරනවා, පටු අරමුණු වෙනුවෙන්, ගොවීන් ආරක්ෂා කිරීමට අපි ගන්න මෙවැනි උත්සාහයන්ට බාධා කරන්නේ නැතුව ඒවායේ දීර්ඝ කාලීන ප්‍රතිඵල දිහා බලලා මේ සම්බන්ධව සාධාරණ මැදිහත්වීමක් කරන්න, මේකට සහයෝගය ලබා දෙන්න කියලා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. (Dr.) Harsha de Silva. You have 11 minutes.

[අ.භා. 12.20]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලින් කථා කළ ගරු මහාචාර්යතුමා කිව්වා, ගොවීන් ආරක්ෂා කරන්න මේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පනවා තිබෙනවා කියලා. එතුමාගේ විෂය දැනුම පිළිබඳව අපට කිසිම ගැටලුවක් නැහැ. නමුත් මෙතැනදී මම පැහැදිලි කරන්න ඕනෑ, එහෙම නම් අස්වැන්න නෙළන කාලයට තමයි මේ බද්ද පනවන්න ඕනෑ කියන එක. එහෙම තමයි ඉස්සර කළේ. දැන් ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් මොකක්ද කරන්නේ? අස්වැන්න නෙළන කාලයටත්, අස්වැන්න නෙළන්නේ නැති කාලයටත් කියන හැමදාටම මේ බද්ද පනවනවා. එතකොට හැමදාටම මේ බද්ද තිබෙනවා. මහාචාර්යතුමා එතකොට ඔබතුමා මට කියන්න, ඒකෙන් කොහොමද ගොවියෝ ආරක්ෂා වෙන්නේ කියලා? ඒකෙන් වෙන්නේ, මිල මට්ටම ඉහළ යන එක විතරයි. ඔබතුමා කියනවා, මේක පාරිභෝගිකයාට අසාධාරණයක් වාගේ පෙනුණත් එහෙම නැහැයි කියලා. ඉතින් පාරිභෝගිකයාටනේ අසාධාරණය වෙන්නේ, ගරු මහාචාර්යතුමා. මොකද මේකෙන් වෙන්නේ, අර මම කිව්වා වාගේ මිල මට්ටම ඉහළ යන එක තමයි වෙන්නේ. මේක මේ අල ලූනුවලට විතරක් පනවපු බද්දක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද ඉදිරිපත් කර තිබෙන මේ ගැසට් නිවේදනයෙන් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 62කට මේ බද්ද පැනවෙනවා. උදාහරණයක් හැටියට කිව්වොත්, හාල්මැස්සන් කිලෝවකට රුපියල් 100ක බද්දක් පැනවෙනවා. ඊළඟට, අල කිලෝවකට රුපියල් 80ක්; ලූනු කිලෝවකට රුපියල් 50ක්; මුං ඇට කිලෝවකට රුපියල් 300ක්; මිරිස් කිලෝවකට රුපියල් 100ක්; කහ කිලෝවකට රුපියල් 360ක්; කුරක්කන් කිලෝවකට රුපියල් 150ක්; Soybeans කිලෝවකට රුපියල් 275ක්; සාඩින් කිලෝවකට රුපියල් 200ක්; සීනි කිලෝවකට රුපියල් 50ක් පැනවෙනවා. ඒ ඔක්කෝම තිබෙනවා. ඔබතුමන්ලාගේ මේ දෙබිඩි පිළිවෙත ගැන නේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් කිව්වේ. විපක්ෂයේ ඉන්නකොට කෑ කෝ ගහගෙන, ගොවියන්ට අමුඩය අන්දාගෙන, කොළඹට ගෙනැල්ලා උද්ඝෝෂණ කළා. දැන් ගොවියාට මොනවා වුණත් ප්‍රශ්නයක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද "ලංකාදීප" පුවත් පතේ කාටූන් එකක් තිබෙනවා, ඩඩ්ලි මුදලාලියි, නිව් රත්න සහල් මුදලාලියි හෙලිකොප්ටර් එකකුයි, Rolls-Royce එකකුයි නවත්වාගෙන ඉන්නවා; අපේ ගොවි මහත්තයා බයිසිකලයක් ගන්න සිහිනයක් දකින. ඒක තමයි ඔබතුමන්ලා කළේ; ඒක තමයි කළේ. දැන් කෝ, අමුඩ අන්දාගෙන ගොවි මහත්තුරු මෙහේ ගෙනෙන්නේ නැහැ නේ? අර කිව්වා හරි. සමාජවාදය ගැන, සාමාන්‍ය මිනිහාගේ ප්‍රශ්න පිළිබඳව කථා කරපු අය දැන් නැහැ. ඒගොල්ලන් විදේශ සවාරි ගිහිල්ලා.

බලන්න, මේ මගේ අතේ තිබෙන්නේ, ඔබතුමන්ලාගේ පොහොසත් රටක්ද මොකක්ද, ඒ කියපු කථාව. මේකේ 103වැනි පිටුවේ මොකක්ද කියා තිබෙන්නේ, රාජ්‍ය මූල්‍ය පිළිබඳව කථා කරනකොට? තවත් නොයෙකුත් දේවල් කියා තිබෙනවා. රුපියල් ලක්ෂ 12 ඉඳලා ලක්ෂ 24 වෙනකල් වාර්ෂික බදු නිදහස් සීමාව ගෙනියනවා ආදී වශයෙන් මෙහි තිබෙනවා. ඒ වාගේ පට්ටපල් බොරු මෙහි කියා තිබෙනවා. ඊළඟට කියා තිබෙනවා, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගැන. පාසල් පොත් ගැනත් තිබෙනවා. ඒවා ගැන මම කියන්නේ නැහැ. VAT එක බින්දුවට ගෙනෙනවා ලු. අත්‍යවශ්‍ය ආහාරවලට අදාළව VAT එක බින්දුවට ගෙනෙනවාය කියලා පොරොන්දු වෙච්ච අය අද මොකක්ද මේ කරන්නේ? ලජ්ජා නැද්ද? රෙදි ඇඳගෙනද, මේවා කිව්වේ? ඔබතුමන්ලාගේ ideology එක ගැන මම දන්නේ නැහැ. මොකක්ද ඔබතුමන්ලා විශ්වාස කරන්නේ කියලා මම දන්නේ නැහැ. ඔබතුමන්ලා ජනතාවට කිව්වේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවලට VAT එක බින්දුව කරනවා කියලායි. දැන් මෙන්න පනවාගෙන යනවා, බදු.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නැවතත් කියනවා, මට කලින් කථා කළ මහාචාර්යතුමා පිළිබඳව අපට ලොකු ගෞරවයක් තිබෙන බව. එතුමා තාක්ෂණික කරුණු සම්බන්ධව කථා කළේ. එතුමා කිව්වා, දේශීය ගොවියා ආරක්ෂා කරන්න ඵලදායීතාව වැඩි කරන්න ඕනෑ කියලා. ඒවා හරි. අපි ඒවා පිළිගන්නවා. ඒවා කරන්න ඕනෑ. තාක්ෂණය ගෙනෙන්න ඕනෑ. වඳුරු ප්‍රශ්නය පිළිබඳවත් මම කැන්ටිමේදී පෞද්ගලිකව එතුමා එක්ක සෑහෙන සාකච්ඡා කරලා තිබෙනවා. ඒ ප්‍රශ්නය ගොවියන්ට තිබෙනවා. ඒවා විසඳන්න ඕනෑ. සංගණනයක් කළාය කියලා වඳුරෝ නැති වුණේ නැහැ නේ. රිළවු ටික ඉන්නවා. රිළවු ටික තවමත් ගොවීන්ගේ අස්වැන්න විනාශ කරනවා. සංගණනයක් කළාට වෙච්ච දෙයක් නැහැ. ඊට පස්සේ එතුමා කිව්වා, තාක්ෂණය ගෙනෙන්න ඕනෑ, ශීත ගබඩා ඇති කරන්න ඕනෑ කියලා. දැන් බලන්න, "ප්‍රභාෂ්වර" කෘෂි ගබඩා සංකීර්ණය පිළිබඳව. එය අපි පටන් ගත්තේ 2019දී. කෘෂිකර්ම ඇමති හැටියට හිටියා, අනුර කුමාර දිසානායක මැතිතුමා. එතුමාවත් ඒක පටන් ගත්තේ නැහැ නේ. හැබැයි, 2020දී ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා මේවා නැවැත්වුවා. 2025දී මෝදි අගමැතිතුමා අපේ රටට ආපු වෙලාවේ ගිහිල්ලා ඒක විවෘත කළා. ඔබතුමා අද, නැත්නම් හෙට හෝ සෙනසුරාදා-ඉරිදා ගිහින් බලන්න, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. ඒක විවෘත කර නැහැ. "ප්‍රභාෂ්වර" කෘෂි ගබඩා සංකීර්ණය තමයි, තෙතමනය සහ උෂ්ණත්වය පාලනය කරපු සාමාන්‍ය ගොවි මහත්තයාට පාවිච්චි කරන්න පුළුවන් ආකාරයට ලංකාවේ තිබෙන ප්‍රථම සහ එකම ගබඩා සංකීර්ණය. ඒකට අල, ලූනු මෙට්‍රික් ටොන් 5,000ක් දමන්න පුළුවන්. හැබැයි, ඒක විවෘත කරන්නේ නැහැ. නමුත් ඒක වටේටම මොකක්ද වෙලා තිබෙන්නේ කියලා බලන්න. අද වනකොට පාකිස්තානයෙන්, චීනයෙන් ගෙනෙන අල ටික, ලූනු ටික දමන පොඩි ශීතාගාර ඒක වටේටම ගසා තිබෙනවා. ඊයේ පෙරේදා රජයේ ඉඩම්වලින් එක්කෙනෙකුට, දෙදෙනෙකුට -යහළු මිත්‍රයන්ට- ඔන්න වැටවල් ගහලා දීලා තිබෙනවා, තමන්ගේ පෞද්ගලික ගබඩා හදා ගන්න කියලා. නමුත්, අසරණ ගොවි මහත්තයාට ඒ ගබඩාව නැහැ. ඔයගොල්ලන් ගොවි මහත්තයා ගැන හිතනවා නම් ඒ අය වෙනුවෙනුත් කටයුතු කරන්න. ටයි, කෝට් දමාගෙන හිටියාට මමත් modern ගොවියෙක් කියන එක සමහරු දන්නවා. අපි තාක්ෂණය පාවිච්චි කරනවා තමයි. හැබැයි, ඒකට අවශ්‍ය දේවල් කරන්න ඕනෑ. ඔතැන ඉඳගෙන කයිවාරු ගැහුවාට විතරක් වැඩක් නැහැ, මහාචාර්යතුමා. ඔබට influence එකක් තිබෙනවා නම්, කෘෂිකර්ම ඇමතිට, වෙළෙඳ ඇමතිට මේක කරන්න කියලා කියන්න.

ඊළඟට, මේ බදු ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ඔවුන් කියනවා, මේ para-tariff අයින් කරනවා ලු. 2030දී මේවා අයින් වන නිසා තව අවුරුදු ගණනක් මේක තියාගෙන ඉන්න ඕනෑ ලු. මේගොල්ලන් බදු ප්‍රතිපත්තිය වෙනස් කර තිබෙන්නේ agricultureවලට විතරක් නොවෙයි, මේ හැම දෙයටම අදාළව බදු ප්‍රතිපත්තිය වෙනස් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Budget Debate එක පැවති කාලයේ මම කළ කථාවකදී මේ කාරණා පෙන්වා දුන්නා. සාමාන්‍යයෙන් තරුණයන්ට රැකියාවක් කරන්න පටන් ගත්තාම ඇති වන ලොකුම ආශාව තමයි loan එකක් අරගෙන පොඩි ගෙයක් හදා ගන්න එක. එක කාමරයකින් හෝ එහි වැඩ පටන් ගන්නා එක ඔවුන්ගේ සිහිනයක්. ගොඩක් කට්ටියට ජීවත් වෙන්න තැනක් තිබෙනවා. හැබැයි, ඒ ජීවත් වෙන්නේ දෙමව්පියන්ගේ ගෙවල්වල. නමුත්, ඔවුන් සමඟ කථා කළාම කියන්නේ, "අපි කැමැතියි, අපේ තැනක් හදා ගන්න" කියලා. එදා මම මේ කාරණා පෙන්වා දුන්නා. සිමෙන්තිවලට තිබෙන බද්ද සියයට 49යි. මේ තිබෙන්නේ effective tariffs. ඒ කියන්නේ, consolidate කරපු tariff එක; රජය විසින් පනවන බද්ද. ඒක නොයෙකුත් දේවල්වලට නම් කර තිබෙනවා. ඇස්බැස්ටස්වලට සියයට 93යි; wall tilesවලට සියයට 61 ඉඳලා සියයට 105 දක්වා; ceramic bathroom fittingsවලට සියයට 60යි; plastic bathroom fittingsවලට සියයට 81 ඉඳලා සියයට 105 දක්වා; ribbed steel bars for concrete සඳහා සියයට 60යි; plain steel barsවලට සියයට 40යි; PVC pipesවලට සියයට 92යි; insulated electric wiresවලට සියයට 53යි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ පෙරේදා survey එකක් කර තිබුණා, ලෝකයේ ජීවත් වෙන්න අමාරුම නගර තිබෙන රටවල් සහ තමන්ට නිවසක් හදා ගන්න බැරිම රටවල් මොනවාද කියලා. සාමාන්‍යයෙන් තරුණයින්ගේ සිහින ඉක්මනින්ම බොඳ වන රට මොකක්ද? ලංකාව තමයි ගෙයක් හදා ගන්න අපහසුම රට. එච්චරට අපේ රටේ මුදල් වියදම් වෙනවා, ගෙයක් හදා ගන්න. තමන්ට හම්බ වන පඩියෙන් අවුරුදු ගණනාවක් ඉතුරු කළත් ගෙයක් හදා ගන්න බැහැ. ඒකට මූලික හේතුවක් තමයි, අපේ රටේ තිබෙන බදු.

ඔයගොල්ලන්ගේ පොරොන්දුව මොකක්ද? අගමැතිතුමිය හැම දාම කියනවා, ජනතාව සමඟ සම්මුතියකට ආවා කියලා. එසේ සම්මුතියකට ආවේ මේවා බින්දුව කරනවා කියලා. කෘෂි උපකරණවලට අදාළ බදු බින්දුව කරනවා කිව්වා. කෘෂි උපකරණවලින් අය කරන බද්ද බින්දුව කරනවා නම්, ගොවි මහත්තයා නඟාසිටුවන්න ඕනෑය කියලා ඔබතුමන්ලා කියනවා නම්, ඇයි දෙවියනේ! කෘෂි උපකරණවලට VAT ගහන්නේ? ඇයි, ඒවාට duty ගහන්නේ? මේකේ පරස්පරය කොහේද තිබෙන්නේ? Ideology එක මොකක්ද? ක්‍රියාත්මක කරන්නේ මොකක්ද?

අනෙක් කාරණය මේකයි. මේ දවස්වල IMF එකේ නිලධාරින් ඇවිල්ලා ජනාධිපතිතුමාව හමු වෙනවා. මගේ අම්මේ! මම දැක්කා, අනිල් ජයන්ත මැතිතුමා IMF එකේ ක්‍රිස්ටලිනා ජෝර්ජීවා පිළිගත් ආකාරය. එතුමිය පිළිගත්තේ අත් දෙකෙන්ම, a warm welcome! මොකක්ද, එතුමා මැතිවරණයට කලින් කිව්වේ? IMF එකෙන් ගොඩ ගිය එක රටක් නැහැ කිව්වා; ආපු ගමන් DSA එක වෙනස් කරනවා කිව්වා. එහෙම තමයි කිව්වේ. හැබැයි, දැන් එතුමියගේ අත් දෙක අල්ලා ගෙන ඉන්නේ, a warm embrace. ඉඳලා හිටලා තමයි අපි ඒ වාගේ පින්තූරයක් දකින්නේ. දැන් ඒ කට්ටිය කියන්නේ මොකක්ද? Governance diagnostics බලන්න කියනවා. යහ පාලනය සම්බන්ධයෙන් ඔයගොල්ලන් පොරොන්දු වුණු ඒවා ඉෂ්ට කර තිබෙනවාද කියලා අහනවා.

හොරකම, වංචාව, දූෂණය පිළිබඳව කථා කරනකොට, overall කථා කරන්න පුළුවන්, අරයා හොරා, මෙයා හොරා කියලා. එහෙම නොවෙයි. එක specific issue එකක් ගන්න පුළුවන් නේ. බලන්න, මේ coal procurement එක ගැන. ඒ තුළ ගැටලු ගොඩක් තිබෙනවා. මම ඒ ගැන අද කථා කරන්නේ නැහැ, සිකුරාදාට ඒ සම්බන්ධයෙන් debate එකක් තිබෙන නිසා.

නමුත්, මම එක කාරණයක් ගැන කථා කරන්නම්. ඒ තමයි, IVS-VFS එකේ e-visa වංචාව. බලන්න, මා ළඟ මේ තිබෙන්නේ අපේ කමිටුවෙන් ඉදිරිපත් කළ වාර්තාව. එම වාර්තාවේ පිටු හයසිය ගණනක් තිබෙනවා. මේ වාර්තාව ඉදිරිපත් කරන්න ගිහිල්ලා අපේ ජීවිතයටත් තර්ජනයක් ආවා. මේක තමයි, ඒකට ප්‍රකාරව විගණකාධිපතිතුමා දීපු වාර්තාව. ඒ වාර්තාවේත් පිටු 1,000ක් විතර තිබෙනවා. ඒකේ තව ෂෝක් කථාවකුත් තිබෙනවා. දැන්, විගණකාධිපතිතුමා දීපු මේ වාර්තාව අත්සන් කරලා තිබෙන්නේ කවුද? ගම්මන්පිල ධර්මපාල මහතා. එතුමාම තමයි දීර්ඝ කළේ නැත්තේ. මේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ මතය මොකක්ද? කිසි කෙනෙක් මේ සම්බන්ධයෙන් කථා කරනවාද? "නඩුවක් තිබෙනවා, එම නිසා මේ ගැන කථා කරන්න බැහැ" කියනවා. ඒ, එවකට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ හිටපු

මන්ත්‍රීවරු තුන්දෙනෙක් වූ ගරු රවුෆ් හකීම් මහතා, ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා හා ගරු පාඨලී චම්පික රණවක මහතා දාපු නඩුවක්. ඒක ආණ්ඩුවෙන් දාපු නඩුවක් නොවෙයි. ඉතින්, මොකද වෙන්නේ? මේකේ කෙළින්ම තිබෙනවා, රුපියල් කෝටි කීයක් වංචා වුණාද කියලා. එහෙම නම් මේක selective justice වෙන්න බැහැ. සමන් ඒකනායකව රක්ෂිත බන්ධනාගාරගත කර තිබෙනවා, නිලධාරියෙක් හැටියට රුපියල් මිලියන 16.6ක් වෙනුවෙන් අත්සන් කළා කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, your time is up.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Okay, Sir.

දැන් ඔහු රක්ෂිත බන්ධනාගාරගත කර තිබෙනවා. හැබැයි, කෝටි ප්‍රකෝටි ගණන් වංචා කළ අය ඉන්නවා. එතැනදී නීතිය clear නැහැ; නීතිය clearම නැහැ. Black and white නැහැ, සමන් ඒකනායකගේ ප්‍රශ්නයේදී. ඒ ගැන මෙතැන කථා කරන්න අවශ්‍ය නැති නිසා මම වැඩිදුර ඒ ගැන කථා කරන්නේ නැහැ. නමුත්, you cannot be selective in justice. ජනාධිපතිතුමා කියනවා නම් හැමෝම නීතියේ රේඛාවට යටයි කියලා, එහෙම නම් හැමෝම නීතියේ රේඛාවට යට වෙන්න ඕනෑ. කට්ටියක් විතරක් නීතියේ රේඛාවට යට වෙලා ඉන්න බැහැ. අද IMF එකෙන් කියලා තිබෙන්නේ මොකක්ද? එහෙම නම් ඔබතුමන්ලා පොරොන්දු වුණු governance diagnostics ටික කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රසම්පාදන නීතිය පිළිබඳවත් මම කියන්නම්. ඇයි, මේ ආණ්ඩුව ප්‍රසම්පාදන නීතිය ගෙනෙන්නේ නැත්තේ? බලයට ඇවිල්ලා අවුරුදු එකහමාරක් වනවා. මහ ලොකුවට කියනවා, ප්‍රසම්පාදනයෙන් තමයි වංචාව හා හොරකම සිදු වෙන්නේ කියලා. භාර අරගෙන තිබෙනවා, ප්‍රසම්පාදන නීතිය ගෙනෙන බවට. හැබැයි, ආණ්ඩුව ඒ ගැන silent; ඒ ගැන කථා කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාල වේලාව පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන නිසා මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා. අපේ මහාචාර්යතුමා කියපු කථාව ගැන අපට ගැටලුවක් නැහැ, තාක්ෂණික පැත්තෙන්. නමුත්, එතුමන්ලා ගොවි ජනතාවට දුන් පොරොන්දුවලට උත්තර මුදල් අමාත්‍යාංශය පැත්තෙන් නම් එන්නේ නැහැ. එහෙම නම් මහාචාර්යතුමා, මුදල් ඇමතිතුමාත් එක්ක කථා කරලා මේ ප්‍රශ්නය internally බේරා ගන්න. නැත්නම් ඔබතුමන්ලා ඇතුළු ආණ්ඩුවටත්, ගොවි ජනතාවටත් ඔක්කෝටම ලැබෙන්නේ බින්දුව තමයි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டுந் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne. You have 11 minutes.

[අ.භා. 1.00]

**ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ මාතෘකාවට එන්න කලින් මම කැමැතියි, මෙන්න මේ කාරණයට ප්‍රතිචාර දක්වා ඉන්න. අද උදේ මේ පාර්ලිමේන්තුවේ ලොකු කලබලයක් ඇති වුණා කාන්තා කොමිසම ගැන. කාන්තා කොමිසම සම්බන්ධයෙන් වන ක්‍රියා පටිපාටිය ගැනත්, එහි තාක්ෂණික සහ කාර්ය පටිපාටික ප්‍රමාදයන් කිහිපයක් සිදුව ඇති බවත්, ඒවා නිවැරදි කරමින් යන බවත් ගරු ඇමතිතුමිය පැහැදිලිව පුන පුනා ප්‍රකාශ කර තිබියදී නිකම් ලොකු චිත්‍රයක් හදන්න හැදුවා, මේ කාන්තා කොමිසම අපි යටපත් කරන්න යනවාද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තාවන් පිළිබඳ සැබෑ හඬක් නඟන කාන්තා ව්‍යාපාරයක් බිමේ හැදුවේ අපියි. ඒ ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් ලෙස, කිසිදු දේශපාලන පදනමකින් - තාත්තාගෙන්, මහත්තයාගෙන්- දේශපාලනයට ආවේ නැති, සැබෑ ලෙස බිමේ දේශපාලනය කරපු දේශපාලන සවිඥානකත්වය සහිත ආන්තික කණ්ඩායම් නියෝජනය කරන විසිදෙනෙකු පළමු වරට පාර්ලිමේන්තුවට ගෙනාවේ අපියි. මේ චෝදනා එල්ල කරන විපක්ෂ නායකතුමාට පවුලෙන් එළියේ දේශපාලනය කරන කාන්තාවන් සිටින කාන්තා ව්‍යාපාරයක්වත් හඳාගන්න බැරි වුණා. ඒ වාගේම මට මතකයි, මැතිවරණය වෙලාවේ ඇත්තටම බිමේ දේශපාලනය කරපු සජබයේ කාන්තාවන් සිටියා, අපට හමු වුණා. ඒගොල්ලන්ට නාම යෝජනාවත් දුන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අර පවුල් දේශපාලනයෙන් එළියේ දේශපාලනයක් ගැන ගරු විපක්ෂ නායකතුමාට හිතන්න බැහැ. එහෙම කාන්තාවන්ගෙන් සමහර අයව සනසන්න ඔවුන් පත් නොවන බව දැන දැනම ජාතික ලැයිස්තුවට දැමුවා. ඒ නිසා ගරු විපක්ෂ නායකතුමනි, තමන්ගේ පක්ෂය ඇතුළේ හරියට කාන්තා ව්‍යාපාරයක් හදාගෙන එන්න, එදාට අපි කාන්තා අයිතිවාසිකම් ගැන විවාද කරමු. නැවතත් මම කියනවා, එහි කාර්ය පටිපාටික ප්‍රමාදයන් කිහිපයක් සිදු වුණු බව. එහෙම තමයි රජයේ වැඩ කරනකොට. ඒවා නිවැරදි කර තිබෙනවා. ඒ නිසා කාන්තා කොමිසම ගැන ආපසු බොරු විවාද ඇදගන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේ පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර තිබෙනවා ගැසට් නිවේදන 4ක් යටතේ ගෙනෙන නියම, නියෝග සහ යෝජනා සම්මතයක්. ඒ සියල්ලම එක් විධියකින් අපේ ආර්ථිකයට සම්බන්ධයි; ඒ වාගේම අපේ අන්තර්ජාතික සම්බන්ධතා සහ අපේ සංචාරක ව්‍යාපාරයට සම්බන්ධයි. අර, විපක්ෂයේ කැඩුණු records තිබෙනවා නේ. ඒ record එකක් - ඒවාට කියන්නේ පරණ records, තැටි කියලා - කැඩුණාම හැම දාම එකම ඇහෙනවා. අපි ආර්ථිකයේ පෙට්ටි කඩයක්වත් කරලා නැහැ, අපි ආවාට පස්සේ ජාත්‍යන්තර සම්බන්ධතා සියල්ල නැති වෙනවා කියපු පරණ record එකට උත්තරයක් විධියට මම මේ කාරණය උපුටා දක්වන්න කැමැතියි. ඊයේ දිනයේ ලංකාවට පැමිණියා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගරු අධ්‍යක්ෂ ජනරාල්වරිය වන ක්‍රිස්ටලිනා ජෝර්ජීවා මහත්මිය. එතුමිය මාධ්‍යයකට සම්මුඛ සාකච්ඡාවක් - interview එකක් - දෙමින් කරපු ප්‍රකාශයක් උපුටා දක්වන්න මම කැමැතියි.

[ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය]

"I had a chance to meet with the community affected by "Ditwah" and see that people remain strong,..."

"I also am very impressed by how the Government stepped forward, quickly and decisively. We, at the IMF, were able to provide emergency financing of over US Dollars 200 million, which came in very timely. So, these communities are not to bear alone the pain of what has happened to them."

"Indeed, Sri Lanka has had quite a challenge in the last decade."

"Now, we have a tremendous opportunity for the country. I think for the first time, there is a Government that is trusted by the people and is doing their part to gain that trust. I want to say from our experience, one, in a short time Sri Lanka regained macroeconomic and financial stability. Inflation was 70%, now is down to 2%. Growth was negative, now we have about 5% growth."

"I also saw in the President and in the members of the Government, genuine interest in the well-being of people. And I know that success comes when the country is united. This Government is working so hard to achieve that."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහෙම කියන්නේ අපි නොවෙයි, ක්‍රිස්ටලිනා ජෝර්ජීවා මහත්මිය. ඒ නිසා මම කැමැතියි කියන්න, මේ සතිය ඇත්තටම අපේ අන්තර්ජාතික සම්බන්ධතා පිළිබඳ සතියක් බව. මම හිතන විධියට මේ සතිය විතරක් නොවෙයි, පසුගිය දෙසතියේම විශේෂයෙන් කැපී පෙනෙන අන්තර්ජාතික සම්බන්ධතා රාශියක් රජය විසින් පවත්වාගෙන ගියා. රජය විසින් ඔප්පු කර පෙන්නුවා, රටක් ලෙස, ජාතියක් ලෙස, ආණ්ඩුවක් ලෙස අපි නිවැරදි දිශාවේ, නිවැරදි තැන හිටගෙන ඉන්නවා කියලා. ඒක පටන් ගත්තේම ජනාධිපතිතුමාගේ ආරාධනාවක් අනුව මෙරටට පැමිණි පාකිස්තානය හා ඉන්දියාව අතර පැවැත්වුණු ක්‍රිකට් තරගයට මුහුණ දීමෙන් තමයි.

අපට මියන්මාරයෙන් පෙබරවාරි 09වැනි දින සහල් මෙට්‍රික්ටොන් 500ක් ලැබුණා, on goodwill; it was purely on goodwill. යුරෝපා සංගමය සහ ශ්‍රී ලංකාව අතර Joint Commission Meeting එක පෙබරවාරි 12, 13 දිනවල තිබුණා. එහිදී GSP Plus, සමුද්‍රීය ආරක්ෂණය ඇතුළුව සමාජ ආර්ථික සම්බන්ධතා, දේශපාලන සම්බන්ධතා පිළිබඳ සාකච්ඡා, සංවාද රාශියක් පැවැත්වුණා. ජපානය සමඟ අපි ආර්ථික සහයෝගිතා ගිවිසුමක් අත්සන් කළා. විශේෂයෙන්ම ජපාන ආයෝජන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අපි කටයුතු කරනවා. *[බාධා කිරීමක්]* Please, do not disturb me. *[බාධා කිරීමක්]* ඔබතුමාට එහෙම නිවේදනයක් ආවාද?

ඊයේ එක්සත් රාජධානියේ නියෝජ්‍ය අගමැතිතුමා වන ඩේවිඩ් ලැමී මහත්මයා ලංකාවට ආවා. ඒ වාගේම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරියත් අපේ රටට ආවා. ජාතික ආරක්ෂාව අනතුරේ, අනතුරේ කියලා කැඩුණු record එක play කරන අයට තමයි මේ කියන්නේ. ඒ වාගේම, මේ මොහොත වන විට ගරු ජනාධිපතිතුමා ඉන්දියාවේ පැවැත්වෙන කෘත්‍රිම බුද්ධිය පිළිබඳ රාජ්‍ය තාන්ත්‍රික සමුළුවකට සහභාගි වෙනවා. ඒක විශේෂයෙන්ම අපේ ඩිජිටල් ආර්ථිකයට සම්බන්ධ වැදගත් මොහොතක්. පෙට්ටි කඩයක්වත් කරගන්න බැහැයි කියපු අපේ ආණ්ඩුව අවුරුද්දකට පසුව විශේෂයෙන්ම ආර්ථික වර්ධන වේගයක් අත්පත් කරගෙන තිබෙනවා. ගිය අවුරුද්දේ පළමු කාර්තුවේ සියයට 4.8ක්, දෙවන කාර්තුවේ සියයට 4.9ක් සහ තුන්වැනි කාර්තුවේ සියයට 5.4ක් ලෙස කැපී පෙනෙන ආර්ථික වර්ධනයක් අපි අත්පත් කරගෙන තිබෙනවා. අපේ මධ්‍ය කාලීන ආර්ථික වර්ධන වේගයේ ඉලක්කය සියයට 7ක්. එය නොවෙනස්ව තිබෙනවා. ඒ වාගේම, උද්ධමනය අපි සියයට 5ක ප්‍රමාණයක පවත්වාගෙන යන්න උත්සාහ කරනවා. දැනට - 2026 ජනවාරි වෙද්දී - එය සියයට 2.3ක් වෙනවා. මේ පිළිබඳව මහ බැංකු අධිපතිතුමා පසුගිය දවස්වල ප්‍රකාශ කර තිබුණා. "දිට්වා" සුළි කුණාටුව නිසා හරි නම් අපේ රටේ උද්ධමනය ඉහළ යන්න තිබුණා. මොකද, විශේෂයෙන්ම මාර්ග සහ ප්‍රවාහන පහසුකම් දැඩි ලෙස බාධාවකට ලක් වූ නිසා. නමුත්, රජය මැදිහත් වෙලා ඉතා ඉක්මනින් ඒ ප්‍රවාහන සේවාවන් විධිමත් කළා; පාරවල් ටික හැදුවා. තාවකාලික පාලම් අපි විදේශ ආධාරත් ඇතුළුව සාදා දුන්නා. අපේ සභානායකතුමාත් අද උදේ ඒ ගැන කිව්වා; ප්‍රවාහනය විධිමත් කළ නිසා උද්ධමනය ඉහළ යාම වැළකුණා කියලා එතුමා කිව්වා.

විපක්ෂයෙන් අපට යෝජනා කළා, "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව අපේ Budget එක adjust කරන්න, වෙනස් කරන්න, ඒ වෙනුවට අලුත් Budget එකක් ගේන්න කියලා. අපි නොසැලී කිව්වා, "නැහැ, අපේ ආර්ථික වේගය අඩාළ කරන්නෙත් නැහැ; මේ ගමන යන එක පැහැදිලියි. ඒ නිසා අපට අවශ්‍ය වෙන්නේ නැහැ අය වැය සංශෝධනය කරන්න" කියලා. ඒ නිසා පොලී අනුපාත මේ වන විට සියයට 7.75ක ස්ථාවර අගයක පවත්වාගෙන යනවා. විශේෂයෙන්ම කියන්න ඕනෑ, වාහන ආනයනය වෙනුවෙන් ඩොලර් බිලියන 1.8ක් වියදම් වුණත්, 2025 දෙසැම්බර් වන විට නිල සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 6.8ක පවත්වා ගන්න අපි සමත් වෙලා තිබෙන බව.

ඒ වාගේම බොහෝ අය අහනවා, අපි ණය ගෙවනවාද, ණය ගෙවනවාද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි 2025 වර්ෂයේත් ඩොලර් බිලියන 3.9ක ණය ගෙවා තිබෙනවා. ජාතික ආරක්ෂාවට තර්ජනයක් යැයි කියමින් හුඹස් බිය හදන විපක්ෂයට අපි මේ කාරණයත් කියන්න ඕනෑ. දැන් ලංකාවට සංචාරකයෝ එනවා. සංචාරක ව්‍යාපාරය පැත්තෙන් ගත්තොත්, 2025 වර්ෂයේදී තමයි අපේ රටට වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙන්නේ. එය 2024 වර්ෂයට සාපේක්ෂව සංචාරක ව්‍යාපාරයේ සියයට 15.1ක වර්ධනයක්. ඉන්දියාව, එක්සත් රාජධානිය සහ රුසියාව කියන රටවලින් තමයි අපේ රටට වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙන්නේ. මෙන්න මේ විධියට ක්ෂේත්‍ර 4ක්; විශේෂයෙන් සංචාරක ක්ෂේත්‍රය, ප්‍රේෂණ ප්‍රමාණය ඒ කියන්නේ සෘජු විදේශ ප්‍රේෂණ; අපේ migrant workersලාගෙන් ලැබෙන ප්‍රමාණය වාගේම සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය - FDIs - වර්ධනය වෙමින් තිබෙනවා.

අද අපේ අපනයන ආදායම ඉහළ යමින් පවතිනවා. ඒ වාගේම මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, අපේ ජංගම ගිණුමේ ඩොලර් බිලියන 1.7ක වාර්තාගත අතිරික්තයක් පවත්වාගෙන යන බව. කවුරුන් හෝ මේ ආර්ථික දත්ත ටික හොඳින් කියවා බැලුවොත්, මේ ආර්ථික දත්ත සම්බන්ධයෙන් කියන්න විවේචන නැහැ. මොකද, අපි positive progress එකක් අරගෙන තිබෙනවා. අපි ඉදිරියට යනවා. දැන් ටිකකට කලින් හරිම සතුටින් හිනා වෙවී කෑ ගහමින් කිව්වා, GSP Plus නැහැ කියලා. ඔය විපක්ෂයම තමයි ඇමෙරිකාව tariffs දාපු වෙලාවේ ගොඩක් සතුටු වුණේ, දැන් ලංකාවට වැඩේ වැරදිලා, අපේ ආණ්ඩුව වැටිලා කියලා. විපක්ෂය එදාත් ගොඩක් සතුටු වුණා, ලංකාවෙන් ඇමෙරිකාවට අපනයනය කරන භාණ්ඩ ටික නතර වෙලා ආර්ථිකය කඩා වැටෙයි කියලා. එතකොටත් තිබුණේ ඔය mood එකම තමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි; same mood. ඇමෙරිකාවෙන් දාපු tariffs ගැන හරි නම් අපි රටක් හැටියට කනගාටුවට පත් වෙන්න ඕනෑ, ඒ අභියෝගයට මුහුණ දෙන්නේ කොහොමද කියලා විසඳුම් සොයන්න ඕනෑ. එහෙම කරන්නේ නැතුව විපක්ෂය එදා ගොඩක් සතුටු වුණා. නමුත් negotiations හරහා අපේ රජය සමත් වුණා එය හොඳ මට්ටමකට අඩු කර ගන්න. මා හිතන විධියට, එය සියයට 24කින් විතර අඩු කර ගත්තා. මම විපක්ෂයට කියන්නේ මේකයි. ඔබතුමන්ලා දැන්

සතුටු වෙන්නත් එපා, ආර්ථිකය වැටෙනවා වැටෙනවා කියලා බලාගෙන ඉන්නත් එපා. මා කියන්නේ ඔබතුමන්ලා මොනවා හරි අලුත් සටන් පාඨ ටිකක් සොයා ගන්න, සංවිධානය වෙන්න, තමන්ගේ ව්‍යාපාරය ඇතුළේ දේශපාලනිකව හොඳ තර්ක ටිකක් ගේන්න කියලායි. හැම දාම කියන පරණ තැටිය play කරන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ මේ කෙටි අදහස් දැක්වීම මා අවසන් කරන්නේ, අපේ ගමන ස්ථිරයි, අවුරුද්දකට පස්සේ පැහැදිලි සංඛ්‍යා දත්ත ඇතුව අප ස්ථාවර ආර්ථිකයකට යන බව ඔප්පු කර තිබෙන බව පවසමින්. මේ වසරේදීත්, ඉදිරියේදීත් මේ රට මෙලෙසම ආර්ථික වර්ධනය කරා ගෙන යනවා. අපි මේ රට වැටිලා තිබුණු අගාධයෙන් ගොඩ ගෙන තිබෙනවා. නමුත්, විපක්ෂය කථා කරන්නේ මැරිලා ඉපදුණා වාගේ නේ; මේ රට මොකුත් ප්‍රශ්නයක් නැතිව හොඳට තිබුණා වාගේ නේ. බංකොලොත් වෙලා ණය ගෙවා ගන්න බැරිව හිහන තත්ත්වයකට වැටිලා තිබුණු රට "මේක ශ්‍රී ලංකාව" කියලා ඔළුව උස්සලා ආඩම්බරයෙන් ලෝකයට පෙන්වන්න පුළුවන් මට්ටමට අපි හදලා තිබෙනවා. ඉදිරියටත් ඒක වැඩි දියුණු කරන බව කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Member, what brings you to your feet?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝගය 92 (2) (ආ) යටතේ මම මේක අහන්නේ.

මම විපක්ෂ නායකතුමාට කථා කරන වීඩියෝ එකක් අද දාලා තිබෙනවා. ආණ්ඩුව පැත්තේ ඉඳන් වීඩියෝ කරලා තිබෙන්නේ. ආණ්ඩුව පැත්තේ ඉඳන් වීඩියෝ කරලායි මේක දාලා තිබෙන්නේ. මේකට legal action එකක් ගන්න ඕනෑ. මම විපක්ෂ නායකට කථා කරන එක ආණ්ඩු පක්ෂයේ ඉඳන් වීඩියෝ කරලා දමන්න පුළුවන්ද? Lady කෙනෙකුට නෙවෙයි මම කථා කළේ, PHI කෙනෙකුටත් නෙවෙයි මම කථා කළේ. මම කථා කළේ විපක්ෂ නායකතුමාට. විපක්ෂ නායකට කථා කරපු එක වීඩියෝ කරලා දාලා තිබෙනවා. මම ඒකට Privilege matter එකක් submit කරන්නම්. අනිවාර්යයෙන් මේක ගැන සොයන්න ඕනෑ. CCTV කැමරාවල ඇති, කවුද ඒක වීඩියෝ කළේ කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You can raise it as a matter of Privilege in the House, Hon. Member.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ආණ්ඩු පක්ෂයෙන් කරලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Listen to me, Hon. Member. I know your concern. You can bring it up as a matter of Privilege.

Next, the Hon. Kathiravelu Shanmugam Kugathasan. You have seven minutes and your time starts now.

[பி.ப. 1.13]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 2025ஆம் ஆண்டின் 2463/04 மற்றும் 2467/52ஆம் இலக்கம் கொண்ட அதிவிசேட வர்த்தமானப் பத்திரிகையில் பிரசுரிக்கப்பட்டதும் (203ஆம் அத்தியாயமான) மோட்டார் வாகனச் சட்டத்தின் சில பிரிவுகளின் கீழான ஒழுங்குவிதிகளை ஒப்புதல் அளிப்பதற்கான விவாதத்தில் எனது கருத்துகளை இந்த அவையிலே எடுத்துரைக்க விழைகின்றேன்.

இலங்கையின் சாலைப் பாதுகாப்புச் சட்டக் கட்டமைப்பானது மோட்டார் வாகனச் சட்டத்தின்கீழ் அத்தியாயம் 203இல் குறிப்பிட்ட இரண்டு ஒழுங்குவிதிகளை நாடாளுமன்ற ஒப்புதலுக்காக முன்வைப்பதன்மூலம் குறிப்பிடத்தக்க மறுசீரமைப்புக்கு உள்ளாகின்றது. மோட்டார் போக்குவரத்து விரைவு நெடுஞ்சாலை ஒழுங்குவிதிகள் மற்றும் மோட்டார் போக்குவரத்து போதைப்பொருள் ஒழுங்குவிதிகள் ஆகிய இந்த விதிமுறைகள், வளர்ந்துவரும் போக்குவரத்து அபாயங்களுக்கு அரசின் விடையாக அமைகின்றன. பல பதிற்றாண்டுகளாக இலங்கையின் சாலைப் பாதுகாப்புக் கட்டமைப்பானது விரிவான நடைமுறைகள் இல்லாத அடிப்படைச் சட்டங்களால் முடக்கப்பட்டிருந்தது. உலக சுகாதார நிறுவனத்தின் அறிக்கையின்படி, 2025ஆம் ஆண்டு இலங்கையில் சாலை விபத்து இறப்புகள் நூறாயிரம் மக்கள் தொகைக்கு 15.2 ஆக இருந்தது. இது ஆசிய - பசுபிக் சராசரியைவிட கூடுதலாக இருப்பதால் சான்றுகள் அடிப்படையிலான தலையீடுகள் கட்டாயமாகின்றன. 2025ஆம் ஆண்டின் திருத்தங்கள் வெறும் கருவிக் கட்டளைகள் மட்டுமல்ல, அவை போதைப்பொருள் பாவனையாளரைக் கண்டறிதல் மற்றும் விரைவு நெடுஞ் சாலைப் பாதுகாப்பில் நீண்டகாலமாக இருந்த நடைமுறை வெற்றிடத்தை நிரப்பும் கருவிகளாகும்.

புதிய ஒழுங்குவிதிகளின் முதன்மை மற்றும் சிறப்புக் கூறுகளாவன: முதலாவது ஒழுங்குவிதியான மோட்டார் போக்குவரத்து விரைவு நெடுஞ்சாலை ஒழுங்குவிதிகள், விரைவு நெடுஞ்சாலை வலையமைப்பைப் பயன்படுத்தும் வாகனங்களுக்கான பாதுகாப்பு இருக்கைப்பட்டி தேவைகளைக் கணிசமாக விரைவுபடுத்துகின்றது. புதிய ஒழுங்குவிதி 8A இன்படி, விரைவு நெடுஞ்சாலையில் வாகனம் இயங்கும்பொழுது ஓட்டுநர் மற்றும் அனைத்து பயணிகளும் பாதுகாப்பு இருக்கைப் பட்டியை அணிந்திருக்க வேண்டும். ஒழுங்குவிதி 8Bஇன்கீழ், அனைத்து பயணிகளுக்கும் தனிப்பட்ட பாதுகாப்பு இருக்கைப்பட்டி பொருத்தப்படாத எந்தவொரு வாகனமும் விரைவு நெடுஞ்சாலையில் நுழையத் தடை விதிக்கப்பட்டுள்ளது. ஒழுங்குவிதி 8Cஇன்படி இதன் பொறுப்பு வாகன உரிமையாளர் மீதும் சுமத்தப்பட்டுள்ளது. ஒழுங்குவிதி 8E(a)இன்படி, ஓட்டுநர் இருக்கையானது மேல்நோக்கிய மற்றும் பக்கவாட்டு பாதுகாப்பு பட்டிகள் மூன்று புள்ளி நங்கூர அமைப்புக் கெண்டதாக இருக்க

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

வேண்டும். ஒழுங்குவிதி 8E(b) இன்படி, முன் மற்றும் பின் இருக்கைகள் இருக்கை வடிவமைப்பைப் பொறுத்து குறைந்தபட்சம் இரண்டு புள்ளி நங்கூர அமைப்புக் கொண்டதாக இருக்க வேண்டும். ஒழுங்குவிதி 8D(1)(b) இன்படி, இரட்டை நோக்க வாகனங்கள் மற்றும் இலகு மோட்டார் வாகனங்களின் அனைத்து பின் மற்றும் நடு இருக்கைகளும் தனிப்பட்ட பாதுகாப்பு இருக்கைப்பட்டி கொண்டதாக இருக்க வேண்டும். ஒழுங்குவிதி 8D(1)(c) இன்படி, பாடசாலை மற்றும் அலுவலக சேவைகளில் ஈடுபடும் போக்குவரத்து வாகனங்களில் அனைத்து இருக்கைகளுக்கும் பாதுகாப்பு இருக்கைப் பட்டி கட்டாயம் ஆகும்.

இரண்டாவது ஒழுங்குவிதியான, மோட்டார் போக்கு வரத்து போதைப்பொருள் ஒழுங்குவிதிகளானவை, போதைப் பொருள் உட்கொண்டு வாகனம் ஓட்டுபவரைக் கண்டறிவதற் கான விரிவான நடைமுறைக் கட்டமைப்பை வழங்குகின்றன. இதன் மையப்பகுதி 'நியாயமான ஐயம்' என்பதாகும். ஓர் ஒட்டுநரின் அசாதாரண நடத்தை, பேச்சு மாற்றம், உடல் சமநிலை இழப்பு அல்லது ஆடைகளின் தோற்றம் ஆகியவற்றின் அடிப்படையில் ஒரு காவற்றுறை அதிகாரி பரிசோதனையைத் தொடங்கலாம். மேலும், அவருக்கு பொலிஸ்மா அதிபரால் ஒப்புதல் அளிக்கப்பட்ட உமிழ்நீர்ப் பரிசோதனைக் கருவியைப் பயன்படுத்தவும் அதிகாரம் வழங்கப்பட்டுள்ளது.

2025ஆம் ஆண்டின் புதிய ஒழுங்குவிதிகள் முன்னைய சட்டக் கட்டமைப்பிலிருந்து கணிசமாக வேறுபடுகின்றன. 1979ஆம் ஆண்டின் 31ஆம் இலக்கம் கொண்ட சட்டம் போதைப்பொருள் பாவனையைத் தடை செய்திருந்தாலும் அதை உறுதிப்படுத்துவதற்கான துல்லியமான நடைமுறைகள் அதில் இருக்கவில்லை. 1979 மற்றும் 2011ஆம் ஆண்டின் சட்டங்களின்படி, போதைப்பொருள் உட்கொண்டு வாகனம் ஓட்டுபவரைக் கண்டறிவதற்குக் காவற்றுறை அதிகாரியின் அகநிலை ஐயம் மட்டுமே தகுதியாக இருந்தது. சோதனைக் கருவிகள் கட்டாயமாக இருக்கவில்லை. 2025ஆம் ஆண்டின் புதிய ஒழுங்குவிதியின்படி, காவற்றுறை அதிகாரியின் அகநிலை ஐயத்தோடு ஒப்புதல் அளிக்கப்பட்ட உமிழ்நீர் சோதனை கருவியும் கட்டாயம் ஆக்கப்பட்டுள்ளது.

முன்னைய சட்டத்தின்படி, போதைப்பொருள் உட்கொண்டு வாகனம் ஓட்டுபவரை அறிவியல் அடிப் படையில் கண்டறிவதற்கு அரச மருத்துவ அதிகாரி அறிக்கை போதுமானதாக இருந்தது. ஆனால், ஆய்வக உறுதிப்படுத்தல் கட்டாயமாக இருக்கவில்லை. புதிய ஒழுங்குவிதியின்படி, அரச மருத்துவ அதிகாரி அறிக்கையோடு ஆய்வக உறுதிப்படுத்தலும் கட்டாயமாக்கப்பட்டுள்ளது. முன்னைய சட்டத்தின்படி இலகு ரக வாகனங்களின் முன் இருக்கைக்கு மட்டுமே பாதுகாப்பு இருக்கைப்பட்டி கட்டாயமாக இருந்தது. புதிய ஒழுங்குவிதியின்படி, விரைவு நெடுஞ்சாலையில் பயணிக்கும் அனைத்து வாகனங்களின் அனைத்து இருக்கைகளுக்கும் பாதுகாப்பு இருக்கைப்பட்டி கட்டாயமாக்கப்பட்டுள்ளது.

முன்னைய சட்டத்தின்படி, பாதுகாப்பு இருக்கைப்பட்டி அணிவதை உறுதிப்படுத்துவது ஓட்டுநரின் பொறுப்பாக மட்டும் இருந்தது. புதிய ஒழுங்குவிதியின்படி பாதுகாப்பு இருக்கைப்பட்டி அணிவதை உறுதிப்படுத்தும் பொறுப்பு ஓட்டுநர், வாகன உரிமையாளர் ஆகிய இருவருக்கும் பகிர்ந்து அளிக்கப்பட்டுள்ளது. முன்னைய சட்டத்தின்படி மது அருந்தி வாகனம் ஓட்டுவதற்கு 2,000 ரூபாய் தண்டம் விதிக்கப்பட்டது. புதிய ஒழுங்குவிதியின்படி 25,000-30,000 ரூபாய் வரை தண்டத்தை அதிகரிக்க முன்மொழியப்பட்டுள்ளது.

பாதுகாப்பு நோக்கங்கள் தெளிவாக இருந்தாலும், தனியார் போக்குவரத்துத் துறையினரிடம் இருந்து புதிய ஒழுங்கு விதிகள் பற்றி கடும் விமர்சனங்கள் எழுந்துள்ளன. 2011ஆம் ஆண்டுக்கு முன்னர் பதிவு செய்யப்பட்ட ஏறத்தாழ 6,000 பேருந்துகளில் பாதுகாப்பு இருக்கைப் பட்டிகள் பொருத்தப் படவில்லை என்று தனியார் பேருந்து உரிமையாளர்கள் சங்கம் சுட்டிக்காட்டி உள்ளது. பழைய பேருந்துகளில் பாதுகாப்பு இருக்கைப் பட்டிகள் பொருத்துவது தொழில்நுட்ப அடிப்படையில் கடினமானதும் செலவு மிக்கதுமானதுமாகும். அறிவியல் அடிப்படையில் உமிழ்நீர்ப் பரிசோதனைகளின் துல்லியம் குறித்து ஐயங்கள் எழுப்பப்பட்டுள்ளன. சில ஆய்வுகளின்படி, உமிழ்நீர் சோதனைகளில் 31% வரை தவறான முடிவுகள் வர வாய்ப்புள்ளது. மேலும், ஆடைகளின் தோற்றம், காவற்றுறையினரின் அகநிலை அளவுகோல் ஆகியன காவற்றுறை பொதுமக்களைத் துன்புறுத்த வழிவகுக்கும் என்றும் விமர்சிக்கப்படுகிறது. பாதுகாப்பு இலக்குகளுக்கும் பங்குதாரர்களின் கவலைகளுக்கும் இடையிலான முரண்பாடுகளைத் தீர்க்கப் பின்வரும் பரிந்துரைகளை நான் முன்வைக்கின்றேன்.

தனியார் போக்குவரத்து ஓட்டுநர்களுக்கான முன்மொழியப் பட்ட நலன்புரி நிதியத்தைச் செயற்படுத்துதல் மற்றும் பாதுகாப்புக் கருவிகளுக்கு மானியம் வழங்குதல்.

பழைய பேருந்துகளில் பாதுகாப்பு இருக்கைப் பட்டிகள் பொருத்துவதற்கு மாற்றாகப் புதிய வாகனங்களுக்கு மாறுவதற்கான உதவிகளை வழங்குதல்.

மருத்துவ அடிப்படையில் தேவைப்படும் மருந்துகள் மற்றும் சட்டவிரோத போதைப் பொருட்களுக்கு இடையே வேறுபாட்டை ஏற்படுத்தும் வகையில் சட்டங்களைச்

சீரமைத்தல்.

காவற்றுறையினர் சோதனைகளை மேற்கொள்ளும் பொழுது உடலில் அணியும் நிழற்படக் கருவிகளைப் பயன்படுத்துவதைக் கட்டாயம் ஆக்குதல்.

இலங்கையின் 2025ஆம் ஆண்டின் புதிய ஒழுங்குவிதிகள், பிரித்தானியா, அவுஸ்திரேலியா, சிங்கப்பூர் முதலிய நாடுகளின் சிறந்த நடைமுறைகளை நெருங்குகின்றன. மோட்டார் போக்குவரத்துச் சட்டத்தின் கீழ் முன்மொழியப்பட்டுள்ள இந்த இரண்டு ஒழுங்கு விதிகளும் இலங்கையின் போக்குவரத்துப் பாதுகாப்பை அடுத்த கட்டத்திற்கு நகர்த்துவதற்குத் தேவையானவை ஆகும். இருப்பினும், இவற்றை நடைமுறைப்படுத்தும்பொழுது ஏற்படும் தொழில்நுட்ப மற்றும் பொருளாதார அறைகூவல்களைக் கவனத்திற்கொண்டு, வெளிப்படையான முறையில் செயற்படுத்துவது அவசிய மாகும் எனக் கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sunil Kumara Gamage. You have 12 minutes.

[අ.භා. 1.20]

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ ගෙනෙන නියමයන්, රේගු ආඥාපනත යටතේ වන යෝජනා සම්මතය සහ මෝටර් වාහන පනත යටතේ වන නියෝග අද දින විවාදය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. ඒවා ගැනයි අපි සාකච්ඡා කරන්නේ. විශේෂයෙන් මෝටර් වාහන පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියෝග ගැන සාකච්ඡා කිරීමේදී, මේ හරහා අපේ සංචාරක ව්‍යාපාරයට ඇති වන තත්ත්වයන් සහ එයට බලපාන කරුණු කිහිපයක් ගැන සාකච්ඡා වෙනවා. අපි පාර්ලිමේන්තුවේ මේ දේවල් ගැන සාකච්ඡා කරන්නේ, පනත් ගේන්නේ අපේ රටේ ආර්ථිකය, සමාජය සහ සංස්කෘතිය මෙතැනින් ඉස්සරහට ගෙන ගොස් අපේ රට ලෝකයේ දියුණු, සංවර්ධිත රාජ්‍යයක් බවට පත් කරගන්නයි. ඒකට තමයි අපි මේ පාර්ලිමේන්තුවේ මේ අණපනත් සම්මත කරගන්නේ.

හැමෝම දන්නවා, බංකොලොත් කියලා සීල් එක ගහලා තිබිච්ච අපේ රට අවුරුද්දක් යනකොට අපි ස්ථාවර කර තිබෙන බව. ඒක ගැන කවුරුවත් තර්ක කරන්නේ නැහැ; ඒකට තර්ක කරන්න බැහැ. අපි, අපේ රට ආර්ථික වශයෙන් සංවර්ධනය කර තිබෙනවා.අවුරුද්දක් ඇතුළත, අර තිබිච්ච බංකොලොත්භාවයෙන් රට මුදාගෙන අපේ ආර්ථිකයේ තිබෙන සියලු නිර්ණායක අපි ශක්තිමත් කර තිබෙනවා. ශක්තිමත් ආර්ථිකයක් දක්වා යන ගමන තහවුරු වෙන විධියට අපේ රජයේ ජනාධිපතිතුමා ප්‍රමුඛ කණ්ඩායම වැඩ කර තිබෙනවා.

ඒත් එක්කම අපි දන්නවා, පසුගිය කාලය තුළ අපේ රටේ සංචාරක කර්මාන්තයේ ඇති වුණු වර්ධනය ගැන. මට කලින් කථා කළ ගරු නියෝජ්‍ය ඇමතිතුමියත් ඒ පිළිබඳව කථා කළා. අපි සංඛ්‍යා දත්තවලින්ම ඒවා ඔප්පු කර තිබෙනවා. 2024දී අපේ රටට සංචාරකයන් ඇවිල්ලා තිබුණේ, ලක්ෂ 20යි. 2025 වෙනකොට ඒක 2,360,000 දක්වා වැඩි වුණා. අපේ රටට එන සංචාරකයින් ප්‍රමාණය වැඩි වෙන්නේ, අපේ රට දැන් හොඳ රටක්, ස්ථාවර රටක්, නිදහස් රටක්, ආරක්ෂිත රටක් නිසා. මේ සමහර පනත් අපි ගෙනෙන්නේත් සංචාරකයින් අපේ රටට තවදුරටත් ආකර්ෂණය වෙන විධියට කටයුතු කරන්නයි. ඒ නිසා තමයි ඒ එන සංචාරකයින්ට Airport එකේදීම තමන්ගේ මෝටර් රථ බලපත්‍රය අරගෙන එදාම ගුවන් තොටුපොළෙන් එළියට එන්න පුළුවන් විධියට අපි වැඩකටයුතු කරමින් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි රටේ රාජ්‍ය ආදායම ඉහළ නංවාගෙන තිබෙනවා, රුපියල් බිලියන 4,090 ඉඳලා රුපියල් බිලියන 5,120 දක්වා. ඒ, 2024 සිට 2025 වනකොට. ඒ වාගේම 2025 වනකොට අපි විදේශ ප්‍රේෂණ ඉහළ නංවා ගත්තා, ඩොලර් මිලියන 6,570 ඉඳලා 8,070 දක්වා. විදේශ විනිමය, සංචාරකයන්ගේ පැමිණීම, සංචිත අනුපාත, උද්ධමනය යන මේ සියල්ලට අදාළ සංඛ්‍යාලේඛන ඇතුළේ අපි අපේ ආර්ථිකය ස්ථාවර කළා කියන සංඥාව රටට දීලා තිබෙනවා. ඒක ගැන දැන් කාටවත් තර්ක කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, මැතිවරණ කාලයේදී විපක්ෂය කිව්වා, අපි බලයට ආවාම වාහන දෙකක් තිබෙන අයගෙන් එකක් ආණ්ඩුවට ගන්නවා කියලා. කියන්න සන්තෝෂයි, වාහන දෙකක් තිබිච්ච කට්ටිය අපි ආවාට පස්සේ වාහන තුන, හතර කරගෙන තිබෙනවා. මොකද, අපි කිව්වේම අපි හදන ආර්ථිකය ඇතුළේ මේ රට පොහොසත් රටක් කරනවා කියලායි. මිනිස්සු පොහොසත් වෙන්න ඕනෑ. අන්න ඒ පොහොසත් රට හදන අධිෂ්ඨානයෙන් අපි දැන් ආලා තිබෙනවා. මම හිතන විධියට, විපක්ෂයටත් දැන් පොඩ්ඩක් හිතාගන්න බැරි වෙලා, අවුල් වෙලා තිබෙනවා, අපේ රටේ තිබෙන ආර්ථික සංවර්ධනය පිළිබඳව. අපි ඒ අයට අභියෝග කරනවා. අපේ රටේ ආර්ථික සංවර්ධනය හමුවේ පුළුවන් නම් අපට challenge කරන්න; අභියෝග කරන්න කියලා අපි කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආර්ථිකය ගොඩ නැඟුවා වාගේම අපේ රටේ සමාජ සංවර්ධනයට අදාළ කාරණාත් අපි ඉෂ්ට කරලා තිබෙනවා. මොකද, අපි දන්නවා රටක් ආර්ථික වශයෙන් දියුණු වෙනවා නම්, සංවර්ධනය වෙනවා නම් ඒ රටේ සමාජ සංවර්ධනය කියන එක අතිශය වැදගත් බව. සාමාන්‍යයෙන් රටක සංවර්ධනය කියන්නේ ආර්ථික සංවර්ධනය, සමාජ සංවර්ධනය සහ දේශපාලන සංවර්ධනයයි. අපි දැන් ආර්ථිකයේ සංවර්ධනයට අදාළ කොටස හදලා තිබෙන්නේ. ඊළඟට, සමාජ සංවර්ධනය. සමාජ සංවර්ධනයේදීත් අපේ තේමාව වුණේම පොහොසත් රටක ලස්සන ජීවිතයක්. අපි අපේ රටේ මිනිස්සුන්ට ලස්සන ජීවිතයකට ඕනෑ කරන කොන්දේසි, එහෙම නැත්නම් ලස්සන ජීවිතයක් ගත කරන්න පුළුවන් සමාජ පරිසරය හදලා තිබෙනවා, තවදුරටත් හදමින් ඉන්නවා.

උදාහරණයක් විධියට, පසුගිය දවස්වල අපේ රටේ පවත්වපු ඉන්දියාව හා පාකිස්තානය අතර ක්‍රිකට් තරගය ගනිමු. අපි හැමෝම දන්නවා අපේ රට ගැන තිබෙන විශ්වාසය. අපි කෙරෙහි ඒ රටවලට තිබෙන විශ්වාසය තමයි ඒකෙන් පෙන්වුවේ. ඒ රටවල් අපිව විශ්වාස කරනවා, දැන්. අපෙන් ඉස්සර ඇහුවේ, "මේගොල්ලන් ආවාම තිබෙන විදේශ සම්බන්ධකම් මොනවාද, එහෙම ඒවා තිබෙනවාද?" කියලා. දැන් බලාගන්න පුළුවන්, ඒ සම්බන්ධතා පාවිච්චි කරලා අපට කලාපයේ බලවත් රාජ්‍යයක් විධියට කොතරම් නැඟී සිටින්න පුළුවන්ද කියලා. ඒක තමයි, ඉන්දියාව හා පාකිස්තානය අතර පසුගිය ඒ තරගයේදී අපි ඔප්පු කළේ; අපි දැක්කේ. අපේ ජනාධිපතිතුමා මැදිහත් වෙලා, ජනාධිපතිතුමා සාකච්ඡා කරලා රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් අපට ඒ වාගේ දේවල් ගොඩ දාගන්න පුළුවන්. ඒ අතින් බැලුවාම අපි විශාල ජයග්‍රහණයක් මේ වෙනකොට අත්පත් කරගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විශේෂයෙන්ම මේ අවස්ථාවේ අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, පාකිස්තානයේ අභ්‍යන්තර කටයුතු අමාත්‍ය මොෂින් රාසා නක්වි මහත්මයාට. එතුමා ලංකාවට ආවා, මේ තරගය නරඹන්න. මොකද, ඒ අයට විශ්වාසයි අපේ රටේ ආරක්ෂාව සහ අපේ රටේ තිබෙන මේ සමාජ සංවර්ධනය පිළිබඳව. මේකේ තවත් විශේෂත්වයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ තරගය ඇතුළේ එකදු සිදුවීමක් වාර්තා වුණේ නැහැ; කිසිම සිදුවීමක් වාර්තා වුණේ නැහැ. හොඳට තරගය පවත්වලා, 32,000කට ආසන්න සංඛ්‍යාවක් තරගය නරඹලා බොහොම සාමකාමීව ඒ තරගය අපි නිමා කළා, ඒ අවශ්‍ය ආරක්ෂාව සහ අනිකුත් සියල්ල අපි තහවුරු කළා. හොඳ සංකේතයක්, හොඳ සංඥාවක් අපි ලෝකයට දුන්නා, "අපේ රට මෙන්න මෙහෙමයි, අපි බොහොම නිදහස් සාමකාමී රටක්" කියලා. ඒ නිසා මේ තරගය පැවැත්වීම අපට අතිශය වැදගත්. ඒකෙන් අපි ඔප්පු කරන්නේ අපේ රටේ සමාජ සංවර්ධනයේ ප්‍රමාණය. මොකද, ලංකාවේ මිනිස්සුත් ඒ cricket match එක බලන්න ගියා. එතැනට දෙරටේම කණ්ඩායම් ඇවිල්ලා හිටියා. ඉතින් මේ සියල්ල හරහා අපට නැවත ඔප්පු වෙනවා, අපේ රටේ සමාජ සංවර්ධනයේ යම්කිසි දුරකට මේ වෙනකොට අපි තල්ලු වෙලා තිබෙනවා, අපි ඒ වෙනුවෙන් වැඩකටයුතු කර තිබෙනවා කියන එක. ක්‍රීඩා

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

ඇමතිවරයා විධියට මම කියන්න කැමැතියි, අපේ රටේ සමාජ සංවර්ධනයට දායක වන මේ ක්‍රීඩාව නඟා සිටුවීම වෙනුවෙනුත් අපි විශාල වශයෙන් වැඩකටයුතු කරමින් සිටින බව. අපේ රටේ ජනතාවට අර අපි බලාපොරොත්තු වෙච්ච පොහොසත් රටේ ලස්සන ජීවිතයක් ගත කරන්නට ඉඩ සලසා දීම වෙනුවෙන් අපට කරන්න පුළුවන් උපරිම දේවල් කරන්නට අපි මැදිහත් වෙමින් තිබෙනවා. ඒක තමයි, අපේ රටේ සමාජ සංවර්ධනය සම්බන්ධයෙන් අපට කරන්න පුළුවන් මැදිහත්වීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ආර්ථිකය සංවර්ධනය කරනකොට, සමාජ සංවර්ධනය කරනකොට අපට අපේ රටේ දේශපාලනයත් ඒ මට්ටමටම සංවර්ධනය කර ගන්න අවශ්‍ය වෙලා තිබෙනවා. හැබැයි, අවාසනාවකට වාගේ, අපට තවමත් අර විපක්ෂයේ තිබෙන අඩුපාඩු, හැමදාම උදේට මෙතැන තිබෙන ඝෝෂාව, පාර්ලිමේන්තුවක තිබෙන සම්ප්‍රදායන් අපට ආරක්ෂා කර ගන්න බැරි වීම වාගේ කාරණා ගත්තාම, ඒවා වෙනුවට අපට මීට වඩා දියුණු දේශපාලන සංස්කෘතියකට යන්න පුළුවන් නම්, අපේ රට මීට වඩා ලස්සන රටක් වෙනවා කියන එක තමයි මගේ විශ්වාසය. මොකද, අපි එහෙම කියන්නේ? අපි මේ වෙනකොට දේශපාලනික වශයෙන් රටක් විධියට දෙන්න පුළුවන් ඉහළම ආදර්ශය ලබා දීලා තිබෙනවා. ඒක තමයි අපි ඊයේත්, පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත සම්මත කිරීම හරහා පෙන්නුවේ. මේවා අපි යෝජනා කරපු ඒවා. මේවා අපේ මැතිවරණ පොරොන්දුවල තිබිච්ච ඒවා. හැබැයි, මේවාටත් විරුද්ධ වෙන, තවමත් මේවා පිළිගන්න බැරි මන්ත්‍රීවරුත් ඉන්නවා. අපි ඒ ගැන කනගාටු වෙනවා. හැබැයි, දියුණු දේශපාලන සංස්කෘතියක් ගොඩනැඟීම සඳහා අපි සියලු උත්සාහයන් ගන්නවා. විපක්ෂයේ හොඳ මන්ත්‍රීවරු ඉන්නවා; ඒවා අගය කරන, ඒවාට එකඟ වන මන්ත්‍රීවරු ඉන්නවා. අපි ඒ අයට ගරු කරනවා. *[බාධා කිරීමක්]* ඔව්, අපි ඒ අයට ගරු කරනවා. හැබැයි, අපට එහෙම සංස්කෘතියක් අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපිට අපේ රට ගොඩ නඟන්න ආර්ථික සංවර්ධනය, සමාජ සංවර්ධනය වාගේම දේශපාලන සංවර්ධනයත් අතිශයින් වැදගත්. අපට මඩ ගහනවා, විපක්ෂයෙන්. නමුත් අපි ගණන් ගන්නේ නැහැ. මඩ ගහලා ඒගොල්ලෝ මඩේ එරෙනවා. අපි කියන්නේ, මඩෙන් එන්න එපා; ගොඩෙන් එන්න කියලා. මඩ ගහලා වෙන්නේ ඒගොල්ලන් හැමදාම මඩේ එරෙන එක විතරයි, මේ දේශපාලනයේ එතැනින් එහාට ගමනක් නැහැ.

අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම අවසන් අටදෙනාගේ වටයට තේරීම සම්බන්ධයෙන් ක්‍රීඩා ඇමතිවරයා විධියට මගේ සුබ පැතුම් එක් කරනවා.

ප්‍රබල ඔස්ට්‍රේලියානු කණ්ඩායමට හොඳ තරගයක් දීලා, ඓතිහාසික ජයග්‍රහණයක් ලබා ගැනීම වෙනුවෙන් අපේ කණ්ඩායමට මගේ සුබපැතුම් එක් කරන ගමන්, ඊළඟ තරගවලදීත් අපට විශාල ජයග්‍රහණ ලබා ගැනීමට හැකි වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Rohitha Abeygunawardhana. You have ten minutes.

Before he starts, will an Hon. Member propose the Hon. (Mrs.) Sagarika Athauda to the Chair?

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
Sir, I propose that the Hon. (Mrs.) Sagarika Athauda do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (MRS.) SAGARIKA ATHAUDA took the Chair.*

[අ.භා. 1.33]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද පාර්ලිමේන්තුවේ මේ විවාදය අවස්ථාවේදී මම මතක් කරන්න ඕනෑ, මෙන්න මේ කාරණයත්. ඊයේ - 17වැනි දා - සභානායකතුමා පාර්ලිමේන්තුවේ කථාවක් කළා. දැන් ක්‍රීඩා ඇමතිතුමාත් කථා කරමින් කිව්වා, පාකිස්තානයත්, ඉන්දියාවත් අතර තරගාවලියට මැදිහත් වුණේ ජනාධිපතිතුමා, ඒකට අවශ්‍ය විධියට කථා කරලා match එක ගහන්න සැලැස්වූවා කියලා. Match එක ගහපු එක හොඳයි. හැබැයි, ඒ ගමන්ම අර මම telephone call එකක් ගත්තා කියන එකට සමාන කරලා කියනවා, "රෝහිත අබේගුණවර්ධන අපේ ධීවර ඇමතිතුමාට කථා කළා වාගේ call එකක් නොවෙයි, එහෙම කාටවත් කථා කරලා නැහැ" කියලා. මම සභානායකතුමාට මෙන්න මේක කියන්න ඕනෑ, පසුගිය දිනවල ගෝල් ෆේස් පිට්ටනිය ඉදිරිපිට තිබෙන ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහට මේ රටේ මාදැල් හිමියන්, මාදැල් කර්මාන්තයේ නියැළෙන ධීවරයන් ටික ඇවිල්ලා දවස් 5ක් කන්න බොන්න නැතිව ඒ ඉස්සරහා වාඩි වෙලා නිදාගෙන හිටියා. ඒක ජනතාවගේ ප්‍රශ්නයක්. ඒ මිනිස්සුන්ට ඇහුම්කන් දෙන්න කෙනෙකු නැති නිසා, ඒ මිනිස්සු ඇවිල්ලා වාඩි වෙලා හිටියා. විපක්ෂය නියෝජනය කරමින් හුඟක් අය එතැනට ගිහිල්ලා ඇහුවා, මොකක්ද ප්‍රශ්නය කියලා. ඒක විපක්ෂයේ කාර්යභාරය නේ. ආණ්ඩුවේ සිටියදීත් අපි ඕක කළා. ඒ වෙලාවේ මමත් මාදැල් කර්මාන්තයේ නියැළෙන ධීවරයන් ළඟට ගියා. ඔවුන් බඩගින්නේ, මහ ගිනි කාෂ්ටක අව්වේ හිටියේ. එතැනදී ඒ ධීවර ජනතාව මගෙන් ඉල්ලීමක් කළා, "අනේ, මන්ත්‍රීතුමා පුළුවන් නම් මේක ගැන ඉහළට කථා කරන්න, ආණ්ඩුවේ වග කියන කාට හෝ කථා කරන්න" කියලා. මම ඒ වෙලාවේ ධීවර ඇමතිතුමාට කථා කරන්න උත්සාහ කළා; අපේ රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමාට මගේ දුරකථනයෙන් කථා කරන්න උත්සාහ කළා. නමුත්, මට ගන්න බැරි වුණා. ඒ Phone එක කාර්ය බහුලයි. මට එතුමාට ගන්න බැරි වුණා. අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඒ වෙලාවේ එතැන හිටියා රුක්මල් තුෂාර ලිවේරා නැමැති අයෙක්. ඔහු මුලතිව් කෝකිලායිවල මාදැල් හිමියෙක්. ඔහු මාදැල් තිබෙන කෙනෙක්; මාදැල් 10ක් තිබෙනවා. මේ මාදැල් හිමියා දුරකථනයෙන් ඇමතිතුමාව සම්බන්ධ කරගෙන, "මෙන්න ඇමතිතුමා ඉන්නවා" කියලා මට දුරකථනය දුන්නා. කාටද? ඇමතිතුමාට කථා කරන්න. ඇමතිතුමාට ඇමතුම අරන් දුන්නාම මම කථා කළා. ඒක මාධ්‍යයෙත් යනවා, මම දැක්කා. මම එතුමාට කථා කරලා

කිව්වා, මොකද, අපි එකට හිටපු යාළුවෝ; 2004දී අපි ජනතා විමුක්ති පෙරමුණත් එක්ක එකතු වෙලා ආණ්ඩු හදනකොට එකට හිටපු යාළුවෝ. මම එතුමාට කථා කළා. කථා කළාම, "ඔව්, මේකට විසඳුමක් අදම ලබා දෙනවා. අපි කථා කරනවා" කියලා එතුමා කිව්වා. එතුමාට කථා කරපු රුක්මල් තුෂාර ලියේරා යන අයගේ දුරකථන අංකය තමයි, 0771829303. ඇමතිතුමාගේ දුරකථන අංකය තමයි, 0777795958. උදේ මම රුක්මල් මහත්මයාට කථා කළා. ඔහු මට එව්වා, වීඩියෝ පටයක්. මගේ phone එකෙන් තමයි ඇමතිතුමාට කථා කරන්න ඔබතුමාට ඇමතුම අරගෙන දුන්නේ කියලා කිව්වා. ඒ නිසා මම අපේ සභානායකතුමාට කියනවා, දෙයක් කියන්න ඉස්සෙල්ලා හොයලා බලලා කියන්න.

මේ ආණ්ඩුව ගැන කියන්න ගියොත්, ඇත්ත කථාව තමයි කප්පරක් බොරු කියලා නේ ආවේ. චෛතිය රජ්ජුරුවෝ තමයි ඉතිහාසයේ වැඩියෙන්ම බොරු කියලා තිබෙන්නේ. දැන් මේ අය චෛතිය රජ්ජුරුවන්ට එහා බොරු කියලා බලයට ආවේ. අපි හිතුවා බොරු කියලා ආවාට පස්සේ; අඩු ගාණේ ආණ්ඩුවක් ගත්තාට පස්සෙවත් බොරු නොකියා ඉඳියි කියලා. එහෙමවත් බොරු නොකියා ඉඳියි කියලා හිතුවා.

අනෙක් එක, නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා ලු, එයාට call එකක් ගත්තේ නැහැ කියලා. මම මොකටද නියෝජ්‍ය ඇමතිතුමාට call ගන්නේ? තීන්දු ගන්න පුළුවන් මිනිහාට නේ කථා කරන්න ඕනෑ. කථා කළේ ඇමතිතුමාට. නියෝජ්‍ය ඇමතිතුමාට කථා කරලා වැඩක් තිබෙනවාද? මමත් හිටපු කැබිනට් ඇමතිවරයෙක්. මම කථා කළේ ඇමතිතුමාට, රුක්මල්ගේ phone එකෙන්. කාටවත් හොර calls දෙන්න අපිට ඇඟේ අමාරුවක් තිබෙනවාද? අපිට පාන් ද? අපේ හඳුන්නෙත්ති ඇමතිතුමා කියන්නේ, "අපිට පාන් නොවෙයි නේ" කියලා. ඒ නිසා අපිට එහෙම ඇඟේ අමාරු නැහැ. අවුරුදු 25ක් අපි මේ පාර්ලිමේන්තුවේ පොල් ගෑවේ නැහැ. අපි ආණ්ඩුවෙත් හිටියා, විපක්ෂයෙත් හිටියා. අපිට ආණ්ඩුවත් හුරුයි, විපක්ෂයත් හුරුයි. හැබැයි, මම වරාය විෂය භාර ඇමතිවරයා හැටියට හිටියා. මම කන්ටේනර් 323ක් කරේ තියාගෙන ගියේ නැහැ; මම කන්ටේනර් කරේ තියාගෙන ගියේ නැහැ නේ. අද වනතුරු ඒ කන්ටේනර් 323 සම්බන්ධයෙන් හෙව්වාද? ඒ සම්බන්ධයෙන් විශේෂ කාරක සභාවක් තිබෙනවා. මේවාට උත්තර දෙන්න. ධීවරයාට උත්තර දෙන්න. මේ රටේ ජීවත් වෙන අහිංසක මාදැල් කර්මාන්තකරුවාට උත්තර දෙන්න. දැන් කියනවා ඒක නිසා කොරල් කැඩෙනවා ලු. කරුණාකරලා ඇමතිතුමා හෝ නියෝජ්‍ය ඇමතිතුමා හෝ නිලධාරියෙක් හෝ මට කියන්න, මාදැලක් ගල් උඩ අදින්නේ කොහේද කියලා. මාදැලක් ගල් උඩ ඇද්දොත් එහෙම දැල කඩාගෙන ගිහින් ගලේ එතිලා මාදැල් හිමියා ඉවරයි. ඒ නිසා අර අහිංසක මිනිස්සුන්ට අසාධාරණයක් කරන්න එපා. කමිටුවක් පත් කළා. ඒ කමිටුවට බාලගිරි දෝෂය ද? ඒ නිසා, කරුණාකරලා ධීවරයාට උත්තර දෙන්න කියලා අපි කියනවා. එහෙම නැතිව, හොර calls ගැන කථා කරන්න, අපි හොර calls දෙන්නේ නැහැ. දෙනවා නම් call එක කෙළින් දෙන්නේ. අපිට කථා කරන්න පුළුවන්කම තිබුණොත් අපි ට්‍රම්ප්ටත් කථා කරනවා. එහෙමයි අපේ කාලයේ අපි ප්‍රශ්න විසඳුවේ. මේ ප්‍රශ්නය විසඳලා දෙන්න කියලා ජනාධිපතිතුමාට අපි කියනවා, අගමැතිතුමාට කියනවා, විෂයභාර ඇමතිතුමාට කියනවා. එහෙමයි අපි කටයුතු කළේ. අපි කෙළින් තීන්දු ගත්තා. ඒ නිසා මෙවැනි ප්‍රකාශ කිරීමෙන් වළකින්න කියලා ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ක්‍රීඩාව භාර ඇමතිතුමා කලින් කථා කළා. හොඳයි. අපි ඇහුම්කන් දෙනවා. සමහර දේවල්වලට, හොඳ දේට හොඳයි කියන්න ඕනෑ. හොඳ දේවල් හොඳයි. හැබැයි, සමහර අය හිතාගෙන ඉන්නවා මේ ලැබිච්ච බලය සදාකාලික බලයක් කියලා; "මේක සදාකාලික බලයක්, මේක ගලේ කෙටුව බලයක්" කියලා හිතේ තියාගෙන ඉන්නවා. නැහැ, අමාත්‍යවරුනි, මන්ත්‍රීවරුනි. ආණ්ඩු පක්ෂයටයි මේ කියන්නේ. මේක කවදාවත් සදාකාලික නැහැ. මේවා තාවකාලිකයි. ඈත දශකයේ ඉඳලා බැලුවොත්, ආණ්ඩු මාරු වෙනවා. ආණ්ඩු සදාකාලික නැහැ. එක දිගටම ආණ්ඩු කරපු කාලයක් තිබුණා නම් කියන්න. එහෙම කරන්න බැහැ. ඉතිහාසයේ කළත්, දැන් කරන්න බැහැ. දැන් බලය ඒ තරම් සදාකාලික නැහැ, තාවකාලිකයි. බලයෙන් ඔළුව උදුම්මවා ගන්න හොඳ නැහැ. බලයෙන් ඔළුව උදුම්මවා ගත්තොත් වෙන්නේ මොකක්ද? අවසානයට සිද්ධ වෙන දේ හොඳ නැහැ. මේ අපි එහෙම සිද්ධ වෙච්ච අය. අපිත් බලය ගත්තාට පස්සේ 'හරි, බලය තිබෙනවා' කියලා හිතුවා. ඒත් අන්තිමට මොකක්ද වුණේ? හැබැයි, මතක තියා ගන්න, අපිට ජනතාව සැලකුවේ සිල්ලරට. හැබැයි, තමුන්නාන්සේලාගේ බලය නැති වෙච්ච කාලයක සලකන්නේ තොගයට. සිල්ලරට නොවෙයි සලකන්නේ, තොගයට සලකන්නේ. මොකක්ද හේතුව? දැන්වත් ජනතාවට දීපු පොරොන්දු ටික ඉටු කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ දවස්වල හීනෙන් පෙනෙන්නෙත් ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාව. මොකක්ද හේතුව? කොහොම හරි කමක් නැහැ, නාමල් රාජපක්ෂව ඇතුළට දාන්න ඕනෑය කියන එක තමයි හිතන්නේ. ආණ්ඩුවක් ඉන්නේ ඇතුළට දාන්නයි, එළියට ගන්නයි ද? ඒකටද ආණ්ඩුවක් ඉන්නේ? ඒකද බලාපොරොත්තු වෙන්නේ? දේශපාලන පළිගැනීම්වලට ලැහැස්ති වෙන්න එපා. දේශපාලන පළිගැනීම් එච්චර සුබවාදී නැහැ. ඒක අසුබවාදීයි. දැන් තමුන්නාන්සේලා අපිට කියනවා, බොරු කරනවා කියලා. තමුන්නාන්සේලා දීපු පොරොන්දු ටික ඉටු කරන්නකෝ. දැන් තමුන්නාන්සේලාට විරුද්ධ වෙලා තිබෙන්නේ කවුද? තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් ගෙනෙන්න උත්සාහ කරපු අය අද තමුන්නාන්සේලාට විරුද්ධයි.

තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ගෙනෙන්න උදව් කළේ කවුද? මහා සංඝරත්නයේ ආශීර්වාදය ඔබට තිබුණා. රාජ්‍ය සේවකයන්ගේ ආශීර්වාදය සියයට 95ක්, සියයට 90ක් තිබුණා. ඊට පස්සේ ගොවි ජනතාවගේ, ධීවරයන්ගේ, වෛද්‍යවරුන්ගේ, හෙදියන්ගේ ආශීර්වාදය තිබුණා. අපි දැක්කා, සමහර හෙද සේවක, සේවිකාවෝ uniforms පිටින් රැස්වීම්වලට ගියේ. එහෙමයි ආශීර්වාද කළේ. අන්න, මේ මාසයේ 20වෙනි දා මේ ආණ්ඩුවට විරුද්ධව මහා සඟ සමුළුවක් ඒක රාශි වෙනවා. මේ සිංහල බෞද්ධ ස්වාමීන් වහන්සේලා දැවැන්ත විධියට ආණ්ඩුවට විරුද්ධව නැඟී සිටිනවා. ගොවි ජනතාව, ධීවරයෝ, කම්කරුවෝ, රාජ්‍ය සේවකයෝ මේ සියලු දෙනා ඒක රාශි වෙනවා.

කරුණාකරලා හොයා බලන්න, කොතැනද අපට වැරදුණේ කියලා. 2024 සැප්තැම්බර් 21වැනි දා ජනාධිපතිතුමා ජයග්‍රහණය කරනකොට තිබුණු ජනප්‍රියභාවය දැන් තිබෙනවාද කියලා උරගාලා බලන්න; හොයලා බලන්න. පාරට බහින්න, සති පොළට යන්න, ත්‍රී වීලර් එකකට නඟින්න. ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඉස්සර ත්‍රී වීලර් එකකට නැග්ගාම මුළු රටම මාලිමාවට කියලා නේද කියන්නේ? ජනාධිපතිවරණයට ඉස්සෙල්ලා පොහොට්ටුවේ කෙනෙක් නඟිනවා, ත්‍රී වීලර් එකකට. පොහොට්ටුවේ කෙනා හයර් එක යන්න නඟිනකොට පොහොට්ටුවේ, බහිනකොට මාලිමාවේ. දැන් මොකක්ද වෙන්නේ? දැන් ත්‍රී වීලර් එකකට කෙනෙක් නඟිනකොට, ඒ කෙනා මාලිමාවේ, හැබැයි ඒ කෙනා බහින්නේ පොහොට්ටුවේ වෙලා. ඒකයි ඇත්ත කථාව. මොකක්ද හේතුව? ජනතාවගේ විරෝධය දැඩි ලෙස බලපාලා තිබෙනවා. ඇහුම්කන් නොදීම තමයි ප්‍රධානම හේතුව. ආණ්ඩුවක් විධියට ඇහුම්කන් දෙන්න පුරුදු වෙන්න. ඇහුම්කන් දීම තමයි මූලික දේ.

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

අපි දැක්කා, තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය. හොඳයි, ඒ වචන ටික. මොකක්ද? "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" තමයි තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තේමා පාඨය. ඒක හොඳයි. එහෙම නේ වැඳෙන්න ඕනෑ; එහෙමයි වෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
තව විනාඩියයි මම ගන්නේ.

පොහොසත් රටයි, ලස්සන ජීවිතයයි. හැබැයි, ඒ පොහොසත් රටේ නොහිතන වෙලාවට ලස්සනට මරනවා. හැබැයි, ඒ හැම මරණයක්ම හුදෙකලා වෙලා තිබෙනවා. ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකු ඝාතනය කළා. ඒකත් හුදෙකලා සිදුවීමක්. නීතිඥ මහත්මයෙක් සහ බිරිඳ ඝාතනය කළා. ඒකත් හුදෙකලා සිදුවීමක්. ඒ දවසේම කළුතර වස්කඩුවේ ඝාතනයක් වුණා. ඒකත් හුදෙකලා සිදුවීමක්. ජින්තුපිටියේ සිදුවීමත් හුදෙකලා සිදුවීමක්. මරන්න ආ අය පැමිණි වාහනය තවත් වාහනයකුත් හප්පාගෙන ගිහිල්ලා ඔවුන් පැමිණි වාහනය පුච්චලා දානවා. ඒකත් හුදෙකලා සිදුවීමක්. මේ රටේ මිනිසුන් මරලා දාන හැම අවස්ථාවක්ම හුදෙකලා සිදුවීමක් නොවෙයි. ඒ සඳහා හේතුවන කාරණය හොයන්න. කරුණාකරලා මිනිසුන්ගේ ජීවිත ආරක්ෂා කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. ඒක තමයි කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම අවසාන වශයෙන් මේ කාරණය මතක් කරනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවට අවුරුදු එකහමාරක් වෙනකොට තිබෙන තත්ත්වය බලන්න නම් කරුණාකරලා පළාත් සභා මැතිවරණය තියන්න. ඔබතුමන්ලාට දැන් ඒකට හොඳ වෙලාව. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ජනප්‍රියයි, ඔබතුමන්ලාට හොඳයි, ඔබතුමන්ලාට වාසියි. ඔබතුමන්ලාට මිනිස්සු ඡන්දය දෙනවා නම් තියන්න, පළාත් සභා මැතිවරණය. අපි විපක්ෂයක් හැටියට ලැහැස්තියි, පළාත් සභා මැතිවරණයට මුහුණ දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බොහොම ස්තුතියි, මට කාලය ලබා දුන්නාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.44]

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டத்தின் கீழான கட்டளை, சுங்கக் கட்டளைச் சட்டத்தின் கீழான தீர்மானம், மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் என்பன தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் சந்தோசமடைகின்றேன்.

இலங்கையில் பொருளாதார ஸ்திரத்தன்மையை தேசிய மக்கள் சக்தி அரசாங்கம் ஏற்படுத்தி இருக்கின்றது. 2024ஆம் ஆண்டுக்கு முன்னர், இந்த நாடு வங்குரோத்து அடைந்த நாடுகளின் பட்டியலில் சிவப்புக் குறியீட்டில் இருந்ததை நாம் அனைவரும் மறந்துவிட முடியாது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தேசிய ஒற்றுமை சீர்குலைந்து, பொருளாதார ரீதியாகப் பின்னடைந்து, வங்குரோத்து தேசமாக இருந்த இந்தத் தேசத்தை, இன்று தேசிய மக்கள் சக்தி அரசாங்கம் பொருளாதார ரீதியாகக் கட்டியெப்பி இருக்கின்றது. அதுமாத்திரமன்றி, நாட்டில் தேசிய நல்லிணக்கத்தையும் ஏற்படுத்தி இருக்கின்றது.

இன்று இலங்கையின் ஏற்றுமதித்துறை 6 சதவீத வளர்ச்சியைக் கண்டுள்ளது. இலங்கையின் மொத்த ஏற்றுமதி வருமானம் கடந்த 10 மாதங்களில் 14 பில்லியனைத் தாண்டி இருக்கின்றது. பொருளாதார ஸ்திரத்தன்மை ஊடாக ஏற்றுமதி வருமானம் அதிகரிக்கப்பட்டு இருக்கின்றது. அதுமாத்திரமன்றி, உற்பத்திப் பொருளாதாரத்துக்கான அடித்தளமும் இடப்பட்டு இருக்கின்றது. மேலும், உற்பத்திப் பொருளாதாரத்தின் ஊடாக இந்த நாட்டுக்குக் கொண்டுவரப்படும் டொலர்களை அதிகரிப்பதற்கும் எமது நாட்டின் ஏற்றுமதிப் பயிரான தேயிலை உற்பத்தியை மீண்டும் உயிரூட்டுவதற்கும் ஏதுவான நடவடிக்கைகள் எடுக்கப்பட்டு இருக்கின்றன. 2025ஆம் ஆண்டுக்குப் பிறகு, இலங்கையில் தைத்த ஆடைகள், தேயிலை, தேங்காய், வைரம், இரத்தினக் கற்கள், நகைகள் மற்றும் உணவுப் பொருட்களின் ஏற்றுமதி அதிகரித்திருப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. அதுமாத்திரமன்றி, 2025 சனவரி மாதத்தில் சேவைகள் ஏற்றுமதி மூலமான வருமானம் கிட்டத்தட்ட 329 மில்லியன் அமெரிக்க டொலர்களாக அதிகரித்திருப்பதையும் நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. கடந்த காலத்தில் எமது நாடு வங்குரோத்து தேசமாக இருந்ததால் வாகனங்களை இறக்குமதி செய்ய முடியாத ஒரு சூழ்நிலை இருந்தது. இப்பொழுது பொருளாதார ஸ்திரத்தன்மை ஏற்படுத்தப்பட்டு இருப்பதனால் வாகனங்களை இறக்குமதி செய்ய முடியுமாக இருக்கிறது. இவ்வாறு நாட்டை அபிவிருத்திப் பாதையில் கொண்டுசெல்லக்கூடிய நிலைமையை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது.

இதுவரை காலமும் இந்த நாட்டை ஆட்சி செய்த ஆட்சியாளர்கள் பல சட்டங்களைக் கொண்டுவந்து இருக்கிறார்கள். அவை மக்கள் விரோத சட்டங்களாகவே தொடர்ச்சியாக இருந்து வந்தன. ஆனால், நேற்று இந்தச் சபையில் நிறைவேற்றப்பட்ட சட்டமூலமானது, இலங்கையின் வரலாற்றையே திருப்பிப்போட்டுள்ளது. கடந்த காலங்களில் சாதாரண தொழிலாளர்களின் ஓய்வூதியம் சம்பந்தமாகக்கூட பேசாத இந்தப் பாராளுமன்றம், இன்று உழைக்கும் வர்க்கத்தினரான தொழிலாளர்களையும் அரச ஊழியர்களையும் தனியார்துறை ஊழியர்களையும் கருத்திலெடுத்து, அவர்களுக்கு உரிமைகளையும் சலுகைகளையும் வழங்குவதற்கான நடவடிக்கைகளை எடுத்துள்ளது. கடந்த காலங்களில் பாராளுமன்றத்தை அலங்கரித்து, பாராளுமன்றத்தின் ஊடாக சுகபோக வாழ்க்கையை அனுபவித்துக் கொண்டிருந்த எஜமான்களின் - மக்கள் பிரதிநிதிகளின் - ஓய்வூதியத்தை இரத்துச் செய்திருப்பது வரலாற்று முக்கியத்துவம் வாய்ந்த ஒரு நிகழ்வாகும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்த நாட்டில் ஏற்படுத்தப்பட்டிருக்கின்ற அரசாங்கமானது, மக்களாட்சியை நோக்கி நகருகின்ற அரசாங்கமாகவே உலக

வரைபடத்தில் குறிப்பிடப்பட்டு இருக்கின்றது. அந்த வகையில், இந்நாட்டை ஆளுகின்ற, இந்த அரசாங்கத்துக்குத் தலைமைத்துவம் கொடுத்துக்கொண்டு இருக்கின்ற மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் வரலாற்றில் இடம்பிடித்திருப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தப் பாராளுமன்றத்தில் இருக்கக்கூடிய ஆளுங்கட்சியைச் சார்ந்த 159 பேரும் பெருந்தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு சம்பந்தமாகப் பேசினார்கள். அவர்களுக்குச் சம்பள உயர்வைப் பெற்றுக்கொடுக்க வேண்டுமெனப் பேசியபொழுது, எதிர்க்கட்சியைச் சார்ந்தவர்கள் என்ன கூறினார்கள்? அதாவது, தோட்டத் தொழிலாளர்களுக்கு குறித்த 200 ரூபாயை வழங்குவது தவறெனவும், அது சட்டத்துக்கு முரணானது எனவும் கூறினார்கள். மேலும், தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பள உயர்வைப் பெற்றுக்கொடுப்பது சம்பந்தமான முன்மொழிவை இந்தச் சபையில் முன்மொழிந்தபோது, அதற்கு எதிராகச் சட்ட நடவடிக்கையெடுக்க வேண்டுமென்றும் கூறினார்கள். அவ்வாறான எதிர்க்கட்சியினர், பாராளுமன்ற ஓய்வூதியம் (நீக்குதல்) சட்டமூலம் கொண்டுவரப்பட்டபோது, இந்தச் சபையில் அதற்கு எதிராகக் கூக்குரலிட்டார்கள். அதற்குப் பிறகும், இந்த உயர் சபையில் சில எதிர்க்கட்சி உறுப்பினர்களின் பேச்சுகள் எவ்வாறானதாக இருக்கின்றன என்பதை நாங்கள் பார்க்க முடிகின்றது. அதாவது, மௌனத்தில் தூஷணமாகவும் சத்தம் போட்டுப் பேசும்போது தெருப்பாடல் போலவும் இருக்கிறது. பொருளாதார அபிவிருத்தியோடு, உழைக்கும் மக்களை மேம்படுத்துவதற்கான திட்டங்களையும் எங்களுடைய அரசாங்கம் முன்னெடுக்கின்றது. இதுவரை காலமும் போராடி சம்பள உயர்வைப் பெற்ற தோட்டத் தொழிலாளர்கள், இம்முறை போராட்டமின்றி சம்பள உயர்வைப் பெற்றிருக்கிறார்கள். இதுவும் ஒரு வரலாற்றுச் சாதனையென்றே நான் நினைக்கின்றேன்.

இந்த அரசாங்கமானது, இன, மத, மொழி ஒற்றுமையையும் நல்லிணக்கத்தையும் ஏற்படுத்துவதற்கான முன்னேற்பாடுகளைத் தொடர்ச்சியாக முன்னெடுத்து வருகின்றது. தேசிய மக்கள் சக்தியினரை 'மத எதிர்ப்பாளர்கள்' என்றும் 'இனவாதிகள்' என்றும் கடந்த காலங்களில் எதிர்க்கட்சியினர் வர்ணித்தார்கள். நாங்கள் இன, மத, மொழி ஐக்கியத்தைப் பேணுபவர்கள் என்பதை தற்பொழுது அவர்கள் நடைமுறையில் காண்கிறார்கள். உதாரணத்துக்கு, கண்டி தலதா மாளிகையின் எசல பெரஹரா, பொங்கல் விழா போன்றவற்றைக் குறிப்பிடலாம். அண்மையில் சிவராத்தி விழாவானது எங்களுடைய புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர் மாண்புமிகு ஹிதுதும சுனில் செனெவி அவர்கள் தலைமையில் சிறப்பாக நடைபெற்றது. எதிர்வரும் காலங்களில் நோன்புப் பெருநாள் வைபவத்துக்கும் அரசாங்கம் முழுமையான ஒத்துழைப்பையும் ஆதரவையும் வழங்கும். அதேபோல், கிறிஸ்மஸ் பண்டிகையும் கொண்டாடப்படும். இவ்வாறு இன, மத, மொழி ஒற்றுமைக்கான ஏற்பாடுகளை இந்த அரசாங்கம் முன்னெடுக்கும்போது, இனவாத ரீதியாகச் சிந்திக்கின்ற எதிர்க்கட்சியினர் தங்களுக்கான சந்தர்ப்பம் கிடைக்கவில்லையென துடித்துக்கொண்டு இருக்கின்றார்கள். இந்த நாட்டைப் பிரிவினையை நோக்கி நகர்த்தி, தொடர்ச்சியாகப் பொருளாதார ரீதியில் பின்தள்ளிய எதிர்க்கட்சியினர், தங்களுக்குச் சந்தர்ப்பம் கிடைக்காதா என்று ஏங்கிக்கொண்டு இருக்கின்றார்கள். இதுதான் உண்மை!

எனக்கு முன்னர் பேசிய ஓர் எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர் சுயவிமர்சனம் செய்துகொண்டார். அதாவது, இந்த ஆட்சி நிலைக்காது என்றும் ஆட்சி நிலைக்காதபோது ஓர் அரசியல்வாதி எவ்வாறு நடந்துகொள்ள வேண்டும் என்றும் சுயவிமர்சனம் செய்துகொண்டார். அது அவர்களுக்கு சுயவிமர்சனமாக இருக்கலாம். இந்தப் பாராளுமன்றத்தில் எங்களுக்குக் கிடைத்துள்ள பதவி, பட்டங்கள் என்பன மக்களுக்குச் சேவை செய்வதற்காக வழங்கப்பட்டு இருக்கின்றதே ஒழிய, எங்களுக்குக் கிடைத்துள்ள வரப்பிரசாதம் அல்ல என்பதை எதிர்க்கட்சியினர் தெரிந்துகொள்ள வேண்டும். நாங்கள் தேசிய மக்கள் சக்தி சார்பில் இந்தச் சபைக்கு வந்திருப்பது, கடந்த கால ஆட்சியாளர்களைப்போல் நடந்துகொள்வதற்கோ, இந்த நாட்டை வங்குரோத்து அடையச் செய்வதற்கோ அல்ல. தேசிய மக்கள் சக்தியினரான எங்களுடைய கோஷமாக இருந்தது, 'வளமான நாடு - அழகான வாழ்க்கை' என்பதுதான். அதாவது, இந்த நாட்டை வளமான தேசமாக மாற்றி, மக்களுக்கு அழகான வாழ்க்கையை ஏற்படுத்திக் கொடுக்க வேண்டும் என்பதுதான். பொருளாதார ரீதியாகவும் அறிவியல் ரீதியாகவும் முன்னேற்றி, இலங்கைத் தேசத்தை வளமான தேசமாக மாற்றுவதற்கு தற்போது தலைமைத்துவம் கொடுக்கின்ற AKD அவர்கள் தயாராகவே இருக்கின்றார். அவர் மாத்திரமல்ல, அவருக்குக்கீழ் இயங்கும் அரசாங்கமும் அதற்குத் தோள்கொடுப்பதற்குத் தயாராக இருக்கின்றது. இந்த நாட்டை வளமான நாடாக மாற்றி, இந்த நாட்டில் இருக்கின்ற மக்களுக்கு அழகான வாழ்க்கையைப் பெற்றுக்கொடுப்பதற்கு தேசிய மக்கள் சக்தி அரசாங்கம் தயாராக இருக்கின்றதெனக் கூறி, என்னுடைய உரையை முடிக்கின்றேன். நன்றி. வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.55]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

විශේෂයෙන්ම ආනයන භාණ්ඩ සම්බන්ධයෙන් පනවන බදු පිළිබඳව කථා කරනකොට මම මේ කාරණය කියන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බලයට ආවේ ගොවියා ශක්තිමත් කරලා, මේ රටේ මිනිසුන්ගේ ආර්ථිකය ශක්තිමත් කරනවා කියලායි. හැබැයි, අද ගොවියාගේ, ධීවරයාගේ ආර්ථිකය ශක්තිමත් කරන එක කෙසේ වෙතත්, ආහාර පිට රටින් ගෙනැල්ලා ව්‍යාපාරිකයාගේ ආර්ථිකය ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් නම් ක්‍රියාත්මක වෙනවා. දිනපතා පිට රටින් ගෙන්වන එළවලු, පලතුරු ඇතුළු ආහාරවල බදු අඩු කරමින් ලංකාවේ ගොවියාට යන එන මං නැති කරන බවක් නම් පෙනෙනවා. හැබැයි, ඔබතුමන්ලා බලයට ආවේ, දේශීය ගොවියා ආරක්ෂා කරනවා, ගොවි සංවිධාන හදලා ගොවියාට කථා කරනවාය කියලා. ආණ්ඩුව කිව්වා, වී මිලදී ගන්න රුපියල් බිලියන 10ක් වෙන් කළා කියලා. හැබැයි, අද වනවිටත් ගොවීන්ට සාධාරණ මිලකට වී ටික අළෙවි කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ ගැන ගොවි සංවිධාන කථා කරනවා. ගොවි සංවිධාන ඒ පිළිබඳව

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

ආණ්ඩුවෙන් අහනවා. ගොවීන් විපක්ෂයටත් ඒ ගැන කියනවා. හැබැයි, ඔබ කරන්න උත්සාහ කරන්නේ මොකක්ද? ඔබ සුපුරුදු මර්දනය ක්‍රියාත්මක කරලා, ගොවියා පාගලා දාලා හරි තමන්ගේ ව්‍යාපාරිකයෝ ටික ලවා හාල් පිට රටින් ගෙනෙන තැනටම පරිවර්තනය වෙලා තිබෙනවා. එක පැන් පහරින් මාෆියාව නැති කරන්න තමයි ඔබතුමන්ලා බලයට ආවේ. මම මාෆියාව ගැන කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, අපට වඩා හොඳට තමුන්නාන්සේලා ඒ අය ආශ්‍රය කරනවා නේ. හැබැයි, බයිසිකලයක්වත් ගන්න බැරි ගොවියා අන්තිමට මහ පාරට ඇදගෙන වැටෙන තැනට ආර්ථිකය කඩාගෙන වැටිලා තිබෙනවා.

ගොවීන්ට පොහොර ටික වෙලාවට දුන්නේ නැහැ. නමුත්, තමුන්නාන්සේලා ගොවීන්ට පොහොර සහනාධාරය දෙන්න පොරොන්දු වුණා. ඒ වාගේම, ගොවීන්ගේ අස්වැන්න මිලදී ගන්නේ නැහැ. වගා හානිත් සිදු වෙනවා. "දිට්වා" සුළි කුණාටුව නිසා වගාවට හානි වුණා; භූමියට හානි වුණා. නමුත්, ඒවාට වන්දි ගෙවන්නේ නැහැ. ගෙවල් කැඩුණු අයට ගෙවල් දෙනවා කිව්වා. අපි ඒ ආපදාවට පත් ප්‍රදේශවලට ගියාම තමුන්නාන්සේලාගේ පක්ෂවල අය කිව්වා, ගෙවල් හදන්න ඉඩම් බලා තිබෙන්නේ කියලා. හැබැයි, අන්තිමට මොකද වුණේ? ඒ ජනතාව කොතැනද ඉන්නේ, කොතැනටද යන්නේ කියන එක පිළිබඳව තවම අවබෝධයක් නැහැ. ඒ හානි වුණු නිවාස ගැන කථා කරද්දී, තහඩුවක් ගියත් රුපියල් ලක්ෂ 10ක් දෙනවාය කිව්වා. "දිට්වා" සුළි කුණාටුව නිසා සිදු වූ හානිය හේතුවෙන් නව නිවසක් ඉදිකිරීමට ඉඩමක් නොමැති නම් ඉඩම් මිලදී ගැනීමට රුපියල් ලක්ෂ 50කුත්, පූර්ණ ලෙස හානි වූ නිවස වෙනුවට නව නිවසක් ඉදිකර ගැනීමට රුපියල් ලක්ෂ 50කුත් විධියට රුපියල් ලක්ෂ 100ක් දෙනවාය කිව්වා. ජනාධිපතිවරයා විශ්වාස කරලා රුපියල් ලක්ෂ 100ක් බලාපොරොත්තුවෙන් තමයි ජනතාව තමන්ගේ ජීවිතය බේරා ගෙන ගියේ. හැබැයි, ඊට සතියකට කලින් ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී කිව්වා, "බොරු කියන්න ඕනෑ නම් පාර්ලිමේන්තුවේදී කියන්න, ඇත්ත කියන්න ඕනෑ නම් එළියේදී කියන්න" කියලා. ඒ දෙකම වුණා. බොරුවකුත් කිව්වා. ඒ බොරුව පාර්ලිමේන්තුවේදීත් කිව්වා. අඩු ගණනේ තමුන්නාන්සේලාට යම්කිසි අවශ්‍යතාවක් තිබෙනවා නම් ව්‍යාපාරිකයෝ පිට රටින් ගෙනෙන භාණ්ඩවල බදු අඩු කළාට කමක් නැහැ. සාමාන්‍ය මිනිසුන්ට බදු වැඩි කරනවා, පිට රටින් ගෙනෙන භාණ්ඩවල බදු අඩු කරනවා. ඒක ඔබේ ප්‍රතිපත්තිය වෙන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ආණ්ඩුවට කියනවා, කරුණාකර ගොවියා ආරක්ෂා කරන්න, ධීවරයා ආරක්ෂා කරන්න කටයුතු කරන්න කියලා. ගොවියා, ධීවරයා ආරක්ෂා නොකර, ආහාර සුරක්ෂිතතාව තහවුරු කරන්නේ නැතුව තමුන්නාන්සේලාට ඉදිරි ගමනක් නැති වෙනවා. ඒ වාගේම රටට ගමනක් නැති වෙනවා. එම නිසා ඒ සඳහා අවධානය යොමු කරන්න.

ගිණුමේ ට්‍රිලියනයක් තිබෙනවා, ඕනෑම වෙලාවක වන්දි ගෙවන්න පුළුවන් කිව්වා. ට්‍රිලියනයක් ගිණුමේ තිබෙනවා කියලා වන්දි ගෙවන්න ආවා. හැබැයි, දීපු cheque එකත් return වෙලා; දීපු cheque එකත් ආපස්සට ඇවිල්ලා. රුපියල් බිලියන 10ක් ගිණුමේ තිබෙනවාද, වෙන කාගේ හෝ ගිණුමකට බැර වෙලාද කියන්න අපි දන්නේ නැහැ. හැබැයි, අපි ඔබෙන් ඉල්ලන්නේ කරුණාකර ඒ ගොවීන්ගේ ප්‍රශ්නයට ඔබතුමන්ලා මැදිහත් වෙන්න කියන එකයි.

පසුගිය දවසක මාදැල් ධීවරයෝ සහ උපාධිධාරීන් ජනාධිපතිතුමාව හමු වෙන්න ආවා. ජනාධිපතිතුමා හමු වුණාම එතුමාගේ හොඳ කියාගෙන ගියා. දැන් අපි බලාගෙන ඉන්නවා, තමුන්නාන්සේලා ඒ දීපු පොරොන්දුව ඉටු කරනවාද කියලා. මොකද, මැතිවරණ කාලයේ මේ හැමෝම ඔබ වෙනුවෙන් වැඩ කරපු අය, ඔබට ඡන්දය දීපු අය. ඔබට අයිතියක් ලැබී තිබෙනවා වාගේම ඔබට ඉටු කරන්න යුතුකමකුත් තිබෙනවා. මැතිවරණයේදී ඒ අය ඔබ වෙනුවෙන් වැඩ කළා නම්, ඔබට ඡන්දය දුන්නා නම්, ඒ අයගේ අහිංසක බලාපොරොත්තු ඉටු කරන්න ඔබට වගකීමක් තිබෙනවා.

ඊළඟට, ඊශ්‍රායලයේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ රැකියා සඳහා තිබෙන ආණ්ඩුවේ quota එක පෞද්ගලික අංශයට දීලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ නිලධාරීන් සහ ඇමතිවරයා කිව්වා, 750දෙනෙකුට ඊශ්‍රායලයට යන්න ලැහැස්ති වෙන්න කියලා. හැබැයි, අද වනකොට ඇමතිවරයා හමු වෙන්න බැරි වෙලා තිබෙනවා. නියෝජ්‍ය ඇමතිවරයාගෙන් වෙලාවක් වෙන් කර ගන්න බැරි වෙලා තිබෙනවා. Foreign Employment Bureau එකට ගියාම බැණලා එළවන තැනට පත් කරලා තිබෙනවා. ඒ 750දෙනා ඊශ්‍රායලයට යවන එක කණ්ඩායමක් පමණයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ අතරේ ආණ්ඩුවෙන් තවත් පිරිසක් ඊශ්‍රායලයට යවන්න ලැහැස්ති කරනවා. Training එක ඉවර කරලා, යන්න ලැහැස්ති වෙන්න කියපු අය ඊශ්‍රායලයට යන්න බලාගෙන ඉන්නවා. මාස 10ක්, 12ක් ගත වෙලාත් තවම ඔවුන්ට ඊශ්‍රායලයට යෑමට බැරි වෙලා තිබෙනවා. නමුත්, ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් මොකක්ද කරන්නේ? තවත් කට්ටිය එකතු කර ගන්නවා, ඊශ්‍රායලයට යවනවා කියලා. හැබැයි, විශාල මුදලක් අරගෙන පෞද්ගලික අංශයෙන් ඊශ්‍රායලයට කට්ටිය යවනවා. ආණ්ඩුවෙන් ලැබුණු quota එකෙන් ඊශ්‍රායලයට යවන්නේ නැහැ. සල්ලි තිබෙන කෙනාට ඊශ්‍රායලයට යන්න අවස්ථාව ලබා දෙනවා. තමුන්නාන්සේලා ඒකට සම්බන්ධද, නැද්ද කියන්න මම දන්නේ නැහැ. හැබැයි, ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඉන්න කිහිප දෙනෙක් හරහා ඊශ්‍රායලයට යන්න පුළුවන්. මේක ඉතාම අසාධාරණයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කටයුත්ත වෙන්න දෙන්න එපා. අපි ආණ්ඩුවට කියන්නේ මේ කටයුත්ත වෙන්න දෙන්න එපා කියලායි. මේ 750දෙනාට සාධාරණයක් ඉෂ්ට කරන්න. ඔවුන් රස්සාවලිනුත් අයින් වෙලා. ඔබතුමන්ලාට සහයෝගය දීපු ඒජන්සි තිබෙන අය ඉන්නවා නම්, ඒ අය මාර්ගයෙන් යවා ගන්න. ඒක ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒ 750දෙනාට සාධාරණයක් කරන්න. මම මේ කිව්වේ එක ක්ෂේත්‍රයක් පිළිබඳව විතරයි. කොරියාවේ රැකියා සම්බන්ධයෙනුත් මේ හා සමාන ගැටලුවක් පැන නැඟිලා තිබෙනවා. අඩු ගණනේ, මේවාට ඇහුම්කන් දෙන්න.

තමුන්නාන්සේලා ජාතික ආරක්ෂාව ගැන කියන්න උත්සාහ කරනවා, Cricket World Cup එක සම්බන්ධ කරගෙන. අපේ රටේ ඉතිහාසයේ ඉඳන්ම හැම අවස්ථාවකම - යුද්ධය පැවතුණු වෙලාවේදී පවා - අපි ජාත්‍යන්තර තරගාවලි ආරක්ෂිතව පැවැත්වූවා. අපේ කණ්ඩායම පාකිස්තානයට ගිය වෙලාවක ඔවුන්ට වෙඩි තැබුවා. එවැනි තත්ත්වයක් තිබියදීත් අපේ ක්‍රිකට් කණ්ඩායම නැවත වතාවක් පාකිස්තානයට ගියා. අනුර කුමාර ජනාධිපතිවරයාගේ කාල සීමාවේදීත් අපේ ක්‍රිකට් කණ්ඩායම පාකිස්තානයට ගියා. ඒ වෙලාවේදීත් පාකිස්තානයේ බෝම්බයක් පිපිරුවා. හැබැයි, අපේ කණ්ඩායම ලංකාවට ගෙන්වූයේ නැහැ. ඒ අවස්ථාවේදී ආණ්ඩුව මැදිහත් වුණා. Sri Lanka Cricket එක මැදිහත් වුණා. තමන්ගේ තිබෙන සම්බන්ධතා ආරක්ෂා කළා. ඒවා වෙන්න ඕනෑ. ජනාධිපතිවරයාගේ මැදිහත් වීමක් තිබෙනවා නම්, Sri Lanka Cricket එකේ මැදිහත් වීමක් තිබෙනවා නම් ඒක වෙන්න ඕනෑ; ඒක හොඳයි. හැබැයි, තමුන්නාන්සේලා ජාතික ආරක්ෂාව සහ පුරවැසියාගේ ආරක්ෂාව තහවුරුයි කියලා කිව්වාට ඔබතුමන්ලාගේ පක්ෂ කාර්යාලයට යන පාරට එහා පැත්තෙන් පිහිටි අකුරේගොඩ හමුදා මූලස්ථානය ආසන්නයේ නීතිඥවරයෙක් සහ ඔහුගේ බිරිඳ ඝාතනය කරපු එක සම්බන්ධයෙන් ලබා දෙන උත්තරය මොකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒකට දෙන උත්තරය මොකක්ද? විනාඩි 10ක්, 15ක් යන්න කලින් පොලීසිය භාර ඇමතිවරයා මොකක්ද කියන්නේ? මේ, පාතාල ක්‍රියාකාරකම් කරන පාතාල සංවිධානවල පිරිසක් ලු, ඒ නීතිඥවරයා සංවිධානාත්මක අපරාධකරුවන් වෙනුවෙන් පෙනී සිටිනවා ලු. මෙන්න, ආණ්ඩුවේ උත්තරය. අපි මේ කාරණය අහන්න කැමැතියි. ගරු හර්ෂණ නානායක්කාර අධිකරණ ඇමතිවරයාත් නීතිඥවරයෙක්. එතුමාටත් ඉතිහාසයක් තිබෙනවා. එතුමාගේ සේවාදායකයන් ගැන බැලුවොත්, අපටත් එහෙම කියන්න පුළුවන්. මම ඒක කියන්නේ නැහැ. ඒක මම කියන්නේ නැත්තේ නීතිඥ වෘත්තියට තිබෙන ගෞරවය නිසා. එහෙම නම්, එතුමාත් සංවිධානාත්මක අපරාධකරුවන් ආශ්‍රය කරලා තිබෙනවා නේ. එතුමාගෙන් අහන්නකෝ. ඔබතුමන්ලා මහ ලොකුවට කරේ තියාගෙන plane එකේ අරගෙන ආපු අයට පෙනී සිටියේ නැද්ද කියලා අහලා බලන්නකෝ. හැබැයි, ඒක වෘත්තිය; එතුමාගේ profession එක, රාජකාරිය. ඒකට අපි අභියෝග කරන්නේ නැහැ. හැබැයි, තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ? නීතිඥවරයා ඝාතනයට ලක් වුණාට පස්සේ ඒ ඝාතනයත් සම්පූර්ණයෙන් සාධාරණීකරණය කරන්න උත්සාහ කරනවා, සංවිධානාත්මක අපරාධකරුවන්ගේ ඇඟට දාලා. ඒ කියන්නේ, පැහැදිලිවම සමහර සංවිධානාත්මක අපරාධ කල්ලි පිටුපස ආණ්ඩුව ඉන්නවා කියන එකයි. ඒක පැලවත්තෙන් පාලනය වෙනවාද, ජනාධිපති කාර්යාලයෙන් පාලනය වෙනවාද, අගමැති කාර්යාලයෙන්ද කියන්න අපි දන්නේ නැහැ.

අග්‍රාමාත්‍යවරිය මන්නාරමට ගියා. ගිහිල්ලා කිව්වේ මොකක්ද? යුද්ධය කළේ එතුමියගෙන් අහලා නොවෙයි ලු. එතකොට 1988-89 කාලයේ සිද්ධි වුණේ අහලාද? යුද්ධයක් තිබුණා. ත්‍රස්තවාදයක් තිබුණා. දැන් ඒක ඉවරයි. ඔබතුමන්ලා තවදුරටත් ජාතිවාදය අවුස්සාගෙන ඒ පැතිවලට ගිහිල්ලා මිනිසුන්ගේ හදවත් එක්ක සෙල්ලම් කරන්න උත්සාහ කරනවා නම්, ඒක සාධාරණ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඊට අමතරව මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඔබතුමන්ලාට කටක් ඇරලා රණ විරුවෙකුට රණ විරුවෙක් කියලා කියන්න බැහැ. නිදහස් දිනයේදී රණ විරුවන් කරපු කාර්යය ගැන කථා කරන්න බැහැ. හැබැයි, ආණ්ඩුවේ ආයතනයක strike එකක්, උද්ඝෝෂණයක් යනවා නම්, වෘත්තීමය ක්‍රියාමාර්ගයක් යනවා නම්, කෝච්චි එළවන්න රණ විරුවන් පාවිච්චි කරන්න හොඳයි. හැබැයි, "රණ විරුවා" කියන්න බැහැ. යුද්ධය ජයග්‍රහණය කරපු එක ගැන කියන්න තහනම්. ලජ්ජයි, ඔබතුමන්ලාට. මට ලජ්ජා නැහැ. ඔබතුමන්ලාට ලජ්ජා ඇති. හැබැයි, මොකක් හරි ප්‍රශ්නයක් වුණොත් -කුණාටුවක් ආවොත්, සුළි සුළඟක් ආවොත්, කෝච්චි strike කළොත්, බස් strike කළොත් - දුවගෙන යන්නේ කවුරු ගාවටද? ත්‍රිවිධ හමුදාවටයි, පොලීසියටයි ගිහිල්ලා කියනවා, අපට මේකට උදවු කරන්න කියලා. "දිට්වා" සුළි කුණාටුව වෙලාවෙත් එහෙමයි. හැබැයි, ඒ අයට ගෞරවයක් දෙන්න, ඒ අය වෙනුවෙන් කථා කරන්න ඔබතුමන්ලාට හැකියාවක් නැහැ. ඔබතුමන්ලා උත්සාහ කරන්නේ මර්දනය කරලා, බය කරලා තමන්ගේ ආණ්ඩුව අරගෙන යන්නයි.

අපි දැක්කා, වෛද්‍යවරු ගැන ඔබතුමන්ලාගේ මතය. වෛද්‍යවරුන්ගේ අයිතියක් පිළිබඳව ඒ අය කථා කරනවා. ඒ අයගේ ඉල්ලීම් තිබෙනවා. ඒවාට ඇහුම්කන් දෙන්න ඕනෑ. ඒවාට ඇහුම්කන් දෙන්න ඔබතමුන්නාන්සේලාට වගකීමක් තිබෙනවා. හැබැයි, ඒවාට ඇහුම්කන් දෙන්නේ නැතිව මොකක්ද කරන්නේ? "වෛද්‍යවරුන්ට කියන්නකෝ, උද්ඝෝෂණය කරලා බලන්න කියලා" යනුවෙන් කියනවා. නැත්නම්, "වෘත්තීමය ක්‍රියාමාර්ග ගැන අපි බලාගන්නම්; ජනතාව බලා ගනීවි" කියනවා. ඔහොම තමයි ඔබතමුන්නාන්සේලා අරගළය වෙලාවේ උසි ගන්වලා 12දෙනෙක් පෝරකේට ගියේ. අරගළය වෙලාවේත් ඔහොමම උසි ගන්වලා මිනිස්සු පාරට බස්සලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මරාගෙන අන්තිමට 12දෙනෙක් එල්ලුම් ගස් ගියා. අන්තිමට, මෙහෙයවපු කට්ටිය රජ වුණා. ඒ මිනිසුන් වෙනුවෙන් කථා කරන්න කෙනෙක් නැහැ, ඊට පස්සේ. ඒ හින්දා කරුණාකරලා ඔබතමුන්නාන්සේලා පටු මානසිකත්වයෙන් මේක දිහා බලන්න එපා. මේ රටේ ආර්ථිකය ගොඩ නඟන්න, සමාජය ගොඩ නඟන්න, ජන ජීවිතය ගොඩ නඟන්න පැහැදිලි දැක්මක් එක්ක යන්න.

ඔබතුමන්ලා වල් පැළ අයින් කරලා මල් පැළ 159ක් නේ, ගෙනාවේ. ඒ කාලයේ කිව්වේ කදිර්ගාමර් මහත්මයා වාගේ,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

කදිර්ගාමර් මහත්මයා වාගේ 159ක් පාර්ලිමේන්තුවට ආවා කියලා නේ කිව්වේ. අර, පාස්පෝට් 17ක් හොරට හදාගෙන ගියා. තවම දන්නේ නැහැ, හදාගෙන ගිය කෙනා කවුද කියලා. හැබැයි, එන්නේ හොරු අල්ලන්න. තමන්ගේ අමාත්‍යාංශයේ. පාස්පෝට් ටික හොරට හදාගෙන ගියා, ලේකම්වරයෙක්. ආණ්ඩුව ආවා විතරයි. අද වෙනකම් ඇල්ලුවාද, කවුද පාස්පෝට් ටික හදාගෙන ගියේ කියලා? නැහැ.

කන්ටේනර් 323ක් වරායෙන් පැන්නුවා. අපි අදටත් ඒ ගැන අහනවා. කුඩු කන්ටේනර් දෙකක් වරායෙන් එළියට දැම්මා කියලා කිව්වා. කුඩු කන්ටේනර් දෙකක් වරායෙන් එළියට දාලා මිද්දෙනියට ගියා කියලා කිව්වා. අපි ආණ්ඩුවෙන් අහනවා, කවුද ඒ කන්ටේනර් දෙක එළියට දමන්න ලියුම දුන්නේ කියලා. ජාත්‍යන්තර බුද්ධි අංශ තොරතුරක් තිබෙනවා නම්, මේ රටේ Sri Lanka Customs එකට හෝ වරායට ඒ කන්ටේනර් දෙක ලිඛිත දැනුම් දීමකින් තොරව කිසි දවසක එළියට දමන්න බැහැ. අපි අහනවා, ලියුම දුන්නේ ජනාධිපතිතුමාද, පොලීසිය භාර ඇමතිවරයාද, පොලිස්පතිවරයාද කියලා. මේ තුන්දෙනාගෙන් මේ කුඩු කන්ටේනර් දෙක එළියට දමන්න අවසර දුන්නේ කවුද ?

අවසාන වශයෙන් මම ඉල්ලන්නේ, ඔබතමුන්නාන්සේලාගේ පටු මානසිකත්වය, වෛරය, ඔබේ මහන්තත්තකම පැත්තක තියලා මේ වෘත්තීය සමිතිවලට, වෛද්‍යවරුන්ට ඇහුම්කන් දෙන්න කියන එකයි. ඒ වාගේම තමයි, ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන්, පුද්ගලයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. පාතාලය හිස ඔසවලා තිබෙන්නේ. මිනිස්සුන්ව මරනවා. ඒක වළක්වන්න, ඒක නවත්වන්න යම් සාධාරණ, සාර්ථක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම මම කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.07]

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්තටම නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන හිටියාට පස්සේ සැහෙන්න හිනා යනවා. ජුලම්පිටියේ අමරේලා පිටුපස තියාගෙන දේශපාලනය කරපු කට්ටිය, මෙතැනට ඇවිල්ලා කියන කථා අහන කොට ඇත්තටම හිනා යනවා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

මම ඒකට උත්තරයක් දෙන්නද?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

උත්තරය අහගන්න. මම ඔබතුමාගේ ප්‍රශ්නවලට උත්තර දෙන්නම්. අහගන්න උත්තර ටික.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉස්කෝලයක ගුරුවරයෙක් ළමයින්ට උගන්වන ගමන් මෙන්න මේ වාගේ කවියක් ලියනවා. ඒ කවියේ තිබෙන්නේ මෙහෙමයි. ගුරුවරයා ළමයින්ට කියනවා,- *[බාධා කිරීමක්]* නාමල් රාජපක්ෂ මැතිතුමා, නැඟිටලා යන්න එපා. වාඩි වෙලා ඉන්න. අහගන්න. විනාඩි 11යි. අහගෙන ඉන්නකෝ. ඔබතුමා කියන කොට අපි අහගෙන හිටියා, දැන් මේ ටික අහගෙන ඉන්න. විනාඩි 11න් උත්තර දෙන්නම් අහගන්න. *[බාධා කිරීමක්]* ගුරුවරයා ළමයින්ට කියනවා, "තිබෙනවා අපිට ජාතික ගීයක්. වෘක්ෂයක්, පුෂ්පයක්, ක්‍රීඩාවක්" කියලා. පිටුපසම පේළියේ ඉන්න ළමයෙක් නැඟිටලා උත්තර දෙනවා. "සමාවෙන්න සර්, ඒත් කෝ අපිට ජාතියක්?" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වසර ගණනාවක් තිස්සේ ලාංකීය ජාතිය ගොඩනැඟෙන්න ඉඩ දුන්නේ නැහැ. ඒකට ගිනි පිම්බා. ඒ ගිනි මකරෙක් තමයි ඔය ඉස්සරහා හිටියේ. ඒ ශිෂ්ටාචාරයට ගිනි තියලා තිබුණේ. ජාතිවාදී ගිනිදැල්වලින් ශිෂ්ටාචාරයට ගිනි තිබ්බා. ඒ ගිනිදැල්වලින් දශක ගණනාවක් තිස්සේ ලංකාවේ මානව සංවර්ධනය කඩාකප්පල් කළා. වසර ගණනක් මානව සංවර්ධනය ඇනහිටලා තිබ්බා. ඒ ගිනි තියලා අපේ රටේ භෞතික සංවර්ධනය වසර ගණනාවක් තිස්සේ අයින් කරලා තිබ්බා. අපේ ශිෂ්ටාචාරය ගමන් ගත්තේ අළු ගොඩවල් උඩින්. ඒකේ නායකයෝ තමයි මේ. දැනුත් උත්සාහ දරන්නේ ඒ ජාතිවාදී ගිනිදැල්වලින් මේ රට ගිනි තියන්න තමයි. ඒකට අපි ඉඩ තියන්නේ නැහැ. ඒක හොඳට මතක තියා ගන්න කියා අපි ඒ අයට කියනවා.

අපට arrears එකක් cover කරන්න තිබෙනවා. මොකක්ද ඒ arrears එක? මේ රටේ වසර ගණනාවක් ගිලිහුණු මානව සංවර්ධනයේ arrears එක අපි cover කර ගන්න ඕනෑ; ඒ arrears එක මේ ජනතාවට ලබා දෙන්න ඕනෑ. අපිට තිබෙනවා, තව arrears එකක් cover කරන්න. මොකක්ද? වසර ගණනාවක් තිස්සේ අපේ රටේ නැති වෙච්ච භෞතික සංවර්ධනය අපි මේ ජනතාවට අත් කර දෙන්න තිබෙනවා. ඒ වෙනුවෙන් අපි කැප වෙනවා. අපට කථා කරන්න වසරක ශේෂ පත්‍රයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

කලින් කථා කරපු මන්ත්‍රීවරු, ඇමතිවරු අද ඉදිරිපත් කර තිබෙන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් ගැන, රේගු ආඥාපනත යටතේ යෝජනා සම්මතය, මෝටර් වාහන පනත යටතේ නියෝග සම්බන්ධව කථා කළා. ඒ නිසා මම වැඩි කාලයක් ගත කරන්නේ නැහැ, ඒ සම්බන්ධව කථා කරන්න. අපි ජනතාව ඉදිරියේ පොරොන්දු දීලා ආවේ, මේ රටේ ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා දේශපාලනික පරිවර්තනයක් ඇති කරනවා කියලා. මේකේ කොටස් හතරක් තිබෙනවා. ඒ තමයි, ආර්ථික, සමාජයීය, දේශපාලනික හා සංස්කෘතික පරිවර්තනය. ඒකේ දේශපාලන පරිවර්තනය වසරක් යන විට ශේෂ පත්‍රය තුළින් අපි ඉටු කරලා තිබෙනවා, ආයෙත් බිම පැළ වෙන්න බැරි ආකාරයට. උඩ ඉඳලාම, ජනාධිපතිගේ ඉඳලාම තිබෙන වරප්‍රසාද අඩු කරලා තිබෙනවා. මැති ඇමතිවරු ගත්තොත්, ඩීසල්, වාහන, නිල නිවාස, වැටුප් සියල්ල අඩු කරලා අපි ඒ කියපු දේවල් ඉටු කරලා තිබෙනවා. ඊයේ දින සම්මත වුණු පනතත් එක්ක අපි දීපු පොරොන්දු අනුව මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුපත් අහෝසි කරලා තිබෙනවා. වසරක ශේෂ පත්‍රයක් තුළ දේශපාලන සංස්කෘතියේ පරිවර්තනය අපි කරලා පෙන්වලා තිබෙනවා.

ඒ වාගේම තමයි, දූෂණය සම්බන්ධයෙනුත්. අපි කියපු දේවල්වලින් කරන්න බැරි වුණු එකක් සම්බන්ධයෙන් තමයි, අද ඔය නැඟිටලා කථා කළේ. කරන්න ප්‍රමාද වුණු එකක්. අපි ඒවාට අත දමන්නේ නැහැ. ඒවා ස්වාධීන ආයතන. ඒවාට නිදහසේ හැසිරෙන්න ඉඩ දෙනවා. ඒ ප්‍රමාදය නිසා තමයි, ඔය නැඟිටලා කථා කරන්නේ. මතක තබා ගන්න. Corruption Perceptions Index - CPI - එකේ ස්ථාන 14ක් ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. ලකුණු 33යි තිබුණේ 35ට ආවා. ආණ්ඩුකරණය වෙනස් වුණා. නමුත්, රාජ්‍ය යන්ත්‍රණය සම්පූර්ණයෙන් වෙනස් වෙලා නැහැ. අපි හිතනවා, කාලයත් එක්ක ඒකත් උඩට එයි කියලා.

ඊළඟට ආර්ථිකය ගත්තොත්, ජංගම ගිණුමේ - Current Account එකේ - 1950 ඉඳලා 2023 දක්වා හත්වතාවයි අතිරික්තයක් තිබුණේ. 1950දී ඇමෙරිකානු ඩොලර් මිලියන 28ක් තිබුණා, 1951දී ඩොලර් මිලියන 14ක් තිබුණා. 1954, 1955, 1956, 1965 හා 1977 වර්ෂවල අතිරික්තයක් තිබුණා, එච්චරයි. හත්වතාවයි අතිරික්තයක් තිබුණේ. 2023-2024 කාල සීමාවේ ආනයන සීමා කරලා තිබුණු නිසා යම්තාක් දුරට අතිරික්තයක් ආවා. හැබැයි, අපි 2025 අවුරුද්ද අවසන් කළේ, ජංගම ගිණුමේ ඩොලර් මිලියන 1,733ක අතිරික්තයක් එක්කයි. තේ කඩයක්වත් කරන්න බැහැ කියපු ජාතික ජන බලවේගය රටක් කරලා පෙන්වපු හැටි තමයි ඒ. අපි මේ සාර්ථකත්වය ගත්තේ කොහොමද? පසුගිය ආණ්ඩුව පෙරළුණේත් අපේ රටේ තිබුණු විදේශ සංචිත ප්‍රමාණයේ හිඟකම නිසායි.

මෙතැනදී කරුණු හතරක් තිබෙනවා. එක කාරණයක් තමයි, අපේ රටේ ශ්‍රමිකයා පිටරට ගිහින් වැඩ කරලා අපේ රටට එවන ඩොලර් ප්‍රමාණය. ගිය අවුරුද්දේ එය ඩොලර් බිලියන 8.1යි. එය ඉතිහාසයේ ඒ අංශයෙන් උපයපු වැඩිම ඩොලර් ප්‍රමාණය. රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා අද ත්‍රිරෝද රථවල නඟින අය දේශපාලන පක්ෂවලට දක්වන කැමැත්ත අකමැත්ත ගැන. ඒ මන්ත්‍රීතුමා මේක අහගෙන ඉන්නවා නම්, මම එතුමාට කියනවා අර එතුමා කියපු ත්‍රිරෝද රථයට නඟින කෙනාට අපේ ආණ්ඩුවේ සාර්ථකත්වය ගැන මතක් කරලා දෙන්න කියලා. ත්‍රිරෝද රථයෙන් බැහැලා යන කොට පොහොට්ටුවේ කෙනෙකු වෙනවාය කියපු කෙනාට මතක් කරලා දෙන්න, අපේ විදේශ සේවා

නියුක්තිකයන් ගිය අවුරුද්දේ මේ රටට එවපු මුදල් ප්‍රමාණය ඩොලර් බිලියන 8.1ක් බව. එම අංශයෙන් ඉතිහාසයේ වැඩිම ඩොලර් ප්‍රමාණය ලබා ගත්තේ ජාතික ජන බලවේගය ආණ්ඩුවයි.

තවත් කාරණයක් තමයි, අපේ රටේ භාණ්ඩ හා සේවා පිටරටට යැව්වාම ලැබෙන ඩොලර් ප්‍රමාණය. ගිය අවුරුද්දේ එය ඩොලර් බිලියන 17.21යි; 2024 වර්ෂයට සාපේක්ෂව සියයට 5.6ක වර්ධනයක්. එයත් එම අංශයෙන් ඉතිහාසයේ වැඩිම ප්‍රමාණයයි. රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා අර කියපු කෙනා ත්‍රිරෝද රථයට නඟින කොට මතක් කරලා දෙන්න ඒක. මා ඒ කිව්වේ අපි භාණ්ඩ හා සේවා අපනයනයෙන් ලැබූ ආදායම. භාණ්ඩ අපනයනයෙන් විතරක් ලැබූ ආදායම ඩොලර් බිලියන 13.76යි. ඉතිරි ඩොලර් බිලියන 3.65 සේවා අපනයන ආදායමයි. එයත් ඉතිහාසයේ වැඩිම ප්‍රමාණය. තේ කඩයක්වත් කරන්න බැහැ කියපු ජාතික ජන බලවේගය කරලා පෙන්වා තිබෙනවා, රටක් හදන හැටි.

ඊළඟ කාරණය, Foreign Direct Investments - FDIs. එය ගිය අවුරුද්දේ ඩොලර් මිලියන 1,057යි. එයත් ඉතිහාසයේ වැඩිම ප්‍රමාණය.

ඊළඟ කාරණය, සංචාරක කර්මාන්තයේ ඉපැයීම්. ඒ ගැන කලිනුත් කිව්වා. 2018 වර්ෂයේ තමයි එතෙක් ඉතිහාසයේ වැඩිම සංචාරකයන් පිරිසක් අපේ රටට ආවේ. ඒ ප්‍රමාණය තමයි 2.3 million. මෙවර අපි එය වැඩි කරගෙන තිබෙනවා. ආදායම US Dollars 3.2 billion. එම අංශයේත් ඉතිහාසයේ වැඩිම ප්‍රමාණය අපි වාර්තා කර තිබෙනවා. ඒ වර්ෂ දෙක සංසන්දනය කරලා බලන්න. අපි තබපු record එක අපිම කඩ කඩා යනවා.

විදේශ ප්‍රේෂණ ගත්තොත්, 2025 ජනවාරි මාසයේ අපි තබපු record එක ඩොලර් මිලියන 573යි. එය 2026 ජනවාරි වෙනකොට ඩොලර් මිලියන 751යි. අපේ රටට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව ගත්තොත්, 2025 ජනවාරි වෙනකොට අපේ රටට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව 252,761යි; 2026 ජනවාරි වෙනකොට 277,327යි. අපි තබපු වාර්තා අපිම කඩා කඩා යනවා.

ඩොලර් විතරක් නොවෙයි, අපි රුපියල් ආදායමත් ස්ථාවර කරගෙන තිබෙනවා. ඒ කොහොමද? ශ්‍රී ලංකා රේගුව - Sri Lanka Customs - රුපියල් බිලියන 2,500කට වැඩි ආදායමක් ලබාගෙන තිබෙනවා. අපි ඒ කට්ටියට වැඩ කරගෙන යන්න නිදහස දුන්නා. ඒ අය වාර්තාගත ආදායමක් පෙන්වා තිබෙනවා. එය ඉතිහාසයේ ඒ අයගේ වැඩිම ආදායම. සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම රුපියල් බිලියන 230යි. එයත් ඉතිහාසයේ ඔවුන්ගේ වැඩිම ආදායම. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම රුපියල් බිලියන 2,200ට වැඩියි. එයත් ඉතිහාසයේ ඔවුන්ගේ වැඩිම ආදායම. මොනවාද මේ ශේෂ පත්‍රයෙන් පෙන්නුම් කර තිබෙන්නේ. ඒ තමයි අප කියපු, අවුරුද්දක ආර්ථික, සමාජයීය සහ දේශපාලන සංස්කෘතියේ පරිවර්තනයේ ප්‍රතිඵල. ඒවා තමයි මිනිස්සු දන්නේ සහ අප පුන පුනා කිව යුත්තේ. මතක තියාගන්න, ඒ ප්‍රතිඵල ලබා ගත්තේ ජාතික ජන බලවේගයේ අප විචක්ෂණශීලීව, ක්‍රියාශීලීව, කැපවීමෙන් වැඩ කිරීම නිසා බව. අදූෂිත පාලනය මඟින් අප කරපු දේවල් තමයි මේ පෙන්නුම් කර තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කියන්න ලජ්ජයි දැන් විපක්ෂයට වෙලා තිබෙන දේ. විපක්ෂය දැන් සොය සොයා යන්නේ මොකක්ද? Strike එකක්. මොකද, ලේවලින් ලියා දෙන්න තිබෙනවා නේ. වෙන විකල්ප නැහැ. Strike එකක් කොහේද, එතැනට යනවා. එතැන තමයි එතුමන්ලාගේ දේශපාලනය තිබෙන්නේ. අපි විපක්ෂයට කියනවා, එතුමන්ලාගේ දේශපාලනය කරගෙන යන්නේ මේ ආකාරයෙන් නම්, එතුමන්ලාට වැඩිකල් යන්න හම්බ වෙන්නේ නැහැ කියලා.

අපි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කර තිබෙනවා. 2025 අවුරුද්දේ රුපියල් බිලියන 110ක් වෙන් කළා, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම වෙනුවෙන්. 2026 අවුරුද්දේ වෙන් කළා තවත් රුපියල් බිලියන 110ක්. ඒ වාගේම තවත් රුපියල් බිලියන 110ක් වෙන් කරනවා, ලබන අවුරුද්දේත්, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම වෙනුවෙන්.

අපි දන්නවා, එදා ගුරු වෘත්තිය කොතැනද තිබුණේ කියලා. එදා ගුරු වෘත්තිය තිබුණේ ගොඩක් පහළ තැනක. ඒ අයට වැටුප් ලැබුණේ සීමාසහිතව. ගුරු වෘත්තිය තුළ ප්‍රශ්න ගොඩක් තිබුණා. හැබැයි, අද වනකොට ගුරු වෘත්තිය කරන අයට විශාල වැටුපක් ලැබෙනවා. ඒ තුළ ඔවුන්ට අභිමානයෙන් යුතුව තමන්ගේ වෘත්තිය කරන්න පුළුවන්. අපි ගුරුවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, ආයෙත් මේ වාගේ විපක්ෂයක් ඇති නොවෙන්න උගන්වන්න කියලා; ආයෙත් මේ වාගේ ජනතා නියෝජිතයන් පාර්ලිමේන්තුවට නොඑන්න දරුවන්ට අකුරු කියලා දෙන්න කියලා. ඒක ඔවුන්ගේ වගකීම. මේ ආකාරයෙනුයි අප රට හදන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මේ ආකාරයෙන්, අප කියපු හැම කරුණක්ම එකින් එක, පැහැදිලිව පෙන්නුම් කර තිබෙනවා; ආර්ථික, සමාජීය සහ දේශපාලන සංස්කෘතියේ පරිවර්තනය අප එකින් එකට, කරුණු සහිතව පෙන්නුම් කර තිබෙනවා.

මේ රට වැටෙනවා කියලා අර කාගේදෝ මොකක්දෝ වැටෙනවා වාගේ බලන් ඉඳලා හරියන්නේ නැහැ. ආණ්ඩු බලය ගන්න නම් විපක්ෂය මීට වඩා හොඳ වෙන්න ඕනෑ. අප පෙන්නපු ඉලක්කම්වලට වඩා වැඩි ඉලක්කම්වලට යන්න ඕනෑ.

ආර්ථික වර්ධන වේගය 2025 වසරේ පළමු කාර්තුවේ සියයට 4.8යි, දෙවැනි කාර්තුවේ සියයට 4.9යි, තුන්වැනි කාර්තුවේ සියයට 5.4යි. විදේශ සංචිත ප්‍රමාණය ගනිමු. ණය විධියට ගෙව්වා, ඩොලර් බිලියන 3.9ක්. වාහන ආනයනය කරන්න දුන්නා, ඩොලර් බිලියන 1.9ක්. එහෙම තත්ත්වයක් තිබියදීත් අපි විදේශ සංචිත පවත්වා ගත්තා ඩොලර් බිලියන 6.8ක. ඒ වාගේම, අපි රුපියලේ අගය ස්ථාවරව තබාගෙන ඉන්නවා, ඩොලරයේ අගය රුපියල් 310ට අඩුවෙන් පවත්වා ගනිමින්. මොකක්ද මේ? අපේ ආණ්ඩුවේ මනා ආර්ථික කළමනාකාරිත්වයයි. මේක තමයි අපේ රටේ බහුතර ජනතාව බලාපොරොත්තු වුණේ. ඒ බලාපොරොත්තු වෙච්ච දේ වසරක් යනකොට අපි කරලා පෙන්වා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම අවසාන වශයෙනුත් කියන්නේ, මේ ආණ්ඩුව වැටෙන ආණ්ඩුවක් නොවන බවයි. මේ ආණ්ඩුව වට්ටන්න නම් මීට වඩා විචක්ෂණශීලීව, අප පෙන්වපු ආර්ථික, සමාජීය සහ දේශපාලන සංස්කෘතියේ පරිවර්තනයට එහා ගිය පරිවර්තනයක් ඔබතුමන්ලා ජනතාව ඉදිරියේ පෙන්වන්න. එහෙම නැතුව ලේවලින් ලියා දෙනවා යනාදි කථා කිය කියා ඉඳලා නම් මේ ආණ්ඩුව පෙරළන්න හම්බ වෙන්නේ නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.16]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද උදේම සභානායකතුමාගේ කථාවේදී අපට අහන්න ලැබුණේ මොනවාද? ඉගෙන ගන්න ලු; වල්බුරු කර ගන්න එපා ලු; උගන්වන්න කැමැති ලු. ඇයි, සභානායකවරයා ඒ ආකාරයෙන් වචන හැසිරෙව්වේ? 2026.02.03 වැනි දින මම පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇහුවා, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව ගැන. අද අමාත්‍යවරිය ඒ සඳහා උත්තර දුන්නා. අමාත්‍යවරිය උත්තර දීමෙන් පසුව අපි බොහොම ශිෂ්ට සම්පන්නව කරුණු කාරණා කිහිපයක් පෙන්වා දුන්නා. ඒ ඇමතිතුමිය කොහොම කිව්වත්, මම පැහැදිලිවම කියන්න කැමැතියි, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව ගැසට් කරලා තිබෙන්නේ එතුමියගේ අමාත්‍යාංශය යටතේ බව. මෙන්න, ඒ ගැසට් එක. එතුමිය කිව්වා, එහෙම කරලා නැහැ කියලා. අපි ඒක නිවැරැදි කෙරෙව්වා. ඒ විතරක් නොවෙයි. Dr. Ramani Jayasundere, කාන්තා කොමිසමේ සභාපතිතුමිය ඉල්ලා අස් වෙනවා. මොකක්ද, ඉල්ලා අස් වෙන්න හේතුව? කාන්තා කොමිසමේ ස්වාධීනත්වය තහවුරු කර ගැනීම සඳහා ස්වාධීන තැනක් වෙන් කර ගන්නට හැකියාවක් නොමැති වීම; තමන්ගේම කාර්ය මණ්ඩලයක් පත් කර ගන්නට ප්‍රතිපාදන නොමැති වීම. ඒ විතරක් නොවෙයි. රජයේ මැදිහත් වීම තුළ ප්‍රධාන විධායක නිලධාරිවරයෙකුත් - CEO - පත් කරනවා. ඒ, අමාත්‍යාංශයක හිටපු ලේකම්වරියක්. ඒ විතරක් ද නොවෙයි. කාන්තා කොමිසමේ සභාපතිතුමියට ජනාධිපති ලේකම්වරයා හමු වෙන්නට අවස්ථාවක් දෙන්නේත් නැහැ, මේ ප්‍රශ්න ගැන කියන්න. ඉතින් මම ඉදිරිපත් කරන්නට උත්සාහ දැරුවේ, ඔන්න ඔය කාරණා. ඔන්න ඔය කාරණා ගැන කියන කොට මාධ්‍යවලට ඇහෙන්න බිමල් රත්නායක ගරු සභානායකතුමා කියනවා, ඉගෙන ගන්න ලු; වල්බුරු කර ගන්න එපා ලු; උගන්වන්න කැමැති ලු. එතුමා ඒ වචන භාවිත කළත්, කාන්තා කටයුතු පිළිබඳ අමාත්‍යවරිය නිවැරැදිව කරුණු අවබෝධ කරගෙන නොවෙයි ඒ ප්‍රශ්නයට උත්තර සැපයුවේ. අපි පෙන්වා දුන්නා, අනෙකුත් ස්වාධීන කොමිෂන් සභා වෙනමම විශේෂ වියදම් ඒකක හැටියට ක්‍රියාත්මක වන බව. ඊට අදාළව, 2025 අංක 23 දරන විසර්ජන පනතේ 8, 9 සහ 10 පිටු මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මම මේ ලේඛන සියල්ලම ජනමාධ්‍යවලටත් බෙදා හරිනවා, මා ඉදිරිපත් කරපු මේ තර්කය තහවුරු කරන්න. මම මේක තොරතුරු, කරුණු කාරණා, දත්ත කේන්ද්‍රීයව ඉදිරිපත් කළ තර්කයක්. ඒ අනුව අපි කරුණු ඉදිරිපත් කරන්න යනකොට කියනවා, අපි උදේ පාන්දර ප්‍රශ්න ඇති කර ගන්නවා ලු; කැකෝ ගහ ගන්නවා ලු. අපේ කටවල් වහන්න හදනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බලන්න, ඔබතුමියත් සාමාජිකත්වය දරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය 2025 ජනවාරි මාසයේදී කාන්තා කොමිසමට අවශ්‍ය නම් දෙක යැව්වා. ඒ වාගේම සෙඩෝව් ප්‍රඥප්තිය, ඒ කියන්නේ කාන්තාවන්ට වෙනස්ව කටයුතු කිරීම ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රඥප්තිය කේන්ද්‍ර කරගෙන ජිනීවාහි පැවැති සම්මන්ත්‍රණයේදී කාන්තා කටයුතු පිළිබඳ අමාත්‍යවරිය කියනවා, කාන්තා කොමිසමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්නට සියලු කටයුතු සූදානම් කියලා. අද එතුමිය පාර්ලිමේන්තුවේදී කියනවා, අය වැයට ප්‍රතිපාදන වෙන් කරන කාල සීමාව 2025 මැයි මාසය ලු. කාන්තා කොමිසම ස්ථාපනය කළේ සැප්තැම්බර් මාසයේ ලු. කනගාටුවට කාරණාව, එතුමිය දන්නේ නැහැ යම්කිසි මහ හැරීමක් සිදු වෙලා තිබුණත් පරිපූරක ඇස්තමේන්තුවක් හරහා ඒ කටයුත්ත කළ හැකි බව. කාන්තා කොමිසම ස්ථාපනය කිරීම, එයට අවශ්‍ය ස්වාධීනත්වය රැකෙන පරිදි කාර්යාල භූමියක් ලබා දීම යනාදිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, අවශ්‍ය මුදල් ටික පරිපූරක ඇස්තමේන්තුවක් - Supplementary Estimate එකක් - යොමු කරලා ඒ හරහා වෙන් කර ගන්න පුළුවන්. ඒ ටික කළේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසානයේදී අප මේ ප්‍රශ්නය පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කළාට පසුව තමයි ඔබතුමියත් සාමාජිකත්වය දරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයට, වෙලාවක් අරගෙන, ජනාධිපති ලේකම් කාර්යාලයේ ජනාධිපති ලේකම්තුමා හමු වෙලා, යම් යම් එකඟතාවලට එන්නට පුළුවන්කම ලැබුණේ. දැන් යෝජනා වෙලා තිබෙනවා, මිලියන 50ක් දෙන්න, 2026දී. ඒ කියන්නේ ඉල්ලපු ප්‍රමාණයෙන් 1/3යි දෙන්නේ. ඉල්ලා තිබෙනවා, මිලියන 150ක්. මිලියන 50ක් දෙනවා. හැබැයි, පසුගිය ඡන්ද කාලයේ කාන්තාවන්ගේ ඡන්ද ලබා ගැනීම සඳහා දුන් පොරොන්දු අනුව නම්, යම්කිසි ප්‍රතිපාදන මුදලකින් 1/3ක් නොවෙයි, දෙන්න තිබෙන ප්‍රමාණය වාගේ තුන්ගුණයක් දෙන්න ඕනෑ. ඒ තරමටම කාන්තාවන් වර්තමාන රජයට සහයෝගය දුන්නා; ශක්තිය ලබා දුන්නා.

අද උදේ පැහැදිලිවම සිදු වුණේ මොකක්ද? මේ රජය කාන්තාවන්ගෙන් වරම අරගෙන කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතට ගත්තා, ස්වාධීනව ක්‍රියාත්මක විය යුතු කාන්තා කොමිසම. කාන්තා කොමිසම තමන්ගේ වහලෙකු, තමන්ගේ අතකොළුවක්, තමන් යටතේ ක්‍රියාත්මක වන නිකම්ම නිකම් ආයතනයක් බවට පත් කර ගැනීමේ ක්‍රියාදාමය හෙළිදරව් කරන කොට අපට කියනවා, ඉගෙන ගන්න කියලා. කාගෙන් ඉගෙන ගත්තත් මට නම් සභානායකතුමාගෙන් කිසිම දෙයක් ඉගෙන ගන්නට අවශ්‍ය නැහැ. අපිත් යම් අවබෝධයකින් තමයි මේ සභාවට ඇවිල්ලා කථා කරන්නේ. ඒ බව මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

ඒ වාගේම මම තවත් කාරණයක් පෙන්වා දෙන්න කැමැතියි. විශේෂයෙන්ම මේ රටේ ජනතාවටත්, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ටත්, ඒ වාගේම මාධ්‍යවලටත් දැන ගන්නටයි මම මේ ගැන කියන්නේ. බලන්න, අද අප ප්‍රශ්න අහන්න යනකොට, එක එක තීන්දු තීරණ පෙන්වනවා. අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධව අප අහන්න යන ප්‍රශ්නත් අද ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. මට අද අග්‍රාමාත්‍යවරියගෙන් ප්‍රශ්නයක් අහන්න තිබුණා. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය වහන්න යනවා. ඒ ප්‍රශ්නය අහන්න විපක්ෂ නායකවරයාට - මට - තහනම්. ඒ කියන්නේ, ඒ සිසුන්ට යන කල ගැන අහන එක තහනම්. වැඩ බලන විදුහල්පතිවරුන් 1,216දෙනෙකු විභාගය සමත් වෙලා තිබියදීත් පත්වීම් ලැබිලා නැහැ. ඒ ප්‍රශ්නය අහන්නත් තහනම්. ඒ වාගේම, දැන් ගුරු සේවයට උපාධිධාරීන් බඳවා ගැනීමේ වැඩ පිළිවෙළක් යනවා, සීමිත සහ විවෘත වශයෙන්. ඒ අයගේ උපාධි වලංගු දිනය 2025 දෙසැම්බර් 31 කරන්න කියා යෝජනා කරන්න, ඒ ගැන ප්‍රශ්න අහන්න තහනම්. මේ ඔක්කෝම තහනම් කරලායි තිබෙන්නේ. මම ඊට අදාළ ඔක්කොම ලේඛන සභාගත කරන්නම්. මේ ඔක්කොම තහනම් කරලායි තිබෙන්නේ.

පුරාවිද්‍යා උපාධිය ලබා ගත් අයට, ජාත්‍යන්තර අධ්‍යයන කටයුතු කරපු උපාධිධාරීන්ට; විශේෂයෙන්ම පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ උපාධිධාරීන්ට ඉතිහාසය ඉගැන්වීමේ අයිතිය පිළිබඳව වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රයේ කරුණු ගණනාවක් පිළිබඳව අග්‍රාමාත්‍යවරියගෙන්; අධ්‍යාපන ඇමතිවරියගෙන් ප්‍රශ්න කරන්නට සජිත් ප්‍රේමදාසට බැහැ; විපක්ෂ නායකවරයාට බැහැ. ඒවා අහන්න සමගි ජන බලවේගයේ නායකයාට තහනම්. මෙන්න, ඒවා

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අහන්න බැහැ කියලා සඳහන් කර තිබෙන ලියුම. මේ මේ හේතු නිසා මේවා අහන්න බැරි ලු. මම මේ අහන්නේ අසභ්‍ය ප්‍රශ්නයක්ද? අධ්‍යාපනය පිළිබඳව මම මේ අහන්නේ අසභ්‍ය ප්‍රශ්නයක්ද? මම මේ ප්‍රශ්නයෙන් අහන්නේ අසභ්‍ය නාළිකා ගැනද? අසභ්‍ය වෙබ් අඩවි ගැනද? ඇයි මෙහෙම තහනම් කරන්නේ? මේ කරන්න හදන්නේ අපට ප්‍රශ්නයක් අහන්න තිබෙන අයිතිය නතර කිරීමයි. අද උදේ අපි බොහොම සර්ව සාධාරණව, ශිෂ්ට සම්පන්නව කරුණු කාරණා සහ දත්ත කේන්ද්‍රීයව ප්‍රශ්න අහන කොට, සභානායකතුමා මැදට පැනලා එක එක කථා කිව්වා. එතුමාගෙන් පාඩම් ඉගෙන ගන්න ලු.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තවත් විනාඩියක් ලබා දෙන්න.

මට එතුමාගෙන් පාඩම් ඉගෙන ගන්න ලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අධ්‍යාපනය පිළිබඳව අප අහපු ප්‍රශ්නය තහනම් කිරීමට අදාළ ලිපිය ඇතුළු ලේඛන මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේක ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවක්. මේ ගැන රටම දැන ගන්නට ඕනෑ. අපි මේ සභාවට ඇවිල්ලා අසභ්‍ය ප්‍රශ්න අහන්නේ නැහැ. අපි මේ සභාවට ඇවිල්ලා අසභ්‍ය වෙබ් අඩවි ගැන විස්තර සභාගත කරන්නේ නැහැ. අපි මේ සභාවට ආවේ අධ්‍යාපනය අසභ්‍යකරණය කරන්නට නොවෙයි. අපි ආවේ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රශ්න ගැන කථා කරන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම පැහැදිලිව එක දෙයක් කියන්න කැමැතියි. මේ සභාවේ උදේ වරුවේ අප අහන්නේ පෞද්ගලික ප්‍රශ්න ගැන නොවෙයි, රටේ ප්‍රශ්න ගැනයි. හැබැයි, උදේ වරුවේ අපට ප්‍රශ්න අහන්න අයිතියක් නැති නමුත් හැන්දෑවට රජය නියෝජනය කරමින් තමන්ට රිසි සේ පැය ගණනාවක් කථා කිරීමේ නිදහස තිබෙනවා. රජයට නිදහසකුත්, විපක්ෂයට තහංචියකුත් ලෙස වෙනස්ව සලකන්න අප ඉඩ තබන්නේ නැති බව මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ලාල් ප්‍රේමනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MRS.) SAGARIKA ATHAUDA left the Chair and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 2.27]

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ස්තුතිවන්ත වෙනවා මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව.

අද දිනට අදාළව ඉදිරිපත් කරන ලද නියමයන්, නියෝග සහ යෝජනා සම්මතය පිළිබඳව ගරු ප්‍රවාහන අමාත්‍යතුමා සහ නියෝජ්‍ය අමාත්‍යතුමන්ලා බොහෝ කරුණු පැහැදිලි කළා. නමුත්, විපක්ෂය පැත්තෙන් ඒවා සම්බන්ධව සාධනීය තොරතුරු ලබා දීම වෙනුවට අදත් අපට දකින්නට ලැබුණේ සුපුරුදු පරිදි නිරන්තරයෙන් කරන විවේචන සහ අවලාද නැඟීම පමණයි. මම හිතනවා, රජය හැටියට, ආණ්ඩුව හැටියට අප වැඩ කරන ආකාරය සම්බන්ධව මේ රටේ ජනතාවට යමක් ප්‍රකාශ කළ යුතුයි කියලා. එම නිසා මගේ කථාවේදී වැඩිපුර කාලයක් ඒ සඳහා යොදා ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ආණ්ඩුවේ පාලන ක්‍රමය, මෙතෙක් කලක් මේ රටේ තිබුණු පාලන ක්‍රමවලට වඩා ගුණයෙන්, ප්‍රමාණයෙන් හා කැප කිරීම් කියන සියල්ලෙන්ම වෙනස් එකක්. හැබැයි අපි හිතනවා විපක්ෂය තවම මේවා තේරුම් ගන්න බැරි තත්ත්වයකයි ඉන්නේ කියලා. ඔවුන් මෙවැනි ආණ්ඩුවක් සම්බන්ධව ළදරු දැක්මක ඉන්නවා කියන එක තමයි මට හිතෙන්නේ. අපි ඡන්ද දායකයන් නිකම්ම නිකම් ඡන්ද දායකයන් කර නොගෙන ඒ අය සම්බන්ධයෙන් ඉතා සංවිධානාත්මකවයි කටයුතු කරන්නේ. ආණ්ඩුකරණයේදී, රට පාලනය කිරීමේදී, මේ රටේ ජනතාව දියුණු ශ්‍රී ලාංකීය ජාතියක්, මේ රට දියුණු රටක් බවට පත් කර ගැනීම පිණිස පුරවැසියන් සියල්ලන්ම සක්‍රිය කොටස්කරුවන් හැටියට පත් කර ගනිමින් පුළුල් ජනතා සහභාගිත්වයක් සහිතව තමයි අප කටයුතු කරන්නේ. බිම් මට්ටමට, ගම් මට්ටමට යනකල්ම ඒ සහභාගිත්වය තිබෙනවා. ගමේ සියලු පුරවැසියන්ට තීන්දු තීරණ ගැනීමේ අවස්ථාව සලසමින්, සියලු පහසුකම් සපයමින් ආණ්ඩුකරණය, රාජ්‍ය පාලනය සිදු කිරීම සඳහා තමයි අප කටයුතු කරන්නේ. මෙය, ඔවුන් සියල්ලන්ම මේ රාජ්‍ය පාලනයට බද්ධ කර ගැනීමේ ප්‍රබල දේශපාලන සංස්කෘතියක් ගොඩනහමින් තිබෙන මොහොතක්; ඒ අරමුණ යම් ප්‍රමාණයකට හෝ සාර්ථක කර ගනිමින් තිබෙන මොහොතක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ගරු ජනාධිපතිතුමාගේ ඉඳලා මේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය ඇතුළු අපේ මන්ත්‍රීවරුන් සියලුදෙනා අවංකභාවය සහ විනිවිදභාවය කියන කාරණා ඉතා උපරිම වශයෙන් රකින්නට හැම විටම උත්සාහ ගෙන තිබෙනවා. ඒ වාගේම අපට සහතික කරලා කියන්න පුළුවන්, අප කිසිවෙකු මේ රටේ ජනතාවගේ ශතයක් හෝ රුපියලක් හෝ අයථා භාවිතාවේ යොදවා නැති බව. ජනතාවගේ මුදල් අපි අවභාවිත නොකළා විතරක් නොවෙයි, ජනතාවගේ මුදල් වෙන කෙනෙකුට හෝ අවභාවිත වෙන්න ඉඩ තබා නැහැ. එම නිසා ඉතිහාසය පුරා මෙතෙක් තිබුණු සෑම ආණ්ඩුවකටම වඩා අවංකභාවය, විනිවිදභාවය ඉතා ප්‍රබල ලෙස තිබෙන ආණ්ඩුවක්, මෙය. අපි හැම රුපියලකටම වග කියනවා. ඉදිරිපත් කරන මෙවැනි අණපනත්, ගැසට් නිවේදන කියන සෑම එකකටම ආණ්ඩුවක් හැටියට අපි සාමූහිකව වග කියනවා. තීන්දු තීරණ ගෙන ප්‍රකාශ කරන හැම දෙයක්ම යථාර්ථයක් බවට පත් කරන්න අපි හැම විටම උත්සාහ ගන්නවා.

අපේ ආණ්ඩුව, චිරාත් කාලයක් මේ රටේ දුක් විඳපු ජනතාව වෙනුවෙන් කටයුතු කරන්න පොරොන්දු වුණු වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළ ආණ්ඩුවක්. රටේ හැම පුරවැසියෙකු සම්බන්ධවම ගරු ජනාධිපතිතුමාගේ ඉඳලා අප සියලුදෙනාම පුළුල්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ලාල් ප්‍රේමනාත් මහතා]

අවබෝධයකින් යුතුව කටයුතු කරනවා. ඒ නිසා තමයි අය වැයේදී, අය වැය ඉදිරිපත් කරන මොහොතේදී යමක් කිව්වාද, ඒ හැම වදනක්ම, ඒ හැම ප්‍රාර්ථනාවක්ම, ඒ හැම පොරොන්දුවක්ම ඒ අය වැය කාල සීමාව අවසන් වෙන්න කලින් අවසන් කරන්න, ඉටු කරලන්න අප කටයුතු කරන්නේ. ඒ අනුව අප ඉදිරිපත් කළ පළමු අය වැයේ සියල්ල අපි ඒ විධියටම ඉටු කළා. දෙවැනි වරට, 2026 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ අය වැයේදී කියපු සෑම දෙයක්ම අපි ඒ විධියට සැලසුම් සහගතව කරනවා. ගිය වසරවල අපේ අතින් අඩුපාඩුකම් සිදු වුණා නම් ඒ සියල්ල ගැන අධ්‍යයනය කරලා, ස්වයං විවේචනයක් හෝ කරගෙන මේ රටේ ජනතාව වෙනුවෙන් අපි ඒ වැරදි නිවැරදි කර ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ දැවැන්ත නිවාස ප්‍රශ්නයක් තිබෙන බව අපි දන්නවා.

දැන් නිවාස ඇමතිතුමාගේ පැත්තෙන් පොරොන්දුවක් එනවා අපි අවම වශයෙන් මේ වසර තුළ නිවාස 55,000ක්වත් හදන්න ඕනෑ කියලා. එතුමා එහෙම කියනකොට අමාත්‍යාංශ 3ක් ඒකට මැදිහත් වෙනවා. අපේ සරෝජා සාවිත්‍රි පෝල්රාජ් ඇමතිතුමිය, පරිවාස භාරයේ සිටින දරුවන් අවුරුදු 18 සම්පූර්ණ වුණාට පසු නැවත සමාජයට එද්දී ඔවුන්ට ජීවත් වෙන්න නිවාස 1,000ක් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරගෙන යනවා. ඊළඟට, බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය පැත්තෙන් අපේ (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි ඇමතිතුමා සමාජයේ ආගමික කටයුතු වෙනුවෙන් ශාසනයට තමන්ගේ දරුවා පූජා කළ මව්වරුන්ට, පියවරුන්ට නිවසක් නැත්නම් එවැනි අයට නිවාස 1,000ක් ලබා දෙන්න කටයුතු කරනවා. ඊට අමතරව, අනෙක් අමාත්‍යාංශවලත් ඒ විධියට ඒ අරමුණ ඔස්සේ සියලු දෙනා එක මිටට ඉඳගෙන වෙච්ච පොරොන්දු ඉටු කරන්න අපි කටයුතු කරනවා.

ඒ වාගේම ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළා අපට මතකයි, සෞඛ්‍ය ඇමතිතුමා ඇතුළු සියලු දෙනාගේ මැදිහත් වීම තුළ රට පුරාම නීරෝගීමත් ජනතාවක් බිහි කිරීම සඳහා රෝග නිවාරණය මුල් කරගත් සෞඛ්‍ය සේවාවක් ඇති කිරීමට පියවර තබා තිබෙන බව. මටත් සතුටුයි, මා නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කයේ ඉතාම ඈත දෙනියාය ප්‍රදේශයේ අවුරුදු 150කට වැඩි රෝහලක් තිබෙනවා. ඒක නාය යෑමේ අවදානමට ලක් වුණාට පසු නිලධාරින් සියලු දෙනා එකතුවෙලා ඒ ගැන නිවැරදිව අධ්‍යයනය කර, ඒ සඳහා ඉඩකඩම් අත්පත් කරගෙන රුපියල් මිලියන 6,000කින් නව අංග සම්පූර්ණ රෝහලක් හදන්න පසුගිය දා කැබිනට් මණ්ඩලයේදී තීන්දුවක් ගත්තා. අපි ඒ විධියට රෝහල් හදද්දී, මාතර දිස්ත්‍රික්කයේම වෙනත් රෝහල් හැදූ හැටි මට මතකයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. රෝහලක් හදන්න කටයුතු කරද්දී, ඒ ප්‍රදේශයේ සිටින ඇමතිවරයා තමන්ගේ ගමට ගන්නවා, ඒක. ජනතාවගේ වුවමනාව මත, ජනගහනය බෙදී යන ආකාරය අනුව, භූමිය අනුව ඒක ස්ථානගත කරන්නේ නැහැ. තමන්ගේ ඊළඟ ඡන්ද ගොඩ වැඩි කරගන්නේ කොහොමද කියලායි බලන්නේ. මමත් hospital එකක් හැදුවා කියලා කියන්න පුළුවන් තැන්වල තමයි රෝහල් ඉදිකර තිබෙන්නේ. ඒ නිසා ඒවා අවිධිමත් විධියට තමයි ස්ථානගත වෙලා තිබෙන්නේ. ඒ නිසාම මේ රටේ පුරවැසියන් රෝහලක් කරා යන්න නොහැකි වීම තුළ බරපතළ ලෙස දුක් විඳිනවා. අපි එහෙම බැලුවේ නැහැ. භූමිය අනුව ඒවා ඉදිකරනවා.

ඒකම තමයි අධ්‍යාපනයටත් කරන්නේ. හැම දරුවෙකුටම වර්ග කිලෝමීටර 3ක් ඇතුළත පාසලකට යන්න පුළුවන් විධියට, කිලෝමීටර එකහමාරක් විතර පයින් හෝ ගිහිල්ලා ඉගෙන ගන්න පුළුවන් විධියට පාසලක් හැදීම තමයි අපේ සිහිනය. අපි ඒක කිව්වාම විපක්ෂ නායකතුමා කියන්නේ මොකක්ද? කිලෝමීටර තුනෙන් තුනට පාරවල් හදනවාය කියනවා. මේවා තේරුම් ගන්න බැරි තරම් දුර්වලයි, ළදරුයි. වර්ග කිලෝමීටර 3ක් ඇතුළත දරුවෙකුට පාසලක් දෙන එක පෞද්ගලිකව අපේ ඡන්ද ව්‍යාපාර සඳහා කරන දෙයක් නොවෙයි. මේ රටේ දරුවන්ට ඒක අවශ්‍යයි. එවැනි රටක් අපි හදන්න ඕනෑ. විශේෂයෙන් ජනාධිපතිතුමා නායකත්වය දෙන Clean Sri Lanka වැඩසටහන ඔස්සේ, ඒ වාගේම දිළිඳුකම පිටුදැකීමේ ව්‍යාපෘතිය ඔස්සේ මිනිස්සුන්ගේ සිතුම් පැතුම්, සිතන ආකාරය වෙනස් කරන්න, ආකල්ප වෙනස් කරන්න, සහකම්පනයෙන් යුතු පරපුරක් හදන්න අපට අවශ්‍යයි. අධ්‍යාපනය ඒකට පිටුවහලක් වෙනවා. ඒකට තමයි අධ්‍යාපන ඇමතිවරිය හැටියට ගරු අගමැතිතුමිය දැවැන්ත කැප කිරීමක් කරන්නේ. හැබැයි, එතුමියට අපහාස කරනවා; නින්දා කරනවා.

මේ රටේ ජනතාවට තිබෙන ආදරයට නොවෙයි මේ අය දේශපාලනය කරන්නේ. ජනතාවට ආදරයෙන් දේශපාලනය කරනවා කියපු අය විශ්‍රාම වැටුප අහෝසි කරනවා කිව්වාම කොයි තරම් කුලප්පු වුණාද කියලා අපි දැක්කා. මම දැක්කා, දැනට පාර්ලිමේන්තුවේ නැති, ජනතාව විසින් ප්‍රතික්ෂේප කරපු හිටපු ඇමතිවරයෙක් විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් එළියේ අඬනවා. ජනතාවට සේවය කරන්න ඇවිල්ලා නැහැ, මේ අය. එහෙම වුණා නම් අපට මේ තරම් අමාරුවෙන් මේ රට ගොඩගන්න තීන්දු තීරණ ගන්න වෙන්නේ නැහැ. එහෙනම් අපට හොඳ රටක් ලැබෙනවා; මුදල් තිබෙනවා; ජාත්‍යන්තර විශ්වාසය තිබෙනවා. අපි එනකොට මොනවාද තිබුණේ? ජාත්‍යන්තර විශ්වාසය අන්තිම බින්දුවටම පිරිහිලා තිබුණා. මේ රටේ තරුණයෙකුට ලෝකයේ වෙනත් රටකට යන්න වීසා ගන්න බැරි තත්ත්වයක් උදාවෙලා තිබුණා. භාණ්ඩාගාරය හිඳිලා තිබුණා; විදේශ සංචිත හිඳිලා තිබුණා; ණය ගෙවන්නේ නැති රටක් බවට පත්වෙලා තිබුණා. "අපි ණය ගෙවන්නේ නැහැ" කියලා පොරොන්දු වෙලා තිබුණා; බංකොලොත් රාජ්‍යයක් හැටියට නම් කර තිබුණා. එවැනි රටක් තමයි අපි මේ ගොඩගනිමින් ඉන්නේ. මේක ලෙහෙසි පහසු කටයුත්තක් නොවෙයි. ඒත් අපි මේක කරනවා. අපි මේ විශ්‍රාම වැටුප බලාගෙනවත්, කෑදර සුඛෝපභෝගී ජීවිත බලාගෙනවත් මේවාට ආපු මිනිස්සු නොවෙයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව තත්පර කිහිපයක් ලබා දෙන්න.

අපේ ජනාධිපතිතුමා කොයි තරම් ජාත්‍යන්තර විශ්වාසයක් දිනාගෙන තිබෙනවා ද? ක්‍රිකට් ගැන උදාහරණය ගනිද්දී, විපක්ෂය ඒකට අපහාස කරනවා. ඔවුන් එහි තිබෙන වටිනාකම තේරුම් ගන්නේ නැහැ. ක්‍රීඩාව පැත්තෙන් ගත්තොත් ඉන්දියාව, පකිස්තානය වාගේ රටවල් ආර්ථික වශයෙන් අපිත් එක්ක කොයි තරම් එකඟ වෙලා තිබෙනවා ද? මේවා ඉතාම වැදගත් කාරණා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව පොඩි වේලාවක් ලබා දෙන්න.

The international community is now looking at Sri Lanka with a renewed sense of trust. As global institutions like the World Bank and the IMF have recently highlighted, Sri Lanka is finally moving towards governance with integrity and fiscal transparency. This Government led by our President is not just about bringing policy, but also about honesty and unity. For the first time, we have bridged the gap between the people and the administration. When nations like India and Pakistan show their solidarity through trade and sports, it is a global certificate for our country's stability and safety. We have transformed from a country in crises to a nation with potential, proving that where there is transparency, there is progress. This is not just the Government, this is people's power in action.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.39]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින අපි විෂයන් කිහිපයක් පිළිබඳව කථා කරනවා. ඒ යටතේ මෝටර් වාහන පනත යටතේ ගෙනෙන නියෝග දෙකක් පිළිබඳවත් සාකච්ඡාවට ලක් කෙරෙන නිසා මේ අවස්ථාවේ ඊට සම්බන්ධව අදහස් ස්වල්පයක් විතරක් ප්‍රකාශ කරන්නට මම බලාපොරොත්තු වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ හරහා විදේශ රියැදුරු බලපත්‍ර තිබෙන, පිට රට සිට පැමිණෙන අයට අපේ රටේ තාවකාලික රියැදුරු බලපත්‍ර නිකුත් කරනකොට මෙතෙක් තිබුණු ගාස්තුවල සංශෝධනයක් සිද්ධ වෙනවා. එම සංශෝධනයේ දී ලාංකිකයන්ට වඩා පිටරැටියන්ගෙන් යම් ප්‍රමාණයක වැඩි මුදලක් අය කරන බවයි අපට පෙනෙන්න තිබෙන්නේ. ඊළඟට, මේ ගෙනෙන අනෙක් නියෝගය තමයි, රියැදුරු බලපත්‍ර වලංගු කාලය තාවකාලිකව දීර්ඝ කිරීම. ඇත්ත වශයෙන්ම පසුගිය ආපදා කාලය තුළ රියැදුරු බලපත්‍ර අලුත් කරන්නට බැරි වුණු අයට ඒ දීපු සහන කාලය දීර්ඝ කිරීම තමයි ඒකෙන් බලාපොරොත්තු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රට තුළ තාවකාලික රියැදුරු බලපත්‍ර විදේශ බලපත්‍රලාභීන්ට නිකුත් කිරීමේදී ගුවන් තොටුපොළෙන් පමණක් නැතිව ප්‍රධාන සංචාරක ගමනාන්ත ගැන බලලා, තවත් තැන් කිහිපයක මේ පහසුකම් ඇති කරන්න කියලා මම රජයට යෝජනා කරනවා. මොකද, මම නියෝජනය කරන්නේ ගාල්ල දිස්ත්‍රික්කය. ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර, හික්කඩුව, ගාල්ල, උණවටුන, අහංගම, ඉන් එහා වැලිගම දක්වා දිගටම මුහුදුබඩ තීරය කියන්නේ සංචාරකයන් විශාල වශයෙන් පැමිණෙන, සංචාරය කරන, ගැවසෙන ප්‍රදේශ. ඒ පළාත්වල සංචාරකයන්ට භාවිත කරන්න ස්කූටර්, මෝටර්සයිකල්, ත්‍රීවිලර් වාගේ වාහන දෛනික කුලියට සපයන ව්‍යාපාරිකයන් රාශියක් ඉන්නවා. ඔවුන් ඒ හරහා විශාල ආදායමක් ගන්නවා. ඒ වාගේම සංචාරක ව්‍යාපාරයටත් ඒකෙන් ආදායමක් ලැබෙනවා. ඒ නිසා මේ පිටරට රියැදුරු බලපත්‍රවලට මේ රට තුළ වලංගු වන පරිදි තාවකාලික බලපත්‍ර ලබාදීමට ගාල්ල වාගේ නගරයකත් ස්ථානයක් ස්ථාපනය කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. ඒ ගමන්ම අපේ රටේ මාර්ග නීති පිළිබඳවත් ඔවුන්ට අවබෝධයක් ලබා දෙන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න හැකියාවක් ලැබෙයි. මොකද, පිටරටවල තිබෙන මාර්ග විනය අපේ රට තුළ දකින්න නැහැ. එම නිසා මාර්ග නීති පිළිබඳව එවැනි අවබෝධයක් ලබා දීම ඔවුන්ටත්, මගීන්ටත්, පදිකයන්ටත්, කාගේත් ආරක්ෂාවට හොඳ වෙයි කියලා තමයි මම කල්පනා කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ප්‍රවාහන ක්ෂේත්‍රය කියන්නේ රටක ඉතාම වැදගත් ක්ෂේත්‍රයක්. මේ අංශයට අදාළ යම් යම් සාධනීය තීන්දු තීරණ විටින් විට නීති හැටියට අරගන්න බව අපි දකිනවා. පසුගිය දවස්වල අධිවේගී මාර්ගයේ යන වාහනවල ඉදිරිපෙළ අසුනට තමයි seat belt එක අනිවාර්ය කර තිබුණේ. නමුත්, ආරක්ෂාව ගැන හිතලා ඉතා වැදගත් තීරණයක් ගත්තා. වාහනවල පසුපස ගමන් කරන අයටත් seat belts අනිවාර්ය කළා. මම ඒක අනුමත කරනවා. මොකද, මගීන්ගේ ආරක්ෂාව තමයි අවශ්‍ය වෙන්නේ. අධිවේගී මාර්ගයේ ගමන් කරනකොට බස් රථවලටත් seat belts අනිවාර්ය කළා. ඒක මගී ආරක්ෂාවට ගත්ත හොඳ තීරණයක්. නමුත්, බස් හිමියන් කියන කාරණයක් තිබෙනවා. Original seat belt එකක් එන්නේ නැති නිසා තාවකාලිකව සවි කරගෙන තමයි ලු, භාවිත කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒකත් ඉණට විතරයි දාන්න පුළුවන්. එතකොට ඒකෙන් බලාපොරොත්තු වන ආරක්ෂාව මගියාට ලැබෙනවාද කියන එක ගැනත් කල්පනා කරලා බලන එක හොඳයි. ඒ වාගේම ඒ බස් රථ හිමියන් දැන් කියන කාරණයක් තමයි, වෙළෙඳ පොළේ රුපියල් 400ට, 500ට තිබුණු seat beltsවල මිල දැන් රුපියල් 4,000ට, 5,000ට වැඩි වෙලා තිබෙනවා, ඒවායේ ප්‍රමිතිය ගැනත් ප්‍රශ්නයක් තිබෙනවා කියන එක. ඒවා ඉක්මනින් කැඩෙන්න බලනවා ලු. මෙන්න මේ වාගේ ප්‍රායෝගික තත්ත්වයන් ගැනත් අවධානය යොමු කරන්න කියලා මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා. එහෙම නැත්නම් කොයි තරම් යහපත් අරමුණකින් ක්‍රියාත්මක කළත් ඒ තුළින් අවශ්‍ය ප්‍රතිඵලය ලබා ගන්න බැරි වෙයි.

ඊළඟට මට මතකයි, දැන් මාස කිහිපයකට ඉස්සෙල්ලා වාචික පිළිතුරු අපේක්ෂා කරමින් මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් අහපු බව, අලුතෙන් ලියාපදිංචි කළ වාහනවලට number plates නැති එක ගැන. ප්‍රවාහන ඇමතිතුමා හැටියට සභානායකතුමා එම ප්‍රශ්නයට උත්තර දුන්නා, නොවැම්බර් මාසයේ 15වන දා වනකොට ඒ අංක තහඩු ප්‍රශ්නය විසඳනවා කියලා. අද පෙබරවාරි මාසයේ 18වන දා, හැබැයි තවමත් ඒ ප්‍රශ්නය විසඳිලා නැහැ. ඇත්තවශයෙන්ම මේ වනකොට යතුරුපැදි ඇතුළු රථ වාහන ලක්ෂ දෙකහමාරක විතර අංක තහඩු නැහැ. පාරේ යනකොට පෙනෙනවා, එක එක වාහනවල එක එක විධියට අංක ගහගෙන යන ආකාරය. සමහර වාහනවල අංකයක් ඇත්තේම නැහැ. සායම් සේදිලා ගිහිල්ලා සමහර වාහනවල අංකය කියවන්නත් බැහැ. නමුත් ඒ ගැටලුවට විසඳුමක් ලබා දීමට තවම ආණ්ඩුව අපොහොසත් වෙලා තිබෙනවා. වාර්තා වන ආකාරයට පසුගිය වසර තුළ යතුරුපැදි 254,000ක් විතර, මෝටර් කාර් 68,000ක්, ත්‍රිරෝද රථ 17,500ක් විතර, ද්විත්ව කාර්ය වාහන 7,000කට ආසන්න ප්‍රමාණයක්, කැබ් රථ 2,500ක් වශයෙන් විවිධ වාහන 362,000ක් විතර අලුතෙන් ලියාපදිංචි කරලා තිබෙනවා. අප්‍රේල් මාසයේ ඉඳලා ආනයනය කළ වාහන සඳහා තමයි මේ අංක තහඩු ලබා දීමට තිබෙන්නේ. අපි දැක්කා ගිය සතියේ කැබිනට් තීරණ දැනුම් දෙනකොට කිව්වා, කැබිනට් මණ්ඩලය ඒ සඳහා අලුතෙන්

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ටෙන්ඩර් කැඳවන්න අනුමැතියක් දුන්නා කියලා. මම දන්නේ නැහැ, ඒකට තව කොයි කාලයක් යයිද කියලා. ඒ ප්‍රශ්නය අහපු කෙනා හැටියට මට මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් කිව්වා, එතුමාත් වාහනයක් අරගෙන number plate එකට රුපියල් පන්දහස් ගාණක් අය කරලාත් තිබෙනවා, මාස ගාණක් ගිහිල්ලා නමුත් තවම number plate එක නැහැ කියලා.

ඊළඟට රජය පැත්තෙන් ප්‍රකාශ කරනවා, බස් රථ රියැදුරන් මත්ද්‍රව්‍ය හෝ මත්පැන් පානය කර තිබෙනවාද කියලා පරීක්ෂා කරනවා කියලා. ඒක බොහොම හොඳයි. කාගේත් ආරක්ෂාව තමයි බලන්න ඕනෑ. නමුත් රියදුරු මත්ද්‍රව්‍ය භාවිත කරලා අහු වුණොත් බස් හිමියන්ගේ මාර්ග බලපත්‍රය cancel කරනවා ලු, route permit එක අවලංගු කරනවා ලු.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව විනාඩි තුනක් දෙන්න.

ඇත්තවශයෙන්ම ඒක අසාධාරණයි. මොකද, බස් කිහිපයක් තිබෙන අයිතිකාරයෝ ඉන්නවා. ඒ මනුස්සයා හැම තිස්සේම රියැදුරා එක්ක ඉන්නේ නැහැ. ඒ නිසා රියැදුරා වරදක් කළොත් ඒක රියැදුරාටයි බලපාන්න ඕනෑ. එහෙම නම් SLTB එකටත් ඒක කරන්න ඕනෑ. SLTB එකේ licence එක cancel කරන්න බැහැ නේ, ඩිපෝ අධිකාරිට දඩ ගහන්නේ නැහැ නේ. ඒක නිසා ඒවා කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දු බවට පත් කරන්නේ නැතිව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ඊළඟට, ප්‍රවාහන සේවය ගැනත් මම වචන දෙක තුනක් කිව යුතුව තිබෙනවා. තවමත් අපේ පොදු ප්‍රවාහන සේවය අවුල් ජාලාවක්. දුම්රියේ යන කෙනෙක් එක්ක කථා කළත්, බස්වල යන කෙනෙක් එක්ක කථා කළත් කාගෙන්වත් හොඳක් අහන්න පුළුවන්කමක් නැහැ. අපේ රටේ දුම්රිය පිටත්වන වෙලාව ගැන තවමත් හරියටම කියන්න බැහැ. හිටපු ගමන් පැය ගණන් ප්‍රමාද වනවා. ඒ විතරක් නොවෙයි. වර්ජන නිසාත් දුම්රිය ගමනාගමනයට බාධා ඇති වනවා.

ඇතැම් රියැදුරන්ගේ වැරදි නිසා, ඔවුන් මාර්ග නීති උල්ලංඝනය කරන නිසා මගී බස් රථ සම්බන්ධව සිදු වන අනතුරු ඉහළ යන බවක් දිනපතාම දකින්න ලැබෙනවා. අද ජනතාවට බස් එකේ, දුම්රියේ යන්න වෙලා තිබෙන්නේ තෙරපිලා, ජීවිත අවදානම් ඇතිව. බොහෝ ප්‍රදේශවල දුෂ්කර මාර්ගවල රාත්‍රි කාලයේ බස් රථ ධාවනය වෙන්නේ නැති එක අද ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ප්‍රවාහන වියදමත් අද ජනතාවට දරාගන්න බැහැ. මේ නිසා අපේ රටේ ප්‍රවාහනය පිළිබඳව තිබෙන්නේ සතුටුදායක තත්ත්වයක් නොවෙයි. දියුණු රටවල ඇති හැකි හැමෝම පොදු ප්‍රවාහන සේවා පාවිච්චි කරනවා. යුරෝපීය රටවලට ගියාම ඒ තත්ත්වය දකින්න ලැබෙනවා. අපි දන්නවා, විවිධ ප්‍රදේශවල ඉඳලා කාර්යාල සේවකයෝ දුම්රියෙන් දිනපතා අගනුවරට එන බව. ඒ බොහෝදෙනෙක් සීසන් ටිකට් එක අරගෙන එන්නේ. නියමිත වෙලාවට දුම්රිය නොපැමිණියාම, දුම්රිය ධාවනය වන්නේ නැති වුණාම, දුම්රිය පරක්කු වුණාම ඒගොල්ලන්ට කාර්යාලයට යන්න අමතර වියදමක් දරන්න පුළුවන්කමක් නැහැ. මොකද, ඒ, සීසන් ටිකට්වලින් යන එන මිනිස්සු. ඒවා ගැනත් ආණ්ඩුවේ අවධානය යොමු කරන්න ඕනෑ.

"දිට්වා" සුළි කුණාටුවෙන් දුම්රිය මාර්ග පද්ධතියට ලොකු බලපෑමක් ඇති වුණා. ඇමතිතුමා ඒකේ ප්‍රගතිය ගැන කථා කළා. ගුණාත්මක ප්‍රවාහන සේවයක් ගැන කොච්චර කථා කළත්, 2020 වසරෙන් පස්සේ ගෙවුණු වසර 5 ඇතුළත රේල් පාර අලුතෙන් දීර්ඝ වෙලා තිබෙන්නේ කිලෝමීටර 4ක් විතරයි. ඒ වාගේම ප්‍රධාන දුම්රිය ස්ථාන සංඛ්‍යාව බැලුවාම වැඩි වෙලා තිබෙන්නේ 4ක් විතරයි. මේ තත්ත්වය ගැන අපට සතුටු වෙන්න පුළුවන්කමක් නැහැ. අනාරක්ෂිත දුම්රිය මාර්ග තවමත් තිබෙනවා. මට මතකයි, මීට දශක තුන හතරකට ඉස්සෙල්ලා අපේ දිස්ත්‍රික්කයේ අහුන්ගල්ල ප්‍රදේශයේදී පාසල් දරුවන් ගෙන ගිය බස් එකක් දුම්රියේ හැප්පිලා ජීවිත විශාල සංඛ්‍යාවක් අහිමි වුණු බව. ඒ වෙලාවේ ප්‍රේමදාස මැතිතුමා තාවකාලික පිළියමක් හැටියට උණබම්බු ගේට්ටු වැඩ පිළිවෙළ පටන් ගත්තා. නමුත් දශක ගණනකට පස්සේ තවමත් තිබෙනවා, අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග. ආසන්න වශයෙන් එවැනි අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග 425ක් විතර තිබෙනවා. 2024 වසරේ පමණක් දුම්රිය අනතුරු 253ක් වාර්තා වුණා. ඒ අතරින් වාර්තා වුණා, මරණ 244ක්. ඒ විතරක් නොවෙයි. දුම්රිය දෙපාර්තමේන්තුව 2024 වසරේදී පමණක් රුපියල් මිලියන 11,000ක පාඩුවක් ලැබුවා. අපි දැක්කා, දුම්රියවල වනඅලි ගැටීම තුළින් මිය යන වනඅලි සංඛ්‍යාව වැඩි වෙනවා; ඒ වාගේම දුම්රිය මාර්ගයට සහ දුම්රියවලට ලොකු අලාභ සිද්ධ වනවා. ඊයේ හෝ පෙරේදා වාර්තා වුණා, රාත්‍රි තැපැල් දුම්රියක අලියෙක් හැප්පිලා මැරුණු පුවතක්. ඒකෙන් දුම්රිය පීලි පැන්නා. මේවා බරපතළ ප්‍රශ්න. වනඅලි දුම්රියෙහි ගැටීම වළක්වා ගන්න විවිධ ක්‍රියාමාර්ග ගත්තත්, තවම ඒවා මුළුමනින්ම සාර්ථක වෙලා නැහැ. දුම්රිය අනතුරු හේතුවෙන් 2025 වසරේ මුල් මාස 10 තුළ පමණක් වනඅලි 17ක් මිය ගියා. ඒක විශාල පාඩුවක් වාගේම ඒ අනතුරු නිසා දුම්රිය දෙපාර්තමේන්තුවටත් පාඩු සිද්ධ වනවා.

පොදු ප්‍රවාහනය ගැන කථා කරනකොට බස් රථ ගැනත් කියලා මම කථාව නවත්වන්නම්. අද SLTB බස් ධාවනය වන්නේ ගමන් වාර 4,500ක් වාගෙයි. බස් රථ 5,000ක් වාගේ ප්‍රමාණයක් තමයි ඩිපෝවල තිබෙන්නේ. නමුත් සේවකයින් ඉන්නවා, එක බස් එකකට පස්දෙනෙක්. ආණ්ඩුව කියනවා, සේවකයින් සියයට 1.4යි ඕනෑ කියලා. නමුත්, 5ක් ඉන්නවා. මේවා බරපතළ ප්‍රශ්න. ආසන්න වශයෙන් අවුරුදු 15කට වඩා පරණ බස් රථ 3,000ක් විතර අද ඩිපෝවල තිබෙනවා. ඒවායේ නඩත්තුවත්, සුවපහසුවත්, ආරක්ෂිතභාවයත් පිරිහිලා තිබෙනවා.

අපේ රටට තවත් විශාල බරක් සහ සමාජ ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා, දෛනිකව සිදුවන රිය අනතුරු. පසුගිය වසරේ පමණක් අපේ රටේ මාරක රිය අනතුරු 2,500ක් පමණ වාර්තා වෙලා තිබෙනවා. ඉන් මිය ගිය සංඛ්‍යාව 2,700ක් පමණ වනවා. පුද්ගලයින් අද වැඩියෙන්ම මැරෙන්නේ මාර්ග අනතුරුවලින් බවට වාර්තා වෙලා තිබෙනවා. ඒ අතරින් මාරක රිය අනතුරුවලට වැඩිපුරම ලක් වෙලා තිබෙන්නේ යතුරුපැදි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තත්පර 30න් මගේ කථාව අවසන් කරනවා.

පසුගිය වසරේ පමණක් යතුරුපැදි අනතුරු 1,000ක් පමණ වාර්තා වුණා. ඊට පස්සේ වැඩිම අනතුරු සිදුවන්නේ, ත්‍රි රෝද රථවලින්. එවැනි අනතුරු 350ක් පමණ පසුගිය වසරේදී වාර්තා වුණා. පෞද්ගලික බස් රථ නිසා සිදු වූ මාරක අනතුරුත් සුළුපටු කොට සලකන්න පුළුවන්කමක් නැහැ. එවැනි අනතුරු 203ක් පසුගිය වසරේ වාර්තා වුණා. ලංගම බස් රථ ආශ්‍රිතවත් මාරක අනතුරු 66ක් වාර්තා වෙලා තිබුණා. ඒ නිසා මේ තත්ත්වය ගැනත් විශේෂ අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා.

තවත් කරුණු කිහිපයක් කිව යුතුව තිබුණත්, අනෙක් කථිකයින්ට අවස්ථාව දිය යුතු නිසා මම මීට වඩා කාලය ගන්නේ නැහැ. Seat belts පිළිබඳ ප්‍රශ්නයත්, number plates පිළිබඳ ප්‍රශ්නයත්, අනතුරු වළක්වා ගැනීම පිළිබඳවත්, දුම්රිය හරස් මාර්ග පිළිබඳවත් විශේෂ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරමින්, කාලය ලබා දීම සම්බන්ධව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නිශාන්ත ජයවීර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.50]

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ වූ නියම 3ක්, රේගු ආඥාපනත යටතේ යෝජනා සම්මතයක් සහ මෝටර් වාහන පනත යටතේ නියෝග 2ක් අද පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර තිබෙනවා. මේ පිළිබඳව කථා කළොත්, පළමුවෙනි ගැසට් පත්‍රය ඉදිරිපත් කිරීමේ මූලික පරමාර්ථය මෙයයි. හයිබ්‍රිඩ් වර්ගයේ මැන්ඩරින් කියන දොඩම් විශේෂය ලංකාවට එනකොට විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ කිලෝග්‍රෑම් එකකට රුපියල් 120ක බද්දක් මෙතෙක් කාලයක් පනවා තිබුණා. මොන රටෙන් ආවත් රුපියල් 120ක බද්දක් පැනවෙනවා. නමුත්, පාකිස්තානය සහ ශ්‍රී ලංකාව අතර තිබෙන විශේෂ වෙළඳ ගිවිසුම යටතේ පාකිස්තානයෙන් එන ඒ ද්‍රව්‍ය වෙනුවෙන් මේ වාගේ විශේෂ බද්දක් අය කරන්න බැහැ. තීරු බදු නිදහසක් දෙන්න ඕනෑ. අන්න ඒ නිදහස ලබා දීමේ අරමුණින් විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ පනවා තිබිච්ච රුපියල් 120ක බදු මුදල එතැනින් ඉවත් කර ඒක තීරු බදු යටතට දැමීම මෙහි එක අරමුණක් වනවා. මෙතෙක් තීරු බදු යටතේ තිබුණා, එන භාණ්ඩයක් සඳහා සියයට 20ක බදු මුදලක් අය කරන්න ඕනෑ කියලා. ඒක සංශෝධනයට ලක් කරනවා, සියයට 20ක් හෝ කිලෝග්‍රෑම් එකකට රුපියල් 60ක් කියන දෙකෙන් වැඩි අගය කියලා. ඒ මඟින් අපි බලාපොරොත්තු වෙන්නේ මේකයි. විශේෂයෙන්ම පාකිස්තානය එක්ක තිබෙන වෙළඳ ගිවිසුමට අනුව ඒ රටට ලබා දිය යුතු බදු සහනය ලබා දීම සහ වෙනත් රටවලින් මේ පලතුරු වෙනුවෙන් ආදායම් සංරක්ෂණ පනත යටතේ අපට ලැබෙන බදු මුදල අහිමි කර ගන්න බැහැ. ඒ බදු මුදල ලබා ගැනීමේ පරමාර්ථයෙන් තමයි මේ සංශෝධනය සිද්ධ වෙන්නේ.

ඊට පසුව නිකුත් කර තිබෙන දෙවන ගැසට් පත්‍රයෙන් බලාපොරොත්තු වෙන්නේ මෙයයි. ඒ අනුව, මැන්ඩරින් වර්ගයේ ඒවාට නිකුත් කර තිබෙන SSCL එක ඉවත් වෙනවා. ඒ එක්කම දේශීය අල සහ ලූනු ගොවියා ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් විශේෂයෙන්ම ආනයනික අර්තාපල් සහ ලූනු වෙනුවෙන් පනවන ලද බදු මුදල තවදුරටත් එලෙසම පවත්වාගෙන යෑම වෙනුවෙන් තමයි මේ දෙවන ගැසට් පත්‍රය නිකුත් කරලා තිබෙන්නේ.

තුන්වනුව නිකුත් කර තිබෙන ගැසට් පත්‍රයෙන් බලාපොරොත්තු වෙන්නේ "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වුණු ජනතාවට සහන සැලසීම වෙනුවෙන් ලැබෙන අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතෙන් නිදහස් කිරීමයි.

හතරවන ගැසට් පත්‍රය මඟින් විශේෂයෙන්ම අපි බලාපොරොත්තු වෙන්නේ මේකයි. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ භාණ්ඩ වර්ග 62කට බදු පනවා තිබුණා. භාණ්ඩ වර්ග 62කට පනවන ලද බදු මුදල් පැනවීමේ කාල සීමාව 2025.12.31 දිනෙන් අවසන් වෙනවා. ඒ කාල සීමාව තවත් වසරකට දීර්ඝ කර ගැනීම මේ තුළින් බලාපොරොත්තු වනවා. ඊට අමතරව, රාමසාන් උත්සව සමයේදී මුස්ලිම් ජනතාව වෙනුවෙන් පරිත්‍යාග විධියට ලැබෙන රටඉඳි වෙනුවෙන් කිලෝවකට රුපියල් 200ක බදු මුදලක් අය කළා. මේවා පරිත්‍යාග විධියට ලැබෙනවා නම්, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත ඒ රුපියල් 200ක බදු මුදල රුපියලක බදු මුදලක් දක්වා අඩු කිරීමත් තමයි මේ ගැසට් පත්‍රයෙන් බලාපොරොත්තු වන්නේ. ඔන්න ඔය ගැසට් පත්‍ර හතර යටතේ ප්‍රධාන වශයෙන් සඳහන් වන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියම සහ රේගු ආඥා පනත යටතේ යෝජනා සම්මතයත් අද පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කරලා තිබෙනවා.

මීටත් අමතරව ගත්තොත්, 2025 අවුරුද්දේදී සුවිශේෂී ආර්ථික ජයග්‍රහණ විශාල ප්‍රමාණයක් ජාතික ජන බලවේග රජය විධියට අප ලබාගෙන තිබෙනවා. ඇත්තටම අපේ ජංගම ගිණුම බැලුවොත්, 1950 ඉඳලා මේ දක්වාම වූ විශාල කාල පරිච්ඡේදය තුළදී ඉතාම කුඩා අවස්ථා කිහිපයකදී හැර ජංගම ගිණුමේ ධන ශේෂයක් අත්පත් කර ගන්න අපි සමත් වෙලා නැහැ. අවස්ථා 7කදී තමයි ජංගම ගිණුමේ ධන ශේෂයක් අත්පත් කර ගන්න අපි සමත් වෙලා තිබෙන්නේ. නමුත්, 2025 අවුරුද්දේදී අපි ඩොලර් බිලියන 17.1 ඉක්මවන අපනයන ආදායමක් ලබා ගන්න සමත් වෙනවා. ඊට අමතරව, අපේ සංචාරක ආදායම වැඩි වනවා. ඒ වාගේම ඉතිහාසයේ පළමුවැනි වතාවට වැඩිම සංචාරකයෝ ප්‍රමාණයක් ලංකාවට එනවා. ඒ හරහා ඩොලර් බිලියන 3.1කට වැඩි ආදායමක් ලබා ගන්න අපි සමත් වෙනවා. ඒ එක්කම විදේශීය ප්‍රේෂණ - විදේශීය ශ්‍රමිකයන්ගෙන් අපේ රටට ලැබෙන ප්‍රේෂණ - ඩොලර් බිලියන 8.1කට වැඩි ප්‍රමාණයක් ලබා ගන්න අපි සමත් වෙනවා. ඊටත් අමතරව අපේ රටට ගලා ගෙන එන සෘජු විදේශ ආයෝජන ඩොලර් මිලියන 1,050කට වැඩි ප්‍රමාණයක් ලබා ගන්න අපි සමත් වෙනවා. මෙන්න මේ සමත් වීම තුළ අපේ ජංගම ගිණුමේ ධන ශේෂය ඩොලර් බිලියන 1.7කට වැඩි ප්‍රමාණයකට ගෙන යන්න අපි සමත් වෙනවා. ඒ අනුව සුවිශේෂී ජයග්‍රහණ රාශියක් අත්පත් කර ගන්න මේ අවස්ථාවේදී අපි සමත් වෙනවා.

ඒ එක්කම විපක්ෂය පැත්තෙන් අදහස් මතු කරපු මන්ත්‍රීතුමෙක් ප්‍රකාශ කළා, අපේ රජය බලයට පත් වුණාට පසුව අපි බදු බින්දුව කරනවාය කියලා කිව්වාය කියා. මම එතුමාට අභියෝග කරනවා, අපි කොහේද එහෙම සඳහනක් කරලා තිබෙන්නේ කියලා පෙන්වන්න කියා. අපි එහෙම සඳහනක් කරලා නැහැ. අපි කියලා තිබෙන්නේ අපි බලයට ආවාට පසුව බදු ක්‍රමය, සාධාරණ බදු මූලධර්මවලට අනුකූලව අනුගත කරලා නිවැරදි බදු ක්‍රමයක් බවට පත් කරනවාය කියායි. ඒකට අවශ්‍ය

[ගරු නිශාන්ත ජයවීර මහතා]

නීතිමය ක්‍රියාමාර්ග මේ වනකොට ගනිමින් පවතිනවා. මෑතකදීම ඉදිරිපත් වෙන්න නියමිතයි, ඒකට අදාළ සුවිශේෂී බදු සංශෝධන කිහිපයක්. ඒ සංශෝධන ඉතාම මෑතකදී ඉදිරිපත් වෙයි. මොකද, මෙතෙක් කාලයක් බදු ක්‍රමයේ තිබුණු සංකීර්ණ බව අයින් කරන්න, ඊට අමතරව හිඟ බදු මුදල් කඩිනමින් අය කර ගන්න අවශ්‍යයි. මොකද, ආදායම් බදු මුදල් සම්බන්ධයෙන් කවුරු හෝ බදු ගෙවන්නෙකුගේ හිඟ බදු මුදල් තිබෙනවා නම්, ඒ හිඟ බදු මුදල මාස හයක වාගේ කාලයක් ඇතුළත ගෙවනවා නම්, ඒ වෙනුවෙන් පනවනු ලබන පොලිය අහෝසි කිරීම වාගේ සහනයක් දීලා හිඟ බදු මුදල් කඩිනමින් අය කර ගන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න සහ බදු ක්‍රමය සරල කරන්න තමයි ඒ සංශෝධන ඉදිරිපත් කරන්නේ.

ඊට අමතරව, බදු ක්‍රමයට නවීන තාක්ෂණය හඳුන්වා දෙන්න අවශ්‍යයි. ඒවාට අවශ්‍ය නීතිමය සංශෝධන සහිත පනත් කෙටුම්පත් කිහිපයක් ඉතා ළඟදීම පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා අපි ඉදිරිපත් කරනවා. ඊටත් අමතරව, නව රජය බලයට පත් වීමත් එක්ක රජයේ ආදායමට සුවිශාල දායකත්වයක් දක්වන ප්‍රධාන දෙපාර්තමේන්තු තුනට ඉතිහාසයේ වැඩිම ආදායම් ඉලක්ක ලබා දී තිබුණා. ඒ දෙපාර්තමේන්තු තුන ආදායම් ලබා ගන්න ප්‍රවණතාව බලා ඒ ඉලක්කම් තවදුරටත් අතරමගදී වැඩි කළා. ඉතිහාසයේ ප්‍රථම වතාවට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ලබා දුන් ඉලක්කයට සහ සංශෝධිත ඉලක්කයටත් එහාට ගිහිල්ලා රුපියල් බිලියන 41ක් ලබා ගන්න අපි සමත් වෙලා තිබෙනවා. ඒක වාර්තාගත ජයග්‍රහණයක්. ඉතිහාසයේ කවදාවත් මේ වාගේ ජයග්‍රහණයක් ලබා ගන්න හැකි වෙලා නැහැ. නමුත්, අද ඒ ඉලක්කවලට වඩා එහාට යන්න අපට හැකියාව ලැබී තිබෙනවා.

ශ්‍රී ලංකා රේගුව ගත්තත්, ඔවුන්ට ලබා දුන් ඉලක්කයෙන් සහ සංශෝධිත ඉලක්කයෙන් එහාට ගිහිල්ලා රුපියල් බිලියන 271ක් ඉක්මවා ගිය ඉලක්කයක් 2025 අවුරුද්දේදී ලබා ගන්න අපි සමත් වෙනවා.

ඒත් එක්කම සුරාබදු දෙපාර්තමේන්තුව ලබා දුන් ඉලක්කයට වඩා රුපියල් බිලියන 5ක වාගේ ආදායම් ඉලක්කයක් ලබා ගන්න සමත් වෙනවා. රජයක් අය වැයකින් ඉදිරිපත් කරපු ආදායමට එහාට ගිය ඉලක්කයක් ප්‍රථම වතාවට අත්කර ගන්න ජාතික ජන බලවේග රජය විධියට මේ අවස්ථාවේදී අපි සමත් වෙලා තිබෙනවා. මේ අවස්ථාව අපට ලැබෙන්නේ මේ රජය ගෙන යන ඉතා නිවැරදි වැඩ පිළිවෙළ, මූල්‍ය විනය, ජනතාව ගෙවන බදු මුදල් ඉතාම සාධාරණ විධියට රටේ සංවර්ධන කටයුතු වෙනුවෙන් යොමු වනවා කියන විශ්වාසය තහවුරු වීම සහ දෙපාර්තමේන්තුවල නිලධාරින්ගේ කාර්යක්ෂමතාව වැඩි කරන්න රජය මැදිහත් වෙලා කරන ලද සියලු කටයුතු හේතුවෙන්. මේ සියලු කටයුතු ඒකාබද්ධ වීම නිසා මේ විධියට සාර්ථක ආදායම් ඉලක්ක අභිභවා යන්න අපි සමත් වෙලා තිබෙනවා, 2025 අවුරුද්ද ගත්තාම.

ඊළඟට අපි 2026 වසර උදාහරණයකට ගනිමු. 2026 වසරේ ජනවාරි මාසය ගත්තොත්, මේ දෙපාර්තමේන්තු සියල්ලම තමන්ට දීලා තිබෙන ඉලක්කයට එහාට ගිය ඉලක්කයක් ලබා ගන්න මේ වනකොට සමත් වෙලා තිබෙනවා. මීට කලින් කථා කරපු නියෝජ්‍ය ඇමතිතුමෙක් ප්‍රකාශ කළා වාගේ අපි ලබා දීලා තිබෙන ඉලක්කය අපිටම අභියෝගයක් කරගෙන එතැනින් එහාට යන්න ඇත්තටම කටයුතු කරනවා. ඒ තුළින් තමයි මේ සියලු ජයග්‍රහණ ලබා ගන්න හැකි වෙන්නේ.

මේ ගරු සභාවේදී විපක්ෂය පැත්තෙන් කථා කළ මන්ත්‍රීතුමන්ලාගෙන් අදහසක් ආවා, මේ රජය "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට පත් වූ ජනතාව වෙනුවෙන් මුදල් වෙන් කරලා නැහැ, ඒ මුදල් අදාළ අයට ලැබෙන්නේ නැහැ කියලා. සංඛ්‍යාලේඛන අනුව බැලුවොත්, රජයක් විධියට අපි 2025 අවුරුද්දේදී රුපියල් බිලියන 72ක් වෙන් කළා, "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් විපතට පත් වූ ජනතාවට ක්ෂණික සහන සලසන්න. එහිදී අපි රුපියල් 25,000ක දීමනාවක් ගෙවිවේ ගංවතුරෙන් යට වූ නිවාස යථාවත් කර ගැනීමට. ඒ දීමනාව සියයට 98කට වැඩි පිරිසකට අපි මේ වනකොට ලබා දී තිබෙනවා. ඒ වාගේම රුපියල් 50,000ක දීමනාව සියයට 85කට වැඩි පිරිසකට ලබා දී තිබෙනවා. ඊට අමතරව, මේවාට අවශ්‍ය සියලු මුදල් රජය විධියට පැහැදිලිවම වෙන් කර තිබෙනවා. ඒ මුදල් එළියට ගලාගෙන යෑමේ යම් යම් ප්‍රමාදයන් තිබෙන්නේ අදාළ පුද්ගලයන් ඉදිරිපත් කරන තොරතුරුවල තිබෙන අඩුපාඩු නිසායි. රජය විධියට අපි අවශ්‍ය මුදල පැහැදිලිව වෙන් කර තිබෙනවා. ඊටත් අමතරව, රජය රුපියල් බිලියන 500ක මුදලක් පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් ඉදිරිපත් කරලා, පාර්ලිමේන්තුවෙන් සම්මත කරගෙන තිබෙනවා. මේ වෙලාවේදී රජයට මුදල් හිඟයක් නැහැ. ඒ කටයුත්ත වෙනුවෙන් අදාළ මුදල් වෙන් කර තිබෙනවා.

ජනාධිපතිතුමා ප්‍රකාශ කළා වාගේ ඒ ජනතාවට සහන ටික ලබා දෙන්න රජය විධියට අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබෙනවා. යම් නිවසක් පූර්ණ හානියට ලක් වුණොත් ඒ සහනය ගන්න අවශ්‍ය තහවුරු කිරීම් කරන්න සහ තක්සේරුව ලබා ගන්න යම් කාලයක් ගත වනවා හැර වෙන ප්‍රමාදයක් නැහැ. මොකද, රජය විසින් සම්පූර්ණ මුදල් ප්‍රමාණය වෙන් කර තිබෙනවා. මේ කාරණා එක්ක ජාතික ජන බලවේග රජය විධියට අපි ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළට ගෙනියන්න අවශ්‍ය සියලු කටයුතු ඉෂ්ට සිද්ධ කරන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නීතිඥ සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මම ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාගෙන් තව විනාඩි දෙකක් ඉල්ලා සිටිනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට වෙලාව දෙනවා.

[අ.භා. 3.02]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විනයගරුක නියෝජ්‍ය අමාත්‍යවරයෙක් කථා කළේ. එතුමා හොඳට කථා කළා. ඇත්තටම එතුමා බදු ගැන කථා කළා. හැබැයි, එතුමාට දෙන උත්තරයක් විධියට මම කියන්න කැමැතියි, බදු අඩු වෙලා නැහැ කියලා.

ඔබතුමන්ලා දැන් මේ සමහර දේවල්වල credit එක ගත්තාට රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ වැඩ පිළිවෙළ තමයි තිබෙන්නේ. අපි නොවෙයි කියන්නේ, මහ බැංකු අධිපතිවරයා. ඔබතුමන්ලා සමහර credit ගන්න හදනවා රනිල් වික්‍රමසිංහ මහත්තයා දාපු platformsවල. එහෙම කරලා එහිම තිබෙන යම් අඩුපාඩුවක් ගැන කියලා "අපි ඒවා කරන්නේ නැහැ" කියනවා. හැබැයි, ඔබතුමන්ලා බදු අය කරගෙන, ආදායම් අරගෙන යම්කිසි මට්ටමකට මොනවා හෝ කරනවා නම් කරන්නේ, එතුමාගේ වැඩ පිළිවෙළ තුළම තමයි. මහ බැංකු අධිපතිවරයා කියනවා, "අනුර, සජිත් නොවෙයි, ශක්‍රයා ජනාධිපති වුවත් කරන්න වෙන්නේ ජනපති රනිල්ගේ වැඩ පිළිවෙළ" කියලා. මේ අපි නොවෙයි, මහ බැංකු අධිපතිවරයා කියන්නේ. අපි රනිල් වික්‍රමසිංහ මහත්තයා හොඳයි කියලා කියනවා නොවෙයි. හැබැයි, ඔබතුමන්ලා කරන්නේ ඒක.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, තව කරුණක් මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මගේ වෙලාවෙන් නම් ගන්න එපා. මට ඔබතුමන්ලාගේ වෙලාවෙන් දෙනවා නම් උත්තර දුන්නාට කමක් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තිබෙන්නේ විනාඩි 8යි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමා බදු ගැන ප්‍රකාශ කරපු නිසා අඩු කරපු බදු වර්ග තුනක් ගැන මට පැහැදිලිව ප්‍රකාශ කරන්න පුළුවන්. පසුගිය රජය පනවා තිබුණු, අපි අඩු කරපු බදු වර්ග තුනක් ගැන මම පැහැදිලිව සඳහන් කරන්නම්. *[බාධා කිරීමක්]* බදු අඩු කළේ නැහැයි කියලා ඔබතුමා කියපු නිසායි මම කියන්න හැදුවේ. ඔබතුමා වැරදි ප්‍රකාශයක් ඉදිරිපත් කරන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමා ඉදිරිපත් කරපු ඒ ප්‍රකාශය වැරදියි. මම පැහැදිලිව ඉදිරිපත් කරන්නම්, අඩු කරපු බදු වර්ග තුනක් තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා තත්පර 30කින් අවසන් කරන්න.*[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කාරණයට උත්තරය දෙන්නේ.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
අපි ආවාට පස්සේ පුද්ගල ආදායම් බද්ද සම්බන්ධයෙන් ආදායම් සීමාව ලක්ෂ 12ට තිබුණු එක ලක්ෂ 18කට ගෙන ගියා. බදු සහනයක් දුන්නා. බදු අය වන පළමු ප්‍රතිශතයේ කාණ්ඩය ලක්ෂ 10 දක්වා ගෙන ගියා. එකතු කළ අගය මත බද්ද කිරි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන මත අඩු කළා. ඊට අමතරව, පොලී මත රඳවා ගැනීම් බද්ද - සියලු දෙනාට දාලා තිබුණු බද්ද - අපි නැති කළා. ඒක අහෝසි කරලා බදු අය කරන අයගෙන් විතරයි අඩු කළේ. ඔය බදු වර්ග තුන අපි අඩු කරන්න කටයුතු කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මට වෙලාව දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.*[බාධා කිරීමක්]* මගේ නැති වුණු කාලය වෙනුවෙන් විනාඩියක් ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හොඳයි, ඔබතුමාට ඒ විනාඩිය ලබා දෙනවා. ඔබතුමා කථා කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියට එහෙම අවසරයක් දෙන්න බැහැ, එතුමාට.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඇමතිතුමා සඳහන් කළේ අත්‍යවශ්‍ය භාණ්ඩවල බදු අඩු කරනවා කියලා. හැබැයි, මොනවත් අඩු කළේ නැහැ. ඔබතුමන්ලා රනිල් වික්‍රමසිංහ මහත්තයා කරපු දේමයි කරන්නේ. ඔබතුමන්ලාගේ කෙරුවාව මම කියන්නම්. VAT එක අයින් කරනවා කිව්වා, අයින් කළේ නැහැ. බොරු කයිය ගහන්නේ. සාමාන්‍ය ජනතාවට දෙන දෙයක් හැරෙන්න වෙන දෙයක් ගන්නේ නැහැ කිව්වා. දැන් වාහන පාවිච්චි කරනවා. නිල නිවාස පාවිච්චි කරනවා. ජනාධිපතිවරයා හැම මාසයකම රට යනවා. රුපියල් කෝටි ගණනක,-*[බාධා කිරීමක්]* මන්ත්‍රීවරු, ඇමතිවරු සිය සැරයකට වැඩිය රට ගිහිල්ලා තිබෙනවා, Business Class එකේ. මේ අවුරුද්දට. මොනවාද කථා කරන්නේ? වොපර්වල යන්නේ. "වොපර්වල මාරු වෙන්නද?" කියලා ඇහුවා. ඒ ඔක්කෝම කරනවා. රට දියුණු කරන්නේ නැති එක විතරයි වෙන්නේ. ආර්ථික වර්ධන වේගයක් නැහැ. ආයෝජන නැහැ. එච්චරයි.

ඔබතුමා බලන්න, පවුල්වලින් සියයට 32ක් බඩගින්නේ ඉන්නේ. අපි නොවෙයි මේවා කියන්නේ. "දිනමිණ" පත්තරේ තමයි තිබෙන්නේ. ගිය වසරේ සියයට 16යි. මේ වසරේ සියයට 32යි. එළවලු කන්නේ සතියට දවස් හතරයි. සියයට 33ක් ආහාර ගන්න වේල් ගණන අඩු කරලා. සියයට 20ක් රත්තරන් බඩු විකුණලා. මෙන්න, අහ ගන්න. "දිනමිණ" පත්තරේ තිබෙන්නේ. "දිට්වා" සුළි කුණාටුව සම්බන්ධයෙන් වන ප්‍රතිසංස්කරණවලට ඇමෙරිකානු ඩොලර් බිලියන 6.5ක් අවශ්‍යයි. ඒත් ඇවිල්ලා තිබෙන්නේ 0.17යි.

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේගොල්ලන්ගේ මඩ වාහිනී එකකින් මඩ ගහනවා. ඔබතුමියටත් හිනා යනවා. මේවා අපිටත් හිනා යන දේවල් තමයි. Corruption Perceptions Index එක බලන්න. *[බාධා කිරීම්]* අහගන්න. සංයමයෙන් යුතුව අහගන්න. 2014දී අපේ රට තිබුණේ Corruption Perceptions Index එකේ 85වැනි ස්ථානයේ. 2015දී තිබුණේ 83වැනි ස්ථානයේ. 2016දී තිබුණේ 95වැනි ස්ථානයේ. 2017දී තිබුණේ 91වැනි ස්ථානයේ. 2018දී තිබුණේ 89වැනි ස්ථානයේ. 2019දී තිබුණේ 93වැනි ස්ථානයේ. 2024 අග වෙනකොට 121වන ස්ථානයට ගියේ මේ ආණ්ඩුව යටතේයි. දැන් ඉන්නේ 107වැනි ස්ථානයේ. 120ට පස්සේ ලොකුම අගය. ඊට කලින් 2022 අවුරුද්දේ සිටියේ 101වැනි ස්ථානයේ.

කයිය ගහනවා. බොරු කරනවා. විරුද්ධ පක්ෂයේ පිරිස හිරේ දාන්න හදනවා. පොඩි පොඩි හාල්මැස්සෝ අල්ලනවා. අර කියපු රාජපක්ෂලා කෝ? මහින්ද රාජපක්ෂ හිරේ කෝ? අනෙක් කට්ටිය හිරේ කෝ? ගෝඨාභය රාජපක්ෂ හිරේ කෝ? බැසිල් රාජපක්ෂ හිරේ කෝ? ඩොලර් බිලියන 20ක් පිටරටින් ගෙනෙනවා කිව්වා. ගෙනාවාද? නැහැ. අනුර කුමාර මහත්තයා ධනවාදී වුණා. බිමල් රත්නායක මහත්තයා ධනවාදී වුණා. දැන් කථා කරනවා වැඩ වර්ජන ගැන. වැඩ වර්ජනවල පිකාසෝලා බිමල් රත්නායක මහත්මයා ඇතුළුව මෙතුමන්ලා. මාලිමාවේ හර්ෂණ ඇමතිතුමන්ලා වාගේ කට්ටිය නොවෙයි. ඒ, අපේ කට්ටිය.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජේවීපී කට්ටිය මොනවාද කළේ? විශාල විනාශයක් කළා. ගහලා, ගහලා, වැඩ වර්ජන කරලා මේ රට විනාශ කළා. දැන් කියනවා වැඩ වර්ජනවලින් ජනතාව අතරමං වෙනවා ලු. කවුද, වැඩ වර්ජන කළේ? කවුද, ඉස්පිරිතාල වැහුවේ? කවුද, ඒ කාලයේ වැඩ වර්ජන කළේ? ඔය ඉන්න හතර දෙනා ඇතුළු ජේවීපී එක. මෙතැන මාලිමාවේ ගොඩාක් හොඳ මන්ත්‍රීවරු ඉන්නවා. ඒ කට්ටිය කළේ නැහැ. ඒවා තමයි මේ රටට කරපු විනාශයන්.

කලින් කථා කරපු ඇමතිවරයා - එතුමාට "සූර පප්පා" ඇමතිවරයා කියලා කියන්නේ - තනිකර පට කිව්වේ, ආර්ථික වර්ධන වේගය ගැන. කොහේද ආර්ථික වර්ධන වේගයක් තිබෙන්නේ? මම මේ තොරතුරු ගත්තේ Research Section එකෙන්. එදා රනිල් වික්‍රමසිංහ මහත්තයා රට භාර දුන්නේ සියයට 5.4ක ආර්ථික වර්ධන වේගයක් එක්කයි. බංකොලොත් වුණු රට රනිල් වික්‍රමසිංහ මහත්තයා ඇවිල්ලා සියයට 5.4ට ආර්ථික වර්ධන වේගය ඉහළ නංවා දුන්නා. ඊට පස්සේ කීයද තිබෙන්නේ? 2025 first quarter එකේ ආර්ථික වර්ධන වේගය සියයට 4.8යි. හතයි ගණනක් කියලා කිව්වා. දෙවන කාර්තුවේ සියයට 4.9යි. තුන්වැනි කාර්තුවේ සියයට 5.2යි. කොහොමද ඒක වුණේ? වාහන ටික ගෙන්වපු නිසා ඒක එහෙම වුණේ. ඩොලර් බිලියනයක් පිට රට යවලා ඩොලර් බිලියන දෙකක් taxවලින් හොයලා තමයි මේ ආර්ථික වර්ධනය ඉහළ නංවලා පෙන්නුවේ. වෙන ආර්ථික වර්ධනයක් නැහැ. ආයෝජන නැහැ. මේ රටේ ජනතාව ජීවත් වෙන්නේ ඉතාම අමාරුවෙන්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඩොලරය දැන් රුපියල් 309යි. ඒ කාලයේ ඩොලරය රුපියල් 290යි. මේකයි යථා තත්ත්වය. හිනා වෙන්න පුළුවන්. බිමල් මහත්තයාගේ නෝනා හිනා වෙනවා. හිනා වුණාට මේක තමයි රටේ යථාර්ථය. බලන්නකෝ, ඔබතුමියට හිනා වෙන්න පුළුවන්ද කියලා. රටේ ජීවත් වෙන පවුල් ප්‍රමාණයෙන් සියයට 32ක් බඩගින්නේ ඉන්නේ. ඔබතුමන්ලා පඩි ගන්නවා, රට යනවා, සුඛෝපභෝගී ජීවිතය එහෙමමයි. කිසිම දෙයකින් වෙනස් වෙලා නැහැ. අවුරුදු හැත්තෑ ගණනට බැන්නා. ඒකේ කිසි දෙයක් වෙනස් වෙලා නැහැ. වියදම් කරන ඒවාත් එහෙමයි.

ජනාධිපති අදත් ඉන්දියාවේ. ඉන්දියාවට ගිහිල්ලා මොකක්ද කළේ? ටිල්වින් සිල්වා මහත්තයා රතු සාටකයකුත් දාගෙන ඉන්දියාවට ගිහිල්ලා ඉන්දියාවේ විදේශ ඇමතිතුමා හම්බ වුණා. අපේ ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිවරයාටත් හිනා. එතුමා ඒ කාලයේ ජේවීපී එකේ හිටියේ නැහැ. ජේවීපී එක ඒ කාලයේ ඉන්දියාවට ගහන්න ගිහිල්ලා 60,000ක් මිය ගියා. දැන් ඔබතුමන්ලා ඉන්දියාවේ best friend. ජනාධිපතිවරයා ඇතුළු ඔක්කෝම යන්නේ ඉන්දියාවට. ඉන්දියාවත් එක්ක හොර ගිවිසුම් අත්සන් කරනවා. ඇමෙරිකාවට බැන්නා. ඒ කාලයේ කොකා-කෝලා බිව්වේ නැහැ.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
ඉරිසියාවයි නේද?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
අපි ඉරිසියාවයි? අපි පොඩි කාලයේ නේ ඇමෙරිකාවට, ඉන්දියාවට ගියේ. ඉරිසියා කරන්න දෙයක් නැහැ. ඔබතුමා මන්ත්‍රී වෙලා පොඩි පොඩි දේවල් ගත්තාට අපි පොඩි කාලයේ තමයි ඒ රටවලට ගියේ. ඔබතුමා ඒ කාලයේ- *[බාධා කිරීමක්]* අපි ඒ කාලයේ නිවාඩුවට ගියේ. අපි ඇමෙරිකාවට ගියේ අවුරුදු 30කට කලින්.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
ඕක තමයි ඉරිසියාව.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඉරිසියාව නොවෙයි. ඕක තමයි අපි හිනා වෙන්නේ. ඔන්න, ප්‍රතිපත්ති වෙනස් කරන ආකාරය; කටුස්සා පාට වෙනස් කරන ආකාරය. මම ඔබතුමා ගැන දන්නේ නැහැ. ඔබතුමා කෑ ගහනවා ඇහිලා තිබෙනවා. මම ඔබතුමාගේ වතගොත - background එක - දන්නේ නැහැ. හොයලා බැලුවොත් කියන්න පුළුවන්. ඕනෑ නම් මම හෙට හොයලා කියන්නම්. හොයලා බැලුවොත් ඔබතුමා කොහෙන්ද ආවේ, මොනවාද කළේ කියන එක රටේ ජනතාවට තේරුම් ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතුමන්ලා වාහන ගැන කථා කළා. මම සදාචාරාත්මක නිසා, මඩ ගහන්න කැමැති නැති නිසා වාහන අංකය විතරක් කියන්නම්. ඒක තමයි, PK - 6305.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අම්මා!

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මොනවාද, "අම්මා, අම්මා" ගාන්නේ? අපි කාටද මඩ ගහලා තිබෙන්නේ? අපි මඩ ගහන්නේ නැහැ. අපි මහින්ද රාජපක්ෂටත් කෙළින් කථා කළා. ගෝඨාභය රාජපක්ෂටත් කෙළින් කථා කළා. කාටවත් අපි මඩ ගහන්නේ නැහැ. අපි නිවටයෝ නොවෙයි. මම මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා අවුරුද්දක් වෙනවා. කොහේවත් මඩක් ගහලා තිබෙනවා නම් පෙන්වන්න. එහෙත් මෙහෙන් hint ගහනවා, එක එක්කෙනා. කෙළින් කථා කරන්න, ඔබතුමන්ලා. මම මේ අයගේ නම් කියන්නේ නැත්තේත් ඒකයි.

PK-6305 - අධ්‍යක්ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය. PG-9359 - ලේකම්, Ministry of Megapolis and Western Development. මම මන්ත්‍රීවරුන්ගේ නම් කියන්නේ නැහැ. CAT-1605 - අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව. PD-9097 - අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි දෙපාර්තමේන්තුව. CAE-7785 - අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්. PD-8669 - ඉන්දීය උසස් අධ්‍යාපන මධ්‍යස්ථාන පෞද්ගලික සමාගම. PG-7178 - කොමසාරිස් ජෙනරාල් දෙපාර්තමේන්තුව, බුද්ධශාසන අමාත්‍යාංශය. PG-0813 - ජනාධිපති ලේකම්. PE-8853 - දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය. PF-0741 - දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්. KB-5111 - නැඟෙනහිර පළාත් ප්‍රධාන ලේකම්. PG-5772 - නැඟෙනහිර පළාත් ප්‍රධාන ලේකම්. PC-4109 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි කියන්නේ මේකයි. බොරුවට මේ සුළු පිරිසක් වන මන්ත්‍රීවරුන්ගේ pension එක නැති කරනවා කියලා -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න.

මාලිමාවේ ගොඩාක් මන්ත්‍රීවරුන් වෘත්තීයමය දේශපාලනඥයන් නොවෙයි; දිගටම දේශපාලනය කරන කට්ටිය නොවෙයි. අවුරුදු පහක් ගිහිල්ලා තමන්ට නැවත වෘත්තියකට බැඳෙන්න පුළුවන් අවස්ථාව තිබෙනවා. හැබැයි, කථා කරන්නේ ඉතා සොච්චම් දෙයක් කරලා. අපට pension එක ඕනෑ නැහැ. අවුරුදු 30ක්, 40ක් දේශපාලනය කරපු අමාරුවෙන් ජීවත් වෙන මනුස්සයෙකුට ඔයගොල්ලන් බලලා pension එකක් දෙනවා නම් දෙන්න. ඒකේ ප්‍රශ්නයක් නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
හැබැයි මේ pension එක ගැන කථා කරලා, මේ රට වෙනස් කරන්න ආවේ කියලා බොරුවට, ලොකුවට කියන්න එපා. අවුරුද්දයි ගියේ. රාජපක්ෂලා අවුරුදු 20ක්, 25ක් ආණ්ඩු කරලා තමයි කරපු මගඩි ඔක්කෝම කරන්න පටන් ගත්තේ. මෙතුමන්ලා අවුරුද්දක් යනකොට මොකක්ද කරන්නේ? ජනාධිපතිතුමා සුමානයෙන්, සුමානයට රට යනවා. වාහන පාවිච්චි කරනවා. නිල නිවාස පාවිච්චි කරනවා. සුඛෝපභෝගී හැම දෙයක්ම පාවිච්චි කරනවා. පිඹුරන් වාගේ, කිඹුලන් වාගේ ඇමතිවරු මහත්වෙලා. බෙල්ට් එක දාගන්න බැහැ. ඔබතුමන්ලා හිටියේ මේ වාගේ පොඩි සයිස් එකට. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි කියනවා, "ඔවා දෙනු පරහට - තමා සම්මතයේ පිහිටා සිට" කියලා. බොරු කියන්න ලැහැස්ති වෙන්න එපා. තමන්ගේ සුඛවිහරණය නම් උපරිමයෙන්ම කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.12]

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැනට ක්‍රියාත්මක වන පනත් තුනක් යටතේ වන නියමයන්, නියෝග සහ යෝජනා සම්මතයක් තමයි අද අප විවාදයට ගන්නේ. එකක් තමයි, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ වන නියමය. ඒ වාගේම, 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත යටතේත් කරුණු සාකච්ඡාවට ගැනෙනවා.

මේ සාකච්ඡාවේදී විපක්ෂයේ ගොඩක් අයගේ කථා අහගෙන ඉන්න කොට අපට හිතෙනවා, අපි මැරිලා ඉපදුණු මිනිස්සු කියලා විපක්ෂයේ අය හිතනවා ඇති කියා. මැරිලා ඉපදුණු මිනිස්සු මේ පැත්තේ නැහැ. ඔය පැත්තේ එහෙම කට්ටිය ඉන්නවාද දන්නේ නැහැ. මොකද, ඔය කියන කථා අහගෙන ඉන්න විටයි අපට එහෙම දැනෙන්නේ. නමුත්, මම ඉහත කී ගැසට් දෙක පිළිබඳව මුලින්ම පුංචි අදහසක් කියලා ඉන්නම්. ඊට පසුව අපි වැඩිදුරටත් කථා කරමු.

විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතට අදාළ ගැසට් නිවේදනය හරහා අපි බලාපොරොත්තු වෙනවා දැනට මැන්ඩරින් වර්ගයට අදාළ පලතුරු ආනයනය කිරීමේදී පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද යම් ප්‍රමාණයකින් සංශෝධනය කරන්න. ඒකට හේතුවක් තිබෙනවා. දැනට ආනයනය කරනු ලබන මැන්ඩරින් වර්ගයේ විශේෂ හයිබ්‍රිඩ් පලතුරු කිලෝවකට රුපියල් 120ක බද්දක් අය කරනවා. ඒ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දත් එක්කම අපි මෑත කාලයේ පාකිස්තානය සමඟ වෙළෙඳ ගිවිසුමකට එළැඹෙනවා. එම වෙළෙඳ ගිවිසුමට එළැඹීමත් සමඟ බදු සහන යටතේ අපි භාණ්ඩ වර්ග 1,800කට ආසන්න ප්‍රමාණයක් පාකිස්තානයෙන් ලංකාවට ආනයනය කරන කොට අපේ රටේ භාණ්ඩ වර්ග 600කට වැඩි ප්‍රමාණයක් පාකිස්තානයට යවනවා. අපි නිදහස් වෙළඳ ගිවිසුමක් හරහා කටයුතු කරන කොට පාකිස්තානයෙන් ගෙනෙන මැන්ඩරින් වර්ගයේ හයිබ්‍රිඩ් පලතුරුවලට බදු අය කිරීම ප්‍රශ්නයක් නිසා පාකිස්තානයෙන් රාජ්‍ය තාන්ත්‍රික ඉල්ලීමක් කරලා තිබෙනවා, ඒක වෙනස් කරලා දෙන්න කියලා. ඒකත් එක්ක පදනම් වෙලා තමයි අපි මේ එක ගැසට් එකක් සාකච්ඡාවට අරගෙන ක්‍රියාත්මක කරන්න පටන් ගන්නේ.

අනෙක් කාරණය මේකයි. මේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පැනවීම පිළිබඳව පසුගිය දවස්වල අපේ රටේ විවිධ සාකච්ඡා, සංවාද ගොඩක් සිදු වුණා. වෙළෙඳ පොළේ භාණ්ඩ මිල පාලනය කිරීම හෙවත් උච්චාවචනය වීම පාලනය කිරීම, ඒ වාගේම ගොවි

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

ජනතාව නිෂ්පාදනය කරන කෘෂි නිෂ්පාදනවලට සාධාරණ මිලක් පවත්වාගෙන යෑම වෙනුවෙනුත් විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු හැමදාම වාගේ පවත්වාගෙන ගිහින් තිබෙනවා. එහිදී අපි විශේෂයෙන් සඳහන් කරන එක් කාරණයක් තමයි, බී ලූනුවලට සහ අපේ රටේ නිෂ්පාදනය කරන අර්තාපල්වලට පනවන බද්ද. අල නිෂ්පාදනය ගත්තොත්, අල නිෂ්පාදනය කරන ගොවියා, තමන්ගේ අස්වැන්න අරගෙන වෙළෙඳ පොළට නිකුත් කරන කොට තමයි සාමාන්‍යයෙන් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පනවන්නේ. රටේ ආනයනික අලවල මිල යම් විධියකට පහළ මට්ටමක පැවතුණොත් දේශීයව නිෂ්පාදනය කරන ගොවියාගේ අර්තාපල්වල මිල පිළිබඳ ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ නිසා අපි එය යම් විධියකට කළමනාකරණය කරනවා. ඒ අනුව පසුගිය දවස්වල ගොවීන්ගේ ඉල්ලීමකට අනුව අපි ආහාර සුරක්ෂිතතා කමිටුවත් එක්ක සාකච්ඡා කරලා තීරණයක් අරගෙන, කැබිනට් මණ්ඩලයේ අනුමැතියත් සහිතව අර්තාපල් සඳහා පවත්වාගෙන ගිය රුපියල් 60ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද රුපියල් 20කින් වැඩි කරලා රුපියල් 80 දක්වා ගෙන ගියා. ඒ වාගේම බී ලූනු සඳහා රුපියල් 10ක්ව තිබුණු බද්ද තවත් රුපියල් 40කින් වැඩි කරලා රුපියල් 50ක් කරලා තිබෙනවා. මොකද, තමන්ගේ බී ලූනු ටික විකුණා ගන්න බැහැ කියලා දඹුල්ල පැත්තේ ගොවීන් අරගළ කරනවා, උද්ඝෝෂණ කරනවා අපි දැක්කා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ බී ලූනු නිෂ්පාදනය වසරකට එක් වතාවයි කරන්නේ. සාමාන්‍යයෙන් කන්න 3ක්, නැත්නම් 4ක් අල නිෂ්පාදනය කරනවා. ඒ කන්න හතරේ අස්වැන්න එන හැම අවස්ථාවකදීම බදු පනවන්න වෙනවා. එතකොට, මිල පවත්වාගෙන යෑම පිළිබඳ නැවත කරන සාකච්ඡාවකින් අලවල මිල දිගට පවත්වාගෙන යෑමේ වුවමනාවක් තිබෙනවා. එම නිසා මේ ගැසට් එක ක්‍රියාත්මක කරගෙන යෑම ගැනත් මෙහිදී සාකච්ඡා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විපක්ෂයේ අය දැන් මෙතැන ලොකු පම්පෝරි ගොඩක් ගහනවා. පම්පෝරි ගහනවා විතරක් නොවෙයි, ඇති වෙන්න බොරුත් කියනවා. මේ තිබෙන්නේ, Verité Research ආයතනය අපේ ආණ්ඩුව පිළිබඳව දක්වපු සටහන. ඒකේ කියනවා, "ජනතා කැමැත්ත සියයට 65 දක්වා ඉහළට" කියලා. මේවා අහන කොට සමහරුන්ට අර වාගේ පිස්සු හැදෙන එක අහන්න දෙයක් නැහැ. පිස්සු හැදිලා සමහර විට මේ සභාව තුළට එන්නේ නැතිව ඉඳීද දන්නේත් නැහැ. ඒක තමයි දැන් තිබෙන තත්ත්වය. ඊළඟට මේ වාර්තාවේ කියනවා, අපේ ආණ්ඩුවේ කටයුතු සම්බන්ධයෙන් වන ප්‍රසාදය දිගින් දිගටම වැඩි වෙච්ච විධිය පිළිබඳව; මේ සමාජය තුළ අප කෙරෙහි විශ්වාසය හැදුණු විධිය පිළිබඳව. ආර්ථික තත්ත්වය පිළිබඳ කැමැත්ත 2024 වර්ෂයේ තිබුණේ සියයට 28ක් ලෙසයි. 2025දී එය සියයට 35 දක්වා ඉහළ ගියා. දැන් සියයට 57යි. එහෙම නම්, මේ තිබෙන්නේ ආර්ථික වර්ධනය පිළිබඳ සහතිකයක්. නමුත්, විපක්ෂය මෙතැනට ඇවිල්ලා ආණ්ඩුවෙන් මොකුත් වෙන්නේ නැහැ කියලා පම්පෝරි ගහනවා. අපි නොවෙයි මේ සංඛ්‍යා දත්ත කියන්නේ. මේ වාගේ ආයතන ලෝකයේ රටවල් පිළිබඳව වෙනම පරීක්ෂණ කරනවා; වෙනම අධ්‍යයනය කරනවා. එසේ අධ්‍යයනය කරලා ඒ රටවල ආර්ථික දත්ත පිළිබඳ විශ්ලේෂණය කරලා තමයි මෙවැනි වාර්තා නිකුත් කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊළඟට රටේ ආර්ථිකයේ ඉදිරි දැක්ම පිළිබඳව ජනතාව කියනවා. ආර්ථිකය යහපත් වෙමින් පවතින බව මීට පෙර පැවසූ පිරිස සියයට 30යි. දැන් එය සියයට 64 දක්වා වර්ධනය වෙලා තිබෙනවා කියලායි කියන්නේ. ඊළඟට, රටේ කටයුතු සිදු වෙමින් පවතින ආකාරය පිළිබඳ ජනතාවගේ තෘප්තිමත් බව කියන කාරණය. එය 2024දී තිබුණේ සියයට 17යි; 2025දී සියයට 46යි. දැන් එය සියයට 59 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. එහෙම නම්, අපි රටේ ජනතාවගේ විශ්වාසය දිනාගෙනයි තිබෙන්නේ. රටේ ජනතාවගේ විශ්වාසය නිකම් ලැබෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. රටේ ජනතාවගේ විශ්වාසය දිනාගන්න නම්, ආර්ථිකය නිවැරැදිව ස්ථාවර කර ගන්න ඕනෑ; ඒ ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාව අතරට යන්න ඕනෑ. දැන් ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාව අතරට ගමන් කරමින් තිබෙනවා. ඒ නිසා මේ අවුරුද්ද ඇතුළත ජනතාවට වාසි කිහිපයක්ම ලැබෙනවා.

මේ රටේ ජනතාව මුහුණ දීලා තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි නිවාස ප්‍රශ්නය. අමාත්‍යාංශ පහක් එකට එකතු වෙලා රටේ ජනතාවගේ නිවාස ප්‍රශ්නය විසඳන්න මේ වන විට ගෙවල් දහස් ගණනක් හදනවා. ඒ වාගේම, කොළඹ නගරයේ ගෙවල් නැති ජනතාව වෙනුවෙන් මහල් නිවාස ව්‍යාපෘති හයක් යටතේ ගෙවල් 5,000කට ආසන්න ප්‍රමාණයක් හදන්න සැලසුම් කරලා ඒ කටයුත්ත මේ අවුරුද්දේ ආරම්භ කරනවා. ඒවා මේ අවුරුද්දේ පටන් ගන්නවා. අපේ ගරු බිමල් රත්නායක ඇමතිතුමා ගිහින් ඒවා පටන් ගන්නවා මම දැක්කා. ඒවා නිකම් ආවාට ගියාට කරන්න බැහැ.

දැන් මෙතැනදී කිව්වා, රනිල් වික්‍රමසිංහගේ ස්ථාවරය අනුවයි මේ කටයුතු කෙරිගෙන යන්නේ කියලා. රනිල් වික්‍රමසිංහගේ ස්ථාවරය මොකක්ද? ඔහුට ආර්ථිකය පිළිබඳව තිබුණු ස්ථාවරය මොකක්ද? ආර්ථිකයේ මුදල් ගමන් කරන්න තිබෙන සියලුම පාරවල් වැහුවා; ආනයනය සීමා කළා. ආනයනය සඳහා ඩොලර් යන එක වැළැක්වූවා. අනෙක් පැත්තෙන්, ආර්ථිකයේ ව්‍යාප්තිය සීමා කළා. අඩුම තරමින් රට ඇතුළේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේවත් කිසිවක් කරන්න දෙන්නේ නැතුව එය වැහුවා. අන්න එහෙම මුදල් ගමන් කරන මාර්ග ඔක්කොම වැහුවාට පසුව ඉතිරි වන ටික වර්ධනයක් කියලා පෙන්වන්න පුළුවන්ද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? අපි දැන් ඒ සියල්ල විවෘත කරලායි තිබෙන්නේ. අපේ සංවර්ධන ක්‍රියාදාමයට අදාළ සංවර්ධන ව්‍යාපෘති, ඉදිකිරීම් කර්මාන්තය, පාරවල් හැදීම ආදි ඔක්කොම දැන් ක්‍රියාත්මකයි. අපි වාහන ආනයනය කිරීම සඳහා ඩොලර් මිලියන 1.9ක් නිදහස් කළා. විදේශීය ණය වශයෙන් ඩොලර් බිලියන තුනයි දශම ගණනක් ගෙව්වා. මේ ඔක්කොම කරන ගමන් ආර්ථික වර්ධන වේගය සියයට 5යි දශම ගණනකට ගෙනාවේ අපි. නමුත් විපක්ෂයේ බොහෝ අය පම්පෝරි ගහලා කියනවා, "අද මොකුත් වෙන්නේ නැහැ, මොකුත් වෙන්නේ නැහැ" කියලා. ඔබතුමන්ලා ඒක හැමදාම කිය කියා ඉන්න. ඔබතුමන්ලා හැමදාම ඒක කිය කියා ඉන්න කොට අපි ගම් බිම්වල ජනතාවත් එක්ක මේ රට ගොඩ නඟන වැඩේ නිශ්චිත ක්‍රමවේදයකට අනුව සැලසුම් කරලා කරගෙන යනවා. අපි නිශ්චිත සැලසුමක් ඇතුළේ තමයි ඒ කටයුතු කරගෙන යන්නේ. ඒ නිසා තමයි අපට පුළුවන් වෙලා තිබෙන්නේ, මේ රට මේ මට්ටමට ගෙන එන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ -IMF එකේ- කළමනාකාර අධ්‍යක්ෂිකා ක්‍රිස්ටලිනා ජෝර්ජීවා මහත්මිය ඊයේ පෙරේදා මොනවාද කියා තිබෙන්නේ බලන්න. එතුමිය කියනවා, "වත්මන් රජයේ යහ පාලනය සහ දූෂණ විරෝධී ප්‍රතිසංස්කරණ සඳහා වන කැපවීම මඟින් ශ්‍රී ලංකාවට වේගවත් සංවර්ධනයක් සහ තිරසාර ප්‍රගතියක් අත් කර ගැනීමේ අනන්‍ය අවස්ථාවක් උදා වී තිබෙනවා" කියලා. එතුමිය ඒ කියන්නේ මොකක්ද? IMF එක කියන්නේ අපේ රටවල් ගැන මොකුත් දන්නේ නැති කට්ටියද? ආර්ථිකය ගැන මොකුත් දන්නේ නැති කට්ටියද? ඒ අය මේ කරුණු ඉදිරිපත් කරන්නේ, මේ රටේ වත්මන් ජනාධිපතිතුමා, අපේ ආණ්ඩුවේ අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන් විතරක් නොව, මේ රටේ රාජ්‍ය නිලධාරින් ඇතුළු අපි ඔක්කොම එකට එකතු වෙලා සැලසුම් සහගතව, විධිමත් විධියට පාලන තන්ත්‍රය පවත්වාගෙන යන නිසාමයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විපක්ෂය පැත්තෙන් පොඩි කන් කෙඳිරියක් නොවෙයි, ලොකු ශබ්දයක් එනවා, පාර්ලිමේන්තු මන්ත්‍රී විශ්‍රාම වැටුප ඉවත් කිරීම පිළිබඳව. අපි දන්නවා, අපේ රටේ සාමාන්‍ය රාජ්‍ය සේවකයෙකුට යන්තම් හෝ විශ්‍රාම වැටුපක් හිමි වෙන්න රාජ්‍ය සේවයේ අවුරුදු 10ක්වත් සේවය කරන්න ඕනෑ බව. හැබැයි, ඔහුට පූර්ණ විශ්‍රාම වැටුපක් හිමි වෙන්න අවුරුදු 30ක් රාජ්‍ය සේවයේ ඉන්න ඕනෑ. රාජ්‍ය සේවයේ අවුරුදු 30ක කැප කිරීමක් කළොත් තමයි ඔහුට පූර්ණ විශ්‍රාම වැටුපක් ලැබෙන්නේ. හැබැයි, පාර්ලිමේන්තුවට එන අය ඇවිල්ලා අවුරුදු පහයි ඉන්න ඕනෑ. වැඩක් කළත් නැතත්, අවුරුදු පහක් මේකේ නිල වශයෙන් ඉඳලා එළියට ගිය ගමන් පූර්ණ විශ්‍රාම වැටුප ලැබෙනවා. ඒකට අමතරව තව තව දේවල් වැඩි කරගෙන තිබෙනවා. එතකොට ඒ ඔක්කොම ලබා ගන්නා අය විශ්‍රාම වැටුප අහෝසි කිරීමේ යෝජනාව ඉදිරිපත් වෙනකොට, කම්පනයට පත් වෙන එක වැරැදි නැහැ. ඒගොල්ලෝ කම්පනයට පත් වෙන්න ඕනෑ. මොකද, නිකම් කොහේ හරි ඉඳලා මොකක් හෝ කරගෙන ඇවිල්ලා, මෙතැනිනුත් හම්බ කරලා, මෙතැනත් දූෂණ කරලා, කොමිස් ගහලා, මොනවා හරි කරලා කුට්ටි පිටින් හම්බ කර ගත්ත අයටත් විශ්‍රාම වැටුපක් දෙන රටක් ලෝකයේ තිබෙනවා නම්, ඒ තමයි ශ්‍රී ලංකාව. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා අපිට වගකීමක් තිබෙනවා. මේ ශ්‍රී ලංකාවේ වත්මන් රජය බලයට පත් කරපු ජනතාවට බලාපොරොත්තුවක්, අරමුණක් තිබුණා. ඒ අරමුණ වෙනුවෙන් තමයි අපි වැඩ කරගෙන යන්නේ.

ඊළඟට, පීඩාවට පත් ජනතාවට සහන සැලසීමට රජය ගත් කඩිනම් පියවර මෙහිදී අගය කළ කළමනාකරණ අධ්‍යක්ෂවරිය එම සහන කටයුතු සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක් දෙන්න තීරණය කරනවා. ලෝක බැංකුව මුදල් දෙනවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල උදවු කරනවා, ලෝකයේ වෙනත් රටවල් හැම එකක්ම අපට උදවු කරනවා. මේ විපක්ෂයට ඒක පෙනෙන්නේ නැති වුණාට අපි ඒක අගය කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි මේ වැටුණු රට, මේ දූෂණයට ලක් වුණු රට, දූෂණයෙන් තොරව, සංවර්ධනය කරා යන ගමනට අනිවාර්යයෙන් මෙහෙයවනවා කියන සහතිකය ලබා දෙමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, ස්ථාවර නියෝග 27(1) යටතේ මෙය මතු කරන්නේ. මම ඒක සම්පූර්ණයෙන් කියවන්නේ නැහැ. මම ප්‍රශ්නය කියන්නම්. සාමාන්‍යයෙන් අපි Privilege matter එකක් සම්බන්ධව හෝ වෙන මොකක් හෝ Motion එකක් භාර දෙනකොට, මහ ලේකම්තුමියගේ කාර්යාලයට භාර දෙන්න කියලා තමයි ස්ථාවර නියෝග 27(1) යටතේ තිබෙන්නේ. හැබැයි, මම ගොඩක් වෙලාවට කථා කරනකොට, මහ ලේකම්තුමිය සහ ලේකම්තුමන්ලා මට කියන්නේ කථානායකතුමාට භාර දෙන්න කියලා. හැබැයි, කථානායකතුමාට භාර දෙන්න ගියාම, ඒගොල්ලෝ කියන්නේ එතැන PHI මහත්මයා හමු වෙන්න කියලා. මට ඒක කරන්න බැහැ. Standing Orders අනුව මහ ලේකම්තුමියට තමයි ඒක භාර දෙන්න පුළුවන්. ඒක මට පැහැදිලි කරලා කියන්න. මහ ලේකම්තුමියගේ Office එකට විතරයි, අපට දෙන්න පුළුවන්. මේ PHI මහත්වරු හමු වෙලා අපිට මොකුත් කරන්න බැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට මහ ලේකම්තුමියගේ Office එකට භාර දෙන්න පුළුවන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හොඳයි. Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු මුනීර් මුලෆ්ෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. LAKSHMAN NIPUNA ARACHCHI took the Chair.*

[பி.ப. 3.25]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

நன்றி! கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற 2007ஆம் ஆண்டின் 48ஆம் இலக்க விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டத்தின் 2(3) ஆம் பிரிவின்கீழ் உருவாக்கப்பட்டுள்ள கட்டளைகள் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு சில கருத்துகளைச் சொல்லலாமென நினைக்கின்றேன்.

வியாபாரப் பண்டங்கள் சம்பந்தமாக எங்களுடைய சாமானிய மக்கள் படுகின்ற துன்பங்கள் சொல்லில் அடங்காதவை. ஒரு சாப்பாட்டுக் கடைக்குச் சென்றால், அங்கு அவர்கள் வைப்பதுதான் விலை! அங்கு வழங்கப்படுகின்ற உணவுகள் சுத்தமாகத் தயாரிக்கப்பட்டதா, இல்லையா? என்ற விடயம் சாமானிய மக்களுக்குத் தெரிவதற்கு வாய்ப்பு இல்லை. ஏனென்றால், கடையின் முகப்புத் தோற்றம் அழகாக இருக்கின்றது. சாப்பாடு மட்டுமல்ல, உணவுப் பொருட்கள்கூட நிர்ணயிக்கப்பட்ட விலையில் விற்பனை செய்யப் படுவதில்லை. எங்களுடைய வன்னிப் பிரதேசத்தை எடுத்துக் கொண்டால், அங்கு நிர்ணயம் செய்யப்பட்ட விலைகளில் எந்தப் பொருளும் விற்பனை செய்யப்படுவதில்லை என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். அது முல்லைத்தீவாக இருக்கலாம், வவுனியாவாக இருக்கலாம், மன்னாராக இருக்கலாம். மன்னாரில் இந்த விடயத்தில் பொது சுகாதார உத்தியோகத்தர்கள் சிலர் நியாயமாக வேலை செய்கின்றார்கள் என்பதை என்னால் குறிப்பிட்டுச் சொல்ல முடியும். ஆனால், ஏனைய இடங்களில் கைமாறு வாங்கிக்கொண்டு, நிர்ணயிக்கப் பட்ட விலையைவிட அதிகமான விலைக்குப் பொருட்களை விற்பனை செய்வதைக் கண்டும்காணாமலும் இருக்கின்றதொரு சூழலை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நியாயமற்ற வர்த்தக நடைமுறைகளைத் தடுக்கின்ற அல்லது பாவனையாளர் அலுவல்கள் அதிகாரசபையின் உத்தியோகத் தர்கள் மாவட்டச் செயலகங்களில் இருக்கின்றார்கள். கூடுதலான விலைக்குப் பொருட்களை விற்கின்றவர்களைக் கண்டறிகின்ற விடயத்தில் இந்த உத்தியோகத்தர்கள் என்ன செய்கின்றார்கள்? என்பதை அரசாங்க அதிபர்கள் அவதானிக்க வேண்டும். இந்த விடயத்தில் கறாராக இருக்க வேண்டும். இந்த அரசு ஊழல் சம்பந்தமான விடயங்களில் மிகவும் கவனம் செலுத்துகின்ற அதே நேரத்தில், அன்றாடம் உழைத்துச் சீவிக்கின்ற எங்களுடைய மக்கள் நியாயமான விலையில் பொருட்களைக் கொள்வனவு செய்கின்ற நிலையையும் உண்டுபண்ண வேண்டும்.

இந்த அரசாங்கம் போதைப்பொருளுக்கு எதிராக மிகத் திறமையாகச் செயற்படுகின்ற அதேநேரம், அதிக விலைகளில் பொருட்களை விற்பனை செய்கின்றவர்கள் விடயத்திலும் கவனம் செலுத்த வேண்டும். சாமானிய மக்களுக்குத் தேவையான medicineஆக இருக்கலாம், அரிசியாக இருக்கலாம் அல்லது மக்கள் அன்றாடம் பயன்படுத்துகின்ற ஏனைய பொருட்களாக இருக்கலாம், கண்மூடித்தனமாக பொருட்களின் விலையைக்கூட்டி விற்கின்ற அபாய நிலை எங்களுடைய பிரதேசத்தில் இருக்கின்றது. உதாரணமாக ஒரு மாத்திரையை எடுத்துக்கொண்டால், அதற்கு வவுனியாவில் ஒரு விலை; கொழும்பில் ஒரு விலை; மன்னாரில் ஒரு விலை; முல்லைத்தீவில் ஒரு விலை! எப்படி சாமானிய மக்கள் private மருந்தகங்களில் அதனை வாங்குவார்கள்? எப்படி இந்த அரசு போதைப்பொருளையும் ஊழலையும் ஒழிக்க திறமையாகச் செயற்படுகின்றதோ, அதேபோன்று இந்த விடயத்திலும் சரியான முறையில் கவனம் செலுத்த வேண்டும் என்பது என்னுடைய கருத்து! அதுமட்டுமல்ல, எங்களுடைய விவசாயிகளை மேம்படுத்துகின்ற நிலை காணப்பட்டாலும், விலை நிர்ணயம் என்பது காலத்துக்குக்காலம் மாறுபடுகின்றது. அதன் காரணமாக நெல் கொள்முதல் செய்கின்ற தனியார் மாபியாக்கள் மிகவும் அடாவடித்தனமாகத் தாங்கள் நினைக்கின்ற விலையிலே எங்களுடைய விவசாயிகளுடைய நெல்லை அல்லது அவர்கள் உற்பத்தி செய்கின்ற பொருட்களைக் கொள்வனவு செய்கின்ற நிலை காணப்படுகின்றது. இந்த விடயத்திலும் அரசு கவனம் செலுத்த வேண்டும்.

அடுத்து, மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமாகப் பேச வேண்டும். நான் ஏற்கனவே, மன்னார் மாவட்ட போக்குவரத்து நிலைமை சம்பந்தமாக போக்குவரத்துக்குப் பொறுப்பான அமைச்சரிடம் பேசியிருந்தேன். மன்னார் மாவட்ட புகையிரதப் போக்குவரத்தை எடுத்துக்கொண்டால், அது பொது மக்கள் பயன்படுத்த முடியாத நிலையில் இருக்கின்றது. இந்த விடயம் தொடர்பில் கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டும். தற்போது மன்னாரிலிருந்து அதிகாலை 1.00 மணிக்கே புகையிரம் புறப்படுகின்றது. அதை நல்ல முறையில் செயற்படுத்த வேண்டுமாகவிருந்தால், இரவு 10.00 மணிக்கு மன்னாரிலிருந்து புறப்படும் வகையில் அதன் நேரத்தை மாற்ற வேண்டும். அதேபோன்று, மன்னாரிலிருந்து மாலையில் புறப்பட்டால், அதிகாலை 4.00 மணிக்கு இங்கே வந்தடையும் சூழலை உருவாக்க முடியும். ஆகவே, இதைக் கவனத்தில் எடுக்க வேண்டுமென நான் இச்சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன். அதைவிடவும் மோசமான ஒரு விடயத்தைச் செய்ய இந்த அரசாங்கம் முயற்சி செய்கின்றது. அதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது.

மாண்புமிகு சனாதிபதி அவர்கள்மீது மக்கள் நம்பிக்கை வைத்திருக்கின்றார்கள். மாகாண சபைத் தேர்தலை நடத்தாது நிழல் அரசொன்றை நடைமுறைப்படுத்துகின்ற ஒரு நிலைப்பாடு காணப்படுகின்றது. இதனை ஒருபோதும் ஏற்றுக்கொள்ள முடியாது. வட மாகாணத்தை எடுத்துக் கொண்டால், அங்கு மாகாண கல்வி அமைச்சு, விவசாய அமைச்சு என அமைச்சுக்கள் உருவாக்கப்பட்டிருந்தாலும், அவை ஆளுநரின் தலைமையில்தான் செயற்படுகின்றது. அங்கு ஒரு நிழல் மாகாண அரசொன்றைச் செயற்படுத்துவது போன்றதொரு பாசாங்கைக் காட்டி, அரசியலமைப்பில் இல்லாத ஒரு விடயத்தைச் செய்ய இந்த அரசாங்கம் நினைக்கின்றது என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். ஆகவே, இந்த விடயத்தில் மாண்புமிகு சனாதிபதி அவர்கள் கவனமெடுத்து, சட்டரீதியற்ற இந்த நிழல் மாகாண சபை முறைமையை இல்லாதொழிக்க வேண்டும். அது நடைமுறைக்கு ஒவ்வாத ஒரு விடயம். அதனை நாங்கள் எதிர்க்கின்றோம். அதனை நடைமுறைப்படுத்துகின்ற செயற்பாட்டை நிறுத்த வேண்டும். மாகாண சபைத் தேர்தலை நடத்துங்கள்! அதனூடாக அரசியல் செயற்பாட்டை மேற்கொள்வதற்கான வாய்ப்பை நீங்கள் உருவாக்க வேண்டுமெனக் கேட்டு, உங்களிடமிருந்து விடைபெறுகின்றேன். நன்றி! வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මේජර් ජෙනරාල් අරුණ ජයසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.32]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. අද විශේෂයෙන්ම සාකච්ඡාවට බඳුන් වන්නේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමේදී බදු සහන ලබා දීම සම්බන්ධයෙන් ගැසට් නිවේදන තුනක පළ කරන ලද නියමයන් තුනක් සහ යෝජනා සම්මතයක් මෙන්ම තවත් නියෝග දෙකක් පිළිබඳවයි. විශේෂයෙන්ම අපේ රටේ ජාතික ආර්ථිකය, ඒ වාගේම ආර්ථික ස්ථාවරත්වය, ඒ වාගේම වෙළෙඳ පොළ තුළ තිබෙන තරගකාරිත්වය සහ ස්ථාවරත්වය, ඒ වාගේම වෙළෙඳ පොළේ තිබෙන භාණ්ඩවල මිල ගණන්වලට කිසිම බලපෑමක් ඇති නොවන විධියට දේශීය නිෂ්පාදන ආරක්ෂා කර ගැනීම ඇතුළු සියලු කරුණු කාරණා, සියලු සාධක සැලකිල්ලට අරගෙන තමයි මේ බදු සහන ක්‍රියාවලිය ක්‍රියාත්මක වන්නේ; ඒ නියමයන් සකසා තිබෙන්නේ; පනතක් සකස් කර තිබෙන්නේ.

අපේ රජය බලයට පත් වූ පසු අපේ මූලිකම, ප්‍රධාන, විශේෂ වගකීම වුණේ අපේ ආර්ථික ස්ථාවරත්වය ගොඩනහා ගැනීමයි. ඒ නිසා තමයි පසුගිය වසරකට වැඩි කාලය තිස්සේ මූල්‍ය විනය මූලික කරගෙන අපේ ආර්ථික ස්ථාවරත්වය ගොඩනඟාගන්න කටයුතු කළේ. අපේ රටට ආර්ථික වශයෙන් විශාල අර්බුදයකට මුහුණපාන්න සිද්ධ වුණේත්, අපිට දේශීය ආර්ථිකයේ කඩා වැටීමකට මුහුණ දෙන්න සිද්ධ වුණේත්, අපි ඒ අත්දැකීම් ලැබුවේත් 2020 වර්ෂයේ පැවති රජය අත්‍යවශ්‍ය භාණ්ඩවලට බදු සහන කීපයක් ලබා දීම නිසායි. විශේෂයෙන්ම මහජනයා නිතරම පරිභෝජනය කරන භාණ්ඩවලට තමයි ඒ බදු සහන ලබා දුන්නේ. අවසානයේ මොකක්ද වුණේ? බදු සහනවලින් මහා විශාල මුදලක් අපේ දේශීය ආර්ථිකයට, එහෙම නැත්නම් අපේ භාණ්ඩාගාරයට අහිමිවීම නිසා අපේ රටේ විශාල ආර්ථික අස්ථාවරත්වයක් ගොඩනැඟුණා. ඒ කියන්නේ ආර්ථිකය කඩා වැටුණා. නමුත් අපි ඒ වාගේ කෙටි අරමුණු, දූරදර්ශී නොවන තීන්දු තීරණ ගන්නේ නැතුව වසරක වැනි කාලයක් තිස්සේ මේ ගැන විශ්ලේෂණය කරලා, අධ්‍යයනය කරලා, අවබෝධය අරගෙන, ඒ ආර්ථික විශේෂඥයන්ගේ අවධානය, අවබෝධය, දැනුම ලබාගෙන තමයි මේ බදු සහන ලබා දුන්නේ.

විශේෂ වෙළෙඳ භාණ්ඩවලට බදු සහන ලබා දීම කිව්වාම අපේ නුවණට නැඟෙන්නේ, එහෙම නැත්නම් අපිට අවබෝධ වෙන්නේ, අපිට ඇහෙන්නේ සීනි බදු වංචාව සම්බන්ධවයි. බදු සහන කියලා කියපු ගමන් සීනි බදු වංචාව තමයි අපේ ඔළුවට එන්නේ. සීනි බදු සහන ලබා දීමෙන් බලාපොරොත්තු වුණේ මොකක්ද? බදු සහන ලබා දීම කිව්වාම සාමාන්‍යයෙන් වෙන්නේ මොකක්ද? පාරිභෝගික ජනතාවට සහන ලබා දීම. නමුත් "සීනි බදු වංචාව" කියලා තමයි ප්‍රසිද්ධියට පත් වුණේ. මේ සීනි බදු වංචාවෙන් මහජනතාවට, එහෙම නැත්නම් පාරිභෝගික ජනතාවට සහනයක්වත්, ප්‍රගතියක්වත් ලැබුණේ නැහැ. ඒ කාලවල ඒ රජයන් වටේ හිටපු විශේෂ පුද්ගලයන් මූල්‍ය වශයෙන් පුද්ගලික සහන ලබා ගැනීම තමයි සිදු වුණේ. දේශීය නිෂ්පාදන සම්බන්ධයෙන් බදු අය කර ගැනීමේදී විශේෂයෙන් මූල්‍ය විනයක් එක්ක කළමනාකාරිත්වයක් තිබෙනවා. එහෙම නැත්නම් ආර්ථික සංවර්ධනය, ආර්ථික ස්ථාවරත්වය සහ ඒවාට සාධක වෙන අනෙකුත් සියලු කරුණු සැලකිල්ලට අරගෙන තමයි එය කරන්නේ. ඒ කියන්නේ තත්ත්වය, ප්‍රගතිය, විශේෂයෙන්ම විනිවිදභාවය ඇතුළු සියල්ලක්ම සැලකිල්ලට අරගෙන ගත කරපු පසුගිය මාස 12ක, 14ක කාලය තුළදී තමයි මේ ප්‍රගතිය අත් කරගත්තේ.

ආදායම් ගත්තාම, ශ්‍රී ලංකා රේගුවේ පමණක් ආදායම් වාර්තා ඉක්මවා ගියා. 2025 වර්ෂයේ දෙසැම්බර් මාසයේ 31වැනි දා වෙනකොට රුපියල් බිලියන 2,510ක වාර්තාගත ආදායමක් ශ්‍රී ලංකා රේගුව ලබා ගත්තා. ඒ කියන්නේ, මුදල් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා රේගුවට ලබා දී තිබූ ආදායම් ඉලක්කය රුපියල් බිලියන 2,115යි. නමුත්, ඒ වසර අවසාන වෙනකොට ශ්‍රී ලංකා රේගුවේ සමස්ත වාර්තාගත ආදායම රුපියල් බිලියන 2,510යි. ඒ නිසා අපි මේ නියමයන් තුළින් විශේෂ භාණ්ඩවලට බදු සහන අඩු කිරීම ආදායමට ගියාට කරන දෙයක් නොවෙයි. ඒ පිළිබඳව විශේෂ සැලකිල්ලක් යොමු කරලා, මුදල් අමාත්‍යාංශය ලබා දෙන ඉලක්ක සපුරා ගෙන තමයි, කටයුතු කරලා තිබෙන්නේ. ඒ වාගේම, මේ වසරේ මුල් මාසයේ දින 30 ගත්තාම, ශ්‍රී ලංකා රේගුවේ සති තුනක ආදායම විතරක් රුපියල් බිලියන 175යි. ඒ ආදායම් ලැබුවේ රේගු නීති තදින් ක්‍රියාත්මක කරපු නිසා, ඒ වාගේම භාණ්ඩ තක්සේරු කිරීමේ නිසි ක්‍රමවේදය වැඩි දියුණු කරපු නිසා, ඒ වාගේම වසර කිහිපයක පසුබෑමකට පසු අපේ ආනයන ප්‍රමාණය නැවත ඉහළ යෑමත් මේකට බලපෑවා. පසුගිය කාල වකවානුව තුළ මේ භාණ්ඩවල වටිනාකම අඩු කරලා පෙන්වා තිබුණා. ඒවායෙන් ලොකු ආදායම් අඩුවීමක් සිදු වෙලා තිබුණා. නමුත්, මුදල් අමාත්‍යාංශය යටතේ තිබෙන ශ්‍රී ලංකා රේගුවේ කටයුතු ගැන බලද්දී, ඒ වැරැදි ලෙස භාණ්ඩ ප්‍රකාශ කිරීම පිළිබඳව දැඩි ලෙස නිරීක්ෂණය කිරීම හරහා තමයි, මේ රජයේ ආදායම තවදුරටත් ශක්තිමත් වුණේ.

ඒ වාගේම මම විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධානී, කළමනාකාර අධ්‍යක්ෂවරිය ඊයේ පැමිණ ගරු ජනාධිපතිතුමා හමු වුණු බව. එහිදී ඇය විසින් පසුගිය වර්ෂය ඇතුළත අපේ රටේ ආර්ථික වර්ධනය සම්බන්ධව, ප්‍රගතිය සම්බන්ධව, ස්ථාවරත්වය සම්බන්ධව විශේෂ ප්‍රකාශයක් කළා. ආර්ථික වර්ධනය සියයට 5කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා කිව්වා. උද්ධමනය සියයට 2කින් අඩු වෙලා තිබෙනවා කිව්වා. ඒ වාගේම විදේශ සංචිතය ප්‍රමාණවත්ය කියලා තිබෙනවා. ඒ වාගේම කොපමණ බදු සහන දුන්නත්, බදු ආදායම අතින් අපි ඉතාම හොඳ ස්ථාවරත්වයක් ගොඩ නඟාගෙන තිබෙනවා. ඒ නිසා තමයි බදු ආදායම අපේක්ෂා කළ මට්ටමටත් වඩා ඉහළයි කියලා එතුමිය දන්වා තිබෙන්නේ. ඉතින් ඒක ආර්ථික ස්ථාවරත්වයේ විශේෂ සලකුණක්.

ඒ වාගේම පසුගිය කාල වකවානුවේදී "දිට්වා" සුළි කුණාටුවෙහි බලපෑමට ලක් වූ පුද්ගලයන්ට පහසුකම් සැලසීම සඳහා වන ආපදාවෙන් නැවත යථා තත්ත්වයට පැමිණීමේ ව්‍යාපෘතිය යටතේ අපට ලැබෙන පරිත්‍යාග විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් නිදහස් කිරීම සඳහා තමයි මේ එක් නියමයක් ප්‍රකාශයට පත් කරලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අත්‍යවශ්‍ය මහජන සේවා පනත ප්‍රකාරව නම් කර තිබෙන අත්‍යවශ්‍ය භාණ්ඩ, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීම, ඒ වාගේම ඒවා ආරක්ෂා කිරීම සහ බෙදා හැරීම සම්බන්ධ සියලු සේවාවන්ට එම නියමය අනුකූල වනවා. විශේෂයෙන්ම අපි හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කළා, පසුගිය කාලයේ. ඒ අනුව අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයෙක් පත් කළා. එතුමාගේත් එකඟතාව මත තමයි අපි මේ බදු සහන සම්බන්ධව මේ නියමය ප්‍රකාශයට පත් කරලා තිබෙන්නේ. ඒ ඇති වෙච්ච ආපදා තත්ත්වය අනුව අත්‍යවශ්‍ය මහජන සේවා පවත්වා ගැනීමට පහසුකම් සැලසීමට, ඒ භාණ්ඩ හරි විධියට අත්‍යවශ්‍යම අයට, පීඩාවට පත් ජනතාවගේ අතටම ලබා දීමට, බෙදා හැරීම නිසි කළමනාකාරිත්වයකින් කරගෙන යාමට එය විශේෂයෙන්ම වැදගත් වුණා.

ඒ වාගේම "දිට්වා" සුළි කුණාටුවෙන් පස්සේ රටවල් 35කින් අපට මේ බදු සහන ක්‍රමය යටතේ විදේශ ආධාර, එහෙම නැත්නම් විදේශ සහනාධාර ලැබී තිබෙනවා. ඒ, සැපයුම් කාණ්ඩ 12ක්

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

යටතේ ආහාර ද්‍රව්‍ය, නිවාසවලට අවශ්‍ය උපකරණ, පීඩාවට පත් ජනතාවට අවශ්‍ය අනෙකුත් විශේෂ භාණ්ඩ යනාදී වශයෙන්. රටවල් 35කින් අපට ලැබිච්ච භාණ්ඩවල වටිනාකම ආසන්න වශයෙන් ගණනය කළාම එය රුපියල් බිලියන 3.1ක් පමණ වනවා. ආහාර ද්‍රව්‍ය පමණක් මෙට්‍රික් ටොන් 339ක, 340ක ප්‍රමාණයක් ලැබුණා. ඒවා නිසි කළමනාකාරිත්වයෙන් යුතුව බෙදා හැරීම සඳහා විශේෂ කමිටුවකුත් පත් කළා, ජනාධිපතිතුමා විසින්. ඒ භාණ්ඩ ගුවන් තොටුපොළවලට, වරායන්වලට පැමිණි පසු රේගුව මඟින් නිසි ආකාරයට බදු සහන ලබා දීමෙන් අනතුරුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට ලැබුණාට පස්සේ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් ඒ ඒ දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා පීඩාවට පත් ජනතාවට ඒ භාණ්ඩ බෙදා දීමේදී ඒක ඉතාම පහසුවක් වුණා. ඒ රටවල් 35ට අමතරව ආධාර දෙන වෙනත් විදේශ ආයතන පහකිනුත් අපට සහනාධාර ලබා දුන්නා. මේ නියමය හරහා මේ සහනය සලසා දුන් නිසා තමයි එපමණ භාණ්ඩ ප්‍රමාණයක් අපට ලැබුණේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ඒ තුළින් අපට විශේෂ සහනයක් ලැබුණා. ඒ අනුව අපේ රටේ අත්‍යවශ්‍ය මහජන සේවා අඛණ්ඩව පවත්වා ගැනීමට පහසුකම් සැලසීම සඳහා, විදේශ රටවලින් ලැබෙන භාණ්ඩ මහජනතාවට ලබා දීම සඳහා මේ නියමය ඉතාම උපකාරී වුණා. ඒ නිසා මේ නියමය සම්මත කර ගැනීම සඳහා අපේ විශේෂ නිර්දේශය ලබා දෙන බව සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.43]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி! கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இச்சபையில் போக்குவரத்து சம்பந்தமான விவாதம் இடம்பெற்றாலும், நேரத்தைக் கருத்திற்கொண்டு, 'வக்பு' சபை சம்பந்தமான சில விடயங்களைப் பேசலாமென நினைக்கின்றேன்.

'வக்பு' சபை என்பது முஸ்லிம் சமூகத்தின் மதஸ்தலங்களையும் சொத்துக்களையும் நிருவகிக்கின்ற ஒரு சிவில் அமைப்பாகும். இந்தச் சபையின் சுயாதீனம் குறித்து கேள்வி எழுப்புவது என்னுடைய ஜனநாயக உரிமை என்பதை நீங்கள் விளங்கிக்கொள்ள வேண்டும். அதைவிடுத்து, நியாயமான கேள்விகளுக்கு இனவாத முத்திரை குத்தி, திசைதிருப்புகின்ற விடயங்களை முன்னெடுக்கக் கூடாது. அவ்வாறு செய்வதைத் துரதிருஷ்டவசமான ஒரு செயற்பாடாகவே நான் பார்க்கின்றேன். தர்க்க ரீதியான கேள்விகளுக்கு உணர்ச்சிவசப்படாமல் பதிலளிக்க வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம். மாற்றத்தை ஏற்படுத்துவதாகக் கூறி ஆட்சிக்கு வந்த நீங்கள், எவ்வாறான மாற்றத்தை ஏற்படுத்துகின்றீர்கள் என்பதை உங்களிடமே கேட்டுக்கொள்ள வேண்டிய நிலையில் இருந்துகொண்டு இருக்கின்றீர்கள்.

கடந்த திங்கட்கிழமை ஓர் ஊடக சந்திப்பின்போது, நான் 'வக்பு' சபை சம்பந்தமாக முன்வைத்த சில நியாயமான குற்றச்சாட்டுகளுக்கும் கேள்விகளுக்கும் அளிக்கப்பட்ட பதில்களைப் பார்க்கும்போது, 'வக்பு' சபைக்குத் தெரிவு செய்யப்பட்டவர்கள் தொடர்பில் சில பிரச்சினைகள் காணப்படுவதை நீங்களே ஒத்துக் கொண்டிருப்பது தெரிகின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இப்போது 'வக்பு' சபைக்கு பரிந்துரைக்கப் பட்டுள்ளவர்களின் பெயர்ப்பட்டியலில் ஓய்வுபெற்ற இராணுவ அதிகாரி ஒருவரின் பெயரும் உள்ளது. அதேபோன்று, கொழும்பு மாநகர சபையில் அரசாங்கத்துக்கு ஆதரவளித்தவருடைய பெயரும் உள்ளது. மேலும், இந்த அரசாங்கம் சார்ந்த கட்சி சார்பில் தொடர்ச்சியாக தேர்தலில் போட்டியிடுகின்ற ஒருவருடைய பெயரும் உள்ளது. இது பற்றி நாங்கள் கேட்கும்பொழுது, உணர்ச்சிவசப்பட்டு அதை இனவாதத்துடன் நோக்கி, திசைதிருப்ப முனைகின்றார்கள். குறிப்பாக, வைத்தியர் ஷாபியின் விவகாரத்தைக் கொண்டு வருகின்றார்கள். வைத்தியர் ஷாபி சம்பந்தமான விவகாரத்தைப் பேசுவதற்கு முன்னர், அன்று அவருக்காக இந்தப் பாராளுமன்றத்தில் யார் குரல்கொடுத்தார்கள் என்பதை நீங்கள் விளங்கிக்கொள்ள வேண்டும். எங்களுடைய கட்சியைச் சேர்ந்தவர்கள்தான் அவர் பக்கம் இருந்து நியாயத்துக்காகப் பேசினார்கள்.

இன்று ஆளும் தரப்பில் இருக்கின்ற சிலர், கடந்த காலத்தில் எதிர்க்கட்சியில் இருக்கும்பொழுது, வைத்தியர் ஷாபி சம்பந்தமாக எந்தவொரு கருத்தையும் முன்வைக்கவில்லை என்பதை நீங்கள் விளங்கிக் கொள்ள வேண்டும். அரசியலில் மாற்றத்தைக் கொண்டுவரப் போகின்றோம் என்று சொன்ன நீங்கள், இன்னும் பழைய அரசியல் கலாசாரத்தையே முன்னெடுக்கின்றீர்கள். அதனை உடனடியாக நிறுத்திவிட்டு, நியாயமான கேள்விகளுக்குப் பதில் அளிக்கின்ற தன்மையை வளர்த்துக்கொள்ள வேண்டும். புதிய அரசாங்கம் வந்ததற்குப் பின்னர், வைத்தியர் ஷாபியால் அளிக்கப்பட்ட ஒரு முறைப்பாடு இருக்கின்றது. அந்த முறைப்பாடு தொடர்பில் நீங்கள் என்ன நடவடிக்கை எடுத்திருக்கிறீர்கள்? என நாங்கள் கேட்கின்றோம். நியாயமான கேள்விகளைக் கேட்கும்போது, பழைய சம்பவங்களோடு தொடர்புபடுத்தி மக்களைத் திசை திருப்புகின்ற செயற்பாடுகளை மேற்கொள்வதை நீங்கள் உடனடியாக நிறுத்த வேண்டுமென இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றோம்.

'வக்பு' சபைக்குப் பரிந்துரைக்கப்பட்டவர்களின் விடயத்தில் குறையிருப்பதாக நீங்களே ஏற்றுக்கொண்டு இருக்கிறீர்கள். அதைச் சரிசெய்து, பொருத்தமானவர்களை நியமியுங்கள்! அதனை ஒரு சுயாதீனமான சபையாகச் செயற்படுத்துங்கள்! இனவாதத்தைத் தூண்டி பல விஷயங்களை முன்னெடுக்கின்ற ஞானசார தேரர் போன்றவர்கள் இந்த விடயத்தில் மூக்கை நுழைக்கின்ற சூழலை ஏற்படுத்தி விடாதீர்களென நாங்கள் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றோம். 'வக்பு' சபை சம்பந்தமாக தீர்க்கமான முடிவை எடுக்க வேண்டிய பொறுப்பு உங்களுக்குக் காணப்படுகின்றது. 'வக்பு' சபையை அரசியல்

மயமாக்கி, எதிர்வரும் காலங்களில் பள்ளிவாசல் நிருவாகத்திலும் அரசாங்கம் சார்பானவர்களை நியமிப்பதற்கு நடவடிக்கை எடுக்கப் போகின்றார்களா? என கிராமங்களில் பரவலாக மக்கள் இன்று கேட்கின்றார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
මම කථාව අවසන් කරනවා.

இன்று 'பிரஜா சக்தி' விடயம்கூட எதிர்ப்பை ஏற்படுத்தியிருக்கின்றது. இன்னும் ஒன்றரை வருடங்களில், இங்கிருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்களையும் தாண்டி, 'பிரஜா சக்தி' உறுப்பினர்களின் தலையீடு இருக்கும் பொழுதுதான் நீங்கள் பிரச்சினைக்கு முகங்கொடுப்பீர்கள். நாங்கள் யாரையும் குற்றஞ்சாட்டவில்லை. மக்கள் உங்களுக்கே ஆணை வழங்கியிருக்கிறார்கள். அவர்கள் மாற்றத்தை எதிர்பார்க்கின்றார்கள். அந்த மாற்றம் சரியானதொரு மாற்றமாக இருக்க வேண்டும்.

எங்களுடைய கேள்விகளுக்கு நீங்கள் உடனடியாகப் பதிலளிக்க வேண்டிய அவசியம் கிடையாது. அதேபோல், ஆத்திரப்பட வேண்டிய அவசியமும் கிடையாது. 'வக்பு' சபை விவகாரமானது மதம் சம்பந்தமான விடயம் என்பதால், அதனைச் சரியான முறையில் தீர்க்க வேண்டுமென இந்த இடத்தில் கேட்டு, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.49]

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ වූ නියම 3ක්, රේගු ආඥාපනත යටතේ යෝජනා සම්මතයක් සහ මෝටර් වාහන පනත යටතේ නියෝග 2ක් සම්බන්ධව සාකච්ඡා කරනු ලබනවා. මගේ පැත්තෙන් සිදු කරන සාකච්ඡාවේදී මුලින්ම මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් අති විශේෂ ගැසට් පත්‍ර කිහිපයක පළ කරන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ වන නියමයන් සම්බන්ධව අවධානය යොමු කරන්න මං බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ආර්ථිකය සම්බන්ධයෙන් කථා කරනකොට විශේෂයෙන්ම මම සඳහන් කරන්න කැමැතියි, රටේ ආර්ථිකය ස්ථාවර කිරීමට මෙතෙක් ආපු ගමන් මාර්ගය තුළ අපි පියවරෙන්, පියවර ඉදිරියට පැමිණි බව. කඩාගෙන වැටුණු රට, බංකොලොත්භාවයට පත් වෙලා තිබුණු ආර්ථිකය ක්‍රමානුකූලව විධිමත් කරමින්, යාවත්කාලීන කරමින් අපි ඉදිරියට පැමිණියා. ඒ විධිමත් සහ යාවත්කාලීන ක්‍රියාවලියට අවශ්‍ය කරන පනත් කිහිපයක් යටතේ පනවන ලද නියම, යෝජනා සම්මතයක් සහ නියෝග ගැන තමයි අද මේ විවාදය පැවැත්වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ආර්ථිකය සම්බන්ධයෙන් අපි මෙතෙක් ආපු ගමන් මඟ සම්බන්ධව විශේෂයෙන්ම විපක්ෂයෙන් මීට කලින් මතු කරපු සහ ගොඩනඟපු තර්ක කිහිපයක් තිබුණා. ඒ තර්කය තමයි, රටේ ආර්ථිකය බංකොලොත් කියන එක. ජාතික ජන බලවේගය රජය බලයට පත් වෙලා බංකොලොත් වෙලා තිබුණු ආර්ථිකය යථාවත් කරලා රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය කරන පදනම දමා මේ ගෙවුණු කාල වකවානුව තුළ එහි සාර්ථක ප්‍රතිඵල අත්පත් කර ගන්නකොට, සුන්බුන් විපක්ෂය පැත්තෙන් මතු කරපු අඳෝනාවක් තිබුණා. මේ රජය අප්‍රේල් මාසයේ වැටෙනවා, අගෝස්තු මාසයේ වැටෙනවා, නොවැම්බර් මාසයේ වැටෙනවා, දෙසැම්බර් මාසයේ වැටෙනවා කිව්වා. එහෙම කියමින් මේ අය නහයෙන් අඬ අඬා හිටියේ. නමුත්, ගෙවුණු කාල වකවානුව තුළ අපි රටේ ආර්ථිකයට ශක්තිමත්, ස්ථාවර මූලික අඩිතාලමක් දමා ආර්ථිකය ගොඩනඟා ක්‍රමානුකූලව, පියවරෙන් පියවර මේ වනවිට ඉදිරියට ගෙන යමින් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් වන සහතිකය ආණ්ඩුවක් හැටියට ජාතික ජන බලවේගයේ අපි මේ රටට දෙන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද, දේශීය සහ ජාත්‍යන්තර සංවිධාන විසින්, පුද්ගලයන් විසින් ඒ සම්බන්ධයෙන් වන සහතිකය ලබා දීලා තිබෙන්නේ. මම හිතන විධියට අපි කාටත් එය ඉතාම වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි උදාහරණයක් ගනිමු. මේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ගෙවුණු කාල වකවානුව තුළ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රතිඵල හැටියට මේ රටේ ජනතාවට ලැබුණු ප්‍රතිලාභ මොනවාද කියලා අපි පොඩ්ඩක් ආපසු හැරී බලමු. රටේ ආර්ථිකය බංකොලොත් නම්, රටේ ආර්ථිකය කඩාගෙන වැටෙනවා නම්, රටේ ආර්ථිකයට ඉදිරියට යා නොහැකි නම් මොකක්ද වෙන්නේ? අපි කවුරුත් දන්නවා, ගෙවුණු කාල වකවානුව තුළ කිසිදු උද්ඝෝෂණයකින් තොරව රාජ්‍ය සේවකයන්ගේ වාගේම පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කළ බව. නමුත් අපි කවුරුත් දන්නවා, මීට කලින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවකයන් වැටුප් වැඩි කර ගැනීමට දිනපතා උද්ඝෝෂණ කළ බව. හැබැයි, ගෙවුණු කාල වකවානුව තුළ කිසිදු ජනතා උද්ඝෝෂණයකින් තොරව රාජ්‍ය අංශයේ වැටුප් වැඩි වුණා; පෞද්ගලික අංශයේ වැටුප් වැඩි වුණා. රාජ්‍ය අංශයේ සේවකයින්ගේ මූලික වැටුප රුපියල් 24,250 ඉඳලා රුපියල් 40,000 දක්වා වැඩි වුණා. ඒ විතරක් නොවෙයි, පෞද්ගලික අංශයේ සේවකයින්ගේ අවම මූලික වැටුප තිබුණේ රුපියල් 21,500ට. මේ ගෙවුණු අවුරුදු 2 ඇතුළත එය රුපියල් 30,000 දක්වා ඉදිරියට ගෙනෙන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ විතරක් නොවෙයි, රුපියල් 1,350ට තිබුණු වතු සේවකයාගේ දෛනික වැටුප වැඩි කරන්න හදනකොට මේ සුන්බුන් විපක්ෂය එදා ඊට විරුද්ධ වුණා. ඒකට විරුද්ධව පෙළපාළි ගියා. විරෝධතා එල්ල කරමින් අධිකරණ ක්‍රියාමාර්ගවලට ගියා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂමටත් ගියා. රුපියල් 1,350ට තිබුණු වතු සේවකයාගේ දෛනික වැටුප රුපියල් 1,750 දක්වා වැඩි කළේ මේ ගෙවුණු අවුරුදු දෙක ඇතුළත අපි රටේ ආර්ථිකය තුළ ගොඩනඟා ගත්ත ආර්ථික ශක්තිය හා ආර්ථික ස්ථායීකරණය මතයි.

අනික් පැත්තෙන්, දිළිඳු පුරවැසියන්ට ලබා දෙන අස්වැසුම ප්‍රතිලාභය වැඩි කළා. එහි ප්‍රතිලාභ රටේ ජනතාවට ලබා දුන්නා. ඒ විතරක් නොවෙයි, වංචාව, දූෂණය හා නාස්තිය නැවැත්වූවා. ඒ වාගේම ගෙවුණු කාල වකවානුව තුළ නීති විරෝධී ලෙස වත්කම් උපයාගෙන තිබුණා නම්, එම වත්කම් රජයට පවරා ගැනීමට අවශ්‍ය කරන අණපනත් ටික ගෙනැල්ලා, සම්මත කරලා, වඩා හොඳ දියුණු කළමනාකාරීත්වයක් සහිතව රටේ ආර්ථිකය ශක්තිමත් ගමනකට අරගෙන යන්න අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ටික අපි ගත්තා.

[ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා]

ඊළඟට, මැති ඇමතිවරුන්ගේ වරප්‍රසාද අඩු කළා. අපි ඊයේ පාර්ලිමේන්තුවේදී දැක්කා, විපක්ෂය පැත්තෙන් එකම එක අඳෝනාවක් කරන ආකාරය. ඒ, වෙන කිසිවක් නිසා නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප ඉවත් කිරීමට අදාළ පනත් කෙටුම්පත ඊයේ දවසේ සම්මත කළා. එම විශ්‍රාම වැටුප ඉවත් කිරීම විපක්ෂය පැත්තෙන් එකම එක අඳෝනාවක් බවට පත් වෙලා තිබුණා. මහජන නියෝජිතයන්ගේ වරප්‍රසාද කප්පාදු කර රටේ ජනතාවට එහි ප්‍රතිලාභ ලබා දෙන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ වාගේම එහි වරප්‍රසාද රටේ සාමාන්‍ය පුරවැසියන්ට ලබා දෙන්නත් පුළුවන්කම ලැබුණා. ඒ විතරක් නොවෙයි, පාසල් දරුවන්ට ලබා දෙන්න පුළුවන් සියලු සහන මේ වනකොට අපි ලබා දීලා තිබෙනවා. මේ සියල්ලගේම මූලික පදනම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථිකමය වශයෙන් රට යථා තත්ත්වයට පත් වෙලා තිබීම සහ රට ස්ථාවර තත්ත්වයට පත් වෙලා තිබීම. මේ ගෙවුණු කෙටි කාල වකවානුව තුළ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව රට යථා තත්ත්වයට පත් කරන්න සමත් වීම සතුටට කරුණක් විධියට අපි දකිනවා. ඒ සම්බන්ධව අපේ පැත්තෙන් නිදසුන් කියනවාට වඩා හොඳම නිදසුනක් අපට ලැබුණා. ඒ නිදසුන තමයි, අපේ රටේ ආර්ථික ස්ථාවරභාවය සම්බන්ධව සොයා බැලීමට මේ වනකොටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කළමනාකාර අධ්‍යක්ෂ ආචාර්ය ක්‍රිස්ටලිනා ජෝර්ජීවා මහත්මිය අපේ රටට පැමිණිලා තිබීම. එතුමිය "Daily FT" පුවත්පතට විශේෂ සම්මුඛ සාකච්ඡාවක් ලබා දෙමින් මම හිතන්නේ අපේ රට සම්බන්ධයෙන් දෙන්න ඕනෑ සහතිකය ලබා දීලා තිබෙනවා. ඒ විශේෂ සම්මුඛ සාකච්ඡාව තුළදී ප්‍රධාන කාරණා කිහිපයක් මතු කර තිබෙනවා. ශ්‍රී ලංකාව නැවත ආර්ථිකමය වශයෙන් ශක්තිමත්, ස්ථාවර ගමනකට යැමට අවශ්‍ය කරන මාර්ගයට අවතීර්ණ වෙලා තිබෙනවාය කියන සහතිකය මේ වනකොට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ජාත්‍යන්තර සංවිධානයක් විසින් ලබා දීලා තිබෙනවා. එම සහතිකය අනුව විපක්ෂය එය තේරුම් ගනු ඇතැයි කියා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි උද්ධමනය සියයට 2.1ක අවම මට්ටමකින් පවත්වාගෙන යමින් සිටිනවා. මීට කලින් උද්ධමනය ඉතා ඉහළ මට්ටමක තිබුණේ. අපි රට භාර ගන්නකොට සියයට 70ක මට්ටමක තිබුණු උද්ධමනය තමයි මේ මට්ටමට අඩු කර ගත්තේ. මේ ගෙවුණු කාල වකවානුව තුළ අපි රටක් හැටියට ආර්ථිකමය වශයෙන් ස්ථාවර වීමේ ප්‍රතිඵලයක් හැටිය තමයි උද්ධමනය සියයට 2.1ක මට්ටමකට ගෙනෙන්න අපට පුළුවන්කම ලැබුණේ. ඒ විතරක් නොවෙයි, සියයට 5.1ක, සියයට 4.9ක ආර්ථික වර්ධන වේගයක් මේ ගෙවුණු කාල වකවානුව තුළ පවත්වාගෙන යන්නත් අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ සංචිත ප්‍රමාණය ඉහළ නංවා ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ වාගේම බදු ආදායම් සියල්ලෙන්ම අපේක්ෂිත ඉලක්ක සපුරා ගන්න අපට පුළුවන්කම ලැබුණා. උදාහරණයක් හැටියට ගත්තොත්, රුපියල් බිලියන 4.9ක් තමයි 2024 අවුරුද්දේ රාජ්‍ය ආදායම හැටියට තිබුණේ. 2025 වසර වනකොට එය රුපියල් බිලියන 5.12 දක්වා වැඩි කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ විතරක් නොවෙයි, ඉතිහාසයේ ප්‍රථම වතාවට ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආදායම් උත්පාදනය කරන ප්‍රධාන ආයතන සියල්ල අපේක්ෂිත ආදායම් වාර්තා අභිභවා යන මට්ටමට ළඟා වුණා. ඒ තුළින් රටේ ආර්ථිකය ස්ථාවර කිරීමට අදාළව රාජ්‍ය ආදායම අත්පත් කර ගන්න, ආර්ථිකය ශක්තිමත් කර ගන්න පුළුවන්කම ලැබුණා.

2024 අවුරුද්දේ විදේශ ප්‍රේෂණ ඇමෙරිකානු ඩොලර් බිලියන 6.57ක් වශයෙනුයි තිබුණේ. 2025 වසර වනකොට ඒක ඇමෙරිකානු ඩොලර් බිලියන 8.7 දක්වා වර්ධනය කර ගන්න අපට හැකියාව ලැබුණා. අනෙක් පැත්තෙන්, කොටස් වෙළෙඳ පොළේ කාර්ය සාධනය ගත්තාම, 2024 සැප්තැම්බර් මාසය වනකොට කොටස් වෙළෙඳ පොළේ මිල දර්ශක අගය ඒකක 11,200ක්. 2026 ජනවාරි මාසය වෙනකොට ඒකක 23,708ක් දක්වා යමින් ඉහළ වර්ධනයක් අත්පත් කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. එය මූල්‍ය අංශයේ, මූල්‍ය දර්ශකවල මෙතෙක් වර්ධනය වුණු ඉහළම වර්ධනය වනවා. ඒ විතරක් නොවෙයි, 2024දී රුපියල් බිලියන 16.2ක්ව තිබුණු අපනයන ආදායම 2025දී රුපියල් බිලියන 17.2 දක්වා වැඩි කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ නිසා මේ රටේ ජනතාවට නැවත ශක්තිමත් ආකාරයට මේ සියල්ල ප්‍රතිලාභ හැටියට ලබා දෙන්න අපට පුළුවන්කම ලැබුණා. එම නිසා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු කර, රටේ ජනතාවට එහි ප්‍රතිලාභ අත්පත් කර දෙන්න හැකියාව ලැබුණා කියන සහතිකය අපට ලබා දෙන්න පුළුවන් බව මතක් කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[ප.ව. 4.01]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

நன்றி! கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் போக்குவரத்து தொடர்பான விவாதம் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. இந்தச் சந்தர்ப்பத்தில் ஒரு விடயத்தைச் சொல்ல ஆசைப்படுகின்றேன். இந்தச் சபையில் ஜெகதீஸ்வரன் MP இருக்கிறாரோ தெரியாது. நான் நினைக்கின்றேன், இப்பொழுது அவர் வவுனியாவில் SLTB Chairmanஇன் கதிரையில் இருப்பாரென்று. ஊழலை ஒழிப்பதாகச் சொல்லி ஆட்சிக்கு வந்ததுதான் இந்த அரசாங்கம். வெட்கம்! நான் call பண்ணி, "அண்ணண்! நீங்கள் SLTB Chairmanஐ பக்கத்தில் ஒரு சின்னக் கதிரையில் அமர்த்திவிட்டு அல்லவா இருக்கிறீர்கள்" என்று சொன்னபோது, "எனக்குக் கதிரை எதுவென்று தெரியாது" என்று சொன்னார். ஆனால், அவர் தான் teacherஆக இருந்ததாகச் சொல்கிறார். ஒரு பாராளுமன்ற உறுப்பினர் அரச நிறுவனம் ஒன்றுக்குள் போய் இந்த மாதிரியான trade union வேலை செய்யலாம் என்றால், அதற்குப் பெயர்தான் NPP-JVP!

நான் இன்னொரு விடயத்தைச் சொல்கின்றேன். மாகாண சபையென்று ஒன்று இருப்பது உங்களுக்குத் தெரியுமோ தெரியாது. மாகாண சபை என்றதொன்று ஒரு காலத்தில் இருந்தது. அது இப்பொழுதும் இருக்கிறது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வடக்கு மாகாண சபையின் நிழல் முதலமைச்சர் யாரென்றால், எங்களுடைய அமைச்சர் சந்திரசேகர்தான். அவருக்கு நிழல் முதலமைச்சர் பதவி கொடுக்கப்பட்டுவிட்டது. அதன் பெண்கள் தொடர்பான நிழல் அமைச்சர் யாரென்றால், வடக்கு மாகாணத்தில் 'வண்டி' யோட மதிலேறிப் பாய்ந்த நபர்தான். வெட்கம்! அவர் ஒரு பாராளுமன்ற உறுப்பினர்; யாழ்ப்பாணத்தைச் சேர்ந்தவர். அவருக்கு நியமனக் கடிதமும் வழங்கப்பட்டுவிட்டது. அது சரி பரவாயில்லை! அதைவிட, கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஜெகதீஸ்வரன் அவர்கள்தான் வடக்கு மாகாண சபையின் கல்வித்துறைக்குப் பொறுப்பான அமைச்சராம். அது சரி பரவாயில்லை!

சுகாதார நிழல் அமைச்சர் யாரென்றால், வைத்தியர் பவானந்தராஜாதான். நேற்று இங்கு வாக்கெடுப்பு இடம்பெறும்போது, தன்னுடைய கட்சிக்கு எதிராக vote போட்டவர்தான் அவர். எங்களுடைய மேசையில் இருக்கும் வாக்களிக்கும் இயந்திரத்தில் மூன்று ஓட்டைகள் இருக்கின்றன. அதில் ஓர் ஓட்டைக்குள் சரியாக விரலை வைத்து Vote போட இயலாதவர், எப்படி ஐயா வடக்கு மாகாணத்தின் நிழல் சுகாதார அமைச்சராக இருக்க முடியும்? சொல்லுங்கள் பார்ப்போம். வெட்கம்! எனக்குச் சரியான சிரிப்பாக இருக்கிறது. இந்த இயந்திரத்தில் மூன்று ஓட்டைகள் இருக்கையில், சிவப்பு, பச்சை, மஞ்சள் colour தெரியாமல் vote போட்டவரை வடக்கு மாகாணத்தின் நிழல் சுகாதார அமைச்சராக நியமித்திருக்கிறீர்கள். உங்களுக்கு வெட்கமாக இல்லையா? அவருக்கு திரும்பவும் 'Yes' என்று சொல்லச் சொன்னால், 'No' என்று சொல்கிறார். திரும்பவும் சபாநாயகர், 'No' என்று சொல்லுங்கள் என்று சொன்னால், 'Yes' என்று சொல்கிறார். மூன்று ஓட்டைகளில் ஓர் ஓட்டைக்குள் சரியாக விரலை இடத்தெரியாத பாராளுமன்ற உறுப்பினரை எப்படி நீங்கள் சுகாதார அமைச்சராக நியமிக்கலாம்? உங்களுக்கு வெட்கமாக இல்லையா? நீங்கள் உள்ளூராட்சி விடயத்துக்கும் நிழல் அமைச்சர் ஒருவரை நியமித்து இருக்கிறீர்கள். அவர் யார் தெரியுமா? இளங்குமரன்! 'கல் கல்' என்று கல்லுப் பிடித்தார். பாராளுமன்றத்தில் பெரிய பிரச்சினை என்னவென்றால் கல்தான். பாராளுமன்றத்திலும் கல், வெளியிலும் கல், சாவகச்சேரியிலும் கல்!

மாகாண சபைக்கு அதிகாரத்தைக் கொடுத்து, கடிதங்கள் தயாரிக்கப்பட்டு, கௌரவ ஆளுநர் முன்னிலையில் அரசாங்க உத்தியோகத்தர்கள் அழைக்கப்பட்டு, இவர்கள் நிழல் அமைச்சர்களாக meeting ஒன்றை நடத்தியிருக்கிறார்கள். இது தொடர்பான செய்திகள் பத்திரிகைகளில் வெளிவந்திருக்கின்றன. வடக்கு மாகாண சபைத் தேர்தலை நடத்தினால், அதில் அர்ச்சுனா போட்டியிடுவார் என்ற பயம் இந்த அரசாங்கத்துக்கு இருக்கிறது. அவ்வளவுதான்! முடியுமென்றால், வடக்கு மாகாண சபைத் தேர்தலை மாத்திரமாவது நடத்துங்கள்! நடத்த முடியாது. நீங்கள் விட்டாலும் சரி, விடாவிட்டாலும் சரி, நான் எப்படியாவது வடக்கு மாகாண சபைத் தேர்தலில் போட்டியிடுவேன். கவலையான விடயம் என்னவென்றால், மூன்று ஓட்டைகள் இருக்கையில் ஓர் ஓட்டைக்குள் சரியாக விரலை இடத்தெரியாத பாராளுமன்ற உறுப்பினரை, சிவப்பு, பச்சை நிறம் தெரியாத நிறக் குறைபாடுள்ளவரை, நீங்கள் வடக்கு மாகாணத்தின் அமைச்சராக நியமித்து இருப்பதுதான். நிறக் குறைபாடுள்ள ஒருவர் எப்படி வடக்கு மாகாண சபையின் சுகாதார அமைச்சராக இருக்க முடியும் என்பதைச் சொல்லுங்கள்!

அடுத்து, ஜெகதீஸ்வரன் அவர்களைக் கூட்டிக்கொண்டுபோய் பிமல் ரத்நாயக்க அவர்கள் கேட்கிறார், "தோழர்! எங்களுடைய அரசாங்கத்தில் யாருக்கு எதிராகவேனும் நடவடிக்கை எடுக்கப்படுகிறதா, ஊழல் இருக்கிறதா, தெரிந்தவர்களுக்கு appointment கொடுக்கிறார்களா? என்று. இங்கு 'தோழர்' என்பது, தோளில் கையைப் போட்டால் தோழரே ஒழிய, வேறுவிதமாக இல்லை. தோழர் மட்டும்தான். ஐயா! video உடன் போட்டிருக்கிறேன். அந்த videoஐப் பாருங்கள்! பெரிய கதிரையில் காலுக்குமேல் காலைப்போட்டு அமர்ந்து, nurseryஇல் பிள்ளைகள் ஆடுவதுபோல் காலை ஆட்டிக்கொண்டு இருக்கிறார் உங்களுடைய பாராளுமன்ற உறுப்பினர் ஜெகதீஸ்வரன்! வெட்கமாக இல்லையா? அடுத்து, திலகநாதன் ஐயா! அவர் பாவம்! அவரை ஆடு, மாடு, நாய் தொடர்பான நிழல் அமைச்சராக நியமித்திருக்கிறீர்கள்.

திலகநாதன் என்பவர்தான் சொன்னார், இலங்கையில் அரிசி பற்றாக்குறை வந்ததற்குக் காரணம் நாய்கள் சோறு தின்னுவதுதான் என்று. அவரை நீங்கள் வடக்கு மாகாண நிழல் விவசாய அமைச்சராக நியமித்தால், நாளைக்கு எத்தனை மாடுகள் பட்டினி கிடக்கும்? வடக்கு மாகாணத்தில் புல் இல்லாமைக்குக் காரணம் மாடுகள்தான் என்று சொல்லி, எல்லா மாடுகளையும் பிடிப்பார்கள். ஏற்கெனவே குரங்குகளைப் பிடித்தார்கள். இப்பொழுது நாய்களைப் பிடித்து, கடைசியாக மாடுகளைப் பிடிக்கின்ற நிலைமை வரும். இதனைத்தான் சொல்வார்கள் "ஆட்டைக்கடித்து மாட்டைக் கடித்து கடைசியாக மனுஷனை கடித்த கதை" என்று. இது வெட்கம்! அவமானம்!

நான் இன்னொரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். அரசியலமைப்பில் மாற்றத்தைக் கொண்டுவருவதாக நீங்கள் சொன்னீர்கள். அதையிட்டு எனக்கும் சந்தோஷம்! மேலும், PTAஐ PTSAஆக மாற்றப் போவதாகச் சொன்னீர்கள். மாகாண சபைத் தேர்தலை நடாத்துவதற்குப் பயப்படுகின்ற அரசாங்கம், இன்றைக்கு எதிர்க்கட்சித் தலைவர் அவர்களைப் பார்த்துச் சொல்கிறது, தங்களுடைய "Anura Meter"இல் 65 வந்திருக்கிறது என்று. ஐயா! அது 65 இல்லை 69. Sixty ninth position என்று ஒன்று இருக்கிறது. அதைமாறி இவர்கள் 65 என்று பார்த்துவிட்டார்கள். அதனால்தான் இவர்களுக்கு 69, 65ஆகத் தெரிகிறது. அது 65 அல்ல, 69. அது அவர்கள் இருக்கின்ற position.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්. කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම ඉක්මනින් අවසන් කරන්නම්.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் உங்களிடம் அன்பாக ஒரு விடயத்தைக் கேட்டுக் கொள்கின்றேன். தயவுசெய்து, இருக்கின்ற மூன்று ஓட்டைகளில் ஓர் ஓட்டையில் சரியாகப் பார்த்து விரலை விடக்கூடிய ஒருவரை வடக்கு மாகாண நிழல் சுகாதார அமைச்சராக நியமியுங்கள்! ஆடு, மாடு, நாய் சோறு உண்டால் நாட்டில் அரிசி இல்லாமல் போகாது என்பதை விளங்குகின்ற ஒருவரை நிழல் விவசாய அமைச்சராக நியமியுங்கள்! உங்களுக்குப் புண்ணியம் கிடைக்கும். இப்படியான பாராளுமன்ற உறுப்பினர்கள் சில வேளைகளில் canteen என்று நினைத்து bathroomஇல் கையைத் தட்டிக்கொண்டு இருப்பார்கள். இந்த நிலைமையில்தான் உங்களுடைய NPP உறுப்பினர்கள் இருக்கிறார்கள். ஆகவே, தயவுசெய்து இந்த நிழல் அமைச்சுகளை இல்லாமல் செய்யுங்கள்! நிழல் அமைச்சுகளை நாங்கள் அங்கீகரிக்க மாட்டோம். அதைப் பார்த்து அரச ஊழியர்கள் உட்பட எல்லோரும் சிரிப்பார்கள். அதிலும், இவர்கள் போகின்றபோது விழுந்து விழுந்து சிரிப்பார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අවසන් කරනවා. මට තත්පර දෙකක් දෙන්න.

தயவுசெய்து, கனவுகளில் மிதக்காமல், வெறியில் மிதக்காமல், நிஜவாழ்க்கைக்குள் வரும்படி உங்களுடைய பாராளுமன்ற உறுப்பினர்களை அன்பாகக் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.07]

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශේෂයෙන් මෝටර් වාහන පනත යටතේ නියෝග 2ක් සහ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් 3ක් ද අනුමත කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙනවා. මම අද ටිකක් බැලුවා විපක්ෂ නායකතුමාගේ ගේලයෝ දිහා. විපක්ෂ නායකතුමාගේ මාතලේ ගෝලයෙක් අර වතු කම්කරුවන්ගේ පඩි වැඩි කරනකොට ඒකට එරෙහිව නඩු මාර්ගයට යනවා කියලා කිව්වා. විපක්ෂ නායකතුමාගේ හෙට්ටිපොල ගෝලයා - හෙට්ටිපොල ගිනි තියපු ගෝලයා - බුද්ධි අංශයෙන් - SIS එකෙන් - මුස්ලිම් සමාජයේ සියලු දෙනා ගැන හොයන්න ඕනෑ කියන අදහස පළ කළා. අද විපක්ෂ නායකතුමා කාන්තාවන්ගේ අයිතිය ගැන කථා කළා. ඉතින්, විහිළු විපක්ෂ නායකයෙක් කියන එක අපට හොඳටම පැහැදිලියි.

இன்று இச்சபையில் முஸ்லிம்களின் உரிமைகள் சம்பந்தமாக குறிப்பாக, 'வக்பு' சபை சம்பந்தமாகப் பேசப்பட்டது. நாங்கள் இந்த விடயத்தைக் கவனமாகப் பார்க்க வேண்டும். நாங்கள் 'வக்பு' சபைக்கான உறுப்பினர்களைத் தெரிவு செய்ய முன்னர், Hajj Committeeஐத் தெரிவு செய்தோம். எமது அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னர், ஹஜ் யாத்திரை தொடர்பில் முஸ்லிம் சமூகத்தை நிருவகிப்பதற்காக மிகவும் பொருத்தமான நபர்களைக் கொண்ட, நடுநிலையான ஒரு குழுவினரைத் தெரிவு செய்தது. அதை இந்த நாட்டிலுள்ள அனைத்துத் தரப்பினரும் இன்று ஏற்றுக் கொள்கிறார்கள்.

நாங்கள் 'வக்பு' சபைக்கான உறுப்பினர்களைத் தெரிவுசெய்துள்ளபோதிலும், இதுவரை final பண்ணவில்லை. அது சம்பந்தமான கலந்துரையாடல் நடைபெறுகின்றது. இவர்கள் அரசியல் ரீதியாகத்தான் தெரிவுசெய்யப்பட்டு இருப்பதாக சில வாதங்கள் உள்ளன. கடந்த காலங்களில் காலி, பேருவளை போன்ற Municipal Councilsஇல் நீண்ட காலம் உறுப்பினர்களாக இருந்த பலர் 'வக்பு' சபையில் அங்கத்துவம்வகித்து இருக்கிறார்கள். அதேபோன்று, சில பாராளுமன்ற உறுப்பினர்கள், அமைச்சர்களின் நெருங்கிய நண்பர்களும் 'வக்பு' சபை நிருவாகத்தில் இருந்துள்ளார்கள். இன்று மேஜர் ஜெனரல் ஒருவரைப் பற்றி சொல்கிறார்கள். உண்மையிலே அவர் இன்று சாதாரண ஒரு நபராகவே இருக்கிறார். இந்த நாட்டிலுள்ள பதிவுசெய்யப்பட்ட 2,826 பள்ளிவாசல்களையும் நிருவகிக்கக்கூடிய மிகப் பொருத்தமான 'வக்பு' சபையை நாங்கள் தெரிவுசெய்ய வேண்டும். NPP அரசாங்கமானது, இந்த நாட்டில் ஊழலை ஒழிப்பதற்கு நடவடிக்கை எடுத்து வருகின்றது. பள்ளிவாசல்களை நிருவகிக்கும் செயற்பாட்டில் ஊழல் இருக்குமானால், அதையும் ஒழிக்க வேண்டிய பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருக்கிறது. அதற்குப் பொருத்தமான 'வக்பு' சபையைத் தெரிவுசெய்ய வேண்டிய தேவையுள்ளது.

Dr. Shafi தெளிவாகக் கூறியுள்ளார், "எனக்காக முதலில் குரல்கொடுத்தவர் அநுர குமார திஸாநாயக்க அவர்கள்" என்று. இங்கு இது பற்றி பேசிய பாராளுமன்ற உறுப்பினர் அங்கம்வகித்த 'நல்லாட்சி' அரசாங்க காலத்தில்தான் திகன எரிக்கப்பட்டது. அந்த ஆட்சிக் காலத்தில்தான் 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலும் நடத்தப்பட்டது. இந்த குண்டுத் தாக்குதலை வைத்து ஒட்டுமொத்த முஸ்லிம் சமூகமும் சீரழிக்கப்பட்டது. அந்தக் காலத்தில் அந்த அரசாங்கத்தில் பிரதானதோர் அமைச்சராகவும் கட்சியின் பிரதித் தலைவராகவும் இருந்தவர்தான் சஜித் பிரேமதாஸ அவர்கள்! அன்று ஹெட்டிபொலவை எரித்தவர் இன்று முஸ்லிம்களுக்காகக் குரல்கொடுக்கிறார்; 'வக்பு' சபை பற்றி பேசுகிறார். அதேபோல், அன்று ஒட்டுமொத்த முஸ்லிம் சமுதாயத்தையும் சீரழித்த மதத் தலைவர் ஒருவர், இன்று 'வக்பு' சபை பற்றி பேசுகிறார். இந்த 'வக்பு' சபை சம்பந்தமான தகவல்களை யார் அவர்களுக்குப் பரிமாறினார்கள். இந்த 'வக்பு' சபை யாரோடு தொடர்புபட்டது? இந்த 'வக்பு' சபைக்கான உறுப்பினர்கள் தெரிவில் ஏன் குழப்பத்தை ஏற்படுத்த வேண்டும்? பள்ளிவாசல்களை நிருவகிப்பதற்கும் அவற்றின் சொத்துக்களைப் பாதுகாப்பதற்கும் பொருத்தமான தலைமைத்துவத்தை நாங்கள் 'வக்பு' சபை ஊடாக வழங்குவோம்.

அரசியல் நோக்கத்துக்காக இந்தச் சபையை நிருவகிக்க வேண்டிய எந்தத் தேவையும் எங்களுக்கு இல்லை. நாங்கள் அரசியல் சார்ந்து இச்சபைக்காக உறுப்பினர்களை நியமிக்கப் போவதில்லை. எங்களுடைய கௌரவ பிரதி அமைச்சரான முனீர் முலாபர் அவர்களை இலக்கு வைத்து பல தாக்குதல்கள் நடத்தப்படுகின்றன. ஏன், இந்த நிலை! பொருத்தமான நிருவாகத்தை உருவாக்கி, பள்ளிவாசல்களின் பிரச்சினைகளைத் தீர்க்கத் தேவையில்லையா? கடந்த காலங்களில் இந்த 'வக்பு' சபையில் இருந்தவர்கள் செய்த வேலைகளை இந்த நாட்டு மக்கள் ஏற்றுக்கொள்கிறார்களா? இன்று பல பிரச்சினைகள் 'வக்பு' சபையால் உருவாக்கப்பட்டுள்ளன. நாங்கள் எங்களுடைய சமூகத்துடன் தொடர்புகொள்ளும்போது, சமூகத் தலைவர்கள் எங்களிடம் சொல்கின்ற விடயம் என்னவென்றால், 'வக்பு' சபையை clear பண்ணுங்கள்!" என்றுதான். "நீங்கள் நாட்டில் corruptionஐ இல்லாமல் பண்ணுகிறீர்கள்; பொருளாதாரத்தை ஸ்திரப்படுத்துகிறீர்கள்; இனவாதத்தை இல்லாமலாக்குகிறீர்கள். அதேபோல், 'வக்பு' சபையையும் தூய்மைப்படுத்தி, சிறந்த முறையில் நிருவகிக்கக்கூடிய ஒரு நிருவாகத்தைக் கொண்டுவாருங்கள்" என்று அவர்கள் கேட்கிறார்கள்.

இந்த நாட்டின் பல பகுதிகளிலும் உள்ள சகல ஜமாஅத்தினரையும் இணைக்கக்கூடியவாறு புத்திஜீவிகளின் அறிவுரைகளைப் பெற்று, பொருத்தமானதொரு 'வக்பு' சபையை நாங்கள் கட்டாயம் உருவாக்குவோம். இதில் எந்த அரசியல் இலாபமும் இல்லை. நாங்கள் வேறு நிறுவனங்களிலும் அரசியல் இலாபம் தேட மாட்டோம். நாங்கள் இந்த 'வக்பு' சபையில் என்ன அரசியல் இலாபம் தேட? நிச்சயமாக இதில் எந்தவித அரசியல் இலாபமும் நாங்கள் தேடவில்லை என்பதை இது பற்றி இங்கு ஏற்கெனவே பேசிய பாராளுமன்ற உறுப்பினருக்கு தெளிவாகக் கூறுகின்றேன்.

கடந்த காலங்களில் நகர சபை உறுப்பினர்கள் 'வக்பு' சபையில் இருந்திருக்கிறார்கள். இது சரியா, பிழையா என்று நான் சொல்ல வரவில்லை. தகுதியுடையவர்களாக இருந்தால் அவர்கள் 'வக்பு' சபைக்கு வரலாம். எங்களுக்குத் தேவை பொருத்தமான ஒரு teamதான். அந்த team பள்ளிவாசல்களை நிருவகிக்க வேண்டும்; முஸ்லிம்களுக்குச் சிறந்த தலைமைத்துவத்தைக் கொடுக்க வேண்டும். நாங்கள் 'வக்பு' சபை விடயத்தில் தெளிவாக இருக்கின்றோம். இதில் எந்தவித அரசியல் நோக்கமும் இல்லை. ஏற்கனவே இருந்த குழுவினர் மீண்டும் அந்த இடத்துக்கு வருவதற்காக, மீண்டும் ஊழலில் ஈடுபடுவதற்காக 'வக்பு' சபை தொடர்பான பிழையான தகவல்களை வழங்கி, மோசமான சில வேலைகளைச் செய்கின்றார்கள். குறிப்பாக, முஸ்லிம்களுக்கு எதிரான குழுவினருக்கு 'வக்பு' சபை தொடர்பான தகவல்களை வழங்கி இந்த விடயத்தைக் குழப்புகிறார்கள்; பல்வேறு வழிகளிலும் pressure பண்ணுகிறார்கள். இந்த நாட்டிலுள்ள முஸ்லிம் சமூகம் NPP அரசாங்கத்தை நம்புகின்றது.

எங்களுடைய கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள் அடிக்கடி கூறுவார், "இந்த நாட்டிலுள்ள மிகப் பெரிய பௌத்த கட்சியும் NPPதான்; தமிழ்க் கட்சியும் NPPதான்; முஸ்லிம் கட்சியும் NPPதான்" என்று. *இன்ஷா அல்லாஹ்!* நாளை ரமழான் மாதம் ஆரம்பமாகும். இது பாதுகாப்பான ஒரு நோன்பு காலமாக அமையப் பிரார்த்திக்கின்றோம். 'வக்பு' சபைக்கு உரிய காலத்தில் பொருத்தமானவர்கள் தெரிவு செய்யப்படுவார்கள். 'வக்பு' சபைக்குரிய criteriaவுக்கு ஏற்ப, இந்த நாட்டிலுள்ள சகல ஜமாஅத்தினரையும் உள்ளடக்கி, பொருத்தமானதொரு குழுவினரை நாங்கள் தெரிவு செய்வோம். அதன்மூலம் இந்த நாட்டிலுள்ள பள்ளிவாசல்கள் தொடர்பில் காணப்படும் பல்வேறுபட்ட பிரச்சினைகளைத் தீர்ப்பதற்கான செயற்றிட்டத்தை நாங்கள் முன்னெடுப்போமெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.15]

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද දිනයේ විශේෂයෙන්ම ගොවි ජනතාවට බලපාන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ආදිය පිළිබඳව කථා කරන මේ වෙලාවේ කිව යුතු කාරණා කිහිපයක් තිබෙනවා. පසුගිය කාලයේ එක එක නම් හදාගෙන ගොවි ජනතාව ගැන කිඹුල් කඳුළු හෙළපු ගොවි ජන නායකයන් ටිකදෙනාවත් මේ මොහොතේ පාර්ලිමේන්තුවේ නැහැ කියලා තමයි අපට පෙනෙන්නට තිබෙන්නේ. ඒ අය පසුගිය කාලයේ ගොවීන්ගේ අඟුපිල්වලට ගිහිල්ලා, ඒ ජනතාව උසිගන්වලා, වී කිලෝවකට රුපියල් 150ක මිලක් ඕනෑ කියලා ඒ ජනතාව කුපිත කරවලා කොහොම හරි පාර්ලිමේන්තුවට රිංගා ගත්තා. හැබැයි, ඒ එක නායකයෙකුවත් ගොවි ජනතාව ගැන කථා කරන්න මේ අවස්ථාවේ පාර්ලිමේන්තුවේ නැති බව විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

අපට පෙනෙන්නට තිබෙනවා, මේ ආණ්ඩුව බදු විධියට අපේ රටේ ගොවි ජනතාවටත් වැඩක් නැති, මේ රටේ පාරිභෝගිකයාටත් වැඩක් නැති, හැබැයි මේ ජාවාරම්කාරයන්ට ඕනෑ ආකාරයට බදු ගහන වැඩ පිළිවෙළක් නම් දැන් ක්‍රියාත්මක කරගෙන යනවා කියලා. ආනයනික අර්තාපල් සඳහා රුපියල් 80ක බද්දක් ගහලා ආණ්ඩුව බලාපොරොත්තු වන්නේ මොකක්ද කියන එක ගැන නම් අපට තේරෙන්නේ නැහැ. අද මේ රටේ අර්තාපල් කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය කරන්න යන වියදම රුපියල් 220යි. හැබැයි, 2019දී අල ගොවියෝ අර්තාපල් මෙට්‍රික් ටොන් 117,000ක අස්වැන්නක් ලැබුවා. අද වෙද්දී එය මෙට්‍රික් ටොන් 17,000 දක්වා අඩු වෙලා තිබෙනවා. අපේ රටේ අල නිෂ්පාදනය මේ විධියට අඩු වෙලා තිබෙන්නේ ඇයි? පාකිස්තානයෙන් අපේ රටට ඇති පදමට අල ගෙන්වනවා. පාකිස්තානයේ කරච්චි නුවරවත් අල කිලෝවක් රුපියල් 120ට නැහැ. හැබැයි, ලංකාවේ අල කිලෝවක් රුපියල් 120ට තිබෙනවා. ඒ වාගේම, මේ තුළ මහා පරිමාණ කූට මගඩියකුත් ක්‍රියාත්මක වෙනවා. මෙහේ ආනයනකරුවාට කිලෝවකට රුපියල් 40ක බද්දක් ගැහුවාම, එහේ ඉන්න නිෂ්පාදකයා මේ ආනයනකරුවාට ඒකෙන් භාගයක මුදලක් ගෙවනවා. එම නිසා කිසිම වෙලාවක මේ තත්ත්වය පාලනය කරන්න බැහැ; අපේ ගොවි ජනතාවට සාධාරණයක් වෙන්නේත් නැහැ. නමුත් සාමාන්‍ය වශයෙන් ගත්තොත්, අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් මිලියන 37ක විතර බදු ප්‍රමාණයක් ආණ්ඩුව අය කර ගන්නවා. හැබැයි, එසේ අය කර ගන්නා බදු මුදලින් දේශීය අල ගොවීන්ගේ අල වගාව දියුණු කරන්න මොනවා හෝ එක දෙයක්වත් මේ ආණ්ඩුව කරලා තිබෙනවාද කියා මම අහනවා. අද අපේ රටේ අල ගොවියාගේ තත්ත්වය ඒකයි.

වී අස්වනු නෙළන කාලය දැන් ඇවිල්ලා තිබෙනවා. මේ වෙද්දී පොළොන්නරුවේ වී මිල දී ගන්නේ කිලෝවක් රුපියල් 80ට. නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා ඒ දවස්වල මහා ලොකුවට කෑ ගැහුවේ, වී කිලෝවක් රුපියල් 150ට ගන්නවා කියලා නේ. හැබැයි, අද වී කිලෝවක් රුපියල් 80ටයි මිල දී ගන්නේ. එදා ජනාධිපතිතුමා මේසයට තට්ටුවක් දාලා හාල් කිලෝවක මිල රුපියල් 10කින් වැඩි කරලා දුන්නා. මහා පරිමාණ වී මෝල් හිමියන්ට "රෝල්ස් රොයිස්" මෝටර් රථ ගේන්න, එහෙම නැත්නම් පෞද්ගලික ජෙට් යානා ගේන්න සහල් මිල වැඩි කරලා දුන්නා. අද වී කිලෝවක මිල රුපියල් 80 දක්වා පහත වැටිලා තිබියදී, මහා පරිමාණ වී මෝල් හිමියන් අධික ලාභයක් උපයන විට සහල් මිල අඩු කරලා, පාරිභෝගික ජනතාවට සහනයක් දෙන්න මේ ආණ්ඩුවේ කවුරුවත් කල්පනා කරලා තිබෙනවාද? නැහැ. ඇයි ඒ? මහා පරිමාණ ජාවාරම්කාරයෝත් එක්ක එක මල්ලේ ලූණු කන ගමන් ඉන්නේ, මේ ආණ්ඩුවේ සියලු දෙනා. ජනාධිපතිවරයාද ඇතුළුව. මේ අය අද ගොවි ජනතාව දිහා හැරිලාවත් බලන්නේ නැහැ. හැබැයි, ඉෂාර නානායක්කාරලා, ධම්මික පෙරේරලා, ඩඩ්ලි සිරිසේනලා, රත්න ගමගේලා එක්ක ඩීල් දාලා තිබෙනවා; කොමිස් ගන්නවා. හැබැයි, ගොවි ජනතාව අතේ සතේ නැතිව හුළං ටික බිබී අද වී ටික විකුණා ගන්න බැරිව ඉන්නේ. අපි දැක්කා, එදා ජනාධිපතිතුමා ඉන්දියාව සහ පාකිස්තානය අතර පැවැත්වුණු ක්‍රිකට් මැච් එක බලන්න ගිහිල්ලා ඉන්නවා. එදා මෙතුමන්ලා කිව්වේ, මේ ශ්‍රී ලංකාවේ ක්‍රිකට් නොවෙයි, ෂම්මිගේ ක්‍රිකට් කියලායි. හැබැයි, එතුමා ලජ්ජා නැතිව ෂම්මිගේ ක්‍රිකට් බලන්න ගිහිල්ලා ඉන්නවා අපි දැක්කා. හැබැයි, ජනාධිපතිතුමාට ලංකාවත් එක්ක තිබුණු මැච් එක බලන්න යන්න බැරි වුණා.

මේ වෙලාවේ මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න ඕනෑ. පසුගිය මාස දෙකේම ආබාධිත පුද්ගලයින්ට ලබා දෙන දීමනාව දීලා නැහැ. ඒ වාගේම වැඩිහිටි පුද්ගලයින්ට ලබා දෙන දීමනාවත් පසුගිය මාස දෙකේම දීලා නැහැ. ඒ නිසා බොරු

[ගරු සුරංග රත්නායක මහතා]

පුරාජේරු කථා කියන්නේ නැතිව ඒ ජනතාවට සහන සලසන්න අවශ්‍යා කටයුතු කරන්න කියන ඉල්ලීම මේ අවස්ථාවේදී මම කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අතුල වෙළඳගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.21]

**ගරු අතුල වෙළඳගොඩ මහතා**
(மாண்புமிகு அதுல வெலந்தகொட)
(The Hon. Athula Welandagoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ වූ නියම 3ක්, රේගු ආඥාපනත යටතේ යෝජනා සම්මතයක් සහ මෝටර් වාහන පනත යටතේ නියෝග 2ක් මේ පාර්ලිමේන්තුවේදී සාකච්ඡාවට බඳුන් වන අද දවස පුරා ඒ වෙනුවෙන් ආණ්ඩු පක්ෂය විධියට අපි කරුණු ඉදිරිපත් කළා. මේ සම්බන්ධයෙන් දත්ත සහ කරුණු පදනම් කරගෙන ඒ සියල්ලක්ම තර්කානුකූලවම මේ පාර්ලිමේන්තුවට අපේ කථික සහෝදර සහෝදරියන් ඉදිරිපත් කළා. නමුත්, විපක්ෂයේ කාර්යභාරය සැලකුවාට පස්සේ අද දවස පුරාම අපට දකින්න ලැබුණේ මොකක්ද? විපක්ෂයට තිබුණේ වෙන මොකුත් නොවෙයි, ඔවුන්ට චෝදනා පත්‍රයක් තිබුණා. ඒ වාගේම රටට කියපු බොරු ගොඩක් තිබුණා. මේ පාර්ලිමේන්තුවට ගෙන එන සියලු අණ පනත් සම්බන්ධයෙන් සලකා බලද්දි අපට දිගින් දිගටම පෙනෙනවා, ඔවුන් කියපු මේ බොරු ටිකත්, මේ චෝදනා පත්‍රයත් තවදුරටත් වලංගු නොවන බව. මේ සියල්ලම සැලකුවාට පස්සේ ඔවුන්ගේ හැසිරීමෙන්, භාවිතාවෙන් අපට පෙනෙන්න තිබෙන එකම එක යථාර්ථය බවට පත්වෙලා තිබෙන්නේ එයයි. මීට කලින් කථා කරපු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා වී මිලදී ගැනීමේ ප්‍රශ්නය පිළිබඳව සඳහන් කළා. දැන් මේකම නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් මෙතැනදි කිව්වා, ගොවියා මහ පාරේ කියලා. ඒ විතරක් නොවෙයි. ඒ බොරු ගොඩ ඇතුළේ ජනතාවට මේ සියල්ලක්ම ඒත්තු ගන්වන්න මේ පාර්ලිමේන්තුව තුළ කටයුතු කළාට, ඔවුන් මහ පොළොවට ගියාට පස්සේ තිබෙන යථාර්ථය මොකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය යල කන්නයේදී අපේ රටේ වී නිෂ්පාදනය ගත්තොත්, අපි ආණ්ඩුව විධියට වී මෙට්‍රික් ටොන් 43,861ක්, දිස්ත්‍රික්ක 16ක, මධ්‍යස්ථාන 137කදී මිලදී අරගෙන තිබෙනවා. නාඩු වී කිලෝග්‍රෑම් එකක් රුපියල් 120කටත්, සම්බා වී කිලෝග්‍රෑම් එකක් රුපියල් 125කටත්, කීරි සම්බා වී කිලෝග්‍රෑම් එකක් රුපියල් 132කටත් වන ආකාරයට තමයි මේ වී මිලදී ගැනීම සහතික මිලක් බවට පත් කළේ. හැබැයි, කලින් තිබුණු තත්ත්වය මොකක්ද? කලින් වී අලෙවි මණ්ඩලයක් තිබුණා ද? අපේ රටේ ගොවියා සම්පූර්ණයෙන්ම ගොවිතැනින් ඉවත් කරලා - යැපුම් කෘෂි කර්මාන්තය ඇතුළේ - සියල්ල විකුණන තැනට පත් කළා. ඔබතුමන්ලා අපි කවුරුත් දන්නවා, මේ රටට අසූචි පොහොර නැව් පවා ගෙනා බව. හිටපු මන්ත්‍රී තිසකුට්ටි ආරච්චි මහතා ඒ ගෙනා පොහොර ගැන කිව්වේ කොහොමද? ඒ පොහොර ගැහුවාම බෝම්බයක් පත්තු වෙනවා හා සමානව අස්වැන්න ලැබෙනවා කිව්වා. හැබැයි, අන්තිමට ගොවියා කොතැනටද වැටුණේ? දැන් තමයි අපේ රටේ ගොවියා හුස්ම ගන්නේ. ඒ වාගේම අපි ගොවියාව ජාතික නිෂ්පාදන ආර්ථිකයට දැන් සම්බන්ධ කරගෙන තිබෙනවා. ඒ අනුව ගොවියාට විශ්වාසයක් ඇති වෙලා තිබෙනවා, මේ ආණ්ඩුව පිළිබඳව. මේ බදු ප්‍රතිපත්තියෙනුත් අපි ගොවියා ආරක්ෂා කරලා තිබෙනවා; වෙන මොකක්වත් වෙනස් කරලා නැහැ. අපි ගොවියාත් ආරක්ෂා කරලා, පාරිභෝගිකයාත් ආරක්ෂා කරලා තිබෙනවා. ආණ්ඩුවේ ප්‍රතිපත්ති පැහැදිලිව කියලා ඒ මත පදනම් වෙලායි අද අපි මේ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම නිසා අපට කිසි ගැටලුවක් නැහැ, විපක්ෂයටයි ප්‍රශ්නය තිබෙන්නේ.

අද නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මේ සභාවට ඇවිල්ලා අසත්‍ය කාරණා ගොඩක් කිව්වා. මම ජීවත් වන හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන අම්බලන්තොට වී පර්යේෂණ ආයතනය පසුගිය වතාවේ AT 378 කියන වී ප්‍රභේදය නිෂ්පාදනය කරලා හෙක්ටෙයාරයකට මෙට්‍රික් ටොන් 12-14 අතර වැඩි වී අස්වැන්නක් ගන්න පුළුවන් විධියට එම ප්‍රභේදය දියුණු කළා. අපි ගොවිතැනට දීලා තිබෙන තැන සහ අද ඒ නිෂ්පාදන බලවේග ක්‍රියාත්මක කරන විධිය දැක්කාම රට සංවර්ධනය වෙනවා කියන එක පැහැදිලියි. රටේ නිෂ්පාදන ආර්ථිකය ගැන අංක, දත්ත ගොඩක් අපි මේ සභාවේ ප්‍රකාශ කළා. උද්ධමනය සියයට 70ට ගිය රටක් අද ඒක සියයට 2 දක්වා අරගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම තමයි සෘණ අගයක තිබුණු ආර්ථික වර්ධන වේගය සියයට 5 දක්වා ගෙනැල්ලා තිබෙනවා. මම හිතන විධියට, තවත් අමුතුවෙන් කථා කරන්න දෙයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉතාම පැහැදිලියි, ඒ සෑම දර්ශකයකින්ම රට ටික ටික ස්ථාවර වෙමින් තිබෙන බව. ලෝකයේ සංවර්ධනය වුණු රාජ්‍යයන් තිබෙනවා. ඒ හැම රටකම සංවර්ධනය මැනපු දර්ශක ඇතුළේ අපි හිටියේ කොහේද? ඒ හැම දර්ශකයකින්ම අපි හිටියේ ඉතාම පහළ අඩියක. ඒ නිසා තමයි රට අර්බුදයකට ගියේ.

අද රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, අපට ලැබුණු බලය පිළිබඳව උද්දාමයට පත් වෙන්න එපා, එතුමන්ලාටත් එහෙම ලැබුණු බලයක් තිබියදී තමයි අන්තිමට ජනතාව එතුමන්ලාට සිල්ලරට සලකලා අපට තොගයට සැලකුවේ කියලා. සිල්ලරට නොවෙයි ඔබතුමන්ලාටත් තොගයට සැලකුවා. ඔව්, අපට පසුගිය වතාවේදී තොගයට සැලකුවා. තොගයට සලකලා තමයි මහ ජනතාවගේ කැමැත්තෙන් ඉතිහාසයේ එක් පක්ෂයකින් පත් වුණු වැඩිම මන්ත්‍රී සංඛ්‍යාව වන 159දෙනෙක් මේ පාර්ලිමේන්තුව - ව්‍යවස්ථාදායකය - නියෝජනය කරන්න එව්වේ. අපි 159දෙනා තමන්ගේ කාර්යභාරය වෙනුවෙන් ඇප වෙලා, කැප වෙලා ජනතාව ඉස්සරහින් තියාගෙන, ආර්ථිකයට සියලුදෙනාම සම්බන්ධ කරගෙන මේ රට නිෂ්පාදන ආර්ථිකයක් කරා මෙහෙයවමින් ක්‍රමානුකූලව ගමනක් යනකොට විපක්ෂයේ කාර්යභාරය මොකක්ද කියලා ඉතාම පැහැදිලියි. මේ මොහොත ගත්තත් ඔවුන් එනවා, ඉන්නවා, වචනයක් කියනවා යනවා. එක මතයක් නැහැ, ස්ථාවරත්වයක් නැහැ. වරප්‍රසාද මත සියල්ලක්ම පාලකයන්ට ගොඩ ගසන රටක් ඇතුළේ, ජනතාවට කිසිවක් නොලැබුණු තත්ත්වයක් ඇතුළේ අවසානයේ ජනතාව දුකට, වේදනාවට පත් වනවා. කාලයක් තිස්සේ අපි විපක්ෂය තුළ ඉඳගෙන කළ කාර්යභාරයක් තිබුණා, ජනතාවට කළ කාර්යභාරයක් තිබුණා, අපි කළ අරගළයක් තිබුණා. ඒ සියල්ල අවසානයේ තමයි ජන අරගළයක් නිර්මාණය වුණේ. එතුමන්ලා කියන විධියට ඒ තුළින් තමයි අවසානයේ අපට බලය ලැබුණේ. නැහැ, රටේ ජනතාවගේ පරමාධිපත්‍යයේ උපරිම කොටස තමයි අපට මේ පවරා දීලා තිබෙන්නේ. කිසිසේත්ම ඒක අමතක කරලා, හැල්ලු කරලා හෝ එයින් හිස උදුම්මාගෙන නොවෙයි, අපි ඒක ගරුකොට ඉස්සරහින් තබාගෙන ඒ ජන මතයට අනුව තමයි අපේ මතය ප්‍රකාශ කළේ. විපක්ෂයට ඕනෑ දේ කරන්න නොවෙයි අපි ඇවිල්ලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මේ සභාවේදී ප්‍රකාශ කළා, ආරක්ෂාව පිළිබඳ කාරණය. අපි ඇති වෙනකම් රටට කරුණු කියලා තිබෙනවා, රටේ ජනතාවත් දන්නවා, අධි ආරක්ෂක කලාප ගැන. එතුමා මේ මොකක් හරි කියලා උත්සාහ කරන්නේ මොකටද? ඒ සැකය, අවිශ්වාසය ඇති කරලා මොකක් හරි විධියකට ආණ්ඩුව කෙරෙහි ජනතාව තුළ තිබෙන විශ්වාසය පලුදු කරන්නද? අධි ආරක්ෂක කලාප ගැන කියනකොට එතුමා දැනගන්න ඕනෑ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ හිටපු දකුණු පළාත් සභාවේ එම්.කේ. රංජිත් අමාත්‍යවරයා - "චණ්ඩි මල්ලි" කියලා රටම දන්නවා - ඝාතනය වුණේ කොතැනදී ද කියලා. අධි ආරක්ෂක කලාපයේදීයි ඝාතනය වුණේ. මොකක්ද පරීක්ෂණය? ඒ අමාත්‍යතුමාගේ පුතා ප්‍රකාශයකුත් කරලා තිබුණා, තාත්තාගේ මරණය පිළිබඳව. එහෙම ඉතිහාසයක් තිබුණු රටක තමයි අපි නැවත ඒගොල්ලන්ට මේවා මතක් කරලා දෙන්නේ. ඒගොල්ලන්ගේ හෘදය සාක්ෂිය මේ පිළිබඳව දන්නවා. මේ රට පත් වෙලා තිබුණු තැන සහ දැන් නැවත රටට ජයග්‍රහණ එකින් එක එකින් එක අත්පත් වෙමින් තිබෙන වෙලාවක් තමයි මේ වෙලාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුව යටතේ ඒ ජයග්‍රහණ සාක්ෂාත් කරන වෙලාවක් මේක. අපට විශ්වාසයක් තිබෙනවා, අපට තව කාලයක් තිබෙනවා. අපට කලබලයක් නැහැ, හදිස්සියක් නැහැ. ඒ නිසා අපි යන මේ ක්‍රමික ගමනේ වර්ධනය තුළ රට තවත් ඉහළට ඔසවා තබන ජයග්‍රහණ වැලක අවුරුද්දක ශේෂ පත්‍රය තමයි මේ තිබෙන්නේ. අවුරුද්දයි ගතවෙලා තිබෙන්නේ. වැඩි කාලයක් නොවෙයි. හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වෙන්න බැරි වුණා, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට. විපක්ෂ නායකතුමාට හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් එන්න සිද්ධ වුණා. සමහරු හම්බන්තොට තමන්ගේ බුදලයට ලියාගෙනයි හිටියේ. අද ජන මතය තිබෙන්නේ කොහේද? ඔවුන්ට ජන මතයක් නැහැ. අද ජන මතය තිබෙන්නේ, වැඩ කරන, ඒ වෙනුවෙන් ඇප වෙන, කැප වෙන, විශ්වාසය තිබෙන අය සමඟයි. ඒ නිසා තමයි අපි ඊයේ පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත සම්මත කරලා, ජනතාවට නැවත ඒ සියල්ලම ගමන් කරන විධියේ තැනකට දේශපාලන සංස්කෘතිය පවා වෙනස් කළේ. අපි ඒ සියල්ල එකින් එක කළේ ප්‍රසිද්ධියේ රට ඉදිරියේ අපට ලැබිච්ච ඒ ජන වරම අනුවයි. අපි ජන වරමට පිටින් කිසිවක් කරලා නැහැ. එහෙම කරන්න අපට අයිතියකුත් නැහැ.

ජන වරම ඉස්සරහින් තියාගෙන මේ සියල්ලක්ම කරන වෙලාවක අපි විපක්ෂයට කියනවා, අපි මේ රට ක්‍රමානුකූලව අරගෙන යන දිශාව පිළිබඳව අඩුම තරමේ දැන්වත් කල්පනා කර බලන්න කියලා. ඒ වාගේම අපි විපක්ෂයට ආරාධනා කරනවා, තමන්ට ලැබුණු ජන වරම පාවිච්චි කරලා, පාර්ලිමේන්තුවේ රැඳී ඉඳලා ඒ දිස්ත්‍රික්කවල ජනතාවගේ ඇත්ත ප්‍රශ්න ගැන කථා කරන්න කියලා. ආණ්ඩු පක්ෂය විධියට අපිත් විශ්වාස කරනවා, තවදුරටත් බොරු සහ අවලාද, මඩ මත නොවෙයි, මේ සියල්ලක්ම දත්ත, නිසි තොරතුරු මත කථා කරලා ජනතාවට ඒ සේවාව ලබා දෙන්න විපක්ෂයට හයියක්, කොන්දක් ලැබේවි කියලා. මේ පාර්ලිමේන්තුව තිබෙන්නේ, හිතුමතේ බොරු කියන්න, හිතුමතේ අවලාද නඟන්න, මඩ ගහන්න නොවෙයි. අන්න ඒ වෙනුවෙන් තමයි අපි නිර්මාණය කරපු මේ ජන වරම තවත් ශක්තිමත්ව අපි ආරක්ෂා කරමින් ඉන්නේ. ඒ වෙනුවෙන් අපි ඇප වෙනවා, කැප වෙනවා කියන පණිවුඩය ලබා දෙමින් මගේ කථාව හමාර කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.30]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நாம் இந்த நாட்டின் விவசாயம் மற்றும் பொருளாதார முன்னேற்றம் தொடர்பாகப் பேசிக்கொண்டு இருக்கின்றோம். வெறுமனே உள்நாட்டு உற்பத்தியில் மாத்திரம் தங்கியிருக்காமல், வெளிநாட்டு முதலீட்டாளர்களையும் வரவழைத்து முதலீடுகளை மேற்கொண்டால் எமது நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்ப முடியும்.

ஆளுங்கட்சியில் இருக்கின்ற அமைச்சர்கள் மற்றும் MPs எதிர்க்கட்சியினரை விமர்சித்துக்கொண்டும், எதிர்க்கட்சியில் இருக்கின்ற MPs ஆளுங்கட்சியினரை விமர்சித்துக்கொண்டும் இருந்தால், ஒருபோதும் பிரச்சினைகளுக்குத் தீர்வு காண முடியாது. இன்று நான் காலையிலிருந்து ஒரு விடயத்தை அவதானித்தேன். அதாவது, அரசாங்கக் கட்சியின் அநேகமான உறுப்பினர்கள், "எதிர்க்கட்சியினர் என்ன செய்தார்கள்?" என்று எதிர்க்கட்சியினர் பற்றியே பேசினார்கள். அதேபோல், எதிர்க்கட்சியில் இருக்கின்ற பல உறுப்பினர்கள், "ஆளுங்கட்சியினர் என்ன செய்திருக்கிறார்கள்?" என்று கேட்கிறார்கள். இந்த நிலையிலிருந்து நாங்கள் மாற வேண்டும். ஏனெனில், நமது நாடு பொருளாதாரத்தில் முன்னேற வேண்டும். யார் ஆட்சி செய்தாலும் நாடு முன்னேற வேண்டும். அப்பொழுதுதான் யார் ஆட்சிக்கு வந்தாலும் நாட்டைக் கட்டியெழுப்ப முடியும்.

அண்மையில் ஏற்பட்ட 'தித்வா' புயல் மற்றும் வெள்ள அனர்த்தத்தால் நமது நாடு மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கிறது. குறிப்பாக, விவசாய நிலங்கள் பாதிக்கப்பட்டு இருக்கின்றன. மீனவர்களும் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். பாதிக்கப்பட்ட மீனவர்களுக்கு எந்தவொரு நிவாரணமும் வழங்கப்படவில்லை. அவர்களுக்கான வலைகளோ, சாதாரண சிறிய படகுகளோ வழங்கப்படவில்லை. அதுமாத்திரமன்றி, அவர்களது தொழிலை மீளக் கட்டியெழுப்புவதற்கான எந்தவொரு நடவடிக்கையும் இன்னும் மேற்கொள்ளப் படவில்லை. வட, கிழக்கு மாகாணங்களிலும் அநுராதபுரம், பொலன்னறுவை மாவட்டங்களிலும் நெல் உற்பத்தி மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கிறது. கௌரவ உதுமாலெப்பை அவர்கள் எனக்குப் பக்கத்தில் இருக்கிறார். அவர் பிரதிநிதித்துவப்படுத்துகின்ற அம்பாறை மாவட்டம் மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கிறது. இன்னும் அங்குள்ள விவசாயிகளுக்கு எந்தவொரு நட்டஈடும் வழங்கப்படவில்லை. அதுமாத்திரமன்றி, அவர்களுக்கான எந்தவொரு முன்மொழிவும் முன்வைக்கப்படவில்லை. அவர்களுக்கு மானிய அடிப்படையில் உரம் வழங்கப்பட வேண்டும்; விதை நெல் வழங்கப்பட வேண்டும்; எரிபொருள் வழங்கப்பட வேண்டும். இப்படி ஏதோவோர் அடிப்படையில் அவர்களுக்கு உதவி செய்தால்தான் விவசாயத் தொழிலை தேசிய ரீதியில் கட்டியெழுப்ப முடியும். மேலும், மரக்கறி வகைகளை உற்பத்தி செய்கின்றவர்களும் பூக்களை உற்பத்தி செய்கின்றவர்களும் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். குறிப்பாக, நுவரெலியா, கண்டி, மாத்தளை மாவட்டங்களில் இத்தொழில்களில் ஈடுபடுகின்றவர்கள் மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். அவர்களுக்கான சில நிவாரணத் திட்டங்கள் பற்றி பேசுகின்றீர்களே ஒழிய, இதுவரையில் அவர்களுக்கு எந்தவொரு நிவாரணமும் கிடைக்கவில்லை.

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

தற்பொழுது, இச்சபையில் கௌரவ நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் அவர்கள் இருக்கிறார். அவர் மிக முக்கிய பொறுப்பை வகிக்கின்றவர். கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் இந்த விடயத்தில் அதிக கவனத்தைச் செலுத்த வேண்டும். ஏதோவோர் அடிப்படையில், இந்தத் தொழில்முயற்சிகளை தேசிய ரீதியில் கட்டியெழுப்புவதற்கு முயற்சி எடுக்க வேண்டும். இன்று மரக்கறி வகைகளின் wholesale priceஐ எடுத்துக்கொண்டால், ஒரு கிலோகிராம் கரட் 300 ரூபாய்; ஒரு கிலோகிராம் போஞ்சி 450 ரூபாய்; ஒரு கிலோகிராம் கறிமிளகாய் 600 ரூபாய். ஆனால், இந்தியா, பாகிஸ்தான், பங்களாதேஷ் போன்ற பக்கத்து நாடுகளில் இவை இந்த விலையின் ஐந்தில் ஒரு பங்குக்குத்தான் விற்பனை செய்யப்படுகின்றன. அண்மையில் நான் கேரளாவுக்குப் போனபோது வியந்து போனேன். அந்தளவுக்கு இந்தியா விவசாயத்தில் முன்னேறியிருக்கிறது. கௌரவ நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் ஒரு பேராசிரியர். நீங்கள் இந்த விடயத்தில் அதிக கவனம் செலுத்த வேண்டும். குறிப்பாக, நிதி அமைச்சு கவனம் செலுத்த வேண்டும். நாட்டில் விவசாயத்துறையை முன்னேற்றுவதற்கான முன்னேற்பாடுகளையும் ஒழுங்குகளையும் நீங்கள் மேற்கொள்ள வேண்டும். வெள்ளத்தால் பாதிக்கப்பட்டவர்களின் தொழில்களை மீளக்கட்டியெழுப்புவதற்குத் தேவையான உதவிகளையும் நீங்கள் செய்ய வேண்டும். அப்போதுதான் இந்த நாடு முன்னேறும்.

மின் கட்டணம் நாளுக்கு நாள் அதிகரித்துக்கொண்டு போகின்றது. விவசாயத்தில் ஈடுபடுகின்றவர்களுக்கு குறிப்பாக, மரக்கறிச் செய்கையில் ஈடுபடுகின்றவர்களுக்கு குறைந்த கட்டணத்தில் மின்சாரத்தை வழங்க வேண்டும். ஏற்றுமதியோடு தொடர்புடைய தொழிற்சாலைகளுக்கு மானிய அடிப்படையில் மின்சாரத்தை வழங்குகின்ற நடைமுறை இந்தியாவில் இருக்கிறது. அதனால்தான் இன்று இந்தியா பொருளாதாரத்தில் முன்னேறி இருக்கிறது.

மேலும், தென்னந்தோட்டம் மற்றும் ஏனைய தோட்டங்களை வைத்திருப்பவர்களுக்குக் குறைந்த மின் கட்டணத்தை வகுத்திருக்கிறது. எங்களுடைய நாட்டில் இருக்கின்ற உயர்ந்த மின் கட்டணம், உயர்ந்த உற்பத்திச் செலவு, உயர்ந்த எரிபொருள் விலை என்பவற்றுக்கு மத்தியில் விவசாயத்தினூடாகப் போதியளவு வருமானத்தைப் பெறமுடியாத காரணத்தால்தான் எமது நாட்டு முதலீட்டாளர்கள் விவசாயத்துறையில் முதலீடு செய்வதைத் தவிர்த்து வருகின்றார்கள். இன்று பல வெளிநாட்டு முதலீட்டாளர்கள் இலங்கைக்கு வந்து, எமது நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கு ஆயத்தமாக இருக்கிறார்கள். அதற்கான வசதிகளை நீங்கள் செய்து கொடுக்க வேண்டும். விசேடமாக, இதற்கான திட்டங்களை நிதி அமைச்சு வகுக்க வேண்டும். வெளிநாட்டு முதலீட்டாளர்களைக் கொண்டுவருவதற்குத் தேவையான ஒழுங்குகள், அவர்களுக்கான வசதி வாய்ப்புகள் தொடர்பில் அதிக கவனத்தைச் செலுத்த வேண்டும். அதன்மூலம் இலங்கைக்கு மிகச் சிறந்த முதலீட்டாளர்களைக் கொண்டுவந்து, விவசாயத்துறையில் -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
I have been allotted eight minutes, Sir. Anyway, I will wind up in a minute.

கௌரவ நிதி அமைச்சர் அவர்கள் இதற்கென விசேட வேலைத்திட்டமொன்றை வகுக்க வேண்டும். எங்களால் முடிந்தளவு வெளிநாடுகளிலிருந்து முதலீட்டாளர்களைக் கொண்டுவந்து, முதலீடுகளைச் செய்வதற்கு நாங்கள் ஆயத்தமாக இருக்கின்றோம். அவர்கள் எதிர்பார்ப்பதெல்லாம் அவர்களுடைய முதலீடுகளுக்கான safety, security and facilitiesஐத்தான். அவற்றை நாங்கள் கொடுக்கின்றபோதுதான் எங்களால் இந்தத் துறையை முன்னேற்றமடையச் செய்ய முடியும். நாங்களும் நீங்களும் பேசிக்கொண்டே இருக்கலாம். இன்னும் நான்கு வருடங்களில் நீங்கள் வீட்டுக்குப் போய் விடுவீர்கள். இன்னுமொரு கூட்டம் ஆளும் தரப்பில் அமர்ந்திருக்கும். இப்படியே பேசிப்பேசி இருக்காமல், எதிர்காலத்தில் நாட்டைக் கட்டியெழுப்புவதற்கான, தீர்க்கதரிசனமான, யதார்த்தமான, முன்னேற்றத்தை ஏற்படுத்தக்கூடிய, practically possibleஆன வேலைத்திட்டங்களை நீங்கள் மேற்கொள்ள வேண்டும். அதற்கு முழுமையான ஒத்துழைப்பை வழங்குவதற்கு நாங்கள் என்றென்றும் ஆயத்தமாக இருக்கின்றோமெனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පත්මනාදන් සත්‍යලිංගම් ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.37]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
நன்றி! கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நாங்கள் இந்தச் சபையில் விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டத்தின் கீழான மூன்று கட்டளைகள் தொடர்பில் விவாதிக்கின்றோம். எங்களுடைய நாட்டுக்கு இறக்குமதி செய்யப்படுகின்ற உருளைக் கிழங்கு, பெரிய வெங்காயம் உட்பட 62 உணவுப் பொருட்களுக்கான வரி விதிப்புச் சம்பந்தமாகவே இந்தக் கட்டளைகள் அமைந்துள்ளன. எங்களுடைய நாட்டின் வடக்கு மாகாணமானது, கடந்த காலங்களில் வெங்காயம், உருளைக் கிழக்குப் பயிர்ச்செய்கையில் பாரிய பங்களிப்பைச் செய்த ஒரு மாகாணம் என்பது உங்களுக்குத் தெரியும்! எனினும், இப்போது அந்த மாகாணத்தில் இந்தப் பயிர்ச்செய்கை பல்வேறு விதத்திலும் பாதிக்கப்பட்டு, நலிவுற்ற நிலையில் இருக்கின்றது. இறக்குமதி செய்யப்படுகின்ற பொருட்களுக்கு வரி விதிப்பதன் ஊடாக இறக்குமதி கட்டுப்படுத்தப்படுவதுடன், அரசாங்கத்துக்கு வருமானமும் கிடைக்கின்றது. மேலும், உள்நாட்டு உற்பத்தியைப் பெருக்குகின்ற ஓர் உத்தியாகவும் நாங்கள் இதனைப் பார்க்கலாம். எங்களுடைய நாட்டில் இவ்வாறான உணவுப் பொருட்களில் தன்னிறைவை ஏற்படுத்துவதற்கு வரி விதிப்பு மாத்திரம் உறுதுணையாக இருக்காது. ஒருபக்கம், இந்த வரி விதிப்பால் உள்நாட்டு உற்பத்தியை அதிகரிப்பதன்மூலம் விவசாயிகளுக்கு ஏற்படுகின்ற இலாபம்; மறுபக்கம், இந்த வரி விதிப்பின் ஊடாக நுகர்வோருக்கு ஏற்படுகின்ற பாரிய சுமை!

ஒரு பொருளுக்கு வரி விதிக்கப்படும்போது, இந்த இரண்டு பக்கங்களையும் நாங்கள் பார்க்கவேண்டி இருக்கின்றது. எங்களுடைய நாட்டிலுள்ள உற்பத்தியாளர்களின் உற்பத்தியைப் பெருக்குவதற்கு அரசாங்கம் பல்வேறு விடயங்களை முன்னெடுத்துச் செல்ல வேண்டும்.

இந்த நாடு தன்னிறைவடைய வேண்டுமாக இருந்தால், உற்பத்தியாளர்களுக்கான பல உதவிகளை அரசாங்கம் செய்ய வேண்டிய தேவை இருக்கிறது. அந்த வகையில், உற்பத்தியாளர்களுக்கான - விவசாயிகளுக்கான - உர மானியம் முக்கியமானது. தற்பொழுது, வடக்கு மாகாணத்தில் 85 சதவீதமான அறுவடை முடிவடைந்து விட்டபோதிலும், கடந்த பெரும் போகத்தில் கிடைக்கவேண்டிய நெல்லுக்கான உர மானியம் இன்றுவரை எமது விவசாயிகளுக்குக் கிடைக்கவில்லை. இவ்வாறு இருந்தால், எவ்வாறு நாங்கள் இந்த நாட்டின் உற்பத்திப் பொருளாதாரத்தைப் பெருக்குவது? நெல்லுக்கான விலை நிர்ணயம் செய்யப்பட்டபோதிலும், கொள்வனவு நடைபெறவில்லை. அதேபோல், அழிவுக்கான காப்புறுதி இருக்கின்றபோதிலும் இன்றுவரை முழுமையாகக் காப்புறுதி செய்யப்படவில்லை. மேலும், வன விலங்குகளால் ஏற்படும் தாக்கத்துக்கு இன்னும் தீர்வில்லை. உற்பத்திப் பொருளாதாரத்தைப் பெருக்குவதற்கு, உள்நாட்டு உற்பத்தியைக் கூட்டி தன்னிறைவு அடைவதற்கு நாங்கள் பல விடயங்களைச் செய்ய வேண்டும். அதற்கு இந்த வரி விதிப்பு மாத்திரம் உதவி செய்யாது என்பதை இந்தச் சந்தர்ப்பத்தில் கூற விரும்புகின்றேன்.

இறக்குமதி செய்யப்படுகின்ற பொருட்களுக்கான விலையுடன் போக்குவரத்துக்கான செலவும் சேர்க்கப்படுகின்றது. அதற்கு மேலதிகமாக வரியும் விதிக்கப்படுகின்றது. உதாரணத்துக்கு, இந்தியாவிலிருந்து கொண்டுவரப்படுகின்ற விவசாய உற்பத்திப் பொருட்களை எடுத்துக்கொள்வோம். அந்தப் பொருட்கள் இந்தியாவிலிருந்து கொழும்புக்கு வந்து, கொழும்பில் இருந்து வட மாகாணத்துக்குச் செல்லும்பொழுது, அவற்றின் விலை அதிகரிக்கின்றது. ஆகவேதான் நாங்கள் சொல்கின்றோம், இந்திய அரசாங்கத்தால் எமக்குத் தரப்படுகின்ற 63.5 மில்லியன் டொலரைப் பயன்படுத்தி, வட மாகாணத்தில் இருக்கின்ற காங்கேசன்துறை துறைமுகத்தை அபிவிருத்தி செய்யுமாறு. அதனை இந்த அரசாங்கம் கணக்கிலெடுப்பதாகத் தெரியவில்லை. எனவே, எங்களுடைய மக்களின் பொருளாதார மேம்பாட்டுக்குத் தேவையான வேலைகளைச் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். காங்கேசன்துறை துறைமுக அபிவிருத்தி தொடர்பான விடயத்தில் மாண்புமிகு சனாதிபதி அவர்கள் தலையிட்டு, அந்தத் துறைமுகத்தின் அபிவிருத்திக்கென மானியமாகத் தரப்படுகின்ற பெரியளவு தொகையை உரிய முறையில் பயன்படுத்த வேண்டுமெனக் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.43]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව ආරම්භ කරන්න කලින් පැවසිය යුතු කරුණු කිහිපයක් තිබෙනවා. අපේ සිවිල් ආරක්ෂක සේවාවේ නියැළී ඉන්න ඒ සෙබළුන්ට මේ වනකොට විවිධ අපහසුතා ගණනාවකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ අයගෙන් කොටසක් පොලීසිවලට අනුයුක්ත කරලා තිබෙනවා. ඒ අය ස්ථාන මාරුවීම් කරනකොට පදිංචි ප්‍රදේශයෙන් ඉතාම දුර බැහැරට ස්ථාන මාරුවීම් දීලා තිබෙනවා. ප්‍රවාහන පහසුකම්, ආහාර දීමනා ඇතුළු සියලු දේවල් එක්ක ඒ අයට ලැබෙන පඩිය සාධාරණ නොවන බව ඔවුන් මතක් කරනවා. ඒ වාගේම අලි වැට ආරක්ෂා කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට, එම අමාත්‍යාංශයට සිවිල් ආරක්ෂක භටයින් 5,000ක් අනුයුක්ත කරන්න යනවා. මේ අයගේත් මාරුවීම් ලැයිස්තු දැන් ඇවිල්ලා තිබෙනවා. අනුරාධපුරය දිස්ත්‍රික්කය ගත්තාම, කැබිතිගොල්ලෑවේ අය කැකිරාවට; කැකිරාවේ අය අඹන්පොළට, අනුරාධපුරයේ අය පදවියට වාගේ දුරබැහැර ප්‍රදේශවලට තමයි මාරු කරලා තිබෙන්නේ. මේ අය ඉතිහාසයේ ඉඳලාම පුරුදු වෙලා තිබෙන්නේ ප්‍රදේශයේ ඉඳලා සේවය කිරීමටයි. මොකද මේ අය බඳවා ගැනීම කළේ, තමන්ගේ ගම් ආරක්ෂා කිරීමට ග්‍රාම ආරක්ෂක සේවාවට ඇතුළු වුණු අය හැටියට. මේ වනකොට වසර 20ක්, 30ක් සේවයේ නියැළිලා අද මේ අය විවිධ ක්ෂේත්‍රවලට අනුයුක්ත කරනකොට ඒක සාධාරණ නැහැ. මේ අයට සේවාව එපා කරවලා බලහත්කාරයෙන් සේවය අතහැර ගිය පුද්ගලයින් බවට පත් කරන්න උත්සාහයක් දරනවා කියන එක තමයි මෙහිදී පැහැදිලිව පෙනෙන්න තිබෙන්නේ. ඉතින් මේ වෙනුවෙන් ඔවුන්ට සාධාරණයක් ඉෂ්ට කරන්න කියලා ඔවුන් ඉල්ලනවා.

ඒ වාගේම තැපැල් සේවයේ නියැළී ඉන්න තැපැල් දෙපාර්තමේන්තුවේ බාහිර ආදේශකයින් විධියට ලියාපදිංචි වෙච්ච අය දැන් ලියාපදිංචි ආදේශකයින් බවට පත් කරන්න ගැසට් කරලා තිබෙනවා. මේ අයගේත් ඉල්ලීමක් තිබෙනවා. මේ අය සේවාවට බඳවා ගන්නකොට අධ්‍යාපන සුදුසුකම් සපුරා, වයස් සීමා සපුරා තමයි මේ සේවාවට ඇතුළත් වුණේ. හැබැයි, මෙවර ගැසට් එක අනුව අවුරුදු 30 ඉක්මවන්නේ නැති අයට තමයි මේ අවස්ථාව උදා වෙලා තිබෙන්නේ. ඒ නිසා අවුරුදු 30 ඉක්ම වූ දැනට සේවාවේ නියැළී ඉන්න අයට මේ සඳහා සාධාරණ කාල සීමාවක් ලබා දෙන්න කියන කාරණය ඔවුන් කියනවා.

ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමිය මේ වෙලාවේ සභාවේ ඉන්න නිසා, ඔබතුමියට මම ස්තුති කරනවා. උපාධිධාරීන්ගේ විභාගය සම්බන්ධයෙන් අලුත් ගැසට් එකක් නිකුත් කරලා තිබෙනවා, මාර්තු 05 දක්වා දිගු කරලා. ඒ තිබෙන්නේ විවෘත අයට. ඒ වාගේම රාජ්‍ය සේවයේ නියැළී ඉන්න අයටත් මේ අවස්ථාව උදා කර දෙන්න කියා ඔවුන්ගේ ඉල්ලීමක් තිබෙනවා. මොකද, ඒ අයට උපාධිය සම්පූර්ණ කර ගන්න බැරි වෙලා තිබෙනවා, පසුගිය කාලයේ පැවති කොවිඩ් උවදුර, ආර්ථික වශයෙන් විවිධ කාරණාවලට රටක් වශයෙන් මුහුණ දුන් තත්ත්වය වැනි හේතු නිසා ඒ විභාග කල් යැම නිසා. ඒ නිසා ඒ අයටත් 2023දී අවසන් කරන්න තිබුණු උපාධිය අවසන් කර ගැනීම සඳහා, මේ මාර්තු මාසයේ හරි, නැත්නම් අඩුම තරමේ 2025.12.31වෙනි දා දක්වාවත් ඒ ගැසට් එක ඒ විධියටම දීන දාලා, ඒ දක්වා උපාධි සම්පූර්ණ කරපු අයටත්, රාජ්‍ය සේවයේ දැනට නියැළී ඉන්න අයටත් ගුරු සේවයට ඇතුළත් වීමට අවස්ථාව උදා කර දෙන්න කියන ඉල්ලීම ඔවුන් කරනවා.

එම ඉල්ලීම් තුන ඒ ක්ෂේත්‍රවල නියැළී ඉන්න අයගේ ඉල්ලීම් හැටියට තිබෙනවා. ගරු අගමැතිතුමියනි, උපාධිධාරීන් සම්බන්ධ කාරණයට ඔබතුමියට ස්තුතිවන්ත වනවා වාගේම මේ පිළිබඳවත් අවධානය යොමු කරලා මේ ගැසට් එක සංශෝධනය කරන්න කටයුතු කරන්න කියාත් මම ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]* මගේ කථාව ඉවර කරන තෙක් ඔබතුමිය පොඩ්ඩක් ඉන්න. මට විනාඩි 8යි නේ තිබෙන්නේ. ඊට පස්සේ ඔබතුමිය උත්තර දෙන්න.

අද දවසේ සාකච්ඡා කරන මාතෘකා අතර විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පැනවීම පිළිබඳ ගැසට් එකත් තිබෙනවා. කාණ්ඩ 62ක් යටතේ භාණ්ඩ - අයිතම - එකසිය ගණනකට යටත්ව තමයි

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

මේ ගැසට් එක ගහලා තිබෙන්නේ. හැබැයි, අපි අද කථා කරන්නේ බී ලූනු සහ අල ගැන විතරයි. බී ලූනුවලට සහ අලවලට මුවාවෙලා ආණ්ඩුව අනෙකුත් සියල්ලම යටපත් කරන්න හදනවා. ගොවියා කියන කාරණයේ සංවේදීකම ඉස්මතු කරලා අරගෙන ගොවීන්ට සාධාරණයක් කිරීමේ අරමුණින් තමයි අපි මේ බදු වැඩි කරන්නේ කියලා කියනවා.

එතකොට අපේ රටේ අද මතු කරන අල සහ ලූනු කියන මේ කෘෂි නිෂ්පාදන දෙක වෙළෙඳ පොළට එන්නේ කොහොමද? ලූනු එන්නේ අවුරුද්දේ එක කාලයකට. අල එනවා, දෙපාරකට. අලත් එන්නේ සීමිත වශයෙන්. මාර්තු, අප්‍රේල් වනකොට අපේ රටේ අල නිෂ්පාදනවලින් යම් ප්‍රමාණයක් වෙළෙඳ පොළට එනවා. ඒ, කුඹුරුවල වගා කරන අයගේ නිෂ්පාදන. ඊළඟට, සැප්තැම්බර්, ඔක්තෝබර් වාගේ කාල සීමාවේදී කඳුවල, එහෙම නැත්නම් ගොඩ වගා කරන අයගේ නිෂ්පාදන වෙළෙඳ පොළට එනවා.

මුල් කාලයේ ඉඳලාම මේ බදු එකම විධියට ක්‍රියාත්මක වීම පිළිබඳව මම විරුද්ධ වන්නේ නැහැ, ගොවි ජනතාව ජීවත් වන දිස්ත්‍රික්කයක ජනතා නියෝජිතයෙකු විධියට. බදු පැනවීම සහ ආනයනය සීමා කිරීම තුළ තමයි ගොවියාට සාධාරණයක් ඉෂ්ට කරන්න වෙන්නේ. ඒ නිසා බදු පැනවීම පිළිබඳව මගේ අසතුටක් නැහැ. හැබැයි, මේක සාධාරණ ක්‍රමවේදයක් විය යුතුයි. අද ඔබතුමන්ලා තීරණය කර තිබෙනවා, ආනයනික අලවලටත්, ලූනුවලටත් බද්දක් පනවන්න. මේ, අස්වනු වෙළෙඳ පොළට එන කාල සීමාවකුත් නොවෙයි. වසර පුරාම මේ මිල මේ විධියට ගෙනියන්න කොහොමද මේ ඉලක්කම් ආවේ? එක එක වර්ෂවල, එක එක මාසවල අලවලට, ලූනුවලට වෙළෙඳ පොළේ නියම වෙච්ච මිල ගණන් පිළිබඳව වසර ගණනාවක් ආපස්සට ගිහිල්ලා බැලුවාද? ඒ මිල ගණන් සාමාන්‍ය අනුපාතයකට අරගෙනද මේ භාණ්ඩවලට මේ බද්ද ගහන්න තීරණය කළේ? එහෙම නොවුණොත් මේ බද්ද නිසා පාරිභෝගිකයා විශාල අපහසුතාවකට පත්වන්න පුළුවන්. ඒ වාගේම මේ ගහන බද්දට යටත්ව වෙළෙඳ පොළේ නියාමනය වන මිල පිළිබඳව නිෂ්පාදකයින්ට, කෘෂි කර්මාන්තයේ නියැළෙන ගොවි මහත්වරුන්ට කොහෙත්ම සෑහීමකට පත්වන්න බැහැ.

මේ බද්දට යටත් වුණත් අල කිලෝ එක රුපියල් 150න් ඉහළ මිලකට යන එකක් නැති වේවි. හැබැයි, දේශීය ගොවියාට රුපියල් 150ට අල කිලෝ එකක් නිෂ්පාදනය කරන්න බැහැ. ඒ නිසා ගොවියා නහාසිටුවීම සඳහා මේ බද්ද පාවිච්චි කරන යම් ක්‍රමවේදයක් තිබෙනවාද? අසාධාරණයට ලක්වන ගොවියාට සාධාරණයක් ලබා දීම වෙනුවෙන් ආණ්ඩුව කැපවනවා. මේ ආණ්ඩුව විතරක් නොවෙයි, පැවති සෑම රජයක්ම එහෙමයි. අල, ලූනු, වී, බඩඉරිඟු, වට්ටක්කා ඇතුළු එළවලු ගොවීන් විවිධ කාල වකවානුවලදී පාරට බැහැලා උද්ඝෝෂණ කරනකොට ඒ සඳහා රාජ්‍ය මැදිහත්වීම් තිබුණා. හැබැයි, රාජ්‍ය මැදිහත්වීම තුළ මේක සාධාරණීකරණය වෙනවාද? මේ සඳහා රාජ්‍යය මැදිහත් වෙන්න ගිහිල්ලා එක්කෝ භාණ්ඩාගාරයට අලාභයක් සිද්ධ වෙනවා. එක්කෝ, පාරිභෝගිකයාට අසාධාරණයක් වෙනවා. එහෙම නැත්නම්, ගොවියාට අසාධාරණයක් වෙනවා. එම නිසා මේ සියල්ලම කළමනාකරණය කර ගන්නා වූ ක්‍රමවේදයකට අපි යා යුතුව තිබෙනවා. එම නිසා මේක අපි මධ්‍යස්ථ තැනකට ගෙනැල්ලා පාරිභෝගිකයාට හැමදාම එකම මිලක් ලබා දීමට කටයුතු කළ යුතුයි.

ඒ වාගේම ඒ එන බදු මුදල ක්‍රමවත්ව ගොවියාගේ පැවැත්ම වෙනුවෙන් අපි යෙදවිය යුතුයි. ඒ සඳහා ගොවියා පාරට බැහැලා උද්ඝෝෂණය කරනකල් ඉන්න අවශ්‍යතාවක් නැහැ. පැහැදිලිවම අපේ ගොවියාට මේ මිලට ඔවුන්ගේ නිෂ්පාදන කරන්න බැරි නම් බදු විධියට අයකර ගන්නා මුදලින් ඔවුන්ට යම් සහනයක් ලබා දිය යුතුයි. කිලෝ එකකට අපි මෙච්චර ගෙවනවා කියන එකට ක්‍රමවේදයක් සකස් කරගන්නේ නැතුව බදු විතරක් පැනෙව්වාට කොහෙත්ම ගොවීන්ට සාධාරණයක් සිද්ධ වෙන්නේ නැහැ කියන එක තමයි ගරු ඇමතිතුමනි කියන්න තිබෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න. ගොවියා පාරට බැහැලා, උද්ඝෝෂණය කරලා, කෑ ගහලා, තමන්ගේ නිෂ්පාදන මහ පාරේ පුච්චලා, වීසි කරලා යනකල් ඉන්නේ නැතිව මේ පිළිබඳව අවධානය යොමු කර සාධාරණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

අද වනකොට වී ගොවියා ප්‍රශ්නයකට මුහුණ දී තිබෙනවා. දැන් වී අස්වනු නෙළනවා. මම මේ කාරණය මේ ආණ්ඩුව එනකොටත් කිව්වා. මම මේ පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳන් මේ පිළිබඳව කථා කරනවා. හැබැයි, ආණ්ඩුව උත්සාහ කරනවා, මේ එන චෝදනාවලින් ගැලවෙන්න. හැම ආණ්ඩුවක්ම මේ ප්‍රශ්නය විසඳන්න උත්සාහ කරනවා. ඒ සඳහා වී අලෙවි මණ්ඩලයට මුදල් වෙන් කරනවා, ගබඩා අරිනවා, සුද්ධ කරනවා. හැබැයි, ප්‍රායෝගිකව මේ කාරණය අපි අවබෝධ කරගෙනද මේ කටයුත්ත කරන්නේ කියන එක පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. පසුගිය සතියේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී කිලෝවක විකුණුම් මිල රුපියල් 78ට අඩු වෙලා තිබුණා. ඒ කියන්නේ, වී කිලෝවක් රුපියල් 78ට විකුණන තැනට පත් වෙලා තිබෙනවා. ඔබතුමන්ලා paddy drying machines වෙනුවෙන් මුදල් වෙන් කළා, මේ අය වැය තුළින්. ඒවා සවි කරලා මේ ගොවීන්ට සාධාරණයක් ලබා දෙන්නේ කවදාද? ඒවා කොච්චර ප්‍රමාණයක් සවි කරන්න ඕනෑද කියන කාරණයත් මම අහනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මට තව විනාඩියක් තිබෙනවා, මගේ කාලය අනුව. ඒ නිසා ඔබතුමා මට ඒ කාලය ලබා දෙන්න.

මම ඉල්ලීමක් කරනවා, හැම ගොවියෙකුම උද්ඝෝෂණ කරනකල් ඉන්නේ නැතුව ඒ ගොවීන්ට සාධාරණයක් ඉෂ්ට කරන්න කියලා. මේවා හැම රජයක්ම හැම දාම මුහුණ දෙන කාරණා. බොහොම පැහැදිලිව ඔබතුමන්ලා විසින් වෙන් කරන මුදල් ප්‍රායෝගිකව අවසානයේ ගොවියාට සාධාරණව ලැබෙන්නේ නැහැ. ඒ නිසා ගොවීන්ට සාධාරණව මේ මුදල් ටික ගලාගෙන යන විධියටත්, ඔවුන්ට නැවත කෘෂි කර්මාන්තයේ නියැළීමට කැමැත්ත, උනන්දුව වැඩි වැඩියෙන් ඇති වන විධියටත් මේ කටයුතුවල යෙදෙනවා නම් මම හිතන විධියට අපට පුළුවන් වෙයි, කෘෂි කර්මාන්තය මීට වඩා දියුණු තැනකට පත් කරන්න. පිරිවැය අඩු කරන්න, නිෂ්පාදනය වැඩි කරන්න නවීන තාක්ෂණය ගෙනෙන්න ඇමතිවරුන් කළ කථා අපි අහගෙන හිටියා. මේ හැම දෙයක් ගැනම එතුමන්ලා කථා කරනවා. නමුත්, මේ කටයුතු ක්‍රමවත්ව කවදාද අපි අවසන් කරන්නේ? කවදාද අපි මේ ඉලක්කවලට යන්නේ? අපේ ගොවියා නවීන කෘෂි කර්මාන්තයට යොමු කරන්නේ කවදාද? ඒ නිසා මේ සම්බන්ධයෙන් මුදල් වෙන් කිරීම වාගේම ප්‍රායෝගිකව ඒවා ක්‍රියාත්මක කරන තැනට වනකල් ගෙනෙන්න කියන කාරණය තමයි මම මතක් කරන්නේ. මට කථා කරන්න කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිය පළ කරමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.51]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ඇත්තටම අද මුදල් අමාත්‍යාංශය පැත්තෙන් ඉදිරිපත් කරනු ලබන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ වූ නියම තුන සහ රේගු ආඥාපනත යටතේ යෝජනා සම්මතය පිළිබඳව විපක්ෂයෙන් ඉදිරිපත් කළ ගොඩක් අදහස් සාවද්‍යයි. මෙහිදී අලුතින් බදු පැනවීම් කිසිවක් සිදු කරලා නැහැ. නමුත්, අලුතින් බදු පැනවීම් කරනවා වාගේ අදහසක් මේ සභාවේදී මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කළා. එහෙම අලුතින් බදු පැනවීමක් සිද්ධ වෙලා නැහැ කියන කාරණය සම්බන්ධයෙන් මම කරුණු එකින් එක පැහැදිලි කරන්නම්.

පළමුවන ගැසට් පත්‍රයේ තිබෙන්නේ පාකිස්තානය සහ ශ්‍රී ලංකාව අතර තිබෙන නිදහස් වෙළෙඳ ගිවිසුමට අදාළව ආනයනය කරනු ලබන මැන්ඩරින් වර්ගයේ ද්‍රව්‍ය තීරු බද්දෙන් නිදහස් කරන්න කියායි. නමුත්, ඒ තීරු බද්ද නිදහස් කර ගැනීමට වූ අවස්ථාව අපට ලබා දෙන්න විධියක් නැති වෙලා තිබෙනවා, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ දැනට ඒ වෙනුවෙන් රුපියල් 120ක් අය වන නිසා. ඒ නිසා මේ සංශෝධනය තුළින් අපි කරන්නේ තීරු බද්ද පනවා අර රුපියල් 120 අයින් කරන එකයි. විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද යටතේ වන රුපියල් 120 අදාළ වෙන්නේ නැහැ. එතකොට, ආනයනය කරන දෙමුහුන් වර්ගයේ නාරං දැන් තීරු බද්දට යටත් වනවා. හැබැයි, අපි තීරු බද්ද කොහොමද නිර්ණය කර තිබෙන්නේ? තීරු බද්ද නිර්ණය කර තිබෙන්නේ, තිබෙන බදු ප්‍රමාණයට බලපෑමක් නොවන විධියටත්, ආදායම් අහිමි නොවන විධියටත්, භාණ්ඩයට අනවශ්‍ය මිලක් පැටවිලා පාරිභෝගිකයාට අසාධාරණයක් නොවන විධියටත්. එතකොට තිබුණු රුපියල් 120 වෙනුවට අපි මොකක්ද පනවපු බද්ද? ආනයනය කරන නාරංවලින් සියයට 20 හෝ රුපියල් 60 කියන අවමයක් යොදා තිබෙනවා. එතකොට ඒවා ආනයනය කරනකොට රුපියල් 60ක් අනිවාර්යයෙන්ම එනවා. ඒ රුපියල් 60 මත, ඒ වාගේම ආනයනය කරන මිල මත අනෙකුත් භාණ්ඩවලට පැනවෙන VAT එකයි, SSCL එකයි පැනවුණොත් මම කලින් කිව්ව රුපියල් 120 ආසන්නයටම එනවා. හැබැයි, අපි ඒ වැඩේ කරන ගමන්ම පාකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමට ගරු කරලා, ඒ තීරු බදු සහනය ලබා දෙනවා. ඒකයි අපි පළමුවන ගැසට් පත්‍රයෙන් කරන්නේ. එහෙම නැතුව අතිරේක බදු පැනවීමක් කරලා නැහැ.

දෙවන ගැසට් පත්‍රය තිබෙන්නේ අල, ලූනු සම්බන්ධයෙනුයි. එහිදී අලුතින් බදු පැනවීමක් කළේ නැහැ, තිබුණු තත්ත්වයම තමයි තිබෙන්නේ. 2025 නොවැම්බර් 25වන දින අවසාන වීමට නියමිතව අලවලට පනවා තිබුණු රුපියල් 80ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දත්, ලූනුවලට පනවා තිබුණු රුපියල් 50ක බද්දත් දෙසැම්බර් 31 දක්වා ඉදිරියට ගෙනාපු එක තමයි අපි කළේ. ඇයි, එහෙම කළේ? ඒක කළේ නිකම් හිතුමතයට නොවෙයි. අපි කවුරුත් දන්නවා, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අතීතයේදී පනවනකොටත් ජීවන වියදම් කමිටුවක් තිබුණු බව. හැබැයි, විවිධ විවේචන තිබුණා, පසුගිය ආණ්ඩුවලට. ඒ කමිටුවලට පිටින් ගිහිල්ලා ජනාධිපති ලේකම් කාර්යාලයේ එවකට හිටපු තුන්හතර දෙනෙකු එකතු වෙලා සකස් කරපු ලියුමකින් තමයි මුදල් අමාත්‍යාංශයට සීනි සඳහා බද්ද ශත 25ට අඩු කරන්න සිද්ධ වුණේ. ඒ නිසා තමයි ඒවා වංචා, ගැටලු සහිතව සිදු වෙලා තිබෙනවාද කියලා බලන්න, පරීක්ෂණ පවත්වන්න කියලා audit reports ඇවිල්ලා තිබෙන්නේ. දැන් එහෙම නොවෙයි වෙන්නේ. විධිමත්භාවය, නිවැරදි ආණ්ඩුකරණය යටතේ දැන් තිබෙනවා, ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවක්. ඒ කමිටුවේ මේවා පිළිබඳව සාකච්ඡා කරනවා. එතැනට එන විද්වතුන්, අමාත්‍යාංශ නිලධාරින්, මේ පිළිබඳ ප්‍රාමාණික දැනුම තිබෙන අය සාකච්ඡා කරලා කමිටු වාර්තාවක් ලබා දුන්නත් එකවර බද්ද පනවන්නේ නැහැ. ඒක කැබිනට් මණ්ඩලයට එනවා. සාමූහික වගකීමක් දරලා, ඒ තොරතුරු අධ්‍යයනය කරලා, කැබිනට් මණ්ඩලය අනුමත කළාට පසුව තමයි ගැසට් නිවේදනය එන්නේ. ඒ අනුව අපි ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා, අනුමත කර ගැනීම සඳහා. ඒ තත්ත්වයන්ට අදාළ දත්ත, විශ්ලේෂණ වාර්තා සියල්ල ඉදිරිපත් කර තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීතුමෙක් සඳහන් කළා, මේ දත්ත, සංඛ්‍යා බලන්නේ නැද්ද කියලා. ඒවා බලා තිබෙන්නේ.

මෙවැනි විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පැනෙව්වාම අල, ලූනු සම්බන්ධයෙන් විය හැකි අනතුරුදායක තත්ත්වය මෙයයි. මෙවැනි බද්දක් අමාත්‍යවරයා තනි හිතුමතයට පනවනකොට ඒ තොරතුර ආනයනකරුට ගියොත් ඔහුට හැකියාව තිබෙනවා, කලින් භාණ්ඩ ගෙනැල්ලා ගබඩා කරන්න. ඒ, අතීතයේ භාවිතය; ඔයගොල්ලන් කරපු දේ. හැබැයි, මේ අවස්ථාවේදී අපි කිසිදු ඉඩකඩක් තියලා නැහැ, මේ තොරතුර ඒ ආනයනකරුවන්ගේ අතට පත් වෙන්න පුළුවන් වන විධියට. ඒකේ ප්‍රතිඵලය තමයි මේ සංඛ්‍යාලේඛන, දත්ත තුළින් පෙන්වන්නේ. මේ මාස හය ඇතුළත විශ්ලේෂණ අරගෙන බලන්න. ජූනි මාසයේ ඉඳන් ඉදිරියට කිසිදු ආකාරයක අතිරේක තොග ඇවිල්ලා නැහැ. සාමාන්‍යයෙන් මාසයකට ලූනු මෙට්‍රික් ටොන් 23,000ක්, අල මෙට්‍රික් ටොන් 18,000ක් 20,000ක් වාගේ ප්‍රමාණයක් බලාපොරොත්තු වෙනවා. මේ හැම මාසයකම දත්ත අරගෙන බැලුවාම ඒ සාමාන්‍ය අගය තුළ තමයි තිබෙන්නේ. එහෙම නැතුව කිසිදු ආකාරයක අතිරේක තොග ගබඩා කිරීමක් සිද්ධ වෙලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බදු පැනවීම් ගැන කථා කළා. නමුත්, බදු සහනයක් ලබා දීලා තිබෙනවා, තුන්වන ගැසට් පත්‍රයෙන්. ඒ, මොකක්ද? "දිට්වා" සුළි කුණාටුව හමුවේ ආණ්ඩුව ගත්ත ක්‍රියාමාර්ග ගොඩක් තිබුණා. ඒ ආපදා අවස්ථාවේදී ඒ වෙනුවෙන් ඉක්මනින් මැදිහත් වෙන්න ඕනෑ වුණා. ඒ, ආපදාවට පත් ජනතාවගේ ජීවන තත්ත්වය යථා තත්ත්වයට පත් කර ගන්නයි. ඒ අවස්ථාවේදී අපිට විශාල ලෙස පරිත්‍යාග ලැබුණා. ඒ වාගේම විදේශ රටවල් වාගේම පුද්ගලයින් ආධාර කළා. ඒ සමහර පරිත්‍යාග අනවශ්‍ය බදුවලින් නිදහස් කර ගන්න සුවිශේෂී ගැසට් නිවේදනයක් අපි නිකුත් කරනවා, පරිත්‍යාග විධියට එන මේ භාණ්ඩවලට යම් යම් කොන්දේසි ඇතුළත් කරලා, ඒ කාල පරිච්ඡේදය ඇතුළත දී ඒවා විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් අයින් කර ගන්න. එතැනදී සහනයක් ලබා දීලා තිබෙන්නේ. රුපියල් බිලියන ගණනාවක් වටිනා භාණ්ඩ මෙට්‍රික් ටොන් විශාල ප්‍රමාණයක් අපිට මේ කාල පරිච්ඡේදය තුළ ලැබිලා තිබෙනවා. ඒ අනුව සහනයක් ලැබිලා තිබෙන්නේ.

හතරවැනි ගැසට් පත්‍රය අනුව මේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාසයකට වැඩි කාල රාමුවකට අනුවයි පනවන්න තිබෙන්නේ. 2025 දෙසැම්බර් 31 වනකොට භාණ්ඩ 62ක ලැයිස්තුවක් තමයි තිබුණේ. ඒ, 2025 අවුරුද්ද තුළ ක්‍රියාත්මක වෙමින් තිබුණු භාණ්ඩ

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ලැයිස්තුව. ඒ භාණ්ඩ ලැයිස්තුවට ආපසු බදු පැනවීමක් කළේ නැහැ. ඒ නිසා වැරදි අදහස් දක්වන්න එපා. මේ භාණ්ඩ 62ට අලුතින් බදු පනවා නැහැ. මේ, අපේ ආදායම් ඒකාග්‍රතාව ඇතුළේ 2025 අය කර ගත්ත බදුම ඒ ආකාරයටම ඉදිරියට ගෙන යෑමක්. ඒවායේ වෙනස් කළ යුතු ඒවා තිබෙනවා නම් ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවෙන් නිර්දේශ ආවට පසුව අපි ඒ වැඩය කරනවා. දැනට තිබෙන දත්ත මත මේ විධියට තමයි අපට ඉදිරියට ගමන් කරන්න වෙන්නේ. ඒ අතරත් තෝරා ගත්ත භාණ්ඩයක්, දෙකක් තිබෙනවා. ඒවාට බදු සහන ලැබිලා තිබෙනවා. සැමන් නිෂ්පාදනය සඳහා ආනයනය කරන රුපියල් 400කට තිබුණු මත්ස්‍ය කිලෝවකට අය කළ බද්ද රුපියල් 6 දක්වා අඩු කරලා තිබෙනවා. ඒක සහනයක් නොවෙයිද? ඒක අලුතින් බදු පැනවීමක්ද? ඒක වැරදි අර්ථ කථනයක්. ඒ වාගේම ඖෂධ නිෂ්පාදන සඳහා භාවිත කරන ලුණු කිලෝග්‍රෑමයකට රුපියල් 40ක බද්දක් 2025දී පනවා තිබුණා. ඒ බද්ද රුපියල් 10ට අඩු කරලා තිබෙනවා. ඒ තත්ත්වය තමයි අපි මේ ඉදිරියට ගෙනැල්ලා තිබෙන්නේ. අපි මේකෙන් පෙන්නුම් කරන්නේ අපේ ආණ්ඩුකරණය ඇතුළේ යහපත් ආණ්ඩු ක්‍රමය, විධිමත්භාවය සහ පාරදෘශ්‍යභාවය. ඒ අනුව අපිට 2025දී ස්ථාවරත්වයක් ගොඩනඟා ගන්න පුළුවන් වුණා. අපේ රට ඇතුළේ දැනට තිරසාර අඩිතාලමක් දමා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! අද දින විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තවත් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්නම්, තිරසාරත්වය කොච්චර දුරට වැදගත් වෙනවාද කියන එක සම්බන්ධයෙන්. අපිට තිරසාරත්වය සම්බන්ධයෙන් තිබුණු අභියෝග හමුවේ ප්‍රධාන වශයෙන්ම මේ මූල්‍ය ස්ථාවරත්වයත්, මිල ස්ථාවරත්වයත් අත්පත් කර ගැනීමම තමයි, ආර්ථික වර්ධනය ඉදිරි අදියරට ගෙන යන්න වාගේම ආයෝජන කැන්දවීමේ පදනම.

අපේ හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා සඳහන් කළා, මේ ආයෝජකයන්ගේ විශ්වාසය ඉතා වැදගත් කියලා. ඇත්තටම එතුමා ඉදිරිපත් කළ අදහස නිවැරදියි. අපි ඒ අදහසට එකඟ වෙනවා. ඒ විශ්වාසය ගොඩනැඟීමට විවිධ වූ ක්‍රියාමාර්ග අපි ගනිමින් තිබෙනවා. ඔවුන්ට පහසුකම් සැලසීම, නීතිරීති සකස් කිරීම කළ යුතු වෙනවා. ඉදිරියේදී මේ තත්ත්වය වඩාත් යහපත් තත්ත්වයට පත් වෙලා මේ ආයෝජන කැන්දවීමේ පදනම එනවා. මේ තිරසාරත්වය ඇතුළේම අපිට පුළුවන්කම ලැබුණා, අපි අපේක්ෂා කළාටත් වඩා ආර්ථික වෘද්ධියක් 2025දී අත්පත් කර ගන්න. ඒ අනුව තමයි, 2025 ආර්ථික වෘද්ධිය සියයට 5ක් හෝ සියයට 5 ඉක්ම වූ තැනකට අපිට ගෙනෙන්න පුළුවන් වෙන්නේ. ඒ සම්බන්ධව විවිධ වැරදි දත්ත ඉදිරිපත් කළා, සියයට 5ක් අරගෙන කරන්න පුළුවන්ද, මදිද, අපේ කාලයේ සියයට 10, සියයට 8 ගත්තා කියලා. ඇත්තටම විපක්ෂයේ ඔයගොල්ලන් ආණ්ඩු කරපු කාලයේ ආර්ථික වෘද්ධි අනුපාතය පිළිබඳව විශ්ලේෂණය කර බැලුවාම විශාල ගැටලුවක් තිබෙනවා. ඒ ගැටලුව තමයි, ආයෝජකයාගේ විශ්වාසය ගොඩනැඟුණේ නැතිකම. ඇයි, ඒ? මේ ආර්ථික වෘද්ධිය ස්ථාවරව පවත්වාගෙන යන්න බැහැ; පුරෝකථනය කරන්න බැහැ. එක අවුරුද්දක සියයට 10යි, සියයට 15යි; ආපසු එක වතාවටම බින්දුවට එනවා; ඍණ වෙනවා. ඇයි, එහෙම වෙන්නේ? විශේෂයෙන්ම ඵලදායී නොවන ණය ගත්ත කාලයට එක වතාවටම රටේ ආර්ථික වෘද්ධිය ඉහළ යනවා. ඒ නිසා එම ණය ගැනීමේ ප්‍රතිඵලයක් නැහැ. ලංකාව පුරාම විහිදී තිබෙන ගොඩනැඟිලි 2,700ක් අපි හොයා ගෙන තිබෙනවා. ඒවා ඔහේ අත්හැර දාලා තිබෙන්නේ. ඒවා වෙනුවෙන් මුදල් වියදම් කරලා තිබෙනවා. හැබැයි, ගොඩනැඟිල්ල හදන්න ණය ගත්ත කාලයේ මොකද වෙලා තිබෙන්නේ? ඒ කාලයේ සියයට 7ක්, සියයට 5ක් පෙන්වනවා. ඊට පසුව ආපසු බින්දුවට වැටෙනවා; ඍණ වෙනවා. අපි ආණ්ඩුව ගන්නකොටත් එවැනි තත්ත්වයක් තමයි තිබුණේ. 2019 අවුරුද්ද අවසන් වනවිට ඍණ ආර්ථික වෘද්ධියකට තමයි අපේ රට ගෙනිහිල්ලා තිබුණේ.

ඒක තමයි ඇත්ත තත්ත්වය. හැබැයි, අපේ මේ කෙටි කාලය තුළ විවිධ අභියෝග හමුවේ ස්ථාවරත්වය අත් පත් කරගෙන අපේ ආර්ථික වෘද්ධිය කොහාටද ගමන් කරමින් තිබෙන්නේ? ඉලක්ක අභිභවා යමින් ධන ප්‍රවණතාවක් කරා. පළමු කාර්තුවේ සියයට 4.8යි, දෙවැනි කාර්තුවේ සියයට 4.9යි, තුන්වැනි කාර්තුවේ සියයට 5.4යි. මේක තමයි ප්‍රවණතාව. අපි මේ තත්ත්වය ඉදිරියට ගෙන යන්න බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදී ඉදිරිපත් කළා, මධ්‍ය කාලීන තිරසාරත්වය, inclusive and sustainable economic growth එකක් අපට අවශ්‍යයි කියලා. සියයට 7කට වඩා තිරසර ආර්ථික වර්ධනයක් අපට අවශ්‍යයි. ඒ සියයට 7 ලබා ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කරලායි තිබෙන්නේ, ඒ සඳහා වැඩකටයුතු කරමිනුයි ඉන්නේ. අපි ඒක කිසි විධියකට ආපස්සට හරවන්නේ නැහැ. ඒ නිසාවෙන්ම තමයි, අනපේක්ෂිත විධියට පැමිණි "දිට්වා" සුළි කුණාටුවෙන් පස්සේ අපේ අය වැය වෙනස් නොකර, ඒ අය වැයට වෙන් කරපු ප්‍රාග්ධන වියදම් ඒ විධියටම තිබියදී පරිපූරක ඇස්තමේන්තුවක් ගෙනැල්ලා අතිරේකව වියදම් කළේ. ඇයි ඒ? අර ඉලක්කයට ළඟා වෙන්න. ඒ ඉලක්කයේ දත්ත සහ තොරතුරු දැන් හැම තැනකින්ම පෙනෙනවා. ඒවා හරියි කියලා සාර්ව ආර්ථික දත්තවලිනුත් පෙන්නුම් කරනවා, ජාත්‍යන්තර සංවිධාන විසින් පෙන්වනවා, සමීක්ෂණ වාර්තාවලිනුත් පෙනෙනවා. "දිට්වා" සුළි කුණාටුවෙන් ඇති වුණු බලපෑම පිළිබඳව සොයා බලා ඊළඟ වැඩකටයුතු පිළිබඳව සාකච්ඡා කරන්න මෑතකදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කළමනාකාර අධ්‍යක්ෂිකාව ලංකාවට ආපු වෙලාවේ එතුමිය විශේෂයෙන් අවධාරණය කළා, මෙවැනි ඕනෑම තත්ත්වයකට මුහුණ දෙන්න පුළුවන් මිනිස්සු ලංකාවේ ඉන්නවා, එවැනි තිරසාරත්වයක් සහිත මිනිස්සු ඉන්නවා, එවැනි ආපදාවකට පෙරළා ප්‍රතික්‍රියා දක්වන resilient මිනිස්සු ඉන්නවා, ඒ වාගේම යහපත් ආණ්ඩුවක් - හොඳ ආණ්ඩුවක් - තිබෙනවා කියලා. ඒ නිසා සියයට 7ක්, 8ක් වූ ආර්ථික වර්ධන ඉලක්කයට යන්න අපට හැකියාව සහ විභවතාව තිබෙනවා කියන කාරණය අවධාරණය කළා.

තවත් කාරණයක් කෙරෙහි ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්න ඕනෑ. ඒ තමයි, ආර්ථික වෘද්ධියත් එක්ක පවතින උද්ධමනය. අතීතයේ ඔය කියන කාලවලදී උද්ධමනය සියයට 70ට විතර ගියා. අපට පුළුවන් වුණා, මෙන්න මේ තිරසාරත්වයේ අඩිතාලම හරහා උද්ධමනය පාලනය කරන්න. ඒක තමයි වැදගත් වෙන්නේ. දැන් අපි ගමන් කරන්නේ අවුරුදු 3ක් ඇතුළේ සියයට 5ක උද්ධමනය පාලනය කරන ඍජු වැඩසටහනක් ඇතුළේ. එතකොට, අන්න ඒ ඉලක්කගත වෙච්ච සියයට 5 ඉක්මවා යනවාද

කියන කාරණයේදී තමයි විපක්ෂයෙන් අපිව ප්‍රශ්න කළ යුතු වෙන්නේ. නමුත්, ඒක එහෙම වෙලා නැහැ. අපි ඒක ඇතුළේ ඉන්නේ. පසුගිය අවුරුද්දේම අපි උද්ධමනය බින්දුව ආසන්නයේ රඳවාගෙන තිබෙනවා. එම නිසා මිනිසුන්ගේ මිලදී ගැනීමේ හැකියාව -ක්‍රය ශක්තිය- ඉහළ ගිහින් තිබෙන්නේ. එසේ ක්‍රය ශක්තිය ඉහළ යන්නේම අනෙක් පැත්තෙන් අපි ශ්‍රමිකයින්ගේ පඩි වැඩි කරපු නිසායි. 2025දී රුපියල් බිලියන 110ක් අය වැය වියදම්වලට අලුතින් එකතු වුණා. කවුරුත් කථා බහ නොකළාට, වැටුප් වැඩි වීමේ කොටස විධියට 2026දීත් අතිරේකව රුපියල් බිලියන 110ක් අලුතින් රාජ්‍ය මූල්‍ය සඳහා එකතු වෙනවා. එවැනි තත්ත්වයකදී උද්ධමනය පාලනය කළා කියන්නේ, ඉතාම හොඳ තත්ත්වයක්. බින්දුව ආසන්නයේ තිබුණු මාසික උද්ධමනය පසුගිය ජනවාරි මාසය වන විට සියයට 2.1යි. ඒ විධියට පාලනය වුණු තත්ත්වයක් තමයි තිබෙන්නේ.

ඒ වාගේම අපි රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ සුවිශේෂී ජයග්‍රහණයක් අත් පත් කරගෙන තිබෙනවා. මෙතැනදී තමයි කියන්නේ, අපි බදු ගහනවා, බදු ගහනවා, අලුතින් බදු ගහනවා කියලා. නැහැ, අලුතින් බදු පැනවීමකින් තොරව බදු ආදායම වැඩි කර ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ කොහොමද? බදු එකතු කිරීමේදී තිබෙන ගැටලුවක් තමයි, tax avoidance and tax evasion. ඒ කියන්නේ, බදු මඟ හැරීම සහ පැහැර හැරීම. මෙන්න මේ මඟ හැරීම සහ පැහැර හැරීම අපි වළක්වලා තිබෙනවා. ඒ වාගේම බදු අනුකූලතාව වැඩි කරලා තිබෙනවා. බදු අය කර ගැනීමේ කාර්යක්ෂමතාව වැඩි කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි අපට හැකියාව ලැබෙන්නේ, 2025 වර්ෂයේදී අපේක්ෂිත ආදායමත් එක්ක ගත්තාම සියයට 110කින් බදු ආදායම වැඩි කර ගන්න.

ආදායම වැඩි කර ගන්න ගමන්ම අපි වියදම් කිරීමේ කාර්යක්ෂමතාවත් පෙන්නුම් කර තිබෙනවා. පසුගිය දෙසැම්බර් මාසය වෙනකල්ම -අය වැය සම්මත කරන කාලය වෙනකල්ම- විපක්ෂයෙන් කිව්වා, අපි ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කළ මුදල් වියදම් කරලා නැහැ, ඒවායින් සියයට 10යි, 15යි වියදම් කරලා තිබෙන්නේ කියලා. ඒ වගේ විවිධ වූ කතන්දර කිව්වා. ඒත් එක්කම ආර්ථිකය දියුණු වෙන්නේ නැහැ, කඩාගෙන වැටෙනවා ආදී දේවලුත් කිව්වා. දැන් මේ දත්ත හා සංඛ්‍යා ලේඛන සකස් කිරීම අවසන් අදියරේ තිබෙන්නේ. ඉදිරියේදී ඒවා අමාත්‍යාංශවලින් නිල වශයෙන් ඉදිරිපත් කරාවි. දැන් අපට තිබෙන අවසානම දත්තය ගත්තාමත්, 2025 වර්ෂයට වෙන් කරන ලද ප්‍රාග්ධන වියදම රුපියල් බිලියන 3,115යි. එය සංශෝධනය කළාට පස්සේ රුපියල් බිලියන 3,337ක් දක්වා තවත් පොඩි ගණනකින් වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව සියයට 75ක ප්‍රතිශතයක් දක්වා වර්ධනය කර ගැනීමේ හැකියාව අපට ලැබී තිබෙනවා. විදේශ සංචිත ගත්තත් ඒ විධියමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට පුළුවන් වෙලා තිබෙනවා, විදේශ සංචිත ප්‍රමාණය සවිමත් කර ගන්න. ඒ වාගේම, තිරසර විධියට අපනයන ප්‍රවර්ධනය කර ගන්න, විදේශ ප්‍රේෂණ වැඩි කර ගන්න සහ සංචාරක කර්මාන්තයෙන් එන ආදායම වර්ධනය කර ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

ඒ වාගේම ණය තිරසරකරණය ඇතුළේ අපි ජයග්‍රහණ ගණනාවක් අත් පත් කරගෙන තිබෙනවා. එහි සුවිශේෂී කාරණයක් මම සඳහන් කරන්නම්. රටක් විධියට ප්‍රතිව්‍යුහගතකරණය ඇතුළේ ලෝකයේ පළමුවැනි වතාවට ඉදිරිපත් කරනු ලබන කොන්දේසියක් තමයි, macro-link bonds. මෙහිදී අපි කැමති වෙනවා, මේ ගනුදෙනු කිරීමේ ප්‍රවණතාව වැඩි කිරීමෙන් අපේ ආර්ථිකය යහපත් මට්ටමට පත් වෙනකොට පොලිය අඩු කරන්න. අපි අයහපත් වුණා නම් පොලිය වැඩි වෙනවා. අපට පුළුවන්කම ලැබුණා, ඒ අත්පත් කර ගත්ත ජයග්‍රහණයෙන් සියයට 0.75කින් පොලිය අඩු කරගෙන ඩොලර් මිලියන 80ක විතර වාසියක් අත්පත් කරගන්න. දැන් සියලු කරුණු කාරණා පෙළ ගැහිලා තිබෙනවා, මේ ස්ථාවරත්වයෙන් ඔබ්බට යන්න අවශ්‍ය කරන ආයෝජන කැඳවීමට. ඒ ආයෝජන ලබා ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළවල් සකස් වෙමින් තිබෙනවා. ඔවුන්ගේ විශ්වාසය අපි තහවුරු කරමින් තිබෙනවා. අවශ්‍ය පහසුකම් සම්පාදනය කරමින් තිබෙනවා. 2026 වර්ෂය අනිවාර්යයෙන්ම ආයෝජකයන්ගේ විශ්වාසය ගොඩ නැඟෙන, සියලු දෙනාම එකට එකතු වෙලා මේ රට ගොඩ නඟන, විශේෂයෙන් "දිට්වා" සුළි කුණාටුවෙන් ඇති වූ තත්ත්වයෙන් රට ගොඩ ගෙන, සංවර්ධනය කිරීමේ කාර්යයට දායක වන අවුරුද්දක් කියන කාරණය සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 දෙසැම්බර් 04 දිනැති අංක 2465/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.02.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 දෙසැම්බර් 31 දිනැති අංක 2469/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.02.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රේගු ආඥාපනත: යෝජනා සම්මතය
## சுங்கக் கட்டளைச் சட்டம்: தீர்மானம்
## CUSTOMS ORDINANCE: RESOLUTION

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

" (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2026.02.05 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2025 නොවැම්බර් 25 දිනැති අංක 2464/15 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මෝටර් වාහන පනත : නියෝග
## மோட்டார் வாகனச் சட்டம்: ஒழுங்குவிதிகள்
## MOTOR TRAFFIC ACT: REGULATIONS

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වගන්තිය සමඟ කියවිය යුතු 44, 123, 124, 125, 126, 126ආ, 128, 132, 132අ සහ 231 වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 නොවැම්බර් 17 දිනැති අංක 2463/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.02.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 126 වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 දෙසැම්බර් 17 දිනැති අංක 2467/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.02.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි පහක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. LAKSHMAN NIPUNA ARACHCHI left the Chair, and THE HON. KITNAN SELVARAJ took the Chair.*

## අල්ලස සහ දූෂණයෙන් තොර රාජ්‍යයක් ස්ථාපිත කිරීම
## இலஞ்சம் மற்றும் ஊழலற்ற தேசத்தைத் தாபித்தல்
## ESTABLISHMENT OF A STATE FREE FROM BRIBERY AND CORRUPTION

[අ.භා. 5.07]

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"දූෂණයෙන් තොර රටක බලාපොරොත්තුව මෙරට ජනතාවගේ සිත් තුළ දශක ගණනාවක් තිස්සේ තිබූ සිහිනයකි. ඒ පිළිබඳව විවිධ කථා දේශපාලන වේදිකාවේ සිදු කළ ද ඒවා හුදු කථාවලට පමණක් සීමා විය. එහෙත්, අල්ලස සහ දූෂණයෙන් තොර රටක් ගොඩනැඟීමේදී දේශපාලන නායකත්වයේ කැපවීම සහ ආදර්ශය ඉතා වැදගත් වේ. දූෂණය සහ අල්ලස පිටුදැකීම සඳහා වන යන්ත්‍රණය ශක්තිමත්ව පවත්වාගෙන යෑමේ හැකියාව අතින් ශ්‍රී ලංකාව පැවතියේ ඉතාමත් පහළ තත්ත්වයකය. මේ නිසා දූෂණ විරෝධී ජාත්‍යන්තර දර්ශකවල ශ්‍රී ලංකාව පැවතියේ ඉතාමත්ම පහළ මට්ටමකය. ඒ හේතුවෙන් "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි 4.3 නීතිය යටතේ පාලනය වන, අල්ලසට හා දූෂණයට එරෙහිව ජනතාවට වගකියන වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර එවා කඩිනමින් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබේ.

Transparency International ආයතනය විසින් නිකුත් කරන ලද දූෂණ සංජානන දර්ශකය - CPI - අනුව ශ්‍රී ලංකාව 2026 වසරේදී පසුගිය වසරට සාපේක්ෂව ස්ථාන 14කින් ඉහළට පැමිණීම, ඉතාමත් සාධනීය තත්ත්වයක් පමණක් නොව, වසරක නව පාලන යුගයක දේශපාලනික පරීක්ෂාවේ ප්‍රතිඵලයකි. "දූෂණයට තිත" යනු හුදෙක් සටන් පාඨයක් නොවේ, එය සංවර්ධනයේ මූලධර්මයකි. වසරක් තුළ ලැබූ ප්‍රගතිය හෙට තවත් ඉදිරියට ගෙන යාම අපේ සමූහ වගකීමයි. එය වචනයක් නොව, ක්‍රියාත්මක වන පද්ධතියක් බව ශ්‍රී ලංකාව ලෝකයට පෙන්වමින් සිටියි. සංවර්ධන ව්‍යාපෘතිවලින් සහ ජාතික ධනය අල්ලසට දූෂණයට යට කළ ක්‍රමවේදය හමාර කළ යුතුව ඇත. දූෂණ විරෝධී රාජ්‍ය ක්‍රියාවලියක් තුළින් සුපිළිපන් රාජ්‍යයක් ගොඩනැඟීම සඳහා පොදු සමාජයේ වගකීම ඉතාමත් අත්‍යවශ්‍ය සහ තීරණාත්මක ලෙස සමාජගත විය යුතුව ඇත. ජාත්‍යන්තර දර්ශකයෙහි පහළ ස්ථානවල ඇති රාජ්‍යයන් බොහොමයක් ඌන සංවර්ධිත මට්ටමක පවතී. එම නිසා සංවර්ධනයේ මාවත කරා පිය නැඟීමට දූෂණය සහ වංචාවට විරුද්ධ වීම අත්‍යවශ්‍ය කාරණයකි.

එම නිසා එවන් රාජ්‍ය පද්ධතියක් ස්ථාපිත කර ගැනීමේදී දේශපාලන නායකත්වය, රාජ්‍ය නිලධාරින් සහ පොදු මහජනතාව යන පාර්ශ්වයන්ගේ සහයෝගය මෙම වැඩ පිළිවෙළ වඩාත් ශක්තිමත්ව ඉදිරියට ගෙන යාම සඳහා ලබා දිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දූෂණය මර්දනය කිරීම සඳහා අප මේ ඉදිරිපත් කරන යෝජනාව සහ අප ගෙන යන වැඩ පිළිවෙළ මෙතෙක් කාලයක් මේ රටේ සුවහසක් ජනතාව බලාපොරොත්තුවෙන් හිටපු දෙයක්. ඒ අය ඒක බලාපොරොත්තුවෙන් තමයි අප කෙරෙහි විශ්වාසය තබලා, ජාතික ජන බලවේගයට ජනාධිපති ධුරය සහ 159ක් වූ මන්ත්‍රී ධුර සංඛ්‍යාවක්ද ඇතුළත්ව ආණ්ඩුවක් ලබා දුන්නේ. ඒ ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට කිරීම සඳහා අපි කැප වෙමින් ඉන්නවා. අපේ වැඩ පිළිවෙළේ ප්‍රශස්තභාවය ගැන අපට මේ අවස්ථාවේදී ජනතාවට සහතික විය හැකියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, අප සිටියේ කොයි වාගේ යුගයකද කියලා; අප පසු කරගෙන ආවේ මොන වාගේ යුගයක්ද කියලා. අපට අමතක නැහැ, විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය. ඒක සිද්ධ වුණේ, එතුමා ඉදිරියේ විභාගයට නියමිතව තිබුණු නඩුවක් හේතුවෙන්මයි. එතුමාගේ වෘත්තිය, එතුමා අදූෂිතව කරගෙන ආපු, නිර්දෝෂී රාජකාරිය නිසා තමයි එතුමාණන්ට ජීවිතය පුදන්න සිදු වුණේ. අපි එවැනි දූෂිත යුගයකයි හිටියේ. අපට අමතක කරන්න බැහැ, සහකාර රේගු අධිකාරී සුජිත් ප්‍රසන්න පෙරේරා ඝාතනය. එතුමා සේවය කළේ රේගු බුද්ධි සහ විමර්ශන අංශයේ. එතුමා පවත්වා ගෙන ගිය විමර්ශනයක් හේතුවෙන්, එතුමාගේ රාජකාරිමය කටයුතු හේතුවෙන්, 2001 මාර්තු 24 වන දින එතුමාට තමන්ගේ ජීවිතයෙන් වන්දි ගෙවන්න සිද්ධ වුණා. ඒ විධියට ප්‍රජාතන්ත්‍රවාදය වළ දැමුණු, රාජ්‍ය නිලධාරින්ට තමන්ගේ රාජකාරිය ඉටු කරන්න අපහසු යුගයක් තමයි එදා තිබුණේ.

අපේ මහනුවර ප්‍රදේශයම ගෙන බැලුවොත්, අපට මතකයි වර්ෂ 2002දී ලලිත් අඹන්වල මහත්මයාට ඇසිඩ් ප්‍රහාරයක් එල්ල වුණා. එතුමා Additional Auditor-General වශයෙන් තමයි විශ්‍රාම ලැබුවේ. මහනුවර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අදාළව විගණනයක් සිදු කරන අවස්ථාවේදී, තමන්ගේ රාජකාරිය හේතුවෙන් එවැනි ඇසිඩ් ප්‍රහාරයකට මුහුණ දෙන්න එතුමාට සිදු වුණා. අපි ඒ වාගේ යුගයක් පසු කරගෙන ඇවිත් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ යුගය නිමා කරන්න අපට අවස්ථාව ලැබී තිබෙනවා. මින් ඉදිරියට ඒ කරන කිසියම් හෝ ක්‍රියාවක් සඳහා සහාය දීමට හෝ ඒ සම්බන්ධයෙන් වන විමර්ශන වැළැක්වීමට හෝ ආණ්ඩු පාර්ශ්වයේ කිසිදු සහායක් නැහැ කියන සහතිකය අපි ජනතාවට දීලා තිබෙනවා වාගේම ජනතාවත් එම සහතිකය අපට දීලා තිබෙනවා. ඒ අනුව ජනතාවත් අපත් අතර ඒ පිළිබඳව ලොකු සහසම්බන්ධයක් ඇති වෙලා තිබෙනවා. ඒ අයගේ විශ්වාසය අපි රකිනවා කියන කාරණය ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. මට කාලය ලබා දීම සම්බන්ධයෙන් බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම, ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.13]

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் சக பாராளுமன்ற உறுப்பினர் கௌரவ துஷாரி ஜயசிங்ஹ அவர்களால் கொண்டுவரப்பட்ட ஊழல், இலஞ்சம் மற்றும் மோசடி இல்லாத தேசத்தைத் தாபித்தல் தொடர்பான சபை ஒத்திவைப்புவேளைப் பிரேரணையை நான் வழிமொழிகின்றேன். நான் இந்தப் பிரேரணையை மிக முக்கியமானதொரு பிரேரணையாகவே பார்க்கின்றேன். கௌரவ உறுப்பினர் அவர்களுக்கு இந்த இடத்தில் நன்றி கூறுவதோடு, பிரேரணையையும் வரவேற்கின்றேன்.

இன்று தேசிய மக்கள் சக்தி அரசாங்கமானது, இலங்கை மக்கள் மத்தியில் மட்டுமல்லாது உலக மக்கள் மத்தியிலும் எவ்வாறானதொரு பிம்பத்தைப் பெற்றிருக்கின்றது என்று பார்ப்போம். நீண்ட காலமாக ஊழல், மோசடிகளால் இலங்கையை வங்குரோத்தடையச் செய்தார்கள். ஆனால், இன்றைக்கு மக்கள் எல்லோரும் எங்களை நிமிர்ந்து பார்க்கின்றார்கள். இலங்கையானது ஊழல், மோசடிகளற்ற நாடுகளின் பட்டியலில் 14 இடங்கள் முன்னேறி இருக்கின்றது. அந்தளவுக்கு அனைவரும் நல்லெண்ணத்துடன் பார்க்கின்ற, நம்புகின்ற, ஏற்றுக்கொள்கின்ற ஒரு நாடாக தேசிய மக்கள் சக்தி அரசாங்கம் இலங்கையை மாற்றியிருக்கின்றது. இலஞ்சம், ஊழல் என்பது வெறும் பணத்தைத் திருடுகின்ற செயற்பாடு மட்டுமல்ல. அது ஒட்டுமொத்த நாட்டு மக்களுடைய எதிர்பார்ப்பையும் நோக்கத்தையும் அழிக்கின்ற செயற்பாடாகும். அவ்வாறுதான் நாங்கள் அதைப் பார்க்கின்றோம். ஊழலானது, பணத்திலும் அதிகாரத் துஷ்பிரயோகத்திலும் மட்டுமல்ல, பல்வேறு வழிகளில் அரச வளங்களையும் ஏனைய வளங்களையும் சரியான முறையில் பயன்படுத்திக்கொள்ளாத தன்மையிலும் உள்ளது.

அழகான, சொர்க்கபுரியான இந்த நாடு அடிமட்டத்துக்குச் சென்றதற்குக் காரணம், ஒரு குறிப்பிட்ட சிலரே தவிர ஒட்டுமொத்த மக்களும் கிடையாது. அவர்கள் தங்களின் சுயநலத்துக்காக மக்களின் வரிப் பணத்தையும் நாட்டின் வளத்தையும் சுரண்டிக் கொண்டார்கள். அதை நாங்கள் ஒழிக்க வேண்டும். ஒரு நாட்டில் ஜனநாயகத்தைப் பலப்படுத்தவும்

[ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා]

இருப்பைத் தக்கவைக்கவும் கையில் எடுக்கும் முதலாவது ஆயுதம் இலஞ்ச ஒழிப்புதான். அந்த வகையில், எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கமானது இலங்கையிலிருந்து ஊழலையும் இலஞ்சத்தையும் ஒழிப்பதில் மிகவும் கவனமாக இருக்கின்றது. நாங்கள் இப்போதும் மக்களுடைய நம்பிக்கையைப் பெற்றிருக்கின்றோம். அதாவது, எங்களுடைய ஆட்சியின் வெளிப்படைத் தன்மையை மக்களுக்குக் காட்டியிருக்கிறோம். ஆட்சிப் பொறுப்பை மக்களுக்குக் கொடுத்திருக்கிறோம். இது மக்களுடைய அரசாங்கம்! தங்களுக்கு இழைக்கப்படுகின்ற அநீதிகளுக்கு எதிராக மக்கள் குரல்கொடுக்கக்கூடிய தன்மையை ஏற்படுத்தியிருக்கிறோம். எனவே, எதிர்காலத்தில் இலங்கையானது ஊழலற்ற நாடாகவும் அனைத்து நாடுகளுக்கும் முன்னுதாரணமான நாடாகவும் இருக்கும் என்பதில் அசைக்க முடியாத நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது.

கடந்த காலங்களில் ஆட்சியில் இருந்தவர்கள் பாரிய அளவிலான கடன்களைப் பெற்றிருக்கிறார்கள். அதாவது, white elephant project என்ற எந்தவித நன்மையுமற்ற திட்டங்களுக்காகப் பெருந்தொகைக் கடன்களைப் பெற்றிருக் கிறார்கள். அவற்றைப் பெற்றதன் நோக்கம் என்னவெனில், அந்தப் பணத்தைத் திருடி, தாமும் தங்களுடைய குடும்பமும் மட்டும் வாழ வேண்டும் என்பதற்காகத்தான். அதற்காக உலக வங்கியிடமிருந்தும் இன்னும் பல நிதி நிறுவனங்களிட மிருந்தும் கடன்களைப் பெற்று, அதன் சுமையை மக்கள்மீது திணித்திருக்கிறார்கள். இன்று நாங்கள் என்ன செய்கின்றோம்? எங்களுக்குப் பணம் தேவையில்லை. இன்றைய நிலைமையில், பாராளுமன்ற உறுப்பினர்களாகிய நாங்கள் எல்லாவற்றையும் துறந்து, வெளிப்படைத் தன்மையுடனான ஓர் ஆட்சியை மக்களுக்குக் காட்டி இருக்கின்றோம். இது முன்னுதாரணமான ஒரு செயற்பாடு! இது எங்களுடைய இளைஞர்கள் பின்பற்றவேண்டிய ஒரு செயற்பாடும்கூட. பாடசாலையாக இருந்தாலும் சரி, வைத்தியசாலையாக இருந்தாலும் சரி, வங்கியாக இருந்தாலும் சரி, எந்த இடத்தில் இருந்தாலும் இந்த நாட்டில் நாங்கள் ஊழலுக்கு எதிராகப் போராட வேண்டும். இலங்கை மக்கள் உலகத்தில் தலைசிறந்த மக்களாக, படித்த மக்களாக, பண்பாடான மக்களாக, வரலாற்றைக்கொண்ட மக்களாக, மதிக்கப்படுகின்ற மக்களாகத் திகழ வேண்டுமென்றால், நாங்கள் இலஞ்சத்தையும் ஊழலையும் ஒழிக்க வேண்டும்.

இன்று படிப்படியாக இலஞ்ச, ஊழல் ஒழிக்கப்பட்டு வருகின்றது. நாங்கள் ஆட்சிக்கு வந்து ஒரு வருட காலப்பகுதிக்குள்ளே நல்ல சமிக்ஞைகள் தெரிகின்றன. அவற்றை மக்கள் ஏற்றுக்கொள்கின்ற நிலைப்பாடு காணப் படுகின்றது. ஆனால், சிலர் மீண்டும் பழைய யுகத்துக்குக் கொண்டுசெல்வதற்காகப் பல்வேறு வடிவங்களில் மக்களைத் திசை திருப்பி, அவற்றைப் பிழையான பிம்பங்களாகக் காட்டுவதற்கு முயற்சிக்கிறார்கள். அதற்கு நாங்கள் ஒருபோதும் இடமளிக்க மாட்டோம். எத்தகைய அச்சுறுத்தல்கள் வந்தாலும், எத்தகைய துயரங்கள் வந்தாலும், மக்களுக்குக் கொடுத்த வாக்குறுதிகளை நிறைவேற்றும்வரை நாங்கள் ஓயமாட்டோம். குறிப்பாக இலஞ்ச, ஊழலை இலங்கையிலிருந்து முற்றாக ஒழிக்கும்வரை நாங்கள் ஓயமாட்டோம். எனவே, வளமானதொரு நாட்டை உருவாக்குவதற்காக, இலஞ்ச, ஊழலை முற்றுமுழுதாக ஒழிப்பதற்காக அரசாங்கத்தின் கொள்கைக்கு இணங்க எம்முடன் சேர்ந்து பயணிக்க வேண்டும் என்று நான் இந்த இடத்தில் அனைவரையும் குறிப்பாக, எதிர்க்கட்சி உறுப்பினர்களைக் கேட்டுக்கொண்டு, இந்த வாய்ப்பை வழங்கிய உங்களுக்கு நன்றி கூறி விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ எம். நிசாம் காரியப்பர் அவர்கள்! உங்களுக்கு 7 நிமிடங்கள் உண்டு.

[අ.භා. 5.18]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්තුතියි, මට මේ අවස්ථාව ලබා දුන්නාට. මට වෙලාවකට හිතෙනවා, ආණ්ඩු පක්ෂයේ ඒ මන්ත්‍රීවරිය පොඩ්ඩක් හදිසි වෙලා මේ යෝජනාව ගෙනවාද කියලාත්. මොකද, Transparency International ආයතනයේ Corruption Perceptions දර්ශකය මුල් කරගෙන, ඒකෙන් ලැබුණු ලකුණු 35ක් එක්ක 107වැනි rank එක ලැබීම ගැන සුබ පැතීමක් නේ දැන් මේ කරන්නේ. එහෙම නේද? 2016 වර්ෂයේ යහ පාලන ආණ්ඩුව ආපු කාලයේ අපි ඒ දර්ශකයේ කොහේද හිටියේ කියලා පොඩ්ඩක් සොයා බැලුවා නම් හොඳයි නේද? එහෙම නම් අපි එතැනින් පටන් ගනිමු. අපි එතකොට හිටියේ, 95 rank එකේ. දැන් rank එක 107; ගිය අවුරුද්දේ rank එක 121. ගිය අවුරුද්දේ 121 ඉඳලා දැන් 107ට ආපු එකට තමතමන්ම ප්‍රශස්ති ගායනා කර ගන්න මේ යෝජනාව ගෙනැල්ලා තිබෙනවා කියලා තමයි මට තේරෙන්නේ. කලබල වෙන්න එපා, මේ Transparency International ආයතනයේ Corruption Perceptions දර්ශකය ගැන ඔබතුමන්ලා හරියට සොයා බැලුවා නම් මීට වඩා හොඳ දේවල් ගැන තොරතුරු එනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2002දී අපි best rankingsවල හිටියා. අපිට තිබුණා, 52වැනි rank එක. අද තිබෙන්නේ 107වැනි rank එක. අපිට 2012දී තිබුණා points 40ක්. අපි එතැන ඉඳලා සුබ පතන්න පටන් ගනිමු නේද? නමුත්, ඒක එහෙම වෙන්නේ නැහැ. ඔබතුමන්ලා මේ Verité Research එකේ index එකයි, Transparency International එකේ index එකයි, මොනවා හරි එකක් අල්ලාගෙන ඔහොම කලබල වෙන්න එපා. ඔයගොල්ලන්ට මේවා නුරුස්සන දේවල් වුණු කාලයක් තිබුණා. සිංහල කියමනක් තිබෙනවා නේ, "කලකදි වහලු කලකදි රහ වෙනවාලු" කියලා. මේවාට දැන් ඔයගොල්ලන් හරි ආසයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මම එක කාරණයක් කියන්න ඕනෑ. දූෂණය නැති කරන්න ඕනෑ. රජය විතරක් නොවෙයි, පාර්ලිමේන්තුවේ විපක්ෂය හැටියට මේ රටේ ඉන්න ජනතාව එකතු කරගෙන දූෂණය නැති කරන්න අපි සම්පූර්ණයෙන් සහයෝගය දක්වනවා. මේ වාගේ දෙයක් ගැන කථා කරනකොට මේ රජයට පමණක් නොවෙයි, මුළු පාර්ලිමේන්තුවටම ඒ සම්බන්ධයෙන් වගකීමක් පැවරී තිබෙනවා.

දූෂණය පටන් ගන්න ප්‍රධානම හේතුව තමයි, ආර්ථික හේතු. අපේ ගම්වල හෙල්මට් එක නැතුව පුද්ගලයෙක් මෝටර් බයිසිකලේ ගිහිල්ලා අහු වුණාම පාරේ ඉන්න පොලිස් නිලධාරින්ට කීයක් හරි දීලා ඒ ප්‍රශ්නයෙන් බේරීම; over speed ගිහිල්ලා පොලිසියට අහු වුණාම ඒ පොලිස් නිලධාරින්ට කීයක් හරි දීලා එතැනින් ඒ ප්‍රශ්නය බේරා ගැනීම; ග්‍රාම නිලධාරින්ගෙන් සහතිකයක් ගන්නකොට ඒ නිලධාරින්ට ඒ වෙනුවෙන් මොනවා හරි දෙයක් දීම වාගේ දේවල්වලින් තමයි දූෂණය පටන් ගත්තේ. අපි ඒ දූෂණය පටන් ගන්න හේතු හොයාගෙන ගියාම එතැන තිබෙන්නේ ආර්ථික ප්‍රශ්නයක්. මම ඒ කාරණය පිළිගන්නවා. ඇත්ත, ඒක අවුරුද්දකින්, දෙකකින් නැති කරන්න බැහැ. Transparency International එකේ දර්ශකය තියාගෙන

ඔබතුමන්ලා දැන් මේක මැනගෙන යන එක ගැන අපිට බොහොම ප්‍රීතියි. මොකද, ඒක ඉතා හොඳ වැඩක්. ඒ දර්ශකය අනුව 107වැනි ස්ථානයට දැන් අපේ රට ඇවිල්ලා ඉන්නවා. ඒ දර්ශකයට අනුව 2016 වර්ෂයේ 91වැනි ස්ථානයේ තමයි අපි හිටියේ. අපි ඒ ස්ථානය දක්වා නැවත ගමන් කරමු. මොන හේතුවක් නිසාද දන්නේ නැහැ, ඒ දර්ශකයට අනුව 2002 වර්ෂයේ අපි හිටියේ 52වැනි ස්ථානයේ. ඒ ගැන කියන්න මටත් තේරෙන්නේ නැහැ. දූෂණය මැඩ පැවැත්වීම සඳහා තිබෙන ලකුණු දීමේ ක්‍රියාවලිය හරහා 40ට වැඩිය ලකුණක් තිබුණොත් තමයි සාමාන්‍යයෙන් සතුටුදායක හැටියට ගණන් ගන්නේ. ලකුණු 30ක් කිව්වාම simple pass එකකුත් නැහැ නේද? ලකුණු 35ක් කිව්වාමත් simple pass එකකුත් නැහැ. ලකුණු 50ක් විතර ගත්තාම තමයි සතුටුදායක සාමර්ථයක් වෙන්නේ. ලකුණු 40ක් කිව්වාම ඒත් මදි.

අපි ඒක සමච්චලයට ලක් කරනවා නොවෙයි. එක අතකින් අපිට ඒ ගැන සන්තෝෂයි. Transparency Internationalහි දර්ශක නියාමයන් ආදර්ශ කරගෙන දූෂණය පිටුදැකීම සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගන්න මේ උත්සාහයට සම්පූර්ණයෙන් අපේ ප්‍රශංසාව පළ කරනවා. ඒක හොඳ වැඩක්. මෙතැන තිබෙන ප්‍රශ්නය මෙයයි. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන Manifesto එක අරගෙන ආපු මේ රජය දූෂණය මැඩ පැවැත්වීම සම්බන්ධයෙන් ගෙන තිබෙන උත්සාහයට විරුද්ධ පක්ෂයෙන් කිසිම ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. අපි ඒ සඳහා සම්පූර්ණයෙන්ම අපේ සහයෝගය දක්වනවා.

நான் தமிழ் மொழியிலும் ஒருசில விடயங்களைச் சொல்வது நல்லதென நினைக்கின்றேன். அழகான வாழ்க்கையை உருவாக்குவதற்கு, ஊழலை ஒழிப்பதற்கு நீங்கள் எடுத்திருக்கின்ற முயற்சிக்கு நாங்கள் முழுமையான ஆதரவை வழங்குகின்றோம். புதிய தலைமுறையினர் ஊழலை ஒழிக்க வேண்டும் என்பதில் உறுதியாக இருக்கின்றார்கள். ஊழலை ஒழிப்பதென்பது வெறுமனே அரசாங்கக் கட்சியின் வேலை மாத்திரமல்ல. அதற்கு எதிர்க்கட்சியும் முன்னுதாரணமாக இருக்கின்றது.

මම අද මේ කාරණය කියන්නම ඕනෑ. මොකද, අපේ විපක්ෂ නායකතුමා දූෂණයෙන් තොර බවට සියයට සියයක් ලකුණු ලබා තිබෙන පුද්ගලයෙක්. ඒක අමතක කරන්න එපා. එතුමා සෑහෙන කාලයක් පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා. එතුමාට විරුද්ධව එහෙන් මෙහෙන් පොඩි පොඩි කථා කිව්වාට මම දන්නා තරමින් එතුමා කිසිම අධිකරණයකින් දූෂණය සම්බන්ධයෙන් කිසිම වරදකට, චෝදනාවකට ලක් නොවුණු පුද්ගලයෙක්. "අපි දූෂණයෙන් තොර ආණ්ඩු පක්ෂයක්" කියලා ඔබතුමන්ලා අද පාර්ලිමේන්තුවේදී ආඩම්බරයෙන් කියනවා නම් ප්‍රධාන විපක්ෂයත් ඒ හා සමානවම දූෂණයෙන් තොර පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමක් සිටින විපක්ෂයක් කියලා තමයි අපිත් ඉතා ආඩම්බරයෙන් කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමන්ට විතරක් ප්‍රශස්ති ගී ගායනා කර ගැනීමක්. අනෙක් කාරණය මේකයි. මේ ගැන හරි පුදුමයි. මේක ආණ්ඩුවේ අලුත් trend එකක්. ආණ්ඩුව තමන් තමන්ටම ප්‍රශස්ති ගී ගායනා කර ගැනීමේ අලුත් culture එකක් හදාගෙන. එහෙම කරන්න එපා. ඒ තත්ත්වයට ගියොත් ඔබතුමන්ලාත් අමාරුවේ වැටෙනවා. ප්‍රශස්ති ගී ගයපු හින්දා තමයි පසුගිය කාලයේ පැවති ආණ්ඩු බොහොමයක් අමාරුවේ වැටුණේ. තමන් පිළිබඳව විවේචනයක් ජනතාව ලබා දෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்து விட்டது.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

මම මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා උගත්, මගේ හොඳ මිත්‍රයෙක්. අපි දූෂණය නැති කළ නිසා දැන් දූෂණය අඩුවෙන් තිබෙනවා කියලා ඔබතුමන්ලාට ඔච්චර කෑ ගහලා කියන්න පුළුවන් නම් පොඩ්ඩක් ජනතාව ඉදිරියට ගිහිල්ලා, මැතිවරණයකටත් මුහුණ දීලා බලමු. එතකොට ජනතාව කොයි පැත්තේද ඉන්නේ කියලා බලා ගන්න පුළුවන්. මේ Select Committee එක අවසන් කරලා, මාස තුනකින් හරි ඉක්මනට පළාත් සභා මැතිවරණයත් පවත්වන්න කටයුතු කරන්න කියලා ඉල්ලමින් මම කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ இராமநாதன் அர்ச்சுனா அவர்கள். உங்களுக்கு 5 நிமிடங்கள் உள்ளது.

[අ.භා. 5.26]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කනගාටු වෙනවා, මේ වාගේ යෝජනාවක් ගෙනැල්ලා පාර්ලිමේන්තුවේ submit කරලා, කථා කරන්න ලැබීම ගැන. ඒකට මම පොඩි උත්තරයක් දෙන්න ඕනෑ. මම ඇත්ත කියන්නම්. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට මට පඩිය විධියට ලැබෙන්නේ රුපියල් ලක්ෂ හතරයි; රුපියල් තුන්ලක්ෂ අනූදෙදාහයි. ඊට පස්සේ මගේ කාර්යාලයට සේවකයන් හයදෙනෙක් පත් කරන්න පුළුවන්. එතකොට මට තවත් රුපියල් ලක්ෂ තුනක් ගන්න පුළුවන්. එතකොට රුපියල් ලක්ෂ හතයි. හැබැයි, දැන් සභාව බලන්න, ආණ්ඩු පක්ෂයේ ඉන්නේ 10යි, 11යි. විපක්ෂය පැත්තේ කී දෙනෙක්ද ඉන්නේ කියලා බලන්න. අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා කොච්චර මන්ත්‍රීවරු ගෙදර ගිහිල්ලා තිබෙනවාද? දූෂණ ගැන කථා කරනවා නම් කරුණාකරලා finger print එකක්,- *[බාධා කිරීමක්]* ඉන්න පොඩ්ඩක්. දූෂණ ගැන කථා කරනවා නම් කරුණාකරලා finger print එක තියන්න, පාර්ලිමේන්තුවෙන් එළියේ. අපි බලමු, NPP මන්ත්‍රීවරු කීයක් එනවාද කියලා. *[බාධා කිරීමක්]* දැන් මේ සභාව ඇතුළේ ඉන්නේ 10ක් - 15ක් නේ. *[බාධා කිරීම්]* ඒ නිසා කෑ ගහන්න එපා බබාලා.

මේ දූෂණ ගැන තමුන්නාන්සේලා,- *[බාධා කිරීම්]* ඔහොම ඉන්න කෝ බබා. දැන් ඔබතුමන්ලාගේ,- *[බාධා කිරීම්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බලන්න කෝ ඔබතුමන්ලාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීමක්] ළඟදී හෙලිකොප්ටර් දෙකකින් ගියා නේද? [බාධා කිරීමක්] හෙලිකොප්ටර් දෙකකින් ගියා නේද? ඇයි, එක හෙලිකොප්ටරයකින් අනෙක් හෙලිකොප්ටරයට පනින්නද? හුළං ගියොත් අනෙක් හෙලිකොප්ටරයට පනින්නද? [බාධා කිරීම්] අනේ, මේ බබාලාට කට වහගෙන ඉන්න කියන්න. ලජ්ජයි. Prime Ministerත් සභාවේ වාඩි වෙලා ඉන්නවා. ඔබතුමන්ලාගේ බබාලාට කට වහගෙන ඉන්න බැරි වෙලා තිබෙනවා. කිව්වා, බස්වල යනවා කියලා. [බාධා කිරීම්] මේ බබා, ඔබතුමාගේ Prime Minister ඔබතුමා ඉස්සරහ වාඩි වෙලා ඉන්නවා. ලජ්ජයි. ඔන්න

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

බලන්න. [බාධා කිරීම්] බණින්න ඔබතුමන්ලාගේ Prime Ministerට. බලන්න, education reforms ගෙනෙනවාය කියලා buddy.net ගෙනාවේ කවුද? පිට රට සල්ලි අරගෙන ඇවිල්ලා buddy.net එක දැම්මේ අපිද කියන්න කෝ. එක මන්ත්‍රීවරයෙක් අත ඔසවලා කියන්න, මට දූෂණ සම්බන්ධයෙන් එක චෝදනාවක් තිබෙනවාද කියලා. ලජ්ජා වෙන්න ඕනෑ, ඔබතුමන්ලා වාගේ කට්ටිය. දවසකට රුපියල් මිලියන 15ක් - රුපියල් ලක්ෂ 150ක් - පාවිච්චි කරලා මේ වාගේ යෝජනා පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙනවා. හැබැයි, සභාවේ ඉන්නේ කී දෙනාද? මේ පැත්තේ ඉන්නේ මන්ත්‍රීවරු 10යි, 11යි. ඉස්සරහ පේළියේ වාඩි වෙලා ඉන්නේ දෙදෙනායි. [බාධා කිරීම්] මේ බබාට වාඩි වෙන්න කියන්න. ලජ්ජයි. [බාධා කිරීම්]

ඊට අමතරව මම තව කාරණයක් කියන්න ඕනෑ. [බාධා කිරීම්] බලන්න කෝ, අපි කථා කළාම තිබෙන සද්ද. අපට දෙන්නේ විනාඩි තුනයි, විනාඩි දෙකයි. [බාධා කිරීම්] කට වහගෙන ඉන්න කියන්න කෝ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ කට්ටියට. [බාධා කිරීම්]

මම එක කාරණයක් කියන්න ඕනෑ. කැබ් 159ක් ගන්නවා නේ. අද Parliament එකේ කාරක සභාවකට ඇවිල්ලා Anuradhapura Hospital එකේ Deputy Director අඬනවා, ඒගොල්ලන්ගේ Anuradhapura Hospital එකටම තිබෙන්නේ වාහන තුනයි - කැබ් එකයි, ලොරියයි, වෑන් එකයි - කියලා. Ambulance එකක්වත් නැහැ කියලා අඬනවා. හැබැයි, මේ බබාලා ටික කැබ් ඉල්ලනවා. කලින් කොහොමද කිව්වේ? බස්වල යනවා, trainsවල යනවා කියලා. දැන් ඔබතුමන්ලාගේ ඇමතිලා ගන්න පඩිය කීයද? [බාධා කිරීමක්] වැඩිය එපා, ඔබතුමන්ලාගේ කථානායකතුමා ගැන complaint එකක් දමා තිබෙනවා. ලජ්ජා නැද්ද? බත් ද කන්නේ? ඔබතුමන්ලා බුද්ධාගමේද? [බාධා කිරීමක්] බුද්ධාගමටත් ලජ්ජයි; සිංහල ජාතියටත් ලජ්ජයි. ඔබතුමන්ලාගේ කථානායකතුමා පෙට්‍රල් දීමනා දෙකක් ගත්තා කියලා,- [බාධා කිරීම්] හොඳම දැනුමක් තිබෙන මේ ඉස්සරහ පුටුවේ ඉන්න එතුමා මට දකිනකොටත් දුකයි. හැබැයි, ඔය PHI ගෙනැල්ලා මේවා කරන්න ඕනෑ කියලා එතුමාවත් ආපහු එළවන්න හදන්නේ. [බාධා කිරීම්] බලන්න කෝ, මේ බබාලා කෑ ගහන විධිය. ඒක තමයි, මේ රටේ 159ක් walking libraries. මේකට තමයි කියන්නේ, walking libraries කියලා. මම දන්නේ නැහැ, A,B,C,Dවත් හරියට කියා ගන්න බැරි බබාලා කිහිපදෙනෙක් පිටිපස්සේ ඉඳගෙන ඉන්නවා. [බාධා කිරීම්] මේ කට්ටිය ගෙනැල්ලා මේ රට හදා ගන්න පුළුවන් කියලා විශ්වාස කරනවාද? [බාධා කිරීම්] මේ බලන්න කෝ, ඔබතුමන්ලාගේ ඇමතිලා අහගෙන ඉන්නවා. ඔබතුමන්ලාගේ Prime Minister අහගෙන ඉන්නවා. බබාලා කෑ ගහනවා. මේ වාගේ ලජ්ජා නැති Parliament Membersලා තමයි ඉන්නේ මේකේ. [බාධා කිරීම්]

මම කියන්නද, ඔබතුමන්ලාගේ index එක අඩු වෙච්ච එකට හේතුව? *[බාධා කිරීම්]* හරි, හරි. ඔබතුමන්ලාගේ index එක අඩු වෙච්ච එකට හේතුව, හැම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඇවිල්ලා පාර්ලිමේන්තුවේ ඉන්න එක. *[බාධා කිරීම්]* ඒ නිසා තමයි ඔබතුමන්ලාගේ index එක අඩු වෙලා තිබෙන්නේ. මම තවත් එකක් කියන්නම්. *[බාධා කිරීම්]* කට වහගෙන ඉන්න කියන්න කෝ අනේ ඔබතුමන්ලාගේ බබාලාට, අඩුම ගණනේ මට කරදර කරන්නේ නැතුව. *[බාධා කිරීම්]* මේ වෙලාවට Standing Orders පාවිච්චි කරන්නේ නැද්ද? *[බාධා කිරීම්]* මේ වෙලාවට Standing Orders පාවිච්චි කරන්නේ නැද්ද? මේ බබාලාට කියන්න ඒවා. *[බාධා කිරීම්]* ලජ්ජා වෙන්න ඕනෑ. *[බාධා කිරීම්]* බිමල් රත්නායක ගිහිල්ලා SLTB එකේ,- *[බාධා කිරීම්]* අනේ! කට වහගෙන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්] කට වහගෙන ඉන්න කියන්න, ඔබතුමන්ලාගේ කට්ටියට. කථා කරන්න ඉඩ දෙන්න කියන්න. [බාධා කිරීම්] ලජ්ජාවක් නැද්ද ඔබතුමන්ලාට? [බාධා කිරීම්] මේ බලන්න, මගේ වෙලාව නාස්ති කරනවා. [බාධා කිරීම්] කට වහගෙන ඉන්න කියන්න. [බාධා කිරීම්] කියන්න හරියටම. [බාධා කිරීම්] ඊට පස්සේ Provincial Council එකේ මන්ත්‍රීතුමන්ලා පස්දෙනෙක්,- [බාධා කිරීම්] ලජ්ජා වෙන්න ඕනෑ. ඔබතුමන්ලාගේ අගමැතිත් ඒ විධියට, ඔබතුමන්ලාගේ MPsලාත් ඒ විධියට. ඔබතුමන්ලාත් කොහොම හරි ගොඩ ගහගෙන ආවා වැස්සට. [බාධා කිරීම්] දැන් වැස්සට,- [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාවේ නිශ්ශබ්දව ඉන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
කියන්න. *[බාධා කිරීම්]* කියන්න. එහෙම කියන්න. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාවේ නිශ්ශබ්දව ඉන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
තවත් වතාවක් කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථිකයාගේ අවස්ථාව සම්බන්ධයෙන්,- *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔබතුමන්ලාගේ Prime Ministerත් ඒ විධියට. *[බාධා කිරීම්]* හැසිරීම අන්තිමයි. ඔබතුමන්ලාගේ කට්ටියගේ, ඔබතුමන්ලාගේ පක්ෂයේ කට්ටියගේ හැසිරීම අන්තිමයි.

1987-88 කාලයේ මිනී මැරුවේ ඔයගොල්ලෝ. අපි එහෙම මිනී මැරුවේ නැහැ; අපි එහෙම තමන්ගේ ජාතියේ අය මරපු කට්ටිය නොවෙයි. අපි රණ්ඩු වුණේ සිංහල මිනිස්සු එක්ක. ඒක ජාතීන් අතර ප්‍රශ්නයක්. ඒක ඇති කර ගත්තේත් ඔයගොල්ලන්. 1988දී ඔයගොල්ලන්ගේ ලොක්කා දුවගෙන ආවේ උතුරට, "අපිව බේරා ගන්න" කියලා. මතක නැද්ද? ඔයගොල්ලන්ගේ කට්ටිය බේරා ගන්න කියලා දුවගෙන ආවේ ප්‍රභාකරන් ළඟට. ඒක මතක තියා ගන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මම එකක් කියන්න කැමැතියි. බලන්න කෝ, දැන් කට වහගෙන ඉන්නවා නේ. මේ විධියටම කලිනුත් ඉන්න තිබුණා නේ. දැනුත් ඉන්න බැරි වෙලා තිබෙන්නේ. මම එකක් කියන්නම්. උතුරු පළාත් සභාවේ මන්ත්‍රීවරුන් 5දෙනෙකුව -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் நிறைவடைந்துவிட்டது.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තව පොඩි වෙලාවක් දෙන්න.

මේ අය මෙහෙම කථා කරනකොට අපි කථා කරන්නේ කොහොමද, Member of Parliament? ඔයගොල්ලන්ගේ කට්ටිය කොච්චර කරදර කළාද? මට තව තත්ත්පර 30ක් දෙන්න, මගේ කථාව ඉවර කරන්න. තත්ත්පර 30ක් දෙන්න. *[බාධා කිරීම්]* අනේ කට වහගෙන ඉන්නවා! *[බාධා කිරීම්]* මේ බලන්නකෝ. පළාත් සභාවට මේ මන්ත්‍රීවරුන් 5දෙනෙක් පත් කරලා තිබෙනවා, ඔයගොල්ලන්ගේ පක්ෂයෙන්. තුවාල 3කින් එක තුවාලයක් හොයලා fingerprint එකක් දෙන්න බැරි පුද්ගලයෙක් පළාත් සභාවට පත් කරලා. ඊයේ දැක්කා නේද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் நிறைவடைந்துவிட்டது.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම අවසන් කරනවා.

ඊයේ දැක්කා නේද? ඒ නිසා කරුණාකරලා මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියන්න, - 2029දී ආයෙත් එන්න බැරි වෙනවා. මේගොල්ලන්ට pension එකත් නැහැ. ගෙදර කන්නත් නැහැ. හොරා කාලා තියා ගන්න කියන්න. එතකොට 2029දී මොකක් හරි බිස්නස් එකක් කරලා බේරා ගන්න පුළුවන්.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.32]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය අද දින සභාව කල්තබන අවස්ථාවේ ඉතාම කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. අල්ලස, දූෂණය, වංචාව, හොරකම වැළැක්වීම තමයි මේ රටේ සෑම පුරවැසියෙකුගේම වුවමනාව. ඒ හරහා තමයි මේ රට පිරිසිදු රාජ්‍යයක් බවට පත් වෙන්නේ. ඒ ගැන විවාදයක් නැහැ. ඒ නිසා මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධව අපි ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙනවා.

ගරු මන්ත්‍රීතුමියනි, අර අපේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඔබතුමිය කලබල වෙලා. ඔබතුමියට විගහට ඔබතුමියන්ලාගේත් උරුමයක් කියන - ඔබතුමන්ලා 2024දී තමයි මේ රටේ රාජ්‍ය බලය ලබා ගත්තේ. 2024දීම තමයි අපේ රට දූෂණ සංජානන දර්ශකයට අනුව 121වැනි තැනට ගියේත්. එතැනින් තමයි රටවල් 14ක් අභිභවා 2025දී අපේ රට ඉස්සරහට ඇවිත් තිබෙන්නේ. හැබැයි, මීට කලින් යූඑන්පී එක ආණ්ඩු කරන කාලයේ අපේ රට එම දර්ශකයට අනුව 50ගණන්වල සිටියේ. ඊට පසුව පහළට වැටිලා යහපාලන ආණ්ඩුවේ අවසාන කාලයේ 89 වාගේ තැනකට ගියා. ඊට පසුව 2024දී 121වැනි තැනට -පහළට- ගිහිල්ලා එතැනින් නැවත 14ක් ඉස්සරහට ඇවිල්ලා. මේ කියන කාරණා අපිට බොහොම පැහැදිලියි. ඔබතුමියලා අපේ රට යම් කිසි මට්ටමකින් ඉස්සරහට ගෙනැල්ලා තිබෙනවා, වසරක් ඇතුළත. ගරු මන්ත්‍රීතුමිය, මේ දර්ශකය තුළ අපේ රට තවත් ඉස්සරහට ගෙනෙන්න පුළුවන්. අර කන්ටේනර්වලින් වුණු වංචාව පිළිබඳව, ඊළඟට ගල්අඟුරු වංචාව පිළිබඳව, අල-ලූනු ගෙන්වපු එක ගැන, ලූණු ගෙන්වනකොට වෙච්ච දේවල් ගැන, රිළා සංගණනය නිසා වෙච්ච පාඩුව ගැන සොයා බැලීමටත් ඔබතුමියන්ලාගේ කණ්ඩායමට යෝජනා කරන්න. මේ වාගේ වැලක් තිබෙනවා.

ඒ අතර ඊයේ පෙරේදා වුණු හොඳම දේ මොකක්ද දන්නවාද? පෙබරවාරි මාසයේ 02 වැනිදා Sri Lanka Telecom එකේ හොරකමක් සම්බන්ධයෙන් සුදර්ශන ගීගනගේ මහත්මයා සම්බන්ධව කටයුතු කරන්න යනකොට, ජ්‍යෙෂ්ඨ අළෙවි කළමනාකාර, කුමුදු අබේධීර මහතාගේ නිවසට පැනලා ඔහුගේ phone එක, laptop එක යනාදී සියල්ල බලහත්කාරයෙන් අරගෙන යනවා. පොලීසියේ පැමිණිල්ලක් දැම්මාම, පැමිණිල්ල භාර ගෙන තිබුණා. නමුත් අද වෙනකොට ඒ පිළිබඳව කථාවක් නැහැ. මේ කාරණයට අදාළ කට්ටිය රෝහල්ගත වෙලා. මේවා ඔබතුමන්ලාගේ කාල සීමාවේ සිද්ධ වෙන දේවල්. කරපු හොරකමක් සම්බන්ධව යම් කිසි පරීක්ෂණයක් කරගෙන යනකොට, ගෙවල්වලට බලහත්කාරයෙන් පැනලා, ඒ අයට ගහලා, බැණලා, එක එක දේවල් හොරකම් කරගෙන යනවා. මේ හොරකම් කර තිබෙන්නේ දත්ත. අනෙක් ප්‍රධාන කාරණය මේකයි. මොබිටෙල් වාගේ ආයතනයක දත්ත එළියට ගියාම, කොයි විධියටද එය බලපාන්නේ කියන කාරණය ගැනත් ඔබතුමන්ලා පොඩ්ඩක් සොයා බලන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තුවක කාලයක් තිබෙනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
දැන් ඔබතුමන්ලාගේ අලුත් පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ගේ, නගරාධිපතිවරුන්ගේ ක්‍රියා කලාපය ගැනත්, ඔවුන් කටයුතු කරන ආකාරය ගැනත් සොයා බැලුවා නම් මම

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

හිතන විධියට අපේ රටට හොඳ රටවල් අතරින් තවත් ඉස්සරහට එන්න පුළුවන්. අපේ රට හොඳම රටවල් කිහිපය අතරට එන එක තමයි මේ රටේ සෑම පුරවැසියෙකුගේම ප්‍රාර්ථනාව වන්නේ. ඒ තැනට අපේ රට ගෙනෙන්න. ඔබතුමිය කලබල වෙච්ච එක තමයි ප්‍රශ්නයකට තිබෙන්නේ. අපේ රට තව ඉස්සරහට ගෙනැල්ලා ඔබතුමියන්ලාගේ පැත්තේ - මට මේවා කියා ගෙන යන්න පුළුවන්. අමාත්‍යවරුන්ට එල්ල වෙලා තිබෙන චෝදනා, number plates සම්බන්ධ ටෙන්ඩර් එකේ වෙච්ච මගඩි වශයෙන් සිදුවීම් ගණනාවක් තිබෙනවා. මේවා ගැනත් සොයා බලන්න.

ඒ වාගේම, ඉන්ධන අවභාවිතය සම්බන්ධයෙන් චෝදනා එල්ල වෙලා තිබෙන ඇමතිවරුන් 4දෙනෙක් විතර ඉන්නවා. අපේ කථානායකතුමාටත් ඉන්ධන සම්බන්ධව චෝදනාවක් තිබෙනවා. එතුමාට නිවාස අවභාවිතය පිළිබඳ චෝදනා තිබෙනවා. මේවා ගැනත් මේ විධියටම වේගවත්ව කටයුතු කරගෙන ගියොත් තමයි හොඳ. මම හිතන විධියට පරණ දේවල් ගැන හොයනවා වාගේම නැවත - අලුතින් - එවැනි දේවල් සිදු නොවීමට වගබලා ගැනීමත් රජයේ වගකීමක්. මේ යෝජනාවේ ඒ ටිකත් ඇතුළත් වුණා නම් හොඳයි. ඔබතුමන්ලා පිරිසිදු - pure - හොඳ රාජ්‍ය පාලනයක් ගෙනියන කණ්ඩායමක් බවට පත් වුණොත්, අපේ රටට මේ index වලින් ඉස්සරහට ඇවිල්ලා හොඳ රටක් බවට පත් වෙන්න පුළුවන් වෙයි; දූෂණයෙන්, අල්ලසෙන්, වංචාවෙන්, හොරකමින් තොර රටක් බවට අපේ රට පත් කරගන්න පුළුවන් වෙයි.

මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව අපි ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙනවා. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන කණ්ඩායම විධියට, පසුපෙළ මන්ත්‍රීවරුන් විධියට ඔබතුමියන්ලාට ලොකු හැකියාවක් තිබෙනවා. අනෙක කාන්තාවන් විධියටත් ඔබතුමියන්ලාට ලොකු හැකියාවක් තිබෙනවා. ඒ නිසා මේ වාගේ දේවල්වලට අකමැති පිරිසක් විධියට ඔබතුමියන්ලාගේ කණ්ඩායමට බල කරන්න, "අපේ පක්ෂයටත්, අපේ ආණ්ඩුවටත් එල්ල වෙලා තිබෙන මේ චෝදනා ටිකෙන් ගැලවෙන්න නම්, මේවා පිළිබඳවත් වේගවත්ව පර්යේෂණ කරලා අපේ රට ඉදිරියට ගෙනෙන්න කටයුතු කරමු" කියලා. එම කටයුත්ත ගැන ඔබතුමියන්ලාගේ කණ්ඩායම සමඟ කථා කරලා විසඳා ගන්න කියන කාරණයත් මතක් කරමින්, මෙවැනි යෝජනාවක් ගෙන ඒම පිළිබඳව ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, පිළිතුරු කථාව, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය.

[අ.භා. 5.36]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි යෝජනාවක් ගෙන ඒම පිළිබඳව ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමියට මම ස්තුතිවන්ත වනවා. මෙම යෝජනාව වැදගත් වන්නේ, මේ තුළින් අපට එන ප්‍රතිචාරය මත අපි යන ගමනක යම් දිශානතියක් සලකුණු කිරීමක් වන නිසා. මෙය, අපි ඉදිරියට යන්නේ කොහොමද කියන එක ගැන එන දර්ශකයක් පමණයි. "අපි ඉලක්කයට ඇවිල්ලා තිබෙනවා, දැන් එය අවසානයි. දැන් අපේ වැඩේ ඉවරයි" කියලා ගරු මන්ත්‍රීතුමිය අදහස් කළාය කියලා මම කිසිසේත්ම හිතන්නේ නැහැ. ඒ අදහසින් නොවෙයි, එතුමිය යෝජනාව ගෙනාවේ. මේ තුළින් අපට ගන්න පුළුවන් පණිවුඩයක් තිබෙනවා. එම පණිවුඩය පිළිබඳව තමයි එතුමිය මෙතැන අවධාරණය කළේ. ඒ පිළිබඳව ගරු සභාවේ අවධානය ලබා ගැනීම පිළිබඳව මම එතුමියට ස්තුතිවන්ත වන අතර, ඉදිරියටත් අපි ගන්න ක්‍රියාමාර්ග පිළිබඳව මේ අවස්ථාවේ යම් පැහැදිලි කිරීමක් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාව 2024 වර්ෂයේදී දූෂණ සංජනන දර්ශකයේ 121 ස්ථානයේ පසු වූයේ ලකුණු 32ක් හිමි කර ගනිමිනි. ඒ අනුව 2024 වර්ෂයට සාපේක්ෂව ස්ථාන 14ක් පසුකරමින් ශ්‍රී ලංකාව 107වන ස්ථානයට පැමිණීම මගින් ශ්‍රී ලංකාව අල්ලස හා දූෂණය තුරන් කරමින් සුපිළිපන් රටක් කරා යන ගමනට ධනාත්මක අපේක්ෂාවක් එක් කර ඇත.

දූෂණ සංජනන දර්ශකය - Corruption Perceptions Index - සැකසීම ලොව පුරා රටවල් සහ පාලන ප්‍රදේශ 182ක රාජ්‍ය අංශයේ පවතින දූෂණය පිළිබඳව විශේෂඥ ඇගයීම් සහ ව්‍යාපාරිකයින් අතර සිදු කළ සමීක්ෂණ පදනම් කර ගනිමින් සිදු වේ. මෙම දර්ශකයේ ශ්‍රේණිගත කිරීම් සඳහා ලෝක බැංකුව, ලෝක ආර්ථික සමුළුව, පෞද්ගලික අවදානම් සහ උපදේශන සමාගම් සහ ප්‍රමුඛ පෙළේ විද්වත් මණ්ඩල ඇතුළු ස්වාධීන බාහිර මූලාශ්‍ර 13ක දත්ත උපයෝගී කර ගනී.

2025 දූෂණ සංජනන දර්ශකයෙන් සමස්තයක් ලෙස ගෝලීය මට්ටමින් දූෂණය ඉහළ ගොස් ඇති බවට සංජනනයක් සහ ආණ්ඩුකරණ ප්‍රමිතීන්හි පහත වැටීමක් නිරීක්ෂණය වන තත්ත්වයක් තුළ ශ්‍රී ලංකාව ලබා ගත් මෙම තත්ත්වය සුවිශේෂී ජයග්‍රහණයකි. Overall, corruption has risen and governance has deteriorated globally. එවැනි තත්ත්වයක් තුළ තමයි ලංකාවේ මේ ප්‍රගතිය අපට පෙන්නුම් කරන්න පුළුවන් වෙන්නේ. එහිදී බොහෝ රටවල් රාජ්‍ය ආරක්ෂාව යන නාමය යටතේ බලය මධ්‍යගත කරමින්, විනිවිදභාවය සහ වගවීම දුර්වල කර ඇති බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය දක්වයි. ශ්‍රී ලංකාව මෙම දර්ශකය තුළ ලබා ගත් වර්ධනය මෑතක සිදු කරන ලද ව්‍යවස්ථාදායක හා ආයතනික ප්‍රතිසංස්කරණ සඳහා ගන්නා ලද ප්‍රයත්න හේතුවෙන් සහ විශේෂඥයන් හා ව්‍යාපාරික පාර්ශ්වකරුවන් දූෂණය පිළිබඳ දරන ලද සංජානනය වෙනස්වීම හේතුවෙන් සිදු වූ බව නිරීක්ෂණය කළ හැක. ඊට 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත මෙන්ම 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත නීතිගත කිරීම සහ නීතිය ක්‍රියාවට නැංවීම උදෙසා වන පියවර ශක්තිමත් කිරීම යන කාරණා අන්තර්ගතය.

මෙම සුවිශේෂී තත්ත්වය අත් කර ගැනීම පිළිබඳව බලපෑ හැකි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මගින් සිදු කළ මෑත කාලීන ක්‍රියාකාරකම් කිහිපයක් පහත පරිදි පෙළගැස්විය හැක.

- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තුළ විශේෂ විමර්ශන අංශයක් ස්ථාපිත කිරීම තුළින් විශේෂ අවධානය යොමු කළ යුතු ජාතික ආර්ථිකයට සංවේදී සිදුවීම් සම්බන්ධ විමර්ශන වේගවත් සහ කාර්යක්ෂම කිරීමට හැකිවීම.
- අවශ්‍යතාව පරිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව විමර්ශන සිදු කිරීම.

- 2023 අංක 9 දර දූෂණ විරෝධී පනත යටතේ කොමිෂන් සභාවේ විෂය පථයට එක් කරන ලද මුදල් විශුද්ධිකරණ චෝදනා පිළිබඳව කොමිෂන් සභාව තුළ වෙනම ඒකකයක් ස්ථාපනය කර අදාළ විමර්ශන සිදු කිරීම මෙන්ම, මේ වන විට මුදල් විශුද්ධිකරණය පිළිබඳ නඩු 12ක් පමණ පැවරීමට කටයුතු කර තිබීම. සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා වෙනම ඒකකයක් ස්ථාපිත කර එම කටයුතු ආරම්භ කිරීම.
- දූෂණ විරෝධී පනත යටතේ පැවරී ඇති ප්‍රතිපාදන මත පැවති පහසුකම් යටතේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් ඇතුළු වත්කම් සහ බැරකම් ප්‍රකාශ සිදු කළ යුතු පුද්ගලයන්ගේ අදාළ ප්‍රකාශයන්හි සංස්කරණය කරන ලද පිටපත් - පනතේ ප්‍රතිපාදන අනුව - කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කිරීමට කටයුතු කිරීම.
- වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ මධ්‍යම අධිකාරිය ලෙස කොමිෂන් සභාව විසින් වත්කම් සහ බැරකම් ප්‍රකාශ කළ යුතු තැනැත්තන්හට මාර්ගගතව අදාළ ප්‍රකාශ සිදු කිරීමට අවස්ථාව සලසා දෙමින් මාර්ගගත පද්ධතියක් - electronic Assets Declaration system එකක් - ආරම්භ කිරීමේ සියලු මූලික කටයුතු මේ වන විට අවසන් කිරීම.
- කොමිෂන් සභාවට යොමු වන පැමිණිලි සම්බන්ධව මාර්ගගත පද්ධතියක් ආරම්භ කිරීමට කටයුතු කිරීම.
- "දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025-2029" මඟින් දිවයින පුරා ආයතන වෙත පැවරී ඇති වගකීම් සහ ඒවායේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම මෙන්ම රාජ්‍ය ආයතන තුළ පිහිටුවන ලද අභ්‍යන්තර කටයුතු ඒකකවල ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කරමින් ශ්‍රී ලංකාව තුළ දූෂණය අවම කිරීම උදෙසා අවශ්‍ය අධීක්ෂණ කටයුතු සිදු කිරීම.
- මේ වන විට කොමිෂන් සභාවේ සිටින සීමිත නිලධාරින් යොදවා ගනිමින් දිවයින පුරා දූෂණ නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන - UNDP - සමඟ ඒකාබද්ධව දිවයින පුරා පළාත් පාලන ආයතන සඳහා 2025 වර්ෂයේදී පත් වූ සභිකයින් 8,000කට වැඩි පිරිසක් ඉලක්කගත කරමින් දූෂණ නිවාරණ වැඩසටහන් මාලාවක් පැවැත්වීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ ඇති කරගනු ලැබූ අවබෝධතා ගිවිසුම යටතේ විශ්වවිද්‍යාලවල ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලාවල විෂය නිර්දේශයන්ට දූෂණ නිවාරණය පිළිබඳ විෂය කරුණු ඇතුළත් කිරීමට කටයුතු කිරීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන වැදගත් වන්නේ දූෂණ විරෝධී ක්‍රියාවලිය, ඒ කියන්නේ corruption eradication වෙනුවෙන් ආයතන ශක්තිමත් කිරීම, සමාජයේ ඒ පිළිබඳ මතය තහවුරු කිරීම, ඒ වෙනුවෙන් මානව සම්පත ශක්තිමත් කිරීම. මෙවැනි වැඩ පිළිවෙළක් යටතේ තමයි අපි මේ ප්‍රගතිය ලබාගෙන ඇවිල්ලා තිබෙන්නේ. ඒක තමයි මෙතැන වැදගත් වන්නේ. එහෙම නැතිව මේක ඉබේ සිද්ධ වන දෙයක් නොවෙයි. මම හිතන්නේ මෙතැන පෙන්නුම් කරන්නේ මේ ආණ්ඩුව විසින් මේක කොච්චර බැරෑරුම් ලෙස භාර ගන්නවාද කියන එකයි. මේක දූෂණ විරෝධී ක්‍රියාවලිය අපේ රටේ සංස්කෘතියක් බවට පත් කිරීමට ගන්නා උත්සාහයක්.

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ සුවිශාල රාජකාරි වපසරියක් සහිතව ඇති කළ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, පෙර කොමිෂන් සභාව තුළ පැවති සීමිත මානව සහ භෞතික පහසුකම් යටතේ ඉහත තත්ත්වයන් අත් කරගෙන ඇත. විශේෂයෙන් අධිකරණයන්හි නඩු මෙහෙයවීම සහ දූෂණ නිවාරණය ඇතුළු සියලු කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කිරීම උදෙසා දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් තීරණය කළ කාර්ය මණ්ඩලය සඳහා පනතේ 26(2) වගන්තියට අනුව මෙම පාර්ලිමේන්තුව විසින් පාරිශ්‍රමික අනුමත කර දිය යුතුව ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පසු නොබෝ දිනකින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත එම පාරිශ්‍රමික යෝජනාවලිය මෙම සභාවේ සියලුම නියෝජිතයන්ගේ අනුමැතියෙන් සම්මත කර දීම තුළින් ශ්‍රී ලංකාව තුළ දූෂණය පිටුදැකීම උදෙසා අපගේ කැපවීම පෙන්නුම් කළ හැකි වනු ඇත.

අද මෙතැන කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට එතකොටත් අවස්ථාවක් එනවා, මේ ක්‍රියාවලියට සම්බන්ධ වෙලා මේ ක්‍රියාවලිය ශක්තිමත් කරන්න සහභාගි වෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.45ට, 2026 පෙබරවාරි 19වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.45க்கு, பாராளுமன்றம் 2026 பெப்ருவரி 19, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.45 p.m. until 9.30 a.m. on Thursday, 19th February, 2026.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

### 1970-2025 දක්වා වාර්තා වූ මනුෂ්‍ය ඝාතන සහ ස්ත්‍රී දූෂණ: විස්තර
### 1970-2025 வரை இடம்பெற்ற ஆட்கொலைகள் மற்றும் பாலியல் வன்புணர்வுச் சம்பவங்கள்: விபரம்
### HOMICIDES AND RAPE CASES REPORTED DURING 1970-2025: DETAILS

1845/2026

**1.ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 1970 සිට 2025 දක්වා එක් එක් වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ සිදුවී ඇති මනුෂ්‍ය ඝාතන සංඛ්‍යාව;

(ii) එම කාලය තුළ සිදුවී ඇති ස්ත්‍රී දූෂණ සිද්ධීන් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1970 தொடக்கம் 2025 வரையிலான ஒவ்வோர் ஆண்டிலும் இலங்கையில் இடம்பெற்றுள்ள ஆட்கொலைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி காலப்பகுதியினுள் இடம்பெற்றுள்ள பாலியல் வன்புணர்வுச் சம்பவங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

ஆண்டு வாரியாக வெவ்வேறாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) the number of homicides reported in Sri Lanka from 1970 to 2025; and

(ii) the number of rape cases reported during the said period;

for each year, separately?

(b) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

(අ) (i) පහත දැක්වෙන වගුවේ (ii) තීරුව මඟින් දක්වා ඇත.

(ii) පහත දැක්වෙන වගුවේ (iii) තීරුව මඟින් දක්වා ඇත.

| වර්ෂය **(i)** | මනුෂ්‍ය ඝාතන සංඛ්‍යාව **(ii)** | ස්ත්‍රී දූෂණ සංඛ්‍යාව **(iii)** |
|---|---|---|
| 1970 | 845 | 166 |
| 1971 | 1,194 | 140 |
| 1972 | * | * |
| 1973 | 1,028 | 2,011 |
| 1974 | 960 | 191 |
| 1975 | 969 | 238 |
| 1976 | 990 | 244 |
| 1977 | 1,261 | 284 |
| 1978 | 1,088 | 383 |
| 1979 | 911 | 275 |
| 1980 | 893 | 229 |
| 1981 | 1,020 | 262 |
| 1982 | 1,089 | 267 |
| 1983 | 1,426 | 241 |
| 1984 | 1,449 | 277 |
| 1985 | 1,693 | 294 |
| 1986 | 1,672 | 274 |
| 1987 | 1,997 | 277 |
| 1988 | 4,173 | 291 |
| 1989 | 8,127 | 373 |
| 1990 | 1,985 | 369 |
| 1991 | 1,561 | 374 |
| 1992 | 1,423 | 371 |
| 1993 | 1,286 | 386 |
| 1994 | 1,336 | 518 |
| 1995 | 1,614 | 542 |
| 1996 | 1,775 | 716 |
| 1997 | 1,851 | 909 |
| 1998 | 1,919 | 1,076 |
| 1999 | 1,801 | 1,309 |
| 2000 | 1,711 | 1,202 |
| 2001 | 1,576 | 1,283 |
| 2002 | 1,347 | 1,247 |
| 2003 | 1,310 | 1,371 |
| 2004 | 1,377 | 1,432 |
| 2005 | 1,221 | 1,540 |
| 2006 | 2,045 | 1,463 |
| 2007 | 1,663 | 1,397 |
| 2008 | 1,488 | 1,582 |
| 2009 | 958 | 1,624 |
| 2010 | 745 | 1,854 |
| 2011 | 707 | 1,870 |
| 2012 | 646 | 2,212 |
| 2013 | 586 | 2,181 |
| 2014 | 548 | 2,008 |
| 2015 | 476 | 2,033 |
| 2016 | 502 | 2,036 |

| | | |
|---|---|---|
| 2017 | 452 | 1,732 |
| 2018 | 489 | 1,792 |
| 2019 | 479 | 1,779 |
| 2020 | 464 | 1,953 |
| 2021 | 521 | 1,977 |
| 2022 | 559 | 1,986 |
| 2023 | 573 | 1,925 |
| 2024 | 555 | 2,019 |
| 2025 | 536 | 1,959 |

* දිවයින තුළ පැවති නොසන්සුන්කාරී වාතාවරණය හේතුවෙන් 1972 වර්ෂයේ දත්ත වාර්තා ලේඛනගතව නොමැත.

(ආ) පැන නොනඟී.

(அ) (i) கீழ்க் காணப்படும் அட்டவணையின் (ii)ஆம் நிரலில் குறிப்பிடப்பட்டுள்ளது.

(ii) கீழ்க் காணப்படும் அட்டவணையின் (iii)ஆம் நிரலில் குறிப்பிடப்பட்டுள்ளது.

| வருடம் (i) | ஆட்கொலைகளின் எண்ணிக்கை (ii) | பாலியல் வன்புணர்வு எண்ணிக்கை (iii) |
|---|---|---|
| 1970 | 845 | 166 |
| 1971 | 1194 | 140 |
| 1972 | * | * |
| 1973 | 1028 | 2011 |
| 1974 | 960 | 191 |
| 1975 | 969 | 238 |
| 1976 | 990 | 244 |
| 1977 | 1261 | 284 |
| 1978 | 1088 | 383 |
| 1979 | 911 | 275 |
| 1980 | 893 | 229 |
| 1981 | 1020 | 262 |
| 1982 | 1089 | 267 |
| 1983 | 1426 | 241 |
| 1984 | 1449 | 277 |
| 1985 | 1693 | 294 |
| 1986 | 1672 | 274 |
| 1987 | 1997 | 277 |
| 1988 | 4173 | 291 |
| 1989 | 8127 | 373 |
| 1990 | 1985 | 369 |
| 1991 | 1561 | 374 |
| 1992 | 1423 | 371 |
| 1993 | 1286 | 386 |
| 1994 | 1336 | 518 |
| 1995 | 1614 | 542 |
| 1996 | 1775 | 716 |
| 1997 | 1851 | 909 |
| 1998 | 1919 | 1076 |
| 1999 | 1801 | 1309 |
| 2000 | 1711 | 1202 |
| 2001 | 1576 | 1283 |
| 2002 | 1347 | 1247 |
| 2003 | 1310 | 1371 |
| 2004 | 1377 | 1432 |
| 2005 | 1221 | 1540 |
| 2006 | 2045 | 1463 |
| 2007 | 1663 | 1397 |
| 2008 | 1488 | 1582 |
| 2009 | 958 | 1624 |
| 2010 | 745 | 1854 |
| 2011 | 707 | 1870 |
| 2012 | 646 | 2212 |
| 2013 | 586 | 2181 |
| 2014 | 548 | 2008 |
| 2015 | 476 | 2033 |
| 2016 | 502 | 2036 |
| 2017 | 452 | 1732 |
| 2018 | 489 | 1792 |
| 2019 | 479 | 1779 |
| 2020 | 464 | 1953 |
| 2021 | 521 | 1977 |
| 2022 | 559 | 1986 |
| 2023 | 573 | 1925 |
| 2024 | 555 | 2019 |
| 2025 | 536 | 1959 |

[ගරු ආනන්ද විජේපාල මහතා]

* தீவில் நிலவிய கொந்தளிப்பான சூழ்நிலை காரணமாக, 1972ஆம் ஆண்டிற்கான தரவுப் பதிவுகள் ஆவணப்படுத்தப்படவில்லை.

(ஆ) ஏற்புடையதல்ல.

(a) (i) Indicated in column (ii) of the table below.

(ii) Indicated in column (iii) of the table below.

| Year (i) | No. of Homicides (ii) | No. of Rape Cases (iii) |
|---|---|---|
| 1970 | 845 | 166 |
| 1971 | 1194 | 140 |
| 1972 | * | * |
| 1973 | 1028 | 2011 |
| 1974 | 960 | 191 |
| 1975 | 969 | 238 |
| 1976 | 990 | 244 |
| 1977 | 1261 | 284 |
| 1978 | 1088 | 383 |
| 1979 | 911 | 275 |
| 1980 | 893 | 229 |
| 1981 | 1020 | 262 |
| 1982 | 1089 | 267 |
| 1983 | 1426 | 241 |
| 1984 | 1449 | 277 |
| 1985 | 1693 | 294 |
| 1986 | 1672 | 274 |
| 1987 | 1997 | 277 |
| 1988 | 4173 | 291 |
| 1989 | 8127 | 373 |
| 1990 | 1985 | 369 |
| 1991 | 1561 | 374 |
| 1992 | 1423 | 371 |
| 1993 | 1286 | 386 |
| 1994 | 1336 | 518 |
| 1995 | 1614 | 542 |
| 1996 | 1775 | 716 |
| 1997 | 1851 | 909 |
| 1998 | 1919 | 1076 |
| 1999 | 1801 | 1309 |
| 2000 | 1711 | 1202 |
| 2001 | 1576 | 1283 |
| 2002 | 1347 | 1247 |
| 2003 | 1310 | 1371 |
| 2004 | 1377 | 1432 |
| 2005 | 1221 | 1540 |
| 2006 | 2045 | 1463 |
| 2007 | 1663 | 1397 |
| 2008 | 1488 | 1582 |
| 2009 | 958 | 1624 |
| 2010 | 745 | 1854 |
| 2011 | 707 | 1870 |
| 2012 | 646 | 2212 |
| 2013 | 586 | 2181 |
| 2014 | 548 | 2008 |
| 2015 | 476 | 2033 |
| 2016 | 502 | 2036 |
| 2017 | 452 | 1732 |
| 2018 | 489 | 1792 |
| 2019 | 479 | 1779 |
| 2020 | 464 | 1953 |
| 2021 | 521 | 1977 |
| 2022 | 559 | 1986 |
| 2023 | 573 | 1925 |
| 2024 | 555 | 2019 |
| 2025 | 536 | 1959 |

* Due to the turbulent situation prevailing in the Island, data records for the year 1972 had not been documented.

(b) Does not arise.

## කතරගම දේවාලය සතු ස්වර්ණාභරණ සහ රන් භාණ්ඩ: විස්තර

## கதிர்காமத் தேவாலயத்திற்குச் சொந்தமான தங்க நகைகள் மற்றும் தங்கப் பொருட்கள்: விபரம்

## JEWELLERY AND GOLD ITEMS IN CUSTODY OF KATARAGAMA DEWALAYA: DETAILS

1846/2026

**2.ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කතරගම දේවාලය සතු ස්වර්ණාභරණ සහ අනෙකුත් රන් භාණ්ඩවල සම්පූර්ණ රත්තරන් බර

කොපමණද;

(ii) එම ස්වර්ණාභරණ සම්පූර්ණයෙන් හෝ කොටසක් විකුණා එම මුදල් රජයට භාර දීමට යෝජනාවක් ඉදිරිපත් වී තිබේද;

(iii) එසේ නම්, එම රන් භාණ්ඩ වෙන්දේසිය තෙක් ආරක්ෂිතව තබා ගැනීම සඳහා ගෙන ඇති පියවර මොනවාද;

(iv) එම රන් භාණ්ඩ විකිණීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂා කරන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்த சாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கதிர்காமத் தேவாலயத்திற்குச் சொந்தமான தங்க நகைகள் மற்றும் ஏனைய தங்கப் பொருட்களின் மொத்த நிறை யாது என்பதையும்;

(ii) மேற்படி அனைத்துத் தங்க நகைகளையும் அல்லது ஒரு பகுதியை விற்பனை செய்து கிடைக்கப் பெறும் நிதியை அரசாங்கத்திடம் கையளிப்பதற்கான யோசனையொன்று முன்வைக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) அவ்வாறெனில், மேற்படி தங்கப் பொருட்களை ஏலத்தில் விற்பனை செய்யும்வரை அவற்றைப் பாதுகாப்பாக வைத்துக் கொள்வதற்காக மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி தங்கப் பொருட்களை விற்பனை செய்யும்பொருட்டுப் பின்பற்ற உத்தேசித்துள்ள வழிமுறை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) the aggregate weight of jewellery and other gold items currently in the custody of the Kataragama Dewalaya;

(ii) whether a proposal has been made to sell all or part of the jewellery and remit the proceeds to the Government;

(iii) if so, the measures taken to ensure the security of the gold items until an auction is conducted; and

(iv) the method proposed to be followed for the sale of the gold items?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)

(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

(අ) (i) බැතිමතුන් විසින් පූජා කර ඇති ස්වර්ණාභරණ හා අනෙකුත් රන් භාණ්ඩවල සම්පූර්ණ රත්තරන් බර ග්‍රෑම් 3,201ක් වේ. (මෙම රන් භාණ්ඩ බැතිමතුන් විසින් රුහුණු මහා කතරගම දේවාලයට පූජා කරන ලද සහ පඬුරු පෙට්ටිවලට බහාලන ලදුව, මුදල් ඉවත් කිරීමේදී රන් භාණ්ඩ බවට හඳුනාගෙන ලේඛනගත කරන ලද භාණ්ඩ වේ.)

(ii) ඔව්, රුහුණු මහා කතරගම දේවාලයේ බස්නායක නිලමේවරයා විසින් එවැනි ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති නමුත් මෙතෙක් ඒ සඳහා අනුමැතිය ලබා දී නොමැත.

(iii) රන් භාණ්ඩ වෙන්දේසි කිරීමට මෙතෙක් තීරණයක් ගෙන නොමැත. රන් භාණ්ඩ ආරක්ෂා කර ගැනීම සඳහා දැනට පවත්වාගෙන යන සාමාන්‍ය ක්‍රමවේදය අනුව රන් භාණ්ඩවලින් කොටසක් ලංකා බැංකුව කතරගම ශාඛාවේ ආරක්ෂිත සේප්පු අංක 55හි තැන්පත් කර ඇති අතර ඉතිරි රන් භාණ්ඩ දේවාල කාර්යාලයේ ආරක්ෂිත සේප්පුවේ තැන්පත් කර ඇත.

(iv) මේ වන විට එබඳු තීරණයක් ගෙන නොමැත.

(ආ) අදාළ නොවේ.

(அ) (i) பக்தர்கள் காணிக்கையாக வழங்கியுள்ள தங்க ஆபரணங்கள் மற்றும் ஏனைய தங்கப் பொருட் களின் மொத்தத் தங்க நிறை 3,201 கிராம் ஆகும்.

(மேற்படி தங்கப் பொருட்கள் பக்தர்களினால் ருஹுணு மகா கதிர்காமம் தேவாலயத்திற்குக் காணிக்கையாக வழங்கப்பட்டுள்ள மற்றும் உண்டியல் பெட்டிகளில் இடப்பட்டுள்ள பணத்தை அகற்றும்போது தங்கப் பொருட்களாக இனங்காணப்பட்டுப் பதிவு செய்யப்பட்டுள்ள பொருட்களாகும்.)

(ii) ஆம், ருஹுணு மகா கதிர்காமம் தேவாலயத்தின் பஸ்நாயக்க நிலமேயினால் அவ்வாறான கோரிக்கை சமர்ப்பிக்கப்பட்டுள்ளபோதிலும் இதுவரை அதற்கு அங்கீகாரம் வழங்கப் படவில்லை.

(iii) தங்கப் பொருட்களை ஏலத்தில் விற்பனை செய்வதற்கு இதுவரை தீர்மானம் மேற்கொள்ளப் படவில்லை. தங்கப் பொருட்களைப் பாதுகாத் துக்கொள்வதற்காக ஏற்கெனவே பேணிவரப் படுகின்ற வழமையான முறையியலுக்கு அமைய தங்கப் பொருட்களில் ஒரு பகுதி இலங்கை வங்கியின் கதிர்காமம் கிளையில் பாதுகாப்பு லொக்கர் இலக்கம் 55இல் வைப்புச் செய்யப் பட்டுள்ளதுடன், எஞ்சிய தங்கப் பொருட்கள் தேவாலயத்தின் அலுவலகத்தில் பாதுகாப்பு லொக்கரில் வைப்புச் செய்யப்பட்டுள்ளன.

(iv) இதுவரை அவ்வாறான தீர்மானம் மேற்கெள்ளப்படவில்லை.

(ஆ) ஏற்புடையதன்று

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

(a) (i) The total gold weight of the jewellery and other gold articles that had been offered by the devotees is 3,201 grams.

(These are gold items that had been offered by the devotees to the Ruhunu Maha Kataragama Dewalaya and those that had been placed in tribute boxes and identified as gold items during the removal of money and had been included in documents.)

(ii) Yes, the Basnayake Nilame of Ruhunu Maha Kataragama Dewalaya has submitted such a request, but no approval has been given for that till now.

(iii) No decision has been taken to auction the gold items yet. According to the normal procedure for protecting gold items, part of the gold items had been deposited in safe No. 55 of the Kataragama Branch of Bank of Ceylon and the rest of the gold items had been deposited in the safe at the Office of the Dewalaya.

(iv) No such decision has been taken till now.

(b) Not relevant.

## 2015-2025 දක්වා CIABOC වෙත මුදා හැර ඇති පොලිස් නිලධාරින්: විස්තර
## 2015 - 2025 வரை CIABOCக்கு விடுவிக்கப்பட்ட பொலிஸ் உத்தியோகத்தர்கள்: விபரம்
## POLICE OFFICERS RELEASED TO CIABOC DURING 2015-2025: DETAILS

1847/2026

**3. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) වර්ෂ 2015 සිට 2025 දක්වා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා ශ්‍රී ලංකා පොලිසිය විසින් මුදා හැර ඇති පොලිස් නිලධාරින් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2026 වර්ෂය සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඉල්ලා ඇති පොලිස් නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අනුව දැනට මුදා හැර ඇති පොලිස් නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(iii) කොමිෂන් සභාවේ කටයුතු සඳහා පරීක්ෂණ නිලධාරින්ගේ හිඟයක් පවතින බව දන්නේද;

(iv) එසේ නම්, එම හිඟය පියවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2015 தொடக்கம் 2025ஆம் ஆண்டுவரை இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவிற்காக இலங்கை பொலிஸ் விடுவித்துள்ள பொலிஸ் உத்தியோகத் தர்களின் எண்ணிக்கையை ஆண்டுவாரியாக வெவ்வேறாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2026ஆம் ஆண்டிற்காக இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவினால் கோரப் பட்டுள்ள பொலிஸ் உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அதற்கமைய தற்போது விடுவிக்கப்பட்டுள்ள பொலிஸ் உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) ஆணைக்குழுவின் பணிகளுக்கான புலனாய்வு உத்தியோகத்தர்களுக்கான பற்றாக்குறை நிலவுவதை அறிவாரா என்பதையும்;

(iv) ஆமெனில், அப்பற்றாக்குறையை நிவர்த்தி செய்வதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs :

(a) Will he inform this House of the number of police officers released by the Sri Lanka Police to the Commission to Investigate Allegations of Bribery or Corruption in each year from 2015 to 2025, separately?

(b) Will he also inform this House -

(i) the number of police officers requested by the Commission to Investigate Allegations of Bribery or Corruption for the year 2026;

(ii) the number of police officers released to the Commission thus far, accordingly;

(iii) whether he is aware that there is a shortage of investigation officers required to execute functions of the Commission; and

(iv) if so, the steps that are being taken to address the said shortage?

(c) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

(අ)

| අනු අංකය | නිලය | වර්ෂය | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| 01 | ජ්‍යෙ.පො.අ. | - | 1 | 1 | 1 | - | - | 1 | 1 | 1 | 1 | 1 |
| 02 | කා.ජ්‍යෙ.පො.අ. | - | - | - | - | 1 | - | - | - | - | - | - |
| 03 | පො.අ. | - | 1 | - | 1 | 1 | - | - | - | - | - | - |
| 04 | කා.පො.අ. | - | - | 1 | 1 | - | - | - | - | - | - | - |
| 05 | ස.පො.අ. | - | 1 | 3 | 2 | 2 | 1 | 4 | 4 | 3 | 3 | 5 |
| 06 | කා.ස.පො.අ. | - | 1 | - | - | - | - | - | - | - | - | - |
| 07 | ප්‍ර.පො.ප. | 11 | 12 | 5 | 5 | 4 | 13 | 10 | 11 | 10 | 9 | 7 |
| 08 | පො.ප. | 12 | 12 | 12 | 12 | 19 | 14 | 15 | 15 | 16 | 13 | 17 |
| 09 | කා.පො.ප. | - | - | - | - | - | 1 | - | - | 1 | 1 | 1 |
| 10 | උ.පො.ප. | 23 | 23 | 23 | 23 | 33 | 32 | 33 | 32 | 35 | 29 | 27 |
| 11 | කා.උ.පො.ප. | 1 | 2 | 2 | 2 | 4 | 7 | 8 | 6 | 13 | 12 | 10 |
| 12 | උ.පො.ප./ප්‍රවාහන | 1 | 1 | 1 | 1 | 1 | 1 | - | - | - | - | - |
| 13 | පො.සැ. | 50 | 50 | 43 | 43 | 41 | 41 | 56 | 70 | 67 | 70 | 84 |
| 14 | කා.පො.සැ. | 10 | 9 | 11 | 11 | 9 | 9 | 13 | 15 | 13 | 12 | 10 |
| 15 | පො.කො. | 54 | 51 | 63 | 63 | 53 | 43 | 49 | 48 | 41 | 41 | 58 |
| 16 | කා.පො.කො. | 29 | 29 | 17 | 17 | 22 | 19 | 21 | 15 | 17 | 17 | 16 |
| 17 | පො.සැ.රි. | 1 | 1 | 2 | 2 | 2 | 2 | 3 | 3 | 4 | 4 | 4 |
| 18 | පො.කො.රි. | 6 | 6 | 5 | 5 | 6 | 4 | 3 | 3 | 5 | 5 | 6 |
| **එකතුව** | | **198** | **200** | **189** | **189** | **198** | **187** | **216** | **223** | **226** | **217** | **246** |

(ආ) (i) නිලධරයන් 05කි.

- පොලිස් පරීක්ෂක - 01
- උප පොලිස් පරීක්ෂක - 03
- කාන්තා උප පොලිස් පරීක්ෂක - 01

(ii) ❖ 2026.01.14 - නිලධරයන් 03යි.

- පොලිස් පරීක්ෂක - 01
- උප පොලිස් පරීක්ෂක - 02

❖ 2026.01.30 - නිලධරයන් 01යි.

- කාන්තා උප පොලිස් පරීක්ෂක - 01

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

(அ) (i)

| தொ.இல. | தரம் | வருடம் | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| 01 | சி.பொ.அ. | - | 1 | 1 | 1 | - | - | 1 | 1 | 1 | 1 | 1 |
| 02 | பெ.சி.பொ.அ. | - | - | - | - | 1 | - | - | - | - | - | - |
| 03 | பொ.அ. | - | 1 | - | 1 | 1 | - | - | - | - | - | - |
| 04 | பெ.பொ.அ. | - | - | 1 | 1 | - | - | - | - | - | - | - |
| 05 | உ.பொ.அ. | - | 1 | 3 | 2 | 2 | 1 | 4 | 4 | 3 | 3 | 5 |
| 06 | பெ.உ.பொ.அ. | - | 1 | - | - | - | - | - | - | - | - | - |
| 07 | பி.பொ.ப. | 11 | 12 | 5 | 5 | 4 | 13 | 10 | 11 | 10 | 9 | 7 |
| 08 | பொ.ப. | 12 | 12 | 12 | 12 | 19 | 14 | 15 | 15 | 16 | 13 | 17 |
| 09 | பெ.பொ.ப. | - | - | - | - | - | 1 | - | - | 1 | 1 | 1 |
| 10 | உ.பொ.ப. | 23 | 23 | 23 | 23 | 33 | 32 | 33 | 32 | 35 | 29 | 27 |
| 11 | பெ.உ.பொ.ப. | 1 | 2 | 2 | 2 | 4 | 7 | 8 | 6 | 13 | 12 | 10 |
| 12 | உ.பொ.ப./ போக்குவரத்து | 1 | 1 | 1 | 1 | 1 | 1 | - | - | - | - | - |
| 13 | பொ.சா. | 50 | 50 | 43 | 43 | 41 | 41 | 56 | 70 | 67 | 70 | 84 |
| 14 | பெ.பொ.சா. | 10 | 9 | 11 | 11 | 9 | 9 | 13 | 15 | 13 | 12 | 10 |
| 15 | பொ.கா. | 54 | 51 | 63 | 63 | 53 | 43 | 49 | 48 | 41 | 41 | 58 |
| 16 | பெ.பொ.கா. | 29 | 29 | 17 | 17 | 22 | 19 | 21 | 15 | 17 | 17 | 16 |
| 17 | பொ.சா./சாரதி | 1 | 1 | 2 | 2 | 2 | 2 | 3 | 3 | 4 | 4 | 4 |
| 18 | பொ.கா./சாரதி | 6 | 6 | 5 | 5 | 6 | 4 | 3 | 3 | 5 | 5 | 6 |
| **மொத்தம்** | | **198** | **200** | **189** | **189** | **198** | **187** | **216** | **223** | **226** | **217** | **246** |

[ගරු ආනන්ද විජේපාල මහතා]

(ஆ) (i) அதிகாரிகள் 05 பேரில் :

- பொலிஸ் பரிசோதகர் - 01
- உப பொலிஸ் பரிசோதகர் - 03
- பெண் உப பொலிஸ் பரிசோதகர் - 01

(ii) 2026.01.14 - அதிகாரிகள் 03 பேரில் :

- பொலிஸ் பரிசோதகர் - 01
- உப பொலிஸ் பரிசோதகர் - 02

2026.01.30 - அதிகாரி 01பேரில்:

- பெண் உப பொலிஸ் பரிசோதகர் - 01

(iii) ஏற்புடையதன்று.

(iv) ஏற்புடையதன்று.

(இ) கேள்வி எழாது.

(b) (i) 05 officers.

- Inspector of Police - 01
- Sub-Inspector of Police - 03
- Woman Sub-Inspector of Police - 01

(ii) 14.01.2026 - 03 officers

- Inspector of Police - 01
- Sub-Inspector of Police - 02

30.01.2026 - 01 officer

- Woman Sub-Inspector of Police - 01

(iii) Not applicable.

(iv) Not applicable.

(c) Does not arise.

(a)

| Serial No. | Rank | Year | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| 01 | SSP | - | 1 | 1 | 1 | - | - | 1 | 1 | 1 | 1 | 1 |
| 02 | WSSP | - | - | - | - | 1 | - | - | - | - | - | - |
| 03 | SP | - | 1 | - | 1 | 1 | - | - | - | - | - | - |
| 04 | WSP | - | - | 1 | 1 | - | - | - | - | - | - | - |
| 05 | ASP | - | 1 | 3 | 2 | 2 | 1 | 4 | 4 | 3 | 3 | 5 |
| 06 | WASP | - | 1 | - | - | - | - | - | - | - | - | - |
| 07 | CI | 11 | 12 | 5 | 5 | 4 | 13 | 10 | 11 | 10 | 9 | 7 |
| 08 | IP | 12 | 12 | 12 | 12 | 19 | 14 | 15 | 15 | 16 | 13 | 17 |
| 09 | WIP | - | - | - | - | - | 1 | - | - | 1 | 1 | 1 |
| 10 | SI | 23 | 23 | 23 | 23 | 33 | 32 | 33 | 32 | 35 | 29 | 27 |
| 11 | WSI | 1 | 2 | 2 | 2 | 4 | 7 | 8 | 6 | 13 | 12 | 10 |
| 12 | SI/Transport | 1 | 1 | 1 | 1 | 1 | 1 | - | - | - | - | - |
| 13 | PS | 50 | 50 | 43 | 43 | 41 | 41 | 56 | 70 | 67 | 70 | 84 |
| 14 | WPS | 10 | 9 | 11 | 11 | 9 | 9 | 13 | 15 | 13 | 12 | 10 |
| 15 | PC | 54 | 51 | 63 | 63 | 53 | 43 | 49 | 48 | 41 | 41 | 58 |
| 16 | WPC | 29 | 29 | 17 | 17 | 22 | 19 | 21 | 15 | 17 | 17 | 16 |
| 17 | PS/Driver | 1 | 1 | 2 | 2 | 2 | 2 | 3 | 3 | 4 | 4 | 4 |
| 18 | PC/Driver | 6 | 6 | 5 | 5 | 6 | 4 | 3 | 3 | 5 | 5 | 6 |
| Total | | 198 | 200 | 189 | 189 | 198 | 187 | 216 | 223 | 226 | 217 | 246 |

## 2020-2025 දක්වා සිදු වූ වෙඩි තැබීම්: විස්තර

2020-2025 வரை துப்பாக்கிச் சூட்டுச் சம்பவங்கள்: விபரம்

SHOOTINGS DURING 2020-2025: DETAILS

1848/2026

**4. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2020 සිට 2025 දක්වා කාලය තුළ එක් එක් වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ වාර්තා වී ඇති වෙඩි තැබීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාලය තුළ වෙඩි තැබීම් හේතුවෙන් මිය ගිය සංඛ්‍යාව සහ තුවාල ලැබූ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම වෙඩි තැබීම් පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙන ඇති පියවර සහ එහි ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) බණ්ඩාරගම පොලීසිය පවත්වාගෙන යනු ලබන ගොඩනැඟිල්ල පැරණි සහ අබලන් තත්ත්වයේ පවතින බව දන්නේද;

(ii) එම පොලීසිය සඳහා පහසුකම් සහිත නවීන ගොඩනැඟිල්ලක අවශ්‍යතාවක් පවතින බව පිළිගන්නේද;

(iii) බණ්ඩාරගම පොලිස් පරිශ්‍රය වැඩිදියුණු කිරීම සඳහා ගොඩනැඟිලි සැලැස්මක් පිළියෙළ කර තිබේද;

(iv) එසේ නම්, එහි අපේක්ෂිත පිරිවැය කොපමණද;

(v) නිල නිවාස අවශ්‍යතාව විසඳීමට බණ්ඩාරගම පොලීසියේ පරිශ්‍රය තුළ නිල නිවාස සංකීර්ණයක් ඉදිකිරීමේ හැකියාව සම්බන්ධව අධ්‍යයනයක් කර තිබේද;

(vi) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு தொடக்கம் 2025ஆம் ஆண்டு வரையான காலப்பகுதிக்குள் ஒவ்வொரு வருடத்திலும் இலங்கையில் பதிவாகியுள்ள துப்பாக்கிச் சூட்டுச் சம்பவங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி காலப்பகுதியில் துப்பாக்கிச் சூட்டுச் சம்பவங்களினால் உயிரிழந்த மற்றும் காயமடைந்தவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(iii) இத்துப்பாக்கிச் சூட்டுச் சம்பவங்களைக் கட்டுப்படுத்துவதற்காக இலங்கை பொலிசாரால் எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் மற்றும் அதன் முன்னேற்றம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) பண்டாரகம பொலிஸ் நிலையம் இயங்கிவரும் கட்டடம் பழையதாகவும் சேதமடைந்த நிலையிலும் காணப்படுவதை அவர் அறிவாரா என்பதையும்;

(ii) மேற்படி பொலிஸ் நிலையத்திற்கு வசதிகளுடன் கூடிய நவீன கட்டடமொன்றின் தேவை நிலவுவதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) பண்டாரகம பொலிஸ் நிலைய வளாகத்தை மேம்படுத்துவதற்காகக் கட்டடத் திட்டமொன்று தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அதற்கான உத்தேச செலவு எவ்வளவு என்பதையும்;

(v) உத்தியோகத்தர் விடுதித் தேவையை நிவர்த்தி செய்வதற்காக பண்டாரகம பொலிஸ் நிலைய வளாகத்தினுள் உத்தியோகத்தர் விடுதித் தொகுதியொன்றை நிர்மாணிப்பதற்கான சாத்தியக்கூறுகள் குறித்து ஆய்வொன்று செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(vi) இன்றேல், அது தொடர்பாக ஆய்வொன்றை மேற்கொள்வதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) the number of shootings reported in Sri Lanka in each year from 2020 to 2025;

(ii) the number of deaths and injuries resulting from the said shootings during that period, separately; and

(iii) the steps taken by the Sri Lanka Police to control these shooting incidents and the progress made therein?

(b) Will he also inform this House -

(i) whether he is aware that the building in which the Bandaragama Police Station is maintained is old and dilapidated;

(ii) whether he acknowledges that there is a need for a modern building with facilities for the said police station;

(iii) whether a building plan has been prepared to improve the Bandaragama Police premises;

(iv) if so, the expected cost thereof;

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

(v) whether a study has been conducted regarding the possibility of constructing an official quarters complex within the Bandaragama Police premises to address the need for official quarters;

(vi) if not, whether steps will be taken to conduct a study in this regard?

(c) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

(අ) (i)

| වර්ෂය | වෙඩි තැබීම් සංඛ්‍යාව |
|---|---|
| 2020 | 36 |
| 2021 | 37 |
| 2022 | 93 |
| 2023 | 111 |
| 2024 | 99 |
| 2025 | 140 |

(ii)

| වර්ෂය | මිය ගිය සංඛ්‍යාව | තුවාල ලැබූ සංඛ්‍යාව |
|---|---|---|
| 2020 | 20 | 16 |
| 2021 | 22 | 19 |
| 2022 | 68 | 53 |
| 2023 | 56 | 73 |
| 2024 | 64 | 50 |
| 2025 | 65 | 68 |

(iii) ශ්‍රී ලංකාවේ පසුගිය කාලය තුළ විවිධ අපරාධ කණ්ඩායම්, සංවිධානාත්මක අපරාධ ජාල, මත්ද්‍රව්‍ය ජාවාරම් කණ්ඩායම් අතර සහ වෙනත් පෞද්ගලික හේතූන් මත විවිධ පාර්ශ්ව අතර වෙඩි තැබීම් සිද්ධීන් වාර්තා වූ අතර, එම තත්ත්වය පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය විසින් දිවයින පුරා නීතිය හා සාමය සුරක්ෂිත කිරීම සඳහා පවතින නෛතික රාමුව තුළ නවීන තාක්ෂණය උපරිම අයුරින් යොදා ගනිමින් ක්ෂණික මෙහෙයුම් හා බුද්ධි ආවේක්ෂණ ක්‍රියාමාර්ග ඇතුළු ප්‍රායෝගික වැඩසටහන් රැසක් ආරම්භ කර ඇත.

මෙයට අදාළව අතිගරු ජනාධිපතිතුමන්ගේ "රටම එකට" යන සංකල්පයට අදාළව ගරු මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමන්ගේ, අමාත්‍යාංශ ලේකම්තුමන්ගේ උපදෙස්වලට අනුව මේ වනවිට ශ්‍රී ලංකාව තුළ වෙඩි තැබීම් හා අනෙකුත් අපරාධ තුරන් කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

**1. <u>වෙඩි තැබීම් සිද්ධීන්ට බලපාන ප්‍රධාන හේතු හඳුනා ගැනීම</u>**

වෙඩි තැබීම් වැඩි වීමට බලපාන ප්‍රධාන හේතු ලෙස පහත කරුණු හඳුනාගෙන ඇත.

1. සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් අතර ගැටුම්
2. මත්ද්‍රව්‍ය ජාවාරම් හා ණය ගැටලු
3. නීති විරෝධී ගිනි අවි සන්තක කිරීම
4. පෞද්ගලික හා පවුල් ආරවුල්
5. විදේශගත අපරාධ ජාල මඟින් දුරස්ථව මෙහෙය වන අපරාධ

**2. <u>විශේෂ මෙහෙයුම් හා සෝදිසි මෙහෙයුම්</u>**

- සංවිධානාත්මක අපරාධකරුවන් ඉලක්ක කර විශේෂ ඒකාබද්ධ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම.
- රාත්‍රී කාලීන මුර සංචාර, හදිසි වාහන පරීක්ෂණ සහ මාර්ග බාධක මෙහෙයුම් වැඩිදියුණු කිරීම.
- සැකකරුවන්, අපරාධ ජාල හා ඔවුන්ගේ සම්බන්ධකයන් ඉලක්ක කර විශේෂ සෝදිසි මෙහෙයුම් සිදු කිරීම.
- පොලිස් විශේෂ කාර්ය බලකාය හා පොලිසිය එකතු කර හදිසි ප්‍රහාරක යතුරුපැදි බලඇණියක් නිර්මාණය කර ඇත. (මෙම යතුරුපැදි කණ්ඩායම් ක්ෂණිකව අපරාධකරුවන් හඹා ගොස් අත්අඩංගුවට ගැනීම සඳහා විශේෂ පුහුණුවක් ලැබූ නිලධාරින් යොදවා ගෙන නිර්මාණය කර ඇත.)

මෙම මෙහෙයුම් හරහා අපරාධකරුවන්ගේ ගමන් මාර්ග, රැඳී සිටින ස්ථාන සහ සැඟවුණු ආයුධ ගබඩා හඳුනාගෙන නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදු කර ඇත. ප්‍රාදේශීය පොලිස් ස්ථාන, විශේෂ ඒකක සහ බුද්ධි ඒකක අතර ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි.

**3. <u>නීති විරෝධී ගිනි අවි සෙවීම හා අත්අඩංගුවට ගැනීම</u>**

- සැක සහිත ස්ථාන, නිවාස, වාහන සහ ගබඩා සෝදිසි කිරීම.
- නීති විරෝධී ගිනි අවි, උණ්ඩ සහ අදාළ උපකරණ අත්අඩංගුවට ගැනීම.
- ගිනි අවි සැපයුම් හා බෙදා හැරීමේ ජාල හඳුනාගෙන නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

මෙම ක්‍රියාමාර්ග හරහා අපරාධකරුවන් විසින් භාවිත කරන නීති විරෝධී ආයුධ සංචාරය අඩු කිරීම සහ නව ආයුධ රට තුළ පැතිරීම වැළැක්වීම අරමුණු කර ඇත.

**4. <u>බුද්ධි තොරතුරු රැස් කිරීම</u>**

මෙයට අදාළව සතිපතා දිවයිනේ සියලුම කොට්ඨාස භාර නිලධාරින්, දිස්ත්‍රික් භාර නිලධාරින්, ස්ථානාධිපතිවරුන් සමඟ අන්තර්ජාලය හරහා රැස්වී ප්‍රගති සමාලෝචනය, සංවිධානාත්මක අපරාධ මැඩලීමට අදාළ සාකච්ඡා ආදිය තුළින් මේ පිළිබඳව නිරන්තරයෙන් පරීක්ෂා කර බලා

උපදෙස් ලබා දීම සිදු කරනු ලබයි. ඒ හරහා මේ වනවිට අපරාධ අවම කර ගැනීමට හැකි වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ.

- අපරාධ බුද්ධි ඒකක මඟින් අපරාධකරුවන් සම්බන්ධ තොරතුරු රැස් කිරීම.
- සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය.
- සැකකරුවන්ගේ චලන රටා, සම්බන්ධතා ජාල හා ගනුදෙනු විශ්ලේෂණය.

බුද්ධි තොරතුරු පදනම් කර ගත් මෙහෙයුම් හරහා වෙඩි තැබීම් සිදු වීමට පෙර සැලසුම් හඳුනාගෙන ඒවා වැළැක්වීමේ හැකියාව වැඩි වී ඇත.

5. <u>මහජන සහයෝගය ලබා ගැනීම</u>

- මහජන තොරතුරු ලබා ගැනීම සඳහා විශේෂ වැඩසටහන් හා දුරකථන සේවා ක්‍රියාත්මක කිරීම.
- ප්‍රජා පොලිස් සේවාව ශක්තිමත් කිරීම.
- තොරතුරු ලබා දෙන පුද්ගලයන්ගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම හා මූල්‍යමය ත්‍යාග ලබා දීම.

මහජන සහයෝගය හරහා බොහෝ අපරාධ සැලසුම් සහ සැකකරුවන් පිළිබඳ තොරතුරු ඉක්මනින් හඳුනා ගැනීමට හැකි වී ඇත.

6. <u>සංවිධානාත්මක අපරාධකරුවන්ට එරෙහිව ගන්නා විශේෂ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම</u>

- පළාත් විශේෂ අපරාධ විමර්ශන කාර්යාංශයන් පිහිටුවීම.
- 2025.09.04වන දින මධ්‍යම අපරාධ විමර්ශන කාර්යාංශය පිහිටුවීම.
- මධ්‍යම අපරාධ විමර්ශන දිසාව හා අපරාධ වාර්තා කොට්ඨාසය හරහා දිවයිනේ ලියාපදිංචි අපරාධකරුවන් හා ඔවුන්ගේ අනුගාමිකයින් සම්බන්ධව තොරතුරු පද්ධතියක් නිර්මාණය කර විද්‍යාත්මකව විශ්ලේෂණය කර ඔවුන් අත්අඩංගුවට ගැනීමට හා ඔවුන්ගේ අනුගාමිකයන් අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය විද්‍යාත්මක ක්‍රමවේද නිර්මාණය කර ක්‍රියාවට නැංවීම මේ වනවිට සිදු වෙමින් පවතී.
- සංවිධානාත්මක අපරාධකරුවන් සහ ඔවුන්ගේ ප්‍රධාන ජාල අත්අඩංගුවට ගැනීම.
- අධිකරණ ක්‍රියාමාර්ග වේගවත් කිරීමට නීතිමය සහාය ලබා දීම.
- සම්බන්ධිත දේපළ, මුදල් ප්‍රවාහ සහ අපරාධ ආදායම් නිරීක්ෂණය.

මෙම ක්‍රියාමාර්ග මඟින් අපරාධකරුවන්ගේ ආර්ථික ශක්තිය අඩු කිරීම සහ දිගු කාලීනව අපරාධ ජාල බිඳ දැමීම අරමුණු කර ඇත.

7. <u>බන්ධනාගාර තුළ සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම් හා අනෙකුත් අපරාධ මැඬලීම</u>

- බන්ධනාගාර තුළ සිදු වන මත්ද්‍රව්‍ය ජාවාරම් හා අනෙකුත් අපරාධමය වැරදිවලට අදාළව ජංගම දුරකථන අත්අඩංගුවට ගැනීම්, මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් ආදී ක්‍රියාවන් සඳහා පොලිස් විශේෂ කාර්ය බලකාය බන්ධනාගාර තුළට යොමු කර ඇත.
- දිවයිනේ පිහිටා ඇති බන්ධනාගාර 17කට අදාළව මධ්‍යම අපරාධ විමර්ශන දිසාව මඟින් පොලිස් නිලධාරීන් බන්ධනාගාරවලට යොමු කර ඔවුන් ප්‍රශ්න කිරීම්, බුද්ධි තොරතුරු ලබා ගැනීම්, දුරකථන ආදිය අත්අඩංගුවට ගැනීම් ආදී මෙහෙයුම් සිදු කිරීම හා ඒවා සම්බන්ධව අන්තර්ජාලය හරහා දිවයිනේ එම කාර්යයන්ට වගකිව යුතු පොලිස් නිලධාරීන් සමඟ අන්තර්ජාලය හරහා සම්බන්ධ වී තොරතුරු විමසීම සිදු කරනු ලබයි.

8. <u>තාක්ෂණික උපකරණ භාවිතය</u>

- CCTV කැමරා පද්ධති හා නගර නිරීක්ෂණ පද්ධති භාවිත කිරීම
- වාහන අංක හඳුනා ගැනීමේ ස්වයංක්‍රීය පද්ධති භාවිතය
- දුරකථන දත්ත, සන්නිවේදන හා ඩිජිටල් තොරතුරු විශ්ලේෂණය

මේ වනවිට කටුනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළ පර්යන්තයේ මුහුණු හඳුනා ගැනීමේ පද්ධති (Facial Recognition System) තොරතුරු භාවිතයෙන් සැකකරුවන්ගේ ගමන් මාර්ග, හමුවීම් ස්ථාන සහ අපරාධ සැලසුම් හඳුනා ගැනීම පහසු වී ඇත. මෙමඟින්,

1. Image capture (රූප ලබා ගැනීම)
2. Face detection (මුහුණ හඳුනා ගැනීම)
3. Feature extraction (ලක්ෂණ වෙන් කර ගැනීම)
4. Comparison (සැසඳීම)

මෙම නවීන තාක්ෂණික ක්‍රමවේදය හරහා අපරාධකරුවන් පහසුවෙන් හඳුනා ගැනීමේ හැකියාව ඇත. මෙයට අදාළ දත්ත පද්ධතිය අපරාධ වාර්තා කොට්ඨාසය මඟින් පවත්වා ගෙන යනු ලබයි.

ශ්‍රී ලංකාවේ වෙඩි තැබීම් පාලනය හා පාතාල ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා ඉහත සඳහන් කළ ක්‍රියාමාර්ග හා යන්ත්‍රණයන් ශ්‍රී ලංකා පොලීසිය මඟින් මේ වනවිට ක්‍රියාවට නංවා ඇත.

(ආ) (i) බණ්ඩාරගම පොලිස් ස්ථානය 1948.01.01 දින ආරම්භ කර එය 1959.01.30 දින ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරා ගෙන ඇති අතර, අලුත්වැඩියා කටයුතු සිදු කර ඇත.

පොලිස් ස්ථාන භූමියෙහි පරිපාලන ගොඩනැඟිල්ල, හට නිවාස සහ අනෙකුත් කාර්යාල ගොඩනැඟිලි පවත්වාගෙන යනු ලබයි. මෙහි පරිපාලන ගොඩනැඟිල්ලෙහි වහලය සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කර ඇති අතර, මේ වනවිට හට නිවාසය හා වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කටයුතු කරමින් පවතී. මෙම පොලිස් ස්ථානයට අනුයුක්තව නිලධරයන් 58ක් සේවය කරන අතර, දැනට පවතින ඉඩකඩ මෙම නිලධරයන් සඳහා ප්‍රමාණවත් වේ.

[ගරු ආනන්ද විජේපාල මහතා]

(ii) ඔව්.

පොලිස් ස්ථානයේ දැනට ඇති ගොඩනැඟිල්ල වෙනුවට අංගසම්පූර්ණ නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට අදාළ මූලික කටයුතු ආරම්භ කර ඇත.

(iii) මෙම ව්‍යාපෘතියේ උපදේශක ආයතනය ලෙස ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) පත් කර ඇති අතර, එම ආයතනය විසින් ඉදිරිපත් කර ඇති වාස්තු විද්‍යාත්මක සැලසුම් සඳහා අනුමැතිය ලබා දී ඇත.

(iv) එම සැලසුම් අනුව නව ඇස්තමේන්තු සකස් කරන ලෙස උපදේශක ආයතනය වෙත දැනුම් දී ඇත. මෙතෙක් පිරිවැය ඇස්තමේන්තු සකස් කර අවසන් කර නැත.

(v) ඔව්.

- බණ්ඩාරගම පොලිස් ස්ථානය සඳහා පරිපාලන ගොඩනැඟිලි, භට නිවාස, විවාහක නිල නිවාස ඇතුළත් කර අංග සම්පූර්ණ පොලිස් සංකීර්ණයක් සහිත පොලිස් ස්ථානයක් සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර ඇත. 2021 වර්ෂයේ මෙම පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කර නිම කර ඇති අතර, 2021.09.02 දිනැතිව යොමු කරන ලද රාජ්‍ය වියදම් සමාලෝචනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ආරම්භ කර නොමැති නව ඉදිකිරීම් තාවකාලිකව අත්හිටුවන ලෙස උපදෙස් දී ඇත. තවද, 2022.04.26 දිනැති ජාතික අය වැය චක්‍රලේඛ අංක 03/2022 කරුණු අංක 03 i පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, වැඩ හෝ භාණ්ඩ මිලදී ගැනීම සඳහා (අය වැය යෝජනා ද ඇතුළත්ව) ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට නියමිත සියලුම ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවන ලෙස දන්වා ඇති බැවින් හා 2022.04.26 දිනැති ජාතික අය වැය චක්‍රලේඛ අංක 04/2023 අනුව ද ඉදිකිරීම් සීමා කර ඇති බැවින් මෙම ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකි විය.
- මේ වනවිට ඉහත පරිදි තාවකාලිකව අත්හිටුවන ලද නව ඉදිකිරීම් ව්‍යාපෘතීන් ප්‍රමුඛතාව අනුව ආරම්භ කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. මෙම ව්‍යාපෘතිය ද එයට ඇතුළත් කර ඇති අතර, 2026-2028 මධ්‍යකාලීන කාල රාමුව තුළ ඉදිකිරීම් අවසන් කිරීමට නියමිතව ඇත.

(vi) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

(அ) (i)

| வருடம் | துப்பாக்கிச் சூடுகளின் எண்ணிக்கை |
|---|---|
| 2020 | 36 |
| 2021 | 37 |
| 2022 | 93 |
| 2023 | 111 |
| 2024 | 99 |
| 2025 | 140 |

(ii)

| வருடம் | இறந்தவர்களின் எண்ணிக்கை | காயமடைந்தவர்களின் எண்ணிக்கை |
|---|---|---|
| 2020 | 20 | 16 |
| 2021 | 22 | 19 |
| 2022 | 68 | 53 |
| 2023 | 56 | 73 |
| 2024 | 64 | 50 |
| 2025 | 65 | 68 |

(iii) அண்மைக்காலமாக, இலங்கையில் பல்வேறு குற்றச் செயல்களில் ஈடுபடும் குழுக்கள், ஒழுங்மைக்கப்பட்ட குற்ற வலையமைப்புகள், போதைப்பொருள் கடத்தல் குழுக்கள் மற்றும் பல்வேறு தரப்பினரிடையே தனிப்பட்ட காரணங்களுக்காகத் துப்பாக்கிச் சூட்டுச் சம்பவங்கள் நடந்துள்ளதாகச் செய்திகள் அறிக்கையிடப்பட்டுள்ளன. நிலைமையைக் கட்டுப்படுத்துவதற்கு இலங்கைப் பொலிஸ் நாடு முழுவதும் சட்டம், ஒழுங்கைப் பேணுவதற்குத் தற்போதுள்ள சட்டக் கட்டமைப்பிற்குள் நவீன தொழில்நுட்பத்தை உச்சளவில் பயன்படுத்தி விரைவான நடவடிக்கைகள் மற்றும் உளவுத்துறை அடிப்படையிலான நடவடிக்கைகள் உட்பட பல நடைமுறைத் திட்டங்களை ஆரம்பித்துள்ளது.

"முழு நாடும் ஒன்றாக" எனும் மாண்புமிகு ஜனாதிபதியின் கருத்தாக்கத்துக்கு இணங்கவும் பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர் மற்றும் அமைச்சின் செயலாளரின் அறிவுறுத்தல்களின் பிரகாரமும், இலங்கையில் துப்பாக்கிச் சூடு மற்றும் ஏனைய குற்றங்களை ஒழிக்க இலங்கை பொலிஸ் பின்வரும் நடவடிக்கைகளை எடுத்துள்ளது:

1. **<u>துப்பாக்கிச் சூட்டுச் சம்பவங்களுக்கான முக்கிய காரணங்களைக் கண்டறிதல்</u>**

துப்பாக்கிச் சூட்டுச் சம்பவங்கள் அதிகரிப்பதற்கான முக்கிய காரணங்களாகப் பின்வரும் காரணிகள் அடையாளம் காணப்பட்டுள்ளன:

1. திட்டமிடப்பட்ட குற்றச் செயல்களைப் புரியும் குழுக்களுக்கு இடையிலான மோதல்கள்
2. போதைப்பொருள் கடத்தல் மற்றும் கடன் பிரச்சினைகள்
3 சட்டவிரோதமாக துப்பாக்கிகளை வைத்திருத்தல்
4. தனிப்பட்ட மற்றும் குடும்பத் தகராறுகள்.
5. வெளிநாட்டு குற்றவியல் வலையமைப்புகளால் தொலைதூரத்திலிருந்து இயக்கப்படும் குற்றங்கள்

2. <u>விசேட நடவடிக்கைகள் மற்றும் தேடல் நடவடிக்கைகள்</u>

- திட்டமிடப்பட்ட குற்றச் செயல்களைப் புரியும் குற்றவாளிகளைக் குறிவைத்து விசேட கூட்டு நடவடிக்கைகளைச் செயற்படுத்தல்.
- இரவுநேர ரோந்து, திடீர் வாகனச் சோதனைகள் மற்றும் வீதித் தடுப்பு நடவடிக்கைகளை மேம்படுத்தல்.
- சந்தேக நபர்கள், குற்றவியல் வலையமைப்புகள் மற்றும் அவர்களின் தொடர்புகளைக் குறிவைத்து விசேட தேடுதல் நடவடிக்கைகளை நடத்துதல்.
- விசேட அதிரடிப்படை மற்றும் பொலிஸ் இணைந்து ஒரு விரைவுத் தாக்குதல் மோட்டார் சைக்கிள் படை உருவாக்கப்பட்டுள்ளது. (குற்றவாளிகளை விரைவாகப் பின்தொடர்ந்து கைது செய்வதற்காக, விசேட பயிற்சிபெற்ற உத்தியோகத்தர்கள்மூலம் இந்த மோட்டார் சைக்கிள் படை உருவாக்கப்பட்டுள்ளது.)

இந்த நடவடிக்கைகள் மூலம், குற்றவாளிகளின் நடமாட்டம், இடங்கள் மற்றும் மறைத்து வைக்கப்பட்டுள்ள ஆயுதக் கிடங்குகள் அடையாளம் காணப்பட்டு, சட்ட நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது. பிராந்திய பொலிஸ் நிலையங்கள், விசேட பிரிவுகள் மற்றும் புலனாய்வுப் பிரிவுகளுக்கு இடையே கூட்டு நடவடிக்கைகள் மேற்கொள்ளப் படுகின்றன.

3. <u>சட்டவிரோத துப்பாக்கிகளைத் தேடுதல் மற்றும் பறிமுதல் செய்தல்</u>

- சந்தேகத்திற்கிடமான இடங்கள், வீடுகள், வாகனங்கள் மற்றும் கிடங்குகளைத் தேடுதல்.
- சட்ட விரோத துப்பாக்கிகள், வெடிமருந்துகள் மற்றும் தொடர்புடைய உபகரணங்களைப் பறிமுதல் செய்தல்.
- துப்பாக்கி விநியோகம் மற்றும் விநியோக வலையமைப்புகளை அடையாளம் கண்டு சட்ட நடவடிக்கை எடுத்தல்.

இந்த நடவடிக்கைகள் குற்றவாளிகளால் பயன்படுத்தப்படும் சட்டவிரோத ஆயுதங்களின் புழக்கத்தைக் குறைப்பதையும் நாட்டில் புதிய ஆயுதங்களின் பரவுகையைத் தடுப்பதையும் நோக்கமாகக் கொண்டுள்ளன.

4. <u>புலனாய்வுத் தகவல்களைச் சேகரித்தல்</u>

இது தொடர்பாக, நாட்டின் அனைத்துப் பிரிவு அதிகாரிகள், மாவட்டங்களுக்குப் பொறுப்பான அதிகாரிகள் மற்றும் நிலையப் பொறுப்பதிகாரிகள் ஒவ்வொரு வாரமும் இணைய வழியில் சந்தித்து முன்னேற்றத்தை மீளாய்வு செய்து, ஒழுங்கமைக்கப்பட்ட குற்றங்களை எதிர்த்துப் போராடுவது தொடர்பான கலந்துரையாடல்களை நடத்தி, இந்த பிரச்சினையில் தொடர்ந்து ஆலோசனைகளை வழங்குகின்றனர். இதன்மூலம் தற்போது குற்றங்கள் குறைந்துவரும் போக்கு அவதானிக்கப்படுகின்றது.

- குற்றவியல் புலனாய்வுப் பிரிவுகளால் குற்றவாளிகள் தொடர்பான தகவல்களைச் சேகரித்தல்.
- திட்டமிடப்பட்ட குற்றச் செயல்களைப் புரியும் குழுக்களின் செயற்பாடுகளைக் கண்காணித்தல்.
- சந்தேக நபர்களின் நடமாட்ட முறைகள், தொடர்பு வலையமைப்புகள் மற்றும் பரிவர்த்தனைகளின் பகுப்பாய்வு.

உளவுத்துறை அடிப்படையிலான செயற்பாடுகள்மூலம், துப்பாக்கிச் சூட்டுச் சம்பவங்கள் நிகழும் முன்பே அவற்றைக் கண்டறிந்து தடுக்கும் திறன் அதிகரித்துள்ளது.

5. <u>பொதுமக்களின் ஒத்துழைப்பைப் பெற்றுக்கொள்ளல்</u>

- பொதுமக்களின் தகவல்களைப் பெற்றுக்கொள்வதற்கு விசேட திட்டங்கள் மற்றும் தொலைபேசிச் சேவைகளைச் செயற்படுத்தல்.
- சமூக பொலிஸ் சேவையை வலுப்படுத்தல்.
- தகவல் அளிப்பவர்களின் இரகசியத் தன்மையைப் பாதுகாத்தல் மற்றும் நிதி அன்பளிப்புக்களை வழங்குதல்.
- பொதுமக்களின் ஒத்துழைப்பின்மூலம், பல குற்றத் திட்டங்களையும் சந்தேக நபர்கள் பற்றிய தகவல்களையும் விரைவாக அடையாளம் காண முடிந்தது.

6. <u>திட்டமிடப்பட்ட குற்றச்செயல்களில் ஈடுபடும் குற்றவாளிகளுக்கு எதிராக விசேட நடவடிக்கைகளைச் செயற்படுத்தல்.</u>

- மாகாண விசேட குற்றப் புலனாய்வுப் பணியகங்களை நிறுவுதல்.
- 2025.09.04ஆம் திகதி மத்திய குற்றப் புலனாய்வுப் பணியகத்தை நிறுவுதல்.
- மத்திய குற்றப் புலனாய்வு பிரிவு மற்றும் குற்றப் பதிவுப் பிரிவு ஆகியவை தற்போது நாட்டில் பதிவுசெய்யப்பட்ட குற்றவாளிகள் மற்றும் அவர்களைப் பின்தொடர்பவர்கள் தொடர்பான தகவல் அமைப்பை உருவாக்கி, அவர்களை விஞ்ஞான ரீதியாகப் பகுப்பாய்வு செய்து, அவர்களையும் அவர்களைப் பின்தொடர்பவர்களையும் கைது செய்வதற்கான விஞ்ஞான முறைகளை உருவாக்கி செயற்படுத்தும் பணியில் ஈடுபட்டுள்ளன.

[ගරු ආනන්ද විජේපාල මහතා]

- திட்டமிடப்பட்ட குற்றச் செயல்களைப் புரியும் குற்றவாளிகள் மற்றும் அவர்களின் முக்கிய வலையமைப்பினரைக் கைதுசெய்தல்.
- நீதிமன்ற நடவடிக்கைகளை விரைவுபடுத்த சட்ட உதவி வழங்குதல்.
- தொடர்புடைய சொத்துக்கள், பணப்புழக்கங்கள் மற்றும் குற்றத்தின் வருமானங்களைக் கண்காணித்தல்.

இந்த நடவடிக்கைகள் குற்றவாளிகளின் பொருளாதார சக்தியை குறைப்பதையும் நீண்ட காலத்துக்கு குற்றவியல் வலையமைப்புகளை அகற்றுவதையும் நோக்கமாகக் கொண்டுள்ளன.

7. **<u>சிறைச்சாலைகளில் போதைப்பொருள் கடத்தல் மற்றும் ஏனைய குற்றங்களைத் தடுத்தல்</u>**

- சிறைச்சாலைகளுக்குள் நிகழும் போதைப்பொருள் கடத்தல் மற்றம் ஏனைய குற்றச் செயல்கள் தொடர்பாக கையடக்கத் தொலைபேசிகளைப் பறிமுதல் செய்தல் மற்றும் போதைப்பொருட்களைப் பறிமுதல் செய்தல் போன்ற நடவடிக்கைகளை மேற்கொள்ள பொலிஸ் விசேட அதிரடிப்படையினர் சிறைச்சாலைகளுக்கு அனுப்பப்பட்டுள்ளனர்.
- நாட்டில் அமைந்துள்ள 17 சிறைச்சாலைகள் தொடர்பாக, மத்திய குற்றப்புலனாய்வு பிரிவினால் சிறைச்சாலைகளுக்கு பொலிஸ் உத்தியோகத்தர்களை அனுப்பி, அவர்களிடம் விசாரணை செய்தல், உளவுத்துறை தகவல்களைப் பெறுதல், தொலைபேசிகளை பறிமுதல் செய்தல் போன்ற நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகின்றன. இந்த நடவடிக்கைகள் தொடர்பாக, நாட்டில் அந்தப் பணிகளுக்கு பொறுப்பான பொலிஸ் அதிகாரிகள் இணைய வழியில் தொடர்புகொண்டு தகவல்களைச் சேகரிக்கின்றனர்.

8. **<u>தொழில் நுட்ப உபகரணங்களின் பயன்பாடு</u>**

- CCTV camera அமைப்புகள் மற்றும் நகர கண்காணிப்பு அமைப்புகளின் பயன்பாடு.
- வாகன இலக்கங்களை அடையாளம் காணும் தன்னியக்க அமைப்புகளின் பயன்பாடு.
- தொலைபேசித் தரவுகள், தகவல் தொடர்பு மற்றும் டிஜிற்றல் தகவல் பகுப்பாய்வு.

தற்போது, கட்டுநாயக்க சர்வதேச விமான நிலைய முனையத்தில் முகங்களை அடையாளம் காணும் அமைப்புகளின் (Facial Recognition System) தகவல்களைப் பயன்படுத்தி சந்தேக நபர்களின் பயண வழிகள், சந்திப்பு இடங்கள் மற்றும் குற்றத் திட்டங்களை அடையாளம் காண்பதற்கு முடியுமாகியுள்ளது. அதன் \மூலம்,

1. Image capture (படப்பிடிப்பு)
2. Face detection (முகத்தைக் கண்டறிதல்)
3. Feature extraction (அம்சங்களைப் பிரித்தெடுத்தல்)
4. Comparison (ஒப்பீடு)

இந்த நவீன தொழில்நுட்பம் குற்றவாளிகளை எளிதில் அடையாளம் காண்பதற்கு உதவுகின்றது. ஏற்புடைய தரவுத்தளம் குற்றப் பதிவுப் பிரிவால் பராமரிக்கப்படுகின்றது.

இலங்கையில் துப்பாக்கிச் சூடு மற்றும் பாதாள உலக நடவடிக்கைகளைக் கட்டுப்படுத்த இலங்கைப் பொலிஸால் மேற்கூறிய நடவடிக்கைகள் மற்றும் வழிமுறைகள் ஏற்கனவே செயற்படுத்தப் பட்டுள்ளன.

(ஆ) (i) பண்டாரகம பொலிஸ் நிலையம் 1948.01.01ஆம் திகதி ஆரம்பிக்கப்பட்டு, 1959.01.30 ஆம் திகதி இலங்கை பொலிஸுக்கு கையகப்படுத்தப்பட்டு பழுதுபார்ப்புப் பணிகள் மேற்கொள்ளப்பட்டுள்ளன.

பொலிஸ் நிலைய வளாகத்தில் நிர்வாகக் கட்டிடம், சிப்பாய் வீடுகள், பிற அலுவலகக் கட்டிடங்கள் பராமரிக்கப்படுகின்றன. நிர்வாகக் கட்டிடத்தின் கூரை முழுமையாகப் புதுப்பிக்கப்பட்டுள்ளது. சிப்பாய் வீடுகள் மற்றும் கழிப்பறை அமைப்புகள் தற்போது புதுப்பிக்கப்பட்டு வருகின்றது. இந்தப் பொலிஸ் நிலையத்தில் 58 உத்தியோகத்தர்கள் இணைக்கப்பட்டுள்ளனர். தற்போதுள்ள இடவசதி அந்த உத்தியோகத்தர்களுக்குப் போதுமானது.

(ii) ஆம்,

பொலிஸ் நிலையத்தில் ஏற்கனவே, உள்ள கட்டிடத்துக்குப் பதிலாக, அனைத்து வசதிகளுடன் கூடிய புதிய கட்டிடம் கட்டுவதற்கான ஆரம்ப கட்டப் பணிகள் ஆரம்பிக்கப்பட்டுள்ளன.

(iii) இந்தக் கருத்திட்டத்துக்கான ஆலோசகராக மத்திய பொறியியல் ஆலோசனைப் பணியகம் (CECB) நியமிக்கப்பட்டுள்ளது. மேலும், அந்த நிறுவனத்தால் சமர்ப்பிக்கப்பட்டுள்ள கட்டிட வரைபுத் திட்டங்களுக்கு அனுமதி வழங்கப்பட்டுள்ளது.

(iv) அந்தத் திட்டங்களின்படி புதிய மதிப்பீடுகளைத் தயாரிக்குமாறு ஆலோசனை நிறுவனத்துக்கு அறிவிக்கப்பட்டுள்ளது. செலவு மதிப்பீடுகள் இன்னும் இறுதி செய்யப்படவில்லை.

(v) ஆம்,

- பண்டாரகம பொலிஸ் நிலையத்திற்கான நிர்வாகக் கட்டிடங்கள், சிப்பாய் வீடுகள் மற்றும் திருமணம் முடித்தவர்களுக்கான விடுதிகள் உள்ளிட்ட முழுமையான பொலிஸ் வளாகத்தைக் கட்டுவதற்கான திட்டங்கள் தயாரிக்கப்பட்டுள்ளன. இந்தப் பொலிஸ் நிலையக் கட்டுமானத்துக்கான ஆரம்பகட்டப் பணிகள் 2021ஆம் ஆண்டில் நிறைவடைந்துள்ளது. 2021.09.02ஆம் திகதி அனுப்பிவைக்கப்பட்ட அரச செலவினங்கள் மீளாய்வு பற்றிய அமைச்சரவைத் தீர்மானத்தின் பிரகாரம், ஆரம்பிக்கப்படாத புதிய கட்டுமானங்களைத் தற்காலிகமாக நிறுத்திவைக்குமாறு அறிவுறுத்தல் வழங்கப்பட்டது. மேலும், 2022.04.26ஆம் திகதிய தேசிய வரவு செலவுத்திட்டச் சுற்றறிக்கை இல. 03/2022இன் விடயம் 03 1 பிரகாரம் கருத்திட்டங்களை நடைமுறைப்படுத்தல், வேலை அல்லது பொருட்கள் கொள்வனவு (வரவு செலவுத்திட்ட முன்மொழிவுகளும் அடங்கலாக) கொள்முதல் நடவடிக்கைகள் ஆரம்பிக்கப்படவுள்ள அனைத்துக் கருத்திட்டங்களையும் தற்காலிகமாக இடைநிறுத்துமாறு அறிவிக்கப்பட்டுள்ளதாலும் 2022.04.26ஆம் திகதிய வரவு செலவுத்திட்ட சுற்றறிக்கை இல. 04/2023 பிரகாரம் கட்டுமானங்கள் வரையறுக்கப்பட்டிருந்ததாலும் இந்தக் கட்டுமானத்தை ஆரம்பிக்க முடியவில்லை.
- தற்காலிகமாக இடைநிறுத்தப்பட்ட புதிய கட்டுமானத் திட்டங்களை முன்னுரிமைப்படி ஆரம்பிப்பதற்குத் தற்போது செயற்றிட்டம் தயாரிக்கப்பட்டுள்ளது. இந்தத் திட்டமும் அதில் சேர்க்கப்பட்டுள்ளது. மேலும், கட்டுமானப் பணிகள் 2026 - 2028ஆம் ஆண்டு நடுத்தர காலக்கட்டத்தில் நிறைவுசெய்வதற்குத் திட்டமிடப்பட்டுள்ளது.

(vi) ஏற்புடையதன்று.

(இ) கேள்வி எழாது.

(a) (i)

| Year | Number of shootings |
|---|---|
| 2020 | 36 |
| 2021 | 37 |
| 2022 | 93 |
| 2023 | 111 |
| 2024 | 99 |
| 2025 | 140 |

(ii)

| Year | Number of deceased persons | Number of injured persons |
|---|---|---|
| 2020 | 20 | 16 |
| 2021 | 22 | 19 |
| 2022 | 68 | 53 |
| 2023 | 56 | 73 |
| 2024 | 64 | 50 |
| 2025 | 65 | 68 |

(iii) During the past period, shootings were reported among criminal groups, organized criminal network, drug smugglers and among several parties over personal reasons and the Sri Lanka Police has initiated a number of practical programmes including instant operations and intelligence surveillance processes utilizing new technology within the prevailing legal framework to safeguard law and order in the Island. In line with the concept "*Ratama Ekata"* by the President and as per instructions by the Hon. Minister of Public Security and Parliamentary Affairs and the Secretary to the Ministry, the Sri Lanka Police has taken the following measures to combat shootings and other crimes in the Island:

1. **Identification of main reasons for shootings**
   1. Conflicts and disputes among organized criminal groups.
   2. Drug smuggling and loan issues.
   3. Illegal possession of firearms.
   4. Personal and family disputes.
   5. Crimes coordinated remotely by foreign criminal networks.

2. **Special operations and search operations**
   - Special joint operations targeting organized criminals.
   - Improving night patrols, emergency vehicle inspections and checkpoint operations.
   - Special search operations targeting suspects, criminal networks and their connections.
   - An emergency motorcycle squad was created with the Police Special Task Force and the Police. (This includes officers who were given special motorcycle training on quick arrest of criminals).

Legal actions were taken to identify road maps, hiding places and hidden weapon storages of criminals. Joint operations among divisional police stations, special units and intelligence units are carried out.

3. **Raid and recovery of illegal firearms**

- Operations to search suspicious places, houses, vehicles and weapon storages.
- Recovery of illegal firearms, bullets and relevant instruments.
- Taking legal action after identifying weapons supply and distribution networks.

This is aimed at reducing illegal weapons sharing by criminals and distribution in the country.

4. **Collecting intelligence data**

Instructions are given constantly through weekly virtual discussions with all the officers in charge of divisions, officers in charge of districts, officers in charge in order to review progress and combat organized crime.

- Collection of information related to criminals through crime intelligence units.
- Inspection of activities of organized criminal groups.
- Analysis of connections of criminal association networks.

Ability to identify plans of shootings earlier through intelligence data based operations.

5. **Obtaining public support**

- Initiating special programmes and telephone services to obtain public information.
- Strengthening Community Police service.
- Ensuring the confidentiality of individuals who provide information and awarding financial gifts.

Ability to identify suspects and criminal plans through public support.

6. **Taking special measures against organized crime operatives**

- Establishment of regional special crime investigation bureaus.
- Establishment of the Central Crime Investigation Bureau on 04.09.2025.
- Creating scientific methods to arrest criminals and their groups through registering them in the Central Crime Investigation Range and Crime Reports Division is underway.
- Arresting organized crime groups and their main networks.
- Providing legal assistance to expedite court actions.
- Analysing properties, cash flow and crime income.

This is aimed at weakening the financial capacity of criminals and combating criminal network as a long-term action.

7. **Curbing drug smuggling and other crimes in prisons**

- The Special Police Task Force has been deployed in prisons to raid drugs and mobile phones, which are a cause for drug smuggling and other criminal offences carried out from prisons.
- The Central Crime Investigation Range, in relation to 17 prisons in the Island, carry out a task with police officers through operations such as questioning at prisons, obtaining intelligence information and recovering telephones.

8. **Usage of technical appliances**

- Usage of CCTV camera systems and town observation systems.
- Usage of electronic systems to identify vehicle numbers.
- Analysis of telephone data, communication and digital information.

It was easy to identify road maps, meeting places and crime plans of suspects, using the facial recognition system at Katunayake International Airport.

1. Image capture
2. Face detection
3. Feature extraction
4. Comparison

It is easy to identify criminals through this new technology. The relevant data system is maintained by the Crime Report Division.

The Sri Lanka Police has currently initiated a system to curb and combat shootings and underworld activities in Sri Lanka.

(b) (i) The Bandaragama Police Station was established on 01.01.1948, taken over by the Sri Lanka Police on 30.01.1959 and renovations were made.

Administrative building, barracks and other office buildings are maintained in the police station premises. The roof of administration building has totally been renovated and barracks and lavatory system, too, are under renovation. There are 58 officers attached to this police station and the prevailing space is adequate for those officers.

(ii) Yes.

Relevant preliminary activities have now been carried out to construct a new complete building, instead of the prevailing building in the police station.

(iii) The Central Engineering Consultancy Bureau - CECB - was appointed as the consulting agency of this project and approval was granted for architectural plans submitted by the institution.

(iv) The consulting agency was informed to prepare new estimates as per those plans and the cost estimate has not yet been finalized.

(v) Yes.

- Necessary plans were prepared for a complete police complex including administration building, barracks and married officers' quarters for the Bandaragama Police Station. Basic activities for the construction of this police station had been completed in 2021 and as per the Cabinet Decision on Public Expenditure review dated 02.09.2022, it was instructed to temporarily suspend the new constructions which were not started. Also, as per 03(i) of National Budget Circular No. 03/2022 dated 26.04.2022, it was informed to temporarily suspend "all the projects to be initiated and procurement activities for purchase of goods or work for implementation of project" and as per National Budget Circular No. 04/2023 dated 26.04.2022, constructions have been limited and it was unable to initiate these constructions.
- An Action Plan was prepared to initiate, according to priority, the new construction projects suspended temporarily as above. This project is also included in it and it is due to finalize construction within the 2026-2028 medium-term time frame.

(vi) Not applicable.

(c) Does not arise.

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 5වන ප්‍රශ්නයට -1849/2026- පිළිතුර දීමට අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்களால் கேட்கப்பட்ட, இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 5ஆம் இலக்க வினாவுக்கு - 1849/2026 - விடையளிப்பதற்கு, நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார அவர்கள் மூன்று வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. Harshana Nanayakkara, Minister of Justice and National Integration requested for three weeks' time to reply to Question No. 05 - 1849/2026 - raised by the Hon. Ajith P. Perera appearing in today's Order Paper.

## පැල්පොල අන්තර් හුවමාරුවේ ඉදිකිරීම් කටයුතු: වර්තමාන තත්ත්වය
## பெல்பொல இடைமாறல் பகுதியின் நிர்மாணம்: தற்போதைய நிலை
## CONSTRUCTION OF PELPOLA INTERCHANGE: CURRENT STATUS

1850/2026

**6. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රදේශ නිරතුරුවම ජල ගැලීම්වලට ලක් වන බැවින්, එම ප්‍රදේශයට භාණ්ඩ සහ සේවා සැපයුම් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා දැනට අර්ධ වශයෙන් ඉදිකර වැඩ නතර කර ඇති දක්ෂිණ අධිවේගී මාර්ගයේ පැල්පොල අන්තර් හුවමාරුව ඉදිකර අවසන් කළ යුතු බව 2025.12.11 දින පැවති යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී තීරණය කර ඇති බව දන්නේද;

(ii) මිල්ලනිය, කළුතර උතුර සහ බුලත්සිංහල ප්‍රදේශවල ජනතාවට දක්ෂිණ අධිවේගී මාර්ගයට ප්‍රමාණවත් ප්‍රවේශයක් නොමැති බව පිළිගන්නේද;

(iii) දැනට අඩක් වැඩ නිමකර ඇති පැල්පොල අන්තර් හුවමාරුවේ කටයුතු අවසන් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) களுத்துறை மாவட்டத்தில் மில்லனிய பிரதேச செயலகப் பிரிவிற்கு உட்பட்ட பகுதிகள் அடிக்கடி வெள்ளநிலைக்கு உட்படுவதால்,

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

அப்பிரதேசங்களுக்குப் பொருட்கள் மற்றும் சேவைகளின் விநியோகத்தைத் தொடர்ச்சியாக முன்னெடுத்துச் செல்வதற்கு தற்போது பாதியளவு நிர்மாணிக்கப்பட்டுப் பணிகள் இடைநிறுத்தப்பட்டுள்ள தெற்கு அதிவேக நெடுஞ்சாலையின் பெல்பொல இடைமாறல் பகுதியை நிர்மாணித்து முடிக்க வேண்டும் என 2025.12.11ஆம் திகதி நடைபெற்ற உட்கட்டமைப்பு வசதிகள் மற்றும் மூலோபாய அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவில் தீர்மானம் எட்டப்பட்டதை அறிவாரா என்பதையும்;

(ii) மில்லனிய, களுத்துறை வடக்கு மற்றும் புலத்சிங்ஹலப் பகுதிகளைச் சேர்ந்த மக்களுக்கு தெற்கு அதிவேக நெடுஞ்சாலைக்குப் பிரவேசிப்பதற்குப் போதியளவு வழிகள் இல்லை என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) தற்போது பாதியளவு பணிகள் நிறைவுசெய்யப்பட்டுள்ள பெல்பொல இடைமாறல் பகுதியின் பணிகளை நிறைவுசெய்ய மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) whether he is aware that the Sectoral Oversight Committee on Infrastructure and Strategic Development, at its meeting held on 11.12.2025, decided that the construction work of the Pelpola Interchange of the Southern Expressway that has been suspended should be completed to ensure continuous supply of goods and services to the areas within the Millaniya Divisional Secretary's Division of Kalutara District, which are constantly affected by floods;

(i) whether he accepts that the people of Millaniya, Kalutara North and Bulathsinhala areas currently lack adequate access to the Southern Expressway; and

(i) the steps that have been taken to complete construction of the Pelpola Interchange, which has been stopped halfway?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

(අ) (i) මේ සම්බන්ධයෙන් 2025.12.11 දින පැවති යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා කළ බවට දැනුවත්ය.

(ii) නැත.

- මිල්ලනිය, කළුතර උතුර සහ බුලත්සිංහල යන ප්‍රදේශයේ ජනතාවට අධිවේගී මාර්ග පද්ධතියට පිවිසීමට ගැලනිගම සහ දොඩන්ගොඩ අන්තර් හුවමාරු භාවිතා කළ හැකිය.
- බුලත්සිංහල ප්‍රදේශයේ ජනතාවට ඉදිරියේදී ඉදිකිරීමට නියමිත රුවන්පුර අධිවේගී මාර්ගයේ පිහිටි ඉංගිරිය අන්තර් හුවමාරුව ද භාවිත කළ හැකිය.

(iii) දැනට කටයුතු නොකෙරේ.

(ආ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් යෝජිත මිල්ලනිය ආයෝජන කලාපය සඳහා අධිවේගී මාර්ගයට පිවිසුමක් අවශ්‍ය වූ බැවින් එම මණ්ඩලයේ ප්‍රතිපාදන මත ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම සිදු වුවත් ඒ සඳහා ප්‍රතිපාදන සැලසීම මේ වනවිට නතර වී ඇත. එබැවින් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ද දැනට සිදු නොවේ.

(அ) (i) இது தொடர்பாக 2025.12.11 அன்று நடைபெற்ற உட்கட்டமைப்பு மற்றும் மூலோபாய அபிவிருத்தி தொடர்பான துறைசார் மேற்பார்வைக் குழுக் கூட்டத்தில் கலந்துரையாடப்பட்டுள்ளது என்பதை அறிவேன்.

(ii) இல்லை.

- மில்லனிய, களுத்துறை வடக்கு மற்றும் புலத்சிங்கல பகுதிகளில் வாழும் மக்கள் அதிவேக நெடுஞ்சாலை அமைப்பை அணுகுவதற்காகக் கெலனிகம மற்றும் தொடங்கொட இடைமாற்று சந்திகளைப் பயன்படுத்த முடியும்.
- புலத்சிங்கல பகுதியில் வாழும் மக்களுக்கு எதிர்காலத்தில் நிர்மாணிக்கப்படவுள்ள ருவன்புர அதிவேக நெடுஞ்சாலையில் அமைந்துள்ள இங்கிரிய இடைமாற்று சந்தியையும் பயன்படுத்த முடியும்.

(iii) தற்போது எந்த நடவடிக்கையும் எடுக்கப்படவில்லை.

(ஆ) இலங்கை முதலீட்டுச் சபையினால் பரிந்துரைக்கப்பட்ட மில்லியன முதலீட்டு வலயத்திற்கான அதிவேகப் பாதை அணுகல்

தேவையைக் கருத்திற்கொண்டு அச்சபையின் ஏற்பாடுகளின் அடிப்படையில் நிர்மாணத்திற்குத் தேவையான நிலங்கள் கையகப்படுத்தப்பட்டாலும், அந்த ஏற்பாடுகள் தற்போதைய நிலையில் நிறுத்தப்பட்டுள்ளன. எனவே நிலங்கள் கையகப்படுத்தும் பணிகளும் தற்போது இடம்பெறவில்லை.

(a) (i) Aware that the matter was discussed at the Sectoral Oversight Committee on Infrastructure and Strategic Development held on 11.12.2025.

(ii) No.

- The people of Millaniya, Kalutara North and Bulathsinhala can access the expressway network through the Gelanigama and Dodangoda Interchanges.
- People of Bulathsinhala area will also be able to access the expressway network through the Ingiriya Interchange on the Ruwanpura Expressway, which is scheduled for construction in the future.

(iii) Not under processing at present.

(b) Access to the expressway was required for Millaniya Investment Zone, as proposed by the Board of Investment of Sri Lanka and the lands necessary for its construction were acquired based on the Board's provisions. The allocation of funds for the project has now been suspended, and consequently, no land acquisition activities are taking place at present.

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 7වන ප්‍රශ්නයට -1851/2026 - පිළිතුර දීමට ආරක්ෂක අමාත්‍ය ගරු අනුර කුමාර දිසානායක මහතා සති දෙකක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்களால் கேட்கப்பட்ட, இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 7ஆம் இலக்க வினாவுக்கு - 1581/2026 - விடையளிப்பதற்கு, பாதுகாப்பு அமைச்சர் மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் இரண்டு வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. Anura Kumara Dissanayake, Minister of Defence requested for two weeks' time to reply to Question No. 07 - 1851/2026 - raised by the Hon. Ajith P. Perera appearing in today's Order Paper.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.